# වාර්ෂික කාර්යසාධන වාර්තාව හා ගිණුම් 2018
# ஆண்டு செயல்திறன் அறிக்கை மற்றும் கணக்குகள் 2018
# Annual Performance Report and Accounts 2018



**මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය**
**மகாவலி அபிவிருத்தி மற்றாடல் அமைசக**
**Ministry of Mahaweli Development and Environment**

# වාර්ෂික කාර්යසාධන වාර්තාව හා ගිණුම් 2018

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

## මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

**අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා**
**මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍ය**

අජිත් මාන්නප්පෙරුම මැතිතුමා
**ගරු මහවැලි සංවර්ධන හා පරිසර රාජ්‍ය අමාත්‍ය**

## අමාත්‍යාංශයේ ප්‍රධාන නිලධාරීන්

අනුර දිසානායක මහතා
ලේකම්

එම් පී ඩී යූ කේ මාපා පතිරණ මහතා
රාජ්‍ය ලේකම්

එච් එන් නිලුක්ෂි ගුණසේකර මහත්මිය
අතිරේක ලේකම් (පාලන i)

ආර් ඒ ආර් ආර් රූපසිංහ මහතා
අතිරේක ලේකම් (පාලන ii)

ඩී ජීවනාදන් මහතා
අතිරේක ලේකම් (ස්වාභාවික සම්පත්)

සී එච් දේවේන්ද්‍ර මහත්මිය
අතිරේක ලේකම් (තාක්ෂණ)

එම් ජී ඩබ්ලිව් එම් ඩබ්ලිව් ටී බී දිසානායක මහතා
අතිරේක ලේකම් (පරිසර ප්‍රතිපත්ති හා සැලසුම්)

# අමාත්‍යාංශයට අයත් රාජ්‍ය හා ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්

| | |
|---|---|
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | - අනුර සතුරුසිංහ මහතා, වන සංරක්ෂක ජනරාල් |
| ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | - ආචාර්ය ඩී එම් එස් දිසානායක මහතා, අධ්‍යක්ෂ ජනරාල් |
| වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව | - බී කේ ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා, අධ්‍යක්ෂ ජනරාල් |
| මධ්‍යම පරිසර අධිකාරිය | - ඒජේ මුසාමිල් මහතා, සභාපති<br>- පී බී හේමන්ත ජයසිංහ මහතා, අධ්‍යක්ෂ ජනරාල් |
| ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය | - ඉංජිනේරු ජී ඩී ඒ පියතිලක මහතා, සභාපති<br>- ඉංජිනේරු කේ එල් එස් සහබන්දු මහතා, සාමාන්‍යාධිකාරී |
| භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය | - ඩබ් එම් ඒ එස් ඉද්දවෙල මහතා, සභාපති<br>- ආචාර්ය සී එච් ඊ ආර් සිරිවර්ධන මහතා, අධ්‍යක්ෂ ජනරාල් |
| සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය | - රියර් අද්මිරාල් රෝහණ පෙරේරා මහතා, සභාපති<br>- ආචාර්ය පී.බී. ටර්නි ප්‍රදීප් කුමාර මහතා, සාමාන්‍යාධිකාරී |
| මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | - රෙජිනෝල්ඩ් කුරේ මහතා, සභාපති<br>- එච්.පී. සුමනසේකර මහතා, අධ්‍යක්ෂ ජනරාල් |
| මැණික් හා ස්වර්ණාභරණ පුහුණු හා අභ්‍යාස ආයතනය | - නවරත්න බංඩාර අලහකෝන් මහතා, සභාපති<br>- ආචාර්ය ප්‍රශාන් ෆ්‍රැන්සිස් මහතා, අධ්‍යක්ෂ ජනරාල් |
| රාජ්‍ය දැව සංස්ථාව | - නිලුකා ඒකනායක මහත්මිය, සභාපති<br>- එන් ඩී රුවන්පතිරණ මහතා, සාමාන්‍යාධිකාරී |
| මහවැලි උපදේශන කාර්යාංශය | - වෛද්‍ය හර්ෂ සමරවීර මහතා, සභාපති |

## බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘති අධ්‍යක්ෂකවරු

| | |
|---|---|
| මොරගහකන්ද හා කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය | - ඉංජිනේරු ඩී.ඩී. විජයරත්න මහතා ව්‍යාපෘති අධ්‍යක්ෂ |
| උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය | - ඉංජිනේරු අචාර්ය සුනිල් ද සිල්වා මහතා ව්‍යාපෘති අධ්‍යක්ෂ |
| මහවැලි ජල සම්පත් සුරක්ෂිත හා ආයෝජන වැඩසටහන | - ඉංජිනේරු කේ.ආර්.නීල් බණ්ඩාර මහතා වැඩසටහන් අධ්‍යක්ෂ |
| පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය | - අනුර ද සිල්වා මහතා ව්‍යාපෘති අධ්‍යක්ෂ |
| මාදුරුඔය දකුණු ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය | - ඉංජිනේරු නිලන්ත ධනපාල මහතා ව්‍යාපෘති අධ්‍යක්ෂ |
| ඒකාබද්ධ ජල කළමනාකරණ ප්‍රවේශයක් තුලින් ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ දේශගුණික විපර්යාසවලට කුඩා ඉඩම් හිමි ගොවීන්ගේ මුහුණදීමේ ශක්තිය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | - ඉංජිනේරු ජී එස් සී රොද්‍රිගෝ මහතා ව්‍යාපෘති අධ්‍යක්ෂ |

අමාත්‍යාංශයේ කාර්යභාර්ය

- මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය තුළින් ප්‍රශස්ථ ජල කළමනාකරණයක් සහ කෘෂිකාර්මික සංවර්ධනයක් ඇති කිරීම.
- මහවැලි බල ප්‍රදේශ තුළ වාරි සහ කෘෂි පහසුකම් වැඩි දියුණු කරමින් ජනතාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම.
- මහවැලි ජනපදිකයින්ගේ ඉඩම් අයිතිය සුරක්ෂිත කිරීම.
- මහවැලි ජලපෝෂක ආරක්ෂා කිරීම හා සංරක්ෂණය.
- මහවැලි හා සියළුම අතු ගංගා ආශ්‍රිතව පරිසර හිතකාමී පුනර්ජනනීය විදුලිබල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා නියාමනය.
- මහවැලි ජල සුරක්ෂිතතා වැඩ සටහන අනුව දේශගුණික විපර්යාස හමුවේ මනා ජල කළමනාකරණ ක්‍රමවේද හඳුන්වාදීම හා සමාජගත කිරීම.
- උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය මඟින් මහවැලි ගංගා ද්‍රෝණියේ අතිරික්ත ජලය මොනරාගල/ වැල්ලවාය වැනි වියලි ප්‍රදේශවල ජන ජීවිතය ඉහල නැංවීම සඳහා යොදාගැනීම, සහ ජාතික විදුලිබල පද්ධතියට මෙගාවොට් 125ක පුනර්ජනණීය බල ශක්තිය එක්කිරීම.
- වලව ගංගා නිම්න ආශ්‍රිතව වලව ව්‍යාපාරය තුළ කෘෂිකර්ම හා සමාජ සංවර්ධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම.
- ප්‍රතිපත්ති සම්පාදනයෙහි ලා උපයෝගී කර ගැනීම පිණිස පාර්ශවකරුවන්ගේ සහාගිත්වයෙන් පරිසර හා ස්වාභාවික සම්පත් ක්ෂේත්‍ර තුළ ඇති ගැටලු හඳුනාගැනීම හා විශ්ලේෂණය කිරීම.
- පරිසර හා ස්වාභාවික සම්පත් සංරක්ෂණයට අදාළව ප්‍රතිපත්ති සම්පාදනය කිරීම අදාළ පාර්ශ්වකරුවන්ට දැනුම් දීම සහ ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම.
- ශ්‍රී ලංකාව විසින් අත්සන් තබා ඇති බහු පාර්ශ්වික පාරිසරික සම්මුතීන්ට අනුකූලව ශ්‍රී ලංකාව විසින් ඉටුකළ යුතු ජාත්‍යන්තර බැඳීම් ඉටු කිරීම තහවුරු කිරීම.
- පරිසර හා ස්වාභාවික සම්පත්වලට අනුකූල වූ ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි උපාය මාර්ග හා ක්‍රියාකාරී සැළසුම් පිළියෙළ කිරීම හා නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- පරිසර හා ස්වභාවික සම්පත් ක්ෂේත්‍රයට අදාළ පසු විපරම් කිරීමේ ක්‍රමවේදයන් සැකසීම හා පසු විපරමෙන් ලැබෙන තොරතුරු මත පරිසර කළමනාකරණය සඳහා සුදුසු ක්‍රමෝපායයන් යෙදීම.
- ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමේ දී පරිසරයට සිදුවන බලපෑම් පිළිබඳ පර්යේෂණ පැවැත්වීම, එම තොරතුරු විශ්ලේෂණය කිරීම සහ එම තොරතුරු මහජනතාව ඇතුළු අදාළ අංශ වලට යොමු කිරීම.
- යහපත් වූ පරිසර කළමනාකරණයක් සඳහා රාජ්‍ය හා දේශපාලන අංශවල කැපවීම සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම.
- පරිසර හා ස්වාභාවික සම්පත් වලට අදාල ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ සහ වෙනත් ප්‍රධාන පාරිසරික ක්‍රියාදාමයන් පිළිබඳව ජාතික මට්ටමෙන් ජනතාව දැනුවත් කිරීම.

## ගරු මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ අමාත්‍යතුමාගේ පණිවිඩය



ශ්‍රී ලංකාව තුළ සීග්‍ර ආර්ථික සංවර්ධන ප්‍රවණතා සහ ස්වභාවික සම්පත් ආරක්ෂා කිරීම අතර සමතුළිතතාවයක් පවත්වා ගැනීමේ මග පෙන්වන්නා සහ මෙහෙයවන්නා ලෙස කටයුතු කරන මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව හා ගිණුම් 2018 වාර්තාව සඳහා පණිවිඩයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳ සතුටු වෙමි.

වර්ධනය වෙමින් පවතින මානව ජනගහනයේ මූලික අවශ්‍යතා ඉටු කිරීම හේතුවෙන් අනාගතයේදී මතුවිය හැකි සම්පත් හීනතාවයන් මගහරවා ගැනීමේ අරමුණින් අපි නව උපායමාර්ග සහ විකල්ප සම්පත් පදනම් සොයමින් සිටින්නෙමු. නීල හරිත ආර්ථික මූලාරම්භයන් හඳුන්වා දෙමින් නව ආර්ථික සංවර්ධන ඉලක්ක හා ගෝලීය තිරසර සංවර්ධන ඉලක්කයන්ට අදාල අරමුණු ඉටුකරගැනීමේලා සියළු පාර්ශවකරුවන්ගේ මැදිහත්වීම අත්‍යාවශ්‍ය වේ. දැනටමත් මාගේ අමාත්‍යාංශය යටතේ පරිසරය හා ස්වභාවික සම්පත් සංරක්ෂණය හා තිරසාර භාවිතය සඳහා විවිධ ප්‍රතිපත්ති, උපායමාර්ග හා ක්‍රියාකාරී සැලසුම් සකස් කර ඇත. එම සැලසුම් තුළින් පරිසර දූෂණය, වන ගහනය අඩුවීම, භූමි හායනය, ජෛව විවිධත්ව හානිය හා දේශගුණ විපර්යාස යනාදී ජාතික හා අන්තර්ජාතික වශයෙන් බලපාන පාරිසරික ගැටළු අවම කිරීමට පියවර ගෙන ඇත. “පුනරුදය” පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන යටතේ ද මෙකී ගැටළු වලට පිළියම් සෙවීම සඳහා දීප ව්‍යාප්තව වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට හැකිවූ බව මාගේ විශ්වාසයයි.

එමගින් පරිසර සංරක්ෂණයට අදාල අන්තර් ජාතික සම්මුතීන් ක්‍රියාත්මක කිරීමෙහිලා වගකීම් නිසි පරිදි ඉටු කර ගැනීමට හැකියාව ලැබී ඇති අතර එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියෙහි (UNFCCC) 21 වන සැසිවාරයේදී ඇති කර ගත් එකඟතාවයන් අනුව ගෝලීය උණුසුම අවම කිරීම සඳහා දේශීය දායකත්වය යටතේ හරිතාගාර වායු විමෝචනය අවම කර ගැනීම සඳහා වූ උපායමාර්ගික ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කර ප්‍රධාන විෂය ක්ෂේත්‍ර 13ක් යටතේ ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත. තවද ගෝලීය හා කලාපීය මට්ටමෙන් ඉටු කරන ලද කාර්යයන් ඉතා ප්‍රශස්ත මට්ටමක පැවති බව සතුටින් සඳහන් කරමි.

කෘෂිකර්මාන්තය ප්‍රධානතම ජීවනෝපාය කරගත් බහුතර වැසියන් වෙසෙන වියළි කලාපය සරු ගොවිබිමක් බවට පත් කරගැනීමේ අභිලාශයෙන් 2018 වසරේදී මොරගහකන්ද කළු ගඟ ජලාශයන්හි ඉදිකිරීම් අවසන් කිරීමෙන් පසුව හෙක්ටයාර් 83,000ක ගොවි බිම් සඳහා දෙකන්නයේ වගා කිරීමට අවශ්‍ය ජල පහසුකම් සැපයීමටත් මෙගා වොට් 25ක ජලවිදුලි ධාරිතාවක් ජාතික විදුලි බල පද්ධතියට එක්කිරීමට හැකිවිය. එසේම මහවැලි ප්‍රදේශ සංවර්ධනය යටතේ බහු කාර්ය සංවර්ධන ව්‍යාපෘතීන් පාරිසරික සුරක්ෂිත බව තහවුරු කරමින් දේශගුණ විපර්යාසයන්ගේ අයහපත් බලපෑම් අවම කිරීම සඳහා ක්‍රියත්මක කිරීමට හැකිවීම ද අප ලද ජයග්‍රහණයකි.

මෙහිදී අප්‍රතිහත ධෛර්යයෙන් කටයුතු කළ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය සහ එහි අධීක්ෂණය යටතේ පවතින අනෙකුත් රාජ්‍ය හා ව්‍යවස්ථාපිත ආයතන මෙන්ම සංවර්ධන ව්‍යාපෘති වල සියළුම කාර්ය මණ්ඩල වලටද පසුගිය වසරේදී මාගේ අමාත්‍යාංශයේ විවිධ වැඩසටහන් සඳහා සහයෝගය දක්වමින් ක්‍රියාත්මක වූ රේඛීය හා පලාත් අමාත්‍යාංශ හා ආයතන වල කාර්ය මණ්ඩලයට ද ස්තූතිය පිරිනැමීමට මෙය අවස්ථාවක් කරගනිමි.

මෛත්‍රීපාල සිරිසේන

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍ය

## ගරු මහවැලි සංවර්ධන හා පරිසර රාජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය



මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධිත ආයතන වල වාර්ෂික කාර්යසාධන වාර්තාව හා ගිණුම් 2018 වාර්තාව ඉදිරිපත් කරන මෙම අවස්ථාවේදී ඒ සඳහා පණිවිඩයක් ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව ඉතා සතුටට පත් වෙමි.

ස්වභාවික සම්පත් පරිසරයට හානි නොවනසේ තිරසරව භාවිතාව තහවුරු කර ගනිමින් හා මනාව කළමනාකරණය කර ගනිමින් සමස්ත ජීවින්ට යහපත් පරිසරයක් ඇති කිරීම සඳහා වූ අභියෝගාත්මක අරමුණ සපුරා ගැනීම උදෙසා මෙන්ම ජනතාවගේ ජීවන තත්වය ඉහල නැංවීමට අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකවන රාජ්‍ය හා ව්‍යාවස්ථාපිත ආයතන විසින් සිදු කරනු ලබන කාර්යභාරය අගය කළ යුතුව ඇත.

වර්තමානයේ අප සැමට මුහුණ පැමට සිදුව ඇති දේශගුණ විපර්යාසයන්ගේ අභියෝගයන් මෙන්ම, ආර්ථික සමාජීය හා සංස්කෘතික වශයෙන් මුහුණ දෙන ගැටලු සඳහා තිරසර විසඳුම් සොයමින් ගොඩබිම ගුවන මෙන්ම මහා සාගරයේ සුරක්ෂිතාව රැකගැනීම සඳහා අප සැම වෙත වගකීම් රාශියක් පැවරී ඇත.

මහවැලි සංවර්ධන හා පරිසර විෂය භාර ගරු අමාත්‍යවරයා ලෙස අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන්ගේ නායකත්වය හා මහපෙන්වීම මෙන්ම අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ සහයෝගයද සහිතව නීල හරිත ආර්ථික අභිමතාර්ත යතාර්තයක් කර ගැනීමේ කටයුතු අප විසින් මේ වන විටත් ආරම්භකර ඇත. ඒ සඳහා ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ගිවිසුම් හා සම්මුතීන් වලට බැඳීම හරහා ගෝලීය වශයෙන් පරිසර සංරක්ෂණයට ගන්නා වූ ක්‍රියාමාර්ග ජාතික වශයෙන් පමණක් නොව ජාත්‍යන්තර වශයෙන්ද මේ වන විට ඇගයීමට ලක්ව ඇත.

අප අමාත්‍යාංශය විසින් පරිසර සංරක්ෂණය හා තිරසරව කළමනාකරණය කිරීම මෙන්ම මහවැලි සංවර්ධන වැඩසටහන් යටතේ ග්‍රාමීය ප්‍රදේශ කේන්ද්‍ර කරගනිමින් යටිතල පහසුකම් සංවර්ධනය මගින් ආර්ථික සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශ නිලධාරීන් ලබාදුන් දායකත්වය මෙන්ම, අනුබද්ධ ආයතන වල කාර්ය මණ්ඩලය කරන්නාවූ මෙහෙය ඇගයීමටද මෙය අවස්ථාවක් කර ගනිමි.

අජිත් මාන්නප්පෙරුම
**මහවැලි සංවර්ධන හා පරිසර රාජ්‍ය අමාත්‍ය**

## මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවිඩය



මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ හා අනුබද්ධිත රාජ්‍ය හා ව්‍යවස්ථාපිත ආයතනවලට අදාළ “වාර්ෂික කාර්යසාධන වාර්තාව හා ගිණුම් 2018 වාර්තාව” මගින් අප අමාත්‍යාංශයට අදාළව ක්‍රියාත්මක පරිසර සංරක්ෂණ වැඩසටහන්, මහවැලි සංවර්ධන වැඩසටහන්, බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රම සහ අප අමාත්‍යාංශයේ එක් එක් අංශවල හා ආයතනවල වාර්ෂික කාර්යසාධන හා ගිණුම් වාර්තා ඉදිරිපත්කර ඇත.

2018 වර්ෂය තුළ පරිසර සංරක්ෂණය පිළිබඳව මූලික වගකීම දරණ අප අමාත්‍යාංශය අත්පත් කරගත් ප්‍රගතිය පිළිබඳව සෑහීමකට පත්විය හැකිය. මෙහිදී ජෛව විවිධත්ව සංරක්ෂණය, වන ආවරණය ඉහල නැංවීම වෙනුවෙන් ක්‍රියාත්මක වූ වනරෝපා වැඩසටහන, දේශගුණ විපර්යාස මගින් ඇතිවන පරිසර හානිය අවම කිරීම සඳහා සැකසූ වැඩසටහන්, භෞමික හා සමුද්‍රීය දූෂණ පාලනයට මැදිහත් වීම, ඛනිජ සම්පත් පතල් කැනීම් මගින් වන හානිය අවම කරගැනීමට කටයුතු කිරීම, වැනි වැඩසටහන් රාශියක් ක්‍රියාක්මක කර ඉහළ ප්‍රගතියක් ලබා කර ගැනීමට හැකිවිය.

තවද මෙම කාල සීමාව තුළදී මහවැලි සංවර්ධන නඩත්තු හා කළමනාකරණ වැඩසටහන්, ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් මෙන්ම මොරගහකන්ද, උමා ඔය, වෙලි ආරක්ෂණ, මහවැලි ජල සුරක්ෂිතතා ඇතුළු බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රම වලින් අදාළ ව්‍යාපෘති බල ප්‍රදේශයන්හි ජනතාවගේ සුභ සිද්ධිය වෙනුවෙන් ඉටුකරන ලද සමාජ, ආර්ථික කාර්ය භාරයද ඉතා අගය කළ යුතු මට්ටමක පවතී.

අතිගරු ජනාධිපතිතුමන්ගේ මහ පෙන්වීම යටතේ ක්‍රියාත්මක “පුනරුදය” තුන් අවුරුදු ජාතික පරිසර සංරක්ෂණ වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීමට පසුගිය වර්ෂයේ දී ද අපට හැකි වූ අතර එහි ඉහළ ප්‍රගතියක් ළඟාකරගැනීමට ද හැකිවිය. එමෙන්ම හරිත දේශගුණ අරමුදල සමඟ සම්පව කටයුතු කිරීම සඳහා අවශ්‍ය මූලික පියවර ගන්නා ලද අතර එහි ප්‍රතිලාභ ඉදිරි වසර කිහිපයේදීම ශ්‍රී ලංකාවේ පාරිසරික සංරක්ෂණය සඳහා ලබා ගැනීමට මංපෙත් විවරවී ඇත.

විශේෂයෙන් පරිසර සංරක්ෂණය සඳහා අප අමාත්‍යාංශය ජාතික මට්ටමින් පමණක් නොව ජාත්‍යාන්තරවද ගිවිසුම් හා සම්මුතීන්වලට ජාත්‍යාන්තර හවුල් කරුවන්ද සමඟ එක්ව ගෝලීය වශයෙන් පරිසර සංරක්ෂණයට කටයුතු කිරීම දක්වා වූ වගකීමට බැඳී සිටිමු.

පසුගිය වසර පුරා ඉටුකරන ලද කාර්ය සාධනය සැකෙවින් මෙම වාර්තාවෙහි සඳහන් කර ඇති අතර ඒඅනුව අප ලබාගත් ප්‍රගතිය පිළිබඳව සෑහීමකට පත්විය හැකිය. විශේෂයෙන් මේ සියළු කටයුතු වලදී අප අමාත්‍යාංශය සමඟ විෂය භාර අමාත්‍යතුමන් ලෙස අතිගරු ජනාධිපතිතුමන් විසින් ලබා දෙන නායකත්වය හා මග පෙන්වීම කෘතඥතා පූර්වකව සටහන් කරමි. එමෙන්ම ගරු මහවැලි සංවර්ධන හා පරිසර රාජ්‍ය ඇමතිතුමන්ගේ මහ පෙන්වීම මෙහිලා අගය කිරීමටද මෙය අවස්ථාවක් කරගනු රිසියෙමි. මෙම අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති හා වැඩසටහන් කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා අමාත්‍යාංශයේ හා අනුබද්ධ ආයතනවල මෙන්ම ව්‍යාපෘතිවල සියළුම කාර්ය මණ්ඩලවල කැපවීම වෙනුවෙන් කෘතඥතාවය පලකිරීමටද රිසියෙමි.

අනුර දිසානායක
ලේකම්
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

# පටුන

**හැදින්වීම** ........................................ 1.

**මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශ මූල්‍ය ප්‍රගති සාරාංශය** ........................................ 2.

**I** වන කොටස

**අමාත්‍යාංශය යටතේ සෘජුවම ක්‍රියාත්මක ප්‍රධාන ව්‍යාපෘතිවල ප්‍රගතිය** ........................................ 6.

1. මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය ........................................ 7.
2. උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය ........................................ 19.
3. වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය ........................................ 26.
4. මහවැලි ජල සම්පත් සුරක්ෂිතතා හා ආයෝජන වැඩසටහන ........................................ 36.
5. පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය ........................................ 43.
6. මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය ........................................ 52.

II වන කොටස

**සෘජු විදේශ ප්‍රදාන මගින් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති ප්‍රගතිය** ........................................ 54.

**1. අමත්‍යාංශය විසින් සෘජුවම ක්‍රියාත්මක කරන ව්‍යාපෘති**

1. ශ්‍රී ලංකාවේ මොන්ට්‍රියල් සන්ධානයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම ........................................ 55.
2. මානව පෝෂණය හා යහපැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා ජෛවවිවිධත්වය හා තිරසාර භාවිතය අනුප්‍රවාහගත කිරීමේ ව්‍යාපෘතිය ........................................ 60.
3. ශ්‍රී ලංකාවේ කෘෂි පාරිසරික කලාප සංරක්ෂණය සහ දේශගුණික විපර්යාස වලට ජනතාව අනුගත කිරීමේ ව්‍යාපෘතිය ........................................ 62.
4. මිනමාටා සම්මුතියට අදාල ඇගයීම ........................................ 65.
5. සෞඛ්‍ය හා පරිසර ප්‍රතිපත්ති සඳහා වායු තත්ත්ව තක්සේරුව පිළිබඳ ව්‍යාපෘතිය ........................................ 67.

**2. අමත්‍යාංශය සහ එක්සත් ජාතීන්ට අනුබද්ධ ආයතන ඒකාබද්ධව ක්‍රියාත්මක කරන ව්‍යාපෘති**

**1.** දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාරකරණ ව්‍යාපෘතිය ........................................ 70.

**2**. මහවැලි ගංගා ද්‍රෝණිය ආශ්‍රිත කෘෂිකාර්මික ප්‍රජාව දේශගුණ විපර්යාස වල අහිතකර බලපෑම් වලට අනුහුරු කරවීමේ ව්‍යාපෘතිය…........................................ 73.

**3**. පාරිසරික සංවේදී භූමි ප්‍රදේශ වල ජෛව විවිධත්ව සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම හා පරිසර පද්ධති සේවා නඩත්තු කිරීමේ ව්‍යාපෘතිය ........................................ 76.

**4**. මධ්‍යම කඳුකරයේ හායනයට පත් වූ කෘෂිකාර්මික ඉඩම් පුනුරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය ........................................ 81.

5. පොලික්ලෝරනේටඩ් බයිෆිනයිල් අඩංගු උපකරණ පරිසර හිතකාමී ලෙස කළමනාකරණය හා බැහැර කිරීමේ ව්‍යාපෘතිය ........................................ 83.

**6**. ශ්‍රී ලංකාවේ තෙවන ජාතික දේශගුණ විපර්යාස සන්නිවේදන වාර්තාව සකස් කිරීමේ ව්‍යාපෘතිය ........................................ 86.

**3. එක්සත් ජාතීන්ට අනුබද්ධ ආයතන මගින් සෘජුවම ක්‍රියාත්මක කරන ව්‍යාපෘති**


1. SWITCH – Asia, තිරසර පරිභෝජන හා නිෂ්පාදන පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සංරචක ව්‍යාපෘතිය ……………........................................................................89.
2. ජෛවවිවිධත්වයට අදාල 6 වන ජාතික වාර්තාව (2016 – 2018) ...............................92.
3. ජෛවවිවිධත්ව සංරක්ෂණය සඳහා අවශ්‍ය මූල්‍ය අවශ්‍යතාවයන් (BIOFIN).................93.
4. ජෛවසුරක්ෂිතතාවය පිළිබඳ කාර්ටජිනා සන්ධානයට අනුගතව ජාතික ජෛවසුරක්ෂිතතා මූලාකෘතිය ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය .................................................................94.
5. ජාතික වශයෙන් යෝග්‍ය හරිතාගාර වායු විමෝචන අවම කිරීමේ ක්‍රියාකාරකම් සකස් කිරීම ........................................................................................................96.
6. දේශගුණ විපර්යාස හේතුවෙන් ඇතිවන අවධානම ඇගයීම සහ ජාතික සංවර්ධන ක්‍රියාවලියට දේශගුණ විපර්යාස සඳහා අනුගත වීමේ ක්‍රියාකාරකම් අන්තර්ග්‍රහණය කිරීම සඳහා වූ තාක්ෂණික ව්‍යාපෘතිය.......................................................................97.


**III වන කොටස**


**මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයට අයත් රාජ්‍ය හා ව්‍යාවස්ථාපිත ආයතනවල ප්‍රගතිය** .............98.

1. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ...............................................................................99.
2. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ......................................................................112.
3. වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව ...................119.
4. මධ්‍යම පරිසර අධිකාරිය......................................................................................128.
5. ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය ..........................................................144.
6. මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය....................................153.
7. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය.......................................................................163.
8. රාජ්‍ය දැව සංස්ථාව ...........................................................................................169.
9. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය ..............................................................174.
10. ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය.......................................189.
11. මහවැලි උපදේශන කාර්යාංශය ............................................................................195.


**IV වන කොටස**


**මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ එක් එක් අංශ මගින් ක්‍රියාත්මක කරන වැඩසටහන්වල ප්‍රගතිය.** ..........................................................................................................198.

1. වායු සම්පත් කළමනාකරණ හා ජාතික ඕසෝන් ඒකකය ..........................................199.
2. ජෛවවිවිධත්ව අංශය ........................................................................................203.
3. දේශගුණ විපර්යාස අංශය ...................................................................................208.
4. භූමි සම්පත් අංශය.............................................................................................213.
5. පරිසර දූෂණ පාලන හා රසායන ද්‍රව්‍ය කළමනාකරණ අංශය .....................................218.
6. වන සම්පත් අංශය ............................................................................................222.
7. පරිසර සැලසුම් හා ආර්ථික අංශය.........................................................................226.
8. පරිසර අධ්‍යාපන හා ප්‍රවර්ධන අංශය.....................................................................232.

9. ප්‍රතිපත්ති සැලසුම් හා නියාමන අංශය ........................................ 236.
10. අන්තර්ජාතික සබඳතා අංශය ........................................ 238.
11. නීති අංශය ........................................ 242.
12. ආයතන අංශය ........................................ 244.
13. විමර්ශන අංශය ........................................ 247.
14. මානව සම්පත් සංවර්ධන අංශය ........................................ 249.
15. අභ්‍යන්තර විගණන අංශය ........................................ 251.
16. ඉඩම් අංශය ........................................ 253.
17. ඉංජිනේරු තාක්ෂණ සේවා හා ප්‍රසම්පාදන අංශය ........................................ 255.
18. ජල සම්පත් කළමණාකරණ අංශය ........................................ 257.

**V වන කොටස**
පුනරුදය පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන ........................................ 259.

**VI වන කොටස**
මූල්‍ය විශ්ලේෂණය සහ ගිණුම් සාරාංශය 2018 ........................................ 263.

**VII වන කොටස**
අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ........................................ 273.

# 1. හැඳින්වීම

**"මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය" වෙත 2015 වර්ෂයේ සිට පරිසර සංරක්ෂණ ක්ෂේත්‍රය**ට අමතරව මහවැලි විශේෂ බල ප්‍රදේශ සංවර්ධනය කිරීම සහ එම ප්‍රදේශවල ජීවත්වන පුරවැසියන්ගේ ජීවන තත්වය ඉහලනැංවීම හා ආයෝජන අවස්ථා වැඩිදියුණු කිරීමේ වගකීම්ද සමග වඩා පුළුල් කාර්යභාරයක් පැවරී ඇත. මහවැලි සංවර්ධන ක්ෂේත්‍රයේ හා පරිසර කළමණාකරණ හා ස්වභාවික සම්පත් සංරක්ෂණය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සම්පාදනයෙහිලා 2018.01.01 සිට 2018.12.31 දක්වා වූ වසරක කාලය තුල සිදු කරණ ලද කාර්යභාරය "වාර්ෂික කාර්යසාධන වාර්තාව හා ගිණුම් 2018" යන නමින් මෙම වාර්තාව ඉදිරිපත් කරයි. මෙම වාර්තාව මගින් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් හා ක්‍රියාකාරකම්වල අත්පත් කර ගන්නා ලද ප්‍රගතිය සහ "පුනරුදය" පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන හි එක් එක් අංශ අත්පත් කර ගන්නා ලද ප්‍රගතිය මෙහි දක්වා ඇත.

ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය වේගවත්වීමත් ජනතාවගේ ජීවන ක්‍රමය වෙනස්වීමත් හේතුවෙන් පරිසරයට ඇතිවන බලපෑම් අවම කිරීම සඳහා පරිසර විෂය භාර අමාත්‍යාංශය සහ අනුබද්ධ ආයතන ප්‍රමුඛ සමස්ත රාජ්‍ය යාන්ත්‍රණයම ආයතනික, නෛතික හා තාක්ෂණික රාමුව ශක්තිමත් කරගනිමින් පවතින සමයක පරිසර සංරක්ෂණය මෙන්ම යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති මගින් ජනතාවගේ ජීවන තත්ත්වය තිරසර හා සකසුරුවම් ගොඩනැංවීම සඳහා විෂයභාර අමාත්‍යතුමන් ලෙස අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ පසුගිය වසරේදී **මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය**ට හැකි විය.

මහවැලි බල ප්‍රදේශයන්හී මනා ජල කළමනාකරණයන් හඳුන්වා දෙමින් එම ජන පදිකයින්ගේ ආර්ථිකය නගා සිටුවන අතර පරිසර සංරක්ෂණය හා ස්වභාවික සම්පත් සංරක්ෂණය තහවුරු කිරීම සඳහා ප්‍රමුඛස්ථානය ලබා දෙමින් දේශගුණ විපර්යාසයන් ගේ බලපෑම් හමුවේ ඇතිවන බලපෑම් අවම කිරීමට අවශ්‍ය කටයුතු සලසමින් ජනතාවගේ වර්තමාන හා අනාගත සම්පත් අවශ්‍යතා තහවුරු කිරීමට කටයුතු කර ඇත.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, රාජ්‍ය දැව සංස්ථාව, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය පරිසර සංරක්ෂණ අංශය යටතට ගැනෙන ආයතන වන අතර ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳව මධ්‍යම උපදේශක කාර්යාංශය, මහවැලි උපදේශන කාර්යාංශය මහවැලි සංවර්ධන අංශය යටතට ගැනෙන ප්‍රධාන ආයතන වේ.

රජයේ සංවර්ධන න්‍යාය පත්‍රයේ ප්‍රමුඛස්ථානයක් ගනු ලබන මොරගහකන්ද/ කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය, උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය, වේලි ආරක්ෂණ සහ ජලසම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය, මහවැලි ජල සම්පත් සුරක්ෂිත හා ආයෝජන වැඩසටහන හා පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතීන් මෙන්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතන හා සියළු අංශ මගින් සිදුකරනු ලබන සංවර්ධන කටයුතුවල පසුගිය වසරතුල සිදුකරණ ලද කාර්යය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කිරීමට මෙම වාර්තාව මගින් අපේක්ෂා කරනු ලැබේ.

# අමාත්‍යාංශ මූල්‍ය ප්‍රගතිය 2018.01.01 සිට 2018.12.31 දක්වා

| | අංශය | 2018 ප්‍රතිපාදන (රු.මි.) | 2018.12.31 දිනට ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | (රු.මි.) | මූල්‍ය % |
| 1 | මහවැලි සංවර්ධන | 36,157.47 | 34,671.31 | 95.9 |
| 2 | පරිසර සංරක්ෂණ | 1,707.97 | 1,566.04 | 91.7 |
| 3 | අමාත්‍යාංශය යටතේ ඇති රාජ්‍ය ආයතන | 1,782.50 | 1,691.36 | 94.9 |
| 4 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 913.60 | 911.95 | 99.8 |
| 5 | වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකරන දෙපාර්තමේන්තුව | 1,367.62 | 448.84 | 32.8 |
| 6 | අමාත්‍ය කාර්යාලය | 3.59 | 2.70 | 75.2 |
| 7 | රාජ්‍ය අමාත්‍ය කාර්යාලය | 3.67 | 3.39 | 92.4 |
| 8 | අමාත්‍යාංශ පරිපාලනය | 18.72 | 17.07 | 91.2 |
| | උප එකතුව | 41,955.14 | 39,312.66 | 93.7 |
| 7 | එක්සත් ජාතීන්ගේ අනුබද්ධ ආයතන සමඟ ක්‍රියාත්මක ප්‍රදාන ව්‍යාපෘති සඳහා එම ආයතන ප්‍රතිපාදන | 934.94 | 1106.89 | 118.4 |
| | උප එකතුව | 42,890.08 | 40,419.55 | 94.2 |
| 8 | පුනරුදය විෂය යටතේ ජනාධිපති කාර්යාලය වෙතින් | 108.78 | 100.38 | 92.3 |
| | එකතුව | 42,998.86 | 40,519.93 | 94.2 |

## අමාත්‍යාංශය යටතේ සෘජුවම ක්‍රියාත්මක ප්‍රධාන ව්‍යාපෘති මූල්‍ය හා භෞතික ප්‍රගතිය

| | ව්‍යාපෘතිය | 2018 වාර්ෂික ප්‍රතිපාදන (රු.මි.) | | 2018.12.31 දිනට මූල්‍ය හා භෞතික ප්‍රගතිය | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රතිපාදන | සංශෝධිත | වියදම (රු.මි.) | බැදීම් (රු.මි.) | එකතුව (රු.මි.) | මූල්‍ය % | භෞතික % |
| 1 | මොරගහකන්ද කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය | 11,400.00 | 18,877.70 | 16,030.05 | 2403.23 | 18,433.28 | 97.6 | 95 |
| 2 | උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය | 11,300.00 | 7,510.00 | 6,523.30 | 920.60 | 7,443.90 | 99.1 | 88.4 |
| 3 | මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන | 7,380.00 | 5,199.00 | 5,108.39 | | 5,108.39 | 97.4 | 97 |
| 4 | වේලි ආරක්ෂණ හා ජලසම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය | 1,440.00 | 2,540.00 | 2,283.05 | | 2,283.05 | 89.9 | 100 |
| 5 | පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය(ESCAMP) | 910.00 | 950.00 | 950.00 | 48.90 | 998.90 | 105 | 100 |
| 6 | මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය | 5.10 | 5.14 | 0.14 | | 0.14 | 2.7 | |
| 7 | ශක්‍යතා අධ්‍යන | 50.00 | 28.03 | 21.54 | | 21.54 | 76.8 | 95 |
| | එකතුව | 32,485.10 | 35,109.87 | 30,916.47 | 3,372.73 | 34,289.20 | 97.7 | |

## අමාත්‍යාංශය යටතේ සෘජුවම ක්‍රියාත්මක විදේශීය ප්‍රදාන අරමුදල් ව්‍යාපෘති මූල්‍ය හා භෞතික ප්‍රගතිය

| | ව්‍යාපෘතිය | 2018 වාර්ෂික ප්‍රතිපාදන (රු.මි.) | | 2018.12.31 දිනට මූල්‍ය හා භෞතික ප්‍රගතිය | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රතිපාදන | සංශෝධිත | වියදම (රු.මි.) | බැදීම් (රු.මි.) | එකතුව | මූල්‍ය % | භෞතික % |
| 1 | ශ්‍රී ලංකාවේ මොන්ට්‍රියල් සන්ධානයේ ක්‍රියාත්මකවීම. | 25.16 | 30.16 | 29.95 | | 29.95 | 99.3 | 100 |
| 2 | මානව පෝෂණය හා යහපැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා ජෛව විවිධත්වය හා තිරසාර භාවිතය අනුප්‍රවාහගත කිරීම. | 16.47 | 16.47 | 8.79 | | 8.79 | 53.3 | 60 |
| 3 | දේශගුණික විපර්යාස වලට අනුහුරුවීම සඳහා කෘෂි ජෛවවිවිධත්වය අනුප්‍රවාහගත කිරීම. | 8.84 | 13.79 | 12.74 | | 12.74 | 92.4 | 93 |
| 4 | මිනමාටා සම්මුතියට අදාල ඇගයීම. | 5.00 | 5.00 | 4.07 | | 4.07 | 81.4 | 100 |
| 5 | පරිසරය හා සෞඛ්‍ය ප්‍රතිපත්ති සඳහා වායු තත්ව තක්සේරු කිරීමේ ව්‍යාපෘතිය | 4.29 | 4.29 | 0.58 | | 0.58 | 13.5 | 20 |
| 6 | වනහායනය හා වනහරණය හේතුවෙන් සිදුවන හරිතාගාර වායු විමෝචනය වැළැක්වීමේ වැඩසටහන | 4.03 | 4.03 | 4.03 | | 4.03 | 100 | 100 |
| | **එකතුව** | **63.79** | **73.74** | **60.16** | | **60.16** | **81.6** | |

## අමාත්‍යාංශය හා එක්සත් ජාතීන්ගේ අනුබද්ධ අනුයෝජිත ආයතන එක්ව ක්‍රියාත්මක විදේශීය ප්‍රදාන ව්‍යාපෘති මූල්‍ය හා භෞතික ප්‍රගතිය

| | ව්‍යාපෘතිය | 2018 වාර්ෂික ප්‍රතිපාදන (රු.මි.) | | 2018.12.31 දිනට මූල්‍ය හා භෞතික ප්‍රගතිය | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රතිපාදන | සංශෝධිත | වියදම (රු.මි.) | බැදීම් (රු.මි.) | එකතුව | මූල්‍ය % | භෞතික % |
| 1 | දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය | 1,145.00 | 1,084.60 | 764.89 | | 764.89 | 71 | 50 |
| 2 | මහවැලි ගංගාද්‍රෝණි ආශ්‍රිත ගොවිජනපදවල කෘෂිකාර්මික ප්‍රජාව දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම්වලට අනුහුරු කරවීමේ ව්‍යාපෘතිය | 553.10 | 553.10 | 411.70 | | 411.70 | 74.4 | 89 |
| 3 | පාරිසරික අධි සංවේදී ප්‍රදේශවල පරිසර පද්ධති සහ ජෛව විවිධත්වය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය. | 106.00 | 137.38 | 113.93 | | 113.93 | 82.9 | 83 |
| 4 | මධ්‍යම කඳුකරයේ හායනයට පත් වූ කෘෂිකාර්මික ඉඩම් පුනුරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය | 29.90 | 29.90 | 24.58 | | 24.58 | 82.2 | 87 |
| 5 | පොලික්ලෝරනේටඩ් බයිෆිනයිල් අඩංගු උපකරණ පරිසර හිතකාමීලෙස කළමනාකරණය හා බැහැර කිරීමේ ව්‍යාපෘතිය | 27.34 | 27.34 | 17.80 | | 17.80 | 65.1 | 80 |
| 6 | ශ්‍රී ලංකාවේ දේශගුණ විපර්යාස වාර්තාකරණය පිළිබඳ තෙවන ජාතික සන්නිවේදන වාර්තාව සකස්කිරීම. | 20.52 | 20.52 | 20.11 | 0.83 | 20.94 | 102 | 90 |
| | **එකතුව** | **1,881.86** | **1,852.84** | **1,353.01** | **0.83** | **1,353.84** | **73.1** | |

## එක්සත් ජාතීන්ට අනුබද්ධ අනුයෝජිත ආයතන විසින් සෘජුවම ක්‍රියාත්මක විදේශීය ප්‍රදාන ව්‍යාපෘති මූල්‍ය හා භෞතික ප්‍රගතිය

| | ව්‍යාපෘතිය | 2018 වාර්ෂික ප්‍රතිපාදන (රු.මි.) | | 2018.12.31 දිනට මූල්‍ය හා භෞතික ප්‍රගතිය | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රතිපාදන | සංශෝධිත | වියදම (රු.මි.) | බැදීම් (රු.මි.) | එකතුව | මූල්‍ය % | භෞතික % |
| 1 | Switch-Asia තිරසර පරිභෝජන හා නිෂ්පාදන පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සංරචක ව්‍යාපෘතිය | 95.50 | 95.90 | 86.31 | | 86.31 | 90 | 100 |
| 2 | ජෛවසුරක්ෂිතතාවය පිළිබඳ කාර්ටජීනා සන්ධානයට අනුගතව ජෛවසුරක්ෂිතතා මූලාකෘතිය ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය | 48.08 | 66.98 | 55.15 | | 55.15 | 82.3 | 85 |
| 3 | ජෛවවිවිධත්ව සංරක්ෂණය සඳහා අවශ්‍ය මූල්‍ය අවශ්‍යතාවයන් (BIOFIN) | 52.53 | 52.53 | 36.89 | | 36.89 | 70.2 | 79.5 |
| 4 | දේශගුණ විපරියාස හේතුවෙන් ඇතිවන අවධානම් ඇගයීම සහ ජාතික සංවර්ධන ක්‍රියාවලියට දේශගුණ විපර්යාස සඳහා අනුගත වීමේ ක්‍රියාකාරකම් අන්තර්ග්‍රහණය සඳහා වූ තාක්ෂණික ව්‍යාපෘතිය | 50.40 | 50.40 | 36.00 | | 36.00 | 71.4 | 80 |
| 5 | ජෛවවිවිධත්වයට අදාල 6වන ජාතික වාර්තාව | 8.21 | 8.21 | 6.05 | | 6.05 | 73.7 | 88 |
| 6 | ජාතික වශයෙන් යෝග්‍ය හරිතාගාර වායු විමෝචන අවම කිරීමේ ක්‍රියාකරකම් සකස් කිරීම | 7.74 | 7.74 | 7.61 | | 7.61 | 98.3 | 100 |
| | **එකතුව** | **252.46** | **281.76** | **228.01** | | **228.01** | **80.9** | |

## අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතන මූල්‍ය හා භෞතික ප්‍රගතිය

| | ව්‍යාපෘතිය | 2018 වාර්ෂික ප්‍රතිපාදන (රු.මි.) | | 2018.12.31 දිනට මූල්‍ය හා භෞතික ප්‍රගතිය | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රතිපාදන | සංශෝධිත | වියදම (රු.මි.) | බැදීම් | එකතුව | මූල්‍ය % | භෞතික % |
| 1 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 834.20 | 913.22 | 911.95 | | 911.95 | 99.9 | 100 |
| 2 | මධ්‍යම පරිසර අධිකාරිය | 1,591.30 | 354.3 | 301.6 | 48.29 | 349.89 | 98.8 | 100 |
| 3 | මැණික් හා ස්වර්ණාභරණ පුහුණු හා පර්යේෂණ ආයතනය | 60.00 | 60.00 | 58.93 | | 58.93 | 98.2 | 100 |
| 4 | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | 2810.50 | 2733.50 | 2587.26 | 30.19 | 2,617.45 | 95.8 | 98 |
| 5 | සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරිය | 90.00 | 90 | 77.25 | | 77.25 | 85.8 | 88.6 |
| 6 | වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකරන දෙපාර්තමේන්තුව | 1,367.62 | 1,367.62 | 448.84 | | 448.84 | 32.8 | 36 |
| 7 | රාජ්‍ය දැව සංස්ථාව | ප්‍රග්ධන ප්‍රතිපාදන වෙන්වී නොමැත | | | | | | |
| 8 | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැනීම් කාර්යාංශය | | | | | | | |
| 9 | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | | | | | | | |
| 10 | ඉංජිනේරුමය කාර්යන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය | | | | | | | |
| 11 | මහවැලි උපදේශන කාර්යාංශය | | | | | | | |
| | **එකතුව** | **6,753.62** | **5,518.64** | **4,385.83** | **78.48** | **4,464.31** | **80.9** | |

## අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක අංශ මූල්‍ය හා භෞතික ප්‍රගතිය

| | ව්‍යාපෘතිය | 2018 වාර්ෂික ප්‍රතිපාදන (රු.මි.) | | 2018.12.31 දිනට මූල්‍ය හා භෞතික ප්‍රගතිය | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රතිපාදන | සංශෝධිත | වියදම (රු.මි.) | බැදීම් | එකතුව | මූල්‍ය % | භෞතික % |
| 1 | භූමි සම්පත් | 9.70 | 8.14 | 8.37 | | 8.37 | 102.8 | 100 |
| 2 | වන සම්පත් | 2.00 | 2.00 | 2.00 | | 2.00 | 100.0 | 100 |
| 3 | දේශගුණ විපර්යාස | 1.50 | 1.50 | 1.47 | | 1.47 | 98.0 | 97 |
| 4 | නීති අංශය | 0.30 | 0.25 | 0.24 | | 0.24 | 96.0 | 100 |
| 5 | ජෛව විවිධත්ව | 4.00 | 4.00 | 3.76 | | 3.76 | 94.0 | 99 |
| 6 | වායු සම්පත් කළමනාකරණ හා ජාතික ඕසෝන් ඒකකය | 3.00 | 2.26 | 2.10 | | 2.10 | 92.9 | 97 |
| 7 | පරිසර සැලසුම් හා ආර්ථික | 1.00 | 0.96 | 0.79 | | 0.79 | 82.3 | 88 |
| 8 | පරිසර අධ්‍යාපන පුහුණු පර්යේෂණ | 6.00 | 6.00 | 4.87 | | 4.87 | 81.2 | 85 |
| 9 | ප්‍රතිපත්ති සැලසුම් හා නියාමන | 0.50 | 1.20 | 0.91 | | 0.91 | 75.8 | 95 |
| 10 | ආයතන | | | | | | | |
| | අමාත්‍ය කාර්යාලය | 4.90 | 3.59 | 2.70 | | 2.70 | 75.2 | |
| | රාජ්‍ය අමාත්‍ය කාර්යාලය | 2.50 | 3.67 | 3.39 | | 3.39 | 92.4 | |
| | ආයතන හා පාලන | 15.40 | 18.72 | 17.07 | | 17.07 | 91.2 | |
| 11 | පරිසර දූෂන පාලන හා රසායනද්‍රව්‍ය කළමනාකරණය | | | | | | | |
| 12 | ආයෝජන ප්‍රවර්ධන | | | | | | | |
| 13 | ජාත්‍යාන්තර සබඳතා | | | | | | | |
| 14 | මානව සම්පත් සංවර්ධන | | | | | | | |
| 15 | විමර්ශණ | | | | | | | |
| 16 | අභ්‍යන්තර විගනන | | | | | | | |
| | එකතුව | **50.80** | **52.29** | **47.67** | | **47.67** | **91.2** | |

## අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතනවල වාර්ෂික ආදායම් ඉලක්ක හා ප්‍රගති විග්‍රහය - 2018.12.31

| | ආයතනය | 2018 ආදායම් ඉලක්කය (රු.මි.) | 2018.12.31 දිනට ප්‍රගතිය | | අරමුදල් (ස්ථිර තැන්පත් හෝ වෙනත් ආයෝජන) (රු.මි.) | භාණ්ඩාගාර දායකත්වය 2018 (රු.මි.) |
|---|---|---|---|---|---|---|
| | | | (රු.මි.) | % | | |
| 1 | ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය | 14,600.00 | 12,800.00 | 87 | 2,000.00 | 25.00 |
| 2 | රාජ්‍ය දැව සංස්ථාව | 4,700.00 | 4,727.00 | 101 | 2,097.00 | 2,014.00 |
| 3 | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය | 3,436.00 | 3,002.00 | 87 | 2817.91 | 1,700.00 |
| 4 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 1,910.00 | 2011.40 | 105.3 | 4.20 | 937.9 |
| 5 | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | 1,193.16 | 753.49 | 63.2 | 86.90 | |
| 6 | ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය | 934.00 | 509.21 | 54.5 | 643.00 | 25.00 |
| 7 | මධ්‍යම පරිසර අධිකාරිය | 335.13 | 330.00 | 98.5 | 9.9 | |
| 8 | මහවැලි උපදේශක සේවා කාර්යාංශය (පුද්.) සමාගම | 100.39 | 90.00 | 90 | | |
| 9 | වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකරන දෙපාර්තමේන්තුව | 50.00 | 50.44 | 100 | 2.24 | 52.68 |
| 10 | සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය | 33.71 | 34.45 | 102 | 12.56 | |
| 11 | මැණික් හා ස්වර්ණාභරණ පුහුණු හා පර්යේෂණ ආයතනය | 12.09 | 12.43 | 102.8 | 5.01 | |
| | එකතුව | **27,304.48** | **24,320.42** | **89.1** | **7,678.72** | **4,754.58** |

# I වන කොටස

## අමාත්‍යාංශය යටතේ සෘජුවම ක්‍රියාත්මක ප්‍රධාන ව්‍යාපෘති

- මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය
- උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය
- වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය
- මහවැලි ජල සම්පත් සුරක්ෂිතතා හා ආයෝජන වැඩසටහන
- පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය
- මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය



# මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය

මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය 1964 සහ 1968 කාල සීමාව තුළ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) මගින් එහි ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ (FAO) විශේෂ නියෝජිතයින් විසින් සහතික කරන ලද වාර්තා අනුව මහවැලි මහ සැලැස්මේ ඉදිකිරීමට නියමිත වුවත් නොයෙකුත් කාරණා නිසා දශක 04 ක් පමණ කාල සීමාවක් මෙය ඉදිකිරීම ප්‍රමාද විය. එබැවින් එවකට කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජනසේවා අමාත්‍යවරයා ලෙස කටයුතු කළ වත්මන් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් රජරට ගොවි ජනතාවගේ කඳුළු කතාව නිම කිරීමේ අරමුණින් 2007 ජනවාරි මස 25 දින මෙම ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කරන ලදී.

## ව්‍යාපෘතියේ ප්‍රතිලාභ

**කෘෂිකාර්මික සංවර්ධනය -** අඹන්ගඟ හා කලුගඟ මගින් ගලාගිය ජලයෙන් හෙක්ටයාර 82,000 ක් පමණ යල මහ සංවර්ධනය කළ ද, එය ස්ථිර නොවී ය. නමුත් මොරගහකන්ද - කළුගඟ ව්‍යාපෘතියත් සමග හෙක්ටයාර 82,000 ක් සඳහා යල මහ දෙකන්නයේ ජලය සැපයීමට හැකිවීම. එනම් විවිධ ප්‍රදේශවල 100% සිට 154% දක්වා වූ වගා තීව්‍රතාවයේ සාමාන්‍ය අගය 181% දක්වා ඉහළ නංවාලීමට හැකියාව ඇත. මෙහි ඍජු ප්‍රතිලාභයක් ලෙස හෙක්ටයාරයකට ලැබෙන වී අස්වැන්න ඉහළ යන අතර, අතිරේක කෘෂිකාර්මික නිෂ්පාදනයට ද විශාල දායකත්වයක් සපයනු ඇත. අපේක්ෂිත මුළු කෘෂිකාර්මික වාර්ෂික ප්‍රතිලාභය රු.මි. 4,000 ක් පමණ වේ.

**විදුලි බල උත්පාදනය -** මොරගහකන්ද ව්‍යාපෘතියේ විදුලි බල නිෂ්පාදනය මෙ.වො. 25 ක් වන අතර, එමගින් වාර්ෂිකව ඉතිරි කෙරෙන ඉන්ධන පිරිවැය රු.මි. 1545 ක් පමණ වේ.

**මිරිදිය ධීවර කර්මාන්තය -** මොරගහකන්ද - කලුගඟ සංවර්ධන ව්‍යාපෘතියත් සමග ප්‍රධාන ජලාශ දෙක හා ඉන් පෝෂිත ජලාශ සමගින් වාර්ෂිකව මිරිදිය මත්ස්‍ය නිෂ්පාදන හැකියාව ටොන් 4,700ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එහි වටිනාකම රු.මි. 940 ක් පමණ වේ.

**පහළ නිම්න ප්‍රදේශවල ගංවතුර පාලනය -** මොරගහකන්ද - කළුගඟ සංවර්ධන ව්‍යාපෘතියත් සමඟ වාර්ෂිකව සිදුවන සෝමාවතිය හා මනම්පිටිය ප්‍රදේශවල ජල ගැල්ම නවතාලිය හැකිවේ.

**පාරිසරික සංචාරක කර්මාන්තය -** වස්ගමුව ජාතික වනෝද්‍යානය, මින්නේරිය ජාතික වනෝද්‍යානය හා රිවස්ටන් වැනි සංචාරකමය ප්‍රදේශයන්ට අතර මැදිව මෙම මොරගහකන්ද ජලාශය ඉදිවීමත් හා සීගිරිය, දඹුල්ල, අලුවිහාරය, මහියංගනය යන ඓතිහාසික ස්ථානයන්ට පහසුවෙන් ලගාවිය හැකි මාර්ග පද්ධතියත් සමඟ සංචාරකමය වශයෙන් හිතකර පරිසර පද්ධතියක් බිහිව ඇත. එබැවින් අනාගතයේ සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීමෙහිලා මෙහි පිහිටීම ඉතාමත් වැදගත් වේ.

**රැකියා අවස්ථා ප්‍රවර්ධනය -** මොරගහකන්ද - කළුගඟ සංවර්ධන ව්‍යාපෘතියත් සමග නැවත පදිංචි කරන 3,000ක පමණ පවුල්වල තරුණ තරුණියන්හට ඉලක්කගත පුහුණු වැඩසටහන් ලෙස මැණික් හාස්වර්ණාභරණ පුහුණුව, හොටෙල් කළමනාකරණ පුහුණුව, ස්වයං රැකියා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන බැවින් අනාගත විරැකියාවන්ට විසඳුම් ලබාදෙමින් පවතී. ඊට අමතරව මෙම ව්‍යාපෘතිය හරහා රැකියා අවස්ථා 650ක් පමණ ලබාදී ඇත.

මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතියේ පළමුවන අදියරේ ක්‍රියාකාරකම් පහතින් දැක්වේ.

1. මොරගහකන්ද ජලාශයේ ප්‍රධාන වේල්ල අඹන්ගඟ හරහා ඉදි කිරීම, සැදලි වේලිදෙකක්, වාන් දොරටු, ඉහළ ප්‍රධාන ඇලසොරොව්ව, ඉහළ ඇලහැර ඇලසොරොව්ව, මෙගාවොට් 25ක ජල විදුලි බලාගාරයක් සහ 16Kmක් දුරට දිවෙන විදුලි සම්ප්‍රේෂණ පද්ධතිය.
2. අඹන්ගගේ ප්‍රධාන අතු ගංගාවක්වන කළුගඟ හරස්කොට කළුගඟ ජලාශයේ ප්‍රධාන වේල්ල ඉදි කිරීම. මෙහි මැටි සහ ගල් වලින් සාදන වේලි 2ක්ද ප්‍රධාන වේල්ලේ වම් ඉවුරු සොරොව්වත්,සැදලි වේල්ලේ දකුණු ඉවුරු සොරොව්වත් වම් ඉවුරු ඇලට හා දකුණු ඉවුරු ඇලට සම්බන්ධ කෙරේ.එසේම ප්‍රධාන වේල්ලේ ඇති තවත් උමගක් හැරවුම් ඇලට සම්බන්ධ කොට හැරවුම් උමඟට යාකෙරේ.
3. නැවත පදිංචි කිරීමේ ප්‍රදේශ 2 සඳහා සමාජ හා වාරිමාර්ග යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
    i. කළුගඟ ජලාශ ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය වන ප්‍රදේශ (එෆ් කලාපය) වම් ඉවුර හෙක්ටයාර් 1900ක්ද දකුණු ඉවුර හෙක්ටයාර් 1700කින්ද සමන්විතය.
    ii. කවුඩුල්ල වම් ඉවුර පුළුල් කිරීමේ ව්‍යාපෘතිය යටතේ සිදුවන සංවර්ධන කලාපය (ඩී කලාපය)හෙක්ටයාර් 7000කින් සමන්විතය.
4. අවතැන් වූ පවුල් 3000ක ඉඩම් අත්පත් කරගැනීමේ හා නැවත පදිංචි කිරීමේ කටයුතු.

5. මොරගහකන්ද කළුගඟ ජලාශ ව්‍යාපෘතිය සඳහා ලබාදී ඇති EIA වාර්තා දෙකට අනුව පාරිසරික බලපෑම් අවම කිරීමේ කාර්යයන් ක්‍රියාවට නැංවීම.

සංවර්ධන ක්‍රියාවලිය වර්ෂ 2007 දී ආරම්භ වූ අතර ඒ හා සම්බන්ධ පහත සඳහන් ක්‍රියාවලි 2018 .01.01 සිට 2018.12.31 දක්වා ක්‍රියාත්මක කිරීම.



මැදිරිගිරිය ක්‍රීඩාංගනය

**මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතියට අදාල මූලික කාර්යයන්**

කළු ගලින් පුරවන ලද වේල්ලක් සහ RCCවේල්ලක් වශයෙන් වේලි 02ක්, අනෙකුත් නිර්මිතයන් ඉදිකිරීම සඳහා EPCකොන්ත්‍රාත්තුවක් යටතේ සිනෝහයිඩ්‍රොචීන සමාගමට පිරිනමා ඇත. කොන්ත්‍රාත්තුවේ සම්පූර්ණ වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 252.3 කි. කොන්ත්‍රාත්තුවේ වටිනාකමින් 85%ක් චීන සංවර්ධන බැංකුවෙන් ලැබෙන අතර, ඉතිරි 15% ශ්‍රී ලංකා රජය මඟින් සපයනු ලබයි. විදුලි බලාගාරයේ යෝජිතව තිබූ සැලැස්ම වෙනස් කිරීම හේතුවෙන් ඇ.ඩො.මි. 10.94ක් සිනෝහයිඩ්‍රො සමාගමට අමතරව ගෙවීමට සිදු වූ අතර එසේම සැදලිවේල්ල ඉදි කිරීමේදී එහි අත්තිවාරම කැණීමේදී තිබූ දෝෂ තත්වයන් නිසා ඇ.ඩො.මි. 15.48ක් අමතරව ගෙවීමට සිදු විය.

මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතියේ ප්‍රධාන නිර්මිතයන්ට අදාල විස්තර පහත දැක්වේ.

| අයිතමය | වැඩ විස්තරය | **2018.12.30** වන විට සමුච්චිත වැඩ ප්‍රගතිය (%) | **2018.01.01** සිට **2018.12.31** දක්වා මූල්‍ය ප්‍රගතිය (රුපියල් මිලියන) |
|---|---|---|---|
| 1.0 | ප්‍රධාන වේල්ල ඉදි කිරීම | 2017වර්ෂයේ අවසන් කර ඇත. | 2,481.65 |
| 2.0 | සැදලි වේලි 01 (ඇලහැර ප්‍රධාන ඇලට හා ඉහළ ඇලහැර ඇල මාර්ගයට ජලය යොමු කරන දොරටු, ජල විදුලි බලාගාරය, වාන් දොරටු ඇතුළු තවත් ඉදි කිරීම්ද ඇතුළත්ව) | 2017වර්ෂයේ අවසන් කර ඇත. | |
| 3.0 | සැදලි වේල්ල අංක 02 | 2010 වර්ෂයේ අවසන් කර ඇත. | |




කළුගඟ ජලාශ ව්‍යාපෘතියේ ප්‍රධාන ඉදිකිරීම්

**කළුගඟ ජලාශ ව්‍යාපෘතියේ ප්‍රධාන ඉදිකිරීම්**

මෙම ව්‍යාපෘතිය සඳහා මූල්‍ය පහසුකම් සපයනු ලබන්නේ අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වන කුවෙට් අරමුදල, සංවර්ධනය සඳහා වන සෞදි අරමුදල, ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල සහ ශ්‍රී ලංකා ජනරජය මගිනි.

කළුගඟ ජලාශය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්තුව චීන සිනෝහයිඩ්‍රෝ සමාගම වෙත වර්ෂ 2014 මාර්තු මස 12 වන දින පිරිනමා ඇත. අදාල ව්‍යාපෘතිය සඳහා වන කොන්ත්‍රාත් වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 110.75ක් වන නමුත් ඉදිකිරීම්හි වෙනස් වීම් හා අමතර වැඩ කිරීමට සිදුවීමත් සමග කොන්ත්‍රාත්තුවේ සම්පූර්ණ වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 201.05ක් වේ.

කළුගඟ ජලාශයේ මූලිකවැඩ සංවර්ධන ව්‍යාපෘතියේ එක් එක් අංගයන්හි විස්තර පහත දැක්වේ.

| අයිතමය | වැඩ විස්තරය | **2018.01.01 සිට 2018.12.31 දක්වා අවසන් කර ඇති වැඩ ප්‍රමාණය(%)** | **2018.12.31 වන විට සමුච්චිත වැඩ ප්‍රගතිය (%)** | **2018.01.01 සිට 2018.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය (රුපියල් මිලියන)** |
|---|---|---|---|---|
| 1 | ප්‍රධානවේල්ල ඉදි කිරීම | 10.0 | 95.0 | 7,115.94 |
| 2 | සැදලි වේල්ල ඉදිකිරීම. | 34.0 | 90.0 | |

**පහළ නිම්න සංවර්ධන වැඩ කටයුතු**

නැවත පදිංචි කිරීමේ ප්‍රදේශ දෙකෙහි සංවර්ධන කටයුතු රජයේ මුදලින් සිදුකරන අතර,කළුගඟ පහල නිම්නය යටතේ (Fකලාපයේ) හෙක්ටයාර් 3600ක් සහ කවුඩුල්ල වම් ඉවුර පුළුල් කිරීමේ ප්‍රදේශයේ (ඩී කලාපයේ) හෙක්ටයාර් 7000ක් සංවර්ධනය කෙරේ. එහි එක් එක් අයිතමයන්හි විස්තර පහත දැක්වේ.

**කළුගඟ දකුණු ඉවුර**

| නො. | වැඩ විස්තරය | **2018.01.01සිට 2018.12.31 දක්වාඅවසන් කරන ලද වැඩ විස්තරය** | **2018.12.31 දක්වා අවසන් කරන ලද සමුච්චිත වැඩ ප්‍රමාණය** |
|---|---|---|---|
| 1 | ගොඩනැගිලි | 44ක්අවසන් කර ඇත | 163ක්අවසන් කර ඇත |
| 2 | මාර්ග | | |
| 2.1 | ප්‍රධාන මාර්ග | - | 10 km අවසන් කර ඇත |
| 2.2 | වෙළඳ මාර්ග | 8 km අවසන් කර ඇත | 28.9 km අවසන් කර ඇත |
| 2.3 | ගම්මාන මාර්ග | 5 km අවසන් කර ඇත | 35 km අවසන් කර ඇත |
| 3 | වාරිමාර්ග වැඩ | | |
| 3.1 | D & Fඇල මාර්ග | 3.5 km අවසන් කර ඇත | 47 km අවසන් කර ඇත |
| 3.2 | කුඩා වැව් | **-** | 9ක්අවසන් කර ඇත |
| 3.3 | සම මට්ටමේ දියමංකඩ | 3න් -17% අවසන්කර ඇත | 3න් **-46%** අවසන්කර ඇත |

**කළුගඟ වම් ඉවුර**

| නො. | වැඩ විස්තරය | 2018.01.01. සිට 2018.12.31 දක්වා අවසන් කරන ලද වැඩ විස්තරය | 2018.12.31 දක්වා අවසන් කරන ලද සමුච්චිත වැඩ ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | ගොඩනැගිලි | 25 ක්අවසන් කර ඇත | 138 ක්අවසන් කර ඇත |
| 2 | මාර්ග | | |
| 2.1 | ප්‍රධාන මාර්ග | 3 km අවසන් කර ඇත | 27.96 km අවසන් කර ඇත |
| 2.2 | වෙළඳ මාර්ග | 4.65 km අවසන් කර ඇත | 20.39 km අවසන් කර ඇත |
| 2.3 | ගම්මාන මාර්ග | 3.95 km අවසන් කර ඇත | 45.28 km අවසන් කර ඇත |
| 3 | වාරිමාර්ග වැඩ | | |
| 3.1 | ප්‍රධාන ඇල | - | 2.9 kmවැඩඅවසන් කර ඇත |
| 3.2 | ශාඛා සහඋප ශාඛා ඇල මාර්ග | - | 4.71 km අවසන් කර ඇත |
| 3.3 | D & Fඇල මාර්ග | 9.7 km අවසන් කර ඇත | 89.26 km අවසන් කර ඇත |
| 3.4 | කුඩා වැව් | - | 2ක්අවසන් කර ඇත |

**මැදිරිගිරිය සංවර්ධන ප්‍රදේශය - D කලාපය**

| නො. | වැඩ විස්තරය | 2018.01.01. සිට 2018.12.31 දක්වා අවසන් කරන ලද වැඩ විස්තරය | 2018.12.31 දක්වා අවසන් කරන ලද සමුච්චිත වැඩ ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | ගොඩනැගිලි | 19 ක් අවසන් කර ඇත | 58 ක්අවසන් කර ඇත |
| 2 | මාර්ග | | |
| 2.1 | ප්‍රධාන මාර්ග | 8 km අවසන් කර ඇත | 8 km අවසන් කර ඇත |
| 2.2 | වෙළඳ මාර්ග | 35.1 km ප්‍රමාණයෙන් 20%ක වැඩ අවසන් කර ඇත | 35.1 kmප්‍රමාණයෙන් 60%කවැඩ අවසන් කර ඇත |
| 2.3 | ගම්මාන මාර්ග | 56 km ප්‍රමාණයෙන් 20%ක වැඩ අවසන් කර ඇත | 56 kmප්‍රමාණයෙන් 70%කවැඩ අවසන් කර ඇත |
| 3 | වාරිමාර්ග වැඩ | | |
| 3.1 | ප්‍රධාන ඇල | - | 6.5 km අවසන් කර ඇත |
| 3.2 | ශාඛා සහඋප ශාඛා ඇල මාර්ග | 1 km අවසන් කර ඇත | 16 km අවසන් කර ඇත |
| 3.3 | D & Fඇල මාර්ග | - | Structures අවසන් කර ඇත |
| 3.4 | කුඩා වැව් | 2 ක්අවසන් කර ඇත | 13 ක්අවසන් කර ඇත |



ලග්ගල ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල



ලග්ගල පාසල් අධ්‍යාපන සංකීර්ණය

**ඉඩම් අත්පත් කර ගැනීම සහ නැවත පදිංචි කිරීම**

සමාජ ආර්ථික සමීක්ෂණයට අනුව මොරගහකන්ද සහ කළුගඟ සංවර්ධන ව්‍යාපෘති දෙක හේතුවෙන් පවුල් 2874 ක් පමණ බලපෑමට ලක්වන බවට ගණන් බලා ඇත. නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය දැනටමත් සකස් කර ඇති අතර එය බලපෑමට ලක් වූ පවුල් අතර බෙදා දී ඇත. ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක වෙමින් පවතී.

නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය 2018.01.01 සිට 2018.12.31 දක්වා - මොරගහකන්ද ජලාශය

| ග්‍රාම නිලධාරි වසම | නැවත පදිංචිකල පවුල් ගණන | | ගොඩ ඉඩම් සහ වාරි ඉඩම් සඳහා රු.ලක්ෂ 16 ලබාගත් පවුල් ගණන | | වාරි ඉඩම් සඳහා රු.ලක්ෂ 12 ලබාගත් පවුල් ගණන | |
|---|---|---|---|---|---|---|
| | 2018.01.01 සිට 2018.12.31 දක්වා | 2018.12.31 දිනට සමුච්චිත ප්‍රගතිය | 2018.01.01 සිට 2018.12.31 දක්වා | 2018.12.31 දිනට සමුච්චිත ප්‍රගතිය | 2018.01.01 සිට 2018.12.31 දක්වා | 2018.12.31 දිනට සමුච්චිත ප්‍රගතිය |
| තලාගොඩ | 0 | 328 | 0 | 85 | 2 | 60 |
| කඩවත | 2 | 255 | 1 | 69 | 0 | 96 |
| කඹරව | 2 | 308 | 0 | 96 | 1 | 39 |
| ගල්පෝරුගොල්ල | 0 | 160 | 4 | 69 | 1 | 30 |
| ඇලගමුව | 5 | 247 | 0 | 93 | 0 | 50 |
| මැදපිහිල්ල | 3 | 183 | 2 | 133 | 0 | 32 |
| කෝන්ගහවෙල | 3 | 46 | 0 | 33 | 0 | 8 |
| මාරගමුව | 0 | 13 | 0 | 12 | 0 | 1 |
| මිල්ලගහමුලතැන්න | 12 | 150 | 8 | 117 | 1 | 23 |
| රජාවෙල | 0 | 8 | 0 | 6 | 0 | 0 |
| ලේල්ඔය | 11 | 11 | 2 | 2 | 1 | 1 |
| කිරිඔය | 15 | 15 | 1 | 1 | 11 | 11 |
| | 9 | 9 | 0 | 0 | 9 | 9 |
| **එකතුව** | **62** | **1733** | **18** | **716** | **26** | **360** |

නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය 2018.01.01 සිට 2018.12.31 දක්වා - කළුගඟ ජලාශය

| ග්‍රාම නිලධාරි වසම | නැවත පදිංචිකල පවුල් ගණන | | ගොඩ ඉඩම් සහ වාරි ඉඩම් සඳහා රු.ලක්ෂ 16 ලබාගත් පවුල් ගණන | | වාරි ඉඩම් සඳහා රු.ලක්ෂ 12 ලබාගත් පවුල් ගණන | |
|---|---|---|---|---|---|---|
| | 2018.01.01 සිට 2018.12.31 දක්වා | 2018.12.31 දිනට සමුච්චිත ප්‍රගතිය | 2018.01.01 සිට 2018.12.31 දක්වා | 2018.12.31 දිනට සමුච්චිත ප්‍රගතිය | 2018.01.01 සිට 2018.12.31 දක්වා | 2018.12.31 දිනට සමුච්චිත ප්‍රගතිය |
| කරදමුල්ල | 1 | 211 | 1 | 9 | 0 | 12 |
| ගුරුවෙල | 0 | 10 | 0 | 0 | 0 | 0 |
| ගල්ගෙදවල | 3 | 34 | 0 | 2 | 1 | 4 |
| රාවණාගම | 0 | 94 | 0 | 14 | 0 | 12 |
| ගෝනවල | 0 | 81 | 0 | 10 | 0 | 6 |
| පල්ලේගම | 3 | 184 | 0 | 22 | 3 | 27 |
| මිණිරන්කැටිය | 4 | 164 | 1 | 12 | 2 | 30 |
| හල්මිණිය | 0 | 36 | 0 | 0 | 0 | 2 |
| ඉමාඩුව | 2 | 79 | 0 | 0 | 1 | 8 |
| ගහහේන්වල | 0 | 30 | 0 | 2 | 1 | 2 |
| රඹුක්ඔළුව | 1 | 59 | 0 | 5 | 1 | 3 |
| අකරහැඩිය | 1 | 12 | 0 | 8 | 1 | 1 |
| **එකතුව** | **15** | **994** | **2** | **84** | **10** | **107** |



ලග්ගල රෝහල



ලග්ගල පොලීසිය

**ඉඩම් අත්පත් කර ගැනීම සහ වන්දි ගෙවීම**

2018.01.01 සිට 2018.12.31 දක්වා එක් එක් සංවර්ධන ප්‍රදේශ සඳහා ගෙවන ලද වන්දි මුදල් පහත දැක්වේ.

| සංවර්ධන ප්‍රදේශ | 2018.01.01 සිට 2018.12.31දක්වා වන්දි ගෙවීම (රු. මිලියන) | 2018.12.31දක්වා සමුච්චිත වන්දි ගෙවීම (රු.මිලියන) |
|---|---|---|
| මොරගහකන්ද | 785.00 | **4,562**.78 |
| කළුගඟ | **840.00** | 3,008.78 |
| මැදිරිගිරිය | **6.60** | **63.72** |
| එකතුව | 1,631.60 | **7,635.28** |

**පාරිසරික බලපෑම් අවම කිරීම සහ පාරිසරික නිර්දේශ ක්‍රියාත්මක කිරීම**
**මොරගහකන්ද කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘතිය**

මොරගහකන්ද කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘතියේ ජලාධාර සංරක්ෂණ කළමනාකරණ සැලැස්මේ සඳහන් නිර්දේශ 2018.01.01 දින සිට 2018.12.30 දින දක්වා කාල සීමාව තුළ දී ජලාධාර ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රගතිය පහත සඳහන් පරිදි දක්වමු.

**මීටර් 100ක ස්වාරක්ෂක කලාපයේ සංවර්ධන කටයුතු**

**රුක්රෝපණය - මොරගහකන්ද ජලාශය**

12,548 පමණ ශාක අතරේ වියළි මෝසම් වනාන්තර ප්‍රදේශවලින් සොයාගත් ශාක වන කුඹුක්, මී, දඹ ආදීය වේ. මේවා මොරගහකන්ද ජලාශය හා ස්වාරක්ෂිත කළාපය තුළ ස්ථානගත කර ඇති අතර, මේ සියල්ලම මොරගහකන්ද මධ්‍යම පැළ තවාන මගින් නිෂ්පාදනය කරන ලදී.

**වනාන්තර සංවර්ධනය**

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම අනුව ලබාදුන් රු.18,465,000.00ක ප්‍රතිපාදන යටතේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වන සංරක්ෂණ ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

**වනජීවී සංරක්ෂණ වැඩසටහන්**

- පුබ්බිලිය සඳවාසලකන්ද විදුලි වැටේ ඕපල්ගල සිට මාරාගමුව දක්වා කි.මී.3ක පමණ කොටස සංස්ථාපනය කිරීම
- ගලබොඩ වන සත්ත්ව විදුලි වැටේ කි.මී.0.5ක කොටස විතැන් කිරීම

- ගලබොඩ, කළුන්දෑව, මා ඔය ප්‍රදේශයන් හි විවේකාගාර තුනක් ඉදිකිරීම
- අගුණවැල්පැලැස්ස විදුලි වැටේ කි.මී.5 පමණ කොටස සුද්ධ පවිත්‍ර කිරීම

**පරිසර දින වැඩසටහන්**

- 2018 ලෝක පරිසර දින වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන යටතේ ආදාවල, ඕපල්ගල හා ගලබොඩ යන පාසල්වල වැඩසටහන් පැවැත්වීම.

**මොරගහකන්ද ජලාශයේ ජල සාම්පල් පරීක්ෂා කිරීම**

ජලාශයෙන් ගුණාත්මක බවෙන් යුත් ජලය පිට කිරීම ව්‍යාපෘතියේ අරමුණක් බැවින් ජලාශයට ජලය ලබා ගන්නා ස්ථාන වන මා ඔය, අඹන් ගඟ, ගලබොඩ ඔය, පොත්තටවෙල, තෙල්ගමු ගඟ හා ජලාශයෙන් ජලය බැහැරවන ස්ථාන කිහිපයක ජලයේ pH අගය, විද්‍යුත් සන්නායකතාවය, උෂ්ණත්වය, අවිලතාවය, Do, BOD, COD හා නයිට්‍රේට ප්‍රමාණය යන ගුණාංගයන් 2018 වසර පුරාවට පරීක්ෂාවට ලක් කරන ලදී.

**ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම**
**ගොවිපළ තුළ පාංශු සංරක්ෂණය**

පාංශු සංරක්ෂණ වැඩසටහන් 12ක කටයුතු නිම කර ඇති අතර අනෙකුත් ඉඩම් කට්ටි 13 ක පාංශු සංරක්ෂණ කටයුතු සිදු කරමින් පවතී. මේ සඳහා රු. 901,662.00ක මුදලක් ගොවීන් වෙත ගෙවීම් කරන ලදී.

**වගා ළිං පුනරුත්ථාපනය**

මොරගොල්ල ප්‍රදේශයේ වගාළිං 23ක්, ගලබොඩ ප්‍රදේශයේ වගා ළිං 14,බඹරගහවත්ත ප්‍රදේශයේ වගාළිං 07ක්, හැළඹගහවත්ත ප්‍රදේශයේ වගාළිං21ක් සහ පුබ්බිලිය ප්‍රදේශයේ වගාළිං 08ක රොන්මඩ ඉවත් කිරීම සහ ගැඹුරු කිරීම මගින් පුනරුත්ථාපන කටයුතු සිදු කරන ලදී.
බණ්ඩරයාය ප්‍රදේශයේ නළ ළිදක් ඉදිකිරීම

**කුඩා අමුණු සහ වාරිමාර්ග පුනරුත්ථාපනය කිරීම**

| අමුණ/වාරිමාර්ගය | සිදු කළ/ සිදුකිරීමට ඇති වැඩ කොටස | තත්වය |
|---|---|---|
| තලයාය සේනාගම ඇළ | වැටුම් ව්‍යුහ 18ක් හා අවහැරවුම් 14ක් ඉදිකිරීම | රු.1,889,216.25ක් ගෙවීම කරන ලදී. |

**කෘෂි මාර්ග පුනරුත්ථාපනය**

- ගොවින්ගේ අස්වැන්න හානියකින් තොරව ආරක්ෂාකාරීව ආර්ථික මධ්‍යස්ථාන කරා ගෙන යෑම සඳහා ව්‍යාපෘතිය විසින් ග්‍රාමීය මාර්ග සංවර්ධනය කරන ලදි. 2017 වර්ෂය තුළ දී කෘෂි මාර්ග 04ක් ඉදිකරන ලදී
- අඳාවල කෘෂිමාර්ගයේ කි.මී. 1.6 පමණ කොටස පුනරුත්ථාපනය කිරීම
- මාරාගමුව කි.මී.3.5 පමණ වන කෘෂි මාර්ගය පුනරුත්ථාපනය කිරීම

**මොරගහකන්ද ජලාධාර ප්‍රදේශයේ පැළ රෝපණ කටයුතු**

- ගම්මිරිස්, පුවක්, දෙළුම් ආදී පැළ ජලාධාරක ප්‍රදේශයේ ජීවත්වන මිනිසුන්ට බෙදා දීම

| ග්‍රාම නිලධාරි වසම | ගොවීන් සංඛ්‍යාව | පැළ වර්ගය හා සංඛ්‍යාව |
|---|---|---|
| ආඳාවල | 56 | යෝධ උණ - 70<br>පුවක් - 335<br>දෙහි - 201<br>දෙළුම් - 64<br>දිවුල් - 67 |
| ගලබොඩ | 31 | යෝධ උණ - 75<br>දෙහි - 225<br>ගම්මිරිස් - 205<br>පුවක් - 220<br>දිවුල් - 114<br>පැෂන් ෆෘට් - 118 |
| මොරගොල්ල | 69 | පුවක් - 345<br>දෙහි - 345<br>ගම්මිරිස් - 345<br>දෙළුම් - 138<br>බෙලි - 69 |
| සේනාගම | | ගම්මිරිස් - 160<br>පුවක් - 160 |

**මැදිරිගිරිය ප්‍රදේශයේ පැළ රෝපණ කටයුතු**

- මැදිරිගිරිය කොට්ඨාශ කළමනාකරණ කාර්යාලයේ සිට ප්‍රධාන මාර්ගය දෙපස රොබරෝසියා පැළ හා නා පැළ සිටුවීම
- ව්‍යාපෘති කාර්යාලයේ සිට බණ්ඩාර වැව දක්වා මාර්ගය දෙපස කොහොඹ පැළ හා කුඹුක් පැළ සිටුවීම
- හෙක්ටයාර 1ක පමණ පස් ලබා ගන්නා ලද ප්‍රදේශයේ පුනරුත්ථාපන කටයුතු
- මැදිරිගිරිය කන්තලේ මාර්ගයේ කටයුතු EIA වාර්තාව අනුව සිදු කිරීම

**කළු ගඟ ව්‍යාපෘතිය ස්වාරක්ෂක කලාපය සංවර්ධනය**

යෝජිත කළුගඟ ජලාශය වටා පිහිටි මීටර් 100කින් යුක්ත ස්වාරක්ෂක කලාපය තුළ පැළ 1100 ක ප්‍රමාණයක් සිටවන ලදි.කළුගඟ ජලාශයේ ස්වාරක්ෂක මායිම්වල සීමාංක ලකුණු කිරීම.

## වන වගා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

**ව්‍යාපෘතිය මඟින් සිදු කළ වන වගා වැඩසටහන්**

- කළුගඟ ප්‍රදේශය තුළ පිහිටි වැව් රක්ෂිතවල (වැව් අංක 05, 07, 09,) පැළ 5000 ක ප්‍රමාණය සිටුවීම සිදු කරන ලදි.
- මාර්ග දෙපස පැළ සිටුවීම හා උද්‍යාන අලංකරණ කටයුතු.
  - අඩවි වන කාර්යාලය
  - ප්‍රාදේශීය රෝහල - ලග්ගල
  - ගොවිජන සේවා මධ්‍යස්ථානය - ලග්ගල
  - ලග්ගල මධ්‍ය මහ විද්‍යාලය
  - හීරටි ඔය හා ගුරුවෙල ප්‍රාථමික විද්‍යාල
- මීට අමතරව පාසල්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව වැනි රජයේ ආයතන සඳහා පැළ ලබා දීම
- ග්‍රාමීය ලියාපදිංචි පැළ තවාන් 04ක් ස්ථාපනය කිරීම
- මා ඔය පුනරුත්ථාපනය කළ ස්ථානවල නඩත්තු කටයුතු සිදු කිරීම

ලග්ගල හරිත නගර වැඩසටහනට අනුව ලග්ගල ප්‍රධාන මාර්ගය ඇතුළු අනෙකුත් ප්‍රදේශ ආවරණය වන කි.මී. 9ක් පමණ වන මාර්ගවල පැළ 2257 ක පමණ ප්‍රමාණයක් සිටුවීමේ කටයුතු සිදු කිරීම.

**වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන වැඩසටහන්**

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව අතර ඇති අවබෝධතා ගිවිසුමට අදාළව පෝෂණීය වනවගා වැඩසටහන්, ස්වාරක්ෂක කලාප සංවර්ධනය, ගිණි පටි පිහිටවීම, වනවගා නඩත්තු හා මායිම් සලකුණු කිරීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත රුපියල් මිලියන 15 ක ප්‍රතිපාදන ලබාදෙන ලදී.

- පෝෂණීය වනවගා නඩත්තුව - හෙක්. 10
- ස්වාරක්ෂක කලාප නඩත්තුව - හෙක්. 60
- ස්වාරක්ෂක කලාපයේ මායිම් සලකුණු කිරීම - කි.මී.42

**කළුගඟ මධ්‍යම පැළ තවානේ පැළ නිෂ්පාදනය**

2018 වර්ෂයේ දී පැළ 17,729ක් නිෂ්පාදනය කළ අතර මධ්‍යම පැළ තවාන මගින් කළුගඟ ජලාධාර වැඩසටහන් සඳහා පැළ 13,900ක් ලබා දෙන ලදී.

කළුගඟ මධ්‍යම පැල තවානේ නව කාර්යාල ගොඩනැගිල්ල, එය වටා තාප්පය හා ජල ටැංකිය රැඳවුම් කුළුණේ වැඩ කටයුතු නිම කරන ලදී.

**පාංශු සංරක්ෂණ වැඩසටහන්**

කළුගඟ ජලාධාර ප්‍රදේශයේ පාංශු සංරක්ෂණ නිර්මිත ක්‍රියාත්මක කළ ගොවීන් 10 දෙනෙක් සඳහා (අක්කර 30) සඳහා මුදල් ගෙවීම් කටයුතු සිදු කිරීම.

**කළුගඟ ජලාධාර ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා කුඩා පරිමාණයේ වාරි පහසුකම් ඉදිකිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

- පුනරුත්ථාපන කටයුතු සිදු කළ අමුණු දෙකක වැඩ කටයුතු සම්පූර්ණයෙන් නිම කරන ලදී.

| අමුණ | ඇස්තමේන්තුගත මුදල (රු.) | තත්වය |
|---|---|---|
| බත්තටවෙල අමුණ - දම්මන්තැන්න | 1,477,014.25 | වැඩ අවසන් කරන ලදි |
| මඩම අමුණ සහ ඇළ මාර්ගය - පුවක්පිටිය | 770,085.45 | වැඩ අවසන් කරන ලදි. |

- අමුණු හා ඇළ මාර්ග ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු හයක් සකස් කර ඇත.

**වනජීවී සංරක්ෂණ වැඩසටහන්**

- නව ජනාවාස වටා පිහිටි විදුලිවැටට සමාන්තරව හණ වගාව, දෙහි හා බෝගන්විලා සිටුවන ලදී
- ගුරුවෙල මධ්‍යම වන අලි පාලන ඒකකය සඳහා 2015 සිට ලබා දුන් පහසුකම් අඛණ්ඩව 2018 වර්ෂයේ ද ක්‍රියාත්මක කිරීම

- මසකට ඉන්ධන ලීටර් 400ක් සමඟ වාහනයක් ලබා දීම
- මසක් තුළදී අලිවෙඩි 500ක් පමණ ලබා දීම
- නවාතැන් පහසුකම් ලබා දීම
- දුරකථන පහසුකම් හා විදුලිය ලබා දීම
- වනජීවී නිලධාරීන් සඳහා දීමනා ලබා දීම

- අලි කම්වූ පිහිටුවීම හා පවත්වා ගෙන යාම - වන අලි කම්වූ ගණන 09කි. (නව ඉමාඩුව, කජුවත්ත, තෝරපිටිය, දේවාලදෙණිය, ගුරුවෙල (NO34),කබරගොයිමඩ, මහපිටිය, මධ්‍යම අලි පාලන ඒකකය සහ මා ඔය) පිහිටවන ලද අතර අඛණ්ඩව සිදුකරගෙන යාම
- නව ජනාවාස වටා කි.මී.62ක විදුලි වැට ඉදිකිරීම හා නඩත්තු කටයුතු සිදු කිරීම
- වම් ඉවුරු ප්‍රධාන ඇළ (තෝරපිටිය) ඉදිකිරීමේ දී කි.මී. 2.5 ක ප්‍රමාණයක් විදුලි වැට විතැන් කිරීම

**ජෛව විවිධත්ව සංරක්ෂණ වැඩසටහන්**

- නව සංවර්ධන කලාපය තුල පිහිටි වැව් අංක 4 සඳහා ආක්‍රමණික ශාකයක් වන සැල්විනියා මර්ධනය සඳහා කෘමීන් හඳුන්වාදීම
- සංවර්ධන කලාපය තුල ව්‍යාප්ත වී ඇති යෝධ නිදිකුම්බා හෙක්. 12 ක ප්‍රමාණයක් ඉවත් කිරීම (යකාකඩුල්ල වැව සහ මාර්ග රක්ෂිතය)
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා පොලිස් ජීවිතාරක්ෂක නිලධාරීන් සමඟ කළුගඟ ජලාශයේ අවතැන් වූ සතුන් මුදවා ගැනීමේ වැඩසටහන පැවැත්වීම

| සත්ත්ව කාණ්ඩය | මුදාගත් ප්‍රමාණය |
|---|---|
| ක්ෂීරපායින් | 12 |
| උරගයින් | 3056 |
| කෘමි | 109 |
| සන්ධිපාදකයන් | 05 |
| මෘද් වංශීන් | 67 |
| මුළු එකතුව | 3249 |

**නිලධාරීන් සහ නැවත පදිංචි කරුවන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

- ජලාධාර ප්‍රදේශය තුල ගොවින් සඳහා පාංශු සංරක්ෂණය හා තවාන් පාලනය පිළිබඳ පුහුණු වැඩසටහන් 08 ක් සිදු කිරීම
- පාසැල් ළමුන් සඳහා පරිසර සංරක්ෂණය හා ගොවිපළ කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන් 4 ක් සංවිධානය කිරීම
- පාංශු සංරක්ෂණය පිළිබඳව ස්වාභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානයේ සම්පත් දායකත්වයෙන් වැඩසටහනක් සංවිධානය කිරීම
- ආක්‍රමණශීලි ශාක පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පැළ සංරක්ෂණ සේවාව සමඟ එක්ව සංවිධානය කිරීම
- කසළ කළමනාකරණ වැඩසටහනක් කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ මඟ පෙන්වීම යටතේ MAS holding ආයතනය මඟින් සංවිධානය කිරීම

**ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

ලග්ගල නව නගරය සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ සහභාගිත්වයෙන් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වැඩසටහනක් සංවිධානය කිරීම

**පරිසර බලපත්‍ර හා අදාළ අනෙකුත් වැඩසටහන්**

- කළුගඟ ව්‍යාපෘතිය සඳහා වූ පාරිසරික බලපෑම් වාර්තාවේ වලංගු කාලය දීර්ඝ කර ගැනීම සඳහා කටයුතු කිරීම
- වම් ඉවුරු ප්‍රධාන ඇළ මාර්ගයේ පරිසර නිශ්කාෂණ කටයුතු
- කළුගඟ වේල්ල සෑදීමේ දී කොන්ත්‍රාත්කරු සඳහා Q1 හා Q2 ප්‍රදේශවලට බලපත්‍ර ලබා දීම
- වැඩබිම් ප්‍රදේශවල පාරිසරික බලපෑම් අවම කිරීමේ ක්‍රියාකාරකම් අධ්‍යනය
- වැල්ලවෙල හා ලේල්ඔය ප්‍රදේශවල ව්‍යාපෘතිය මඟින් සිදු කරන ක්‍රියාකාරකම් නිසා ප්‍රදේශයේ ඇති නිවෙස්වලට ඇති වූ බලපෑම් අධීක්ෂණය
- හත්තොට අමුණ ආශ්‍රිතව පුරාවිද්‍යා ස්මාරක වටා රක්ෂිත වෙන් කිරීම






# උමා ඔය
# බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය

උමාඔය ද්‍රෝණියේ පාරිසරික හා අනෙකුත් ජල අවශ්‍යතා වලට බලපෑමක් ඇති නොවන අයුරින් එම ද්‍රෝණියේ සිට ජල ඌනතාවයෙන් පෙලෙන දක්ෂිණ කලාපයේ කිරිඳි ඔය ද්‍රෝණියට, ජලය ඝන මීටර් මිලියන 145 ක් වාර්ෂිකව හරවා යැවීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ.

එමගින් මොණරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය සහ තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල පිහිටි නව ඉඩම් හෙක්ටාර 4500 ක් හා දැනට වගා කෙරෙන ඉඩම් හෙක්ටාර 1500 කට වාරි ජලය සැපයීම ද, මෙ. වො. 120 ක ධාරිතාවයෙන් යුත් භූගත විදුලි බලාගාරයක් මගින් ගි.වො. පැය 290 ක විදුලිය නිපදවා ජාතික විදුලිබල පද්ධතියට එකතු කිරීම ද, මොණරාගල හා හම්බන්තොට දිස්ත්‍රික්ක වල පානීය හා කර්මාන්ත සඳහා ඝන මීටර් මිලියන 30 ක ජලය සැපයීම ද, ඩයරබා ජලාශයෙන් බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල විසල් ජල සම්පාදන යෝජනා ක්‍රමයේ පානීය ජල අවශ්‍යතා සැපයීම ද, පුහුල්පොල ජලාශයෙන් බදුල්ල දිස්ත්‍රික්කයේ ඇටැම්පිටිය ජල සම්පාදන යෝජනා ක්‍රමයේ පානීය ජල අවශ්‍යතා සැපයීම ද, කුඩා ඔය ජලාශයෙන් මොණරාගල දිස්ත්‍රික්කයේ හම්බෙගමුව ප්‍රදේශයේ පානීය ජල අවශ්‍යතා සැපයීමද අපේක්ෂා කෙරේ.

**ව්‍යාපෘතියේ ප්‍රධාන අංග සහ පිරිවැය**




මූලස්ථායී වැඩ




පහළ නිම්න සංවර්ධනය

ව්‍යාපෘතිය මූලස්ථායී වැඩ හා කිරිඳි ඔය ආශ්‍රිත පහළ නිම්න සංවර්ධන වශයෙන් ප්‍රධාන අංග 2 කින් සමන්විත වන අතර, මූලස්ථායී වැඩ ඉංජිනේරුමය ප්‍රසම්පාදන හා ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක් මගින් ක්‍රියාත්මක කරන අතර, පහළ නිම්න සංවර්ධනය වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් සෘජු ශ්‍රමය යටතේ ක්‍රියාත්මක කරනු ලබයි.

ව්‍යාපෘතියේ, සමස්ථ පිරිවැය ඇ.ඩො. මිලියන 514.5 ක් සමග ශ්‍රී ලංකා රු. මිලියන 15,474.25 ක් වන අතර මූලස්ථායි වැඩ වල මුළු පිරිවැය ඇස්තමේන්තුව ඇ.ඩො. මිලියන 514.5 ක් සමග රු. මිලියන 6,122 ක් වේ.පහළ නිම්න සංවර්ධනය වැඩ වල මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 9,352.5 කි.

**ප්‍රධාන ක්‍රියාකාරකම් - මූලස්ථායි වැඩ**

උමා ඔය හරහා පුහුල්පොල දී මීටර් 35 ක් උසැති රෝලර් සම්පීඩිත කොන්ක්‍රීට් වේල්ලක් සහිත ජලාශයක් ඉදි කර එම ජලාශයට එක්වන ජලය, මා තැටිල්ල ඔය හරහා ඩයරබාහි දී ඉදිකෙරෙන මීටර 50 ක් උසැති රෝලර් සම්පීඩිත කොන්ක්‍රීට් වේල්ලක් සහිත ජලාශයට මීටර් 3,718 ක් දිග උමගක් මගින් හරවා ඩයරබා ජලාශයේසිට කි.මී. 15.4 දිග පෙරාර උමඟ තුලින් කරඳගොල්ලේදී ඉදි කෙරෙන මෙ.වො 120 ක භූගත ජල විදුලි බලාගාරය හරහා ඉහළ කිරිඳි ඔය ද්‍රෝණියට අලිකොටආර දී එක්වන සේ එම ජලය හැරවීම සිදුකරනු ලැබේ.

විදුලි බලාගාරය ආශ්‍රිතව මීටර් 618 ක් උස සිරස් පීඩන උමගක් ද, මීටර් 150 ක් උස කැලඹුම් ළිඳක් ද වන අතරවිදුලි බලාගාරයෙන් පසු නිකුත් වන ජලය, මීටර් 3,600 ක් දිග පසු-ආර උමඟ (Tailrace Tunnel) මගින් අළුතින් ඉදිකෙරෙන අලිකොට ආර පාලක ජලාශයට එක් වේ. තවද, විදුලි බලාගාරය ආශ්‍රිතව වහරු

අංගනයක් (Switch Yard) හා බදුල්ල විදුලි උපපොල දක්වා දිවෙන කි.මී. 23 ක් දිග කි. වොල්ට් 132 විදුලි සම්ප්‍රේෂණ මාර්ගයකින් ද මූලස්ථායී වැඩ සමන්විතය.

**කිරිඳි ඔය ද්‍රෝණිය ආශ්‍රිත පහළ නිම්න සංවර්ධනය**

උමා ඔය ද්‍රෝණියෙන් කිරිඳි ඔය ද්‍රෝණියට වාර්ෂිකව හරවනු ලබන ඝන මීටර මිලියන 145 ක් පමණ වන ජලයෙන් පෝෂිත වන්නා වූ ප්‍රදේශයේ වාරි හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, පහළ නිම්න සංවර්ධනය යටතේ ඉටු කරනු ලැබේ. ප්‍රතිලාභ ලබන ප්‍රදේශය මොණරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය හා තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල පිහිටා ඇති අතර මේ යටතේ ඉදි කෙරෙන අලිකොට ආර සහ කුඩා ඔය ජලාශ බදුල්ල දිස්ත්‍රික් මායිමේ පිහිටා ඇත.

මෙම සංවර්ධනයට, කිරිඳි ඔයේ අතු ගංගාවක් වන අලිකොට ආර හරහා ඉදි කෙරෙන ඝන මීටර් මිලියන 6.5 ක ධාරිතාවකින් යුත් අලිකොට ආර පාලක ජලාශය ඉදි කිරීම, කිරිඳි ඔයේ අතු ගංගාවක් වන කුඩා ඔය හරහා ඉදි කෙරෙන ඝන මීටර් මිලියන 29 ක ධාරිතාවකින් යුත් කුඩා ඔය ජලාශය ඉදි කිරීම, හඳපානාගල වැවෙහි ධාරිතාව ඝන මීටර් මිලියන 6.5 සිට ඝන මීටර් මිලියන 14 දක්වා වැඩි කිරීම,කි.මී. 48 ක් දිග හැරවුම් ඇල මාර්ග හා ඒ ආශ්‍රිත වාරි පහසුකම් ද ග්‍රාමීය වැව් පද්ධති 100 ක් පමණ සංවර්ධනය ද ඇතුළත් වේ.

**භෞතික ප්‍රගතිය**

**මූලස්ථායී වැඩ**



පුහුල්පොල වේල්ල



ඩයරබා වේල්ල



ජලාශ යා කෙරෙන උමඟ




ප්‍රධාන උමඟ




භූගත ජල විදුලි බලාගාරය



සවිකරමින් පවතින ප්‍රධාන ට්‍රාන්ස්ෆෝමරය



බලාගාරයේ විදුලි ජනකය



ඉදිකෙරෙමින් පවතින විදුලි බලාගාරයේ සිට බදුල්ල දක්වා වන විදුලි සම්ප්‍රේෂණ මාර්ගය

ව්‍යාපෘතියේ මූලස්ථායී වැඩ වල ඉදිකිරීම් 2011 මැයි මස ආරම්භ කළ අතර, 2018 දෙසැම්බර් අග වන විට මූලස්ථායී වැඩ වල සමස්ත ප්‍රගතිය 87.80% ක් වේ. මේ වන විට ඩයරබා වේල්ලෙහි හා ජලාශ යා කරන උමඟෙහි ද පසුආර උමඟෙහි ද වැඩ සම්පූර්ණයෙන්ම අවසන් කර ඇති අතර,තල බමණ යන්ත්‍ර සවි කිරීම හා භූගත ජල විදුලි බලාගාරය හා ඒ ආශ්‍රිත වැඩ අවසන් අදියරෙහි පවතී. එම වැඩ මෙම වර්ෂයේදී නිම කිරීමට අපේක්ෂිත අතර, ප්‍රධාන උමඟෙහි කිලෝ මීටර් 2.7ක පමණ දිගක් කැණීම් කිරීමට ඉතිරිව ඇත.

ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් වල විස්තරාත්මක ප්‍රගතිය පහත දැක්වේ.

| උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය මූලස්ථායී වැඩ 2018.12.31 දිනට ක්‍රියාකාරකම් වල ප්‍රගතිය | |
|---|---|
| ක්‍රියාකාරකම | භෞතික ප්‍රගතිය |
| පුහුල්පොල වේල්ල | 82.33% |
| ජලාශ සම්බන්ධිත උමඟ | 93.98% |
| ඩයරබා වේල්ල | 91.97% |
| ප්‍රධාන උමඟ | 73.19% |
| කැළඹුම් ළිඳ | 51.68% |
| ජල පීඩන සිරස් උමඟ | 92.17% |
| භූගත ජල විදුලි බලාගාරය | 90.46% |
| පිවිසුම් උමඟ | 94.77% |
| පිවිසුම් හා ප්‍රතිස්ථාපන මාර්ග | 78.51% |
| විදුලි සම්ප්‍රේෂණ මාර්ගය | 87.27% |
| ජලය පිටකරන උමඟ | 95.86% |
| **සමස්ත මූලස්ථායී වැඩ** | 87.80% |

### පහළ නිම්න සංවර්ධන වැඩවල ප්‍රගතිය

ව්‍යාපෘතියේ පහළ නිම්න සංවර්ධන වැඩ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන අතර, එම ඉදිකිරීම් 2013 ඔක්තෝබර් මස ආරම්භ කරන ලදි. මේ වන විට අලිකොට ආර පාලක ජලාශයෙහි ද හඳපානාගල ජලාශයේ ඉදිකිරීම් ද අවසන් වෙමින් පවතී.

පහළ නිම්න සංවර්ධන වැඩ වල 2018 දෙසැම්බර් අග වන විට සමස්ත ප්‍රගතිය 72.0% ක් වන අතර, ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් වල විස්තරාත්මක ප්‍රගතිය පහත දැක්වේ.



අලිකොට ආර ජලාශය



අලිකොට ආර ජලාශයේ පිටවාන



හැරවුම් ඇළ



ග්‍රාමීය වැව් පද්ධති සංවර්ධනය

| උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය - පහළ නිම්න සංවර්ධන වැඩ: 2018.12.31 දිනට ක්‍රියාකාරකම් වල ප්‍රගතිය | |
|---|---|
| ක්‍රියාකාරකම | භෞතිකප්‍රගතිය |
| අලිකොට ආර ජලාශය ඉදි කිරීම | 99.5% |
| කුඩා ඔය ජලාශය ඉදි කිරීම | 54.0% |
| හඳපානාගල වැඩි දියුණු කිරීම | 88.0% |
| හඳපානාගල වම් ඉවුර ඇල පද්ධතිය | 47.0% |
| අලිකොට ආර - කුඩා ඔය හැරවුම් ඇල | 48.0% |
| කුඩා ඔය - සිංහලයාගම වැව හැරවුම් ඇල | 64.0% |
| කුඩා වැව් පුනරුත්ථාපනය | 32/96 |
| **සමස්ථ** | **72.0%** |

විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණක් වන්නේ මේ වන විට අවසන් කර ඇති ඉදිකිරීම් හේතුවෙන් හඳපානාගල ව්‍යාපාරයේ දැනට ඇති මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණයම 2017 යල කන්නයේදී වගා කළ හැකි වූ අතර එය ව්‍යාපෘතියේ ප්‍රතිලාභ දැනටම ලැබෙමින් පවතින බවට සාක්ෂියක් බවයි.

**ව්‍යාපෘතියේ සමස්ත ප්‍රගතිය**

2018 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතියෙහි සමස්ත භෞතික ප්‍රගතිය 86.2% ක් වන අතර, සමුච්චිත වියදම රු. මිලියන 68,584.2 ක් වේ.

| ක්‍රියාකාරකම | භෞතික ප්‍රගතිය | | මූල්‍ය ප්‍රගතිය | | | |
|---|---|---|---|---|---|---|
| | සමුච්චිත ප්‍රගතිය 2017 අවසාන වන විට (%) | 2018 අවසාන වන විට සමුච්චිතප්‍රගතිය (%) | මුළු ඇස්තමේන්තු ගත පිරිවැය | 2018 අවසාන වන විට සමුච්චිත වියදම (රු. මිලි) | අතැති බිල්පත් (රු. මිලි) | 2018 අවසාන වන විට සමුච්චිත මූල්‍ය ප්‍රගතිය අතැති බිල්පත් සමග (රු. මිලි) |
| 1. මූලස්ථායි වැඩ | 82.38 | 87.80 | 80,447.5 | 62,884.4 | 209.8 | 63,094.2 |
| 2. පහළ නිම්න සංවර්ධනය | 48.0 | 72.0 | 9,352.5 | 5,699.8 | 710.8 | 6,410.6 |
| මුළු ව්‍යාපෘතියේ ප්‍රගතිය | 78.9 | 86.22 | 89,800.0 | 68,584.2 | 920.6 | 69,504.8 |

**ව්‍යාපෘතිය ඉදිකිරීමේදී ඇති වූ ප්‍රධාන ගැටළු**

ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු කරගෙන යාමේදී මුහුණපෑමට සිදු වූ ප්‍රධාන ගැටළුව වූයේ එහි ප්‍රධාන උමඟෙහි කැණීම් කරගෙන යාමේදී ඇති වූ ජල කාන්දු වීමය. ව්‍යාපෘතියෙහි ප්‍රධාන උමඟ කැණීමේදී,පළමු වරට 2014 දෙසැම්බර් මස අනපේක්ෂිතව උමඟෙහි පහළ කෙළවරේ සිට කිලෝ මීටර් 3.8 ක් දුරින් තත්පරයට ලීටර් 450 ක් පමණ ප්‍රමාණයකින් ජල කාන්දුවක් ඇති වූ අතර, ඒ හේතුවෙන් බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මකුල්ඇල්ල, වෙහෙරගල තැන්න, උඩපේරුව, බඹරගම හා හීල්ඔය ග්‍රාම නිලධාරී වසම් වල උමං මාර්ගයේ ජල කාන්දුව සිදු වූ ප්‍රදේශයට ආසන්න ව පිහිටි ප්‍රාදේශ වල ළිං සිඳී යාම, භූගත ජල මට්ටම පහත බැසීම හා නිවාස ඉරිතැලීම් හා හානි ද ප්‍රදේශයේ වගාවන්ට ජලය නොමැති වීම නිසා නිසා එම ජනතාවට අහිතකර බලපෑම් ඇති විය.

උමං වල ජල කාන්දු වැසීම සංකීර්ණ හා අභියෝගාත්මක කාර්යයක් වන අතර, ඒ සඳහා විශේෂඥ දැනුම ඇති වෘත්තිකයින් ද පලපුරුදු කාර්ය මණ්ඩලයක් ද විශේෂිත වූ ද්‍රව්‍ය හා උපකරණ අවශ්‍ය වන අතර, ඒ අනුව දේශීය හා විදේශීය විශේෂඥයින්ගේ උපදෙස් ලබා ගැනීමෙන් අනතුරුව ඒ සම්බන්ධයෙන් විශේෂඥ කොන්ත්‍රාත්කරුවකු වන සවිට්සර්ලන්තයේ මාර්ට් සමාගමට හිමිකාරිත්වය පවරන ලදි. 2015 දෙසැම්බර් මැද

වන විට ජල කාන්දුව තත්පරයට ලීටර් 47 ක් දක්වා අඩු කර ගත හැකි විය. ඉන් අනතුරුව උමඟෙහි කැණීම් නැවත ආරම්භ කරන ලද අතර විශාල ගැටළු වලින් තොරව එම කටයුතු කරගෙන යා හැකි විය.

එසේ වුවද, 2017 අප්‍රේල් මස17 වන දින උමඟෙහි පහළ කෙළවරේ සිට කිලෝ. මීටර් 8.1 ක් දුරින් කැණීම් කරගෙන යන අවස්ථාවේ උමඟෙහි විදුම් මුහුණතෙහි පාෂාණය තුල වූ පැලීම් හරහා නැවත විශාල ජල කාන්දුවකට මුහුණ දීමට සිදු විය. මෙවර ජල කාන්දුව, මීටර් 50 ක පමණ දිගක් ඇතුලත තත්පරයට ලීටර් 1,200 ක් පමණ වූ අතර, මුල් අවස්ථාවේදී සිදු වූ ජල කාන්දුව වන තත්පරයට ලීටර් 450, සමග සැසඳීමේදී එය විශාල අගයක් විය.

#### ජල කාන්දුව වැසීම සඳහා ගන්නා ලද ප්‍රතිකර්ම

මෙම ජල කාන්දුවත් සමග උමඟෙහි කැණීම් කටයුතු වහාම අත්හිටුවන ලද අතර, මේ සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමාගේ මැදිහත්වීම මත ලබා ගන්නා ලද නෝර්වේජියානු හා ස්විට්සර්ලන්ත විශේෂඥයින්ගේ උපදෙස් ලබා ගන්නා ලදි. මෙම විශේෂඥයින්ගේ උපදෙස් වූයේ මතුපිට පොළව මට්ටමේ පාරිසරික බලපෑම් සිදු නොවීමට නම් මුද්‍රා තැබීමේ කටයුතු මගින් උමඟෙහි මීටර් 100 ක දිගකදී මිනිත්තුවට ලීටර් 20 එනම්, තත්පරයට ලීටර් 1/3 ක මට්ටමකට ජල කාන්දුව අවම කළ යුතු බවයි.

මෙම ඉලක්කය සපුරා ගැනීම සඳහා උමං කැණීම් යන්ත්‍රයට තවදුරටත් උපාංග එකතු කරන ලද අතර එමගින් එම යන්ත්‍රයේ බදාම විදීමට හැකි සිදුරු ගණන 12 සිට 27දක්වා වැඩිකරන ලදි. එමගින්, බදාම විදීමේ අතිච්ඡේදනය ඉහළ මට්ටමකට ගෙන යන ලද අතර උමඟෙහි මුළු පරිධියම ආවරණය වන පරිදි වඩාත් ඵලදායීව කැණීම් සිදු කිරීමට පෙරාතුව පාෂාණය තුල ඇති ජලය පිරි කුස්තුර හා පැළුම්වසා දැමිය හැකිය. තවද, වඩාත් කාර්යක්ෂමව ජල කාන්දුව මුද්‍රා වන සේ අවශ්‍ය විට විශේෂ ශුද්‍ර සිමෙන්ති ඒ සඳහා යොදා ගැනෙන අතර ඉහළ පීඩනයකින් බදාම විදිය හැකි පරිදි නව යන්ත්‍ර හා උපාංග සවි කර ඇත.

ඊට අමතරව, මෙම කටයුතු වඩාත් ඵලදායිව ඉටු කිරීම සඳහා පහත සඳහන් විමර්ශණ කටයුතු ද පසු විපරම් කටයුතු ද ඉටුකරනු ලැබේ.

(1) නිරීක්ෂණය කරන ලද දත්ත හා තොරතුරු ආශ්‍රයෙන් උමඟෙහි කැණීම් නිසා බලපෑම් ඇති විය හැකි ප්‍රදේශ සිතියම් ගත කිරීම.
(2) පාෂාණයේ පර්යේක්ෂණ සිදුරු වල ජල මට්ටම් මැනීම
(3) දෛනිකව ළිං වල ජල මට්ටම ගැනීම
(4) ගෙවල් ඉරි තැලීම් පිළිබඳ සමීක්ෂණ හා පසු විපරම් අඛණ්ඩව කර ගෙන යාම
(5) ජාතික ගොඩනැගිලි පර්යේක්ෂණ සංවිධානයෙන් උපදෙස් ලබා ගෙන බලපෑම් ඇති වූ ප්‍රදේශයේ සිදු විය හැකි නාය යෑමේ සම්භාවිතාවය පිළිබඳ වාර්තා ලබා ගැනීම
(6) භූ විද්‍යාත්මක සිතියම් පිළියෙල කිරීම සහ පාෂාණය ගැඹුරට විදීම මගින් පාෂාණ ස්ථර වල පිහිටීම පිළිබඳ තොරතුරු ලබා ගැනීම
(7) භූ විද්‍යා සමීක්ෂණ මගින් භූගත ජලය හා පාෂාණයේ තත්ත්වය පිළිබඳ තොරතුරු ලබා ගැනීම

ව්‍යාපෘතියේ ප්‍රධාන උමඟෙහි ජල කාන්දුව මුද්‍ර තැබීම සඳහා දැනට භාවිතා කරන පූර්ව කැණීම් බදාම විදීමේ ක්‍රමය සතුටුදායක අතර,එමගින් ජල කාන්දුව අවශ්‍ය අවම මට්ටම කරා අඩු කර ගත හැකි විය. තවද, 2017 වසර අග වන විට උමඟෙන් පිටවන මුළු ජල කාන්දුවේ ප්‍රමාණය තත්පරයට ලීටර් 200 ක් දක්වා අඩු වී ඇත. ඒඅනුව,පර්යේක්ෂණ විදීම් මගින් පාෂාණයේ ඇති ජලය ඇති ස්ථාන සනාථ කර ගැනීමෙන් අනතුරුව, පූර්ව කැණීම් බදාම වීදීම් මගින් එම කාන්දු වසා දමමින් ඉතිරි වී ඇති උමං කොටසෙහි කැණීම් කරගෙන යනු ලැබේ.

ඒ අනුව, දැනට කැණීම් අවසන් කිරීමට ඇති ප්‍රධාන උමඟෙහි ඉතිරි කොටස පූර්ව කැණීම් බදාම විදීම මගින් ශුන්‍ය පාරිසරික හානි තත්ත්වයක් මත කරගෙන යාම අරමුණු වන අතර දැනටමත් කැණීම් අවසන් කර ඇති කොටසෙහි පසු කැණීම් බදාම විදීම් මගින් කාන්දුව අවම මට්ටමට ගෙන එනු ලැබේ.





# වේලි ආරක්ෂණ හා ජල සම්පත්
# සැලසුම්කරණ ව්‍යාපෘතිය

වේලි ආරක්ෂණ සහ ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය සාර්ථකව අවසන් කිරීමත් සමඟම ව්‍යාපෘතියේ අභිප්‍රායන් තවදුරටත් ව්‍යාප්ත කර ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය ලෝක බැංකුවෙන් අතිරේක මූල්‍ය ආධාරා ඉල්ලා සිටින ලදී. ඒ අනුව ව්‍යාපෘතියේ අරමුණු අඛණ්ඩව ඉදිරියට කරගෙන යාමට ලෝක බැංකුව විසින් ඇමරිකානු ඩොලර් මිලියන 83ක් ලබාදෙන ලදී.

වේලි ආරක්ෂණ ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියේ (අතිරේක මූල්‍යයන) ප්‍රධාන අරමුණු

1. විශාල ජලාශවල මෙහෙයුම් සහ නඩත්තු කටයුතු සඳහා දිගුකාලීන සහ තිරසාර සැකැස්මක් ඇති කිරීම
2. ජල සම්පත් සැලසුම් වැඩි දියුණු කිරීම

යෝජිත අතිරේක මූල්‍ය ප්‍රතිපාදන පහත සඳහන් පිරිවැය පියවීම සඳහා යොදා ගැනෙනු ඇත.

1. මුල් වේ.ආ.ජ.ස.සැ.ව්‍යාපෘතිය සම්පූර්ණ කර ගැනීමට නොහැකි වූ වැඩ සඳහා වැය වූ අමතර පිරිවැය
2. ජලාශ ප්‍රතිසංස්කරණය සහ නවීකරණය තවදුරටත් ව්‍යාප්ත කිරීම සහ මුල් ව්‍යාපෘතියට අයත් නොවූ උතුරු සහ නැගෙනහිර පළාත්වලට ව්‍යාප්ත කිරීම

**මූලික ව්‍යාපෘති පරාමිතීන්**

| | |
|---|---|
| ව්‍යාපෘතිය බලපැවැත්වෙන දිනය | : 2014 ඔක්තෝබර් 23 |
| ව්‍යාපෘතිය අවසන් වන දිනය | : 2018 මැයි 15 |
| ව්‍යාපෘතියේ මූල්‍ය කටයුතු අවසන් වන දිනය | : 2018 සැප්තැම්බර් 30 |
| ව්‍යාපෘති කාලය | : වසර 4 යි |

අතිරේක මූල්‍ය පහසුකම් 100% ම ලෝක බැංකුවේ ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය විසින් සපයනු ලැබේ. ඊට අමතරව ශ්‍රී ලංකා රජය ඇමරිකානු ඩොලර් මිලියන 1.5ක් ව්‍යාපෘති කළමනාකරණ සහ ක්‍රියාත්මක කිරීමේ කණ්ඩායමේ වියදම් පියවීම සඳහා ලබාදීමට එකග විය.

**ව්‍යාපෘතිය සංරචක 4 කින් සමන්විත වේ.**

**සංරචක 01.** වේලි ආරක්ෂණ සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම. මුල් ව්‍යාපෘති කාලයේදී වැඩ අවසන් නොවූ වේලි 14ක ප්‍රතිසංස්කරණ සම්පූර්ණ කිරීම සඳහා වැයවූ පිරිවැය පියවීම සහ ප්‍රතිසංස්කරණය කළයුතු තවත් වේලි 31 ක් ප්‍රතිකාර්මික කටයුතු ඉහළ නැංවීම, නඩත්තු උපකරණ ලබාදීම, මෙහෙයුම් සහ නඩත්තු තටයුතු සහ හදිසි ක්‍රියාත්මක සැලසුම් පිළියෙළ කිරීම.

**සංරචක 02.** ජල මිණුම් දත්ත පද්ධතිය වැඩි දියුණු කිරීම. නව ජල මිණුම් දත්ත මධ්‍යස්ථාන 46ක් පමණ ස්ථාපනය කිරීම, මුල් ව්‍යාපෘතියේ ආරම්භ කළ භූගත ජල සමීක්ෂණ වැඩසටහන ව්‍යාප්ත කිරීම සහ අතිරේකව භූගත ජාල නිමාන ප්‍රදේශයක් ලෙස වකුගඩු රෝගීන්ගේ වර්ධනයක් පවතින පොළොන්නරුව ප්‍රදේශයේ භූගත ජල සමීක්ෂණ වැඩසටහනක් ස්ථාපනය කිරීම.

**සංරචක 03.** බහු අංශ ජාල සම්පත් සැලසුම්, ප්‍රමුඛතා ජල සම්පත් සංවර්ධනය සහ වැඩි දියුණු කිරීම සඳහා සක්‍යතා අධ්‍යයනයන් සිදුකිරීම, ගල්ගමුව සහ කොත්මලේ වාරිමාර්ග පුහුණු මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම සහ එමගින් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සහ අනෙකුත් ජල කළමනාකරණ ආයතනවල කාර්යමණ්ඩල වලට වේලි ආරක්ෂණ සහ ජලසම්පත් සැලසුම් පිලිබඳ විවිධ පුහුණු වැඩසටහන් පැවැත්වීම.

**සංරචක 04.** ව්‍යාපෘති කළමනාකරණය, නිමාන සහ ඇගයුම්, දැනට මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශයේ පිහිටුවා ඇති ව්‍යාපෘති කළමනාකරණ ඒකකය තුලින් ව්‍යාපෘති කළමනාකරණ සහ සම්බන්ධීකරණ සහ ඇගයුම් කටයුතු සඳහා සහාය ලබාදෙනු ඇත.

## 1. වේලි ආරක්ෂණ සහ ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය (අතිරේක මූල්‍යයන) යටතට ගැනෙන ක්‍රියාකාරකම්

ව්‍යාපෘතියේ විවිධ කාර්යයන් සඳහා ලෝක බැංකු ආධාර ලැබේ. ඒවා නම්;

1. පිරිවැය ඉහළයාම පියවීම සඳහා අවශ්‍ය අරමුදල්: මෙම අංගය යටතේ මුල් වේලි ආරක්ෂණ ව්‍යාපෘතියේ ඇතුලත්ව තිබූ සහ එහෙත් නියමිත කාලය තුල අවසන් කිරීමට හෝ ඉටුකර ගැනීමට නොහැකි වූ අංගයන් අයත් වේ.
2. ජල සම්පත් මණ්ඩලයේ යෝජිත නව ක්‍රියාකාරකම් සඳහා අවශ්‍යතාවයන් සපුරා ලීමට සහ නව ජාල මිණුම් දත්ත මධ්‍යස්ථාන 46ක් ඉදිකිරීම සඳහා අවශ්‍ය අරමුදල් සැපයීම: තෝරාගන්නා ලද අවදානම් සහිත ප්‍රදේශ 7 ක භූගත ජලය නිමාණනය සඳහා නියමු නිමාණන ජාලයක් ස්ථාපනය කර ඇත. වේලි ආරක්ෂණ සහ ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය (අතිරේක මූල්‍යයන) යටතේ මෙම ජාලය යාබද ප්‍රදේශ සඳහා ව්‍යාප්ත කරනු ලබන අතර නිදන්ගත වකුගඩු රෝග බහුල වශයෙන් වාර්තා වන ප්‍රදේශවල ජලයේ ගුණාත්මක බව පිළිබඳව පරීක්ෂා කිරීමට කටයුතු කරන ලදී.
   මුල් ව්‍යාපෘතිය යටතේ ජල මිනුම් දත්ත මධ්‍යස්ථාන 122ක් ස්ථාපනය කරන ලද අතර එම ස්ථාපිත මධ්‍යස්ථාන වලින් ආවරණය නොවන ප්‍රදේශ වල තවත් ජල මිනුම් මධ්‍යස්ථාන 46ක් ස්ථාපනය කිරීම.
3. වේලි ආරක්ෂණ සහ ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය (අතිරේක මූල්‍යයන) යටතේ යෝජිත නව ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අරමුදල් සම්පාදනයට; මෙම සංරචකය යටතේ කඩිනම් ප්‍රතිසංස්කරණ අවශ්‍යව පැවති තවත් වේලි 31ක් තෝරා ගන්නා ලදී. වේලි තෝරා ගැනීම අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතනය මගින් සිදුකරන ලදී. ඊට අමතරව සියලුම ක්‍රියාත්මක කිරීමේ ආයතනවල මෙහෙයුම් සහ නඩත්තු කටයුතු, තත්ව පාලන පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය නව උපකරණ ලබාදීමට, ධාරිතා ඉහළ නැංවීමට සහ අනෙකුත් ඉහළ ගිය මෙහෙයුම් පිරිවැය සම්පාදනයටත් මෙමගින් ප්‍රතිපාදන ලැබිණි.

## 2. වේලි ආරක්ෂණ සහ ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියේ වැඩවල ප්‍රගතිය

මුල් ව්‍යාපෘතියේ අමතර වැඩ සඳහා වූ ගෙවීම් අවසන් වී ඇති අතර රඳවා ගැනීම් කිහිපයක් පමණක් ගෙවීමට ඇත. ප්‍රතිසංස්කරණ කොන්ත්‍රාත් 31ක් පිරිනමා ඇති අතර ඉන් 16ක් සම්පූර්ණ කර ඇති අතර වික්ටෝරියා ජලාශයේ ප්‍රතිසංස්කරණ කොන්ත්‍රාත්තුව ද ඒ අතර වේ. එම කොන්ත්‍රාත් 31 ප්‍රගතිය පහත දැක්වේ.



නවීකරණය කරන ලද බඹරවාන ජලාශයේ වාන් දොරටු මෙහෙයුම් පද්ධතිය



බඹරවාන ජලාශයේ රළපනාව ප්‍රතිසංස්කරණය කරමින්

| අං | වේල්ල | කොන්ත්‍රාත්තු වටිනාකම (රු.මිලියන) | ආරම්භක දිනය | අවසන් කල හෝ අවසන් කිරීමට නියමිත දිනය | ප්‍රධාන අංගයන් සහ 2018 සැප්තම්බර්30 දිනට ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| වාරිමාර්ග දෙපාර්තමේන්තුව | | | | | |
| 1 | අංගමුව | 172.99 | 2016.03.01 | 2016.12.05 | භෞතික ප්‍රගතිය - 100% සහ<br>මූල්‍ය ප්‍රගතිය -100% |
| 2 | පදවිය | 131.1 | 2016.02.25 | 2017.08.25 | භෞතික ප්‍රගතිය - 100% සහ<br>මූල්‍ය ප්‍රගතිය -87.53% |
| 3 | තෝප්පූර් | 48.3 | 2016.05.24 | 2017.10.20 | භෞතික ප්‍රගතිය - 100% සහ<br>මූල්‍ය ප්‍රගතිය - 87% |
| 4 | මහකනදරාව | 105.99 | 2016.02.25 | 2017.03.01 | භෞතික ප්‍රගතිය - 100% සහ<br>මූල්‍ය ප්‍රගතිය– 100 % |
| 5 | මහවිලච්චිය | 218.08 | 2016.02.03 | 2017.08.03 | භෞතික ප්‍රගතිය - 100% සහ<br>මූල්‍ය ප්‍රගතිය - 95% |
| 6 | වාන්ඇල | 69.17 | 2016.05.08 | 2017.12.01 | භෞතික ප්‍රගතිය - 100% සහ<br>මූල්‍ය ප්‍රගතිය -97.50% |
| 7 | සොරබොර වැව | 20.17 | 2016.08.04 | 2017.11.30 | භෞතික ප්‍රගතිය - 100% සහ<br>මූල්‍ය ප්‍රගතිය -100% |
| 8 | ජනරන්ජනවැව | 108.47 | 2016.08.15 | 2018.03.30 | භෞතික ප්‍රගතිය - 100% සහ<br>මූල්‍ය ප්‍රගතිය - 98.80%<br>මූල්‍ය ප්‍රගතිය - 80.97% |
| 9 | කොට්ටුකච්චි | 74.54 | 2016.08.02 | 2018.03.30 | භෞතික ප්‍රගතිය - 100% සහ<br>මූල්‍ය ප්‍රගතිය - 80.80% |
| 10 | බඳගිරිය | 78.29 | 2016.08.30 | 2018.04.11 | භෞතික ප්‍රගතිය - 100% සහ<br>මූල්‍ය ප්‍රගතිය - 67% |
| 11 | නවගිරි වැව | 89.06 | 2016.08.22 | 2018.04.11 | භෞතික ප්‍රගතිය - 100% සහ<br>මූල්‍ය ප්‍රගතිය - 91% |
| 12 | උන්නච්චිය | 76.47 | 2016.09.19 | 2018.04.11 | භෞතික ප්‍රගතිය -100% සහ<br>මූල්‍ය ප්‍රගතිය– 68.08% |
| 13 | කච්චිමඩු | 97 | 2016.08.08 | 2018.05.15 | භෞතික ප්‍රගතිය - 60% සහ<br>මූල්‍ය ප්‍රගතිය - 58.23%<br>(දුර්වල භෞතික ප්‍රගතිය නිසා කොන්ත්‍රාත්තුව අත්හිටුවා ඇත) |
| 14 | බදුලුඔය | 59.85 | 2016.11.23 | 2018.05.15 | භෞතික ප්‍රගතිය - 100% සහ<br>මූල්‍ය ප්‍රගතිය - 63% |
| 15 | මුතුකණ්ඩිය | 20.45 | | | භෞතික ප්‍රගතිය - 100% සහ<br>මූල්‍ය ප්‍රගතිය - 91% |
| ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | | | | | |
| 1 | වික්ටෝරියා | 1,453.20 | 2015.01.29 | 2017.03.08 | භෞතික ප්‍රගතිය - 100% සහ<br>මූල්‍ය ප්‍රගතිය -100% |
| 2 | හෙන්නානිගල | 130.08 | 2016.01.23 | 2017.04. 22 | භෞතික ප්‍රගතිය 100% සහ<br>මූල්‍ය ප්‍රගතිය– 100% |
| 3 | බඹරවාන | 61.41 | 2016.01.14 | 2017.04. 14 | භෞතික ප්‍රගතිය 100 % සහ<br>මූල්‍ය ප්‍රගතිය– 98.92% |
| 4 | පුස්සලවින්න | 43.94 | 2016.01.14 | 2017.06.11 | භෞතික ප්‍රගතිය 100% සහ<br>මූල්‍ය ප්‍රගතිය– 98.81% |
| 5 | උල්හිටියරත්කිඳ | 266.4 | 2015.08.12 | 2017.03.26 | භෞතික ප්‍රගතිය 100% සහ<br>මූල්‍ය ප්‍රගතිය– 87.23% |

| අං | වේල්ල | කොන්ත්‍රාත්තු වටිනාකම (රු.මිලියන) | ආරම්භක දිනය | අවසන් කල හෝ අවසන් කිරීමට නියමිත දිනය | ප්‍රධාන අංගයන් සහ 2018 සැප්තම්බර්30 දිනට ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| 6 | උරුසිටා වැව | 48.66 | 2016.11.09 | 2017.12.09 | භෞතික ප්‍රගතිය -100% සහ<br>මූල්‍ය ප්‍රගතිය – 100 % |
| 7 | අඹගහගම | 34.72 | 2016.09.16 | 2018.02.28 | භෞතික ප්‍රගතිය - 100% ,සහ<br>මූල්‍ය ප්‍රගතිය– 82.5% |
| 8 | පනන්කානිය | 13.82 | 2016.09.13 | 2018.04.10 | භෞතික ප්‍රගතිය -100% සහ<br>මූල්‍ය ප්‍රගතිය– 91.12 % |
| 9 | පිඹුරත්තැව<br>පිඹුරුත්තැව | 270.41 | 2016.04.08 | 2018.04.11 | භෞතික ප්‍රගතිය - 100% සහ<br>මූල්‍ය ප්‍රගතිය– 100 % |
| 10 | මුවගම්මන | 64.09 | 2016.03.28 | 2018.03.31 | භෞතික ප්‍රගතිය -100% සහ<br>මූල්‍ය ප්‍රගතිය– 70% |
| 11 | මිනිපේ අන්තර් නිම්න ඇල | 495.47 | 2014.11.07 | 2018.02.28 | භෞතික ප්‍රගතිය - 100% සහ<br>මූල්‍ය ප්‍රගතිය– 100% |
| 12 | උඩවලව | 91.47 | 2016.08.11 | 2018.03.31 | භෞතික ප්‍රගතිය -100 % සහ<br>මූල්‍ය ප්‍රගතිය 97.58% |
| උතුරු පළාත්සභා වාරිමාර්ග දෙපාර්තමේන්තුව | | | | | |
| 1 | පෙරියපන්ඩිවිරිච්චාන් | 72.44 | 2014.11.08 | 2016.04.30 | අවසන් සහ<br>මූල්‍ය ප්‍රගතිය - 100% |
| 2 | මුත්තියන්කාඩු<br>සිවිල් | 171.5 | 2015.02.20 | 2016.12.01 | අවසන් සහ<br>මූල්‍ය ප්‍රගතිය - 100% |
| | මුත්තියන්කාඩු<br>විදුලි<br>යාන්ත්‍රික | 428 | 2015.03.01 | 2016.03.12 | අවසන් සහ<br>මූල්‍ය ප්‍රගතිය - 100% |
| 3 | තොන්ඩමනාරු<br>සිවිල් | 112.37 | 2016.07.25 | 2018.04.30 | අවසන් සහ<br>මූල්‍ය ප්‍රගතිය - 100% |
| | තොන්ඩමනාරු<br>විදුලි<br>යාන්ත්‍රික | 297.85 | 2016.06.17 | 2018.04.30 | අවසන් සහ<br>මූල්‍ය ප්‍රගතිය - 100% |
| මහනුවර මහා නගර සභාව | | | | | |
| 1 | රෝසනෙත් | 24.62 | 2016.07.27 | 2017.11. 30 | අවසන් සහ<br>මූල්‍ය ප්‍රගතිය - 96.45% |
| 2 | දුනුමඩළාව | 43.94 | 2016.08.18 | 2018.05. 15 | අවසන් සහ<br>මූල්‍ය ප්‍රගතිය - 52% |
| ලංකා විදුලිබල මණ්ඩලය | | | | | |
| 1 | මාඋස්සාකැලේ | 69.24 | 2017.07.26 | 2018.04. 11 | අවසන් සහ<br>මූල්‍ය ප්‍රගතිය - 100% |

**වේලිආරක්ෂණ සහ ජලසම්පත් සැලසුම් ව්‍යාපෘතිය (අතිරේක මූල්‍යයන) යටතේ එන අනෙකුත් ප්‍රධාන කොන්ත්‍රාත්තුවල ප්‍රගතිය**

| අං | කොන්ත්‍රාතුවේ නම | ප්‍රගතිය | කොන්ත්‍රාත්තු වටිනාකම |
|---|---|---|---|
| 1 | රාජාංගනය සහ කවුඩුල්ල ජලාශවල වාන් දොරටු විද්‍යුත්කරණය සහ ස්වයංක්‍රියකරණය | සම්පූර්ණ කර ඇත. | රු.මිලියන 226.47 |
| 2 | පොල්ගොල්ල ගංවතුර සහ ජලාශ පාලන මධ්‍යස්ථානය | සම්පූර්ණ කර ඇත. | රු. මිලියන 307.15 |
| 3 | වේලි ආරක්ෂාව පිලිබඳ ජාතික මධ්‍යස්ථානය | සම්පූර්ණ කර ඇත. | රු. මිලියන 25.17 |
| 4 | රාජාංගනය වේල්ලේ 1-15 වාන් දොරටු ප්‍රතිස්ථාපනය | සම්පූර්ණ කර ඇත. | රු. මිලියන 282.58 |

| | | | |
|---|---|---|---|
| 5 | රාජාංගනය වෙල්ලේ16-30වාන් දොරටු ප්‍රතිස්ථාපනය | සම්පූර්ණ කර ඇත. | රු.මිලියන 255.79 |
| 6 | ඉතිරි වේලි 8 සඳහා හදිසි ක්‍රියාකාරි සැලසුම්(හ.ක්‍රි.සැ) පිළියෙළ කිරීම | සම්පූර්ණ කර ඇත. | රු. මිලියන 12.89 |
| 7 | ජල මිනුම් දත්ත පද්ධතිය ස්ථාපනය කිරීම | මුල් කොන්ත්‍රාත්තුව:<br>මධ්‍යස්ථාන 122න් 120ක් අවසන්කර ඇත. එම 120න් මධ්‍යස්ථාන 4 ක උපකරණ සවිකිරීම ක්‍රියාත්මක කිරීමේ ආයතනවල පුහුණුව ලබාදුන් කාර්ය මණ්ඩලය විසින් සිදුකරන ලදී. දත්ත මධ්‍යස්ථාන දෙකක කටයුතු අවසන් කර ඇති අතර අභ්‍යන්තර දත්ත කළමනාකරණ කාර්ය මණ්ඩලයට දත්ත ලබාගත හැකි පරිදි වෙබ් පෝර්ටලය ක්‍රියාත්මක වේ.<br>අතිරේක මූල්‍යයන ව්‍යාපෘතිය:<br>නව මධ්‍යස්ථාන 45ක් ස්ථාපනය සම්පූර්ණ කරන ලද අතර ජලසම්පත් සැලසුම්කරණය සහ තත්කාලීන ගංවතුර නිරීක්ෂණ සඳහා දත්ත මධ්‍යස්ථාන දෙකට ස්ථාන165ක සිට නව දත්ත ලබා ගැනීන. | |
| 8 | භූගත ජල අධීක්ෂණ ජාලය පුළුල් කිරීම | සම්පූර්ණ කරන ලද නියමු ප්‍රදේශ හත සඳහා භූගත ජල අධීක්ෂණ ජාලය පුළුල් කිරීම. | |
| 9 | වේලිවල මෙහෙයුම් කටයුතුවල නිරත කාර්යමණ්ඩල පුහුණු කිරීම සඳහා ගල්ගමුව පුහුණු මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම. | සම්පූර්ණ කර ඇත. | රු. මිලියන 184.4 |
| 10 | වේලි වල මෙහෙයුම් කටයුතු වල නිරත කාර්ය මණ්ඩල පුහුණු කිරීම සඳහා කොත්මලේ කාර්යාලය සහ පුහුණු මධ්‍යස්ථානය පිහිටුවීම. | සම්පූර්ණ කර ඇත. | රු.මිලියන 152.78 |
| 11 | කාසල්රී ජලාශයේ මඩ සොරොව්වේ කපාට/ වැල්ව ප්‍රතිසංස්කරණය කිරීම | සම්පූර්ණ කර ඇත. | 2017 අගෝස්තු 28<br>රු.මිලියන 83.40 |
| 12 | ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ජල කළමනාකරණ ලේකම් කාර්යාලයට මෙහෙයුම් ආකෘතියක්(පරිගණක වැඩසටහනක්) සැකසීම | සම්පූර්ණ කර ඇත.<br>මූල්‍යප්‍රගතිය32.72% | රු.මිලියන 151.96 |
| 13 | වික්ටෝරියා ජලාශයේ භූමිතික සමීක්ෂණ | සම්පූර්ණ කර ඇත.<br>මූල්‍යප්‍රගතිය18.73% | 2017 ජූලි 17<br>රු.මිලියන 88.20 |

**පරිසර කළමනාකරණ සැලැස්ම සකස් කිරීම**

ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් සෑම වැඩ බිමක් සඳහාම පරිසර කළමනාකරණ සැලැස්මට අනුව නිමානන ආකෘතියක් සකස්කර ඇත. කොන්ත්‍රාත්කරුට එම ආකෘතිය පිරවීමට ලබාදෙන අතර මාසිකව ඔහු එය අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතනයට ලබාදිය යුතුය. ක්‍රියාත්මක කිරීමේ ආයතනය ක්ෂේත්‍ර නිරීක්ෂණ සිදුකර සැලැස්ම ක්‍රියාත්මක කිරීම සතුටුදායක ද යන වග එය සහතික කොට සහ අත්සන්කොට ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට එවිය යුතුය. ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පරිසර විශේෂඥ වරින් වර වේලි වැඩබිම් වෙත ගොස් සැලස්ම ක්‍රියාත්මක කිරීම සතුටුදායක ලෙස සිදුවේ ද යන්න පරීක්ෂා කරයි. පරිසර කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම ගෙවීමේ ක්‍රමවේදය සමග සම්බන්ධ වේ. එබැවින් ක්‍රියාත්මක කිරීමේ ආයතනවලට ගෙවීම් නිදහස් කල හැක්කේ පරිසර කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සතුටුදායක නම් පමණි. පරිසර කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ දැනට ප්‍රගතිය පහත දැක්වේ.

| | වේල්ල | පරිසර ඇගයීම සැකසීම | පරිසර කළමනාකරණ සැලැස්මට ලංසුතැබීමේ ලේඛනයට ඇතුලත් කිරීම | නිමානආකෘතිය සැකසීම | පරිසර කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| | **උතුරු පළාත්සභාව** | | | | |
| 1 | මුත්තියන්කඩ්ඩු | අවසන් | අවසන් | අවසන් | 100 % අවසන් |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2 | පෙරියපන්ඩිවිරිච්චාන් | අවසන් | අවසන් | අවසන් | 100 % අවසන් |
| 3 | තොන්ඩමනාරු බැරාජය | අවසන් | අවසන් | අවසන් | 100 % අවසන් |
| | **ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය** | | | | |
| 4 | උල්හිටිය-රත්කිඳ | අවසන් | අවසන් | අවසන් | 100 % අවසන් |
| 5 | හෙන්නානිගල | අවසන් | අවසන් | අවසන් | 100 % අවසන් |
| 6 | බඹරවාන | අවසන් | අවසන් | අවසන් | 100 % අවසන් |
| 7 | පුස්සැලවින්න | අවසන් | අවසන් | අවසන් | 100 % අවසන් |
| 8 | ඌරුසිටාන | අවසන් | අවසන් | අවසන් | 100 % අවසන් |
| 9 | වික්ටෝරියා | අවසන් | අවසන් | අවසන් | 100 % අවසන් |
| 10 | අඹගහගම | අවසන් | අවසන් | අවසන් | 100 % අවසන් |
| 11 | පනක්කානිය | අවසන් | අවසන් | අවසන් | 100 % අවසන් |
| 12 | මුවගම්මන | අවසන් | අවසන් | අවසන් | 100 % අවසන් |
| 13 | මිනිපේ අන්තර් නිම්න ඇල | අවසන් | අවසන් | අවසන් | 100 % අවසන් |
| 14 | පිඹුරුත්තැව | අවසන් | අවසන් | අවසන් | 100 % අවසන් |
| 15 | උඩවලව | අවසන් | අවසන් | අවසන් | 100 % අවසන් |
| | **වාරිමාර්ග දෙපාර්තමේන්තුව** | | | | |
| 16 | පදවිය | අවසන් | අවසන් | අවසන් | 100 % අවසන් |
| 17 | අංගමුව | අවසන් | අවසන් | අවසන් | 100 % අවසන් |
| 18 | මහකනදරාව | අවසන් | අවසන් | අවසන් | 100 % අවසන් |
| 19 | වාන්ඇල | අවසන් | අවසන් | අවසන් | 100 % අවසන් |
| 20 | තෝප්පූර් | අවසන් | අවසන් | අවසන් | 100 % අවසන් |
| 21 | සොරබොරවැව | අවසන් | අවසන් | අවසන් | 100 % අවසන් |
| 22 | රොසනෙත් | අවසන් | අවසන් | අවසන් | 100 % අවසන් |
| 23 | මහවිලච්චිය | අවසන් | අවසන් | අවසන් | 100 % අවසන් |
| 24 | ජනරංජන වැව | අවසන් | අවසන් | අවසන් | 100 % අවසන් |
| 25 | කොට්ටුකච්චිය | අවසන් | අවසන් | අවසන් | 100 % අවසන් |
| 26 | බඳගිරිය | අවසන් | අවසන් | අවසන් | 100 % අවසන් |
| 27 | නවගිරිවැව | අවසන් | අවසන් | අවසන් | 100 % අවසන් |
| 28 | දුනුමඩළාව | අවසන් | අවසන් | අවසන් | 100 % අවසන් |
| 29 | උන්නිච්චිය | අවසන් | අවසන් | අවසන් | 100 % අවසන් |
| 30 | කච්චිමඩු | අවසන් | අවසන් | අවසන් | 100 % අවසන් |
| 31 | මුතුකන්ඩිය | අවසන් | අවසන් | අවසන් | 100 % අවසන් |
| 32 | බඳුලුඔය | අවසන් | අවසන් | අවසන් | 100 % අවසන් |
| | **ලංකා විදුලිබල මණ්ඩලය** | | | | |
| 33 | මාවුස්සාකැලේ | අවසන් | අවසන් | අවසන් | 100 % අවසන් |

**සමාජ ආරක්ෂණ කළමනාකරණ වැඩසටහන**

ප්‍රතිසංස්කරණය කටයුතු නිසා ජලාශයේ ජලය ඉවත් කිරීමට සිදුවන අවස්ථාවලදී පමණක් සමාජ ආරක්ෂණ කළමනාකරණ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

- මහකනදරාව, මහවිලච්චිය සහ මුත්තියන්කාඩු ජලාශ ප්‍රතිසංස්කරණය කිරීමේ දී 2016 යල් කන්නය වගා කිරීමට නොහැකි වීම හේතුවෙන් ජනතාවගේ ජීවන මාර්ග වලට ඇතිවිය හැකි අහිතකර බලපෑම් වැළැක්වීම සඳහා ජීවනාධාර වැඩසටහන සැලසුම් කරන ලදී
- සමාජ ආරක්ෂණ කළමනාකරණ සැලසුම යටතේ තොරතුරු, අධ්‍යාපන සහ සන්නිවේදන ව්‍යාපාරයක් ගෙනගිය අතර සමාජ ආර්ථික පාදරේඛා සමීක්ෂණයක් මගින් බලපෑමට ලක්වන ප්‍රජාවන්ට වන බලපෑම ඇගයීමට ලක්කරන ලදී
- උප සැලසුම් තුනක් ඒ අනුව ක්‍රියාවට නගන ලදී
    - ශ්‍රම කුලී සහන සැලසුම
    - පානීය ජලය සැපයීමේ සැලසුම
    - කාන්තා සවිබල ගැන්වීමේ වැඩසටහන (Gender Assistance Plan (GAP)

| ජලාශය | බලපෑමට ලක්වූ ගොවි පවුල් සංඛ්‍යාව | ධීවර පවුල් | කෘෂිකාර්මික කම්කරු | බලපෑමට ලක්වූ මුළු පවුල් සංඛ්‍යාව | බලපෑමට ලක්වූ මුළු ජනගහනය |
|---|---|---|---|---|---|
| මහකනදරාව | 2,765 | 86 | - | 2,851 | 11,062 |
| මහවිලච්චිය | 1,778 | - | - | 1,778 | 7,645 |
| මුත්තියන්කාඩු | 1,663 | 52 | 505 | 2,220 | 7,650 |
| | 6,206 | 138 | 505 | 6,987 | 26,357 |

- ව්‍යාපෘතිය මගින් ජලාශ තුනේම ජීවනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම 2016 ජුනි සහ ඔක්තෝබර් අතර කාලයේ දී ආරම්භ කරන ලදී.

**ජීවනාධාරා වැඩසටහන් සඳහා වෙන්කරන ලද මුදල්**

| සැලැස්ම | මහකනදරාව | මහවිලච්චිය | මුත්තියන්කාඩු | මුළු |
|---|---|---|---|---|
| ශ්‍රම කුලී සහන සැලසුම | 75.8 | 44.75 | 54.7 | 175.25 |
| පානීය ජලය සැපයීමේ සැලසුම | 5.65 | 4.41 | 3.14 | 13.2 |
| කාන්තා සවිබල ගැන්වීමේ ක්‍රියාකාරී සැලසුම (Gender Action Plan) | 1.2 | 1 | 0.6 | 2.8 |
| ජලාශයේ මාළු බෝකිරීම සහ පැටවුන් දැමීම | 1.6 | 0.8 | 0.6 | 3 |
| මුළු ගණන | 84.25 | 50.96 | 59.04 | 194.25 |

ජීවනාධාර වැඩසටහන සාර්ථකව අවසන් කරන ලදී. ඉතිරි මුදල් අනුරාධපුර වාරිමාර්ග කළමනාකරණ අංශයේ ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම සඳහා යොදාගන්නා ලදී.

**ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය**




| | 2014 | 2015 | 2016 | 2,017 | 2,018 |
|---|---|---|---|---|---|
| Allocation | 150 | 1950 | 3719 | 3920 | 2435 |
| Expenditure | 114.37 | 1,914.00 | 3,698.10 | 3017.1 | 2,179.56 |
| Project Cumm Ex Precentage | 1% | 18% | 51% | 78% | 98% |



ජනරංජන වැව රළපනාව ප්‍රතිසංස්කරණය



වාන් දොරටුවලට පහල ආරක්ෂණ ඉදිකිරීම්-ජනරංජනවැව



කාන්දු පෙරන සහ කාන්දු ජලය ගෙනයන කානුපද්ධතිය - වාන්ඇල



ශක්තිමත්ව ඉදිකරන ලද තෝපූර් වැව් බැම්ම



උල්හිටිය රත්කිඳ ප්‍රතිසංස්කරණයෙන් පසු



වැඩිදියුණු කළ වාන් දොරටු මෙහෙයුම් පද්ධතිය - උල්හිටිය රත්කිඳ



වික්ටෝරියා වේල්ල ප්‍රතිසංස්කරණය කිරීම



ප්‍රතිසංස්කරණය කරන ලද සොරබොර වැව



ප්‍රතිසංස්කරණය කරන ලද මුතියන්කඩිඩු වේල්ල



ප්‍රතිසංස්කරණය කරන ලද රාජාංගනය වේල්ල



ප්‍රතිසංස්කරණය කරන ලද මාවස්කැලේ වේල්ල



ජල කාලගුණ විද්‍යාත්මක තොරතුරු පද්ධති (HMIS) ස්ථානය










# මහවැලි ජල සුරක්ෂිතතා හා ආයෝජන වැඩසටහන

මහවැලි ජල ද්‍රෝණියේ අතිරික්ත ජලය උතුරු වියලි ප්‍රදේශ වලට ලබා දීම තුලින් ආර්ථික කටයුතු වේගවත් කිරීම සිදු කරන අතර වාරිමාර්ග, බීමට හා වානිජ කටයුතු සඳහාද ජලය ලබා දීම මෙම වැඩසටහන මඟින් සිදු කෙරේ. උතුරු මැද පළාතේ ජලාශ වල ජලය ගබඩා කිරීමටත් 1973 වර්ෂයේදී ආරම්භ කල මහවැලි සංවර්ධන වැඩසටහනේ කටයුතු අවසාන කිරීමත් මෙම වැඩසටහනෙන් බලාපොරොත්තු වේ. තවද වැඩසටහනහි මූල්‍ය ප්‍රතිපාදන රාමුව සඳහා වූ ගිවිසුම ආසියානු සංවර්ධන බැංකුව හා ශ්‍රී ලංකා රජය 2015 අප්‍රේල් 23 වැනි දින අත්සන් කරන ලද අතර, 2015 ජූනි 24 දින 2015– 2024 කාල සීමාව සඳහා ඇ.ඩො.මිලියන 453 ක් ලබා දීම අනුමත කර ඇත.

වැඩසටහනේ නිමැවුම් අංක 1 යටතේ ඉහළ ඇලහැර ව්‍යාපෘතියේ කි.මී 101ක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම තුලින් කලුගඟ , මොරගහකන්ද ,හුරුළු වැව , ඒරු වැව සහ මහකන්දරාව දක්වා ජලය ලබා දෙනු ඇත. එමෙන්ම වයඹ පලාත් ව්‍යාපෘතිය යටතේ කි.මී 91ක් සංවර්ධනය කිරීමටත් ජලාශ 02ක් ඉදිකිරීමත් සිදු කිරීම මඟින් පවත්නා වාරිමාර්ග හා නගර සැපයුම් සම්පාදනය කිරීමත් සිදු කරයි.

එමෙන්ම නිමැවුම් අංක 1 මිනිපේ ජල ව්‍යාපෘතිය යටතේ කි.මී. 74 ක ඇළ මාර්ග සංවර්ධනය කිරීමත් සිදු වේ.

ණය වාරික අදියර 2 යටතේ වයඹ ඇළ ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු ඉදිරියට කර ගෙන යැමත් ඇළ හැර ඇළ ව්‍යාපෘතියේ කි.මී. 8.8 ක කළු ගඟ මොරගහකන්ද උමං මාර්ගය කි.මී 28 ක උමං මාර්ගය සංවර්ධනය කිරීමත් සිදු වේ.






**වැඩසටහනේ බලපෑම**

උතුරු මැද මධ්‍යම වයඹ හා නැගෙනහිර පළාත් වල කෘෂිකාර්මික ඵලදායිතාවය හා තිරසර ආර්ථික සංවර්ධන වැඩි දියුණු කිරීම සිදු වේ.

**වැඩසටහනේ නිමවුම**

ව්‍යාපෘති ප්‍රදේශ වල කෘෂි කාර්මික හා පානීය ජල සුරක්ෂිතතාවය ඇති කිරීම.

**වැඩසටහනේ නිමැවුම**

1. ජලය බෙදාහැරීම සහ ගබඩා කිරීම සඳහා අලුත් හා වැඩිදියුණු කල නිර්මිත ඉදිකිරීම්
2. ජල සම්පත් කළමනාකරණය හා ඵලදායීතාවය සංවර්ධනය කිරීම
3. බහු විධ ආයෝජන වැඩසටහන් කළමනාකරණය

**සමස්ථ ආර්ථික ප්‍රතිලාභ**

වගා තීව්‍රතාවය 130% සිට 180% දක්වා ඉහළ නැංවීම මඟින් වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 3 සිට 6 දක්වා ඉහළ නැංවීම සඳහා පවතින වගා බිම් හෙක්ටයාර 32,800 ක් වැඩි දියුණු කිරීම.

**වෙනත් ප්‍රතිලාභ**

කි.මී. 260 කට වඩා අලුත් හා වැඩි දියුණු කල ඇල මාර්ග හා ජලාශ හා වෙනත් වාරි මාර්ග යටිතල පහසුකම් ඉදිකිරීම.

- මිනිසුන් 350,000කට අධික පිරිසක් සඳහා පිරිසිදු පානීය ජලය ලබා දීමට සහය වීම
- ජලයේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම
- වයඹ පළාතේ ප්‍රධාන ජලාශ 13 ක් හා කුඩා වැව් 353 ක් සඳහා ජලය සැපයීම

**මිනිපේ වම් ඉවුරු ඇළ පුනරුත්තාපනය කිරීමේ ව්‍යාපෘතිය**

- 74 km ඇළ පුනරුත්තාපනය
- විදුලියෙන් ක්‍රියාත්මක වන ගේට්ටු පුනරුත්තාපනය
- මී 3.5 කින් මිනිපේ අමුණ ඉස්සීම හා ප්‍රධාන නිර්මිත ඉදි කිරීම








මිණිපේ වම් ඉවුරු ඇළ පුනරුත්තාපන කටයුතු

**වයඹ පළාත් ඇළ ව්‍යාපෘතිය**

- කි.මී.96 නව හා වැඩිදියුණු කල ඇළ මාර්ගය (මී.940ක උමං මාර්ගය ඉදි කිරීම ඇතුළුව)
- මීටර් 26ක් උස පස් වලින් හදන ලද වැව් බැමි 02 ක් ඉදි කිරීම






වැමැඩිල්ල වම් ඉවුරු ඇළ නැබඩගහවත්ත දක්වා වැඩිදියුණු කිරිම

### උතුරු මැද ඇළ ව්‍යාපෘතිය

- මී.65 නව ඇළ/conduit
- මී.8 ක කලු ගඟ හා මොරගහකන්ද යා කරන උමං මාර්ගය






උතුරු මැද ඇළ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු

**ව්‍යාපෘතියේ සමස්ථ ප්‍රගතිය හා ප්‍රධාන ක්‍රියාකාරිත්වය**

**වැඩසටහනේ ප්‍රගතිය**

මෙම වාර්තාව මගින් 2018ජනවාරි මස 01 දින සිට 2018 දෙසැම්බර් 30 දක්වා වූ වර්ෂයේ 2018 ක්‍රියාකාරි සැලැස්මට අනුව මූල්‍ය හා භෞතික ප්‍රගතිය ඉදිරිපත් කොට ඇත. මෙම වැඩසටහන මගින් මිණිපේ වම් ඉවුරු ඇළ පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියෙහි වයඹ පළාත් ඇළ ව්‍යාපෘතියෙහි උතුරු මැද ඇළ ව්‍යාපෘතියෙහි යටිතල පහසුකම් සංවර්ධනය වැඩි දියුණු කිරීම ප්‍රධාන වශයෙන් ඉලක්ක කර ඇත. මීට අමතරව සමස්ථ මූල්‍ය හා භෞතික ප්‍රගතිය ඇතුළුව පිරි නැමූ කොන්ත්‍රාත් වල ප්‍රගතිය දපහත ඉදිරිපත් කර ඇත.

**සමස්ථ මූල්‍ය ප්‍රගතිය**

| ව්‍යාපෘති කාලසීමාව | මුළු ඇස්තමේන්තුව රු.මි. (වාරිකය 1 සහ 2) | වාර්ෂිකවෙන් කිරීම(2018) රු.මි. | 2018.12.31 දිනට | | | වාර්ෂික ප්‍රගතිය % | සමස්ථ ප්‍රගතිය 2018.12.31 දිනට | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | ඉලක්කය රු.මි. | ප්‍රගතිය රු.මි. | ප්‍රගතිය% | | රු.මි. | % |
| 2015-2024 | 64,282.00 | 5,199.00 | 5,199.00 | 5,065.37 | 97 | 98 | 8,271.61 | 13 |

**සමස්ථ භෞතික ප්‍රගතිය**

| අයිතමය | වාර්ෂික භෞතික ඉලක්කය% | 2018.12.31 දිනට | |
|---|---|---|---|
| | | ඉලක්කය% | ප්‍රගතිය% |
| මිනිපේ වම් ඉවුරු ඇළ පුනරුත්ථාපනය (මිනිපේ වම් ඉවුරු ඇළ ව්‍යාපෘතිය) | 24 | 24 | 24 |
| වයඹ ඇළ වැඩි දියුණු කිරීම (වයඹ ඇළ ව්‍යාපෘතිය) | 31 | 31 | 30.5 |
| ඉහළ ඇළ හැර ඇළ ඉදි කිරීම(උතුරු මැද ඇළ ව්‍යාපෘතිය) | 22 | 22 | 21 |
| උපදේශනාත්මක සේවා ක්‍රියාත්මක කිරීම(වැඩසටහන් කළමනාකරණ සැලසුම් හා උපදේශාත්මක ආයතනය) | 12 | 12 | 12 |
| වැඩසටහන් කළමනාකරණ ඒකකය හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ඒකකය මෙහෙයුම් හා නඩත්තු කටයුතු ප්‍රජා මූල්‍ය කොන්ත්‍රාත් (ක්ෂේත්‍ර කාර්යාල,පුහුණු ,පරිසර, සන්නිවේදන, නැවත පදිංචි කිරීම් හා අනෙකුත් පුනරාවර්තන වැඩසටහන්) | 11 | 11 | 10.5 |
| මුළු | **100** | **100** | **98** |

**පිරි නැමූ කොන්ත්‍රාත් වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය**

| පැකේජය | කොන්ත්‍රාත් වටිනාකම (රු.මි.) | **වියදම (සත්‍ය නිමි වැඩ)** (රු.මි.) | භෞතික ප්‍රගතිය 2018.12.31 දිනට(%) |
|---|---|---|---|
| MLBCR-NCB-1 | 414.16 | 202.2 | **71** |
| MLBCR-NCB-2 | 343.03 | 98.17 | **59** |
| MLBCR-NCB-3 | 829.03 | 262.58 | **34** |
| MLBCR-NCB-4 | 246.98 | 136.35 | **90** |
| MLBCR-NCB-5 | 425.5 | 40.35 | **23** |
| MLBCR-ICB-1 | 2144.52 | 123.82 | **10** |
| UEC-ICB-1 | 3742.44 | 813.25 | **28** |
| UEC-ICB-2B | 8218.95 | | **2** |
| NWPC-NCB-1 | 926.11 | 468.32 | **60** |
| NWPC-ICB-2 | 7266.82 | | **1** |



# පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ පරිසර පද්ධති කළමනාකරණය වැඩිදියුණු කිරීම තුලින් එම පද්ධති සංරක්ෂණය හා ඒ තුලින් පරිසර පද්ධති ආශ්‍රිතව ජීවත්වන ප්‍රජාවට අවශ්‍ය ප්‍රතිලාභ ලබා දීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණයි.

මෙම ව්‍යාපෘතිය මගින් ජාතික මට්ටමේ පරිසර පද්ධති සංරක්ෂණය හා කළමනාකරණය මෙන්ම ඒ අශ්‍රිතව ජීවත් වන ජනතාවට ප්‍රතිලාභ ලබා දීමද සිදු කරයි. ජාතික මට්ටමේදී පද්ධති සංරක්ෂණය හා කළමනාකරණයට අදාළව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වනජීවී දෙපාර්තමේන්තුවේ ධාරිතා සංවර්ධනය කිරීම තුලින් කාර්යක්ෂම සේවාවක් ලබා දීම සිදු කරයි. එමෙන්ම සංරක්ෂිත ප්‍රදේශ අශ්‍රිතව ජීවත්වන ජනතාවගේ ජීවන තත්වයන් වැඩි දියුණු කිරීමද ව්‍යාපෘතිය මගින් සිදු කරයි. එමගින් ප්‍රතිලාභීන් 15,000කට ප්‍රතිලාභ ලබා දීමට අපේක්ෂා කරයි. ජෛව විවිධත්ව ආරක්ෂණය වැඩි කිරීම, අලි-මිනිස් ගැටුම් වලකාලීමට අවශ්‍ය උපාය මාර්ග සැකසීම සහ වන සංරක්ෂණ හා වන ජීවී දෙපාර්තමේන්තුවල ආයතනික සංවර්ධනය සඳහා අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යනාදිය විශේෂ අරමුණු ඉටුකර ගැනීම සඳහා මෙම ව්‍යාපෘතිය සැලසුම් කර ඇත.

ව්‍යාපෘති කාලසීමාව අවුරුදු 5ක් වන අතර, ව්‍යාපෘතිය 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ක්‍රියාත්මක වේ.

ලෝක බැංකුවට (World Bank) අනුබද්ධිත ජාත්‍යන්තර සංවර්ධන සංගමය (IDA) මගින් සපයනු ලැබූ ඇමෙරිකානු ඩොලර් මිලියන 45 ක ණය මුදලක් මගින් මෙම ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රතිපාදන සපයා ඇත. පහත දක්වා ඇත්තේ ව්‍යාපෘතියේ ප්‍රධාන සංරචකයන් සහ ඒ සඳහා ව්‍යාපෘතිය ඔස්සේ මූල්‍ය ප්‍රතිපාදන ලබා දී ඇති ආකාරයයි.

| අනු අංකය | ව්‍යාපෘති සංරචකය | ව්‍යාපෘති ප්‍රතිපාදන (ඇ.ඩො.මිලියන) |
|---|---|---|
| 1 | නියමු භූ-දර්ශන සැලසුම් සැකසීම හා කළමනාකරණය | 2.8 |
| 2 | ජීවනෝපායන් වැඩිදියුණු කිරීම සඳහා ස්වාභාවික සම්පත් තිරසාර ලෙස භාවිත කිරීම සහ මිනිසාගේ ජීවනෝපාය සුරක්ෂිත කිරීම සඳහා අලිමිනිස් සහජීවනය | 17.0 |
| 3 | රක්ෂිත ප්‍රදේශ කළමනාකරණය සහ ආයතනික කුසලතා සංවර්ධනය | 24.2 |
| 4 | ව්‍යාපෘති කළමනාකරණය | 1.0 |
| එකතුව | | 45.0 |

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය සහ තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ බලයලත් ආයතන වේ. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වනජීවී දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි. සංරක්ෂිත ප්‍රදේශ ආශ්‍රිතව ජීවත්වන වනජීවීන්, සංරක්ෂිත ප්‍රදේශ ආසනයේ ජීවත් වන ප්‍රජාව, සංරක්ෂිත ප්‍රදේශ ආශ්‍රිතව අලි-මිනිස් ගැටුම්වලට මුහුණ දෙන ප්‍රජාව, ස්වභාවික සම්පත් කළමනාකරණය කරනු ලබන ආයතන යනාදිය මෙම ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් වේ.

ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමට 2018 වර්ෂය සඳහා රු. මිලියන 910ක මුදලක් අනුමත විය. එම ඉලක්කය සපුරමින් රු. මිලියන 950ක මුදලක් වියදම් කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සමත්විය.

**ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම්**

## ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් 2018

### සංරචක 1 - නියමු භූ-දර්ශන සැලසුම් සැකසීම හා කළමනාකරණය

- ප්‍රාදේශීය මට්ටමේ සැලසුම් කමිටු රැස්වීම් 3ක් පවත්වන ලදි. ඒ අනුව එම කමිටුවල නිර්දේශයන් මත කාර්යභාර කණ්ඩායම් රැස්වීම් 6ක්ද පවත්වන ලදි.
- දත්ත රැස් කිරීම, විශ්ලේෂණය හා වාර්තා සකස් කිරීම අවසන් කර ඇත.

- නියමු භූ-දර්ශන සැලසුම සැකසීමට අදාළ මූලික වාර්තාව අවසන් කර ඇත.
- නියමු භූ-දර්ශන සැලසුම සැකසීමට අදාළව සකස් කරන්නාවූ ව්‍යාපෘති යෝජනා වලට අදාල මූලික කටයුතු නිම කර ඇත.
- නියමු භූ-දර්ශන සැලසුම් සැකසීමට අදාලව වීඩියෝවක් හා ගුවන් විදුලි වැඩසටහන් 2ක් පැවැත්විය.
- වියලි කලාපයට අදාළ අවසන් නියමු භූ-දර්ශන සැලසුම සැකසීමට අදාළව උපදේශන සේවාවන් තෝරාගෙන ඇත.

### උප-සංරචක 2(a) – ජීවනෝපායන් වැඩිදියුණු කිරීම සඳහා ස්වාභාවික සම්පත් තිරසාර ලෙස භාවිත කිරීම

මෙම ව්‍යාපෘතිය මගින් රක්ෂිත ප්‍රදේශ වල ජීවත් වන , ප්‍රජාවන්ගේ , තිරසාර ස්වභාවික සම්පත් මත පදනම් වූ ජීවනෝපායන් වැඩි දියුණු කිරීමටත්, ඔවුන්ගේ යැපීම අඩු කර ගැනීමත්, සංරක්ෂණ හා කලමනාකරණය සඳහා, ප්‍රජාව සහභාගී කරවා ගැනීමට උපකාරී කරනු ලබයි.

### වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක වැඩසටහන් වල ප්‍රගතිය

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ගම්මාන 91 ආවරණය වන පරිදි ප්‍රජා ක්‍රියාකාරී සැලසුම් 41 සංවර්ධනය කර ඇත. 2018 වර්ෂය ආරම්භයේදී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමේ ඒකකය, ප්‍රජා සංවර්ධනය සහ ජීවනෝපායන් සම්බන්දයෙන් කෙටි කාලීන උපදේශකයකු කුලී පදනම මත පත් කරන ලද අතර ඔහු විසින් ප්‍රජා ක්‍රියාකාරිත්ව සැලසුම් සකස් කිරීම, ව්‍යාපෘති ලිවීම , සහභාගීත්ව කලමනාකරණය, ජීවනෝපායන් සංවර්ධනය ,හා සම්බන්දයෙන් පුහුණු හා දැනුවත් කිරීම් වැඩසටහන් 07ක්, තෝරා ගනු ලැබූ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින් සඳහා සිදු කරන ලදී. පහත දැක්වෙන වගුව මගින් , ප්‍රදේශ තුල ක්‍රියාත්මක වන ව්‍යාපෘතින්හි 2018.12.31 දක්වා වූ ප්‍රගතිය , පෙන්නුම් කරනු ලබයි.



| ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රදේශය | උප සංරචක 2( a ) වල පවත්නා ප්‍රගතිය . |
|---|---|
| අනුරාධපුරය | මී මැසි පාලනය , අගය එකතු කළ ආහාර නිෂ්පාදනය හා ප්‍රජා වන කටයුතු පිළිබඳ තෝරා ගත් ප්‍රජා සාමාජිකයන් සඳහා පුහුණු වැඩසටහන් 222ක් පවත්වන ලදී.<br>ආදායම් මාර්ග උත්පාදන ක්‍රියාකාරකම් 64 ක් ආරම්භ කිරීම සඳහා (23 කාන්තා ප්‍රතිලාභීන්) මහන මැෂින්, අත්කම් නිපැයුම් මැෂින්, මී මැසි පාලනය සඳහා අවශ්‍ය උපකරණ , සහ අගය එකතු කළ ආහාර නිෂ්පාදනය සඳහා සහාය ලබා දෙන ලදී..<br>රෝගීන් 255 ක් සහභාගී වූ සෞඛ්‍ය කඳවුරු දෙකක් (02) පවත්වන ලදී.<br>ගෙවතු 472 ක් සංවර්ධනය කරන ලද අතර එයින් 352 ක් (74%) ප්‍රතිලාභ කාන්තාවන්ට හිමි විය. |
| පොලොන්නරුව | සෞඛ්‍ය සම්පන්න ආහාර නිෂ්පාදනය, කුරුම්ණියන්, මී මැසි පාලනය, මැහුම් පුහුණුව සහ බැග් පුහුණුව පිළිබඳ පුහුණු වැඩසටහන් 4 ක් (පුහුණු වන්නන් 163 ක්) සඳහා පැවැත්වීම.<br>ආදායම් උපයා ගැනීමේ ක්‍රියාකාරකම් 6 ක් ආරම්භ කිරීම සඳහා කියත් , මී මැසි පාලනය සඳහා පෙට්ටි, ප්‍රජා වන ක්‍රියාකාරකම් ආරම්භ කිරීම සඳහා සහාය |

| ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රදේශය | උප සංරචක 2( a ) වල පවත්නා ප්‍රගතිය . |
|---|---|
| | දක්වන ලදී. |
| පුත්තලම | ප්‍රජා දැනුවත් කිරීම් වැඩසටහන් 6 ක් පවත්වන ලදී<br>ගෙවතු 500 ක් ආරම්භ කිරීමට කටයුතු කර ඇත. |
| කුරුණෑගල | ආදායම් උත්පාදන මැදිහත්වීමක් ලෙස ට්‍රැක්ටර් යන්ත්‍ර 02 බෙදා දෙන ලදී. .<br>ගෙවතු 100 ක් සඳහා ආධාර කිරීමට සැලසුම් කර ඇත. |
| මාතලේ | ගෙවතු 482 ක් ආරම්භ කිරීමට සහය විය.<br>අලුත්වැඩියා කරන ලද පෝෂිත ඇල (මීටර් 110 ක්) මගින් ඉලුක්කුඹුර ප්‍රදේශයේ කුඹුරු අක්කර 60 ක් ආවරණය කෙරේ.<br>පානීය ජල ළිං දෙකක් (02) ප්‍රතිසංස්කරණය කර ඇත.<br>ඇටැන්වල ගම්මානයේ ස්ථිර වැසිකිළි නොමැති පවුල් 8 ක් අතර සනීපාරක්ෂක උපකරණ බෙදා දෙන ලදී. |
| මහනුවර | මැසි පාලනය, තවාන් ස්ථාපිත කිරීම, කෝපි නිෂ්පාදනය, කාබනික ගොවිතැන, නවීන කෘෂිකාර්මික ක්‍රම, ගම්මිරිස් වගාව සහ ඉඟුරු සහ කහ කෘෂි කර්මාන්තය සඳහා පුහුණු වැඩසටහන් 8 ක් (පුහුණුවන්නන් 649 ක්) පැවැත්වීම<br>හෙක් .30 සඳහා ගොරකා පැළ බෙදා දෙන ලදී.<br>මී මැසි පෙට්ටි හා රෝපණ ද්‍රව්‍යය අදාළ උපකරණ ලබා දීම.<br>පානීය ජල පහසුකම් වැඩිදියුණු කිරීම හා සනීපාරක්ෂක ද්‍රව්‍යය බෙදා හැරීම.<br>ගෙවතු 83 ක් ආරම්භ කිරීමට සහාය වීම.<br>පාසැල් උපකරණ සිසුන් 190 ක් අතර බෙදා දෙන ලදී.<br>සෞඛ්‍ය ආරක්ෂක කඳවුරු 02 ක් පවත්වා ඇත. |
| රත්නපුර | කුඩාව සහ පිටකැලේ ගම්මානයේ නිවාස නවාතැන් පහසුකම් හයක් (06) සංවර්ධනය කිරීම.<br>ප්‍රජා ශාලාවක් ඉදි කිරීම. - පවුල් 247 ක් ප්‍රතිලාභීන් වේ. |
| මාතර | පොත්පත් තැබීම, ක්ෂුද්‍ර මූල්‍යයකරණය, කිතුල් නිෂ්පාදන, අපනයන කෘෂිකර්මාන්තය සහ සංචාරක මගපෙන්වීම පිළිබඳ පුහුණු වැඩසටහන් 6 ක් පැවැත්වීම. පුහුණුවන්නන් 280 ක් (27% ක් කාන්තා) |
| ගාල්ල | නිවාස නවාතැන් පහසුකම් සංවර්ධනය කිරීම 10 , ප්‍රජා ශාලා දෙකක් (02) සහ පානීය ජල යෝජනා ක්‍රම (01) සංවර්ධනය කිරීමට සහය වීම.<br>ප්‍රතිලාභී පවුල් 264කි.<br>ගම්මාන 5 හි නිවාස උද්‍යාන 103 ක් සංවර්ධනය කිරීම (48% ක් කාන්තා ප්‍රතිලාභීන්). |

**වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය**

සංරචක(a)2 ට අදාලව සුදුසු ජීවනෝපාය වැඩි දියුණු කිරීමේ ක්‍රම සහ ඒවා ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳව වැඩමුළු 3ක් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දකුණු කලාපයේ නිලධාරීන් සඳහා ක්‍රියාත්මක කරන ලදි.

මෙම සංරචකයට අදාලව වනජීවී දෙපාර්තමේන්තුව විසින් බුන්දල ජාතික වනෝද්‍යානය තුල සිදු කරන ලද ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

| ගම්මානය | ක්‍රියාකාරකම | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| කොන්වලාන | ප්‍රජා මූලික ජල ව්‍යාපෘතියක් ඉදිකිරීම | ප්‍රජා මූලික සංවිධානය මඟින් ඉදිකිරීම් ආරම්භ කරන ලදි. |
| නැදිගම්විල | ප්‍රජා මූලික කේටරින් සේවාවක් (catering service) ආරම්භ කිරීම | අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු නිම වෙමින් පවතී. |
| යහන්ගල-නැගෙනහිර | පරිසර හිතකාමී ළමා උද්‍යානයක් ආරම්භ කිරීම | ඉදිකිරීම් කටයුතු සඳහා ප්‍රජා මූලික සංවිධානයක් තෝරා ගන්නා ලදි. |

**උප-සංරචකය 2b අලි -මිනිස් සහජීවනය සහ ජීවනෝපායන් ආරක්ෂා කිරීම**

අනු-සංරචක 2ආ මඟින් අලි-මිනිස් ගැටුම් පවතින ප්‍රදේශවල එම ගැටුම් අවම කර ගැනීමට අවශ්‍ය සහජීවන ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන වෙන් කරනු ලබයි. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ හා ප්‍රජාමූල සංවිධානවල සහභාගිත්වයෙන් මෙම සංරචකයට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක වේ. තවද මෙම ගැටලුවෙන් පීඩා විඳින ජනකොටස් සඳහා ආර්ථිකමය දිරිගැන්වීම් ලබාදීම සහ ගැටලුව අවම කිරීමට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය කරනු ලබයි. මෙමගින් පහත සඳහන් වැඩසටහන් අදාළ ව්‍යාපෘති කාලය තුල සිදුකරන ලදී.



දන්ගහ වැව ඉදිකිරීම

| වැඩසටහන | ප්‍රගතිය |
|---|---|
| 1.දීප ව්‍යාප්ත වන අලි සංගණනය | -සංගණන ක්‍රමවේදය සහ දත්ත එක්රැස් කිරීම පිළිබඳ එක්දින වැඩමුළුවක් පවත්වන ලදී.<br>-පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යා ජෛව තාක්ෂණ ආයතනය වෙත වසුරුවල ජානමය තත්වයන් පරික්ෂ කිරීම සඳහා කොන්ත්‍රාත් ලබා දෙන ලදී.<br>-දියකඩිති සංගණන ක්‍රමය සම්බන්ධීකරණය කිරිම සඳහා ප්‍රධාන කාර්යාලයෙන් සහකාර අධ්‍යක්ෂකවරු සහ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරු 11 දෙනෙකු පත් කරන ලදී. |
| 2.වන අලි ව්‍යාප්තිය හා ඔවුන්ගේ ගමන් මාර්ග පිළිබඳ අධ්‍යයනය | -රේඩියෝ කරපටි 40ක් මිළ දී ගෙන වනජීවී සංරක්ෂණ දෙපර්තමේන්තුව වෙත ලබා දෙන ලදී. |
| 3. කුරුණෑගල සහ අනුරාධපුර දිස්ත්‍රික්ක වල ගම් හා වගා භූමි ආශ්‍රිතව ආවරණ වැට ඉදිකිරිම | කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් ප්‍රදේශ 11 ද අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් ප්‍රදේශ 06 ද හඳුනාගෙන ආරම්භ කර ඇත.<br>- ව්‍යාපෘතිය පිළිබඳව මෙම ගම්මානවල ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.<br>-අවශ්‍ය උපකරණ මිළ දී ගැනීමට වනජීවී සංරක්ෂණ දෙපර්තමේන්තුව මගින් කොන්ත්‍රාත් ලබාදුන් අතර එම භාණ්ඩ සඳහා රේගු නිරවුල් කිරීම් සිදු කරමින් පවතී.<br>-අලි- මිනිස් ගැටුම පිළිබඳව මූලික අධ්‍යයනයන් සිදුකිරීමට දත්ත ලබාගැනීම සඳහා ගම්මාන 02 තෝරාගන්න ලදී.<br>- අලි- මිනිස් සහජීවනය පිළිබඳ විදි නාට්‍යයේ ප්‍රදර්ශන වාර 27 සිදුකර ඇත.<br>-මේ පිළිබඳව රූපවාහිනී වැඩසටහන් නිර්මාණය කර ප්‍රදර්ශනය කර ඇත (දෙරණ නාලිකාව සමග) |

| වැඩසටහන | ප්‍රගතිය |
|---|---|
| 4. ලුනුගම්වෙහෙර කරදරකාරී අලි ගාල් කිරීම සහ පුනරුත්ථාපනය සඳහා ස්ථානයක් පිහිටුවීම. | -ප්‍රතිසම්පාදන ක්‍රමවේදය සිදුකිරීමට පාර්ලිමේන්තු අනුමැතිය සඳහා තාක්ෂණික කමිටුවක් පත් කරන ලදී.<br>විදුලි වැට ඉදිකිරීම සඳහා අවශ්‍ය ප්‍රදේශ එලිපෙහෙළි කිරිම සඳහා ටෙන්ඩර් ප්‍රදානය කර වැඩ සම්පූර්ණ කර ඇත.<br>-මෙම අලි පුනරුත්ථාපන භූමියේ පිහිටි වැව් 05ක් ප්‍රතිසංස්කරණය කිරීම මේ වන විට 35% පමණ සම්පූර්ණ කර ඇත.<br>-ඇතුලත හා භූමිය වටවන පරිදි ඉදිකරනු ලබන මාර්ග පද්ධතිය සඳහා ඇස්තමේන්තු සකස් කර ඇත. |

**උප-සංරචකය 3(a): රක්ෂිත ප්‍රදේශ සංරක්ෂණය හා කළමනාකරණය**

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් සංරක්ෂිත ප්‍රදේශවලට අයත් වනජීවී වාසස්ථාන වැඩිදියුණු කිරීමට සහාය වීම මෙම උප-සංරචකයේ ප්‍රධාන අරමුණයි. ප්‍රමුඛතාව අනුව සංරක්ෂිත ප්‍රදේශ සංරක්ෂණයට හා කළමනාකරණයට අදාළ සැලසුම් සකස් කිරීම සඳහා මූල්‍ය පහසුකම් මෙම උප-සංරචකය මඟින් සපයයි. තෝරාගත් භෞමික, සාගර හා තෙත් කලාපීය පරිසර පද්ධති මෙමගින් ආවරණය වේ.

**වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය**

| **ක්‍රියාකාරකම** | **භෞතික ප්‍රගතිය** |
|---|---|
| **(1)** රක්ෂිත ප්‍රදේශ සඳහා වූ කළ. සැලසුම් යාවත් කාලීන කිරීම | සිංහරාජ රක්ෂිත වනාන්තරය හා හුරුළු රක්ෂිත වනාන්තරයට අදාළව ඒවායේ සැලසුම් යාවත්කාලීන කිරීම සිදු කරන ලදි. |
| **(2)** වනාන්තර මායිම් මැනීම සහ සලකුණු කිරීම | - මීට අදාලව ගම්මාන 18ක ගැටුම් නිරාකරණය කිරීමට රැස්වීම් පවත්වන ලදි.<br>- මායිම් කි.මී. 241ක් මනින ලද අතර කි.මී. 230ක සලකුණු කිරීම් කරන ලදි.<br>- මායිම් කණු 6,560ක් මිළදී ගන්නා ලදි.<br>- සිංහරාජ රක්ෂිත වනයේ මායිම් කි.මී. 431ක නඩත්තු කටයුතු සිදු කරන ලදි. |
| **(3)** ආක්‍රමණශීලී ශාක විශේෂ පාලනය කිරීම | - හෙක්. 128ක ඉවත් කිරීම සිදු කරන ලද අතර හෙක්. 592ක නඩත්තු කටයුතු කරන ලදි. |
| **(4)** ස්වාභාවික වන-පුනර්ජනනය | - හෙක්. 128ක ස්වාභාවික වන-පුනර්ජනනය සිදු කරන ලද අතර හෙක්. 86ක නඩත්තු කටයුතු සිදු කරන ලදි.<br>- හෙක්. 86ක පයිනස් වගාවන් සඳහා සුදුසු යටිරෝපණ වගාවන් කරන ලදී. |
| **(5)** රක්ෂිත ප්‍රදේශ කළමනාකරණයට අදාළ යටිතල පහසුකම් සංවර්ධනය | - බිට්ටු වන නිලධාරීන්ගේ නිල නිවාස 11ක වැඩ 60%ක් නිම වී ඇත.<br>- විරක්කොඩිචෝලේ රක්ෂිත වනාන්තරය ආශ්‍රිතව ඉදි කරන ගල්විල eco-park හි නිල නිවාස සංකීර්ණයේ හා කාර්යාල ගොඩනැගිල්ලේ වැඩ කටයුතු 60%ක් අවසන් කර ඇත. |
| **(6)** ගිනි-පටි විවෘත කිරීම | - ගිනි ගැනීම් වැළක්වීමේ කමිටු 4ක් මාතර-සිංහරාජ රක්ෂිත වනාන්තරය ආශ්‍රිතව ස්ථාපිත කරන ලදි.<br>- ගිනි පටි කි.මී. 17ක් අලුතින් කපන ලද අතර කි.මී. 103ක නඩත්තු කටයුතු සිදු කරන ලදි. |
| **(7)** රක්ෂිත වනාන්තර ආශ්‍රිත මාර්ග පද්ධතීන් පුනරුත්ථාපනය කිරීම | - සිංහරාජ කුඩව පිවිසුමේ 15%ක වැඩ නිම කර ඇත.<br>- කන්නෙලිය වන පිවිසුම පුනරුත්ථාපනයට හා එහි වාහන නැවතුම්පොළ ඉදිකිරීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු නිම කර ඇත. |



රක්ෂිත ප්‍රදේශ මායිම් ලකුණු කිරීම



ආක්‍රමණකාරී ශාක ඉවත් කිරීම

**වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය**

| ක්‍රියාකාරකම | භෞතික ප්‍රගතිය |
|---|---|
| **(1)** රක්ෂිත ප්‍රදේශ සඳහා වූ කළමනාකරණ සැලසුම් යාවත්කාලීන කිරීම | - කළමනාකරණ සැලසුම් යාවත්කාලීන කිරීම සිදු සඳහා උපදේශකයකු බඳවා ගැනීමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කරන ලදි. |
| **(2)** මුර සංචාරක කටයුතු සඳහා අවශ්‍ය SMART Tool මෙවලම හඳුන්වා දීම | - මුලිකව ජාතික වනෝද්‍යාන 7ක මෙම මෙවලම හඳුන්වාදීම හා අවශ්‍ය සියලුම මුලික පුහුණු වැඩසටහන් සිදු කරන ලදි.<br>- මෙම මෙවලම හඳුන්වාදීමේ දෙවන අදියර සඳහා අවශ්‍ය මුලික පුහුණු වැඩසටහන් සිදු කිරීම ආරම්භ කරන ලදි. ඒ සඳහා ජාතික වනෝද්‍යාන 22ක් දැනට තෝරාගෙන ඇත.<br>- මායිම් සලකුණු කිරීමට මායිම් කණු 6560ක් මිලදී ගන්නා ලදි.<br>- සිංහරාජ රක්ෂිත වනයේ මායිම් කි.මී. 431ක නඩත්තු කටයුතු සිදු කරන ලදි. |
| **(3)** යාල ජාතික වනෝද්‍යානය තුල ඇති කුඩා ප්‍රමාණයේ වැව් පුනරුත්ථාපනය කිරීම | - වැව් 10ක වැඩ 90%ක් අවසන් කර ඇත.<br>- ගල්කෙම් 4ක් සම්පුර්ණයෙන් පිරිසිදු කර පුනරුත්ථාපනය කරන ලදි.<br>- කොන්ක්‍රීට් පොකුණු 11ක් ඉදි කිරීම සඳහා අවශ්‍ය මුලික මැනීම් කටයුතු නිම කර ඇත. |
| **(4)** ආක්‍රමණශීලි ශාක විශේෂ පාලනය කිරීම | - හෙක්. 170ක (ලුණුගම්වෙහෙර - හෙක්.20ක් හා බුන්දල - හෙක්.150ක්) ආක්‍රමණශීලි ශාක විශේෂ ඉවත් කර අවසන්ය. ලුණුගම්වෙහෙර - හෙක්. 200ක් හා බුන්දල - හෙක්. 400ක ඉවත්කෙරෙමින් පවතී. |
| **(5)** ජාතික වනෝද්‍යාන වල වන-ප්‍රතිමාරය සම්බන්ධයෙන් අධ්‍යනයන් සිදු කිරීම | - වන-ප්‍රතිමාරය සම්බන්ධයෙන් වැඩමුළු 2ක් පවත්වන ලදි.<br>- වන-ප්‍රතිමාරය සම්බන්ධ අතුරු-ව්‍යාපෘති යෝජනාවක් සකස් කරන ලදි. |

**උප සංරචකය 3 (b) - රක්ෂිත ප්‍රදේශ තුල සිදුකරනු ලබන ස්වභාවික (පාරිසරික) සංචාරක ව්‍යාපාරය**

සංචාරකයන්ගේ අවශ්‍යතා හඳුනාගනිමින් අදාළ පරිසර පද්ධතියෙහි ඉසිලීම් ධාරිතාවය අධ්‍යයනය කර රක්ෂිත ප්‍රදේශ තුල සිදුකරන ස්වභාවික පාරිසරික සංචාරක ව්‍යාපාරයෙහි ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා සැලසුම් සකස් කිරීම සහ සේවා සැපයීම මෙම උප සංරචකයේ අරමුණ වේ.

තවද, මෙම ප්‍රදේශ තුල සංචරණය කළහැකි ප්‍රශස්ථ සංචාරකයන් ප්‍රමාණය සහ සංචාරකයින්ගේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම ඇතුළුව ස්වභාවික පාරිසරික සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම සඳහා ක්‍රමානුකූල සංවර්ධන සැලසුම් සැකසීම සඳහා මෙම උප-සංරචකය සහාය වනු ඇත. තවද, මෙම උප සංරචකය යටතේ, මාර්ගෝපදේශ සේවා සහ ප්‍රජා මූලික සංචාරක සේවා වැනි ආගන්තුක සේවාවන් හි වර්තමාන තත්වය වැඩිදියුණු කිරීම සඳහා ද සහාය වනු ඇත.

අන්තර්ජාතික උපදේශකවරයෙකුගේ සහායෙන් සිංහරාජ, නකල්ස්, බුන්දල සහ උඩවලව යන රක්ෂිත ප්‍රදේශ සඳහා ස්වභාවික පාරිසරික සංචාරක සැලසුම් හතරක් වර්ධනය කරන ලද අතර, යාල වනෝද්‍යානය සඳහා පරිසර පද්ධතියෙහි ඉසිලීම් ධාරිතා වාර්තාවක් සකස්කර ඇත. අවසන් වාර්තාවන් සැකසීමට පෙර ප්‍රතිසමාලෝචනය සඳහා මෙම සැලසුම් හා අදාළ වාර්තා වන සංරක්ෂණ පොර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ ලෝක බැංකුව වෙත යොමුකර ඇත.

අන්තර්ජාතික උපදේශකවරයාගේ මෙහෙයවීමෙන් පාරිසරික සංචාරක ව්‍යාපාරයට අදාළව සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ වගකීම් දරණ දෙපාර්තමේන්තු දෙකෙහිම වගකිවයුතු නිලධාරින් සවිබල ගැන්වීම සඳහා වැඩමුළු 9 ක් සාර්ථකව පවත්වා ඇත .



පසුගිය ව්‍යාපෘති සමාලෝචන කාල පරිච්ඡේදය තුළ ,ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් ස්වභාවික පාරිසරික සංචාරක ව්‍යාපාරය සංවර්ධනය කිරීමේ අරමුණ ඇතිව අන්තර්ජාතික උපදේශකවරයෙකුගේ සහාය ලබා ගත් අතර ඔහු විසින් සිංහරාජ, නකල්ස්, බුන්දල සහ උඩවලව යන රක්ෂිත ප්‍රදේශ සඳහා ස්වභාවික පාරිසරික සංචාරක සැලසුම් හතරක් වර්ධනය කරන ලද අතර, යාල වනෝද්‍යානය සඳහා ද, පරිසර පද්ධතියෙහි ඉසිලීම් ධාරිතාවය සඳහා, වාර්තාවක් සකස්කර ඇති අතර ඒ සඳහා සංචරණය සඳහා වෙළඳ පොළ ඉල්ලුම, ආකර්ෂණ ස්ථාන, යටිතල පහසුකම් සහ සේවා, සැපයුම සහ තරඟකාරිත්වය, මානව සම්පත් හා ආයතනික ධාරිතාව සහ පාරිසරික සාධක ආදිය සැලකිල්ලට භාජනය කර ඇත .

එමෙන්ම, නකල්ස් රක්ෂිත ප්‍රදේශය සඳහාද (මාතලේ දිස්ත්‍රික්කය), ස්වභාවික (පාරිසරික) සංචාරක ව්‍යාපාරය (NBTP) ප්‍රවර්ධනය කිරීම සඳහා දින තුනක වැඩමුළුවක් සංවිධානය කරන ලදී. මෙහිදී ව්‍යාපෘතිය පිළිබඳ සමාලෝචනයක් සිදු කරනු ලැබූ අතර පුළුල් ක්‍රියාකාරී සැලැස්මක්ද, සකස් කරන ලදී.

හුරුළු - පොලොන්නරුව රක්ෂිතය තුල කි.මී 12 .ක ස්භාවික මං තිරුවක් සංවර්ධනය කර ඇත. කන්නෙලිය හා නකල්ස් යන රක්ෂිත වනාන්තර තුල කි.මී.30ක ස්භාවික සංචරණ මංතීරු වැඩි දියුණු කිරීම සඳහා ටෙන්ඩර් ප්‍රධානය කර ඇත. ඉදිකිරීම් කටයුතු වලින් 60% ක් පමණ සම්පූර්ණ කර ඇත.
ස්වභාවික සංචාරක ව්‍යාපාරය සංවර්ධනය කිරීම සඳහා පුළුල් ලෙස යෝජනා ඉදිරිපත් කිරීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ගිරිතලේ ජාතික වනජීවී පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයේ දින තුනක වැඩමුළුවක් පවත්වන ලදී . ඒ අනුව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ස්වභාවික සංචාරක

ව්‍යාපාරය සංවර්ධනය පිළිබඳ නව යෝජනා 25 ක් කෙටුම්පත් කරන ලද අතර, ඒවා අධීක්ෂණය හා අනුමත කිරීමේ ක්‍රියාවලිය සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත ඉදිරිපත් කර ඇත.

## උප සංරචකය 3 (c) - වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙහි හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙහි ආයතනික ධාරිතාව හා ආයෝජන හැකියාවන්

### වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙහි ප්‍රගතිය

වන සංරක්ෂණ දෙපාර්තමේන්තු පුහුණු මධ්‍යස්ථානයේ වැඩිදියුණු කිරීම සහ ආයතනික තත්ත්ව වැඩිදියුණු කිරීම සඳහා සැලසුම් කර ඇත .ශ්‍රී ලංකා වන විද්‍යා පුහුණු මධ්‍යස්ථානයේ (SLFI) සංවර්ධන කටයුතු සඳහා වන සවිස්තරාත්මක සැලැස්ම සකස් කරන ලද අතර එහි ඉදිකිරීම් අවසන් අදියරෙහි පසු වේ.
ඉනාමළුව ක්ෂේත්‍ර පුහුණු මධ්‍යස්ථානයේ සංකල්පමය සැලසුම් (conceptual design) සකස් කිරීම අවසන් කර ඇති අතර සවිස්තරාත්මක සැලැස්ම අවසන් අදියරේ අවසන් පසුවේ.
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙහි නිලධාරීන්ගේ ඉල්ලීම පරිදි ,ඔවුන්ට අවශ්‍ය ක්ෂේත්‍ර සහ කාර්යාලීය උපකරණ (GPS, පරිගණක, අනෙකුත් කාර්යාල උපකරණ) මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සහාය වන ලදී .



### වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙහි ප්‍රගතිය

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙහි පුහුණු ආයතනය වැඩිදියුණු කිරීම සඳහා ද මූල්‍ය ආධාර සපයනු ලැබේ. ජාතික වනජීවී පුහුණු හා පර්යේෂණ ආයතනය (NWRTC) වැඩිදියුණු කිරීම සඳහා සවිස්තරාත්මක සැලසුම් නිම කරන ලද අතර මෙහි ඉදිරි උපදේශන කටයුතු සඳහා ලංසු කැඳවනු ලැබිය.
ව්‍යාපෘතියේ අරමුදල් යොදා ගනිමින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙහි තෝරාගත් නිලධාරීන් 27දෙනෙකු කොළඹ විශ්ව විද්‍යාලයේ වනජීවී ඩිප්ලෝමා පාඨමාලාවෙහි ප්‍රථම පාඨමාලාව සාර්ථකව නිම කරන ලදී.
2018 අගෝස්තු 7 සිට 9 දක්වා පවත්වන ලද WILDLANKA-2018 වාර්ෂික වැඩසටහන සඳහා ව්‍යාපෘතිය මඟින් අරමුදල් ලබා දෙන ලදී.
පරිසර පද්ධති කළමනාකරණ වැඩසටහන් කඩිනම් කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ට්‍රැක්ටර් රථ 8 ක් සහ ආක්‍රමණික ශාක ඉවත් කිරීමෙ යන්ත්‍ර 10 ක් මිලදී ගැනීම සඳහා මූල්‍ය ආධාර ලබාදී ඇත.
වාසස්ථාන කළමනාකරණය සහ මාර්ග වැඩිදියුණු කිරීමේ කටයුතු සඳහා කැණීම් යන්ත්‍ර 4 ක් සපයා ඇත.
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඩෙස්ක්ටොප් පරිගණක සහ ලැප්ටොප් පරිගණක ලබා දෙමින් ආයතනික ධාරිතාව ශක්තිමත් කිරීම සඳහා ද ප්‍රතිපාදන ලබා දී ඇත .




| Land Use Type | | Land Extent (Ha) |
|---|---|---|
| Agriculture land | Paddy Area (Net area) | 2700 |
| | Fruits and OFC Area (Net area) | 6712 |
| Settlement Land (Net area) | | 1148 |
| Forest Land | | 24708 |
| Water Bodies | | 6039 |
| Canal, Roads & Service centers | | 2845 |
| Total | | 44152 |

# මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය

කඩිනම් මහවැලි සංවර්ධන වැඩසටහන (AMDP) යටතේ ඉදිකළ මුල්ම ප්‍රධාන ව්‍යාපෘතිය වන්නේ මාදුරු ඔය සංවර්ධන ව්‍යාපෘතිය වන අතර මාදුරු ඔය, මහවැලි ගඟ හා මුන්දෙනි ආරු ඔය අතර පිහිටා ඇත්තේ කිලෝමීටර් 135 ක දිගින් හා 453 km2 වපසරියකින් යුත් පෝෂක ප්‍රදේශයකි. මාදුරුඔය සංවර්ධන ව්‍යාපෘතියේ සම්පූර්ණයෙන් හෙක්ටයාර් 135,000 ක දළ භූමි ප්‍රමාණයක් අයත් වන අතර  එයට අයත් වාරි ජල පහසුකම් සැපයිය හැකි භූමි ප්‍රමාණය හෙක්ටයාර් 37,500 ක් වේ. (වම් ඉවුර හෙක්ටයාර් 22,000 සහ දකුණු ඉවුර හෙක්ටයාර 15,500ක් ) මාදුරු ඔය දකුණු ඉවුර  නැගෙනහිරින් කිරාන් කලපුවෙන්ද ගිණිකොණ දිසාවෙන් නියන්ගොල්ල ඇලෙන්ද උතුරු හා බටහිර දෙසින් මාදුරු ඔයෙන්ද මායිම් වේ.

ව්‍යාපෘති වියදම - ඇ.ඩෙ.මි. 475
ව්‍යාපෘති කාල සීමාව - අවුරුදු 04
කොන්ත්‍රාත්කරු - China CAMC Engineering Co.Ltd

ක්‍රියාත්මක වැඩසටහන




2018 වර්ෂයේ ලඟාකර ගත් ප්‍රගතිය

- චීනයේ CAMC ඉන්ජිනියරින් සමාගම සමග ඉංජිනේරු ප්‍රසම්පාදන ඉදිකිරීම් (EPC) ගිවිසුම අත්සන් කිරීම
- පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව ඉදිරිපත් කිරීම
- අතිරේක පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාවක් ඉදිරිපත් කිරීම

# II වන කොටස

## සෘජු විදේශ ප්‍රදාන මගින් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති ප්‍රගතිය

**1. අමාත්‍යාංශය විසින් සෘජුවම ක්‍රියාත්මක කරන ව්‍යාපෘති**

- ශ්‍රී ලංකාව තුළ මොන්ට්‍රියල් සන්ධානයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම
- මානව පෝෂණය හා යහපැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා ජෛවවිවිධත්වය හා තිරසර භාවිතය අනුප්‍රවාහගත කිරීමේ ව්‍යාපෘතිය
- ශ්‍රී ලංකාවේ කෘෂි පාරිසරික කලාප සංරක්ෂණය සහ දේශගුණික විපර්යාස වලට ජනතාව අනුගත කිරීමේ ව්‍යාපෘතිය
- මිනමාටා සම්මුතියට අදාල ඇගයීම
- සෞඛ්‍ය හා පරිසර ප්‍රතිපත්ති සඳහා වායු තත්ත්ව තක්සේරුව පිළිබඳ ව්‍යාපෘතිය




# ශ්‍රී ලංකාව තුළ මොන්ට්‍රියල් සන්ධානයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම

මොන්ට්‍රියල් සන්ධානය මගින් මේවන විට ඕසෝන් ක්ෂයකාරක ද්‍රව්‍ය 96 කින් 55 ක් සම්පූර්ණයෙන්ම භාවිතයෙන් ඉවත් කර ඇත. සත්ත්ව හා ශාක නිරෝධායන කටයුතු හා නැව්ගත කිරීමේ කටයුතු හැර (QPS) අනෙකුත් කටයුතු සඳහා මීතයිල් බ්‍රෝමයිඩ් (MeBr) භාවිතය සම්පූර්ණයෙන්ම තහනම් කර ඇත. ඉතිරි රසායනික වන හයිඩ්‍රොක්ලෝරොෆ්ලෝරොකාබන් Hydrochloroflurocarbons - HCFCs 2013 වසරේ සිට අදියරගතව භාවිතයෙන් ඉවත් කිරීම ආරම්භකර ඇති අතර 2030 වන විට අවසන් කිරීමට නියමිතය.

ඕසෝන් ස්ථරය නැවත යථා තත්ත්වයට පත් කිරීම හා ගෝලීය උණුසුම අඩු කර මිහිමත ජීවයේ සුරක්ෂිතතාව තහවුරු කරණු පිණිස ඕසෝන් වියන සුරැකීම අරමුණු කර ගනිමින් 2018 වර්ෂයේදී ජාතික ඕසෝන් ඒකකය මගින් ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් රැසකි.

**ශ්‍රී ලංකා තුල මොන්ට්‍රියල් සන්ධානයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව (PSC) ස්ථාපනය කිරීම**

2018 වර්ෂයේ ශ්‍රී ලංකාව තුල මොන්ට්‍රියල් සන්ධානයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය සඳහා පාර්ශවකරුවන්ගේ සම්බන්ධීකරණය ශක්තිමත් කිරීමට ක්ෂේත්‍රයේ නිපුන පාර්ශවකරුවන්ගෙන් හා විශේෂඥයන්ගෙන් සමන්විත මෙහෙයුම්/නියාමන කමිටුව (PSC) ස්ථාපනය කරන ලදී. මොන්ට්‍රියල් සන්ධානයේ ඉලක්කයන් කරා ලඟාවීම හා ගැටළුකාරී තත්ත්වයන් මගහරවා ගැනීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග නිශ්චය කර ගැනීම මෙම කමිටුව වෙත පැවරෙනු ඇත.

**HCFC ආනයන පංගු ක්‍රමය (quota distribution) යටතේ 2018 වර්ෂය සඳහා කෝටා නිකුත් කිරීම (ඕසෝන් ප්‍රහීනකාරක ද්‍රව්‍ය පාලනය සඳහා ක්‍රියාත්මක යාන්ත්‍රණය)**

ඕසෝන් ප්‍රහීනකාරී රසායනිකයක් වන හයිඩ්‍රොක්ලෝරොෆ්ලෝරොකාබන් (HCFC) භාවිතයෙන් ඉවත් කිරිම සඳහා ශ්‍රී ලංකාව තුල HCFC කළමණාකරණ සැළැස්මක් ක්‍රියාත්මක වන අතර ශීතකරණ හා වායු සමිකරණ ක්ෂේත්‍රයන්හි සේවාවන් සඳහා අවශ්‍ය HCFC ආනයනය සඳහා ජාතික ඕසෝන් ඒකකය මගින් පාලනය කෙරේ. ඒ අනුව 2018 වර්ෂයේදී අමාත්‍යාංශයේ ලියාපදිංචි ආයතන 24ක් සඳහා පමණක් HCFC ආනයනය කිරීම සඳහා quota නිකුත් කරන ලද අතර අනයනය මෙට්‍රික් ටොන් 164.761 දක්වා අවම කර ගැනීමට හැකිවිය.

**ඕසෝන් ප්‍රහීනකාරී ද්‍රව්‍ය පරිභෝජනය වාර්තා කිරීම**

මොන්ට්‍රියල් සන්ධානයේ වගන්ති 7 යටතේ වාර්ෂික ඕසෝන් ප්‍රහීනකාරී ද්‍රව්‍ය පරිභෝජනය ඕසෝන් ලේකම් කාර්යාලයට හා බහු පාර්ශවීය අරමුදලේ ලේකම් කාර්යාලයට වාර්තා කිරීම අනිවාර්ය වේ. මෙය ඉතා වැදගත් හා ප්‍රමුඛ කාර්යයකි. ඒ අනුව 2017 වසරේ ඕසෝන් ප්‍රහීනකාරී ද්‍රව්‍ය පරිභෝජනය 2018 අප්‍රේල් මාසයේදී එකී ආයතන වෙත වාර්තා කර ඇති අතර 2018 වසරේ ඕසෝන් ප්‍රහීනකාරී ද්‍රව්‍ය පරිභෝජනය 2019 අප්‍රේල් මාසයේදී වාර්තා කිරීමට නියමිතය. සන්ධානයේ සියලු පාර්ශවකරුවන් ආනයනය හා අපනයනය කරණු ලබන රසායනික ද්‍රව්‍යයන් සම්බන්ධ දත්ත මෙම ලේකම් කාර්යාල සතුව පවතින බැවින්, නීති විරෝධි ආනයනයන් හා අපනයනයන් පාලනයට මෙය මහත් පිටුවහලක් වී ඇත.

**ශුන්‍ය ඕසෝන් ක්ෂයකාරී විභවයකින් හා අඩු ගෝලීය උණුසුමකින් යුත් ශීතකාරක භාවිතා කරමින් නිපදවා ඇති වායුසමන යන්ත්‍ර මිළදී ගැනීමට දිරි දීමනා ප්‍රදානය**

දැනට වායුසමනය සඳහා බහුලව භාවිතා කරනු ලබන ස්පිලිට් සහ පැකේජ් (Split and Package) වායුසමන යන්ත්‍රවල ක්‍රියාකාරී ශීතකාරකය HCFC 22 (R 22) වන අතර R 22 ඕසෝන් ක්ෂයකාරක විභවයකින් සහ ඉහල ගෝලීය උණුසුම් විභවයකින් යුත් ශීතකාරකයක් බැවින් දේශගුණික විපර්යාස අවම කිරීමේ ජාත්‍යන්තර සාමූහික එකඟතාවයට අනුගතවෙමින් ශ්‍රී ලංකාවද R 22 භාවිතා කරනු ලබන වායු සමන යන්ත්‍ර ආනයනය ද පාලනය කිරීමට අවශ්‍ය නෛතික කටයුතු ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී සිදු කරමින් පවතී.

තවද ශුන්‍ය ඕසෝන් ක්ෂයකාරක විභවයකින් (0 ODP) සහ අවම ගෝලීය උණුසුම් විභවයකින් යුත් ශීතකාරක (R 32, R 290) භාවිතා කරන ධාරිතාව 9,000 Btu/h සිට 24,000 Btu/h දක්වා වන වායු සමන යන්ත්‍ර මිළදී ගැනීම උනන්දු කිරීම පිණිස විශේෂ දිරි දීමනා ප්‍රදානය කිරීමේ ව්‍යාපෘතිය යටතේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) සහයෝගයෙන් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන සඳහා වායුසමන යන්ත්‍ර 97ක් මිළදී ගැනීමට 2018 වසරේදී දිරි දීමනා ලබා දි ඇත.

**R-22 ශීතකාරක පවිත්‍ර කිරීමේ මධ්‍යස්ථාන (Refrigerant Reclamation Centers) ස්ථාපිත කිරීම**

මෙහිදී HCFC ආනයනය පාලනය වීමක් සිදු වන බැවින් එම උපකරණ සේවාවන් සහ නඩත්තු කටයුතු සඳහා HCFC හි හිඟතාවයක් ඇතිවිය හැකි බැවින් HCFC ශිතකාරක පවිත්‍ර කර නැවත භාවිතය දිරි ගැන්වීමට HCFC ශිතකාරක පවිත්‍රකරණ මධ්‍යස්ථාන 8 ක් තාක්ෂණ විද්‍යාල හා ඒකාබද්ධව පෙර වසරවලදී ස්ථාපිත කර ඇති අතර 2018 වර්ෂයේ ජූනි 05 වෙනිදාට යෙදුණු ලෝක පරිසර දිනයට සමගාමීව නව වන (09) ශිතකාරක පවිත්‍රකරණ මධ්‍යස්ථානය ගම්පහ කාර්මික විද්‍යාලයේදී ආරම්භ කරන ලදී.

**ශ්‍රී ලංකා රේගුව වෙත ශීතකාරක විශ්ලේෂක (Refrigerant Analyzers) ප්‍රදානය කිරීම**

ශීතකාරක විශ්ලේෂක යන්ත්‍රය මගින් විවිධ වර්ගයේ ශීතකාරක එකිනෙකින් වෙන් කර හඳුනාගත හැකි අතරම එකී ශීතකාරකයන් විශ්ලේෂණය කර එහි සංයුතිය සොයාගත හැක. එබැවින් මෙම උපකරණය මගින් ශීතකාරක නීති විරෝධී ලෙස ආනයනය කිරීම වළක්වාගත හැකි වෙයි. මෙම අරමුණ ඉටු කර ගැනීමේ සඳහා ජාතික ඕසෝන් ඒකකය, 2018 ජගත් ඕසෝන් දිනයට සමගාමීව ශ්‍රී ලංකා රේගුව වෙත ශීතකාරක විශ්ලේෂක යන්ත්‍ර 02ක් අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රදානය කරන ලදී.

**ශීතකරණ හා වායු සමීකරණ ක්ෂේත්‍රයේ නියුතු සේවා හා නඩත්තු ආයතන සම්බන්ධයෙන් දත්ත පද්ධතියක් සකස් කිරීම**

ශීතකරණ හා වායු සමන ක්ෂේත්‍රයට සම්බන්ධ ආයතන හා කාර්මික මහතුන් පිළිබඳව දත්ත පද්ධතියක් තබා ගැනීම අත්‍යවශ්‍ය ක්‍රියාමාර්ගක් බව මොන්ට්‍රියල් සන්ධානය සම්බන්ධ පාර්ශවකරුවන්ගේ රැස්වීම්වලදී අවධාරණයෙන් සඳහන් කරනු ලබයි. එබැවින් ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින ශීතකරණ හා වායුසමීකරණ (RAC) සේවා සපයනු ලබන ආයතන හා කාර්මික මහතුන් ලියාපදිංචි කිරිම සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ එක්ව දිස්ත්‍රික් ලේකම් හරහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් 2018 වර්ෂය තුලදී අවශ්‍ය පියවර ගන්නා ලදී.

**ශීතකරණ හා වායු සමීකරණ ක්ෂේත්‍රයේ නියුතු කාර්මිකයින් සඳහා විධිමත් පුහුණුවක් හා පිළිගත් සහතිකපතක් ලබාදීම**

මෙම ක්ෂේත්‍රයේ සේවයෙහි නියුතු කාර්මිකයින් වැඩිදෙනෙකු විධිමත් පුහුණුවක් ලබා ඇතත් ප්‍රායෝගික පුහුණුවක් රහිත කාර්මිකයින් විසින් අනවශ්‍ය ලෙස ශීතකාරක විශාල ප්‍රමාණයක් පරිසරයට මුදා හැරීම සිදු කරණු ලබයි. මෙවැනි කාර්මිකයින්ගේ සේවාව ප්‍රමිතිගත කිරීම සඳහා ශීතකරණ හා වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ පරිසර මිතුරු තාක්ෂණය පිළිබඳ පුහුණුවක් ඔවුන්ට ලබාදීමෙන් පසු පැවැත්වෙන පරීක්ෂණයකින් පසු ඔවුන් සඳහා Recognition for Prior Learning (RPL) නමින් හඳුන්වනු ලබන සහතිකපතක් නිකුත් කිරීමටද අවශ්‍ය මූලික කටයුතු 2018 වර්ෂයේදි සම්පාදනය කරන ලදී.

**කිගාලි සංශෝධනය**




2016 වසරේදී මොන්ට්‍රියල් සන්ධානය විසින් සම්මත කරගත් කිගාලි සංශෝධනය යටතේ සියළු රාජ්‍යයන් සිය හයිඩ්‍රොෆ්ලෝරෝකාබන් (HFC) නිෂ්පාදනය හා භාවිතය ඉදිරි වසර 30 තුලදී 80% කින් අඩු කිරීමට එකඟවිය. මෙමගින් ශතවර්ෂය අවසානයේදී සෙ. ග්‍රේ අංශක 0.5 කින් ගෝලීය උණුසුම ඉහල යෑම වලක්වා ගැනීමට හැකිවනු ඇත.මෙම සංශෝධනය යටතේ සංවර්ධිත රාජ්‍යන් 2019 වසරේදීද කණ්ඩායම් 1 ට අයත්වන සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යන් 2024 වසරේදීද කණ්ඩායම් 2ට අයත්වන සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යන් 2028 වසරේදීද හයිඩ්‍රොෆ්ලෝරෝකාබන් (HFCs) භාවිතය පාලනය කිරීම ආරම්භ කිරීමට නියමිතව ඇත.
කිගාලි සංශෝධනයට අපරානුගත වූ ශ්‍රී ලංකාව කිගාලි සංශෝධනයට අනුගතවූ 28 වන රාජ්‍යයයි.

**කිගාලි සංශෝධනය යටතේ හයිඩ්‍රෝෆ්ලෝරොකාබන් (HFCs) අදියරගතව (භාවිතය) සීමා කිරීම හා ඕසෝන් ප්‍රහීනකාරී ද්‍රව්‍ය භාවිතයෙන් ඉවත් කිරීමේ වැඩසටහන සඳහා ප්‍රචාරණය ලබාදීම**




මෙම කර්තව්‍ය සඳහා අත්‍යවශ්‍ය වූ මූලික ප්‍රචාරණ කටයුතු සඳහා ජාතික ඕසෝන් ඒකකය විසින් මුද්‍රිත හා ඉලෙක්ට්‍රොනික මාධ්‍ය භාවිතයට ගන්නා ලදී. මේ යටතේ පොත් පිංච, අත් පත්‍රිකා, විවිධ පොත් මුද්‍රණය කල අතරම ඕසෝන් වියන සුරැකීම සම්බන්ධයෙන් වූ සුවිශේෂී කරුණු ඇතුළත් වීඩියෝ පට 02ක් නිෂ්පාදනය කිරීම සඳහා වූ මූලික අදියරෙහි කටයුතු අවසන් කරන ලදී. මීට අමතරව මේ සම්බන්ධයෙන් සිංහල, දමිළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පල කරන ලද පුවත්පත් දැන්වීම් 04ක් මගින් අතිවිශාල පාඨක සංඛ්‍යාවක් ග්‍රහණය කර ගැනීමේ හැකියාවක් ලැබිණි.

## දැණුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

- **රේගු නිලධාරීන් හා ආනයන හා අපනයන පාලන නිලධාරීන් සඳහා ධාරිතා වර්ධන වැඩසටහන (ඕසෝන් ප්‍රහීනකාරී ද්‍රව්‍ය නීති විරෝධී ලෙස ආනයනය වැළැක්වීම)**

ඕසෝන් ප්‍රහීනකාරී ද්‍රව්‍ය නීති විරෝධී ලෙස ආනයනය වැළැක්වීම සඳහා රේගු නිලධාරීන් 116 දෙනෙක් ආනයන හා අපනයන පාලන නිලධාරීන් 100 දෙනෙක් දැනුවත් කිරීම හා පුහුණු කිරීම සිදු කරන ලදී. මෙහිදී ඕසෝන් වියනට හානි කරන ශීතකාරක හඳුනා ගැනීම පිළිබඳව ප්‍රදර්ශනාත්මක ප්‍රායෝගික පුහුණුවක්ද පවත්වන ලදී. එමගින් ශීතකාරක රේගුවෙන් මුදා හැරීමට පෙර හඳුනාගැනීමේ හැකියාව පිළිබඳ රේගු නිලධාරීන්ට අවශ්‍ය දැණුම ලබා දෙනු ලැබිණි.

- ශීතකරණ හා වායු සමන ක්ෂේත්‍රය සඳහා හරිත තාක්ෂණය හඳුන්වාදීම

වායු සමීකරණ හා ශීතකරණ ක්ෂේත්‍රයේ උපකරණ සේවා කිරීමේදී HCFC-22 ශීතකාරකය වායුගෝලයට නිදහස් නොකර සේවා කිරීමේ තාක්ෂණයක් හඳුන්වා දී ඇති අතර මේ යටතේ පුහුණු වැඩසටහන් 13ක් තාක්ෂණ විද්‍යාලවල ශීතකරණ හා වායු සමන ක්ෂේත්‍රයේ පුහුණුවන්නන්, ශීතකරණ හා වායු සමන ක්ෂේත්‍රෙය් සේවා හා නඩත්තු ආයතනවල හිමිකරුවන් හා කාර්මිකයින්, ශීතකරණ හා වායු සමන හා ශීතකරණ ක්ෂේත්‍රෙය් ඉංජිනේරුවරුන් හා මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් සඳහා පවත්වා ඇත. තවද, 2019.01.01 දින සිට ශීතකරණ හා වායු සමන උපකරණ සේවා හා නඩත්තු කටයුතු සිදු කරනු ලබන සියළු කාර්මික ආයතන අනිවාර්යෙන්ම ශීතකාරක එකතු කිරීමේ යන්ත්‍ර හා අනෙකුත් උපාංග භාවිතා කිරීම අනිවාර්ය කොන්දේසියක් පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම හා අලුත් කිරීම සඳහා ඇතුලත් කිරීම සඳහා අදල රෙගුලාසින් සකස් කරන ලදී.

- **පාසල් සිසුන්, ගුරුවරුන්, රාජ්‍ය සේවකයින් හා පොලිස් නිලධාරීන් පුහුණු කිරීම හා දැණුවත් කිරීම**



ඕසෝන් වියන පිලිබඳවත් එය හායනය වන ආකාරය එම තත්ත්වය මානව සෞඛ්‍යය ජෛව විවිධත්වය හා දේශගුණ විපර්යාස කෙරෙහි බලපාන ආකාරය පිලිබඳවත් එය රැක ගැනීමට ගත හැකි ක්‍රමෝපායන් පිලිබඳවත් පාසල් ශිෂය ශිෂ්‍යාවන්, ගුරුවරුන්, රාජ්‍ය සේවකයින් හා පොලිස් නිලධාරීන් සඳහා වැඩමුළු 26ක් පවත්වා ඇත.

- **පරිසර නියමුවන් සඳහා පවත්වන ලද දැණුවත් කිරීමේ විශේෂ වැඩසටහන**

ජාතික ඕසෝන් ඒකකය මධ්‍යම පරිසර අධිකාරිය සහ අධ්‍යාපන අමාත්‍යාංශය සමග එක්ව රන් හා රිදී පදක්කම් ලාභී පරිසර නියමුවන් සඳහා විශේෂ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

1). ඕසෝන් වියන හායනය වීම සහ ඊට සමාන්තරව ඇතිවන්නාවූ දේශගුණ විපර්යාස, ජෛව විවිධත්වය හා මානව සෞඛය කෙරෙහි ඇති වන්නාවූ බලපෑම් අවම කර ගැනීම සහ ඕසෝන් වියන රැකගැනීම

සම්බන්ධයෙන් පුහුණු වැඩමුළු 05ක් උතුර, නැගෙනහිර, මධ්‍යම, ඌව හා සබරගමුව යන පළාත් ආවරණය වන පරිදී පවත්වන ලදී.




2). **පාසල් සිසුන් සඳහා වූ දීප ව්‍යාප්ත පැන විසඳුම් තරඟය -** මෙම තරඟාවලිය 2018 වර්ෂයේ ඕසෝන් දින සැමරුම් උළෙලට සමාගාමීව පවත්වන ලද අතර ස්වර්ණ හා රජත පදක්කම්ලාභී පරිසර නියමුවන් ඒ සඳහා සහභාගී කරවාගන්නා ලදී. මෙහිදී සිංහල මාධ්‍ය සඳහා දිස්ත්‍රික් 16ක් නියෝජනය කරමින් පරිසර නියමු කණ්ඩායම් 16ක් හා දමිළ මාධ්‍ය සඳහා දිස්ත්‍රික් 05ක් නියෝජනය කරමින් කණ්ඩායම් 05ක්ද සහභාගී විය. මෙහි සිංහල මාධ්‍ය වැඩසටහන් 07ක් හා දමිළ මාධ්‍ය වැඩසටහන් 01ක් ස්වාධීන රූපවාහිනී සේවය ඔස්සේ විකාශනය කරන ලදී.

- **ජගත් ඕසෝන් දිනය - 2018**




මෙවර මොන්ට්‍රියල් සන්ධානය බිහිවී වසර 31ක් සපුරාලීම නිමිතිකර ගනිමින් හා "සිසිලන සමඟින් ඉදිරියට" තේමාව කරගනිමින් ශ්‍රී ලංකාවද 2018 වර්ෂයේ සැප්තැම්බර් 17 දින ජගත් ඕසොන් දිනය අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා පරිසර නියෝජ්‍ය අමාත්‍ය අජිත් මාන්නප්පෙරුම මැතිතුමාගේ සහභාගිත්වයෙන් බණ්ඩාරනායක ජාත්‍යාන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී අති උත්කර්ෂවත් අයුරින් පවත්වන ලදී. මෙහිදී මොන්ට්‍රියල් සන්ධානයට අනුකූලව නවීන ලෝකයට ගැලපෙන පරිසර හිතකාමී ශීතකරණ හා වායු සමීකරණ සඳහා නව තාක්ෂණ ක්‍රමවේදයන් හඳුන්වාදීම පිණිසත් ශීතකරණ හා වායු සමීකරණ ක්ෂේත්‍රය මුහුණ දීමට සිදු විය හැකි අභියෝගයන් පිළිබඳවත් වට මේස සාකච්ඡාවක් එදින පවත්වන ලදී.



# මානව පෝෂණය හා
# යහපැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා
# ජෛවවිවිධත්වය හා තිරසර භාවිතය
# අනුප්‍රවාහගත කිරීමේ ව්‍යාපෘතිය (BFN)

- දැනුම මූලික කරගත් ක්‍රියාකාරකම්



ආහාර සංයුතිය විශ්ලේෂණය-
ආහාර වල පෝෂණ ප්‍රතිලාභවල වැදගත්කම මහජනතාව අතර ප්‍රචලිත කිරීම සඳහා තෝරාගත් ඌන භාවිත පලතුරු, එළවළු සහ පලා වර්ගවල පෝෂණ සංයුතිය විශ්ලේෂණය කිරීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලදී. ගන්නෝරුව පලතුරු පර්යේෂණ මධ්‍යස්ථානය, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨයේ ආහාර විද්‍යා දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව 2018 වර්ෂය තුලදී ඌනභාවිත විශේෂ 33ක පෝෂණ තත්ත්වය විශ්ලේෂණය සිදු කර ඇත.

- ප්‍රතිපත්ති, නියාමන රාමුව සහ වෙළඳපොළ

කෘෂි ජෛවවිවිධත්වය හා ඉහළ පෝෂණ වටිනාකමකින් යුත් ආහාර හඳුනාගැනීම, අගය එකතු කිරීම, සංවර්ධනය සහ නව අලෙවි විකල්පයන් සහ මාර්ගෝපදේශ සකස් කිරීම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨයේ කෘෂි වෙළඳ මධ්‍යස්ථානය මගින් සිදු කර ඇත. ඉන් අනතුරුව රාජ්‍ය, රාජ්‍ය නොවන සහ පුද්ගලික අංශයේ මේ සම්බන්ධයෙන් වූ ප්‍රධාන පාර්ශවකරුවන් අතර මෙම දැනුම බෙදාහරින ලදී.

- දැනුවත් කිරීම හා සබැඳි ක්‍රියාකාරකම්



ව්‍යාපෘති නියමු ක්ෂේත්‍රවල ගෙවතු විවිධාංගීකරණය
ගම්පොල සහ ගිරිබාව ව්‍යාපෘති නියමු ක්ෂේත්‍රවල ගෙවතු 50ක් විවිධාංගීකරණය කිරීම, කෘෂි ජෛවවිවිධත්වය හා සෞඛ්‍ය පෝෂණ ආහාර පුරුදු වැඩිදියුණු කිරීම ඇතුළු ගුණාත්මක වැඩසටහන් රාශියක් ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කර ඇත. ගෙවතු විවිධාංගීකරණ උපකරණ, රෝපණ ද්‍රව්‍ය, කාබනික පොහොර, අඩු ජල තත්ත්ව යටතේ වගාකරණ උපක්‍රම සඳහා ආධාර කිරීම 2018 වර්ෂය තුලදී මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලදී.

ඒකාබද්ධ පළිබෝධනාශක වැඩසටහනක් පවත්වන ලද අතර එහි ප්‍රධාන අරමුණ වූයේ ගෙවතු වගාවන්ට බලපාන පළිබෝධ රෝග තත්ත්වයන්ගෙන් ගෙවතු වගාවන් ආරක්ෂා කර ගැනීමයි. මෙම පරිසර හිතකාමී පළිබෝධ රෝග පාලන ක්‍රම ගන්නෝරුව පැලෑටි සංරක්ෂණ මධ්‍යස්ථානයේ නිළධාරීන්ගේ උපදෙස් මත ලබාදෙන ලදී.




# ශ්‍රී ලංකාවේ කෘෂි පාරිසරික කලාප සංරක්ෂණය සහ දේශගුණික විපර්යාස වලට ජනතාව අනුගත කිරීමේ ව්‍යාපෘතිය (BACC)

- සාම්ප්‍රදායික හා වැඩිදියුණු කළ බෝග ප්‍රභේද හඳුන්වාදීම



සාම්ප්‍රදායික හා වැඩිදියුණු කළ බෝග ප්‍රභේද ගන්නෝරුව පැලෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේදී (PGRC) සහ උද්‍යාන බෝග පර්යේෂන හා සංවර්ධන ආයතනයවල පර්යේෂණ ක්ෂේත්‍රයන් තුල ගුණනය කරමින් ගොවි ප්‍රජාවට ලබාදෙන බීජ ප්‍රමාණය ක්‍රම ක්‍රමයෙන් වැඩිකරමින් නොකඩවා ආදර්ශන කොටු ලබා දීම සිදු කරන ලදී. එලෙස ගුණනය කල බීජ භාවිතා කරමින් ව්‍යාපෘතියේ බල ප්‍රදේශ 3 හිම සහභාගිත්වතා ගොවි පර්යේෂණ කොටු (Farm Fild Fora) පිහිටුවමින් කාලගුණික විපර්යාසය ජය ගැනීමට සමත් වන හා ගොවින් රුචියක් දක්වන බෝග වර්ග තෝරා ගැනීම සිදුකර ඇත.

- ජෛවවිවිධත්ව පොළක් පැවැත් වීම (Bio diversity Fair)



ගිරිබාව,ගම්පොල හා වන්නිකුඩා වැව ගොවින් 88 දෙනෙකුගේ සහභාගිත්වය ඇතුව ගිරිබාව, ගම්පොල කනිෂ්ඨ විද්‍යාලයෙදි පවත්වනු ලැබූ ජෛවවිවිධත්ව පොළ මගින් සම්ප්‍රදායික බෝග වර්ග හඳුනා ගැනීම ප්‍රධාන වශයෙන්ම සිදු කරයි. මෙහිදී ජෛවවිවිධත්වය පාදක කරගත් නිපැයුම් වර්ගද ඒවාට අදාළ සාම්ප්‍රදායික දැනුමද මෙම පොළ වෙත එම ගොවින් විසින් රැගෙන ආ අතර ඒවා ප්‍රදර්ශනය කිරීම හා හුවමාරු කිරීමද සිදුවිය. මෙහිදී උසස් ජෛව විවිධත්වයක් ඉදිරිපත් කල විශිෂ්ට ගොවින් තෝරා ත්‍යාග ප්‍රදානය කිරීමක්ද සිදු කරන ලදී.

- ප්‍රජා මුල ජෛවවිවිධත්ව ලේඛනය සකස් කිරීම (Community Biodiversity Registers)





ප්‍රදේශය තුළ පවතින ජෛවවිවිධත්වය හා එයට අදාල සාම්ප්‍රදායික දැනුම හඳුනාගෙන ලේඛනගත කිරීමේ අපේක්ෂාවෙන් සකස් කරනු ලබන ප්‍රජා මුල ජෛවවිවිධත්ව ලේඛනයන් 3 ක් බැගින් එක් ව්‍යාපෘති බල ප්‍රදේශයක් වෙනුවෙන් සකස් කරන ලදි. එක් ලේඛනයක් බෝග වගාව වෙනුවෙන්ද, තවත් ලේඛනයක් ඖෂධ පැලෑටි වෙනුවෙන්ද අනෙක් ලේඛනය සත්ව පාලනය වෙනුවෙන්ද සකස් කර ඇත.

- පාංශු හා ජල සංරක්ෂණ උපක්‍රම හදුන්වාදීම



ගම්පොල, මිල්ලෙණිය හා උඩුකුඹුර ව්‍යාපෘති බල ප්‍රදේශ සඳහා පාංශු හා ජල සංරක්ෂණ ක්‍රම වන පස් වැටි, ගල් වැටි, කුට්ටි කානු ,ග්ලිරිසීඩියා බාධක වෙලි, තනි වේදිකා සහ ජල කාවැද්දුම් ව්‍යුහයන් වගා බිම් 13 ක ස්ථාපිත කරන ලදී. මෙයට අමතරව පාංශු ජෛව විවිධත්වය ඉහළ නැංවීම සඳහා කොම්පෝස්ට් නිපදවීම හා භාවිතයට ගොවීන් පුහුණු කර ඇත.

- පරාග වාහකයන්, පලිබෝධකින්, විලෝපිකයන් හා ස්වභාවික සතුරන් හදුනාගැනීම හා ඔවුන්ට බලපාන සාධක පිළිබඳව අධ්‍යයනය කිරීම

පරිසර පද්ධති හා සේවාවන් හදුනාගැනීමට හා වැඩි දියුණු කිරීම අරමුණු කරගෙන ගන්නෝරුව HORDI ආයතනය විසින් පහත සදහන් ඉලක්ක සපුරාගෙන ඇත.

- සමීක්ෂණයන් මගින් එක් එක් ව්‍යාපෘති බල ප්‍රදේශය සඳහා සිටින පරාග වාහකයින් මෙන්ම ඔවුන් විසින් රුචියක් දක්වන බෝග වර්ග හදුනාගැනීම. උදා: Apidae (honeybees), Megachilidae (pollen bees), Halictidae)
- පරාග වාහකින් සඳහා සිදු කල පර්යේෂණ ඇසුරෙන් ලබා ගත් දැනුම හා තොරතුරු පුහුණු කටුතු සඳහා යොදා ගැනීම සඳහා HORDI ආයතනයේ ප්‍රදර්ශණ කාමරයක් නිම කිරීම , පෝස්ටර 6 ක් සංවර්ධනය කර මුද්‍රණය කිරීම
- පරාග වාහකයන් ලෙස මී මැස්සන් යොදා ගැනීම දිරිගැන්වීමට පුහුණු වැඩසටහන් 4 ක් සහ ව්‍යාපෘති බල ප්‍රදේශයක් සඳහා මී මැසි පෙට්ටි 10 බැගින් ලබාදීම
- පෝස්ටර 6 ක් සංවර්ධනය කර මුද්‍රණය කිරීම
- ව්‍යාපෘති බල ප්‍රදේශ වල සිටින පරාගවාහකයන්, පලිබෝධකින්, විලෝපිකයන් හා ස්වභාවික සතුරන් ගේ ගහණය සඳහා බලපවත්වන දේශගුණික සාධක හදුනාගැනීමට පර්යේෂණ වැඩසටහනක් ක්‍රියාත්මක කෙරේ

- ප්‍රජා මූල බීජ බැංකු ස්ථාපිත කිරීම

සාම්ප්‍රදායික බෝග වර්ග සංරක්ෂණය හා ප්‍රචලිත කර ගැනීමට අවශ්‍ය වන බීජ වර්ග ප්‍රදේශය තුලම සංරක්ෂණය කරගැනීමේ අපේක්ෂාවෙන් ප්‍රජා මූල බීජ බැංකුවක් බැගින් එක් එක් බල ප්‍රදේශයක් සඳහා ලබා දීමට සැලසුම් කර ඇත. එක් එක් ප්‍රජා මූල බීජ බැංකුවක් යටතේ ගෘහස්ත බීජ බැංකු 5-10 ත් අතර සංඛ්‍යාවක් ස්ථාපිත කරමින් ක්ෂේත්‍ර මට්ටමින් සාම්ප්‍රදායික බීජ ගුණනය කිරීම හා ප්‍රජාව තුල සාම්ප්‍රදායික බීජ හුවමාරුව ශක්තිමත් කිරීමට කටයුතු ආරම්භ කර ඇත. ඒ අනුව ගම්පොල ව්‍යාපෘති බල ප්‍රදේශ තුල ගෘහස්ත බීජ බැංකු 6 ක් ස්ථාපිත කර ඇත.

- ජෛව විවිධත්වය පාදක කරගත් නිෂ්පාදන හදුන්වාදීම හා ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය
- ඖෂධ පැළෑටි බෙදාදීම
- ජෛව විවිධත්ව ගෙවතු සංකල්පය හදුන්වා දීම

වතු ආශ්‍රිතව පවතින ජෛවවිවිධත්වය ඉහළ නැංවීමේ අපේක්ෂාවෙන් ජෛවවිවිධත්ව ගෙවතු සංකල්පය ගම්පොල හා මිල්ලෙණිය ව්‍යාපෘති බල ප්‍රදේශ වලට හදුන්වාදීම. මේ යටතේ ගම්පොල ව්‍යාපෘති බල ප්‍රදේශ තුල ගෙවතු 107 ක්ද මිල්ලෙණිය ව්‍යාපෘති බල ප්‍රදේශ තුල ගෙවතු 103 ක් ද ස්ථාපිත කර ඇත. ගම්පොල ව්‍යාපෘති බල ප්‍රදේශ තුල නඩත්තු කරනු ලබන ගෙවතු අතරින් විශිෂ්ටතම ගෙවතු 6 ක් තෝරා ත්‍යාග ලබාදීම සිදු කර ඇත.




- ක්ෂේත්‍ර මට්ටමින් සිදුවන ක්‍රියාකාරකම්. ව්‍යාපෘති බල ප්‍රදේශ තුල සිටින ප්‍රජාවේ සාමාජිකයින් දැනුවත් කිරීම සඳහා පුවත් පත්‍රිකා ( News Letters) 2 ක් නිකුත් කර ඇත.

# මිනමාටා සම්මුතියට
# අදාල ඇගයීම

මිනමාටා සම්මුතිය යටතේ '' රසදිය මූලික තක්සේරු වාර්තාව පිලිබඳ ව්‍යාපෘතිය

රසදිය ස්නායු ආබාධ ඇති කරන අතර මෙම ව්‍යාපෘතිය මගින් සෞඛ්‍ය,කාර්මික හා අධ්‍යාපන ක්ෂේත්‍රයන්හි රසදිය භාවිතය පිළිබද දීප ව්‍යාප්ත සමීක්ෂණයක් මගින් මූලික තක්සේරු වාර්තාවක් සකස් කර නිම කර ඇති අතර එමගින් ඉහත ක්ෂේත්‍ර සඳහා ඉන්වෙන්ට්‍රියක් සකසා ඇත.
මෙම දැනුම රට තුල රසදිය කළමනාකරණ කටයුතු වලට යොදා ගන්නා අතර අධ්‍යාපන ක්ෂේත්‍රය රසදිය භාවිතය අවම කර ඇති අතර සෞඛ්‍ය අංශය රසදිය භාවිතයෙන් බැහැර වෙමින් පවතී.

රසදිය මූලික තක්සේරු වාර්තාව පිලිබඳ මෙහෙයුම් කමිටුව මගින් ශ්‍රී ලංකාව තුල රසදිය කළමනාකරණ කටයුතුවල ප්‍රගතිය, සමාලෝචනය කරනු ලැබේ.

මිනමාටා සම්මුතිය සහ රසදිය කළමනාකරණය පිලිබඳ සිසුන් දැනුවත් කිරීම කරන ලදී. - ගාල්ල සහ කොළඹ දිස්ත්‍රික්කවල වැඩසටහන් 02ක් පවත්වන ලදී.

රන් භාණ්ඩ සාදන කුඩා පරිමාණ ව්‍යාපාරිකයන් පිලිබඳ සමීක්ෂණයක් කිරීම සඳහා මැණික් සහ ස්වර්ණාභරණ පර්යේෂණ ආයතනය සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කර සමීක්ෂණ කටයුතු ආරම්භ කරන ලදී . මෙම සමීක්ෂණය කුඩා පරිමාණ රන්කරුවන්ගේ රසදිය භාවිතය පිලිබඳ කරුණු සොයා ගැනීමට ඉවහල් වන අතර එමගින් රසදිය වෙනුවට විකල්ප හඳුන්වාදී ඔවුන්ගේ සෞඛ්‍ය සහ පරිසරය ආරක්ෂා කිරීමට උපකාරී වනු ඇත.





# සෞඛ්‍ය හා පරිසර ප්‍රතිපත්ති සඳහා වායු තත්ත්ව තක්සේරුව පිළිබඳ ව්‍යාපෘතිය

වායු දූෂණය මානව සෞඛ්‍ය කෙරෙහි බලපෑම් ඇති කරන ආකාරය පිළිබඳව අධ්‍යයනය කර ප්‍රතිපත්ති සම්පාදනය කිරීම තුලින් වායු දූෂක පරිසරයට මුක්ත වීම පාලනය කර සෞඛ්‍යමය වශයෙන් පවත්නා අවධානම අවම කර ගැනීමේ හැකියාවක් පවතී. එබැවින් වායු සම්පත් කළමනාකරණ අංශය මගින් එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන (UNEP) සමග සම්බන්ධව උක්ත ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම සිදු කරනු ලබයි. මේ යටතේ ක්ෂේත්‍රයේ නිපුණ උපදේශකවරුන් මගින් පාරිසරික වායු තත්ත්වයන් මානව සෞඛ්‍ය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් හා ඒ සඳහා වන ප්‍රතිපත්ති හා සැළසුම් සමාලෝචන වාර්තාවක් ලබා ගැනීමට බලාපොරොත්තු වන අතර එම විද්‍යාත්මක සාක්ෂි පදනම් කරගෙන වායු දූෂණය මගින් ඇති විය හැකි සෞඛ්‍යමය අවදානම අවම කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයට යොමුවීමට බලාපෙරොත්තු වේ. මේ වන විට වායු සම්පත් අංශය විසින් අදාළ උපදේශකවරුන් බඳවා ගැනීමට කටයුතු කර ඇති අතර මේ සඳහා වන මූලික සාකච්ඡා වටයක්ද පවත්වා ඇත. ව්‍යාපෘතියට අදාළ මූලික වාර්තාවක් (inception report) මේ වන විට උපදේශකවරුන් විසින් ලබාදී ඇත.

 

## 2. අමාත්‍යාංශය සහ එක්සත් ජාතින්ට අනුබද්ධ ආයතන ඒකාබද්ධව ක්‍රියාත්මක කරන ව්‍යාපෘති

- දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාරකරණ ව්‍යාපෘතිය
- මහවැලි ගංගා ද්‍රෝණිය ආශ්‍රිත කෘෂිකාර්මික ප්‍රජාව දේශගුණ විපර්යාස වල අහිතකර බලපෑම් වලට අනුහුරු කරවීමේ ව්‍යාපෘතිය
- පාරිසරික සංවේදී භූමි ප්‍රදේශ වල ජෛවවිවිධත්ව සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම හා පරිසර පද්ධති සේවා නඩත්තු කිරීමේ ව්‍යාපෘතිය
- මධ්‍යම කඳුකරයේ හායනයට පත් වූ කෘෂිකාර්මික ඉඩම් පුනුරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය
- පොලික්ලෝරනේටඩ් බයිෆිනයිල් අඩංගු උපකරණ පරිසර හිතකාමී ලෙස කළමනාකරණය හා බැහැර කිරීමේ ව්‍යාපෘතිය
- ශ්‍රී ලංකාවේ තෙවන ජාතික දේශගුණ විපර්යාස සන්නිවේදන වාර්තාව සකස් කිරීමේ ව්‍යාපෘතිය




# දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය

**වියළි කලාපීය ග්‍රාමීය වැව් පද්ධති පුනරුත්ථාපනය සහ වියළි කලාපයේ ගංගා ද්‍රෝණි 03ක් ආශ්‍රිතව කෘෂිකාර්මික කටයුතු දේශගුණික විපර්යයාසවලට ඔරොත්තු දිය හැකි ලෙස දියුණු කිරීම**

- මුළු ව්‍යාපෘති කාලය තුළ ප්‍රතිසංස්කරණය කිරීමට එල්ලංගා පද්ධති හඳුනා ගැනීම
- එල්ලංගා පද්ධති මට්ටමින් ජල කලමණාකරණ සැලසුම් සැකසීම සඳහා තාක්ෂණික උපදේශණ මාලාවක් සැකසීම
- අනුරාධපුර දිස්ත්‍රික්කයේ වැව් 42ක් සහ වවුනියා දිස්ත්‍රික්කයේ වැව් 14 ක් ප්‍රතිසංස්කරණය කිරීම
- 2019 වසරේ ප්‍රතිසංස්කරණය කිරීමට යෝජිත අනුරාධපුර, වවුනියා, කුරුණෑගල සහ පුත්තලම යන දිස්ත්‍රික්ක ආවරණය වන වැව් 81 ක මැනුම් කටයුතු කිරීම සහ එයට අදාල සැලසුම් සකස් කිරීම
- පුනරුත්ථාපනය කළ වැව් වල රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- කුරුණෑගල,පුත්තලම, අනුරාධපුර, වවුනියා, ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක වල දේශගුණික සුහුරු කෘෂිකර්මාන්තය පිළිබඳව සියළුම කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුවත් කිරීම හා පුහුණු පැවැත්වීම ආරම්භ කිරීම (පුහුණු 15)
- එම දිස්ත්‍රික්ක 05 හි කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමඟ ඉදිරි ව්‍යාපෘති කටයුතු කිරීමට අවබෝධතා ගිවිසුමක් අත්සන් කොට 2018/2019 මහ කන්නයේදී කෘෂිකර්ම වැඩසටහන ක්‍රියාත්මක කිරීම (පරිසර හිතකාමී ගෙවතු - 700 / වාණිජ පළතුරු පැළ - 351000 / පශු සම්පත් වැඩසටහන - කුකුළු කොටු, ගව ගාල්,තෘණ බෝග නිෂ්පාදනය - ඒකක - 107 / බීජ වී වගාව සඳහා පහසුකම් සැපයීම - අක්කර - 250 )
- සිවිල් සමාජ සංවිධාන 04 ක් හා අදාල තාක්ෂණ විශේෂඥයින්ගේද සහයෝගය ලබාගනිමින් ව්‍යාපෘති කටයුතු අධීක්ෂණය කිරීම

ප්‍රතිසංස්කරණයට පෙර

ප්‍රතිසංස්කරණයෙන් පසු





කටුපොතන වැව – ප්‍රතිසංස්කරණයට පෙර සහ පසු - බණ්ඩාරකුඹුක් වැව එල්ලංගා පද්ධතිය - අනුරාධපුර දිස්ත්‍රික්කය

**අවදානමට ලක් වී ඇති ප්‍රජාවන්ට සුරක්ෂිත පානීය ජලය සැපයීමට විමධ්‍යගත ජල සම්පාදන සහ ජල කලමණාකරණ විසඳුම් වැඩිදියුණු කිරීම**

- ඉදිරි ව්‍යාපෘති කටයුතු කිරීමට ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය සමඟ සහ ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව සමඟ මූලික අවබෝධතා ගිවිසුම් 02ක් අත්සන් කිරීම
- කුරුණෑගල, පුත්තලම, වවුනියාව, අනුරාධපුර යන දිස්ත්‍රික්ක 04 ආවරණය වන පරිදි ග්‍රාමීය ප්‍රජා ජල සම්පාදන පද්ධති 11ක් පිහිටුවීම සඳහා සුදුසු ස්ථාන තෝරා ගැනීම නිමා කර ඇත. ඒවායේ ශක්‍යතා අධ්‍යයනයත් බොහෝ දුරට අවසන් කර ඇත. මේවා පිහිටුවීමට සුදුසු ජල ප්‍රභව තෝරා ගැනීම සඳහා ළිං කැණීමත් , මේ සඳහා සුදුසු ඉඩම් සඳහා අවසර ලබා ගැනීමත්, අදාළ ජලයේ ප්‍රමාණාත්මක සහ ගුණාත්මක පරීක්ෂණත් , මෙම ජල සැපයුම් ක්‍රියාත්මක කිරීමට ප්‍රජා සංවිධාන ගොඩ නැංවීමත් සිදු වෙමින් පවතී. මේවායේ මිනුම් කොට අදාළ සැලසුම් සකස් කිරීමට උපදේශක කණ්ඩායමක් බඳවාගෙන ඇත
- ලංකාවේ විවිධ තාක්ෂණික ආයතන සම්බන්ධ කරගෙන ලෝක ජල දිනයේ ප්‍රදර්ශනයක් පැවැත්වීම මඟින්, ලංකාවේ විවිධජලය පිරිසිදු කිරීමට භාවිත වන තාක්ෂණික ක්‍රම හඳුනා ගැනීම සිදු කර ඇත
- උසස් තාක්ෂණයෙන් යුක්ත ජල පිරිපහදු පද්ධති 24ක් (ග්‍රාමීය ප්‍රජා සැපයුම් පද්ධති සඳහා - විශාල ප්‍රමාණයේ පෙරහන් පද්ධති 15ක් සහ ග්‍රාමීය රෝහල් සහ පාසැල් සඳහා - කුඩා ප්‍රමාණයේ පෙරහන් පද්ධති 09ක්) පිහිටුවීමට ස්ථාන තෝරාගැනීමත්, සුදුසු තාක්ෂණය නිර්ණය කිරීමත් සිදු වෙමින් පවතී. මේවායේ මිනුම් කොට අදාළ සැලසුම් සකස් කිරීමට උපදේශක කණ්ඩායමක් බඳවාගෙන ඇත

- වැසි ජල ටැංකි පිළිබඳව ප්‍රජාවගේ ආකල්පය සෙවීමට සහ ඔවුන්ට අවශ්‍ය වැසි ජල ටැංකි වල ස්වභාවය තීරණය කිරීමට වැසි ජලය සංසදය හා එක්ව සමීක්ෂණයක් සිදුකිරීම සහ ඉන් පසුව සමීක්ෂණයකින් මෙම වැසි ජල ටැංකි වල අවශ්‍යතාවය ඇති ප්‍රතිලාභීන් තෝරා ගැනීම සහ කුරුණෑගල, පුත්තලම, වවුනියාව, අනුරාධපුර යන දිස්ත්‍රික්ක 04 ආවරණය වන පරිදි වැසිජලපද්ධති 545ක් සවි කිරීම
- සිවිල් සමාජ සංවිධාන 04 ක් හා අදාල තාක්ෂණ විශේෂඥයින්ගේද සහයෝගය ලබාගනිමින් ව්‍යාපෘති කටයුතු අධීක්ෂණය කිරීම



පානීය ජල සැපයුම් පද්ධති පිහිටුවීමට ඇති හැකියාව පරීක්ෂා කිරීම




වැසි ජල ටැංකි ලබා දීම

**කාලගුණික, ජල විද්‍යාත්මක නිරීක්ෂණ සහ ප්‍රක්ෂේපණ පද්ධති දියුණු කිරීම මගින් සුළු ඉඩම් හිමි ගොවීන්ගේ නියගය සහ ගං වතුර හමුවේ ඇති අනුහුරු ධාරිතාවය වැඩි කිරීම**



- ව්‍යාපෘති බල ප්‍රදේශය තුළ දැනට පවතින කාලගුණික නිරීක්ෂණ මධ්‍යස්ථාන ජාලය සිතියම් ගත කිරීම මගින් දැනට කාලගුණික නිරීක්ෂණ මධ්‍යස්ථාන අඩු ස්ථාන සොයා බැලීම
- කාලගුණ අනාවැකි පළ කිරීමේ සංඛ්‍යාත්මක ක්‍රමවේද මගින් කාලගුණික අනාවැකි පළ කිරීමේ තාක්ෂණය පිළිබඳව කාලගුණික විද්‍යා දෙපාර්තමේන්තු නිලධාරියෙකු සඳහා විදේශීය දින 12 ක පුහුණුවක් ලබා දීම සහ කාලගුණික අනාවැකි පළ කිරීමේ GIS තාක්ෂණික යෙදීම් පිළිබඳව කාලගුණික විද්‍යා දෙපාර්තමේන්තු නිලධාරීන්12ක් සඳහා දේශීය පුහුණුවක් පැවැත්වීම
- දිස්ත්‍රික්යේ දැනට තිබෙන කාලගුණික නිරීක්ෂණ මධ්‍යස්ථාන ජාලය දියුණු කරනු වස් කෘෂි කාලගුණික විද්‍යා නිරීක්ෂණ ස්ථාන 05, ස්වයංක්‍රීය වර්ෂාපතන මාපක 10ක්, GIS server 01 ක්සවි කිරීමට සුදුසු ස්ථාන තෝරා ගැනීම සහ ඒවායේ පිරිවිතර (specifications) හඳුනාගැනීම අවසන් කොට මේවා සැපයීමට අදාළ කොන්ත්‍රාත්තුව ලබා දීම
- ජල කලමණාකරණ සහ ගං වතුර කලමණාකරණයට උපකාර කරනු වස් මල්වතු ඔය සහ යාන් ඔයෙහි සවි කිරීමට වාරි මාර්ග දෙපාර්තමේන්තුව සඳහා ස්වයංක්‍රීය ගංගා ජල මාපක 08ක් මිලදී ගැනීම
- ව්‍යාපෘති පෙදෙස් තුළ ඇති ගොවි ජන සේවා මධ්‍යස්ථාන සඳහා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් දින දහයේ කාලාන්තර වලින් අනාවැකි නිකුත් කිරීම ආරම්භ කිරීම
- කාලගුණ විද්‍යා දෙපාර්මේන්තුව මගින් ප්‍රාදේශීය මට්ටමට අනාවැකි නිකුත් කිරීමට උපකාර වන වෙබ් GIS Server මිලදී ගැනීම
- ස්වභාවික සම්පත් කලමණාකරණ මධ්‍යස්ථානයේ සහාය ඇතිව මහ කන්නය සඳහා කෘෂි උපදේශන දිස්ත්‍රික්ක 04ක පාර්ශව කරුවන් වෙත සැපයීම
- මල්වතු ඔයෙහි ගං වතුර පූර්ව අනතුරු ඇඟවීම් පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා වව්නියාව හා මන්නාරම දිස්ත්‍රික්ක වල ගං වතුර අවදානම තක්සේරු කිරීම
- ව්‍යාපෘතිය ක්‍රියාක්මක එල්ලංගා පද්ධති 08ක ග්‍රාම නිලධාරී වසම් 25ක ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීමේ සැලසුම් සකස් කිරීම
- සිවිල් සමාජ සංවිධාන 04 ක් හා අදාල තාක්ෂණ විශේෂඥයින්ගේද සහයෝගය ලබාගනිමින් ව්‍යාපෘති කටයුතු අධීක්ෂණය කිරීම

# මහවැලි ගංගා ද්‍රෝණිය ආශ්‍රිත කෘෂිකාර්මික ප්‍රජාව දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම්වලට අනුහුරු කරවීමේ ව්‍යාපෘතිය

දේශගුණික විපර්යාසයන්හි බලපෑමට ලක් වූ වර්ෂාපතන විචල්‍යතාවයන් හේතුවෙන් දැඩි වර්ෂාපතනයන් හා දිගුකාලීන නියඟයන්ට එරෙහි ප්‍රජා ජීවනෝපායන් හා ආහාර සුරක්ෂිතතාව සනාථ කිරීම පිණිස නව හා නියඟයට ඔරොත්තු දෙන කෘෂිකාර්මික ක්‍රම උපායන් හඳුන්වා දීම හා කෘෂි ජනතාව ජීවත් වන ප්‍රදේශයන්හි යටිතල පහසුකම් හා වාරි ජල පහසුකම් වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතිය මඟින් සිදුකෙරේ. මේ සඳහා අනුහුරු වීමේ අරමුදල මගින් මූල්‍යමය ප්‍රතිපාදන සපයන අතර ලෝක ආහාර සංවිධානය (WFP) මගින් මෙහි සම්බන්ධීකරණ කටයුතු කරණු ලබයි. ශ්‍රී ලංකා රජය පාර්ශවයෙන් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය මඟින් මහවැලි ගංගා ද්‍රෝණිය ආශ්‍රිත ගොවි ජනපද වල කෘෂිකාර්මික ප්‍රජාව දේශගුණික විපර්යාස වල අහිතකර බලපෑම් වලට අනුහුරු කරවීමේ ව්‍යාපෘති අංශය විසින් අදාල ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ ආයතනය ලෙස ක්‍රියා කරන අතර ව්‍යාපෘතියේ ඵලදායීතාවය ඉහල නැංවීම සඳහා 2017 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන දෙවන ක්‍රියාත්මක කිරීමේ ආයතනය ලෙස සම්බන්ධ වන ලදී.

මෙම ව්‍යාපෘතිය මගින් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය හා ලංකාපුර යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශත් නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ කොට්ඨාශයත් ආවරණය වන පරිදි ව්‍යාපෘති සකස් වන අතර එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා ගොවි සංවිධාන පාදක කොට ප්‍රතිලාභ සපයනු ලබයි. මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මැදිරිගිරිය හා අඹගස් වැව ගොවිජන සේවා මධ්‍යස්ථාන වල ගොවි සංවිධාන 52 ක් හා ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පුලතිසිගම හා ගල් අමුණ ගොවිජන සේවා මධ්‍යස්ථාන වල ගොවි සංවිධාන 18ක් ඇතුළුව පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සම්පූර්ණ ගොවි සංවිධාන 70 ක් සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ තෙරිපහ, රූපහ, මුන්වත්ත, නිල්දන්ඩාහින්න සහ වලපනේ ගොවි ජන සේවා මධ්‍යස්ථාන වල සම්පූර්ණ ගොවි සංවිධාන 113ක් වශයෙන් මුළු ගොවි සංවිධාන 183ක් ආවරණය කරනු ලබයි.



ආරක්ෂිත ගෘහ ඉදි කිරීම (වලපනේ)

**2018 වර්ෂය තුල සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම්**

ප්‍රධාන වශයෙන් මූලික නිර්ණායක දෙකක් ඔස්සේ ව්‍යාපෘතිය බල ගැන්වෙන අතර ඒ ඒ නිර්ණායක වල පසු ගිය වසර සඳහා වූ ප්‍රගතිය පහත පරිදි වේ. ව්‍යාපෘතිය මගින් 2018 ජනවාරි 01 සිට 2018 දෙසැම්බර් 31 දක්වා අදාළ වාර්තා කරනු ලබන වර්ෂය තුල කෘෂි ළිං, කෘෂි මාර්ග ඉදී කිරීම් හා වාරි ජල ව්‍යාපෘති ඇතුළු යටිතල පහසුකම් වර්ධනය කිරීමේ උප ව්‍යාපෘති 76ක් රුපියල් මිලියන 79.07ක ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘතිය මගින් ඉදි කරන ලදී.

| අංකය | උප ව්‍යාපෘතිය | උප ව්‍යාපෘති සංඛ්‍යාව | වැයවූ මුදල (රු .මි) | ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | වාරි ජල ව්‍යාපෘති | 8 | 10.53 | 3421 |
| 2 | කෘෂි මාර්ග | 15 | 19.07 | 6048 |
| 3 | කුඩා වැව් | 11 | 11.45 | 2640 |
| 4 | පානීය ජල ව්‍යාපෘති | 3 | 3 | 137 |
| 5 | කෘෂි ළිං | 34 | 6.8 | 352 |
| 6 | පාංශු සංරක්ෂණ ව්‍යාපෘති | 1 | 1 | 221 |
| 7 | කෘෂි වන වගා | 1 | 2 | 330 |
| 8 | ක්ෂුද්‍ර ජල සම්පාදන ව්‍යාපෘති | 2 | 2 | 26 |
| 9 | විදුලි වැට ලබා දීම | 1 | 1 | 582 |
| **එකතුව** | | **76** | **56.55** | **13,757** |

ගෘහාශ්‍රිත ආහාර සුරක්ෂිතතාව වර්ධනය කිරීම හා වැසි දියෙන් වගා කරන ගොවි පවුල් සඳහා නම්‍යශීලී ජීවනෝපායයන් ගොඩනැංවීම යටතේ පසු අස්වනු තාක්ෂණ වැඩසටහන්, කිරි ගව පාලනය හා ආරක්ෂිත ගෘහ ඉදි කිරීම ඇතුළු අනුහුරු කිරීමේ ජීවනෝපාය ඇතුලත් උප ව්‍යාපෘති 72ක් රුපියල් මිලියන 40.1 ක වියදමෙන් සිදු කරන ලදී .එසේ ඉදි කරන ලද උප ව්‍යාපෘති පහත පරිදි වේ.

| අංකය | උප ව්‍යාපෘතිය | උප ව්‍යාපෘති සංඛ්‍යාව | වැයවූ මුදල රු.මි. | ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | ආරක්ෂිත ගෘහ ඉදි කිරීම | 7 | 3.84 | 200 |
| 2 | කෘෂි සංවර්ධන ව්‍යාපෘතිය | 2 | 11.6 | 854 |
| 3 | සත්ව නිෂ්පාදන ව්‍යාපෘතිය | 1 | 2.27 | 158 |
| 4 | යන්ත්‍ර හා උපකරණ බෙදා හැරීම | 2 | 3 | 78 |
| 5 | පසු අස්වනු තාක්ෂණ වැඩසටහන | 5 | 5.61 | 9119 |
| **එකතුව** | | | **26.32** | **10,409** |

දේශගුණික විපර්යාසයන්ගේ බලපෑම් ලැබූ වර්ෂාපතන විචලතාවය හා සම්බන්ධ අවධානම අඩු කිරීමට ග්‍රාමීය, දේශීය හා ප්‍රාදේශීය මට්ටමෙන් සේවා සැපයීමේ ආයතනික ශක්‍යතාවය ගොඩනැංවීම යටතේ ආයතනික ශක්‍යතාවය ඉහල දැමීමේ වැඩසටහන්, භූමි සිතියම් සකස් කිරීම හා ආපදා පෙර දැනුම් දීමේ පද්ධති ඇති කිරීම ඇතුළු පහත සඳහන් පරිදි උප ව්‍යාපෘති 12ක් රුපියල් මිලියන 8.5ක වියදමෙන් ක්‍රියාත්මක කරන ලදී.

| අංකය | උප ව්‍යාපෘතිය | උප ව්‍යාපෘති සංඛ්‍යාව | වැයවූ මුදල (රු.මි) | ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | ආපදා පෙර දැනුම් දීමේ පද්ධති | 1 | 5.78 | වලපනේ ප්‍රාදේශීය ලේකම් වසම |
| 2 | ශක්‍යතාවය ඉහල දැමීමේ වැඩසටහන් | 4 | 3.39 | 2500 |
| 3 | භූමි සිතියම් සකස් කිරීම | 1 | 0.43 | වලපනේ ප්‍රාදේශීය ලේකම් වසම |
| 4 | දිළිඳුකම පිටු දැකීමේ වැඩසටහන (alternative income) | 6 | 15.89 | 60 |
| **එකතුව** | | **12** | **25.49** | **2, 560සහ වලපනේ ප්‍රාදේශීය ලේකම් වසම** |



නව එළවලු වෙළඳපොල (වලපනේ)

2018 වසර තුල මහවැලි ගංගා ද්‍රෝණිය ආශ්‍රිත ගොවි ජනපද වල කෘෂිකාර්මික ප්‍රජාව දේශගුණික විපර්යාස වල අහිතකර බලපෑම් වලට අනුහුරු කරවීමේ ව්‍යාපෘති අංශය මගින් ක්‍රියාත්මක කරන ලද මුළු උප-ව්‍යාපෘති ගණන 113ක් වන අතර පරිපාලන වියදම්ද ඇතුළුව ව්‍යාපෘතිය සඳහා වර්ෂයේ සම්පූර්ණ වියදම රු.මි:127.89 කි.




# පාරිසරික සංවේදී භූමි ප්‍රදේශවල ජෛවවිවිධත්ව සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම හා පරිසර පද්ධති සේවා නඩත්තු කිරීමේ (ESA) ව්‍යාපෘතිය

පාරිසරික සංවේදී භූමි ප්‍රදේශ වල ජෛව විවිධත්වය සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම හා පරිසර පද්ධති සේවා නඩත්තු කිරීමේ ව්‍යාපෘතිය සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) සහාය ලැබෙන අතර, ජගත් පාරිසරික පහසුකම (GEF) මගින් මූල්‍යාධාර සපයනු ලබයි. ජෛව විවිධත්වයට සිදු වන තර්ජන අවම කර ගැනීම උදෙසා, ඉහළ සංරක්ෂණ වැදගත්කමක් සහිත පරිසර සංවේදී භූමි ප්‍රදේශ කේන්ද්‍ර කර ගනිමින් සංරක්ෂිත ප්‍රදේශ ලෙස ප්‍රකාශිත ප්‍රදේශයන්ට පරිභාහිරව පවතින පරිසර පද්ධති සේවාවන් හා ජෛව විවිධත්වය අතින් අතිශයින් වැදගත්කමකින් යුතු පරිසර සංවේදී කලාප හඳුනාගෙන ජෛව විවිධත්වය සංරක්ෂණය සහ තිරසාර සංවර්ධනය මූලික කරගත් ඉඩම් පරිහරණ සැලසුම් රටාවක් තුළින් පරිසර පද්ධති කළමනාකරණය සංවර්ධනය සමඟ අනුප්‍රවාහගත කිරීම මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කෙරේ.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, මධ්‍යම පරිසර අධිකාරිය, ජෛව විවිධත්ත්ව ලේකම් කාර්යාලය වැනි රාජ්‍ය ආයතන පාර්ශ්වකරුවන් ලෙස ක්‍රියා කරයි.



ඒ මඟින් රාජ්‍ය, රාජ්‍ය නොවන, පෞද්ගලික අංශය සහ ප්‍රජාව සවිබල ගන්වා පරිසර සංවේදී ප්‍රදේශ කළමනාකරණයේ කොටස්කරුවන් බවට ඔවුන් පත් කරන අතරම, ආරක්ෂිත ප්‍රදේශ හා පරිසර සංවේදී ප්‍රදේශ ආශ්‍රිත තිරසර සමාජ - ආර්ථික සංවර්ධනයක ප්‍රතිලාභ ළඟා කර ගැනීම කෙරෙහි අවධානය යොමු කෙරේ. පරිසර පද්ධති සේවාවන් හා ජෛව විවිධත්වය පිළිබඳ දත්තයන් අන්තර්ග්‍රහනය කළ භූ දර්ශ හා සාගර දර්ශ පදනම් කර ගත් ඉඩම් පරිහරණ සැලැසුම් සකස් කිරීමත්, ඒ මත පදනම්ව කෘෂිකාර්මික, ධීවර, සංචාරක යනාදී අංශ ඔස්සේ ආංශීය සැලැසුම් ක්‍රියාත්මක කිරීම ඇතුළු ක්‍රියාකාරකම් රැසක් මේ හරහා සිදු කෙරේ.

ඒ අනුව පරිසර පද්ධති කළමනාකරණය සමඟ සංවර්ධනය අනුප්‍රවාහගත කිරීම මඟින් ශ්‍රී ලංකාව තුළ දිගු කාලීනව තිරසර සංවර්ධනය තහවුරු කර ගැනීමට මෙම ව්‍යාපෘතිය හරහා මූලික පදනම සැලසෙනු ඇත. එසේම මෙම ව්‍යාපෘතියේ අත්දැකීම් ශ්‍රී ලංකාවේ අනෙකුත් පාරිසරික සංවේදී කළාපයන් සඳහා ඉදිරියේදී යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

ප්‍රතිඵලය 1: පාරිසරික සංවේදී ප්‍රදේශ කළමනාකරණය කිරීම සඳහා ආයතනික හා නීතිමය රාමුවක් ඇති කිරීම සහ මාර්ගෝපදේශ සැකසීම

ප්‍රතිඵලය 2 : කලා ඔය ද්‍රෝණියේ පාරිසරික සංවේදී කළාප වල ජෛව විවිධත්ව සංරක්ෂණය

2018 වර්ෂයේදී පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

- වන සංරක්ෂණය දෙපාර්තමේන්තුව සතු මානෑව කන්ද යෝජිත රක්ෂිතය සඳහා තිරසර සංචරණ සැලසුමක් සකස් කරන ලදි. මානෑව කන්ද පාරිසරික උද්‍යානය කඳවුරු භූමිය සංවර්ධන කටයුතු අවසන් කොට ඇත. දේශීය විදේශීය සංචාරකයන් සඳහා විවෘත කිරීමට නියමිතව ඇත.



මානෑව කන්ද පාරිසරික සංචරණ උද්‍යානය ඉදි කර ඇති සංචාරක කඳවුරු

- කොරල්පර සමුදුරු අභය භූමි සඳහා කළමනාකරණ සැලැස්මක් සකස් කිරීම. කල්පිටිය කොරල්පරයේ වර්තමාන තත්වය පිළිබඳ අධ්‍යයනයක් සිදු කර ඒ අනුව කොරල්පරයේ දැඩි අවදානමට ලක් වූ කලාප ආරක්ෂා කිරීමට බෝයා දැමීම සඳහා සුදුසු පාර්ශ්වයන් සමඟ ගිවිසුම් ඇති කර ගෙන බෝයාවන් ස්ථාපිත කර ඇත.









කල්පිටිය බාධක කොරල්පරයේ හඳුනාගත් දැඩි අවදානමට ලක් වූ කලාප තුළ බෝයාවන් ස්ථාපිත කිරීම හා කොරල්පර සමුදුරු අභය භූමි සඳහා සැකසූ කළමනාකරණ සැලැස්ම

- අනුරාධපුර සහ පුත්තලම දිස්ත්‍රික්ක වල කෘෂි පද්ධතිවල ජෛව විවිධත්ව සංරක්ෂණය සහතික කිරීම සඳහා නව මාර්ගෝපදේශ 12 ක් සකස් කර ඇත. ඒ පිළිබඳව දෙපාර්තමේන්තු නිලධාරීන්ට පුහුණුව ලබා දීම සහ පාරිසරික ගොවිතැන ප්‍රවර්ධන වැඩසටහන් ආරම්භ කිරීම.







කඩිංගල්ල (ඉපලෝගම) හා නෙල්ලියාගම (කැකිරාව) -12ha ගොවීන්ගේ ගෙවතු වගා වැඩසටහන් දියත් කිරීම.

- ශ්‍රී ලංකාවේ වන අලි සංරක්ෂණය සහ කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම අවසන් කර ඇත. මහජන අදහස් ලබා ගැනීම හා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා තිරසර සංවර්ධන, වනජීවී හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. අනෙකුත් වන ජීවීන් කළමනාකරණය පිළිබඳ උපායමාර්ගික රාමුවක් සැකසීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.
- ජෛව විවිධත්ව පාදීය සමීක්ෂණ දත්ත පදනම් කර ගනිමින් කලා ඔය ද්‍රෝණිය සඳහා ජෛව විවිධත්ව ඒකාබද්ධ ඉඩම් පරිහරණ සැලසුම් සකස් කරන ලදී.











ජෛව විවිධත්ව ඒකාබද්ධ ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම සඳහා සැකසූ පුහුණු මොඩියුල හා මාර්ගෝපදේශ




කලා ඔය ද්‍රෝණියේ හඳුනාගත් පාරිසරික සංවේදී කලාප 10

- කලා වැව ද්‍රෝණියේ හඳුනාගත් ජෛව විවිධත්වය අතින් අනූන ආරක්ෂිත කලාප වලින් පිටත වන රක්ෂිත 08 ක් සඳහා කළමනාකරන සැලසුම් සකස් කිරීම. (රිටිගල/ කුඩාකන්ද/කලාවැව/ නිදිගම/කඩියන්ගල්ල/ නෙල්ලියාගම/කඩුබොද/ කහල්ලපල්ලේකැලේ යන වනාන්තර සමූහය) එම වනාන්තර සමූහයේ සීමා මායිම් කණු සිටුවීම.





කලා වැව ද්‍රෝණියේ හඳුනාගත් ජෛව විවිධත්වය අතින් අනූන වනාන්තර සමූහයේ සීමා මායිම් කණු සිටුවීම

- වැටකොලුවාගම, කණුපිච්චියාගම , පහල හබරවත්ත හා ඉහළ හබරවත්ත වැව් ප්‍රතිසංස්කරණ කටයුතු 100%ක් වැඩ අවසන් කොට ඇති අතර වැව් රක්ෂිතය හඳුනාගෙන මැනීම් කටයුතු ආරම්භ කර ඇත. වැව් පද්ධතියට අදාළ ක්ෂුද්‍ර ජල පෝෂක ප්‍රතිස්ථාපන කටයුතු සිදු කිරීම ආරම්භ කිරීම.





හබරවත්ත එල්ලංගා පද්ධතිය ප්‍රතිස්ථාපනය

- පලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කහල්ල පල්ලේකැලේ වන සමූහයේ හෙක්. 50ක් නැවත ස්වභාවික පුනර්ජනනය (Assisted Natural Regeneration) සිදු කිරීම ආරම්භ කිරීම.






- අලීන් ගම්වැදීමේ පූර්ව අනතුරු ඇඟවීම් පද්ධතියක් ස්ථාපිත කිරීම පිළිබඳව ගම්වැසියන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හා පුත්තලම දිස්ත්‍රික්කයේ තේවනුවර ගම්මානය වටා නියාමක ව්‍යාපෘතියක් දියත් කිරීම ආරම්භ කිරීම.





අලීන් ගම්වැදීමේ පූර්ව අනතුරු ඇඟවීම් පද්ධතිය සහ ගම්වැසියන් දැනුවත් කිරීම

- කලා ඔය ද්‍රෝණියේ වෙසෙන ජනතාවගේ සමාජ ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හා ව්‍යාපෘති දියත් කිරීම.( මානෑව කන්ද ප්‍රදේශයේ ප්‍රජා සංවිධාන විසින් ක්‍රියාත්මක කරන ඖෂධීය තෙල් නිස්සාරණය ව්‍යාපෘතිය/ කාන්තා ව්‍යවසායකයින් දිරි ගැන්වීමේ ව්‍යාපෘති )

# මධ්‍යම කඳුකරයේ හායනයට පත් වූ කෘෂිකාර්මික ඉඩම් පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය මහනුවර දිස්ත්‍රික්කයේ දොලුව හා දෙල්තොට යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලද බදුල්ල දිස්ත්‍රික්කයේ හාලි ඇල, වැලිමඩ,ඌව පරණගම හා බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොටඨාශ හා නුවරඑළිය දිස්ත්‍රික්කයේ වළපනේ හා නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වලද ක්‍රියාත්මක වේ.

මෙම ව්‍යාපෘතියේ පළමු සංරචකය යටතේ සහභාගීත්ව ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීමේ උපදේශන මාලාව සකස් කිරීමට නියමිතව ඇති අතර මේ වන විට දළ කෙටුම්පත සකස්කර ඇත.

තිරසර භූමි කළමනාකරණය පිළිබඳ බලපෑමක් ඇති කරන ප්‍රතිපත්ති වල තිබෙන ගැටළු හඳුනාගෙන ඒ සඳහා සුදුසු සංශෝධනයන් සඳහා යෝජනා කිරීම සඳහා මූලික අධ්‍යනයන් සිදු කර ඇත.

තිරසර භූමි කළමනාකරණය සඳහා ක්ෂේත්‍ර ආදර්ශන පිහිටුවීම පිණිස මේ වන විට ගොවීන් 80ක් තෝරාගෙන ඇති අතර ඉන් 10 ක ඉඩම් සංරක්ෂණය මේ වන විට ආරම්භ කර ඇති අතර අනිකුත් ස්ථාන වලද වැඩකටයුතු ආරම්භ කිරිමට සියළු කටයුතු සූදානම් කර ඇත. එසේම ක්ෂුද්‍ර ජල පෝෂක ප්‍රදේශ 08 ක සංරක්ෂණ කටයුතු ආරම්භ කර ඇත. ක්ෂුද්‍ර ජල පෝෂක ප්‍රදේශ සඳහා සහභාගීත්ව ඉඩම් පරිහරණ සැලසුම් 08ක් මේ වන විට සාදා නිමකර ඇත. තිරසර භූමි කළමනාකරණය පිළිබඳ මහජනතාවගේ දැනුම වර්ධනය කිරීම උදෙසා දැණුවත් කිරීමේ වැඩසටහන් මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කර ඇත.

| කාර්යය | ප්‍රගතිය |
|---|---|
| සහභාගීත්ව ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීමේ උපදේශන මාලාව සකස් කිරීම | දළ සැලසුම සකසා ඇත. |
| තිරසර භූමි කළමනාකරණය පිළිබඳ බලපෑමක් ඇති කරන ප්‍රතිපත්ති වල තිබෙන ගැටළු හඳුනාගෙන ඒ සඳහා සුදුසු සංශෝධනයන් සඳහා යෝජනා කිරීම | මූලික අධ්‍යනයන් සිදු කර ඇත. |
| ඉඩම් තොරතුරු පද්ධතියක් සැකසීම | අවශ්‍ය මූලික සැලසුම සකසා ඇත |
| තිරසර භූමි කළමනාකරණය පිළිබඳ පුහුණු ඇත් පොත සැකසීම | මූලික සැලැස්ම සකසා ඇත. |
| ආදර්ශන පිහිටුවීම | රජයේ ආයතන තුනක , ක්ෂුද්‍ර ජල පෝෂක ප්‍රදේශ 08 ක වැඩ කටයුතු ආරම්භ කර අත. |
| පරිසර පද්ධති ඇගයීම | IUCN සමග මූලික කටයුතු ආරම්භ කර ඇත |
| ප්‍රජා දැණුවත් කිරීමේ වැඩසටහන් | 5ක් සිදු කර ඇත. |

# පොලික්ලෝරනේටඩ් බයිෆිනයිල් අඩංගු උපකරණ පරිසර හිතකාමී ලෙස කළමනාකරණය හා බැහැර කිරීමේ ව්‍යාපෘතිය

පොලික්ලෝරිනේටඩ් බයිෆීනයිල් අඩංගු කල්පවතින දූෂකාරක වන අතර මෙමගින් පිළිකා , වර්ධන ඌනතා වැනි සෞඛ්‍ය ගැටළු රාශියක් ඇති කරයි. මෙම රසායනිකය ලොව පුරා 1980 පමණ තහනම් කරන ලද අතර දැනට මෙය ලංකා විදුලි බල මණ්ඩලයේ පැරණි ට්‍රාන්ස්ෆෝමර් වල හා වෑල්ඩින් ට්‍රාන්ස්ෆෝමර් වල දැකිය හැක. මේ වන විට ප්‍රධාන වශයෙන් ට්‍රාන්ස්ෆෝමර් මගින් PCB ව්‍යාප්ත වෙමින් පවතී.

මෙම ව්‍යාපෘතියේ අරමුණ විදුලි ට්‍රාන්ෆෝමර් හා වෑල්ඩින් ට්‍රාන්ෆෝමර් වල PCB අඩංගු ට්‍රාන්ස්ෆෝමර් හඳුනාගෙන එහි ඇති ට්‍රාන්ෆෝමර් තෙල් හා භාවිතයෙන් ඉවත් කරන ලද ට්‍රාන්ෆෝමර් පරිසර ආරක්ෂිත ලෙස බැහැර කිරීමයි.

මෙයට අදාලව වෙල්ඩින් අංශයේ ඉන්වෙන්ටරිය සාදා නිමකර ඇති අතර ට්‍රාන්ෆෝමර් තෙල් සාම්පල් පරීක්ෂාව සඳහා ඉදිරිපත් කර ඇත.විදුලි බල අංශයේ PCB ට්‍රාන්ස්ෆෝමර් ඉන්වෙන්ටරිය සෑදීම ආරම්භ කර ඇත.



ජාත්‍යන්තර උපදේශක ආචාර්ය කාලෝ ලූපි තාක්ෂණික නිලධාරීන් පුහුණු කිරීම



ට්‍රාන්ස්ෆොර්මර් තෙල් සාම්පල් ලබාගැනීම- පුහුණු වන තාක්ෂණික නිලධාරීන්




ට්‍රාන්ස්ෆොර්ම ලේබලයක්



ට්‍රාන්ස්ෆොර්ම රැස්කර ඇති ස්ථානයක් - කහතුඩුව

- අදාල කණ්ඩායම් සහ ජනතාව අතර දැනුම වැඩි දියුණු කිරීම සඳහා PCB පිළිබඳ වෙබ් අඩවියක් සහ වීඩියෝ පටයක් නිර්මාණය කර ඇත.



PCB වෙබ් අඩවිය එළි දැක්වීම




PCB වීඩියෝ පටය

- පාසල්, විශ්ව විද්‍යාල සහ නිපුණතා පුහුණු වැඩසටහන් සඳහා කල්පවතින, ජෛව සංචිත වන සහ විෂ සහිත රසායනික ද්‍රව්‍ය පිලිබඳ පාඨමලාවන් සැකසීම නිමකර ඇත. මෙමගින් එම සිසුන් තුල මෙම රසායනික ද්‍රව්‍ය පිලිබඳ දැනුමක් ඇතිකිරීමත්, එහි නියමිත භාවිතයත්, ගබඩා කිරීම, ප්‍රවාහනය සහ පරිසර හිතකාමී බැහැරලීමේ ක්‍රමවේද ප්‍රගුණ කිරීමටත් අදහස් කෙරේ.








# ශ්‍රී ලංකාවේ දේශගුණ විපර්යාස පිළිබඳ තෙවන ජාතික සන්නිවේදන වාර්තාව සකස් කිරීමේ ව්‍යාපෘතිය (SLTNC)

ශ්‍රී ලංකාවේ දේශගුණ විපර්යාස පිළබඳ තෙවන ජාතික සන්නිවේදන වාර්තාව සකස් කිරීමේ ව්‍යාපෘතිය(TNC) සඳහා 2016 මාර්තු මස 18 වන දින එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සමග මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය අත්සන් තබන ලද අතර එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී. මෙම ව්‍යාපෘතිය වසර තුනක කාලයක් එනම්, 2016-2018 අතර කාලයේදී ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් මගින් ක්‍රියාත්මක කළ යුතු වුවද එම වාර්තාව සැකසීමට අදාල දත්ත රැස් කිරීමේදී පැවති විවිධ හේතුද ශේෂ වූ සංස්කරණ කටයුතුද දැනුවත් කිරීමේදී සාධාරණීයකරණය මත තවත් වසරක දිගුවක් ලැබිණි.

මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වන්නේ එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියෙහි (UNFCCC) එකඟතාවයන්ට අනුව හරිතාගාර වායු විමෝචනය අවම කිරීමට හා දේශගුණික විපර්යාසවලට අනුහුරුවීම සඳහා වන උපායමාර්ග ඵලදායි ලෙස සකස් කර පාර්ශවකරුවන් සතු තාක්ෂණික හා මානව සම්පත් ප්‍රයෝජනයට ගනිමින් තෙවන ජාතික සන්නිවේදන වාර්තාව සකස් කිරීමයි. මෙම වාර්තාව සකස් කිරීම සඳහා ගෝලීය පාරිසරික පහසුකම (Global Environment Facility) යටතේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනහි සහයෝගයෙන් යුතුව ඇමරිකානු ඩොලර් 500,000 ක මුල්‍යමය ප්‍රදානයක් ලැබී ඇත.

ප්‍රගතිය වාර්තා කරන කාලසීමාව තුළ;

- තෙවන ජාතික සන්නිවේදන වාර්තාව සකස් කිරීම සඳහා සුදුසු විශේෂඥයින් සහ විශේෂඥ කණ්ඩායම් පත්කරන ලද අතර ප්‍රධාන සංරචක සඳහා අවසන් කාර්ය සාධන වාර්තා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත ඉදිරිපත් කරන ලදී.
- ස්වාධීන සමාලෝචන කමිටුවක් ස්ථාපිත කළ අතර ප්‍රගති සමාලෝචන රැස්වීම් 08 ක් පවත්වන ලදී. එමගින් ලබා ගත් අදහස් හා යෝජනා, එම වාර්තා අවසන් කෙටුම්පත් කිරීම සඳහා යොදා ගන්නා ලද අතර පාර්ශවකරුවන්ගේ පුළුල් සහභාගීත්වයෙන් එම වාර්තා සැකසීමට අදහස් ලබා ගන්නා ලදී.
- දේශගුණ විපර්යාස අනුහුරුවීමේ හා හරිතාගාර වායු විමෝචන අවම ක්‍රියා මාර්ග පිළිබඳ විද්වත් කමිටුවලට ඉදිරිපත් කර එම කමිටුවල තාක්ෂණික අදහස් හා යෝජනා ලබා ගන්නා ලදී.
- ජාත්‍යන්තර උපදේශකයෙකුගේ සම්පත් දායකදායකත්වය මත හරිතාගාර වායු ඉන්වෙන්ට්‍රිය සැකසීම හා තෙවන ජාතික සන්නිවේදන වාර්තාව සම්බන්ධ අනෙකුත් අදාළ අංශ පිළිබඳ පාර්ශවකරුවන් සඳහා පුහුණු වැඩසටහනක් පවත්වන ලද අතර තෙවන ජාතික සන්නිවේදන වාර්තාව සඳහා එම උපදේශකුගේ අදහස් හා යෝජනා ලබා ගනිමින් එම වාර්තාව තවදුරටත් වැඩිදියුණු කරන ලදී.
- තෙවන ජාතික සන්නිවේදන වාර්තාව සකස් කිරීම සඳහා වැඩමුළු, සම්මන්ත්‍රණ, දැනුවත් කිරීමේ මෙවලම් සකස් කිරීම හා සන්නිවේදන වැඩසටහන් සංවිධානය කිරීම සඳහා සැපයුම්කරුවෙකු තෝරා ගනිමින් සියළුම පළාත් නිළධාරින් සඳහා දැනුවත් වැඩමුළු පවත්වන ලදී. අනාගත වාර්තාකරණයන් සඳහා වන දත්ත අවශ්‍යතාවයන් එම වැඩමුළුවල දී ඉදිරිපත් කළ අතර එම දත්ත පළාත තුළ ඒකරාශි කිරීමට විධිමත් වැඩ පිළිවෙලක් සඳහා අඩිතාලම දමන ලදී.
- දත්ත රැස් කිරීම, විශ්ලේෂණය හා අදාල තොරතුරු ගබඩා කිරීමට දත්ත පද්ධතියක් සකස් කිරීම සිදු කෙරෙමින් පවතී.

එමෙන්ම, තෙවන ජාතික සන්නිවේදන වාර්තාවේ ක්‍රියාකාරකම් ක්‍රියාත්ම කිරීම සඳහා, ව්‍යාපෘතිය ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා වන ව්‍යාපෘති මණ්ඩලය පවත්වන ලදී. ව්‍යාපෘතිය ඵලදායී මෙන්ම, ව්‍යාපෘතියේ උපාය මාර්ගික ප්‍රතිඵල රාමුව තුල වඩාත් කැපී පෙනෙන දියුණුවක් ඇති කර ගැනීම මත, පිරිවැය ඵලදායි සහ ප්‍රතිනිර්මාණය කරන ආකාරයට ව්‍යාපෘතියේ හඳුනාගත් ක්‍රියාවන්ට එම මණ්ඩලයේ පූර්ණ එකඟතාවය පළ කරන ලදී.

## 3. එක්සත් ජාතීන්ට අනුබද්ධ ආයතන මගින් සෘජුවම ක්‍රියාත්මක කරන ව්‍යාපෘති

- SWITCH – Asia, තිරසර පරිභෝජන හා නිෂ්පාදන පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සංරචක ව්‍යාපෘතිය
- ජෛවවිවිධත්වයට අදාල 6 වන ජාතික වාර්තාව (2016 – 2018)
- ජෛවවිවිධත්ව සංරක්ෂණය සඳහා අවශ්‍ය මූල්‍ය අවශ්‍යතාවයන් (BIOFIN)
- ජෛවසුරක්ෂිතතාවය පිළිබඳ කාර්ටජිනා සන්ධානයට අනුගතව ජාතික ජෛවසුරක්ෂිතතා මූලාකෘතිය ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය
- ජාතික වශයෙන් යෝග්‍ය හරිතාගාර වායු විමෝචන අවම කිරීමේ ක්‍රියාකාරකම් සකස් කිරීම
- දේශගුණ විපර්යාස හේතුවෙන් ඇතිවන අවධානම ඇගයීම සහ ජාතික සංවර්ධන ක්‍රියාවලියට දේශගුණ විපර්යාස සඳහා අනුගත වීමේ ක්‍රියාකාරකම් අන්තර්ග්‍රහණය කිරීම සඳහා වූ තාක්ෂණික ව්‍යාපෘතිය




# SWITCH - Asia,

# තිරසර පරිභෝජන හා නිෂ්පාදන පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සංරචක ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය යුරෝපා සංගමය මගින් පරිසර අමාත්‍යාංශයේ ඉල්ලීම මත ප්‍රදානය කරනු ලැබූ ව්‍යාපෘතියකි.මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ ප්‍රතිපත්ති සම්පාදකයන්, පාර්ශවකරුවන් සහ මහජනතාවගේ තිරසර පරිභෝජන හා නිෂ්පාදන පිළිබඳ දැනුම සහ ධාරිතාව වර්ධනය කිරීමේ වසර 4 ක පුළුල් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය 2015 ජනවාරි සිට 2019 ජනවාරි මස තෙක් යුරෝපා සංගමයේ ඍජු ආධාර මත ක්‍රියාත්මක වූ ව්‍යාපෘතියකි.

මෙම ව්‍යාපෘතිය යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

01. ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්ති සැකසීමේ ක්‍රියාවලිය ප්‍රමිතිකරණය කිරීම

02. ජාතික තිරසාර පරිභෝජන හා නිෂ්පාදන ප්‍රතිපත්තිය සැකසීම



කෙටුම්පත

ශ්‍රී ලංකාව සඳහා තිරසර පරිභෝජනය සහ නිෂ්පාදනය
පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

03 තිරසර නිෂ්පාදනය හා තිරසාර පරිභෝජනය සඳහා ජාතික දර්ශක සැකසීම

04 තිරසර පරිභෝජන හා නිෂ්පාදන පිළිබඳ අධ්‍යාන වැඩසටහන් සැලසුමක් සහ විශ්ව විද්‍යාල සඳහා පුහුණු මෙවලම් සැකසීම

05 තිරසර නිෂ්පාදනය හා පරිභෝජනය සම්බන්ධ දැනුවත් කිරීම් සහ ධාරිතා වර්ධන වැඩසටහන් පැවැත්වීම. ඒ අනුව ආ මෙම අමාත්‍යාංශයේ නිලධාරීන් දෙදෙනෙකුට පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම සඳහා ඉඩ ප්‍රස්ථා ලබාදීම හා තෝරාගනු ලැබූ රාජ්‍ය ආයතන, අනෙකුත් අනුබද්ද ආයතන වල නිලධාරීන් 15 දෙනෙක් සඳහා තායිලන්තයේ ආසියානු තාක්ෂණික ආයතනයෙහි (AIT) දින 10ක පුහුණුවක් ලබාදීම

06 තිරසර ප්‍රසම්පාදන කෙටුම්පත වැඩි දියුණු කොට ක්‍රියාකාරී සැලසුමක් සහ ප්‍රසම්පාදන නිලධාරීන් සඳහා පුහුණු මෙවලමක් සැකසීම

07 දැනුවත් කිරීමේ හා පුහුණු වැඩමුළු තිරසර සංවර්ධන හා පරිභෝජනය සම්බන්ධ ප්‍රධාන සංවිධාන සඳහා පැවැත්වීම. (MoMDE, SLIDA,IESL, University of kelaniya)

08 ශ්‍රී ලංකාවේ පරිසර හිතකාමී කථිකාවතක් ඇති කිරීම පිළිබඳ ප්‍රචාරණ වැඩමුළුවක් පැවැත්වීම.

09 නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය, SCP සහ SDG වැනි බස්නාහිර පළාත් අපද්‍රව්‍යය කළමනාකරණ අධිකාරිය වැනි ප්‍රධාන සංවිධානවල සාමාජිකයන් 997 දෙනෙකු සඳහා SCP පිළිබඳ දැනුවත් කිරීමේ / පුහුණු වැඩසටහන් 19 ක් පවත්වන ලදී

10 නිෂ්පාදන සඳහා ආයුකාලය හා පාරිසරික නවෝත්පාදන හඳුන්වා දීම වෙනුවෙන් අංශ 03ක් (සහල්/කිරි/තේ) සඳහා උපදේශක වැඩමුළුවක් පැවැත්වීම (TOT)

11 රාජ්‍ය හා පෞද්ගලික අංශ නියෝජනය කරමින් නිලධාරීන් 29 දෙනෙකුගේ සහභාගීත්වය ඇතිව තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම

12 නිවාස සංවර්ධන අමාත්‍යාංශයේ නිලධාරියකු තායිලන්තයේ AIT විශ්ව විද්‍යාලයේ සහතික පත්‍ර පාඨමාලාවක් හැදෑරීමට මෙම ව්‍යාපෘතිය මගින් පූර්ණ අනුග්‍රහය ලබා දෙන ලදී

13 තිරසර නිෂ්පාදන හා පරිභෝජනය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීමත් ඒ අනුව සංවර්ධන න්‍යායන් තුල තිරසාර නිෂ්පාදන හා පරිභෝජන පිළිබඳ අවධානය යොමු කිරීමේ අරමුණින් ඍජුවම අදාළ වන අමාත්‍යාංශ වල ලේකම්වරුන් 09 දෙනෙකුට යුරෝපයේ අධ්‍යාන චාරිකාවකට අවස්ථාව ලබාදීම





යුරෝපා අධ්‍යයන චාරිකාව

14 තිරසර පරිභෝජන හා නිෂ්පාදන පිළිබඳ සම්බන්ධිකරණ යාන්ත්‍රණය සැකසීම. මෙහිදී මහාවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය තුල තිරසාර පරිභෝජන හා නිෂ්පාදනය පිළිබඳ ඒකකයක් ස්ථාපිත කර තිරසර පරිභෝජන හා නිෂ්පාදන පිළිබඳ වූ විද්වත් කමිටුවේ සහ අනෙකුත් අදාල ආයතන වල සහයෝගයෙන් යුතුව තිරසාර නිෂ්පාදන හා පරිභෝජනය ක්‍රියාකාරකම් ඉදිරියේදීද ක්‍රියාත්මක කෙරෙනු ඇත

15 ශ්‍රී ලංකාවේ පරිසර හිතකාමී කථිකාවතක් ඇති කිරීම පිළිබඳ ප්‍රචාරණ වැඩමුළුවක් මාධ්‍යවේදීන් සඳහා පැවැත්වීම

16 තොරතුරු කළමනාකරණ යාන්ත්‍රණයක් ජාතික තිරසාර නිෂ්පාදන හා පරිභෝජන වෙබ් අඩවිය තුලින් ඇති කිරීම හා ඉලෙක්ට්‍රොනික අධ්‍යනය සඳහා පහසුකම් ඇතිකිරීම







17 තිරසර නිෂ්පාදනය හා පරිභෝජනය පිළිබඳව වාර්තා වැඩසහනක් භාෂා ත්‍රිත්වයෙන්ම සැකසීම

18 තෝරාගනු ලැබූ නිෂ්පාදිත (තේ,සහල් සහ කිරි) සඳහා තිරසර පරිභෝජනය සහ නිෂ්පාදනයට අදාල ක්‍රියාකාරී සැලසුම් සැකසීම මේ මඟින් තිරසර පරිභෝජන හා නිෂ්පාදන නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කල හැක

19 තිරසර නිෂ්පාදනය හා පරිභෝජනය පිළිබඳ මූල්‍ය මෙවලමක් සැකසීම

20 නිෂ්පාදන සඳහා පරිසර හිතකාමී ලේබල (Eco Label) හඳුන්වා දීමට ක්‍රමවේදයක් හඳුන්වා දී

21 නිෂ්පාදන සඳහා ආයුකාලය හා පාරිසරික නවෝත්පාදන (Eco Innovation and Life Cycle Analysis) හඳුන්වා දීම

# ජෛවවිවිධත්වය පිළිබඳ වූ හයවන ජාතික වාර්තාව සකස් කිරීම




එක්සත් ජාතීන්ගේ ජෛවවිවිධත්ව සම්මුතියේ පාර්ශවකරුවන්ගේ 13 වන සමුළුවේදී ගනු ලැබූ තීරණයකට අනුව සියලුම පාර්ශවකාර රටවල් විසින් ජාතික ජෛවවිවිධත්ව උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය පිළිබඳව 6 වන ජාතික වාර්තාව සකස් කර 2018 වර්ෂයේ දෙසැම්බර් මාසය වන විට ඉදිරිපත් කල යුතුවිය.

ඒ අනුව එම සම්මුතියේ ශ්‍රී ලංකාවේ නියමු ස්ථානය ලෙස මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශයේ ජෛවවිවිධත්ව අංශය විසින් ජෛවවිවිධත්වය පිළිබඳ වූ 6 වන ජාතික වාර්ථාව සකස් කර එක්සත් ජාතීන්ගේ ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත. සියළුම පාර්ශවකාර රාජ්‍යයන් මෙම වාර්තාව අවුරුදු 4කට වරක් සකස් කර ජෛවවිවිධත්ව සම්මුති ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලැබේ. මෙම වාර්තාව සකස් කිරීම සඳහා ජාතික මෙන්ම ප්‍රාදේශීය මට්ටමින් වැඩමුළු රාශියක් පවත්වමින්ද **පර්යේෂණ මඟින් එක්රැස් කර ගත් තොරතුරුද පදනම් කරගනිමින් 6වන ජාතික වාර්ථාව කෙටුම්පත් කර ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලය වෙත 2018 දෙසැම්බර් මාසයෙදී ඉදිරිපත් කරන ලදී.**

# ජෛවවිවිධත්ව සංරක්ෂණය සඳහා අවශ්‍ය මූල්‍ය අවශ්‍යතාවයන් (BIOFIN-2016-2018)

ජෛවවිවිධත්ව සම්මුතියේ 11වන පාර්ශවකරුවන්ගේ රැස්වීමේදී ගත් තීරණයකට අනුව ජෛවවිවිධත්ව සංරක්ෂණය සඳහා අවශ්‍ය මූල්‍ය අවශ්‍යතාවයන් (BIOFIN) යන ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. මෙය වසර දෙකක කෙටි කාලීන ව්‍යාපෘතියක් වන අතර මෙහි සියළු මූල්‍යමය වියදම් යුරෝපා සංගමය මගින් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි ශ්‍රී ලංකා නියෝජිත ආයතනය විසින් ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලයේ සම්බණ්ධීකරණයෙන් සකස් කරනු ලබයි. ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ව්‍යාපෘති කේන්ද්‍රීය ස්ථානය ලෙස මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය ක්‍රියා කරනු ලබයි.

මෙහිදී වාර්තා 4ක් එනම් ප්‍රතිපත්ති සහ ආයතනික සමාලෝචන විශ්ලේෂණ වාර්තාව, ජෛවවිවිධත්ව මිලයන සමාලෝචන විශ්ලේෂණ වාර්තාව සහ මූල්‍ය අවශ්‍යතා පැවරුම සහ ජෛවවිවිධත්ව සංරක්ෂණය සඳහා අවශ්‍ය මූල්‍ය සැලසුම යන වාර්තා සකස් කර අවසන් කර ඇත. ජෛවවිවිධත්ව සංරක්ෂණය සඳහා අවශ්‍ය මූල්‍ය සැලසුම යටතේ හඳුනාගත් ප්‍රධාන මූල්‍ය අවශ්‍යතාවන් වන පරිසර සංරක්ෂණ කටයුතු සඳහා මූල්‍ය අවශ්‍යතාවයන් ලබා දීම,තිරසාර සංචාරක කර්මාන්තය දිරිමත් කිරීම සඳහා සහතිකකරණය කිරීම සහ ජෛවවිවිධත්වය හා පරිසර පද්ධති සංරක්ෂණය සඳහා අගයන් නියම කිරීම වැනි මූල්‍යමය විසඳුම් මේ යටතේ හඳුනාගෙන ඇත.

Supported by:

Federal Ministry for the Environment, Nature Conservation and Nuclear Safety

This project is co-funded by the European Union

NORWEGIAN MINISTRY OF FOREIGN AFFAIRS

Flanders State of the Art

Schweizerische Eidgenossenschaft
Confédération suisse
Confederazione Svizzera
Confederaziun svizra
Swiss Confederation
Federal Office for the Environment FOEN












# ජෛවසුරක්ෂිතතාවය පිළිබඳ
# කාර්ටජිනා සන්ධානයට අනුගතව
# ජාතික ජෛවසුරක්ෂිතතා මූලාකෘතිය
# ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘති ගෝලීය පාරිසරික පහසුකම මගින් ලබාදෙන මූල්‍යාධාර යටතේ එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ සහයෝගය සහිතව මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරයි. මෙම ව්‍යාපෘතිය යටතේ ජෛවසුරක්ෂිතතාවයට අදාල තොරතුරු නිෂ්කාශන යාන්ත්‍රණයක් සකස් කොට ක්‍රියාත්මක කිරීම ,ජාන විකරණය කල ජීවීන් මගින් සිදුවිය හැකි අවදානම් තක්සේරුව හා කළමනාකරණය සඳහා අවශ්‍ය යාන්ත්‍රණයක් සකස් කිරීම, ජාන තාක්ෂණික තොරතුරු සහිත දත්ත පද්ධති සකස් කිරීම,විකරණය කරන ලද ජීවීන් හඳුනා ගැනීමට අදාළ ධාරිතාවන් හා හැකියාවන් වර්ධනය කිරීම,විද්‍යාගාර තාක්සණික යටිතල පහසුකම් වර්දනය කිරීම හා සාමාන්‍ය ජනතාව අතර ජෛව සුරක්ෂිතතාවය පිළිබඳ දැනුම සහ අවබෝධය වර්ධනය කිරීම ආදී වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට යෝජිතය.

- ✓ **මාධ්‍ය වැඩමුළුව හා ජෛවසුරක්ෂිතතාව පිළිබඳ ප්‍රවෘත්ති නිවේදනය එළිදැක්වීම**




ජෛවසුරක්ෂිතතාව පිළිබඳව සහ මෙම ව්‍යාපෘතිය පිළිබඳ සමස්ත තොරතුරු ප්‍රචලිත කිරීමේ අරමුණින් මහජනතාව දැනුවත් කිරීමේ පළමු වැඩමුළුව ලෙස මාධ්‍යය වැඩමුළුවක් 2018 මාර්තු 29 දින Waters Edge හිදී පවත්වන ලදී. එසේම ශ්‍රී ලංකාව තුල පවතින ජානමය වශයෙන් වෙනස් කරන ලද ජීවී කාණ්ඩ සම්බන්ධයෙන් පවතින සැක සංකා සහ අවිශ්වාසයන් පැහැදිලි කර ගැනීමේ අවස්ථාවද මේ ඔස්සේ මාධ්‍යවේදීන්ට හිමිවිය. ඒ අනුව ජෛවසුරක්ෂිතතාව පිළිබඳ මහජනතාව දැනුවත් කල හැකි ආකාරයේ විවිධ ප්‍රවෘත්ති සහ විශේෂ ලිපි සම්පාදනය සඳහා වූ වටිනා තොරතුරු සමුදායක් සපයා ගැනීමට සැමට හැකිවිය. ජෛවසුරක්ෂිතතාව පිළිබඳ ප්‍රවෘත්ති නිවේදනයේ ප්‍රථම කලාපය මෙහිදී එළි දක්වන ලද අතර ඉන්පසු දෙවන කලාපයද ප්‍රකාශයට පත් කරන ලදී.

ව්‍යාපෘතියේ පළමු සංරචකය එනම් ‘‘ජෛවසුරක්ෂිතතාව පිළිබඳ ආයතනික හා නියාමන ක්‍රියාරාමුව ශක්තිමත් කිරීම’’ සඳහා නීතිමය කටයුතු සහ ජෛවසුරක්ෂිතතා ප්‍රතිපත්ති සංවර්ධන වශයෙන් ජාතික උපදේශක වරුන් දෙදෙනෙක් සහ ජාත්‍යන්තර උපදේශකවරියක් පත් කරගන්නා ලදී. තවද ජාතික ආයතන නියෝජනයෙන් ක්‍රියාකාරී කණ්ඩායමද පත්කරන ලද අතර කණ්ඩායමේ රැස්වීම් 4 ක් පවත්වා මේ වනවිට ශ්‍රී ලංකාවේ ජෛවසුරක්ෂිතතාව වෙනුවෙන් වන ජෛවසුරක්ෂිතතා නීති රෙගුලාසි, ප්‍රධාන සැලසුම් (Biosafety Master Plan) ,පරිපාලන හා මෙහෙයුම් ක්‍රියාවලියට අදාල තොරතුරු සම්පිඩනය කර අවසාන කෙටුම්පත් වාර්තා සකස් කර ඇත.

මෙම වාර්තාවන් තාක්ෂණික ඇගයුම් කමිටුවට ඉදිරිපත් කර අදහස් ලබා ගන්නා ලදී.

- ✓ **ජාන විකරණය කරන ලද ජීවීන් හේතුවෙන් පරිසරයට හා මානව සෞඛ්‍යට එල්ලවිය හැකි බලපෑම් අවම කිරීම හා මගහරවා ගැනීම සඳහා ජෛව සුරක්ෂිතතාවය පනත**

මෙම පනත කෙටුම්පත් කිරීම සඳහා අදාල ආයතන නියෝජනයෙන් යුතුව සාකච්ඡා කිහිපයක් පවත්වා ඔවුන්ගේ අදහස් ඇතුලත් කර නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් කෙටුම්පත් කරන ලද ජෛව සුරක්ෂිතතාවය පිළිබඳ පනත අවශ්‍ය අනුමැතිය සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

- ✓ **ජෛවසුරක්ෂිතතාව පිළිබඳ දැනුම්වත් කිරීමේ මුද්‍රිත පොත්, අත් පත්‍රිකා සහ සඟරා**

ජෛවසුරක්ෂිතතාව පිළිබඳ සියළුම පාර්ශව දැනුවත් කිරීම සඳහා පොත්, අත් පත්‍රිකා සහ සඟරා ප්‍රකාශයට පත්කර අදාල ආයතන වලට බෙදා හරින ලදී.

# ජාතික වශයෙන් යෝග්‍ය හරිතාගාර වායු විමෝචන අවම කිරීමේ ක්‍රියාකාරකම් සකස් කිරීම (NAMAs)

**බලශක්ති අංශය සඳහා ජාතික වශයෙන් යෝග්‍ය හරිතාගාර වායු විමෝචන අවම කිරීම**

බලශක්ති ජනනය හා බලශක්ති පරිභෝජන යන ක්ෂේත්‍ර සඳහා ජාතික වශයෙන් යෝග්‍ය හරිතාගාර වායු විමෝචන අවම කිරීම සඳහා ක්‍රියාකාරකම් සකස් කිරීමේ (NAMAs) ව්‍යාපෘතිය විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර ව්‍යාපෘතියේ 4 වන සංරචකය වන "බලශක්ති ජනනය හා පරිභෝජන යන ක්ෂේත්‍ර සඳහා ඇගයීමේ, වාර්තා කිරීමේ හා තහවුරු කිරීමේ ක්‍රමවේදය (MRV) සකස් කිරීම හා ජාතික ලියාපදිංචි ලේඛනය සකස් කිරීම" යන්න දේශගුණ විපර්යාස අංශය යටතේ ක්‍රියාවට නැංවේ.

මේ යටතේ ජාතික වශයෙන් යෝග්‍ය හරිතාගාරවායු අවම කිරීමේ ක්‍රියාකාරකම් පිළිබඳ ආයතනික රාමුව, ව්‍යාපෘතිය අනුමත කිරීමේ ක්‍රමවේදය, ජාතික ලියාපදිංචි ලේඛනය, බලශක්ති ක්ෂේත්‍රය සඳහා ඇගයීමේ, වාර්තා කිරීමේ හා තහවුරු කිරීමේ ක්‍රමවේදය (MRV) සිදු කිරීම, වෙබ් අඩවිය සකස් කිරීම ආදිය ප්‍රධාන ක්‍රියාකාරකම් ලෙස හඳුනාගෙන ඇත.

ප්‍රගතිය වාර්තා කරන කාලසීමාව තුළ;

- ජාතික වශයෙන් යෝග්‍ය හරිතාගාර වායු අවම කිරීමේ ක්‍රියාකාරකම් පිළිබඳ ආයතනික රාමුව හා අනුමත කිරීමේ ක්‍රමවේදය සකස් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම
- "ශ්‍රී ලංකාව තුළ ජාතික වශයෙන් යෝග්‍ය හරිතාගාර වායු අවම කිරීමේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම පිළිබඳ පොත් පිංච නිර්මාණය කිරීම
- බලශක්ති ක්ෂේත්‍රය සඳහා නියමු ව්‍යාපෘති 3 ක් සඳහා ඇගයීමේ, වාර්තා කිරීමේ හා තහවුරු කිරීමේ ක්‍රමවේදය (MRV) සකස් කිරීම
- දැනුවත් කිරීමේ පත්‍රිකා මුද්‍රණය කිරීම
- MRV ඇගැයීම් සිදු කිරීම සඳහා සම්පත් සංචිතය ස්ථාපිත කිරීම
- වෙබ් අඩවිය, වෙබ් අඩවිය පදනම් කරගත් ලේඛනය, ජාතික ලියාපදිංචි ලේඛනය සකස් කිරීම
- ශ්‍රී ලංකාව තුළ ජාතික වශයෙන් යෝග්‍ය හරිතාගාර වායු විමෝචන අවම කිරීමේ ක්‍රියාකාරකම් සකස් කිරීම සඳහා පාර්ශවකරුවන් සමග රැස්වීම් පැවැත්වන ලදී
- නව NAMA ව්‍යාපෘති යෝජනා සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩමුළු පැවැත්වීම. ඒ අනුව නව ව්‍යාපෘති යෝජනා 6 ක් සකස් කරමින් පවතී

# දේශගුණ විපර්යාස හේතුවෙන් ඇතිවන අවධානම ඇගයීම සහ ජාතික සංවර්ධන ක්‍රියාවලියට දේශගුණ විපර්යාස සඳහා අනුගත වීමේ ක්‍රියාකාරකම් අන්තර්ග්‍රහණය කිරීම සඳහා වූ තාක්ෂණික ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාව දේශගුණ විපර්යාස මගින් ඇතිකරනු ලබන අයහපත් බලපෑම් වල දැඩි අවධානමකට ලක්ව පවතී. මේ පිළිබඳව අවධානය යොමු කොට අමාත්‍යාංශය විසින් ආසියානු සංවර්ධන බැංකුවේ තාක්ෂණික ව්‍යාපෘතියක් යටතේ 2009 වර්ෂයේදි දේශගුණ විපර්යාස හේතුවෙන් ඇතිවන අවධානම ඇගයීම් කිරීම සහ ඒවා සිතියම් ගත කෙරුණි. එම ව්‍යාපෘතියෙහි දීර්ඝ කිරීමක් ලෙස එම ව්‍යාපෘතිය මගින් සකස් කරන ලද අවධානම් පැතිකඩ (Vulnerability Profiles) වඩා දියුණු ක්‍රමවේදයන් යොදා ගනිමින් මුළු දිවයිනම ආවරණය වන පරිදි යාවත්කාලීන කිරීමටත්, ඒ තුලට මෑතදී හඳුනා ගන්නා ලද අනුහුරුවීමේ නව ක්ෂේත්‍රයන් අන්තර්ගත කිරීමටත් ආසියානු සංවර්ධන බැංකුව විසින් නැවත තාක්ෂණික ව්‍යාපෘතියක් අනුමත කරණ ලදී.

මෙම ව්‍යාපෘතියෙහි මුලික අරමුණ වන්නේ;

- රාජ්‍ය මට්ටමේ ධාරිතා වර්ධනය කිරීම තුලින්, ජාතික සංවර්ධන ප්‍රතිපත්ති වලට දේශගුණික විපර්යාස වලින් ඇති වන බලපෑම් අන්තර්ග්‍රහණය කිරීමත් එමගින් ප්‍රජාව තුළ දේශගුණික විපර්යාස වල අහිතකර බලපෑම් වලට මුහුණදීමට ඇති හැකියාව වැඩිදියුණු කිරීම.
- උතුරු හා නැගෙනහිර පළාත් වලත්, කඳුකර හා වෙරළ කළාප වලත් ස්වභාවික සම්පත් මනා ලෙස සැලසුම්කරණය කිරීම හා විශේෂයෙන් දේශගුණ විපර්යාස පිළිබඳ අවධානම් හඳුනාගැනීම, අවධානම් ඇගයීම හා බලපෑම් ඇගයීම සඳහා ධාරිතා වර්ධනය.
- දේශගුණ විපර්යාස වලට අනුහුරු විම පිළිබඳ සැලසුම් හා ප්‍රතිපත්ති වලට මෙවලම් සකස් කිරීම.

ප්‍රගතිය වාර්තා කරන කාලසීමාව තුළ අදාළ ආයතන සහ විශේෂඥයන් සමඟ උපදේශාත්මක රැස්වීම් පැවැත්වීම, සිතියම් සංවර්ධනය සඳහා විශ්ලේෂණය සිදුකරන ලදී. තවද,
(1) ආහාර සුරක්ෂිතතාවය (කෘෂිකර්ම,ධීවර හා පශු සම්පත්)
(2) ජල සුරක්ෂිතතාවය,
(3) මහජන සෞඛ්‍යය,
(4) ජෛව විවිධත්වය සහ පාරිසරික පද්ධති සේවා හා
(5) නාගරික සංවර්ධනය / මානව ජනාවාස සහ ආර්ථික යටිතල පහසුකම් යන ක්ෂේත්‍ර පහ සඳහා සකස් කරණ ලද අවධානම් පැතිකඩ (Risk Profiles) සහ දේශගුණ විපර්යාස පිළිබඳ අවදානම් දත්ත පොතෙහි අවසාන කෙටුම්පත් නිමකොට ඇති අතර වෙරළ හා කඳුකරකලාප සඳහා වන දේශගුණ විපර්යාස අවධානම් පැතිකඩ (Vulnerability Profile) කෙටුම්පත් කොට ඇත.

# III වන කොටස

## මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයට අයත් රාජ්‍ය හා ව්‍යාවස්ථාපිත ආයතනවල ප්‍රගතිය

- ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව
- මධ්‍යම පරිසර අධිකාරිය
- ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
- මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය
- සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
- රාජ්‍ය දැව සංස්ථාව
- භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
- ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය
- මහවැලි උපදේශන කාර්යාංශය



# ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

**2018 වසර තුළ සිදු කරන ලද සංවර්ධන ක්‍රියාකාරකම්**

මූල්‍ය ප්‍රගතිය

2018 වසර සඳහා වර්ෂය සඳහා මුලු ඇස්තමේන්තු ගත ආයෝජනය රු.මි. **2,733.50**. මූල්‍ය ප්‍රගතිය පහතින් දක්වා ඇත.

| විස්තරය | | රු.මිලි |
|---|---|---|
| | අය වැය ප්‍රතිපාදන **2018** | **වියදම (2018.12.31)** |
| **මහවැලි ව්‍යාපෘති** | **1,158.00** | **1,080.00** |
| මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය (ඒ.අ ) | 290.00 | 290.00 |
| බී කලාපයේ මාදුරුඔය දකුණු ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය (ඒ.අ ) | 60.00 | 60.00 |
| රිදීමාලියද්ද ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය (ඒ.අ ) | 76.00 | 64.00 |
| රඹකැන් ඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය (ඒ.අ ) | 108.00 | 94.00 |
| වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය - එල් කලාපය (ඒ.අ ) | 260.00 | 260.00 |
| හදිසි යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය ඇතුළු විශාල හා මධ්‍යම වාරිමාර්ග ව්‍යාපෘති ප්‍රතිසංස්කරණය කිරීම (ඒ.අ ) | 150.00 | 137.00 |
| කෘෂිකර්ම හා පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය (ඒ.අ ) | 214.00 | 175.00 |
| **පරිපාලන හා නඩත්තු (ඒ.අ )** | **1,575.50** | **1,498.18** |
| **එකතුව** | **2,733.50** | **2,578.18** |

## මහවැලි ව්‍යාපෘති

- **මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය**

මූල්‍ය ප්‍රතිපාදන : දේශීය අරමුදල්
ඇස්තමේන්තු පිරිවැය : රු.මි 4,910 (සංශෝධිත අයවැය)
ව්‍යාපෘති කාලසීමාව : 2007-2018

මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය වාරි ජල සැපයුම සුරක්ෂිත කරමින් කෘෂි ආර්ථිකය නැංවීම හරහා මාදුරුඔය වම් ඉවුර ප්‍රදේශයේ වෙසෙන ග්‍රාමීය ප්‍රජාවගේ ආර්ථිකය සංවර්ධනය කිරීම අරමුණු කර ආරම්භ කරන ලදි. ව්‍යාපෘති ක්‍රියාකාරකම් යටතට 1982 - 1986 කාලයේ ඉදිකරන ලද වාරිමාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම ඇතුළත් වේ. (අ) මාදුරු ඔය දකුණු ඉවුර වාරිමාර්ග ප්‍රතිසංස්කරණය යටතේ යටතේ කි. මී. 52 ක් වන ප්‍රධාන ඇල, කි. මී. 65 ක් වන ශාඛා ඇලවල්, කි. මී. 459 ක් වන බෙදාහැරීමේ ඇලවල්, කි. මී. 1,138 ක් වන කෙත් ඇලවල්, කි. මී. 54 ක් වන පරිවහන ඇලවල්, කි. මී. 80 ක් ග්‍රාමීය මාර්ග මෙහෙයුම් හා නඩත්තු කටයුතු, හා කුඩා වැව් ප්‍රතිසංස්කරණ කටයුතු ඇතුළුව ජල කළමනාකරණය සඳහා මාදුරුඔය වම් ඉවුරේ 1981 – 1986 කාලය තුල ඉදිකරන ලද වාරිමාර්ග ජාලය ප්‍රතිසංස්කරණය කිරීම. (ආ) ග්‍රාමීය ස්වයං ආධාරක ව්‍යාපෘති යටතේ ගොඩනගන ලද තෝරාගත් ජල සැපයුම් සේවා විධිමත් කර ප්‍රවර්ධනය කිරීම (ඇ) කෘෂිකාර්මික සංවර්ධනය උදෙසා සහය ලබා දීම මෙන්ම ගොවි සංවිධාන ශක්තිමත් කිරීම හා (ඈ) යෝග්‍ය පාරිසරික සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ඇතුළත් වේ.

2018 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිපාදන රු. මි. 290 (සංශෝධිත) ක් වේ. වසර අවසන් වන විට සියලුම මුදල් ඵලදායී ලෙස යොදවා ඇත.

| අංකය. | විස්තරය | භෞතික ප්‍රගතිය 2018.12.31 |
|---|---|---|
| 01 | බෙදාහැරීමේ ඇලවල් ඉදි කිරීම/ප්‍රතිසංස්කරණය | 13.2 කි.මී |
| 02 | කෙත් ඇල ඉදි කිරීම/ප්‍රතිසංස්කරණය | 70.4 කි.මී |
| 03 | දියමංකඩ ප්‍රතිසංස්කරණය කිරීම | 03 |
| 06 | ගොඩනැගිලි අළුත්වැඩියාව | 2.5 |
| 09 | සහභාගිත්ව කෙත් ඇල ප්‍රතිසංස්කරණ | 2.1 කි.මී |



- **බී කලාපයේ මාදුරුඔය දකුණු ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය (මල්වැන්න සහ මහවැලිතැන්න)**

මූල්‍ය ප්‍රතිපාදන : දේශීය අරමුදල්
ඇස්තමේන්තු පිරිවැය : රු.මි.935.49
ව්‍යාපෘති කාලසීමාව : 2014-2018

පොලොන්නරුව හා මඩකලපුව පරිපාලන දිස්ත්‍රික්කයන්හි මහවැලි බී කලාපය ආවරණය කරන සිංහපුර ඉහළ කොටසේ මහවැලිතැන්න සහ මල්වැන්න මහවැලි කලාප පිහිටා ඇති අතර ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කරනු ලැබේ. මෙම ප්‍රදේශයන්හි ඉකුත් දශක කිහිපයේ පැවති අභ්‍යන්තර අර්බුදකාරී වාතාවරණය හේතුවෙන් නැවත පදිංචි කරුවන් බොහෝමයක් අභ්‍යන්තරික වශයෙන් අවතැන් විය. එහි ප්‍රතිඵලයක් ලෙස දල වශයෙන් නැවත පදිංචි කරවූ පවුල් 1200 ක් පමණ නැවත ඔවුන්ගේ මුල් ගම් බිම් වෙත ගියහ.
අර්බුදකාරී වාතාවරණය සමනය වීමත් සමගම 2014 වර්ෂයේදී මෙම විශේෂ ව්‍යාපෘතිය යටතේ නැවත පදිංචි කිරීම සහ පුනරුත්ථාපන කටයුතු ආරම්භ කරන ලදී. මෙහිදී සිංහපුර කොට්ඨාශයේ මල්වැන්න හා මහවැලිතැන්න ඒකකවල ගෙවතු ඉඩම් 859 ක් හා වාරි ඉඩම් 859 සංවර්ධනය කිරීමට යෝජනා විය. ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්යයන් වශයෙන් (අ) අවතැන් වූ පවුල් 859 ක් සිංහපුර කොටසේ නැවත පදිංචි කිරීම හා පදිංචිය නැවත ස්ථාපිත කිරීම (ආ) දැනට පවත්නා වාරි පදනම් වූ හෙක්ටයාර 521 ක් කෘෂිකර්මාන්තය සඳහා සංවර්ධනය කිරීම හා හෙක්ටයාර 174 ක් වූ ගෙවතු ඉඩම් සංවර්ධනය කිරීම සහ (ඇ) මහවැලිතැන්න වැව හා අනෙකුත් වාරි පද්ධතිය ඉදි කිරීම දක්වා ඇත.

2018 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිපාදන රු. මි. 60 (සංශෝධිත) ක් වේ. වසර අවසන් වන විට සියලුම මුදල් ඵලදායී ලෙස යොදවා ඇත.

| අංකය. | විස්තරය | භෞතික ප්‍රගතිය 2018.12.31 |
|---|---|---|
| 01 | බෙදාහැරීමේ ඇලවල් ඉදි කිරීම | 6.8 කිමී |
| 02 | කෙත් ඇල ඉදි කිරීම | 3 කි.මී |

| | | |
|---|---|---|
| 03 | වෙළඳපොළ හා ගම්මාන මාර්ග ඉදි කිරීම | 4 කි.මී |
| 04 | ප්‍රතිරෝපණය-පැල | 2000 පැල |





- **රිදීමාලියද්ද ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය**

මූල්‍ය ප්‍රතිපාදන : දේශීය අරමුදල්
ඇස්තමේන්තු පිරිවැය : රු.මි.1,100
ව්‍යාපෘති කාලසීමාව : 2012-2018

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ගෘහස්ථ ආදායම් හා වියදම් සමීක්ෂණයට අනුව බදුල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ඉතා දුර බැහැර පිහිටි මෙන්ම වඩාත් දරිද්‍රතාවයෙන් යුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් වශයෙන් හඳුනාගෙන ඇත. එබැවින් ඉහත ප්‍රදේශය සංවර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් පස් අවුරුදු ආයෝජන සැලැස්මක් සකස් කරන ලදි. මෙම ප්‍රදේශයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා මෙම ප්‍රදේශයේ වෙසෙන පවුල්වලට කෘෂිකර්මය මත පදනම් වූ ඵලදායී මෙන්ම තිරසාර ආර්ථික ප්‍රවේශයන් විවර කරදීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණු වේ. මේ යටතේ (අ) වාණිජ බෝග නිෂ්පාදනය වැඩිදියුණු කිරීම (ආ) පශු සම්පත් සංවර්ධනය (ඇ) ව්‍යවසායකත්ව සංවර්ධනය කෙරෙහි මූලික වශයෙන් අවධානය යොමු කෙරේ.

2018 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිපාදන රු. මි. 76 (සංශෝධිත) ක් වේ. 2018 දෙසැම්බර් මස අවසන් වන විට එයින් රු. මි. 64 ක් ඵලදායී ලෙස යොදවා ඇත.





| අංකය. | විස්තරය | භෞතික ප්‍රගතිය 2018.12.31 |
|---|---|---|
| 01 | වාරිමාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය කාරීම | 2 අමුණු |
| | | 3.3 කි.මී වාරි ඇළ මාර්ග |
| 02 | මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම | 5.2 කි.මී ගල්තාර මාර්ග |
| | | 150 මී කොන්ක්‍රීට් මාර්ග’ |
| 03 | ගොඩනැගිලි ඉදිකිරිම | 09 |

| | | |
|---|---|---|
| 04 | පුහුණු වැඩසටහන් | 74 වැඩසටහන් |
| 05 | කෘෂිකර්ම හා සත්වපාලන වැඩසටහන | 1,439 පවුල් |

- **රඹකැන් ඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය**

මූල්‍ය ප්‍රතිපාදන : දේශීය අරමුදල්
ඇස්තමේන්තු පිරිවැය : රු.මි. 1,086
ව්‍යාපෘති කාලසීමාව : 2012-2019

රඹකැන් ඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය මගින් අම්පාර දිස්ත්‍රික්කයේ මහ ඔය සහ පදියතලාව ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයන්හි ජලාශ සහ වාරිමාර්ග සංවර්ධනය පිළිබඳ මූලික අවධානය යොමු කෙරේ.මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණු වනුයේ (අ) කුඩා හා මධ්‍යම වැව් හා අමුණු පුනරුත්ථාපනය කිරීම (ආ) ග්‍රාමීය මාර්ග කිලෝමීටර් 70 ක් පුනරුත්ථාපනය කිරීම (ඇ)කෘෂිකාර්මික නිෂ්පාදනය *50 %* වැඩි කිරීම (ඈ) පානීය ජල ළිං ඉදි කිරීම තුළින් ජල සැපයුම (ඉ) ළිං සහ සනීපාරක්ෂක සෞඛ්‍ය ආරක්ෂණ වැඩපිළිවෙල (වැසිකිළි ඉදිකිරීම).
2018 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිපාදන රු. මි. 108 (සංශෝධිත) ක් වේ. 2018 දෙසැම්බර් මස අවසන් වන විට එයින් රු. මි. 94 ක් ඵලදායී ලෙස යොදවා ඇත.



| අංකය. | විස්තරය | භෞතික ප්‍රගතිය 2018.12.31 |
|---|---|---|
| 01 | වාරිමාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය කාරීම | 2 අමුණු |
| | | 1.925 කි.මී වාරි ඇල මාර්ග |
| 02 | මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම | 0.55 කි.මී ඇස්පර මාර්ග |
| | | 4 කි. මී ගල්තාර මාර්ග |
| 03 | ගොඩනැගිලි ඉදිකිරිම | 06 |
| 04 | ඉඩම් සහ ඉඩම් සංවර්ධනය ( වන්දි ගෙවීම්) | 22 කට්ටි |
| 05 | කෘෂිකර්ම හා සත්වපාලන වැඩසටහන | 1,557 පවුල් |

- **වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය - එල් කලාපය**

මූල්‍ය ප්‍රතිපාදන : දේශීය අරමුදල්
ඇස්තමේන්තු පිරිවැය : රු.මි.3,957
ව්‍යාපෘති කාලසීමාව : 2012-2018

අනුරාධපුරය , වව්නියාව,මුලතිව් හා ත්‍රිකුණාමලය යන පරිපාලන දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි මහවැලි කලාපයේ සංවර්ධනය සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.අවතැන් පවුල් 6,788 ක් සඳහා ගෙවතු වගාව, වාරි ඉඩම් හා අවශ්‍ය භෞතික හා සමාජ යටිතල පහසුකම් සැපයීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ.
මේ යටතේ (අ) ගම්මාන 11 ක් තුල ගොවි පවුල් 6,788 ක් නැවත පදිංචි කරවීම (ආ) හෙක්ටයාර් 4,187 කෘෂිකර්ම ඉඩම් සංවර්ධනය කිරීම (ඇ) වෙළඳ පොල හා ගම්මාන මාර්ග ඉදිකිරීම හා වැඩි දියුණු කිරීම (ඈ) සමාජ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සිදු කෙරේ.

2018 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිපාදන රු. මි. 260 (සංශෝධිත) ක් වේ. 2018 වසර අවසන් වන විට සියලුම මුදල් ඵලදායී ලෙස යොදවා ඇත.



| අංකය. | විස්තරය | භෞතික ප්‍රගතිය 2018.12.31 |
|---|---|---|
| 01 | ඉඩම් ලකුණු කිරීම හා මැනීම | 2000කට්ටි |
| 01 | වාරි ඇල ප්‍රතිසංස්කරණය කිරීම | 5 කි.මී |
| 02 | ගොඩනැගලි ඉදි කිරීම | 23 |
| 03 | මහා මාර්ග ඉදි කිරීම | 55 කි.මී |
| 04 | කෘෂි ළිං ඉදි කිරීම | 19 |
| 05 | පානිය ජාල සැපයුම් ව්‍යාපෘතිය | 80 ටැංකි |
| 06 | පුහුණු වැඩසටහන් | 157 වැඩසටහන් |
| 07 | කෘෂිකර්ම හා සත්වපාලන වැඩසටහන | 3000 පවුල් |

- **හදිසි යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය ඇතුළු විශාල හා මධ්‍යම වාරිමාර්ග ව්‍යාපෘති ප්‍රතිසංස්කරණය කිරීම**

මූල්‍ය ප්‍රතිපාදන : දේශීය අරමුදල්
ඇස්තමේන්තු පිරිවැය : රු.මි.825
ව්‍යාපෘති කාලසීමාව : 2015-2018

(අ) මූලික වැඩ හා ජලාශ අළුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම (ආ) වාරි යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම හා (ඇ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ වන හුරුලුවැව, උඩවලව, මහවැලි කලාප බී, සී, එච්, එල් හා මූලික වැඩ පාලන ක්‍රියා කරවුම් නඩත්තු හා මෙහෙයුම් අංශය යටතේ වන කාර්යය භාර ඉංජිනේරු අංශවල වාරි බෙදුම් ඇලවල් අතර මාර්ග ඉදි කිරීම් හා ප්‍රතිසංස්කරණය මෙම ව්‍යාපෘතිය මගින් අරමුණු කෙරේ. 2018 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිපාදන රු. මි. 150 (සංශෝධිත) ක් වේ. 2018 දෙසැම්බර් මස අවසන් වන විට එයින් රු. මි. 137ක් ඵලදායී ලෙස යොදවා ඇත.

| අංකය. | විස්තරය | භෞතික ප්‍රගතිය 2018.12.31 |
|---|---|---|
| 01 | ප්‍රධාන ජලාශවලට හදිසි යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය | ප්‍රධාන ජලාශ 8 න් 95% |
| 01 | 2018 වර්ෂය සඳහා පහළ යටිතල වාරි පහසුකම් ප්‍රතිසංස්කරණය | 100 % |

- **කෘෂිකර්ම හා පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය**

මූල්‍ය ප්‍රතිපාදන : දේශීය අරමුදල්
ඇස්තමේන්තු පිරිවැය : රු.මි.214 (සංශෝධිත අයවැය)
ව්‍යාපෘති කාලසීමාව : වාර්ෂික (01.01.2018 - 31.12.2018 )

ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහනට සමගාමීව රටේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා දේශීය කෘෂි ආනයනය අඩු කිරීමට හේතු වන දේශීය ආහාර බෝග වගාව සහ පශු සම්පත් නිෂ්පාදනය පූර්ණ වශයෙන් වැඩිදියුණු කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ආරම්භ කර ඇත.

2018 වර්ෂය සඳහා කෘෂිකාර්මික ප්‍රමුඛතා වනුයේ බෝග විවිධාංගීකරණය, මහවැලි එල් කලාපය සඳහා සුදුසු මිරිස් වර්ග හඳුනාගැනීම, ගුණාත්මක බීජ නිෂ්පාදනය සඳහා වැඩසටහන්, පළතුරු ගස් සඳහා පුනරුත්ථාපන වැඩසටහන්, කාබනික පොහොර භාවිතය වැඩි කිරීම, නියඟ සහිත කාලගුණයට ඔරොත්තු දීමට කෘෂිකාර්මික ළිං ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම, දේශීය ආර්ථික සංවර්ධනය සඳහා වන වැඩසටහන සහ ජල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම වේ. වැඩි දියුණු කරන ලද පශු සංවර්ධන වැඩපිළිවෙල, දියර කිරි නිෂ්පාදනය, කුකුළු නිෂ්පාදන, මිරිදිය හා විසිතුරු මත්ස්‍ය නිෂ්පාදන කටයුතු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු හා වැඩමුළු පැවැත්වීම සිදු කරන ලදී.

2018 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිපාදන රු. මි. 220 ක් වන අතර එයින් රු.මි 175 ක් මෙම කාලය වන විට උපයෝජනය කර ඇත.

**කෘෂිකාර්මික භෝග වගාව**

2017/2018 මහ කන්නයේදී මහවැලි ප්‍රදේශවල වී වගාකර ඇති ඉඩම් ප්‍රමාණය හෙක්. 84,460 ක් වන අතර මහවැලි කලාපවල වී නිෂ්පාදනය දල වශයෙන් මෙ. ටො. 469,176 ක් විය 2018 යල කන්නයේ වී වගාකර ඇති භූමි ප්‍රමාණය හෙක්. 80,960 වන අතර වාරතා වන වී නිෂ්පාදනය මෙ. ටො. 436,875 වේ. 2017/2018 මහ සහ 2018 යල කන්නයේ වාර්තා වී ඇති මුලු වී නිෂ්පාදනය මෙ. ටො. 906,052 වේ. මෙම වර්ෂයේදී මහවැලි කලාපවල සාමාන්‍යය වී අස්වැන්න හෙක්ටයාරයකට මෙ. ටො. 5.5 ක් වී ඇත

අනෙකුත් බෝග වගා කිරීම ( අනෙකුත් ක්ෂේත්‍ර භෝග, පළතුරු,එළවළු සහ නිත්‍ය භෝග) හෙක්. 36,164 ක් වූ අතර එය සෝයා බෝංචි හෙක්. 1,510 ක්ද, බඩ ඉරිඟු හෙක්. 3,805 ක්ද, ලොකු ළූණු හෙක්. 535 ක්ද මිරිස් හෙක්. 683 ක්ද, කළු කවුපි හෙක්. 137 ක්ද, කවුපි හෙක්. 443 ක් සහ රට කජු හෙක්. 704 වශයෙන් සමන්විත විය. තවද, හෙ. 13,557 ක් පලතුරු ද හෙ. 6,312 නිත්‍ය භෝග ද වගා කොට ඇත.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දත්තවලට අනුව මෙම කාලය තුළදී වී අස්වැන්න 24% සෝයා බෝංචි 85% රට කජු 6 % හා මිරිස් 9 % ආදී වශයෙන් දේශීය කෘෂි නිෂපාදන හා සංවර්ධනය කාර්යයන් හිදී ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ඉතා ඉහළ දායකත්වයක් දරයි.

**කිරිගව සංවර්ධන වැඩසටහන**

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පශු සම්පත් සංවර්ධන අංශය හරහා මහවැලි ප්‍රදේශ වල අතිරේක ආදායම් මාර්ග හඳුන්වාදීම හා මහවැලි ජනපදිකයින්ගේ පෝෂණ තත්වය ඉහළ නැංවීම අරමුණු කරගෙන කිරිගව පාලනය ප්‍රවර්ධනය කිරීමට ක්‍රියාකරනු ලැබේ. මහවැලි කලාපවල කිරි නිෂ්පාදනයේ සංවර්ධන කටයුතු සිදු කිරීම සහ මෙහෙයවීම ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පශු සම්පත් සංවර්ධන අංශයේ වගකීම වේ.

2018 වර්ෂයේ ජුනි සිට දෙසැම්බර් කාලය තුළදී මහවැලි ප්‍රදේශවල 109, 060 ක මුළු ගව ගහනයක් වාර්තා වූ අතර එම කාලය තුළ දල වශයෙන් කිරි ලීටර් මිලියන 27.1ක් පමණ නිෂ්පාදනය කර ඇත.

මෙම කාල පරිච්ඡේදය තුළදී ගව ගාල් 98 ක් ඉදි කරන ලද තවද සත්ව අභිජනන හැකියාව වැඩිදියුණු කිරීම යටතේ අභිජනනන මධ්‍යස්ථාන 02 ක් ස්ථාපනය කරන ලදී. තව දුරටත් ආදර්ශ ගොවිපළ සඳහා ජංගම කිරි දෙවීමේ යන්ත්‍ර 22 ක් බෙදාදී අවසන් අතර සත්ව සායන හා එන්නත් වැඩසටහන් 42 ක් පවත්වා ඇත.

**මිරිදිය මත්ස්‍ය කර්මාන්තය හා විසිතුරු මත්ස්‍ය රෝපණය**

මහවැලි ජනපදිකයින්ගේ පෝෂණය හා ආර්ථික තත්වය නැංවීමෙහි ලා මහවැලි ජලාශවල මිරිදිය මත්ස්‍ය කර්මාන්තය සංවර්ධනය කිරීම ප්‍රධාන කාර්යයක් වේ. 2018 වර්ෂ අවසානයේදී මත්ස්‍ය නිෂ්පාදනය මෙ. ටො. 13.7 ක් ලෙස වාර්තා විය. මත්ස්‍ය නිෂ්පාදනය වැඩිකිරීම සඳහා අභිජනන මධ්‍යස්ථාන 20 ක් ඉදිකර ඇත.විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය වැඩි දියුණු කිරීම අදාළ කාල පරිච්ඡේදය තුළ සඳහා මඩ පොකුණු 41 ක් හා සිමෙන්ති ටැංකි 26 ක් ඉදි කර ඇත. තව දුරටත් ධීවර ප්‍රජාව ශක්තිමත් කිරීම සඳහා පුහුණු වැඩසටහන් 36 ක් පවත්වා ඇත.

## නඩත්තු සහ සංවර්ධනය

ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහනට සමගාමීව කෘෂි කර්මාන්තය සංවර්ධන කිරීමේ අරමුණ පෙරදැරිව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය එහි කලාප 10 තුළ හෙක්. 106,971 ක් වන වාරි ඉඩම් සඳහා ජල සැපයුම තහවුරු කරනු වස් විශාල, මධ්‍යම හා කුඩා ප්‍රමාණයේ ජලාශ 484 කින් සමන්විත කි.මී. 10,202 ක් වූ වාරි මාර්ග ජාලයේ මෙහෙයුම් හා නඩත්තු කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන් වගකීම දරන ආයතනය වේ. මේ අතර පවුල් 330,000 කට වැඩි ප්‍රතිලාභ සපයනු වස් මහවැලි මාර්ග පද්ධතිය හා අනෙකුත් යටිතල පහසුකම් නඩත්තු කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම ද ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතට ගැනෙන කාර්යයන් වේ.

තවද, ප්‍රදේශය තුළ දැනට වෙසෙන හා ඉදිරි පරම්පරාවේ උන්නතිය උදෙසා සඵලදායී අයුරින් ඉඩම් පරිපාලනය, ව්‍යවසායකත්ව සංවර්ධනය, පරිසර සංරක්ෂණය සහ ආයතනික සංවර්ධන කටයුතු මෙන්ම මහවැලි ජනපද ප්‍රදේශවල ක්‍රීඩා කටයුතු සංවර්ධනය කිරීම ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රධාන කාර්යයන් වේ. මේ සඳහා 2018 වසරට අය වැය ප්‍රතිපාදන රු.මි. 1,575 .00 ක් වන අතර මෙම කාලපරිච්ඡේදය තුළදී එයින් රු. මි. 1,498.18 ඵලදායී ලෙස යොදවා ඇත.

- **වාරිමාර්ග පද්ධතිය නඩත්තුව**

දෙවනි වර කැලෑ එළි කිරීම, වාරිමාර්ග ඇල පද්ධතියෙහි රොන්මඩ ඉවත් කිරීම, වාරි මාර්ග පද්ධතිය හා නිර්මිත අළුත්වැඩියාව සහ සංවර්ධනය, මාර්ග බොරළු ඇතිරීම ආදිය මහවැලි වාරිමාර්ග පද්ධතිය නඩත්තු කටයුතු යටතට ගැනේ. 2018 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන රු. මි. 482.65 ක් වාරිමාර්ග පද්ධතිය නඩත්තු කටයුතු වෙනුවෙන් වෙන්කර ඇති අතර ඉහත කාර්යයන් සාක්ෂාත් කර ගනු වස් 2018 දෙසැම්බර් දක්වා ඉන් රු.මි. 430.31 ක් ඵලදායී අයුරින් වැය කර ඇත.

මහවැලි කලාප තුළ ගොවි සංවිධාන 1,014 ක් ක්‍රියාත්මකව පවතින අතර බෙදා හැරීමේ ඇළ පද්ධති නඩත්තු හා මෙහෙයුම් කටයුතු සිදු කර ඇත. තවද, ආයතනික සංවර්ධන අංශයේ උපදෙස් මත 2018 වර්ෂයේදී ගොවි සංවිධාන 16 ක් වාණිජ මට්ටමට ඉහළ නංවන ලදී.

## ඉඩම් හිමිකම් පත්‍ර ප්‍රදානය



ඉඩම් හිමිකම් පත්‍ර ලබා දීමේ වැඩසටහන යටතේ ඉඩම් ලාභීන් 39,172ක් සඳහා හිමිකම් පත්‍ර ලබා දීමට කටයුතු කර ඇත.

| කලාපය | ඉලක්කය (2018 ) | ප්‍රගතිය ප්‍රදාන පත්‍ර/ බලපත්‍ර/ දීර්ඝකාලීන බදු |
|---|---|---|
| බී | 9,174 | 8,270 |
| සී | 8,440 | 8,440 |
| ඩී | 1,198 | 1,990 |
| එච් | 5,230 | 4,240 |
| එල් | 2,750 | 2,750 |
| මොරගහකන්ද | 1,857 | 1,857 |
| වික්ටෝරියා | 920 | 255 |
| හුරුළුවැව | 1,302 | 1,300 |
| වලව | 8,570 | 8,570 |
| රඹකැන්ඔය | 1,500 | 1,500 |
| **එකතුව** | **41,741** | **39,172** |

## ආයතනික සංවර්ධනය

ව්‍යවසායකත්ව අවස්ථා, පුද්ගල සංවර්ධනය, ආයතනික සවිබල ගැන්වීම, කාන්තාව සවිබලගැන්වීම, සමාජ හා සංස්කෘතික සංවර්ධනය ජනපදිකයන් වෙත ලබා දෙමින් මහවැලි පදිංචි කරුවන්ගේ සමාජ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම ඔවුන් පදිංචි කරවීමේ පශ්චාත් සමයේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රධාන කාර්යන් වේ. ඒ අනුව, පදිංචි කරුවන්ගේ දෙවන හා තුන්වන පරම්පරාවල අභිවෘද්ධිය තකා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ආයතනික සංවර්ධන අංශය ඉහත ක්ෂේත්‍ර ආවරණය වන පරිදි විවිධ වැඩ සටහන් හා වැඩමුළු සංවිධානය කරන ලදී.

ඒ අනුව 2018 කාල පරිච්ඡේදය තුළ ආයතනික සංවර්ධන වැඩසටහන් 3,090 ප්‍රජා සංවර්ධන වැඩසටහන් 651, කාන්තා අභිවෘද්ධියට අදාළ වැඩසටහන් 88 ක් පැවැත්වීමට හැකියාව ලැබිණි.

## වනාන්තර හා පරිසරය

- **වනාන්තර හා පරිසර සංරක්ෂණය**

පාරිසරික අංශය විසින් මහවැලි ප්‍රදේශ වල පාරිසරික කටයුතු කළමනාකරණය හා සම්බන්ධීකරණය අඛණ්ඩව සිදු කරනු ලබයි. ජාතික පාරිසරික වැඩසටහන යටතේ වන "පුනරුදය" තුන් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම සඳහා ප්‍රමුඛතා ලබා දෙමින් පරිසර අමාත්‍යාංශය මහවැලි ප්‍රදේශ තුළ හරිත සංකල්පය ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීමට කටයුතු කරමින් සිටියි.

වනාන්තර හා පරිසර සංරක්ෂණ කටයුතු සඳහා 2018 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන රු. මි. 35 ක් වන අතර එයින් රු. මි. 30.66 ක් වසර අවසන් වන විට එලදායී ලෙස යොදවා ඇත.

ස්වාභාවික සම්පත් සංරක්ෂණය යටතේ 2018 දෙසැම්බර් මස දක්වා වගා පස් මීටර 15367 ක් සංරක්ෂණය කරන ලදී. තවද පැල තවාන් කළමනාකරණය හා පැල නිෂ්පාදන වැඩසටහන යටතේ පැල 357,934 ක් නිෂ්පාදනය කරන ලද අතර ප්‍රදේශයේ වන සනත්වය ඉහල නැංවීමේ අරමුණින් පැල 33,595 ක් රෝපණය කරන ලදී. ජලයේ ගුණාත්මකභාවය මැනීමට හා වැඩි දියුණු කිරීමට මෙම වර්ෂය තුළදී ජලයේ ගුණාත්මකභාවය මැනීමේ මධ්‍යස්ථාන 19 ක් හා රොන් මඩ මැනීමේ මධ්‍යස්ථාන 07 ක් ස්ථාපනය කරන ලදී.

පාරිසරික අධ්‍යාපන හා දැනුවත් කිරීමේ වඩසටහන් 23 ක් පාසල් ළමුන්ගේ සහභාගිත්වයෙන් මෙම කාලය තුළදී පවත්වා ඇති අතර මහවැලි ප්‍රදේශවල දැඩි ආක්‍රමණශීලී ශාක විශේෂ පාලනය කිරීමට හා කලමණාකරණය කිරීමට වැව් 24 ක වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මහවැලි ප්‍රදේශවල අලි මිනිස් ගැටුම පාලනය කරනු වස් 2018 වර්ෂය තුළදී කි.මී. 18.6 ක අලි වැටක් ඉදි කරන ලද අතර කි.මී 666 (මොරගහකන්ද ව්‍යාපෘතියේ 299 කි.මී ඇතුළුව) ක අලි වැටක කඩත්තු කටයුතුද මෙම කාල පරිච්ඡේදය තුල සිදු කරන ලදී.

- **පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදනය වැඩි කිරීම (කුඩා ජල විදුලිබල ව්‍යාපෘති)**

මහවැලි ප්‍රදේශයන්හි කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘති 21 ක් ඉදි කිරීම තුළින් මෙ.වො. 56.03 ක් සමස්ථ ජල විදුලි ඒකක ප්‍රමාණයක් නිෂ්පාදන කිරීමට අපේක්ෂිත කෙරේ. 2018 දෙසැම්බර්මස අවසාන වන විට ඉන් ව්‍යාපෘති 12 ක් වාණිජ ක්‍රියාකාරකම් ආරම්භ කර ඇති අතර ඒවායේ ධාරිතාවය මෙ.වො. 39.85 කි.

## ව්‍යාපාර සංවර්ධනය

නවීන ගෘහ භාණ්ඩ සහිතව සංචාරල බංගලා 08 ක නවීකරණ කටයුතු මේ වන විට අවසන් කර ඇති අතර සංචාරක බංගලා 04 ක ගෘහ භාණ්ඩ නවීකරණය කර ඇත. සංචාරල බංගලා 12 ක් සඳහා අන්තර්ජාලය හරහා නවාතැන් පහසුකම් වෙන් කර ගැනීමේ හැකියාව පවතී.





කොත්මලේ මාදුරු ඔය රුහුණුකෙත

**මහවැලි හෙළ බොජුන් හල**

වැලිකන්ද, දෙහිඅත්තකණ්ඩිය සහ මොරගහකන්ද වෙළඳ අලෙවි මධ්‍යස්ථාන සහිතව "මහවැලි හෙළ බොජුන් හලා" *03* ක් ස්ථාපනය කරන ලදී.





**මහවැලි කලාපයන්හි පෞද්ගලික අංශයේ ආයෝජන සඳහා අවස්ථා**

2018 වර්ෂයේ දෙසැම්බර් දක්වා මහවැලි කලාපයේ නව ආයෝජන සහ අනෙකුත් සංවර්ධන ව්‍යාපෘතීන් 36 ක් සඳහා අනුමැතිය ලබාදී ඇත.

| | |
|---|---|
| ආයෝජන ව්‍යාපෘති | 29 |
| පුනර්ජනනීය බලශක්ති ව්‍යාපිතිය (සූරිය/ජෛව ස්කන්ධ) | 07 |

**සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධනය**

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සහයෝගය සංවිධානය කරන ලද "මහවැලි සවිය" වැඩසටහන යටතේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධන වැඩසටහන් මගින් කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකයන් 1722 දෙනෙක් සඳහා රු. මි. 285 ක් ලබාදී ඇති අතර "මොරගහකන්ද අත්වැල" නව ණය යෝජනා ක්‍රමය යටතේ 2017 වර්ෂය තුළදී "මහවැලි දිරිය" විශේෂ ණය යෝජනා ක්‍රමය යටතේ වසායකයන් 33 දෙනෙක් සඳහා රු. මි. 9.6 2017 වර්ෂයේ සිට 2018 වර්ෂය අවසානය දක්වා ලබා දීමට හැකියාව ලැබිණ.

**බෝට්ටු සේවා**

පරිසර හිතකාමී බෝට්ටු සේවාවන් ව්‍යාපාර සංවර්ධනයේ තවත් ප්‍රධාන ආදායම් උත්පාදන ව්‍යාපෘතියකි. 2018 අවසන් වන විට මහවැලි අධිකාරිය යටතේ වික්ටෝරියා, පොල්ගොල්ල, දඹුලුඔය සහ ලොග්ගල්ඔය යන ප්‍රදේශවල බෝට්ටු සේවයන් 6 ක් ක්‍රියාත්මක වන අතර, වාර්ෂික බදු මත පදනම්ව රු.මි. 1.1 ආදායම ලබා දෙයි.

## සේවක අභිප්‍රේරණය

- **මානව සම්පත් සංවර්ධනය/නව බඳවා ගැනීම්/කාර්ය මණ්ඩල උසස් වීම්**

කාර්යක්ෂම මෙන්ම ඵලදායී සේවාවක් සැපයීම සඳහා සංශෝධනය කරන ලද බඳවා ගැනීම් පරිපාටිවලට අනුව නව බඳවා ගැනීම් බොහෝමයක් ඉටු කර ගැනීමට 2018 දෙසැම්බර් මස අවසන් වන විට අධිකාරියට හැකියාව ලැබී ඇත.

| පුරවන ලද පුරප්පාඩු සංඛ්‍යාව | | උසස්වීම් | |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණය (ජ්‍යෙ.ක) | 1 | ජ්‍යෙෂ්ඨ කළමනාකරණය (ජ්‍යෙ.ක) | 02 |
| මධ්‍යම කළමනාකරණය (ම.ක) | 26 | මධ්‍යම කළමනාකරණය (ම.ක) | 14 |
| කණිෂ්ඨ කළමනාකරණය (ක.ක) | 5 | කණිෂ්ඨ කළමනාකරණය (ක.ක) | 33 |
| කළමනාකරණ කාර්ය මණ්ඩලය (ක.ස. 3, ක.ස. 2-2, ක.ස. 1-2) | 109 | කළමනාකරණ කාර්ය මණ්ඩලය (ක.ස. 3, ක.ස. 2-2, ක.ස. 1-2) | 77 |
| ප්‍රාථමික මට්ටම (ප්‍රා.ම ) | 70 | ප්‍රාථමික මට්ටම (ප්‍රා.ම ) | 04 |
| **එකතුව** | **211** | **එකතුව** | **130** |

- **පුහුණු වැඩසටහන්**

සේවකයන්ගේ හැකියාවන් හා දැනුම් මට්ටම ඉහළ තලයකට ගෙන එමින් ශක්තීන් වැඩි දියුණු කිරීම සඳහා අධිකාරියේ පුහුණු අංශය මගින් විවිධ විෂයයන් යටතේ පුහුණු වැඩ සටහන් පවත්වන ලදී.

| **පවත්වන ලද පුහුණු වැඩ සටහන් 2018 ජනවාරි - දෙසැම්බර්** | | |
|---|---|---|
| | වැඩ සටහන | සහභාගී වූවන් |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණය (ජ්‍යෙ.ක) | 10 | 40 |
| මධ්‍යම කළමනාකරණය (ම.ක) | 27 | 151 |
| කණිෂ්ඨ කළමනාකරණය (ක.ක) | 24 | 218 |
| කළමනාකරණ කාර්ය මණ්ඩලය | 35 | 447 |
| ප්‍රාථමික මට්ටම (ප්‍රා.ම ) | 4 | 202 |
| **එකතුව** | **100** | **1058** |

## නෛතික බලාත්මක කිරීම

වර්ෂයේ මෙම කාලය තුළ නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් යටතේ නිති අංශය මගින් නඩු 160 ක් සම්බන්ධ කටයුතුවල නිරත වූ අතර වැඩ මූලික අංශා නඩු වාර 32 ක් සඳහා සහභාගි විය. තවද, අළුතින් නඩු 03 පනවා ඇත.

## ජල කළමනාකරණය

ලං.වි.ම, ජල සම්පාදන මණ්ඩලය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා කාලගුණික දෙපාර්තමේන්තුව සමග අවශ්‍යා සම්බන්ධීකරණය කටයුතු කරමින් කෘෂි කර්මාන්තය, ජල විදුලිය හා පානීය මෙන්ම අනෙකුත් ජල අවශ්‍යතා සඳහා මහවැලි ජලාශවල ජල සම්පත් ඵලදායී අයුරින් භාවිත කරන බවට ජල කළමනාකරණ ලේකම් කාර්යාලය සහතික වේ. එමෙන්ම ජල කලමනාකරණ මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිපත්ති තීරණ ගැනීමේදී ජල කළමනාකරණ ලේකම් කාර්යාලය ඒ සඳහා තොරතුරු හා නිර්දේශ ලබා දේ.

**මහවැලි ජලාශවල ජලය ගබඩා කර තැබීමේ ධාරිතාව**

| ජලාශ | සජීව ධාරිතාවය ( ස.මී.මි) (2018.12.31) | ක්‍රියාකාරී ධාරිතාවය ( ස.මී.මි ) (2018.12.31) |
|---|---|---|
| කොත්මලේ | 143.5 | 121.3 |
| වික්ටෝරියා | 593.8 | 559.8 |
| රන්දෙනිගල | 770.1 | 376.7 |
| රන්ටැඹේ | 5.2 | 0.8 |
| බෝවතැන්න | 17.2 | 14.9 |
| උඩ වලව | 266.2 | 237.9 |
| මොරගහකන්ද | 556.3 | 503.7 |
| දඹුලු ඔය | 10.8 | 5.4 |
| කන්ඩලම | 31.4 | 27.6 |
| කණ්ඩලම | 116.9 | 101.9 |
| උල්හිටිය/රත්කිඳ | 124.6 | 61.2 |
| මාදුරුඔය | 521.3 | 402.3 |
| **එකතුව** | **3,157.3** | **2,413.5** |

## අභ්‍යන්තර විගනණය

අධිකාරියේ කාර්යයන් සමබන්ධයෙන් කාර්යක්ෂමතාව තහවුරු කරනු වස් අභ්‍යන්තර විගනණ අංශය මගින් මෙම වර්ෂය තුළදී විගනණ වාර්තා 17 ක් හා විගනණ විමසුම් වාර්තා 17 ක් නිකුත් කර ඇත.

## මහවැලි ජලාශවල බල ශක්ති උත්පාදන ධාරිතාව

| ජලාශය | මුළු ජල ධාරිතාව (MCM) | මුළු බල ශක්ති ධාරිතාව (MW) | බල ශක්ති උත්පාදනය 2017 GWh | බල ශක්ති උත්පාදනය ජන.- ජුනි 2018 GWh |
|---|---|---|---|---|
| කොත්මලේ | 174 | 201 (67 x 3) | 230.44 | 208.79 |
| වික්ටෝරියා | 722 | 210 (70x3) | 193.59 | 250.48 |
| රන්දෙනිගල | 860 | 126 (63x2) | 53.53 | 118.36 |
| රන්ටැඹේ | 7.001 | 49 (24.5x2) | 38.37 | 66.26 |

| ජලාශය | මුළු ජල ධාරිතාව (MCM) | මුළු බල ශක්ති ධාරිතාව (MW) | බල ශක්ති උත්පාදනය 2017 GWh | බල ශක්ති උත්පාදනය ජන.- ජුනි 2018 GWh |
|---|---|---|---|---|
| උල්හිටිය/රත්කිඳ | 146 | - | - | - |
| මාදුරුඔය | 596 | - | - | - |
| බෝවතැන්න | 23.5 | 40 (40x1) | 47.21 | 23.13 |
| උඩවලව | 268.65 | 6 (LB- 2x2+RB-2x1) | 1.25 | 8.98 |
| උකුවෙල | - | 40 (20x2) | 99.36 | 84.44 |
| පොල්ගොල්ල | 4.112 | - | | |
| මොරගහකන්ද | 570 | 25 | - | 28.57 |
| **එකතුව** | **3,371** | **697** | **664** | **789** |



# වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

**"ශ්‍රී ලාංකීක ප්‍රජාවගේ අභිවෘද්ධිය තහවුරු කරනු වස් වන සම්පත් සංරක්ෂණය සහ සංවර්ධනය කිරීම"**

ජාතියේ සෞභාග්‍ය සහතික කිරීම සඳහා ශ්‍රී ලංකාවේ වන සම්පත් සංරක්ෂණය කොට සංවර්ධනය කිරීම, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මෙහෙවර වේ. මෙම මෙහෙවර සහතික කිරීම උදෙසා විවිධ ක්‍රියාකාරකම් 2018 වර්ෂ තුළදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. එම වර්ෂ තුළ ක්‍රියාත්මක කරන ලද වැඩ කටයුතු සමාජ සහ පාරිසරික ප්‍රතිලාභ තිරසරව ලබා ගැනීම සහතික කිරීම සඳහා උපරිම වන ආවරණයක් සංරක්ෂණය කිරීම උදෙසා විශාල වශයෙන් දායක විය.

**සමාජ වන විද්‍යා සහ වන ව්‍යාප්ති කටයුතු**

- **බීජ පැළ නිපදවීම**

2018 වන ව්‍යාප්ති කටයුතු සඳහා වසරේ නිපදවන ලද සම්පූර්ණ බීජ පැල සංඛ්‍යාව 558,850 කි. නිදපවන ලද සම්පූර්ණ බීජ පැල සංඛ්‍යාවෙන් බීජ පැල 124,686 ක් අලෙවි කරන ලද අතර 283,382 ක් රුක් රෝපණ වැඩ සටහන් සඳහා අනෙකුත් රාජ්‍ය සහ වෙනත් ආයතනවලට නොමිලයේ ලබාදෙන ලදි. ඉතිරිය "වනරෝපා" ජාතික රුක් රෝපණ වැඩ සටහන සහ ගෙවතු සංවර්ධන වැඩසටහන් වැනි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩ සටහන් සඳහා යොදා ගන්නා ලදී.

- **දැනුවත් කිරීමේ සහ වන ව්‍යාප්ති වැඩ සටහන් ( 2018.01.01 සිට 2018.12.31 දක්වා )**

| වැඩසටහන | සංඛ්‍යාව |
|---|---|
| දැනුවත් කිරීමේ වැඩ සටහන් | 1322 |
| රුක් රෝපණ වැඩ සටහන් | 786 |
| තරග සහ වෙනත් වැඩසටහන් | 247 |
| එකතුව | 2355 |

- **සහභාගිත්ව රුක් රෝපණ වැඩ සටහන්**

"වන රෝපා" ජාතික රුක් රෝපණ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී තිබෙන ප්‍රධාන ආයතන අතුරින් එක් ආයතනයක් වන්නේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවයි. 2018 වසරේදී හෙක්. 1956.9 භූමි ප්‍රමාණයක් පැල සිටුවීමේ කටයුතුවලට යොදා ගත් අතර ඒ සඳහා පැල 2,153,479 බෙදා හරින ලදී.

**2018 වසරේදී රුක් රෝපණ වැඩසටහන්**

| ක්‍රියාකාරකම් | සංඛ්‍යාව |
|---|---|
| මාර්ග දෙපස රුක් රෝපණය කිරීම | 26 |
| ජලාධාරවල සහ ගං ඉවුරුවල රුක් රෝපණය කිරීම | 53 |
| පාසැල්වල රුක් රෝපණය කිරීම | 203 |
| අනෙකුත් රජයේ ආයතන භූමිවල රුක් රෝපණය කිරීම | 75 |
| ආගමික සිද්ධස්ථාන භූමිවල රුක් රෝපණ කිරීම | 41 |
| වෙනත් රුක් රෝපණ වැඩ සටහන් | 388 |
| එකතුව | 786 |

- **නව ගොවි වන වගා ස්ථාපනය කිරීම**

2018 වසර තුල දී ගොවි වන වගා හෙක්ටයාර් 101.2 ක් ස්ථාපනය කරන ලදී. සහභාගි වූ ගොවින් සංඛ්‍යාව 170 කි. 2016 සහ 2017 වර්ෂයන් තුළ ස්ථාපනය කරන ලද ගොවි වන වගා හෙක්ටයාර් 241 ක් විද්‍යාත්මකව කළමනාකරණය කරන ලදී.

- **ගෙවතු සංවර්ධනය කිරීම**

2018 වසරේදී ගෙවතු 6087 ක් සඳහා බිජ පැල සපයා දීමෙන් සහ තාක්ෂණික සහය ලබා දීමෙන් සංවර්ධනය කරන ලදි. ශාක කළමනාකරණය කිරීමේ වැඩසටහන් 106 ක් ක්‍රියාත්මක කරන ලදී.

## වනවිද්‍යා හා වන කළමනාකරණ කටයුතු

- **වනාන්තරවල ගුණාත්මක බව වැඩි දියුණු කිරීම**

ශ්‍රී ලංකාවේ වන ආවරණය භූමි ප්‍රමාණයෙන් 29.7 % සිට 32% දක්වා ඉහළ නැංවීම සඳහා වනාන්තරවල ගුණාත්මක බව වැඩිකිරීමේ වැඩ සටහනක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2014 වසරේ දී ආරම්භ කරන ලදී. මෙම වැඩසටහන යටතේ වන ආවරණය ඉහල නැංවීම සඳහා ප්‍රධාන උපාය මාර්ග තුනක් හඳුනාගෙන තිබේ. ඒවානම්, දැනට තිබෙන වනාන්තර ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම, නව ප්‍රදේශවලට වනාන්තර ව්‍යාප්ත කිරීම සහ පුද්ගලික ඉඩම්වල තුරු ආවරණය ඉහල නැංවීමයි. ඉහත උපාය මාර්ග යටතේ 2018 වර්ෂයේදී පාරිසරික ප්‍රතිස්ථාපනය, නැවත වනවගා කිරීමේ වැඩ සටහන හා නැවත වන වගා කරන ලද බිම් නඩත්තු කිරීම යන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ නැවත වන වගා පෙර වසර වල (2014, 2015, 2016) ප්‍රතිස්ථාපනය කරන ලද හෙක්. 7583 ක්ද, මිශ්‍ර දේශීය විශේෂ යොදා නැවත රුක් රෝපණය කරන ලද වගා හෙක්. 420 ක නඩත්තු සිදු කරන ලදී.

- **නැවත වන වගා කරන ලද බිම් නඩත්තු කිරීම**

මෙම දෙවසර තුල දී 2015 ,2016 සහ 2017 යන වසර වල දී ප්‍රතිස්ථාපනය කරන ලද ප්‍රදේශ නඩත්තු කරන ලදී. මේ යටතේ ප්‍රතිස්ථාපනය කරන ලද හෙක්ටයාර 7583 ක් 2018 වසරේදී නඩත්තු කරන ලදී.

**නැවත වනවගා කිරීමේ වැඩ සටහන**

මේ යටතේ 2018 වර්ෂය තුළ මෙම අංශය විසින් පූර්ණ හෙලීම් සිදුකල වන වගා වල වන වගා හෙක්ටයාර් 951.7 ක් ස්ථාපනය කරන ලදී.

**නැවත වන වගාකිරීමේ වැඩ සටහන - 2018**

| දිස්ත්‍රික්කය | පැරණි විශේෂය | අළුතින් ස්ථාපනය කරන ලද විශේෂය | ප්‍රගතිය (හෙක්ටයාර්) |
|---|---|---|---|
| අම්පාර | තේක්ක/කායා | තේක්ක/කායා | 142 |
| අනුරාධපුර | තේක්ක | තේක්ක/කායා | 109.5 |
| පොළොන්නරුව | තේක්ක | හල්මිල්ල | 62 |
| මඩකලපුව | තේක්ක | කායා | 150 |
| මුලතිව් | තේක්ක | තේක්ක | 50 |
| වවුනියාව | තේක්ක | තේක්ක | 35 |
| මාතලේ | තේක්ක | තේක්ක | 33 |
| මොණරාගල | තේක්ක | තේක්ක | 52.4 |
| බදුල්ල | පයිනස්/ඉයුකැලිප්ටස් | ඉයුකැලිප්ටස් /කායා | 67.6 |
| නුවරඑළිය | ඉයුකැලිප්ටස්/පයිනස් | ඉයුකැලිප්ටස් | 43.2 |
| කළුතර | පයිනස් /මිශ්‍ර | හොර/ මිශ්‍ර | 37.5 |
| කුරුණෑගල | තේක්ක | තේක්ක | 59.1 |
| ගම්පහ | අකේෂියා | දේශීය විශේෂ | 10 |
| පුත්තලම | තේක්ක/කායා | කුඹුක් | 40 |
| රත්නපුර | කායා/හල්මිල්ල | ඉයුකැලිප්ටස්/ඇකේෂියා | 30 |
| මාතර | පයිනස් | හොර/ මිශ්‍ර | 30.4 |
| එකතුව | | | 951.7 |

- **බීජ පැල නිෂ්පාදනය**

2018 නැවත වන වගා කිරීමේ වැඩසටහන සඳහා බීජපැල 1748639 ක් නිෂ්පාදනය කරන ලදී. මෙහිදී තේක්ක, ඉයුකැලිප්ටස් සහ දේශීය විශේෂ මෙම නැවත වන වගා කිරීමේ වැඩසටහන සඳහා භාවිතා කරන ලදී.

- **නොමේරූ වන වගා නඩත්තු කිරීම**

වන වගා නඩත්තු කිරීමේ වැඩ සටහන යටතේ වල් නෙලීම, පොහොර යෙදීම, කැලෑ ගිනි වැලැක්වීම සහ පාළු පැල සිටුවීම යන ප්‍රධාන ක්‍රියාකාරකම් සිදු කරන ලදී. 2018 වර්ෂයේදී හෙක්ටයාර් 2,349.44 නඩත්තු කටයුතු සිදු කරන ලදී.

- **වන වගාවල වන විද්‍යාත්මක මෙහෙයුම්**

2018 වසර තුල දී දිස්ත්‍රික්ක 08 ක තේක්ක, ඉයුකැලිප්ටස් සහ කායා වන වගා හෙක්. 532.32 පූර්ව වානිජමය තුනී කිරීම් සිදු කරන ලදී. දිස්ත්‍රික්ක 08 ක පිහිටි තේක්ක සහ ඉයුකැලිප්ටස් වන වගා හෙක්. 695.78 ක් තුනී කිරීම් සිදුකරන ලදී. රිකිලි නඩත්තුව හෙක්. 92 ක සිදුකරන ලදී.

- **කඳුමුදුන් සංරක්ෂණය කිරීම**

2015 හා 2017 මධ්‍යම කඳුකරයේ කඳුමුදුන් වනවගා නඩත්තු කිරීම හෙක්ටයාර් 103.9 ක සිදු කරන ලදී.

- **පයිනස් වන වගා පුළුල් පත්‍ර සහිත වනවගා බවට පරිවර්තනය කිරීම**

පයිනස් වනවගා පුළුල් පත්‍ර සහිත වනවගා බවට පරිවර්තනය කිරීම හෙක්ටයාර් 25.3 ක සිදු කරන ලදී.
වනවගා නඩත්තු කිරීම හෙක්ටයාර් 90.9 ක සිදු කරන ලදී.

- **පයිනස් වන වගාවලින් ඔලියෝ රෙසින් නිස්සාරණය කිරීම**

පයිනස් ඔලියොරෙසින් නිස්සාරණය සඳහා තෝරාගත් පෞද්ගලික අංශයේ සමාගම් වලට, පරිණත පයිනස් කැරිබියා වන වගා බදු දීම හා එම කටයුතු අධීක්ෂණය සිදු කරනු ලබයි. පුද්ගලික අංශයේ සමාගම් 05 ක්, සිය වානිජ මට්ටමේ රෙසින නිස්සාරණ කටයුතු වලට අදාල ගිවිසුම් දීර්ඝ කරන ලද අතර එම වන වගා වල රෙසින් නිස්සාරණ කටයුතු 2018 වර්ෂය පුරා සිදු කරන ලදී. බදු දුන් ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 966.64 වන අතර බදු ආදායම රුපියල් 6,008,830.05 කි.

- **වන වගා වලින් ලද අස්වැන්න (2018 වසර සඳහා)**

| | | |
|---|---|---|
| 01. තුනී කිරීම් වලින් ලද අස්වැන්න | - | ඝන මීටර් 123,736 |
| 02. පුනර්ජනන හෙලීම් මගින් ලද අස්වැන්න | - | ඝන මීටර් 190,352 |
| 03. සංවර්ධන ව්‍යාපෘති මගින් ලද අස්වැන්න | - | ඝන මීටර් 51,782 |
| 04. පරිත්‍යාග ලෙස ලැබුණු දැව මගින් ලද අස්වැන්න | - | ඝන මීටර් 37,824 |
| 05. වන අපරාධ යටතේ ලැබුණු දැව | - | ඝන මීටර් 4,515 |

- **2018 වර්ෂයේ දී සංචාරක බංගලාවලින් ලද ආදායම**

සංචාරක බංගලා, සංරක්ෂණ මධ්‍යස්ථාන, නැරඹුම් කුටි සහ කඳවුරු බිම් මහජනයාගේ පරිහරනයට ලබාදීමෙන් රු: 8,828,099.01 ක මුදලක් උපයාගෙන තිබේ. වන සංගණන හා භූගෝල විද්‍යා තොරතුරු පද්ධති අංශයේ කටයුතු.

- **වන සංගණන කටයුතු**

නැවත වන වගා කිරීමේ කටයුතු සඳහා වනවගාවල ගස් සලකුණු කිරීම ඉටු කලයුතු අතර 2018 වසර සඳහා දැව සංස්ථාවට නිදහස් කළ හෙක්ටයාර් 700 ක ගස් සලකුණු කිරීම නිම කරන ලදී.

- **ජාතික වන සංගණනය ( NFI )**

UN-REDD වැඩසටහනේ ආධාර යටතේ ආරම්භ කරන ලද ජාතික වන සංගණනය නියදි ස්ථාන 900 දී සිදු කරන ලදී. එම දත්ත, දත්ත ගබඩා කිරීම සඳහා පවත්වා ගෙන යනු ලබන පරිගණක සර්වරයකට ඇතුළත් කිරීම හා යාවත්කාලීන කිරීම සිදු කරන ලදී.

- **මැණුම් කිරීම සහ මායිම් සලකුණු කිරීම**

මෙම වසර සඳහා මායිම් සලකුණු කිරීමේ ඉලක්කය කිලෝමීටර් 996.83 ක් වූ අතර කිලෝමීටර් 996.83 මායිම් සලකුණු කරන ලද අතර වනාන්තර මායිම් කිලෝමීටර් 35 ක මිනුම් කිරීමට සැලසුම් කර තිබූ අතර කිලෝමීටර් 35 ක මිනුම් කටයුතු නිම කරන ලදී.

- **පරිසර සංරක්ෂණ හා කළමනාකරණ කටයුතු**

සිංහරාජ, නකල්ස් ලෝකඋරුම වනභූමීන්ගේ පවත්වා ගෙන යනු ලබන ස්වභාවික මංපෙත්, නවාතැන් ඇතුළු සියළු පහසුකම් නඩත්තු කරමින් පවත්වා ගෙන යාමට කටයුතු කරන ලදී.

- **සංරක්ෂණ මධ්‍යස්ථාන කළමනාකරණය**

කන්නෙලිය, කොට්ටව, උඩවත්තකැලේ, ඔලියගන්කැලේ හා කුරුළුකැලේ යන සංරක්ෂණ මධ්‍යස්ථානවල හා කන්දෙඇල අධ්‍යාපනික වන උද්‍යානයේ හා හපුතලේ උද්‍යානයේ අවශ්‍ය පහසුකම් නඩත්තු හා වැඩි දියුණු කරමින් පවත්වා ගෙන යාම කරන ලදී.

- **2018 වසර සඳහා ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමෙන් රැස්කරන ලද ආදායම (2018.01.01 සිට 2018.12.31 දක්වා)**

| | අමුත්තන් සංඛ්‍යාව | ප්‍රවේශ ගාස්තු ලෙස රැස්කල ආදායම (රුපියල්) |
|---|---|---|
| උඩවත්ත කැලේ මහනුවර) | 34,126 | 7,683,258.85 |
| නකල්ස් වනාන්තරය (ඩීන්ස්ටන්) | 5,399 | 1,115,765.00 |
| නකල්ස් වනාන්තරය (පිටවලපතන), | 58,706 | 1,716,185.17 |
| සිංහරාජ වනාන්තරය (පිටදෙනිය) | 23,859 | 3,730,889.49 |
| සිංහරාජ වනාන්තරය (කුඩව) | 33,839 | 5,349,397.00 |
| හුරුළු පාරිසරික උද්‍යානය ( හබරණ) | 57,292 | 48,581,204.31 |
| කොට්ටව වනාන්තරය (ගාල්ල) | 2,172 | 257,550.00 |
| කන්නෙලිය වනාන්තරය (ගාල්ල ) | 64,779 | 2,680,819.50 |
| මාකන්දාව වනාන්තරය (කෑගල්ල ) | 3,559 | 791,779.35 |
| එකතුව | | 71,906,848.67 |

ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමෙන් ලැබූ මුළු ආදායම රුපියල් 71,906,848.67 කි.

- **වනාන්තර තුල රූගත කිරීම් වලින් ලද ආදායම**

දෙපාර්තමේන්තුව මගින් කළමනාකරණය කරනු ලබන රක්ෂිත වනාන්තර තුල වීඩියෝ රූගත කිරීම් මගින් 2018 වසර සඳහා රු. 662,250.00 ක ආදායම් උපයා තිබේ.

- 2018 අප්‍රේල් මාසයේදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නව නිල වෙබ් අඩවිය එළිදක්වන ලදී. 2018 "Best Web" තරඟාවලියේදී මෙම වෙබ් අඩවිය සඳහා කුසලතා සම්මානයක් ද හිමිවිය.http://www.forestdept.gov.lk/index.php/en/

- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් පාරිසරික සංචාරක නැවතුම්පොල සහ කඳවුරු භූමි අන්තර්ජාලය ඔස්සේ වෙන්කිරීම සඳහා e-සේවාවක් ආරම්භ කරනලදී.http://eservices.forestdept.gov.lk/dof/#/view-main/view-home-page

- 2018 මාර්තු 21 වන දිනට යෙදුණු අන්තර්ජාතික වනාන්තර දිනය සමරමින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සිය තේමා ගීතය රූප රචනා ද සමඟින් එළිදක්වන ලදි.https://www.youtube.com/watch?v=5PH0QI0EQX0

- **2018 වර්ෂය තුළ මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු ස්කන්ධ භාගය**

2018 වසර තුල දී රජයේ වන වගාවලින් ලබාගත් දැව අලෙවි වටිනාකම අනුව හා වන අපරාධවලින් අත්පත් කරගත් දැව සඳහා රාජ්‍ය දැව සංස්ථාව විසින් ගෙවිය යුතු සම්පූර්ණ ස්කන්ධ භාගය රුපියල් 1,033,853,193.16 කි.

## පර්යේෂණ, අධ්‍යාපන සහ සංවර්ධන කටයුතු

1 දේශගුණික විපර්යාස වලට අනුවර්තනය වීම සඳහා තේක්ක වන වගා ස්ථාපනය කිරීමේදී යොදාගත හැකි යෝග්‍ය ක්‍රම පිළිබඳව අධ්‍යයනය කිරීම.
2 තේක්ක වන වගා ස්ථාපනය කිරීමේදී වන විද්‍යාත්මක ප්‍රතිකර්ම තුළින් සාර්ථක ලෙස වල් පැලෑටි පාලනය කිරීමේ ක්‍රම පිළිබඳව අධ්‍යයනය කිරීම.
3 වනාන්තර ප්‍රතිස්ථාපනය සඳහා සුදුසු ශාක විශේෂ මිශ්‍රන අධ්‍යයනය කිරීම.
4 දැව නිෂ්පාදනය සඳහා තෝරාගත් දේශීය ශාක විශේෂ වැඩිදියුණු කිරීම සඳහා වන විද්‍යාත්මක ප්‍රතිකර්ම යොදා ගැනීම.
5 කඩොලාන පසේ තිබෙන කාබන් ප්‍රමාණය ඇස්තමේන්තු කිරීමේ අධ්‍යයනය
6 තේක්ක හා කුඹුක් බද්ධ කිරීම

- **පර්යේෂණ නඩත්තු කිරීම**

1 මෙම වසර තුළදී දිස්ත්‍රික්ක 09 ක ක්ෂේත්‍ර පරීක්ෂණ හතලිස් දෙකක් දිසා වන නිලධාරී කාර්ය මණ්ඩලය හා පර්යේෂණ කාර්ය මණ්ඩලය විසින් නඩත්තු කරන ලදි
2 කුරුණෑගල වන විද්‍යා පර්යේෂණ මධ්‍යස්ථානය විසින් හෙක්. 40 ක් පුරාවට ව්‍යාප්තව පවත්නා බීජ උද්‍යාන කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ (තේක්ක සහ කායා) නඩත්තු කරන ලදි. මෙම උද්‍යාන වලින් මෙම වසර තුළදී තේක්ක බීජ කිලෝග්‍රෑම් 500 ක් පමණ රැස්කරන ලදී
Eucalyptu grandis බීජ කිලෝ ග්‍රෑම් 7.2 ක් රැස්කරන ලදී.

- **වන විද්‍යා අධ්‍යාපනය**

01. වන විද්‍යා ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව (NVA මට්ටම) යටතේ අඩවි වන නිලධාරීන් 47 දෙනෙකු පුහුණු කරන ලදී
02 වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරී/නිලධාරිණියන් සඳහා කෙටි කාලීන පුහුණු වැඩසටහන් 13 ක් පවත්වන ලදී
03. අනෙකුත් ආයතන සඳහා එක් පුහුණු වැඩසටහනක් පවත්වන ලදී

## වන ආරක්ෂණ සහ නීති ක්‍රියාත්මක කිරීමේ කටයුතු

ආරක්ෂණය සහ සම්බන්ධ ප්‍රධාන කාර්ය භාරයන් දිසාවන් **23** ට අනුබද්ධව සේවය කරන ප්‍රාදේශීය කාර්ය මණ්ඩලය විසින් ඉටු කරයි. **2018** වසර තුළදී මෙම දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය විසින් වන අපරාධ **3,757** ක් නීතියට හසුකරගෙන තිබේ.

2018 වසර තුළ එම කාර්යයන් යටතේ අති විශේෂ ගැසට් 06 ක් නිකුත් කරන ලද අතර, සංරක්ෂිත වනාන්තර 01 ක්, රක්ෂිත වනාන්තර 09 ක් ප්‍රකාශයට පත් කරන ලදී.

- **පුද්ගලික දැව ව්‍යාපාර**

2018 වසර තුලදී දැව ඉරුම් හල් 364 ක්, දැව අලෙවිසැල් 550 ක්, වඩු මඩු 724 ක්, ගෘහ භාණ්ඩ වෙළඳසැල් 627 ක් සහ දර විකුණුම්හල් 51 ක් ද, දැව පදම් කිරීම් හා සැකසුම් කර්මාන්තශාලා 17 ක් හා ජංගම දැව ඉරුම්හල් 417 ක් අළුතින් ලියාපදිංචි කරන ලදී.

2018 වසර අවසාන වනවිට ලියාපදිංචි දැව ව්‍යාපාර සංඛ්‍යාව 28,731 ක් ලෙස වාර්තා වී තිබුණි

## වනාන්තර නොවන ප්‍රභව වලින් ලබා ගන්නා නිෂ්පාදන අපනයනය කිරීම

වනාන්තර නොවන ප්‍රභව වලින් ලබා ගන්නා නිෂ්පාදන අපනයනය කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදි. සීඝ්‍රගාමී තුලින් රු 1,755,187.50 ක මුදලක්ද, සාමාන්‍ය සේවාවන් තුලින් රු. 168,906.25 ක මුදලක්ද, ශාක/ශාකමය ද්‍රව්‍ය සහ බීජ අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීමෙන් අදාල වර්ෂය තුලදී උපයා ගෙන තිබේ. තවද ගෘහ භාණ්ඩ, අත්කම් භාණ්ඩ, සෙල්ලම්බඩු සහ අගය එකතු කරන ලද දැවමය නිෂ්පාදන අපනයනය සඳහා ශීඝ්‍රගාමී සේවාව මගින් බලපත්‍ර නිකුත් කිරීමෙන් රු 2,273,062.50 ක්ද, සාමාන්‍ය සේවාව මගින් බලපත්‍ර නිකුත් කිරිමෙන් රු 762,593.75 ක්ද උපයාගෙන තිබේ. තවද ඉහත සඳහන් කරන ලද නිෂ්පාදන සඳහා එක්දින සේවාවක් යටතේ බලපත්‍ර නිකුත් කිරීමෙන් රු. 1,790,032.50 ක්ද උපයාගෙන තිබේ. මෙලෙස ඉහත දැක්වූ සියළුම සේවාවන් මගින් රු. 6,749,782.50 ක සම්පූර්ණ ආදායමක් උපයා තිබේ.

## සැලසුම් හා ප්‍රගති පාලන කටයුතු

- **ගොඩනැගිලි ඉදිකිරීම**

ඒකාබද්ධ අරමුදලේ, මුදල් උපයෝගී කර ගනිමින් මීරිගම අඩවි වන කාර්යාලය, කිලිනොච්චිය අඩවි වන නිලධාරී නිල නිවස ඉදි කිරීම් කටයුතු සිදු කරන ලදී.

- **ගොඩනැගිලි නඩත්තු කිරීම**

මෙම වසර තුලදී ගොඩනැගිලි නඩත්තු කිරීමේ වැඩසටහන් යටතේ ගොඩනැගිලි 120 වල නඩත්තු කටයුතු සිදු කරන ලදී.



# වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව

ආර්ථික සම්පත් බහුල ශ්‍රී ලංකාවේ වෙරළබඩ සම්පත් මත පදනම් වූ ආරක්ෂිත, තිරසාර සංවර්ධනයකට ඉඩ ප්‍රස්ථා සැලසීමේ සහ ප්‍රවර්ධනය කිරීම හා වෙරළ තීරය සංරක්ෂණ කිරීම අරමුණු ඇතිව, 1984 ජනවාරි 1. දින සිට "ඒ ශ්‍රේණියේ " දෙපාර්තමේන්තුවක් වශයෙන් වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී. 2009 ජුනි මස දෙපාර්තමේන්තුව සඳහා අධ්‍යක්ෂ ජෙනරාල්වරයකු පත් කිරීමත් දෙපාර්තමේන්තු නාමය වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව වශයෙන් වෙනස් කිරීමත් 2011 අංක 49 සංශෝධිත පණත මඟින් බලාත්මක කරන ලදී.

**වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විශේෂිත වූ අරමුණු**

- වෙරළබඩ පරිසරයේ තත්ත්වය වැඩි දියුණු කිරීම
- වෙරළ තීරය සංවර්ධනය කිරීම සහ කළමනාකරණය කිරීම
- වෙරළබඩ යටිතල පහසුකම් ආරක්ෂණය කිරීමහා වෙරළ බඩ ප්‍රජාවට සිදුවිය හැකි ආපදා අවම කිරීම
- වෙරළබඩ ප්‍රජාවගේ සහ සම්පත් භාවිතා කරන්නන්ගේ ජීවන තත්වය උසස් කිරීම
- වෙරළ සම්පත් මත පදනම් වූ ආර්ථික සංවර්ධනය පහසු කර වීම සහ ප්‍රවර්ධනය කිරීම

**ප්‍රධාන අභියෝග**

- පාරිසරික බලපෑම් හේතුවෙන් සිදුවන වෙරළ ඛාදන තත්ත්වයන් සඳහා අප්‍රමාදව විසඳුම් ක්‍රියාත්මක කිරීම
- සංවර්ධන කාර්යන්හා කාලගුණික වෙනස්වීම් හේතුවෙන් සිදුවන පාරිසරික බලපෑම්
- සමාජීය සාධක හේතුවෙන් වෙරළ කලාපයේ සිදු කරන අනවසර සංවර්ධන කාර්යන් සඳහා අප්‍රමාදව ක්‍රියාකිරීම

## ඉටුකරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම්

## වෙරළ තීර කළමනාකරණය*(2018 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා)*

**වෙරළ ආරක්ෂණ ව්‍යුහ ඉදිකිරීම**

ශ්‍රී ලංකාව, ඉන්දියන් සාගරයේ දූපතක් වීම එහි ප්‍රධාන වශයෙන් දූපත්මය නිමේශනයට බලපානු ඇත. මෙයට අමතරව වෙරළ කලාපය තුල සිදුකරන සංවර්ධන කාර්යයන් හේතුවෙන් වෙරළ ඛාදන සීඝ්‍රතාවය වැඩිවන ප්‍රවනතාවයක් ඇත.වසර 30ක අධික කාලයක් තුල කෙටිකාලීනව හා දීර්ඝ කාලීනව සිදුවන වෙනස්වීම් හේතුවෙන් සිදුවන වෙරළ ඛාදනය හා වෙරළ තීරයේ ස්ථායිතාවය නැවත ස්ථාපනය සඳහා ප්‍රධාන වශයෙන් උත්සාහයන් දරා ඇත.

භාවිතයට ගතහැකි කළු ගල් යොදා ඇඩ වෙරළාරක්ෂක ව්‍යුහ ඉදිකිරීම් එක් විකල්ප විසඳුමක් ලෙස සැලකේ. මෙම වෙරළාරක්ෂක විසඳුම් සමඟ යාබද වෙරළ තීරයන් ඇව්දින මංතීරු ,වෙරළ උද්‍යාන වශයෙන් සංවර්ධනය කරනු ලැබේ.කෙසේ වුවත් මේ වන විට වැලි පෝෂණය කිරීම සහ වෙනත් මෘදු විසඳුම් සුදුසු ස්ථාන සඳහා හඳුනා දෙනු ලැබේ.



- **දියකඩන**




කප්පල්අඩි ප්‍රදේශයේ ඉදිවූ මීටර් 50 දියකඩනය



මන්ඩතිව් ප්‍රදේශයේ මීටර් 80 ක් දිග “T” හැඩයේ දියකඩනය

දියකඩනයන්

- යාපනය මන්ඩතිව් - මීටර 80T හැඩයේ දියකඩනය
- දුවවත්ත - මාරවිල හා කොලින් ජාඩිය ප්‍රදේශවල- මීටර් 80 දියකඩන 3ක්
- කප්පල්අඩි - මීටර් 50ක් දිග දියකඩනයක් ඉදිකිරීම අවසන් කර ඇත.

මාරවිල ප්‍රදේශයේ මීටර 80ක් වූ දියකඩනය ඉදිවෙමින් පවතී

2018 වර්ෂයේදි දියකඩන ඉදිකිරීම සඳහා වැයවූ මුළු මුදල *රු.84,211,807.70*

- **පැති බැමි**



ගාල්ල තොටගමුව මීටර 150ක්වූ පැති බැම්ම

- දුන්ගල්පිටිය ප්‍රදේශයේ මීටර්60ක්
- ගාල්ල තොටගමුව මීටර 150ක්
- මාතර පරමුල්ල මීටර 35ක්
- තංගල්ල පල්ලිකුඩා ප්‍රදේශයේ මීටර් 50ක් වූ පැති බැමි ඉදිකිරීම අවසන් කර ඇත.
- මැඩිල්ල මීටර් 230 හා
- ගාල්ල, උණවටුන දල වැල්ල මීටර 120ක් පැති බැමි ඉදිවෙමින් පවති.

ඉදිකිරීම් අවසන් කරන ලද වෙරළ තීරයේ දිග මීටර් 600 ක් වේ.
2018 වර්ෂයේදි පැති බැමි ඉදිකිරීම සඳහා වැයවූ මුළු වියදම -රු.54,497,897.03

- **පනා බැම් පද්ධති**



බරුදැල්පොල ඉදිකල පනා බැම් පද්ධතිය

- බේරුවල - ග්‍රොයින 2
- බරුදැල්පොල - ග්‍රොයින 8
- කුඩාමාදුවැල්ල- ග්‍රොයින 6
- නොරෝච්චෝලේ ඉලන්තඩිය - ග්‍රෙයින 8
- මුතු පංතිය - ග්‍රොයින10
- උඩප්පුව - ග්‍රොයින2 ප්‍රදේශවල පනා බැම් පද්ධති ඉදිකිරිම අවසන් කර ඇත.



මුතුපංතිය ප්‍රදේශයේ වෙරළ ඛාදනය

උස්වැටකෙයියාව දුන්ගල්පිටිය පනා බැම් 3ක් ඉදිකිරිම් සිදුවෙමින් පවති.

මුළු ආයෝජනය - රු.103,797,647.39

- **හදිසි වෙරළ ආරක්ෂක ව්‍යුහ**

වෙරළ ඛාදන ප්‍රවනතාවය ඉහල යෑම සඳහා ජනාවාස වැඩිවීමේ ප්‍රවනතාවය හා සංවර්ධන කාර්යයන් ඉහල යෑම බලපාන අතර හදිසි කාලගුණික තත්ත්ව වෙනස්වීම් මත ඇතිවන වෙරළ ඛාදනයන් උච්චවූ ප්‍රදේශවල හදිසි වෙරළ ආරක්ෂණයන් සිදු කරනු ලැබේ.



*වෙරළ තීරය - ඉලන්තඩිය*

බේරුවල මොරගල්ල ශේබියන් බැම්ම, තල්දිය වත්ත ,කළුතර නාවික හමුදා කඳවුර අසල ,ආබෲ පාර හා කැලිඩෝ වෙරල තීරය, මුතුපංතිය, දොඩන්දූව, කරුකපනේ, කටුනේරිය, කොස්ගොඩ, තලල්ල ,තොඩුවාව, අඹකඳවිල,කුට්ටිදූව, උස්වැටකෙයියාව සහ දුන්ගල්පිටිය ප්‍රදේශවල හදිසි වෙරළ ආරක්ෂණ ව්‍යුහ ඉදිකර අවසන් කර ඇත.

මුළු ආයෝජනය රු.49,073,159.67





හදිසි වෙරළ ආරක්ෂණ පිළියම් යෙදීම. - මුතුපංතිය



වෙරළතීරය - පටුවත, දොඩන්දුව

- **වෙරළ ආරක්ෂක ව්‍යුහ හා ගොඩනැගිලි නඩත්තු කිරිම**

දැනට පවතින වෙරළ ආරක්ෂක ව්‍යුහ වල තත්ත්වය හා ක්‍රියාකාරිත්වය අධික්ෂණය කිරිමෙන් පසුව අවශ්‍යතාවය අනුව එම ව්‍යුහයන් වැඩි දියුණු කිරිම හා නඩත්තු කිරිම සිදු කරනු ලැබේ.



- මුදුකටුව ප්‍රදේශයේ මීටර් 400ක් වු පැති බැම්ම, මහමෝදර ප්‍රදේශයේ ග්‍රෙයිනය අළුත් වැඩියා කිරිම හා අවට අලංකරනය හා
- මාතර හා මඩකලපුව ප්‍රාදේශිය ඉංජිනේරු කාර්යල අළුත්වැඩියා කිරිම අවසන් කර ඇත.

මුළු ආයෝජනය රු. 5,757,845.83

*මීටර 400ක් වු පැති බැම්ම - මුදු කටුව*

- **වෙරළ ආරක්ෂා කිරිමේ මෘදු විසඳුමක් ලෙස වැලි පෝෂණ කිරිම**

වෙරළ ඉංජිනේරුමය විද්‍යාව අනුව ගැඹුරු මුහුදේ වැලි යොදා ගනිමින් වෙරළ පෝෂණය කිරිම වෙරළ ඛාදනය සඳහා වන වඩාත්ම සුදුසු පරිසර හිතකාමී විසඳුම ලෙස සැලකේ. 2018 වර්ෂයේ ජාතික අයවැය වෙන් කිරිම යටතේ වෙරළ පෝෂණය කිරිම සඳහා අයවැය යෝජනා අංක 42 සහ 43හි කොටසක් මඟින් රුපියල් මිලියන 800 ක මුල්‍යමය ප්‍රතිපාදන වෙන්කරන ලදී.





ප්‍රථමයෙන් රත්මලාන සිට ගල්කිස්ස දක්වා කිලෝ මීටර 6ක් වූ වෙරළ තීරය හඳුනාගන්නා ලදි. එහෙත් බඩා වී ඇති කළු ගං මෝය වැලි වැටිය ඉතා ඉක්මනින් නැවත ප්‍රතිශ්ඨාපනය කිරීම් අවශ්‍යතාවය මත මෙම ව්‍යාපෘතිය කඩිනම් කිරීම සඳහා ශ්‍රී ලංකාව තුල වැලි පෝෂණය සිදු කරන කොන්ත්‍රාත්කරුවන් ගෙන් පමණක් ලංසු කැඳවීම අරමුණු කරගනිමින් ඉදිරිපත් කල සංශෝධිත වැඩසටහන සඳහා කැබිනට් මණ්ඩල තීරණය 2018 ඔක්තෝම්බර් මස18 දින අනුමත කරන ලදි. ඒ අනුව 2018 වර්ෂයේ දෙසැම්බර් මස සිට ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත.

- **වෙරළ ඉංජිනේරු විමර්ශන**

මෙම වැඩසටහනෙහි ප්‍රධාන අරමුණ වනුයේ වෙරළෙහි ඉංජිනේරුමය ගැටළු සඳහා විසඳුම් වශයෙන් වෙරළ ඉංජිනේරුමය ව්‍යාපෘතීන් සඳහා අධ්‍යයන හා විමර්ශන , වෙරළ ස්ථායිකරණ ව්‍යාපෘති සඳහා නිර්මාණ සැකසීම , මුහුදු ජලයේ හා මුහුදට එකතු වන ජල තලයන්හි පාරිසරික වශයෙන් සිදුවන අපවිත්‍ර කිරීම් පාලනය කිරීම සඳහා ජලයේ ගුණාත්මකභාවය අධීක්ෂණය වෙරළදත්ත හා අන්තර්ජාලය යාවත්කාලීන කිරීම ආදිය ප්‍රධාන කාර්යන් වේ. තවද වෙරළ හා පාරිසරික ඉංජිනේරුමය ක්ෂේත්‍රවල දැනුම හා අත්දැකීම් යාවත්කාලීන කිරීම වැඩිදියුණු කිරීම හා බෙදා ගැනීම සඳහා සම්මන්ත්‍රණ හා වැඩමුළු පවත්වනු ලැබේ.




- අවසාන කර ඇති වැඩසටහන්

අගාධමිතික සිතියම් ගත කිරීමට ගල්කිස්ස සිට හම්බන්තොට දක්වා වෙරළ තීරයන්හි මුහුදු පතුලේ මැනුම් කටයුතු අවසාන කර ඇත.

බරුදැල්පොල,කුඩාමාදුවැල්ල,උඩප්පුව,ඉලන්තඩිය නොරච්චෝලේ, දුන්ගල්පිටිය, පරමුල්ල, මැඩිල්ල, පල්ලිකුඩා, මරදාන/ බේරුවල, බේරුවල, තොටගමුව, කටුනේරිය, සහ මුදුකටුව දකුණ වෙරළතීරයෙහි සැලසුම් කල ව්‍යාපෘතීන් සඳහා වෙරළ ඉංජිනේරුමය නිර්මාණ

වාර්ෂික ඉංජිනේරුමය වැඩමුළුව හා ගෝලීය පිහිටීමේ ක්‍රියාවලිය (Global Positioning System) සඳහා වූ පුහුණු වැඩසටහන

- ක්‍රියාත්මක වන වැඩසටහන්

අගාධමිතික සිතියම් ගත කිරීමට හම්බන්තොට සිට පානම දක්වා මුහුදු පතුලේ මිනුම් කටයුතු සිදු වෙමින් පවති.
කොග්ගල වෙරළ උද්‍යාන ඉදිකිරීම ආරම්භ කර



මුහුදු ජල තත්ත්ව ඇගයීමේ වැඩසටහන

ඇත.භූමළු යොදා ගනිමින් වෙරළ ආරක්ෂණ කිරිම සඳහා ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ඇත.

නැගෙනහිර හා දකුණු වෙරළ තීරයන්හි අවසාදිත ප්‍රවාහය සඳහා අධ්‍යයන කටයුතු සිදුවෙමින් පවති.

- මුහුදු ජල තත්ත්ව ඇගයීමේ වැඩසටහන

මුහුදු ජල තත්ත්ව ඇගයීමේ වැඩසටහන යටතේ ගල්කිස්ස, නිලාවෙලි, ආරුගම්බේ,පොල්හේන, උණවටුණ, හා හික්කඩුව යන වෙරළ තීරයන් 6හි ක්ෂෙත්‍ර කටයුතු සිදුකර ඇත.
මෙහි තාක්ෂනික ඇගයීම් සිදුවෙමින් පවති.

මුළු ආයෝජනයරු.මි.44,958,839.62

## වෙරළ සම්පත් කළමනාකරණ වැඩසටහන

පරිසරය , පරිසර පද්ධති හායනයට ලක්වීමේ අවදානම අවම කිරීමට හා සංවර්ධන කටයුතු තුලනය කිරිම සඳහා වාර්ෂිකව වෙරළ කළාප කළමනාකරණ වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම වැඩසටහන යටතේ වෙරළ කළාපයේ තිරසාර කළමනාකරණය සඳහා හරිත වෙරළ තීරය ස්ථාපිත කිරිම, වෙරළ පිවිසුම් මාර්ග වැඩසටහන, අනවසර ඉදිකිරිම් ඉවත් කිරිම හා පාලනය කිරිම, පාරසරික බලපෑම් අධ්‍යයනය සහිතව බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය සංරක්ෂණය කලයුතු හා බලපෑමට ලක්වන ප්‍රදේශ හඳුනාගැනීම ආදි වැඩසටහන් සිදුකරනු ලැබේ.

*හරිත වෙරළ තීරය ක්‍රියාත්මක කිරිම*

- පුත්තලම, මන්නාරම, හා හලාවත කලපුවල කඩොලාන ශාක වගා කිරිම.
- කල්මුනේ, සිනිගම හා අහංගම වෙරළ තීරයන්හි සූරිය, කස, පොල් හා මුදිල්ලා වැනි ශාක වගා කරමින් කිලෝමීටර 1.0 පමණ වූ හරිත වෙරළ තීරයක් නිර්මාණය කිරීම.
- අවසන් කරන ලද ව්‍යාපෘතිවල නඩත්තු කිරීම යන ව්‍යාපෘතින් 2018 වසරේදි අවසාන කර ඇත.

මුළු ආයෝජනය රු.3,976,138.80



**හරිත තීරය - කල්මුනේ**



**පැල සිටුවීමේ වැඩසටහන - සිනීගම**

**වෙරළ ප්‍රවෙශ මාර්ග ක්‍රියාත්මක කිරිම**

- හම්බන්තොට, මාතර, ගාල්ල යන දිස්ත්‍රික්කයන්හි වෙරළ ප්‍රවෙශ මාර්ග හඳුනා ගැනීම සඳහා ක්ෂේත්‍ර කටයුතු අවසාන කර දත්ත විශ්ලේෂණය ද අවසන් කර ඇත.

- කොළඹ හා කළුතර දිස්ත්‍රික්කයන්හි වෙරළ ප්‍රවේශ මාර්ග හඳුනා ගැනීම අවසාන කර දත්ත විශ්ලේෂණය කරමින් පවතී.

මුළු ආයෝජනය රු.1,629,138.59

**අනවසර ඉදිකිරීම් කඩා ඉවත්කිරීම් හා වෙරළ පිරිසිදු කිරීම් වැඩසටහන**





**මාතර පරමුල්ල ප්‍රදේශයේ සිදුකල වෙරළ පවිත්‍රතා වැඩසටහන**

- මීගමුව, මිරිස්ස, ඉඳුරුව, හම්බන්තොට සහ බේරුවල ප්‍රදේශවල අනවසරව ඉදිකරන ලද ඉදිකිරීම් 51ක් ඉවත් කර ඇත.
- වෙරළ කලාපය තුල අනවසරව ඉදිකරන ලද ඉදිකිරීම් 162ක් හඳුනා ගෙන නීතිමය පියවර ගෙන ඇත.
- වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන් 25ක් ද හඳුනාගත් වෙරළ තීරයන්හි ක්‍රියාත්මක කර ඇත.

මුළු ආයෝජනය රු.4,221,665.07

**බලපත්‍ර ක්‍රියාවලිය**

- සංවර්ධන ව්‍යාපෘතීන් 19ක් සඳහා මූලික පාරිසරික අධ්‍යනයන්ද, ව්‍යාපෘතීන් 09ක් සඳහා පාරිසරික අධ්‍යනයන්ද අවසන් කිරීමෙන් පසුව ව්‍යාපෘතීන් ආරම්භ කිරීම සඳහා අවසර ලබාදී ඇත.
- පාරිසරික අධ්‍යනයන් අවශ්‍ය නොවන සංවර්ධන ව්‍යාපෘතීන් 1,763ක් ඉදිකිරීම සඳහා අවසර ලබාදී ඇත.
- බලපත්‍ර නිකුත් කිරීම කාර්යක්ෂම කිරීම සඳහා වන ඉ-සේවාව ලබා දී මෘදුකාංගය සකස් කිරීම 2018 වසර අවසන් වන විට 90%ක ප්‍රගතියක් වේ.

මුළු ආයෝජනය රු.9,475,368.14

**විශේෂ කළමනාකරණ ප්‍රදේශ වැඩසටහන**

පානම ප්‍රදේශයේ වැලිකඳු බලපෑමට ලක්වූ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම සඳහා ගැසට් නිවේදනය නිකුත්කර, රෙගුලාසි සකස් කිරීම සිදුවෙමින් පවතී.

මුළු ආයෝජනය රු5,236,086.40

**පාරිසරික අධ්‍යපනික වැඩසටහන**

මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ වෙරළ කලාප කළමනාකරණ සහ එයට අදාල රෙගුලාසි පිළිබඳව පාසල් ළමුන් රාජ්‍ය නිලධාරීන් සහ මහජනතාව වැනි වෙරළ ප්‍රජාව දැනුවත් කිරීම වේ. මෙයට අමතරව වෙරළ කලාප කළමනාකරණය පිළිබඳව අධ්‍යාපනික වැඩසටහන් දිවයින පුරා පාසැල් මට්ටමින් පවත්වනු ලැබේ. වෙරළ ප්‍රජාව දැනුවත් කිරීම මඟින් වෙරළ කලාපයට සිදුවන හානිය අවම කිරීම වෙරළ කලාප කළමනාකරනයේ එක් උපාය මාර්ගයක් වේ.

දෙපාර්තමේන්තුව විසින් වෙරළ කලාපයේ සිදුකරන ව්‍යාපෘතීන් හා වෙනත් පුවත් ඇතුලත් ප්‍රවෘත්ති සඟරාව වන " වෙරළ පාරිසරික පුවත් සඟරාව" පළමු පිටපත 2018 වසරේ ජූනි මස තුලදී ද දෙවන මුද්‍රනය 2018 වසරේ නොවැම්බර් මසදී පළ කරන ලදි.




ප්‍රථම පාරිසරික පුවත් පත



ගාල්ල ප්‍රදේශයේ දැනුවත් කිරීමේ වැඩසටහනක්

- රාජ්‍ය නිලධාරින්, පාසැල් ළමුන් , පොලිස් නිලධාරින් දැනුවත් කිරීමේ වැඩසටහන් - 13
- පරිසර දින වැඩසටහන යටතේ ගම්පහ දිස්ත්‍රික්කයේ පාසැල් ළමුන් සඳහා කථීක තරඟද , අධ්‍යාපනික ප්‍රදර්ශන, චිත්‍ර තරඟ මෙන්ම විදි නාට්‍ය සහ සංස්කෘතික සංදර්ශනද 2018 ජූනි මස 5දින සිට සතියක් තුල පවත්වන ලදි.
- කොරල් සහ කඩොලාන පිළිබඳ වූ ලේඛන ගත විඩියෝ පටය නැවත සංවර්ධනය කිරීම අවසන් කර ඇත.

මුළු ආයෝජනය - රු.. 4,579,891.05

**මිරිස්ස සිට මීගමුව දක්වා ඒකාබද්ධ වෙරළ කලාප වැඩසටහනක් සංවර්ධනය කිරීම**

2018 වර්ෂයේ ජාතික අයවැය වෙන් කිරීම යටතේ මිරිස්ස සිට මීගමුව දක්වා ඒකාබද්ධ වෙරළ කලාප වැඩසටහනක් සංවර්ධනය කිරීම සඳහා අයවැය යෝජනා අංක 40 මඟින් රුපියල් මිලියන 25ක මූල්‍යමය ප්‍රතිපාදන වෙන්කරන ලදි.

මෙම වැඩසටහන යටතේ මිරිස්ස සිට මීගමුව දක්වා වෙරළ කලාපය සංරක්ෂණය කරමින් සංචාරක ව්‍යාපාරය සංවර්ධනය කිරීම සඳහා සුදුසු ප්‍රධාන සැලස්මක් සකස් කිරීම හා කෙටිකාලින වැඩසටහනක් වශයෙන් කොග්ගල වෙරළ තීරයේ වෙරළ උද්‍යානයක් ඉදි කිරීම හඳුනා ගෙන ඇත.

- මිරිස්ස සිට මීගමුව දක්වා වෙරළ කලාපය සංරක්ෂණය කරමින් සංචාරක ව්‍යාපාරය සංවර්ධනය කිරීම සඳහා සුදුසු ප්‍රධාන සැලස්මක් සකස් කිරීම - උපදේශන සේවා ආයතනයක් මඟින් මෙම වෙරළ කලාපය අධ්‍යයන කිරීමෙන් පසු අවසන් අධ්‍යයන වාර්තාවඉදිරිපත් කර ඇත.
- කොග්ගල වෙරළ තීරයේ වෙරළ උද්‍යානය - ඉදි කිරීම් ආරම්භ කර ඇත.

මුළු ආයෝජනය - රු..9,372,266.30











# මධ්‍යම පරිසර අධිකාරිය

ජාතික පාරිසරික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු ලබන මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ප්‍රධාන ආයතනවලින් එකක් ලෙස මධ්‍යම පරිසර අධිකාරිය හඳුන්වා දිය හැක.

මධ්‍යම පරිසර අධිකාරිය, 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත යටතේ 1981 වර්ෂයේදී ස්ථාපනය කරන ලද අතර මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශ මත, 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත 1988 හා 2000 යන වර්ෂවලදී සංශෝධනය කරන ලදී. වර්ෂ 2018 වන විට වසර 37ක සේවාවක් මධ්‍යම පරිසර අධිකාරිය විසින් සම්පූර්ණ කර ඇත.

මෙම වාර්තාවෙන් පළාත් කාර්යාල 9ක, දිස්ත්‍රික් කාර්යාල 14 ක, විශේෂ ව්‍යාපෘතිවල ක්‍රියාකාරකම් ද ඇතුලත්ව මධ්‍යම පරිසර අධිකාරියේ 2018 වසරේ කාර්ය සාධනය ඉදිරිපත් කරනු ලබයි.

**අරමුණු**

- ජාතික පාරිසරික පනත යටතේ පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම තුළින් අපද්‍රව්‍ය විසර්ජනය, විමෝචනය හා තැන්පත් කිරීම තුළින් ඇතිවන පාරිසරික බලපෑම සහ පරිසරයට අනතුරුදායක මෙන්ම අනතුරු දායක වීමට ඉඩ ඇති දූෂණ ප්‍රභයන් මඟින් ඇති වන පාරිසරික බලපෑම නියාමනය, නඩත්තු කිරීම සහ පාලනය කිරීම
- පාරිසරික බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය උපයෝගී කරගෙන, පාරිසරික අනුමිතීන් ක්‍රමවත්ව ඇගයීම මඟින් පරිසර හිතකාමී සංවර්ධනයක් තහවුරු කරමින් රටේ ස්වභාවික සම්පත් පද්ධතිය ආරක්ෂා කිරීම
- පරිසරය ආරක්ෂා කිරීමෙහිලා මහජන සහයෝගය සහ සහභාගීත්වය, විශේෂයෙන් පාසල් ළමුන්ගේ සහයෝගය ලබාගැනීම අරමුණු කොට දේශීය, ජාතික මෙන්ම ගෝලීය පරිසර ගැටළු පිළිබඳ මහජනයා දැනුවත් කිරීම
- පුළුල් සේවාදායක අවශ්‍යතා සලසමින් පරිසරය ආශ්‍රිත තොරතුරු සහ දත්ත සපයන ප්‍රධාන මධ්‍යස්ථානයක් සේ ක්‍රියා කිරීම

**මූල්‍ය සහ භෞතික ප්‍රගතියේ සාරාංශ**

**ප්‍රාග්ධන සහ පුනරාවර්තන ඇස්තමේන්තුවේ ප්‍රගතිය**

| අයවැය | ඇස්තමේන්තු ගත මුදල 2018 (රු.මි.) | 2018 12.31.දිනට ප්‍රගතිය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතය |
|---|---|---|---|
| ප්‍රාග්ධන අයවැය | 57.00 | 57.174 | 100% |
| පුනරාවර්ථන අයවැය | 17.75 | 15.8698 | 89.41% |

**විශේෂ ව්‍යාපෘති වල මූල්‍ය ප්‍රගතිය**

| ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තු ගත මුදල 2018 (රු.මි.) | 2018 12.31. දිනට ප්‍රගතිය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස | භෞතික ප්‍රගතිය ප්‍රතිශතය |
|---|---|---|---|---|
| ජාතික පරිසර නියමු වැඩසටහන | 19.00 | 18.485 | 97.28 | 100 |
| පාරිසරික අධ්‍යාපන දැනුවත් කිරීම හා හරිත සම්මාන | 17.00 | 16.787 | 98.75 | 100 |
| ප්‍රධාන ජල දේහයන්හි ජල තත්වය පසුවිපරම් කිරීම. (JICA) | 1.00 | 0.964 | 96.4 | 100 |
| පිළිසරු ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය | 190.00 | 188.00 | 98.94 | 100 |
| EDCF ව්‍යාපෘතිය | 39.00 | 37.152 | 95.26 | 100 |
| පෙතියාකන්ද ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය | 25.00 | 25.00 | 100 | 100 |
| ගම්පහ දිස්ත්‍රික්කයේ භූගත ජල තත්වය පසුවිපරම් කිරීමේ ව්‍යාපෘතිය | 6.355 | 6.25 | 98.35 | 100 |

**"පුනරුදය" පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන**

| වැඩසටහන | ඇස්තමේන්තු ගත මුදල 2018 (රු.මි.) | 2018 12.31. දිනට ප්‍රගතිය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස | භෞතික ප්‍රගතිය ප්‍රතිශතය |
|---|---|---|---|---|
| පරිසර නියමු හා ළමා සමාජ වැඩසටහන ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය නිෂ්පාදනය (හිස්වැසුම, පරිසර නියමු පදක්කම්, සටහන් පොත්) | 14.70 | 14.65 | 99 | 100 |
| ජාතික පරිසර නියමු කඳවුර පැවැත්වීම | 6.00 | 5.89 | 98 | 100 |
| පරිසර නියමු ජනාධිපති පදක්කම් ක්‍රියාවලිය පිළිබඳ සකස් කරනු ලබන ගුරු උපදෙස් සංග්‍රහය | 0.30 | 0.17 | 57 | 100 |
| පරිසර නියමු ජනාධිපති පදක්කම් අපේක්ෂකයන් වෙනුවෙන් පවත්වන පරිසර අධ්‍යාපන වැඩසටහන | 0.50 | 0.34 | 68 | 100 |
| මධ්‍යම පරිසර අධිකාරියේ හා පළාත් කාර්යාල වල පරිසර ප්‍රදර්ශන ඒකකය ශක්තිමත් කිරීම | 1.00 | 0.73 | 73 | 100 |
| මහජන පුස්තකාල තුළින් ජනතාවගේ පාරිසරික දැනුවත්භාවය වැඩි කිරීම | 0.90 | 0.90 | 100 | 100 |
| ගම්පහ දිස්ත්‍රික් ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය කොම්පෝස්ට් අංගනය ඉදි කිරීම | 64.97 | 60.29 | 93 | 100 |
| **එකතුව** | **88.37** | **82.96** | **93.9** | **100** |

# පරිසර දූෂණ පාලනය

**පරිසර දූෂණ පාලන ඒකකය**

කර්මාන්ත ක්‍රියාකාරිත්වයන් මගින් සිදුවන දූෂණය පාලනය කිරීම සඳහා ප්‍රධාන නීතිමය මෙවලම ලෙස පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාවලිය හැඳින්විය හැකිය. සියළුම නියමිත් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබාගත යුතුය. මීට අමතරව පරිසර දූෂණයට සම්බන්ව මහජන පැමිණිලි විමර්ශනය කිරීම, කර්මාන විසින් දූෂණ පාලන ක්‍රියාවලිය උපයෝගී කර ගන්නා ආකාරය පිළිබඳව ඇගයීම (අපජල විමර්ෂණ වාර්තා, ශබ්ද හා කම්පා මිනුම් වැනි ක්‍රියාකාරකම් මගින්) පරිසර දූෂණ පාලන ඒකකය ඒකකය මගින් සිදු කරනු ලබයි .

**2018 වර්ෂය තුළ සිදු කරන ලද ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය**

- ***ප්‍රතිපත්ති, රෙගුලාසි, ප්‍රමිති සහ මාර්ගෝපදේශ සකස් කිරීම***
  JICA ව්‍යාපෘතියේ සහාය ඇතිව මධ්‍යම පරිසර අධිකාරිය විසින් ආංශික ජල තත්ත්ව ප්‍රමිතීන් සකස් කරන ලද අතර එම ප්‍රමිතින් ගැසට් කිරීම සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත අවසන් කෙටුම්පත ඉදිරිපත් කරන ලදී.
- ***නව කර්මාන්ත ස්ථානගත කිරීම සඳහා නිර්දේශ නිකුත් කිරීම***
  දිවයින පුරා නව කර්මාන්තායතන සඳහා පාරිසරික නිර්දේශ1331 ක් නිකුත් කර ඇත.
- ***පාරිසරික ආරක්ෂණ බලපත්‍ර (EPL) ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම***
  - කර්මාන්ත ක්‍රියාකාරකම් නියමිත ප්‍රමිතීන්ට හා උපමානයන්ට අනුකූලව පවත්වා ගනිමින් එම ක්‍රියාකාරකම් මගින් පරිසරයට බැහැර කරන අපද්‍රව්‍ය ප්‍රමාණය 90% කට වඩා අඩුකර ගැනීමට හැකි වී ඇත මෙම කාර්යය .ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාවලිය හරහා මහා පරිමාණ දූෂකාරක ක්‍රියාකාරකම් සහිත කර්මාන්තයන් 8914 ක් සහ මධ්‍යම පරිමාණ දූෂකාරක ක්‍රියාකාරකම් සහිත කර්මාන්තයන් 8752 ක් නියාමනය කිරීම මගින් සිදු කර ඇති අතර එය සමස්ත මහා පරිමාණ සහ මධ්‍යම පරිමාණ දූෂකාරක ක්‍රියාකාරකම් සහිත කර්මාන්තයන් ගණනින් පිළිවෙළින් 68 %ක් හා 83% ක් වේ.
  - ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි කර්මාන්ත 859ක් සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ එකඟතාවය හා මගපෙන්වීම ලබාදීම මගින් එම කර්මාන්ත හරහා සිදුවිය හැකි පරිසර දූෂණය පාලනය කිරීමට හැකිවූ අතර එය සමස්ථ අපනයන සැකසුම් කලාපයන්ට බැහැරව පවතින ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි කර්මාන්ත ප්‍රමාණයෙන් 76%කි.
  - කර්මාන්ත පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාවලියේ කොන්දේසිවල පවතින ප්‍රමිතීන්ට සහ උපමානයන්ට අනුව පවත්වා ගැනීම සඳහා අනුකූලතා අධීක්ෂණය ඉතා වැදගත් වන අතර අත්‍යාවශ්‍ය වේ. එබැවින්

දිවයින පුරා මහා පරිමාණ සහ මධ්‍ය පරිමාණ දූෂ්‍යකාරක කර්මාන්ත අධීක්ෂණය සඳහා පරිසර දූෂණ පාලන ඒකකය විසින් පුළුල් අධීක්ෂණ සැලැස්මක් සකස් කරන ලදී. ක්‍රියාත්මක කිරීම පළාත් සහ දිස්ත්‍රික් කාර්යාල සමඟ ඒකාබද්ධව සිදු කරන ලදී.

- ***පුහුණු වැඩසටහන්***
  වායු දූෂණය පාලනය කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ විශේෂ තාක්ෂණික පුහුණුවක් මධ්‍යම පරිසර අධිකාරියේ කාර්ය මණ්ඩලය වෙත ලබා දෙන ලද අතර තෝරාගත් පළාත් පාලන ආයතන වෙත පාරිසරික ආරක්ෂණ ක්‍රමෝපාය ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන් 6 ක් පවත්වන ලදී.
- ***දූෂකාරක ප්‍රභව නාමාවලිය (PSI)***
  JICA ව්‍යාපෘතිය යටතේ කර්මාන්ත ක්‍රියාකාරකම් පිළිබඳ දූෂකාරක ප්‍රභව නාමාවලිය සඳහා දත්ත පද්ධතියක් මධ්‍යම පරිසර අධිකාරිය විසින් සකස් කර ඇති අතර 2018 වසරේ සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. එය තවමත් පරීක්ෂණ අවධියේ පවතින අතර එහි විධිමත් පරිහරණය සඳහා තවදුරටත් වැඩිදියුණු කිරීම සිදුකරමින් පවතී.
- ***තාක්ෂණික මැදිහත්වීම සහ කර්මාන්ත පහසුකම් සැලසීම***
  - කැළණි ගංගාව කාර්මික විසර්ජන වලින් ආරක්ෂා කිරීම සඳහා කැළණි ගංහා ආශ්‍රිතව සංවේදී ප්‍රදේශයන්හි මහා පරිමාණ සහ මධ්‍ය පරිමාණ දූෂකාරක ක්‍රියාකාරකම් සහිත කර්මාන්තයන් ස්ථානගත කිරීම සඳහා සීමාවන් පැනවීම පිණිස කැබිනට් සංදේශයක් නිකුත් කර ඇත. මෙම කැබිනට් සංදේශය ක්‍රියාවට නැංවීම පිණිස මධ්‍යම පරිසර අධිකාරිය නව කර්මාන්ත පිහිටුවීම පිළිබඳ නිර්දේශ සැපයීම සඳහා කමිටුවක් පිහිටුවා ඇත. 2018 වර්ෂය තුළ මධ්‍යම පරිසර අධිකාරිය රැස්වීම් 9 ක් පැවැත්වූ අතර ව්‍යාපෘති යෝජනා 51 ක් ඇගයීමට ලක් කළේය.
  - කාර්මික තාක්ෂණ ආයතනය (ITI) හා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය (NERD) යන ආයතනයන්හි තාක්ෂණික සහායෝගීතාවයෙන් බේකරි සහ හුණුපොරුණු සඳහා දූෂණ පාලන කටයුතු පිළිබඳ තාක්ෂණික මාර්ගෝපදේශ පිළියෙළ කරන ලදී.
  - කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය (MOIC) විසින් පරිසර හිතකාමී කර්මාන්ත ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම් සඳහා පහසු ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කර ඇති අතර මධ්‍යම පරිසර අධිකාරිය විසින් මෙම වැඩ සටහන සඳහා පහසුකම් සපයනු ලැබීය. පොළිය අවුරුදු 2 ක සහන කාලයක් සහිතව 6.5% ක් වන අතර සීමාව රු. මිලියන 30කි. පරිසර දූෂණය පාලනය කිරීමේ පද්ධති වැඩි දියුණු කිරීම හෝ ඉදිකිරීම සඳහා කර්මාන්ත 98 ක් සඳහා ණය ලබා දීමට මධ්‍යම පරිසර අධිකාරිය පහසුකම් සැපයීය. අවසානයේදී මෙම ක්‍රියාවලිය, පරිසරයට බැහැරවන අපද්‍රව්‍ය ප්‍රමාණය අවම කිරීමට හා පරිසරයේ ගුණාත්මකභාවය පවත්වා ගැනීමට දායක වෙයි.
- ***පාරිසරික උපදේශකයින් සහ විශ්ලේශණ රසායනාගාර ලියාපදිංචි කිරීමේ වාර්ෂික වැඩසටහන***
  ගුණාත්මක සේවාවක් ලබා ගැනීම අරමුණු කොටගෙන පාරිසරික උපදේශකයින්ව හා විශ්ලේෂණ රසායනාගාර ලියාපදිංචි කිරීමේ වාර්ෂික වැඩසටහනක් මධ්‍යම පරිසර අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරනු ල්බයි. ඒ අනුව, කර්මාන්තකරුවන්ව සඳහා වඩා හොඳ උපදේශණ/ රසායනාගාර සේවාවන් ලබාදීම උදෙසා 2018/2017 කාල් වකවානුවේ දී රසායානාගාර 28 ක්ද, පාරිසරික උපදේශකවරුන් 53 ක් ද ලියාපදිංචි කරන ලදී.
- ***විශේෂ ව්‍යාපෘති සහ වැඩසටහන්***
  - කැළණි ගඟේ අඹතලේ ජල පෝෂකයේ යථා කාල (Real Time) ජල තත්ත්ව අධීක්ෂණ ක්‍රමයක් ආරම්භ කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව වැඩ සටහනක් 2018 වසරේදී ආරම්භ කරන ලදී
  - කළු, නිල්වලා, මහ ඔය හා බඳුලු ඔය යන වැදගත් ජල දේහයන් කීපයක් තෝරාගෙන, එම ජල දේහයන්හි ජල තත්ත්ව අධීක්ෂණය සඳහා අධීක්ෂණ ස්ථාන භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) සහ ස්ථාන අධ්‍යයනය මඟින් හඳුනා ගන්නා ලදී.
  - **ගම්පහ දිස්ත්‍රික්කයේ භූගත ජල තත්ත්ව අධීක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය** සඳහා ආසියානු ජල පාරිසරික සහයෝගීතා වැඩ සටහන මඟින් මධ්‍යම පරිසර අධිකාරිය වෙත රුපියල් මිලියන 7.2 ක මුදලක් ලබා දී ඇත. මෙමඟින්, භූගත ජල දූෂණයට කාර්මික අපසන්දන මඟින් ඇති වන බලපෑම අධ්‍යයනය සිදු කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ, අපජල උත්පාදන කර්මාන්ත 13 ක් තෝරාගෙන ඒවායේ දූෂණය පාලනය කිරීමේ උපාය මාර්ග හා අවසාන බැහැර කිරීමේ ක්‍රම අධ්‍යයනය කරන ලදී. එසේම භූගත ජල මූලාශ්‍ර 96 ක් (නොගැඹුරු ළිං) තෝරාගෙන විවිධ කාලවලදී (මෝසම් සහ අන්තර් මෝසම් කාලවලදී) ජල සාම්පල එකතු කරන ලද අතර තෝරාගත් භූගත ජල මූලාශ්‍ර වල ජල මට්ටම හා උෂ්ණත්වය පරීක්ෂා කිරීම සඳහා ජල දත්ත එකතුකරන්නන් 09 දෙනෙක් යොමු කරන ලදී. 2018 දෙසැම්බර් මස අවසානය වන විට දත්ත එක්රැස් කිරීමේ කටයුතු අවසන් කරන ලදී.

**වායු සම්පත් කළමනාකරණ සහ පසුවිපරම් ඒකකය**

ආංශික වායු තත්ත්ව කළමනාකරණය සහ පාරිසරික ශබ්ද දූෂණ කළමනාකරණය මෙම ඒකකයේ ප්‍රධාන කාර්යයන් වේ.

- ***2003 අංක 1 දරන ජාතික පාරිසරික රෙගුලාසි (වායු විමෝචනය, ඉන්ධන සහ වාහන ආනයන ප්‍රමිති) සංශෝධනය කිරීම***
  යුරෝ IV ප්‍රමිති හා ජපාන ප්‍රමිතීන්ට අනුකූලව වාහන ආනයනය, නිෂ්පාදනය කිරීම හෝ එකලස් කිරීම සඳහා වාහන වායු විමෝචන ප්‍රමිති සංශෝධනය කරන ලද අතර එම සංශෝධන 2018.07.12 දිනැති අංක 2079/42 දරණ හා 2018.08.06 දිනැති අංක 2083/03 දරණ අති විශේෂ ගැසට් පත්‍රයන්හි පළ කරන ලදී.
- ***ප්‍රභව විමෝචන පාලන ප්‍රමිති***
  ප්‍රභව විමෝචනය පාලනය කිරීම සඳහා වන රෙගුලාසි මාලාවක් මධ්‍යම පරිසර අධිකාරිය විසින් සකස් කර ඇති අතර, ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා සූදානම් කරමින් පවති.
- ***අධිවේගී මාර්ග සඳහා රථවාහන ශබ්ද ඇගයීමේ නිර්ණායක සඳහා මාර්ගෝපදේශ***
  අධිවේගී මාර්ග සඳහා රථවාහන ශබ්දය ඇගයීමේ නිර්ණායක පිළිබඳ මාර්ගෝපදේශය නිකුත් කිරීම සඳහා 2018 වසරේදී මෙම ඒකකය විසින් පියවර ගෙන තිබේ.
- ***වේගවත් දුම්රිය මාර්ග පද්ධතිය සඳහා දුම්රිය ශබ්ද ඇගයීමේ නිර්ණායක සඳහා මාර්ගෝපදේශ***
  වේගවත් දුම්රිය මාර්ග පද්ධතිය සඳහා දුම්රිය ශබ්ද ඇගයීමේ නිර්ණායක සඳහා මාර්ගෝපදේශ සකස්කර ප්‍රසිද්ධ කරන ලදී.
- ***වාහන නලා ශබ්ද රෙගුලාසි ක්‍රියාත්මක කිරීම***
  මධ්‍යම පරිසර අධිකාරිය විසින් තාක්ෂණ කමිටුවක් පත්කර ඇති අතර එම තාක්ෂණ කමිටුවේ නිර්දේශ අනුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් නලා ශබ්ද රෙගුලාසි එළදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා නිලධාරියෙකු පත් කර ඇත.
- ***ආංශික වායු තත්ත්ව පසුවිපරම් කිරීම***
  2018 වර්ෂය තුළදී සල්ෆර් ඩයොක්සයිඩ් ($SO_2$) හා නයිට්‍රජන් ඩයොක්සයිඩ් ($NO_2$) වායු සාන්ද්‍රණය මිනුම් කිරීම සඳහා සාම්පල 97 ක් ද, වායු ගතික විශ්කම්භය මයික්‍රොමීටර් ට අඩු ක්ෂු 10ද අංශූන් ($PM_{10}$) සාන්ද්‍රණය මිනුම් කිරීම සඳහා සාම්පල 88 ක් ද කොළඹ කොටුව අධීක්ෂණ මධ්‍යස්ථානයේ දී විශ්ලේෂණය කරන ලදී.
- ***ජාතික ආංශික වායු තත්ත්ව පසුවිපරම් කිරීමේ වැඩසටහන***
  මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාහන විමෝචන භාර අරමුදල විසින් ස්ථාවර ආංශික වායු තත්ත්ව පසුවිපරම් කිරීමේ මධ්‍යස්ථාන දෙකක් සහ ජංගම ආංශික වායු තත්ත්ව පසුවිපරම් කිරීමේ මධ්‍යස්ථානයක් ස්ථාපනය කරන ලදී. එම ස්ථාවර මධ්‍යස්ථාන දෙක බත්තරමුල්ල සහ මහනුවර නගරවල ආංශික වායු තත්ත්ව පසුවිපරම් කිරීම සඳහා ස්ථාපනය කරන ලද අතර, පරීක්ෂණ සාර්ථකව සිදු කරනු ලැබේ. තෝරාගත් නගරවල වායු තත්ත්වය මැනීම සඳහා ජංගම ආංශික වායු තත්ත්ව පසුවිපරම් කිරීමේ මධ්‍යස්ථානය භාවිතා කිරීමට තීරණය කරන ලදී.
- ***පැමිණිලි මෙහෙයවීම හා අනුකූලතා පරීක්ෂා කිරීම සඳහා තාක්ෂණික මග පෙන්වීම සහ සහාය සැපයීම***
  වායු සම්පත් කළමනාකරණ හා පසුවිපරම් ඒකකය විසින් පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේදී, පැමිණිලි විමර්ශනය කිරීමේදී, වාණිජ පදනම මත නිතිපතා අධීක්ෂණය කිරීමේදී සහ නීතිමය අවශ්‍යතා සඳහා වායු තත්ව සහ ශබ්ද මට්ටම් සඳහා අනුකූලතා පසුවිපරම් වාර්තා නිකුත් කිරීම සිදු කරනු ලැබේ.
- ***මාලේ ප්‍රකාශනයේ කටයුතු ක්‍රියාත්මක කරන ජාතික ආයතනය ලෙස ක්‍රියා කිරීම***
  මාලේ ප්‍රකාශනයේ ක්‍රියාකාරකම් වලට අදාල වූ දකුණු ආසියානු රටවල දේශ සීමා හරහා සිදුවන වායු දූෂණ තත්ත්ව, එහි බලපෑම සහ වායු දූෂණ තත්ත්ව වැළැක්වීමේ සහ පාලනය කිරීමේ කටයුතු සිදු කිරීමේදී මාලේ ප්‍රකාශනයේ කටයුතු ක්‍රියාත්මක කරන ජාතික ආයතනය ලෙස මධ්‍යම පරිසර අධිකාරිය ක්‍රියා කරනු ලබයි. වායු සම්පත් කළමනාකරණ හා පසුවිපරම් ඒකකය විසින් අනුරාධපුරයේ දොරමඩලාව ප්‍රදේශයේ පිහිටි දේශ සීමා වායු දූෂණය පිළිබඳ අධීක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන අතර 2018 මාර්තු මස මැද භාගය වනවිට $SO_2$, $NO_2$ සහ $PM_{10}$ සඳහා නියැදි 10ක් එකතු කර විශ්ලේෂණය කරන ලදී.

**ජල තත්ව පසුවිපරම් ඒකකය**

බස්නාහිර පළාතේ මෙන්ම අනෙකුත් පළාත්වල තෝරාගත් ජල මූලාශ්‍රයන්හි කාර්මික අපසන්දන (effluents) පසුවිපරම් කිරීම සහ විශ්ලේෂණ වාර්තා සැපයීම මඟින් රටෙහි ජලය කළමනාකරණය කිරීම හා සංරක්ෂණය කිරීම මෙම ඒකකයට පැවරී ඇති ප්‍රධාන කාර්යයන් වේ.

- ***මතුපිට ජල ප්‍රභවයන්හි ජල සාම්පල විශ්ලේෂණය***
  2018 වසර තුළදී මෙම රසායනාගාරය මඟින් ජල නියැදින් හා අපසන්දන ජල නියැදි 1168ක් එකතු කර විවිධ පරාමිතීන් භාවිතා කොට විශ්ලේෂණය කරන ලදී .මෙම කාලය තුළ, කැලණි ගඟ, බෙන්තොට ගඟ, මා ඔය හා දියවන්නා ඔය වැනි තෝරාගත් ජල ප්‍රභවයන්හි ජල සාම්පල එකතු කර පූර්ව නිශ්චිත පරාමිතීන් 17 ක් භාවිතා කොට විශ්ලේෂණය කරන ලදී.
- ***ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය මඟින් ජල තත්ත්ව පසුවිපරම් ඒකකය වෙත ප්‍රතීතනය ලත් තත්ත්ව සහතිකයක් ලබා ගැනීම***

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ (SLAB) තාක්ෂණික හා කළමනාකරණ අවශ්‍යතා සාර්ථකව සපුරාලීමෙන් අනතුරුව 2018 නොවැම්බර් මස 15 වන දින රසායනාගාර සේවයේ ජල තත්ව පසුවිපරම් ඒකකය ISO / IEC 17025 ප්‍රමිති සහතිකය ලබා ගන්නා ලදී. එසේම, අවශ්‍ය කරන උපකරණ සියල්ල ප්‍රතීතන අවශ්‍යතා අනුව ක්‍රමාංකනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ ප්‍රතීතන අවශ්‍යතා සම්බන්ධව රසායනාගාර නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය පුහුණු වැඩසටහනක් ද පවත්වනලදී.

### අපද්‍රව්‍ය කළමනාකරණ

#### රසායනික හා උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය

පහත කටයුතු ඉටු කිරීමේ වගකීම මධ්‍යම පරිසර අධිකාරියේ අපද්‍රව්‍ය කළමනාකරණ අංශයට අයත් රසායනික හා උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය වෙත පැවරී ඇත.

අ. උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණයට අදාල රෙගුලාසි ක්‍රියාත්මක කිරීම.
ආ. අන්තර් ජාතික සම්මුතීන්ට අදාල කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම.
ඇ. 2018 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මෙන් හඳුනා ගන්නා ලද රසායනික හා උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමට අදාල ව්‍යාපෘති/වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- ***ශ්‍රී ලංකාවේ උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණ රෙගුලාසි ක්‍රියාත්මක කිරීම***
    - ශ්‍රී ලංකාවේ උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණයට අදාල රෙගුලාසි (අංක 1534/18 දරණ 2008 පෙබරවාරි 01 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය) ක්‍රියාත්මක කිරීමේ එක කොටසක් ලෙස 2018 වර්ෂය තුළදි උපලේඛණ ගත අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍ර (SWML) 343ක් නිකුත් කරන ලදී.
    - ඵලදායී ලෙස උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන බාධාවක් ලෙස උපද්‍රවකාරී අපද්‍රව්‍ය පිළිබඳ දත්ත පද්ධතියක් නොමැතිවීම හැදින්විය හැක. එබැවින්, රට තුළ ජනනය කරන ලද උපද්‍රවකාරී අපද්‍රව්‍ය පිළිබඳ දත්ත එක්රැස් කිරීම සඳහා ක්ෂේත්‍ර සමීක්ෂණයක් සිදු කර උපද්‍රවකාරී අපද්‍රව්‍ය ප්‍රමාණය ගණනය කිරීම ශ්‍රී ලංකා කාර්මික තාක්ෂණ ආයතනය (ITI) විසින් සිදු කරන ලද අතර මෙම සමීක්ෂණ වාර්තාවේ කෙටුම්පත මධ්‍යම පරිසර අධිකාරිය වෙත ශ්‍රී ලංකා කාර්මික තාක්ෂණ ආයතනය විසින් ඉදිරිපත් කරන ලදී.
- ***බාසල් සම්මුතිය ක්‍රියාත්මක කිරීම***
    - බාසල් සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා වන මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ජාතික සම්බන්ධීකරණ කමිටුව (NCC) විසින් රට තුළ උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අවශ්‍ය තාක්ෂණික කරුණු වලට අදාල නිසි තීරණ ගැනීමේ කටයුතු සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරියට අවශ්‍ය සහාය ලබාදීම සඳහා තාක්ෂණික ප්‍රවීණයන්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත්කොට ඇත .
    - උපද්‍රවකාරී රසායනික ද්‍රව්‍ය හා උපද්‍රවකාරී අපද්‍රව්‍ය ආනයනය කිරීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරන රෙගුලාසිවලට අනුව, බාසල් සම්මුතියේ "B" ලැයිස්තුවේ ලැයිස්තුගත කර ඇති උපද්‍රවකාරී රසායනික ද්‍රව්‍ය සහ උපද්‍රවකාරී අපද්‍රව්‍ය ආනයනය සඳහා 2018 වර්ෂය තුළදී අනුමැතීන් 230 ක් නිකුත් කරන ලදී.
    - බාසල් සම්මුතිය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමේ බලයලත් ආයතනය ලෙස 2018 වර්ෂය තුළදී මධ්‍යම පරිසර අධිකාරිය විසින් බාසල් සම්මුතියේ “A” ලැයිස්තුවේ ලැයිස්තුගත අපද්‍රව්‍ය මෙරට දේශසීමා හරහා ප්‍රවාහනයට අනුමැතීන් 47ක් ද දේශසීමා හරහා මෙරටින් අපනයනය සඳහා අනුමැතීන් 08ක් ද ලබාදී ඇත.
- ***රසායනික ද්‍රව්‍ය කළමනාකරණය***

  රසායනික ද්‍රව්‍ය කළමනාකරණය ක්‍රියාත්මක කිරීම යටතේ රසායනික ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා පාරිසරික නිර්දේශ 128 ක් ද රසායනික ද්‍රව්‍ය ආනයනය සඳහා අනුමැතීන් 293 ක් ද නිකුත් කරන ලදී.
- ***රොටර්ඩෑම් සම්මුතිය ක්‍රියාත්මක කිරීම***

  රසායනික ද්‍රව්‍ය කළමනාකරණය සඳහා වූ තාක්ෂණික උපදේශක කමිටු (TACMIC) රැස්වීම් තුනක් 2018 වසර තුළදී පවත්වන ලද අතර එම කමිටු රැස්වීම්වලදී ගත් තීරණයන්ට අනුව සුදු ඇස්බැස්ටෝස් ආනයනය කිරීම සඳහා ආනයන අනුමැතීන් 32 ක් ලබා දෙනලදී.
- ***ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය***

  අවිධිමත් ලෙස ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එක්රැස් කරන්නන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා රසායනික හා උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණ අංශය සැලසුම් කර ඇත. ඒ අනුව, කළුතර දිස්ත්‍රික්කය තුළ අවිධිමත් ලෙස මෙහෙයුම් කටයුතු සිදුකරන්නන් සඳහා දැනුවත් කිරීමේ වැඩමුළුවක් පවත්වන ලදී.

- ***දැනුවත් කිරීමේ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය පිළියෙල කිරීම***

  2018 වසර තුළදී පහත පොත් පිංචයන් සහ අත් පොත් ප්‍රකාශන මුද්‍රණය කරන ලදී.
  - සිංහල මාධ්‍යයෙන් ඇස්බැස්ටෝස් කළමනාකරණ මාර්ගෝපදේශ පොත් පිංච පිටපත් 5000 ක්
  - සායනික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අත්පත්‍රිකා පිටපත් 5000 ක්
  - රසදිය කළමනාකරණය පිළිබඳ අත්පත්‍රිකා පිටපත් 7000 ක්

**පරිසර කළමනාකරණ හා ඇගයීම**

**පරිසර බලපෑම් ඇගයීමේ ඒකකය**

ව්‍යාපෘති මගින් ඇති වන පාරිසරික බලපෑම් ඇගයීමේ අරමුණින් සියලු නියමිත ව්‍යාපෘති සඳහා පරිසර බලපෑම් ඇගයීමේ පරිපාලන ක්‍රියාදාමය පවත්වාගෙන යාම මෙම ඒකකයේ ප්‍රධාන කාර්යභාරය වේ.

- ***නියමිත ව්‍යාපෘති සඳහා පරිසර බලපෑම් ඇගයීම / මූලික පාරිසරික පරීක්ෂණ (EIA/IEE) ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම***
  2018 වර්ෂය තුළ දී, ජාතික පාරිසරික පනතේ IVC වගන්තිය යටතේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය ව්‍යාපෘති 50 ක් සඳහා මෙම ඒකකය ක්‍රියා කරන ලදී. එම ව්‍යාපෘති වලින් ව්‍යාපෘති 17 ක් සඳහා අනුමැතිය ලබා දෙන ලද අතර ව්‍යාපෘති 33ක් සඳහා අනුමත කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක වෙමින් පවතී. තවද, පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය යටතේ අනුමැතිය ලබාදිය යුතු ව්‍යාපෘති 19 ක් ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතන වෙත යොමු කරන ලදී.
- ***පරිසර බලපෑම් ඇගයීම / මූලික පාරිසරික පරීක්ෂණ (EIA/IEE) ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා වෙනත් ආයතනවලට තාක්ෂණික සහාය ලබා දීම***
  පරිසර බලපෑම් ඇගයීම් ඒකකය විසින් නියමිත ව්‍යාපෘති 50 ක් සඳහා තාක්ෂණික සහාය ලබා දී ඇත. එමෙන්ම, පරිසර බලපෑම් ඇගයීම් ඒකකය විසින් පරිසර උපදේශන කමිටු රැස්වීම් 14 ක් පවත්වන ලදී.
- ***සාර්ථක ක්‍රියාකාරීත්වය සඳහා පවත්නා පාරිසරික බලපෑම් නීති, රෙගුලාසි හා ක්‍රියා පටිපාටි ප්‍රවර්ධනය හා වැඩිදියුණු කිරීම***
  පරිසර බලපෑම් ඇගයීම් ඒකකය විසින් පරිසර බලපෑම් ඇගයීම් රෙගුලාසි, ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතන ලැයිස්තුව හා දැනට පවතින නියමිත ව්‍යාපෘති ලේඛනය සංශෝධනය සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව ඇතුළු අදාල පාර්ශවකරුවන් සමඟ රැස්වීම් හා සාකච්ඡා කිහිපයක් පවත්වන ලදී. මෙම සංශෝධනයන්හි අවසන් කෙටුම්පත්, ගැසට් නිවේදන නිකුත් කිරීම සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලදී.
- ***අනුමත කරන ලද ව්‍යාපෘති පසුවිපරම් කිරීම***
  මධ්‍යම පරිසර අධිකාරිය මගින් අනුමත කරන ලද ව්‍යාපෘති අනුමත කොන්දේසි වලට අනුකූලව ක්‍රියාත්මක වනවාද යන්න සොයා බැලීම සඳහා පරිසර බලපෑම් ඇගයීම් ඒකකය විසින් අඛණ්ඩව එම ව්‍යාපෘති පසුවිපරම් කරනු ලැබේ. ඒ යටතේ 2018 වසර තුළදී ව්‍යාපෘති 30 ක් පසුවිපරම් කරන ලදී.
- ***සංවර්ධන ව්‍යාපෘති සඳහා පාරිසරික ප්‍රවාහ (E-Flows) නිර්ණය කිරීම සඳහා මාර්ගෝපදේශන පොත් පිංච***
  මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර බලපෑම් ඇගයීම් ඒකකය විසින් ශ්‍රී ලංකාව තුළ ජලය බැසීමේ හා අපසරනය කිරීමේ ව්‍යාපෘති රාශියක් ඇගයීම සඳහා අධ්‍යනයක් ආරම්භ කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පාරිසරික ප්‍රවාහය නිර්ණය කිරීමේදී අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ මාලාවක් සහ නිර්ණායකයන් ඇතුළත් අත්පොත සකස් කර ප්‍රකාශයට පත් කර ඇත.

**ස්වාභාවික සම්පත් කළමනාකරණ ඒකකය**

පාරිසරික ආරක්ෂණ කලාප (EPAs) ප්‍රකාශයට පත්කිරිම හා කළමනාකරණය කිරීම, ස්වාභාවික සම්පත් කළමනාකරණය සහ ජාතික තෙත් බිම් ප්‍රතිපත්තිය - 2006 හි සඳහන් උපාය මාර්ග හා නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම ස්වාභාවික සම්පත් කළමනාකරණ ඒකකයෙහි ප්‍රධාන කාර්යයන් වේ.

- ***අධ්‍යාපනික ද්‍රව්‍ය***

  2018 වර්ෂය තුළ ස්වාභාවික සම්පත් කළමනාකරණ ඒකකය විසින් පහත අධ්‍යාපනික ද්‍රව්‍ය සකස් කරන ලදී.

  - වැලි සම්පත් පිළිබද පුහුණු අත්පොතෙහි දෙමළ පරිවර්තනය (පිටපත් 125 ක් සහ සීඩී තැටි) මුද්‍රණය කරන ලද අතර පළාත් හා දිස්ත්‍රික් කාර්යාල වෙත බෙදාහරින ලදී.
  - "තෙත්බිම් අසිරිය" දෙමළ පරිවර්තනයෙහි පිටපත් 125ක් මුද්‍රණය කරන ලදී.
  - බෝල්ගොඩ පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය සම්බන්ධ අත්පත්‍රිකාව සකසා පිටපත් 5000ක් මුද්‍රණය කරන ලදී.
  - පන්සලාතැන්න හා වරාතැන්න හක්කින්ද පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය සම්බන්ධ අත්පත්‍රිකාව සකස්කරන ලද අතර මුද්‍රණය සඳහා යොමු කර ඇත.

- මධ්‍යම පරිසර අධිකාරියේ පලාත් කාර්යාල විසින් පාරිසරික නිර්දේශ නිකුත් කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේදී අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ මාලාවක් (පාරිසරික නිර්දේශ නිකුත් කිරීමේ ලිපියෙහි පොදු ආකෘති පත්‍රය, පිරික්සුම් ලැයිස්තුව,පරීක්ෂණ වාර්තා ආකෘතිය ඇතුළත්ව) සකස් කරන ලදී.
- "තෙත්බිම් ශ්‍රී ලංකා" සඟරාව සඳහා තෙත්බිම් සම්බන්ධ පර්යේෂණ ලිපි 7 ක් ලැබුණු අතර එම ලිපි ප්‍රධාන සංස්කාරක විසින් සංස්කරනය කරන ලදී. මෙම සඟරාවේ පිටපත් 500 ක් මුද්‍රණය කරන ලදී.

- *පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ (EPAs) ප්‍රකාශයට පත්කිරීම හා කළමනාකරණය කිරීම*
ස්වාභාවික සම්පත් කළමනාකරණ ඒකකය, අනන්‍ය පාරිසරික ලක්ෂණ සහිත හා දරුනු ලෙස තර්ජනයට ලක්විය හැකි ප්‍රදේශ පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කිරීමට කටයුතු කරනු ලබයි. ජාතික පාරිසරික පනතේ විධිවිධාන යටතේ මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2018 වසර දක්වා පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ 10 ක් ප්‍රකාශයට පත්කර ඇත. 2018 වර්ෂය තුළදී මාතෙල් දිස්ත්‍රික්කයේ පන්සලාතැන්න - මවුස්සාව පාරිසරික ආරක්ෂණ ප්‍රදේශයක් ලෙස 2018 ජූනි 11 දිනැති අංක 2075/15 දරන අති විශේෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත්කරන ලදී.
- *පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ කළමනාකරණය*
  - මුතුරාජවෙල තෙත්බිම් පරිසර පද්ධතිය සංරක්ෂණය පිළිබඳ වාර්තාවක් පිළියෙල කර අවශ්‍ය කටයුතු සඳහා අදාල ආයතන වෙත යොමු කරන ලදී.
  - දිය ඇලි ලැයිස්තුව (547) ප්‍රාදේශීය ලේකම්වරුන් සමග සම්බන්ධීකරණයෙන් යාවත්කාලීන කරන ලදී
  - 2018 වසරේ දී විජය පුවත්පත් පුද්ගලික සමාගම සමඟ ඒකාබද්ධව පන්සලාතැන්න පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය පිළිබඳ වාර්තා චිත්‍රපටයක් සකස් කරන ලදී.
  - නකල්ස් සංරක්ෂණ වනාන්තරය පිළිබඳ වාර්තාවේ කෙටුම්පත සකස් කරන ලදී.
  - ස්වාභාවික සම්පත් කළමනාකරණ ඒකකය විසින් ගිං ඔය, පතනකන්ද, හාලිඇල ජල පෝෂක ප්‍රදේශය, දැඩිගමුව කන්ද සහ ගෝනුමරියාව ජල උල්පත යන ප්‍රදේශ පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා අවශ්‍ය විවිධ වූ ක්‍රියාමාර්ග ගන්නා ලදී.
- *ප්‍රකාශයට පත්කරන ලද පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ සමීක්ෂණය හා මායිම් නිර්ණය කිරීම*
මිනින්දෝරු දෙපාර්තමේන්තුව සමඟ එක්ව මරගල කන්ද සංශෝධිත මායිම් පිළිබඳ අවසන් සමීක්ෂණ සැලැස්ම පිළියෙල කිරීම සඳහා මාර්ග සමීක්ෂණයක් සිදු කරන ලදී.

- *ලෝක තෙත්බිම් දින ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම*

ලෝක තෙත්බිම් දිනය සැමරීමේ ජාතික වැඩසටහන 2018 පෙබරවාරි 02 වන දින බත්තරමුල්ලේ පිහිටි "අපේ ගම" පරිශ්‍රයේ දී පැවැත්විණි. මෙම උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තන් ලෙස අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන සහ මහ නගර සහ බස්නාහිර පළාත් සංවර්ධන අමාත්‍යවරයා සහභාගී වන ලදී. මෙම වැඩසටහනට සමගාමීව, දිස්ත්‍රික් මට්ටමින් ප්‍රාදේශීය වැඩසටහන් 25ක් පළාත් කාර්යාල හා දිස්ත්‍රික් කාර්යාල හා ඍජු සම්බන්ධීකරණය යටතේ ක්‍රියාත්මක කරන ලදී.

- *ස්වභාවික සම්පත් පිළිබඳ පැමිණිලි මෙහෙය වීම*
ස්වාභාවික සම්පත් සම්බන්ධව පැමිණිලි 28 ක් ඍජුව සහ "ජනපතිට කියන්න " වැඩසටහන හරහා ලැබී ඇති අතර, එම පැමිණිලි විසඳීම සඳහා ස්වාභාවික සම්පත් කළමනාකරණ ඒකකය පියවර ගෙන තිබේ.

**උපායමාර්ගික පාරිසරික ඇගයීම් ඒකකය**

මෙම ඒකකය අලුතින් පිහිටුවනු ලැබූ අතර ඒකකයේ අරමුණ වන්නේ පරිසර බලපෑම් ඇති කරනු ලබන ප්‍රතිපත්ති, සැලසුම් සහ වැඩසටහන් සඳහා උපාය මාර්ගික පරිසර ඇගයීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමයි.

- *ශ්‍රී ලංකාව තුළ උපාය මාර්ගික පරිසර ඇගයීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා නීති රාමුවක් සැකසීම*
  - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ඉල්ලීම මත සැළකිය යුතු පාරිසරික බලපෑම් ඇති කළ හැකි ප්‍රතිපත්ති, සැලසුම් සහ වැඩසටහන් සඳහා උපාය මාර්ගික පරිසර ඇගයීම් ක්‍රියාවලිය හඳුන්වා දීමට නීති සම්පාදනය කරන ලෙස අමාත්‍ය මණ්ඩලය විසින් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත උපදෙස් ලබා දී ඇත
  - උපාය මාර්ගික පරිසර ඇගයීම් ක්‍රියාවලියට අදාළ විධිවිධාන ජාතික පාරිසරික පනතට හඳුන්වාදීම පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමග උපදේශන රැස්වීම් දෙකක් පවත්වන ලදී.

- *නියමු පදනම මත උපාය මාර්ගික පරිසර ඇගයීම් ක්‍රියාත්මක කිරීම සඳහා පාර්ශවකරුවන් යොදවා ගැනීම*
  - වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරියේ උපදේශකත්වයෙන් ව්‍යාපෘති 76 කින් යුත් වාරිමාර්ග හා ජල සම්පත් අංශයේ සැලැස්ම සඳහා උපාය මාර්ගික පරිසර ඇගයීම් අධ්‍යයනයක් සිදු කරන ලදී. මෙම සැලැස්ම සඳහා උපාය මාර්ගික පරිසර ඇගයීම් වාර්තාව සකස්කිරීමට මධ්‍යම පරිසර අධිකාරිය විසින් සහාය ලබාදෙන ලදී.

- වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (CRIP), ගංගා ද්‍රෝණි 4ක දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියේ සැලසුම් සඳහා උපාය මාර්ගික පරිසර ඇගයීම් 4ක් සිදු කරන ලදී. මධ්‍යම පරිසර අධිකාරිය විසින් උපාය මාර්ගික පරිසර ඇගයීම් වාර්තා ඇගයීම සඳහා සහාය ලබාදෙන ලදී.
- මධ්‍යම පරිසර අධිකාරිය විසින් හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දිද්දෙණිය ප්‍රදේශයේ පවතින ගල් වළවල් මඟින් ඇතිවිය හැකි සමුච්චිත බලපෑම අධ්‍යයනය කිරීම සඳහා සහ ප්‍රදේශවාසීන්ට හා එම ප්‍රදේශයේ පවතින භූගත ජලය සඳහා බලපෑමක් ඇති නොකරන අන්දමින් කළුගල් කැණීම් කලාප සැලසුම් කිරීම සඳහා උපාය මාර්ගික පරිසර ඇගයීම් අධ්‍යයනයක් ආරම්භ කරන ලදී.
- ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ මඟපෙන්වීම යටතේ මධ්‍යම පරිසර අධිකාරියේ උපදේශකත්වයෙන් ගංගා ද්‍රෝණි වල කුඩා ජල විදුලි බලාගාර පිහිටුවීම සඳහා උපාය මාර්ගික පරිසර ඇගයීම් අධ්‍යයනයක් සිදු කරනු ලබයි.

## පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම

### පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීමේ ඒකකය

පරිසරය සම්බන්ධව සමාජයේ විවිධ ඉලක්ක ගත කණ්ඩායම්වල දැනුවත්භාවය හා අධ්‍යාපනය වැඩිදියුණු කිරීම තුලින් පරිසර සංරක්ෂණය සඳහා සහ පරිසර හිතකාමී කළමනාකරණ ක්‍රියාවලියක් ඇති කිරීම උදෙසා ඔවුන්ගේ ක්‍රියාකාරී සහභාගිත්වය ලබා ගැනීම අධ්‍යාපන හා දැනුවත් කිරීමේ ඒකකයෙහි ප්‍රධාන වගකීම වේ. මෙම ඒකකය ප්‍රධාන වශයෙන් පරිසර නියමු වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි.

- ***පාසල් සිසුන් සඳහා වූ ඕසෝන් වියන, දේශගුණ විපර්යාස හා වායු දූෂණය පිළිබඳ දීප ව්‍යාප්ත පැණ විසඳුම් තරඟය (ඕසෝන් සිසු පැන)***
  2018 වර්ෂයේ දී, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ, වායු සම්පත් කළමනාකරණ හා ජාතික ඕසෝන් ඒකකයේ ප්‍රධානත්වයෙන් සහ මධ්‍යම පරිසර අධිකාරියේ සහයෝගයෙන් රජත හා ස්වර්ණ පරිසර නියමුවන් සඳහා සිංහල සහ දෙමළ මාධ්‍ය දෙකම ආවරණය වන පරිදි ජාතික මට්ටමින් මෙම වැඩසටහන පවත්වන ලදි.
- ***පරිසර නියමුවන් සඳහා වූ ඕසෝන් වියන හායනය හා අනෙකුත් පරිසර සංවේදී විෂයන් පිළිබඳ දැනුවත් කිරීම් (කඳවුරු) මාලාව***
  2018 වසර තුළදී, මධ්‍යම පරිසර අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරන පරිසර නියමු වැඩසටහන ආශ්‍රිතව ඉහළ ළකුණු ලබා ගත් ස්වර්ණ පදක්කම් ලාභීන් සඳහා මෙම වැඩසටහන යටතේ කඳවුරු වැඩසටහන් 05ක් පළාත් මට්ටමින් සංවිධානය කරන ලදි.



### පරිසර ප්‍රවර්ධනය

මෙම ඒකකය අලුතින් පිහිටුවනු ලැබූ අතර පරිසර අධ්‍යාපන දැනුවත් කිරීම් සහ හරිත සම්මාන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා පිහිටවන ලදි.

- ***අධ්‍යාපනික ද්‍රව්‍ය සැකසීම හා නැවත මුද්‍රණය කිරීම (පොස්ටර්, අත් පත්‍රිකා හා පොත් පිංච)***
  දැනුම ප්‍රචලිත කිරීමේ වැදගත් කම සැලකිල්ලට ගනිමින් සිංහල,දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා 3න්ම මාතෘකා 3ක් යටතේ අත්පත්‍රිකා 9ක් මුද්‍රණය කොට ප්‍රකාශයට පත් කරන ලදි.
- ***ප්‍රදර්ශන භාණ්ඩ නිෂ්පාදනය***
  මහජන ප්‍රදර්ශනය සඳහා යොදාගත හැකි ආකෘතිමය උදුනක් සහිත ජීව වායු ඒකකයක්, පාෂාණ සහ ඛණිජ ඇතුලත් ඛනිජ බහාළුමක්, බලශක්ති ඉතිරි කිරීමේ උදුනක් සහ ශාක නිදර්ශකයක් මෙම ඒකකය මඟින් නිෂ්පාදනය කර ඇත.
- ***සොබාකෙත මධ්‍යස්ථානවල වැඩසටහන් ක්‍රියාත්මක කිරීම***
  සොබාකෙත මධ්‍යස්ථාන 4ක් රුමස්සල, කුණ්ඩසාලේ, කෑගල්ල සහ අත්තිඩිය යන ප්‍රදේශවල ක්‍රියාත්මක වන අතර මෙමඟින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට අවස්ථාව සලසා ඇත. 2018 වර්ෂයේ දී, පාසල් ළමුන් හා අනෙකුත් ඉලක්කගත කණ්ඩායම් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 77ක් මෙම මධ්‍යස්ථානයන්හි දී පවත්වන ලදී.
- ***වර්තමාන ගැටළු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් (ඩෙංගු හා අපද්‍රව්‍ය කළමනාකරණය) පැවැත්වීම***
  ඩෙංගු හා අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 21ක් පවත්වන ලදී.

- ***සංස්කෘතික උත්සව සඳහා වැඩසටහන් (මහනුවර, අනුරාධපුර, පොලොන්නරුව, කතරගම, නල්ලූර් සහ තලවිල) පැවැත්වීම***



පලාත් හා දිස්ත්‍රික් කාර්යාල නිලධාරින්, පරිසර නියමුවන් සහ ප්‍රජාවගේ සහභාගීත්වය ඇතිව දැනුවත් කිරීමේ සහ පිරිසිදු කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

- ***ලෝක පරිසර දින වැඩසටහන***
  - ලෝක පරිසර දින ජාතික වැඩසටහන අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මහතාගේ ප්‍රධානාත්වයෙන් 2018 ජුනි මස 04 වන දින කෑගල්ල නගරයේදී පවත්වන ලද අතර පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු විවිධ පාර්ශව නියෝජනය කරමින් 3000ට අධික පිරිසක් මෙම උත්සවය සඳහා සහභාගි වූහ.
  - මීට අමතරව, ලෝක පරිසර දිනයට සමගාමීව පැළ සිටුවීම, අපද්‍රව්‍ය කළමනාකරණය සහ පොස්ටර් හා අත් පත්‍රිකා බෙදාහැරීම වැනි වැඩසටහන් ඇතුළුව දිස්ත්‍රික් වැඩසටහන් 25ක් පවත්වන ලදී.

- **ජාතික රුක් රෝපණ වැඩසටහන (වනරෝපා)**

ජාතික රුක් රෝපණ දිනය සැමරීම සඳහා ඔක්තෝබර් මාසයේ දී දිවයින පුරා පාසල් භූමි තුල සහ ජල පෝෂක ප්‍රදේශවල පළතුරු සහ දැවමය වැදගත්කමක් සහිත ශාක වගා කරමින් රුක් රෝපණ වැඩසටහන් 25ක් පවත්වන ලදී.

- ***රාජ්‍ය නිලධාරින් සඳහා පරිසර දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම***

පරිසර ආරක්ෂාව සඳහා රාජ්‍ය නිලධාරින්ගෙන් වඩා හොඳ සේවාවක් ලබාගැනීම සඳහා ග්‍රාමීය හා නාගරික මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහන් 755ක් පවත්වන ලදී.

- ***ජනාධිපති පරිසර සම්මාන වැඩසටහන***

ජනාධිපති පරිසර සම්මාන වැඩසටහන විවිධ කාණ්ඩ 19ක් යටතේ පරිසර හිතකාමී ආයතන හඳුනාගැනීම සඳහා ක්‍රියාත්මක කරනු ලබයි. කාර්ය සාධන මට්ටම, රන්, රිදී, ලෝකඩ සහ කුසලතා ලෙස වර්ගීකරණය කරන ලද අතර ජයග්‍රාහකයන් සඳහා පදක්කම් 60 ක් ප්‍රදානය කරන ලදී. කාණ්ඩ 5 කින් රන් පදක්කම්ලාභීන් තෝරාගන්නා ලදි. මෙම වසරේ දී ජනාධිපති පරිසර සම්මාන උළෙල, විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන නියෝජනය කරමින් 1500 කට අධික පිරිසකගේ සහභාගීත්වය ඇතිව ඔක්තෝබර් මස 19 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වන ලදී .

- ***සොබාකෙත ගුවන්විදුලි සටහන***

2018 වර්ෂය තුළ සොබාකෙත ගුවන්විදුලි වැඩසටහන් 44 විකාශය කෙරුණි. මෙම වැඩසටහන් සඳහා සම්පත් දායකයින් 44 දෙනෙකු සහ පරිසර නියමුවන් 41 දෙනෙකු සහභාගි වූ අතර මෙම වැඩසටහනේ දී ප්‍රවෘත්ති ලිපි 132ක් විකාශනය කරන ලදි.

- ***රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීම***

මෙම වැඩසටහන යටතේ රාජ්‍ය නොවන ආයතන 47 ලියාපදිංචි වී ඇත. මධ්‍යම පරිසර අධිකාරියෙහි ක්‍රියාකාරිත්වය පිළිබඳ දැනුවත් කිරීමට සහ පරිසරය සම්බන්ධව පවතින ගැටලු පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධාන කරන ලද අතර එම වැඩසටහන සඳහා රාජ්‍ය නොවන සංවිධාන 94 නියෝජනය කරමින් නිලධාරින් 150ක් සහභාගි වූහ.

- ***පරිසර පුවත් පත්‍රිකාව***

පරිසර නියමුවන්ගේ පරිසර ක්‍රියාකාරකම් සහ අනෙකුත් පාරිසරික වැඩසටහන් ආවරණය වන පරිදි වසරකට දෙවරක් පරිසර පුවත් පත්‍රිකාව පළ කරන අතර එය 2018 වසරේ ජුනි සහ දෙසැම්බර් මාසවලදී ප්‍රකාශයට පත් කරන ලදී.

**පර්යේෂණ හා සංවර්ධන ඒකකය**

පර්යේෂණ හා සංවර්ධන ඒකකයේ ප්‍රධාන අරමුණු වනුයේ, පාරිසරික තත්වය පිරිහීම හා එය වලක්වා ගැනීමට අදාළව පර්යේෂණ/අධ්‍යයන/සමීක්ෂණ සිදු කිරීම, ප්‍රවර්ධනය කිරීම හා සම්බන්ධීකරණය කිරීම. එම තොරතුරු

ව්‍යාප්ත කිරීම සහ ස්වාභාවික සම්පත් තිරසාර ලෙස භාවිතා කිරීමට භූගෝලීය දත්ත පද්ධති (GIS) හා දුරස්ථ සන්නිවේදන (RS) තාක්ෂණය යොදා ගැනීම වේ.

- *විවිධ ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයන් ඇතුළත් පර්යේෂණ කණ්ඩායමක් ඇති කිරීම*

මධ්‍යම පරිසර අධිකාරියේ පර්යේෂණ උපදේශන කමිටුවේ මඟපෙන්වීම යටතේ මෙම ක්‍රියාවලිය සිදු කරනු ලැබේ. 2018 වසරේ දී පර්යේෂණ යෝජනා 06ක් ලැබුණු අතර මධ්‍යම පරිසර අධිකාරියේ විධිවිධානවලට අනුකූල වන පර්යේෂණ යෝජනා 04ක් මූල්‍ය හා තාක්ෂණික සහාය සැපයීමට තෝරා ගන්නා ලදී. 2018 වසරේ දී පර්යේෂණ ව්‍යාපෘති 02ක් නිම කරන ලද අතර පර්යේෂණ ව්‍යාපෘති 08 ක් සිදු කරමින් පවතී.

- *පාරිසරික ඇගයීම සඳහා ජෛව විවිධත්ව පරිසර පද්ධති සේවා දර්ශක සහ මාර්ගෝපදේශ ගොඩනැගීම*

මෙම අධ්‍යනයේ අරමුණ වනුයේ පාරිසරික ඇගයීම් සිදු කිරීමේ දී විවිධ පරිසර පද්ධතීන් විසින් සිදු කරනු ලබන සේවාවන් පිළිබඳ අවශ්‍ය දැනුම වර්ධනය කිරීම සඳහා රටෙහි ජෛව විවිධත්ව පරිසර පද්ධතීන් පිළිබඳ අවකාශීය තොරතුරු පද්ධතියක් ගොඩ නැගීම වේ. මේ වන විට අපේක්ෂිත අධ්‍යනය සිදු කරනු ලබන ක්‍රමවේදය හඳුනාගෙන ඇත .

- **ශ්‍රී ලංකාවේ කටුපොල් වගාව මඟින් සිදුවන පාරිසරික සහ සමාජීය ගැටළු හඳුනා ගැනීම සඳහා අධ්‍යනයක් සිදු කිරීම (නිරීක්ෂණ හා නිර්දේශ)**

මෙම අධ්‍යනයේ අවසාන වාර්තාව කටුපොල් වගාව සඳහා නිර්දේශ ඇතුළත් කරමින් සකස් කර ප්‍රකාශයට පත් කරන ලදී. 2018.09.11දින පවත්වන ලද ජාතික ආර්ථික සභාව විසින් මෙම වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද අතර මේ සම්බන්ධයෙන් කැබිනට් පත්‍රිකාවක් යොමු කර ඇත.

- *මධ්‍යම පරිසර අධිකාරියේ විධිවිධානවලට අනුකූලවන පර්යේෂණ ප්‍රමුඛතා ක්ෂේත්‍ර හඳුනා ගැනීම*

ස්වාභාවික සම්පත් කළමනාකරණය, පරිසර දූෂණ පාලනය, අපද්‍රව්‍ය කළමනාකරණය, පාරිසරික අධ්‍යාපනය හා දැනුවත් කිරීම් සහ පාරිසරික නීතිය යන එක් එක් අංශයන්හි සම්පත් දායකයින් සහ මධ්‍යම පරිසර අධිකාරියේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් හඳුනාගත් පර්යේෂණ ප්‍රමුඛතා ක්ෂේත්‍රයන් (ගැටළු සහ පර්යේෂණ මාතෘකා) සම්බන්ධව අවසන් තීරණයකට එළඹීම සඳහා ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම් පවත්වන ලදී. මේ සම්බන්ධ වාර්තාව කෙටුම්පත් කර ඇත.

- *පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය සඳහා ගුවන් නිරීක්ෂණ මෙහෙයුම්*

ගුවන් නිරීක්ෂණ මෙහෙයුම් හරහා ශ්‍රී ලංකාවේ පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව සමඟ සහයෝගිතා වැඩසටහනක් ආරම්භ කරන ලදී. ගුවන්ව හමුදා නිලධාරීන් කණ්ඩායමක් විසින්ව මේ සම්බන්ව දැනුවත් කිරීමේ/පුහුණු වැඩසටහන් සැප්තැම්බර් 12 වන දින සහ දෙසැම්බර් 14 වන දින මධ්‍යම පරිසර අධිකාරියේ ජ්‍යේෂ්ඨ කළමනාකාරීත්වයට සහ තෝරාගත් නිලධාරීන් සඳහා පවත්වන ලදී.

- *පරිසර සම්පත් තිරසර කළමනාකරණය සඳහා ශ්‍රී ලංකාවේ පාරිසරික සම්පත් පිළිබඳ අන්තර්ජාලගත අවකාශීය දත්ත පද්ධතියක් ගොඩනැඟීම*

පරිපාලන මායිම්, වනජීවී සම්පත් සංචිතය, රක්ෂිත වනාන්තර, පුරාවිද්‍යාත්මක වැදගත් ස්ථාන ආදී විවිධ දත්ත සමුදායන් ඇතුළත් කොට මෙම අන්තර්ජාලගත අවකාශීය දත්ත පද්ධතිය යාවත්කාලීන කරන ලදී. දිස්ත්‍රික්ක 15 ක කර්මාන්තශාලා පිළිබඳ ගෝලීය ස්ථානීය පද්ධති (GPS) පිහිටීම් යාවත්කාලීන කරන ලද අතර එම දත්ත අන්තර්ජාලගත දත්ත පද්ධතියට එක්කරන ලදී.

- *පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු නියමිත කර්මාන්ත ක්‍රියාකාරකම් / සේවා පිළිබඳ අවකාශීය දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම*

පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු නියමිත කර්මාන්ත ක්‍රියාකාරකම් සේවා / පිළිබඳ භූගෝලීය අවකාශීය දත්ත පද්ධතිය පර්යේෂණ හා සංවර්ධන ඒකකය විසින් මාසිකව යාවත්කාලීන කරනු ලැබේ. එම දත්ත පද්ධතියට අනුව 2018 වසර අවසානය වන විට මහා පරිමාණ දූෂකාරක ක්‍රියාකාරකම් සහිත කර්මාන්තයන් 13,058 ක් ද මධ්‍යම පරිමාණ දූෂකාරක ක්‍රියාකාරකම් සහිත කර්මාන්තයන් 10,601ක් ද ශ්‍රී ලංකාවේ ස්ථාපනය කර ඇත.

- *ගෝලීය ස්ථානීය පද්ධති (GPS) පදනම් කරගත් පරිසර තොරතුරු පද්ධතිය වැඩි දියුණු කිරීම සහ යාවත්කාලීන කිරීම*

රටෙහි කේන්ද්‍රීය පාරිසරික දත්ත පද්ධතිය මෙය වන අතර පාරිසරික සැලසුම්කරණය, කළමනාකරණය, පසුවිපරම් කිරීම, විශ්ලේෂණය, සංවර්ධන ව්‍යාපෘති සඳහා සුදුසු ස්ථාන හඳුනා ගැනීම, ආපදා සඳහා සූදානම්

වීමේ සැලසුම් සකස්කිරීම සහ දැනුවත් කිරීමේ වැඩසටහන් වැනි කටයුතු සඳහා මෙම දත්ත පද්ධතිය ප්‍රයෝජනවත් වේ.

- *ආංශික දිස්ත්‍රික් පාරිසරික පැතිකඩ ඇතුලත් CD සකස් කිරීම හා මුද්‍රණය කිරීම*

ආංශික දිස්ත්‍රික් පාරිසරික පැතිකඩයන්හී ඒ ඒ දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පාරිසරික තොරතුරු සහ සමාජ ආර්ථික තොරතුරු අඩංගු වේ. 2018 වර්ෂය තුළ මාතලේ, අම්පාර, වව්නියාව, මන්නාරම සහ මුලතිව් දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් පාරිසරික පැතිකඩ සකස් කර CD මුද්‍රණය කර ඇත.

**අනුකූලතා පසුවිපරම් ඒකකය**

අනුකූලතා පසුවිපරම් කිරීම, බලපත්‍ර නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබා දීමේ ක්‍රියාවලියේ මූලික අංගයකි. එසේම පරිසර ආරක්ෂණ බලපත්‍ර, උපලේඛණ ගත අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍ර (SWML), පරිසර බලපෑම් ඇගයීම් හා මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රමවේදයන්ට අදාල තත්වයන් හා කොන්දේසීන්ට අනුකූලව නියමිත ක්‍රියාකාරකම් / උපලේඛනගත අපද්‍රව්‍ය කලමනාකරණ ක්‍රියාකාරකම් / නියමිත ව්‍යාපෘතීන් ක්‍රියාත්මක වනවාද යන්න ක්‍රමානුකූලව පසු විපරම් කිරීමට යාන්ත්‍රණයක් බිහි කිරීම අත්‍යාවශ්‍ය වේ.

- *විධිමත් අනුකූලතා පසුවිපරම් ජාලයක් ස්ථාපනය හා ක්‍රියාත්මක කිරීම*
    - 2018 වර්ෂය තුල්දී, අනුකූලතා පසුවිපරම් ක්‍රියාවලිය ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන ලද්දේ පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රමවේදයට වන අතර පළාත් හා දිස්ත්‍රික් කාර්යාල මගින් පරිසර ආරක්ෂණ බලපත්‍ර පසුවිපරම් කිරීම් 12941 ක් සිදු කරන ලදී. එසේම පලාත් හා දිස්ත්‍රික් කාර්යාල මගින් සිදු කරනු ලබන පසු විපරම් ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය පරීක්ෂා කිරීම සඳහා අනුකූලතා පසු විපරම් ඒකකය මූලික වශයෙන් කැලණි ගංගා හා කළු ගංගා ද්‍රෝණි ආශ්‍රිතව පිහිටා ඇති කර්මාන්තයන් තෝරාගෙන පසු විපරම් කරන ලදී. එයට අමතරව, අනුකූලතා පසු විපරම් ඒකකය විසින් වෙනත් අදාල තාක්ෂණික ඒකකයන් හි සහයෝගය ඇතිව මධ්‍යම පරිසර අධිකාරියේ ඉහල කලමණාකාරිත්වයට දැනුම් දෙන නියමිත ක්‍රියාකාරකම් වලට අදාල පැමිණිලි සම්බන්ධයෙන් පසුවිපරම් සිදු කරන ලදී
    - මූලික පාරිසරික පරීක්ෂණ සහ උපලේඛනගත අපද්‍රව්‍ය කලමනාකරණ බලපත්‍ර (SWML) සඳහා අනුකූලතා පසුවිපරම් සැලසුම් සකස් කිරීම සඳහා මූලික පියවර ගනු ලැබීය

**විමර්ශන ඒකකය**

පොලිතින් තහනම සම්බන්ධ රෙගුලාසි හා පාරිසරික ගැටලු සම්බන්ධව විශේෂ විමර්ශන කටයුතු ක්‍රියාත්මක කිරීම විමර්ශන ඒකකයේ ප්‍රධාන කාර්යභාර වේ.

- *පොලිතින් රෙගුලාසි ක්‍රියාත්මක කිරීම*
    - ශ්‍රී ලංකා පොලිසියේ සහය ඇතිව මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන කාර්යාලය සහ පළාත් /දිස්ත්‍රික් කාර්යාල මගින් මුළු දිවයිනම ආවරණය වන පරිදි වැටලීම් සිදු කරන ලදී. 2018 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ වැටලීම් 10,327 ක් සිදු කර ඇත. රෙගුලාසි උල්ලංඝනය කිරීම් 810 ක් අනාවරණය කරන ලද අතර උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් නඩු 250 ක් ගොනුකරන ලදී
    - පාරිභෝගික කටයුතු අධිකාරිය සමග එක්ව නීතිවිරෝධී ආහාර ඇසුරුම් නිෂ්පාදනය කරන කර්මාන්තශාලා 17 ක් නිෂ්පාදන ක්‍රියාවලිය සිදුකරන අවස්ථාවේදීම වැටලීම් සිදු කරන ලදී. පාරිභෝගික කටයුතු පිළිබඳ පනතේ විධිවිධාන යටතේ එම නිෂ්පාදන තොග අත් අඩංගුවට ගන්නා ලද අතර විත්තිකරුට දඩය නියම වූ පසු මහේස්ත්‍රාත්වරුන්ගේ නියෝගයන්ට අනුව එම නිෂ්පාදන ප්‍රතිචක්‍රීකරණය කිරීම /විනාශයට පත් කිරීම සිදු කරන ලදී. නීතිවිරෝධී නිෂ්පාදන පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා මෙම ඒකාබද්ධ වැටලීම්වල තොරතුරු විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හරහා ප්‍රකාශයට පත්කරන ලදී
    - රාජ්‍ය ආයතන තුළ ක්‍රියාත්මක වන ආපනශාලා ද වටලන ලද අතර නීති විරෝධී ආහාර දවටන එම ආපනශාලාහි භාවිතා කරනු ලබන බව සොයා ගන්නා ලදි. එවැනි නිෂ්පාදන භාවිතා නොකරණ ලෙස සහ නීතියට අනුකූලව කටයුතු කරන ලෙස ඔවුන්ට ලිඛිතව දන්වන ලදී. එවැනි ආයතන 78 ක් හඳුනාගත් අතර ඒවා තවදුරටත් පසුවිපරම් කිරීම සිදු කරන ලදී
    - නීතිවිරෝධී නිෂ්පාදන පිළිබඳ විමර්ශන තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා, පොලිස් අධිකාරියේ 71 වන වගන්තිය යටතේ නීතිවිරෝධී නිෂ්පාදන අත්අඩංගුවට ගැනීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ බලය ශ්‍රී ලංකා පොලිසියට පැවරීමට තීරණය කර ඇති අතර ඒ අනුව නීති ඒකකය සමග එක්ව සකස් කරන ලද එම ලේඛන කෙටුම්පත අදහස් විමසීම සඳහා යොමුකොට ඇත

**පැමිණිලි ඒකකය**

පැමිණිලි කාර්යක්ෂමව මෙහෙයවීම සඳහා යාන්ත්‍රණයක් මධ්‍යම පරිසර අධිකාරිය සතුව ඇති අතර මධ්‍යම පරිසර අධිකාරියේ කළමනාකරණ කමිටු රැස්වීම්වලදී ප්‍රගතිය මාසිකව සමාලෝචනය කරනු ලැබේ.

- **මධ්‍යම පරිසර අධිකාරිය වෙත සෘජුව ලැබී ඇති පැමිණිලි කළමනාකරණය කිරීම**

2018 වර්ෂය තුළදී, මධ්‍යම පරිසර අධිකාරිය වෙත පැමිණිලි 2770ක් සෘජුවම ලැබී ඇත. එම පැමිණිලි වලින් පැමිණිලි 2131 ක් (77%) විසඳා ඇති අතර අනෙකුත් පැමිණිලි විසඳමින් පවතී

- **"මහජන පැමිණිලි කළමනාකරණ පද්ධතිය" හරහා ලැබුණු පැමිණිලි කළමනාකරණය කිරීම**

2018 වර්ෂය තුළදී මහජන පැමිණිලි කළමනාකරණ පද්ධතිය හරහා පැමිණිලි 495 ක් ලැබුණු අතර පැමිණිලි 348 ක් 70% විසඳන ලදී. පැමිණිලි විභාග කිරීම සඳහා ලැබී ඇති තොරතුරු ප්‍රමාණවත් නොවූ පැමිණිලි 5 ක් විමර්ශන ක්‍රියාවලියට යොමු නොකරන ලද අතර මෙම පද්ධතිය හරහා ලැබුණු පැමිණිලි 142ක් විසඳමින් පවතී

**නීති ඒකකය**

ජාතික පාරිසරික පනතේ නෛතික ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැපයීම මෙම ඒකකයේ ප්‍රධාන කාර්යය වේ.

- **නඩු පැවරීම්**

  නීති අංශය විසින් 2018 වර්ෂය තුළදී නඩු ගණනාවක් ගොනු කර විභාග කර අවසන් කරන ලදී .ඒ අනුව, මධ්‍යම පරිසර අධිකාරියට විරුද්ධව සහ මධ්‍යම පරිසර අධිකාරිය විසින් නඩු පවරා ඇති නඩු ගණන 445 ක් වන අතර අළුතින් නඩු 364කට අධික සංඛ්‍යාවක් ගොනුකොට ඇත

- 2018 වර්ෂය තුළදී, මධ්‍යම පරිසර අධිකාරියට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයන්හි, දිස්ත්‍රික් අධිකරණයන්හි, මහ අධිකරණයන්හි, ජෙයාෂ්ඨාධිකරයේ සහ අභියාචනා අධිකරණයේ විසඳීමට තිබෙන නඩු ගණන 60 කි

- **පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අවලංගු කිරීම අත්හිටුවීම හා නිකුත් කිරීම ,ප්‍රතික්ෂේප කිරීම**

  කාර්මාන්තශාලා වලින් සිදුවන පරිසර දූෂණය සලකා බලා, කර්මාන්තශාලා 56කට නිකුත්කොට ඇති පරිසර ආරක්ෂණ බලපත්‍ර අවලංගු කිරීමට සහ පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරමින් කර්මාන්තශාලා 152ක් සඳහා ලිපි යොමු කිරීමට මධ්‍යම පරිසර අධිකාරිය විසින් ක්‍රියාමාර්ග ගෙන ඇත

- **නීති නිවේදන**

  පරිසර දූෂකාරක කර්මාන්ත 195කට එරෙහිව 2018 වර්ෂයේදී නීති නිවේදන යොමු කොට ඇත

- **උපදේශක සේවා**

  අධිකරණයේ විභාග වෙමින් පවතින මධ්‍යම පරිසර අධිකාරියට එරෙහිව හා මධ්‍යම පරිසර අධිකාරිය මගින් පවරා ඇති නඩු සඳහා පිළිතුරු, ලිඛිත කරුණු, විරෝධතා දැක්වීම් සකස්කිරීම සඳහා නීති ඒකකයේ නිලධාරීන් විසින් නීතිපති දෙපාර්මේන්තුවේ උපදේශක සේවා 81ක් සඳහා සහභාගී විය

- **ජාතික පාරිසරික පනත සංශෝධනය කිරීම**

  ධාරිතාව මත පදනම් වූ බලපත්‍ර ක්‍රමවේදය හඳුන්වාදීම මගින් "දූෂකයා විසින්ම ගෙවීමේ මූලධර්මය (Polluter Pay principle)" තෙත්බිම් හා උපද්‍රවකාරී අපද්‍රව්‍ය සම්බන්ධ ප්‍රතිපාදන ජාතික පාරිසරික පනතට හඳුන්වාදීම සහ පවතින දඩුවම් දීම සම්බන්ධ ප්‍රතිපාදන ඉහල නැංවීම යන නව සංකල්ප හඳුන්වාදීමට නීති ඒකකය විසින් පියවර ගන්නා ලදී .මෙම සංශෝධන සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලද අතර යෝජිත සංශෝධන කෙටුම්පත් කිරීම සඳහා අනුමත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදී

## මධ්‍යම පරිසර අධිකාරිය ක්‍රියත්මක කරන ලද විශේෂ ව්‍යාපෘති

### "පිළිසරු" ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය

පිළිසරු ව්‍යාපෘතිය මගින් තිරසාර ලෙස සියලුම පළාත් පාලන අයතනයන්හි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතීන් සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලැබේ.

**2018 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් හි භෞතික ප්‍රගතිය.**

- ***පවත්නා කොම්පෝස්ට් අංගන, නව කොම්පොස්ට් අංගන සහ අනෙකුත් ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ ව්‍යාපෘති වැඩි දියුණු කිරීම් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැපයීම***

- ○ පළාත් පාලන සහ අනෙකුත් රජය ආයතන ඉල්ලීම් වලට අනුව නව ජීව වායු ඒකකයක් සහ නව අපද්‍රව්‍යය කළමනාකරණ ව්‍යාපෘතියක් සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන ලදි.
- ○ පවත්නා කොම්පෝස්ට් අංගන 28 ක්, ජීව වායු ඒකක 01 ක් සහ ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයක් වැඩි දියුණු කිරීම් සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන ලදි .
- ○ ***පළාත් පාලන ආයතන සඳහා උපකරණ, යන්ත්‍රෝපකරණ සහ අපද්‍රව්‍ය ප්‍රවාහනයට වාහන සැපයීම***
  මේ යටතේ බේල මැෂින් 6ක්, ට්‍රැක්ටර් සහ ටේලර් 05 ක් සහ කොම්පෝස්ට්කරණ යන්ත්‍ර 11 ක් මිලදී ගන්නා ලද අතර පළාත් පාලන ආයතන වෙත බෙදා හරින ලදී.
- ○ ***ගෘහස්ථ කොම්පෝස්ට් බඳුන් සහ කසල වෙන් කිරීමේ බඳුන් සැපයීම***
  මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා ගෘහස්ථ කොම්පෝස්ට් බඳුන් 300ක් බෙදා දෙන ලදී.
- ○ පාසල්, ආගමික ස්ථාන, රජය ආයතන සහ රජයේ ආරක්ෂක බලකායන් වෙත කසල බෙදා වෙන් කර තැබීමේ බඳුන් 1161 ක් බෙදා දෙන ලදී.
- ○ ***දැනුවත් කිරීම් සහ පුහුණු වැඩසටහන්***
  දැනුවත් කිරීම් සහ අධ්‍යාපනික වැඩසටහන් 09ක් පවත්වන ලදී.
  විශේෂ අවස්ථා 10 ක් ආවරණය කරමින් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.
  ව්‍යාපෘතියේ තෝරාගන්නා ලද නිලධාරීන් කිහිපදෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් 2ක් පවත්වන ලදී.

***ගම්පහ දිස්ත්‍රික් ඒකාබද්ධ කළමණාකරණ කසල කළමනාකරණ ව්‍යාපෘතිය - පෙතියාකන්ද***

"පිලිසරු" ව්‍යාපෘතිය යටතේ ගම්පහ දිස්ත්‍රික්කයේ පෙතියාකන්ද ප්‍රදේශයේ ඒකාබද්ධ කසල කළමනාකරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනු ලැබේ. එම ව්‍යාපෘතිය මගින් 2018 වසරේ දී පහත ක්‍රියාකාරකම් සිදුකරන ලදි.

- දිනකට මෙට්‍රික්ටොන් 05ක ධාරිතාවක් සහිත කොම්පෝස්ට් අංගනයක් ඉදිකිරීම
- "පුනරුදය" ප්‍රතිපාදන යටතේ දිනකට මෙට්‍රික්ටොන් 15ක ධාරිතාවයක් සහිත කොම්පෝස්ට් අංගනයක් ඉදිකිරීම
- අවශ්‍ය යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීම සඳහා අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියට මූල්‍යාධාර ලබා දීම
- ලීචේට් එකතු කිරීමේ ටැංකිය සහ පිරිසිදුකිරීමේ පද්ධතිය (Leachate collection tank & treatment system) ඉදිකිරීම

**ජාතික පරිසර නියමු වැඩසටහන (NEPP)**

මෙම වැඩසටහන, පාසල් පද්ධතිය හරහා තරුණ පරපුර වෙත නවීන පරිසර සංරක්ෂණ වැඩපිළිවෙළක් හඳුන්වාදීම අරමුණ කර ගනිමින් අධ්‍යාපන අමාත්‍යාංශය සමග එක්ව මධ්‍යම පරිසර අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබයි.

- ***"Eco Club" වැඩසටහන යටතේ පිරිනමනු ලබන සහතික පිළිබඳ තොරතුරු***




| | Northern | Southern | Western | Eastern | North Central | Uva | Central | Northwest | sabaragamuwa |
|---|---|---|---|---|---|---|---|---|---|
| Nature | 2113 | 1810 | 1505 | 284 | 329 | 208 | 692 | 378 | 195 |
| Bird | 5345 | 6882 | 4008 | 1306 | 2115 | 1566 | 3584 | 1022 | 1394 |
| Plant | 9731 | 12657 | 8756 | 9051 | 5521 | 6543 | 8825 | 6643 | 2416 |

- ***EPP* වැඩසටහන යටතේ පිරිනමන පදක්කම් පිළිබඳ විස්තර**




| | Northern | Southern | Western | Eastern | North Central | Uva | Central | Northwest | sabaragamuwa |
|---|---|---|---|---|---|---|---|---|---|
| Presidential | 3 | 14 | 10 | 6 | 6 | 26 | 10 | 8 | 10 |
| Gold | 108 | 73 | 192 | 98 | 26 | 108 | 33 | 96 | 76 |
| Silver | 1129 | 727 | 393 | 317 | 197 | 358 | 569 | 209 | 170 |
| Green | 4325 | 3524 | 1688 | 4148 | 1049 | 2013 | 3830 | 623 | 1768 |
| Pioneers | 9208 | 12068 | 12585 | 9090 | 6379 | 8458 | 17630 | 9557 | 10700 |

- ***මෙම වැඩසටහන යටතේ සංවිධානය කරන ලද පුහුණු වැඩසටහන්***
  - විදුහල්පතිවරුන් සඳහා පුහුණු වැඩසටහන් 12 ක් පවත්වන ලදී.
  - කලාපීය මට්ටමින් පරිසර නියමු වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන් 02 ක් පවත්වන ලදී.
  - දිස්ත්‍රික් මට්ටමේ පරිසර නියමු නායකයින් සඳහා පුහුණු වැඩසටහන් 05ක් පැවැත්වීම.
  - පරිසර නියමු වැඩසටහන සඳහා සක්‍රියව දායක වූ ගුරුවරුන් සඳහා නේවාසික පුහුණු වැඩසටහන් 02 ක් පවත්වන ලදී.
- ***නව වැඩසටහන් හඳුන්වා දීම***
  - සරසවි සිසුන්, කාර්මික විද්‍යාල සිසුන් සඳහා සහ පිරිවෙන් හා අනෙකුත් ආගමික සංවිධාන සඳහා පරිසර අධ්‍යාපන වැඩසටහන් හඳුන්වාදීම.
  - ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ විෂය නිර්දේශයට පරිසර නියමු සංකල්ප හඳුන්වා දීම

**ශ්‍රී ලංකාවේ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය (EDCF ව්‍යාපෘතිය)**

මෙම වැඩසටහන යටතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ කීරිකුලම, ගාල්ල දිස්ත්‍රික්කයේ මොණරෝවියාවත්ත, පොලොන්නරුව දිස්ත්‍රික්කයේ මීගස්වැව හා යාපනය දිස්ත්‍රික්කයේ කීරිමලේ යන ස්ථානයන්හි සනීපාරක්ෂක බිම් පිරවුම්හල් ඉදිකිරීමට සැලසුම් කර ඇත.

- ඉහත ස්ථානයන් සඳහා යටිතල පහසුකම් සැපයීමට පියවර ගෙන ඇත. මීට අමතරව අලි හානි අවම කිරීම සඳහා මීගස්වැව ප්‍රදේශයේ විදුලි වැටක් සහ ජීව වැටක් ඉදි කරන ලදි.
- මීගස්වැව සහ කීරිමලෙයි ව්‍යාපෘති සඳහා සමාජ මූලික අධ්‍යයනයන් සහ මහජන උපදේශන හා අනාවරණ වැඩසටහන (Public Consultation & Disclosure program) ක්‍රියාත්මක කිරීම සඳහා රජරට විශ්ව විද්‍යාලයට සහ යාපනය විශ්ව විද්‍යාලයට පර්යේෂණ දෙකක් ලබා දෙන ලදී. රජරට විශ්වවිද්‍යාලය සාර්ථකව පර්යේෂණය අවසන් කළ අතර අවසන් වාර්තාව 2018.09.21 දින ඉදිරිපත් කරන ලදී. එසේම යාපනය විශ්වවිද්‍යාලය විසින් 2018.12.15 දින අවසන් වාර්තා කෙටුම්පත ඉදිරිපත් කරන ලදී.
- 2018 නොවැම්බර් මස 26 වන දින සිට නොවැම්බර් 29 දින දක්වා කොරියානු Eximbank හි නියෝජිතයින් ශ්‍රී ලංකාව තුළ රැඳිසිටි අතර ව්‍යාපෘතියේ ප්‍රගතිය සම්බන්ධව විශේෂයෙන් සිවිල් වැඩ කොන්ත්‍රාත්තුව පිරිනැමීම සම්බන්ධයෙන් 2018 නොවැම්බර් 26 වන දින මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ දී දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලදී.
- මීට අමතරව, පාරිසරික මාධ්‍යවේදීන් සඳහා එක් දින වැඩමුළුවක් 2018.08.21 වන දින දොම්පේ සනීපාරක්ෂක කසල කළමනාකරණ භූමියේදී සංවිධානය කරන ලද අතර එය පිළිසරු ව්‍යාපෘතිය සහ මධ්‍යම පරිසර අධිකාරියේ මාධ්‍ය ඒකකය එක්ව සංවිධානය කරන ලදී.

### ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජල දේහයන්හි ජල තත්වය පසුවිපරම් කිරීම (JICA ව්‍යාපෘතිය)

තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘතිය යටතේ JICA විශේෂඥ කණ්ඩායමේ සහාය ඇතිව ඉහත ව්‍යාපෘතිය 2015 වසරේ මාර්තු මස සිට 2018 වසරේ පෙබරවාරි මස දක්වා කාල සීමාව තුල ක්‍රියාත්මක විය.

***වසර තුනක කාල පරිච්ඡේදය තුල මෙම ව්‍යාපෘතිය මඟින් සිදුකරනුලැබූ ප්‍රධාන කාර්යයන් පහත දැක්වේ.***

- ආංශික ජල තත්ව ප්‍රමිතීන් ගැසට් කිරීම.
- මධ්‍යම රසායනාගාරය සඳහා අවශ්‍ය රසායනාගාර උපකරණ සහ අනෙකුත් උපකරණ මිලදී ගැනීම.
- වසර තුනක කාලය තුළ ජල කළමනාකරණය, විද්‍යාගාර ප්‍රමිතිකරණය හා ජල දූෂණ පාලනය සම්බන්ධව ජපානයේ දී දින 10 ක පුහුණුවක් මධ්‍යම පරිසර අධිකාරියේ අනුකාරක සාමාජිකයින් 36 දෙනෙකු සඳහා ලබාදෙන ලදි.
- මධ්‍යම පරිසර අධිකාරියේ මධ්‍යම රසායනාගාරය සඳහා IS017025 රසායනාගාර ප්‍රමිතිකරණය ලබා ගැනීම.
- පාරිසරික ආරක්ෂණ බලපත්‍ර කලමනාකරණය සඳහා දූෂකාරක ප්‍රභව නාමාවලි (PSI) දත්ත පද්ධතිය සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- තොරතුරු කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම.
- 2018 වර්ෂයේ දී මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 1 ක් වෙන්කරන ලද අතර ව්‍යාපෘති අවසන් වැඩමුළුව 2018 පෙබරවාරි මාසයේ දී පවත්වන ලදි.

### ග්‍රීන් පාර්ක් සනීපාරක්ෂක කසල රඳවනය හා ඒකාබද්ධ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය

දොම්පේ කිරිඳිවැල පිහිටි මධ්‍යම පරිසර අධිකාරිය විසින් කළමනාකරණය කරනු ලබන ග්‍රීන් පාර්ක් සනීපාරක්ෂක කසල රඳවනය ලංකාවේ පලවෙනි සනීපාරක්ෂක කසල රඳවනයයි. මෙම මධ්‍යස්ථානය සනීපාරක්ෂක කසළ රඳවනයකින්, කොම්පෝස්ට් අංගනයකින් සහ පුහුණු මධ්‍යස්ථානයකින් සමන්විත වේ.

- 2018 වර්ෂයේ දී, සනීපාරක්ෂක කසල රඳවනය වෙත දොම්පෙ ප්‍රාදේශීය සභාව මඟින් කසල ටොන් 866.3 ක ප්‍රමාණයක්, කොළඹ මහ නගර සභාව මඟින් කසල ටොන් 4522 ක ප්‍රමාණයක් සහ ගම්පහ දිස්ත්‍රික්කයේ ඇති පලාත් පාලන ආයතන වලින් (බියගම ප්‍රාදේශීය සභාව, ගම්පහ නගර සභාව හා අත්තනගල්ල ප්‍රාදේශීය සභාව) කසල ටොන් 1686.4 ප්‍රමාණයක්ද බැහැරලීම සිදු කර ඇති අතර දොම්පෙ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් කර්මාන්තශාල මඟින් උපද්‍රවකාරී නොවන කාර්මික අපද්‍රව්‍ය ටොන් 656 කට ආසන්න ප්‍රමාණයක්ද කසල රඳවනය වෙත බැහැරලීම සිදු කර ඇත.





- කසල රඳවනය වෙත අමතර අපද්‍රව්‍ය භාර ගැනීමක් වශයෙන් 2018 වර්ෂයේදී වීදුරු පුළුන් ( Glass Wool ) ටොන් 25ක ප්‍රමාණයක් බැහැරලීම සිදු කර ඇත. එමෙන්ම දොම්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් කර්මාන්තශාලා වලට අමතරව, නිශ්චිත අපද්‍රව්‍ය වර්ග බැහැර කිරීම සඳහා ඉල්ලීම් කරන ලද කර්මාන්තශාලා කිහිපයක් වෙත මධ්‍යම පරිසර අධිකාරිය විසින් එකඟත්වය පලකරන ලද අතර ටොන් 185.2 ක අපද්‍රව්‍ය ප්‍රමාණයක් කසල රඳවනය බැහැරලීම සිදු කර ඇත.
- "ග්‍රීන් පාක්" යන වචනයේ අර්ථය නැවත ශක්තිමත් කිරමින්, භූමි අලංකරණය හා කාබනික එළවළු නිෂ්පාදනය වැඩිදියුණු කිරීම සාර්ථකව සිදු කරමින් පවතී. ඒ අනුව එළවළු නිෂ්පාදනයෙන් ලැබුණු ආදායම රු.215,000 ක් වන අතර අවම පොලී යටතේ ණය නිකුත් කිරීම සහ විවිධ අංගයන් සංවිධානය කිරීම මෙම ආදායමෙන් සිදු කරනු ලැබේ.




# ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය

ශ්‍රී ලංකාවේ මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තය සංවර්ධනය, ප්‍රවර්ධනය සහ නියාමනය සඳහා ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පිහිටුවා ඇත. අධිකාරිය විසින් මැණික් පතල් කැණීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම, මැණික් නිධි සොයා ගැනීම, ස්වර්ණාභරණ කර්මාන්තය නඟා සිටුවීමට දායක වීම, රන් ප්‍රමාණය නිශ්චය කිරීම, මැණික් පරීක්ෂා කිරීම සහ තක්සේරු කිරීම, මැණික් අපනයන කිරීමේ දී පහසුකම් සැලසීම යන කාර්යයන් සිදු කරනු ලබයි.

**අධිකාරිය විසින් සිදුකරන ලද ප්‍රධාන කාර්යයන් (2018.01.31 සිට 2018.12.31 දක්වා)**

## බලපත්‍ර නිකුත් කිරීම සහ නියාමනය

මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තය නියාමනය කිරීම සඳහා අධිකාරිය විසින් පහත සඳහන් බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

- මැණික් ගැරීම් බලපත්‍ර
- වෙළඳ බලපත්‍ර
- මැණික් කැපුම් බලපත්‍ර
- මැණික් වෙන්දේසි බලපත්‍ර
- මීට අමතරව අනවසර මැණික් ගැරීම් වැටලීම් සිදුකරනු ලබයි

**නියාමන ක්‍රියාකරකම් - බලපත්‍ර නිකුත් කිරීම සහ වැටලීම්**

| විස්තරය | 2018 පළමු කාර්තුව | 2018 දෙවන කාර්තුව | 2018 තෙවන කාර්තුව | 2018 සිව්වන කාර්තුව | 2018 වර්ෂය එකතුව | 2018 පළමු කාර්තුව | 2018 දෙවන කාර්තුව | 2018 තෙවන කාර්තුව | 2018 සිව්වන කාර්තුව | 2018 වර්ෂය එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | භෞතික ප්‍රගතිය (බලපත්‍ර සංඛ්‍යාව) | | | | | මූල්‍ය ප්‍රගතිය (ආදායම රු.මිලියන) | | | | |
| ගැරීම් බලපත්‍ර | 1189 | 862 | 1273 | 2208 | **5532** | **7** | **7** | **9** | **12** | **35** |
| වෙළඳ බලපත්‍ර | 2160 | 785 | 827 | 1023 | **4795** | **25** | **8** | **5** | **11** | **49** |
| කැපුම් බලපත්‍ර | 111 | 50 | 16 | 34 | **211** | **0.15** | **0.03** | **0.03** | **0.15** | **0.36** |
| වෙන්දේසි බලපත්‍ර | 153 | 63 | 103 | 96 | **415** | **0.3** | **0.14** | **0.24** | **0.32** | **1** |
| වැටලීම් | 490 | 313 | 473 | 353 | **1629** | **0.89** | **4.91** | **4.2** | **7** | **17** |

බලපත්‍ර නිකුත් කිරීම සහ වැටලීම්
මූලාශ්‍රය - සංඛ්‍යාලේඛන අංශය,ජා.මැ.සහ ස්ව.අ

## අපනයන කාර්යය සාධනය

මැණික් හා ස්වර්ණාභරණ අපනයනය මඟින් සිදු කරනු ලබන්නේ ශ්‍රී ලංකාවෙන් හමුවන මැණික් අපනයන කිරීම, ගෙවුඩ කට්ට අපනයනය කිරීම , විදේශ රටවලින් ආනයනය කරන රළු මැණික් ගල් කපා ඔපදමා නව වටිනාකමක් එකතු කර ප්‍රති අපනයන කිරීම, දියමන්ති සහ දියමන්ති එබ්බ වූ ස්වර්ණාභරණ ප්‍රති අපනයනය කිරීම යනාදියයි. මෙම අපනයන ක්‍රියාවලී කොළඹ ප්‍රධාන කාර්යාලයට අමතරව කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල පරිශ්‍රයේ තිබෙන කාර්යාලයෙන් හා රත්නපුර ගෙවුඩ මධ්‍යස්ථානය හරහා ද සිදුකරනු ලබයි. අපනයන වටිනාකම ලෙස හඳුන්වන්නේ අදාළ අපනයනයන් සඳහා වන තක්සේරු වටිනාකමයි.

මෙම මැණික් හා ස්වර්ණාභරණ අපනයන කිරීමේදී තක්සේරු කිරීම සහ අධිකාරිය විසින් සපයනු ලබන සේවාවන් සඳහා අපනයන වටිනාකමෙන් 0.5%ක සේවා ගාස්තුවක් අයකරනු ලැබේ. මෙලෙස අයකරගනු ලබන සේවා ගාස්තු මුදල අධිකාරියේ ප්‍රධාන ආදායම් අතරින් එකක් වේ.

2017 වසර අවසානය වන විට ශ්‍රී ලංකාවෙන් අපනයන වූ මැණික් හා ස්වර්ණාභරණ සඳහා ප්‍රධාන අපනයන ගමනාන්තය වූ (ගැණුම්කරු) රටවල් 5 වූයේ ඇමරිකා එක්සත් ජනපදය, ස්විට්සර්ලන්තය, ජපානය, ජර්මනිය සහ චීනයයි.

**මැණික් සහ ස්වර්ණාභරණ අපනයන වටිනාකම ( රුපියල් මිලියන)**

| විස්තරය | 2018 පළමු කාර්තුව | 2018 දෙවන කාර්තුව | 2018 තෙවන කාර්තුව | 2018 සිව්වන කාර්තුව | 2018 වර්ෂය එකතුව | 2018 පළමු කාර්තුව | 2018 දෙවන කාර්තුව | 2018 තෙවන කාර්තුව | 2018 සිව්වන කාර්තුව | 2018 වර්ෂය එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අපනයන වටිනාකම (රු.මිලියන) | | | | | අපනයන සේවා ගාස්තු (ආදායම රු.මිලියන) | | | | |
| මැණික් | 8615 | 4254 | 4156 | 4678 | **21,703** | 48 | 38 | 22 | 38 | **146** |
| ස්වර්ණාභරණ | 475 | 539 | 484 | 564 | **2062** | | | | | |
| රළු මැණික් ආනයනය හා ප්‍රති අපනයනය | 139 | 120 | 197 | 145 | **601** | | | | | |
| දියමන්ති ප්‍රති අපනයනය | 4326 | 4670 | 5134 | 5263 | **19,393** | | | | | |
| දියමන්ති ස්වර්ණාභරණ ප්‍රති අපනයන | 65 | 43 | 34 | 48 | **190** | | | | | |
| ගෙවුඩ/ගෙවුඩ කට්ට | 5 | 5 | 5 | 4 | **19** | | | | | |

මැණික් සහ ස්වර්ණාභරණ අපනයන වටිනාකම
මූලාශ්‍රය - සංඛ්‍යාලේඛන අංශය,ජා.මැ.සහ ස්ව.අ

**අපනයන ප්‍රවර්ධන කාර්ය සාධනය**

මැණික් සහ ස්වර්ණාභරණ සඳහා පවත්නා දේශීය වෙළඳපල මෙන්ම විදේශීය වෙළඳපල ද ප්‍රවර්ධනය කරමින් නව වෙළඳපලවල් කරා අපනයනකරුවන් යොමු කිරීම සිදුකරනු ලබයි. තවද නව ගෝලීය ප්‍රවණතා හඳුනාගෙන ඒ සම්බන්ධ දේශීය වශයෙන් පුහුණු වැඩමුළු පැවැත්වීම ද සිදුකර ඇත. විදේශීය ප්‍රදර්ශන සංවිධානය කිරීම මඟින් පහත සඳහන් ප්‍රතිලාභ අත්වේ.

1. විදේශීය මැණික් සහ ස්වර්ණාභරණ වෙළඳ සංගම් සහ රාජ්‍ය ආයතන සමඟ පවතින සම්බන්ධතා තහවුරු කර ගැනීම
2. වඩා වාසිදායක ව්‍යාපාරික පසුබිමක් සකස් කර දීම
3. ශ්‍රී ලංකාව නිල් මැණික් සඳහා අගනුවර යන විරුදාවලිය තවදුරටත් ප්‍රතිඨාපනය කිරීම
4. වෙළඳපළ පිළිබඳ දැනුවත් වීම හා අදාල කරුණු අපනයනකරුවන් වෙත ලබා දීම
5. විදේශීය ඇනවුම් ලබාගැනීම තුලින් විදේශ විනිමය වැඩිකර ගැනීම





ජාත්‍යන්තර ස්වර්ණාභරණ ප්‍රදර්ශනය ලන්ඩන්

- **හඳුනාගන්නා ලද නව වෙළඳපල - මියුනිච්, ජර්මනිය**

**2018.01.01-2018.12.31 දක්වා විදේශීය ප්‍රදර්ශන**

- ජාත්‍යන්තර ස්වර්ණාභරණ ප්‍රදර්ශනය - ටෝකියෝ
- හොංකොං ජාත්‍යන්තර දියමන්ති, මැණික් සහ මුතු ප්‍රදර්ශනය HKTDC
- JCK ලාස්වේගාස් ප්‍රදර්ශනය
- දකුණු සහ අග්නිදිග ආසියාතික ප්‍රදර්ශනය - කුන්මින්ග්
- ෂැංග්හයි ස්වර්ණාභරණ ප්‍රදර්ශනය
- මුනිච් ප්‍රදර්ශනය - ජර්මනිය
- චීන ජාත්‍යන්තර ස්වර්ණාභරණ ප්‍රදර්ශනය- බීජිං
- ලන්ඩන් ජාත්‍යන්තර ස්වර්ණාභරණ ප්‍රදර්ශනය
- 15වන CAEXPO ප්‍රදර්ශනය -චීනය නැනින්ග්
- චීන ජාත්‍යන්තර ආනයන ප්‍රදර්ශනය- ෂැංග්හයි

**2018.01.01-2018.12.31 දක්වා දේශීය ප්‍රදර්ශන**

- ආයු ලංකා ප්‍රදර්ශනය
- දිදුළ ප්‍රභා අධ්‍යාපනික ප්‍රදර්ශනය
- විද්‍යා සහ අධ්‍යාපනික ප්‍රදර්ශනය සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය
- ආයුර්වේද එක්ස්පෝ ප්‍රදර්ශනය
- V2020 ව්‍යවසායකත්ව ප්‍රදර්ශනය
- අධ්‍යාපනික ප්‍රදර්ශනය - ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලය
- ෆැසට්ස් ජාත්‍යන්තර ප්‍රදර්ශනය
- ජුවෙල්ස් ප්‍රදර්ශනය
- අධ්‍යාපනික ප්‍රදර්ශනය - ලීඩ්ස් ජාත්‍යන්තර පාසල










ජාත්‍යන්තර ස්වර්ණාභරණ ප්‍රදර්ශනය ටෝකියෝ -

අධිකාරිය ආරම්භකර වසර 25ක් සපිරීම නිමිතිකොට ගෙන මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රකරුවන් අගයමින් අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති සම්මාන උළෙලක් 2018.11.23 දින කොළඹ ෂැංග්‍රිලා හෝටලයේදී පැවැත්විණි.

එහිදී පාසල් ළමුන් සඳහා පැවැත්වූ දීප ව්‍යාප්ත ගද්‍ය, පද්‍ය චිත්‍ර තරඟයන්හි ජයග්‍රාහික -ජයග්‍රාහිකාවන් වෙත ත්‍යාග සහ සහතික පත් බෙදා දීමද මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ නිපුණයන් සඳහා රන්,රිදී ලෝකඩ සම්මාන ලබාදීමද අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණි.








Silver Jubilee
2018
NATIONAL GEM AND JEWELLERY







### මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තයේ අපනයන ප්‍රවර්ධනය සඳහා පවත්වන ලද විදේශීය දූත මණ්ඩල හමු

ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය මගින් පහත සඳහන් දූත මණ්ඩල හමු පවත්වන ලදී. මෙමගින් ගැනුම්කරුවන් හඳුනාගැනීම හා අදාළ රටේ රාජ්‍ය ආයතන හා සම්බන්ධවීම මගින් ව්‍යාපාරික සබඳතා පුළුල් කර ගත හැකි වේ.

- ඉන්දුනීසියානු දූත මණ්ඩල හමුව
- මියන්මාර් දූත මණ්ඩල හමුව
- ජපන් ජාතික දූත මණ්ඩල ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියට පැමිණීම
- නිපෝන් මාරු දූත මණ්ඩල සුහද හමුව


නිපෝන් මාරු දූත පිරිස සමඟ සුහද හමුව

සෑම මසකම සෙරන්ඩිබ් සඟරාව තුලින් වෙළඳ ප්‍රචාරණ කටයුතු සිදු කරණු ලබයි.







කර්මාන්තයේ සංවර්ධනය උදෙසා පවත්වන ලද වැඩමුළු

- මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ අලෙවිකරණ පැතිකඩ පිළිබඳ මැණික් සහ ස්වර්ණාභරණ පර්යේෂණ ආයතනය සඳහා වැඩමුළුවක් පැවැත්වීම.
- මුලටියාන ප්‍රදේශයේ ස්වර්ණාභරණ නිමැවුම්කරුවන් 100 දෙනෙක් සඳහා ස්වර්ණාභරණ නිෂ්පාදනය පිළිබඳ වැඩමුළුවක් පැවැත්වීම.





ස්වීඩන් ජාතික ජොහැනස් ඔස්ටර්ඩියස් මහතා විසින් පවත්වන ලද සමුළුව

- ශ්‍රී ලංකාවේ මැණික් කැපීම යුරෝපීය වෙළඳපලට වඩා යහපත් ලෙස ඉදිරිපත් කිරීම සම්බන්ධව වැඩසටහනක් කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී ශ්‍රී ලංකාවේ මැණික් සහ ස්වර්ණාභරණ ආයතන 60කට ආසන්න ප්‍රමාණයක සහභාගීත්වයෙන් පවත්වන ලදී. මේ සඳහා සම්පත් දායකයා ලෙස ස්වීඩන් ජාතික ජොහැනස් ඔස්ටර්ඩියස් (Mr. Johannes Orstadius) මහතා සම්බන්ධ විය.

**ඉඩම්,කැණීම් සහ පරිසර අංශයේ කාර්ය සාධනය**

පරිසර හිතකාමී මැණික් ගැරීම් ක්‍රමවේදයන් පවත්වාගෙන යාම ක්‍රියාකාරකම යටතේ පහත සඳහන් භූමි සහ ඉල්ලම් වෙන්දේසි 30ක් සිදු කර ඇත.

**2018.01.01 සිට 2018.12.31 දක්වා**

- බලංගොඩ කල්තොට පාර 22/4 පාලම
- කහවත්ත පැල්මඩුල්ල මැණික් ඉල්ලම් වෙන්දේසිය
- කරද-සිරිසමන්පුර පාර මැණික් ඉල්ලම් වෙන්දේසිය
- කෙසෙල්වත්ත ආරව කුඹුක්කන් ඔය මැණික් ඉල්ලම් වෙන්දේසිය
- වැලිකඩගම මහතැන්න ජලවිදුලි බලාගාරය වෙන්දේසිය
- බලංගොඩ කල්තොට පාර සහ හංගමුව මැණික් වෙන්දේසිය
- කෙහෙල්ඕවිටියාගම මැණික් ඉල්ලම් වෙන්දේසිය
- ගබ්බෙල මැණික් ඉල්ලම් වෙන්දේසිය
- මිල්ලැකඩේ මැණික් ඉල්ලම් වෙන්දේසිය
- කොළඹගේ ආර මැණික් ඉල්ලම් වෙන්දේසිය
- කනුග්ගල මැණික් ඉල්ලම් වෙන්දේසිය
- කළු ගඟ මැණික් ඉල්ලම් වෙන්දේසිය
- එරබැද්ද මැණික් ඉල්ලම් වෙන්දේසිය
- නාවුල විවිධ ප්‍රදේශ වලින් අධිකාරිය භාරයට ගන්නා ලද ඉල්ලම් වෙන්දේසිය
- බකමූණ මැණික් කර්මාන්තය නඟා සිටුවීමේ වැඩසටහන යටතේ සිදුකල ඉල්ලම් වෙන්දේසිය
- හංගමුව-රඹුක්කන්ද මාර්ගය සංවර්ධනයේදී මතුවූ ඉල්ලම් වෙන්දේසිය
- නුවරඑළිය, අඹගමුව ප්‍රා.ලේ. බල ප්‍රද්ශයේ නෝර්වුඩ් ඇල සංවර්ධනයේදී මතුවූ ඉල්ලම් වෙන්දේසිය
- ශාන්ත ජෝකීම් වත්ත බිම් කොටස් 2ක් වෙන්දේසි කිරීම
- රත්නපුර කලවාන ප්‍රෙද්ශයේ අධිකාරියේ භාරයට ගන්නා ලද ඉල්ලම් ලොට් 2ක් වෙන්දේසි කිරීම
- ඇහැළියගොඩ සිරි සමන්පුර- මැදගම කෙකටිය දෙ හරහා පාලම ඉදිකිරීමට සමගාමීව මතුවන මැණික් ඉල්ලම් ඉවත් කිරීම සඳහා මිළ ගණන් කැඳවීම
- ඇහැළියගොඩ මාටුවාගල ප්‍රදේශයෙන් අධිකාරිය භාරයට ගන්නාලද ඉල්ලම් ලොට් 10ක් වෙන්දේසිය
- ශාන්ත ජෝකීම් වත්ත වෙන්දේසිය

විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යටතේ ආර්ථික වටිනාකමකින් වැඩි මැණික් පිහිටා තිබෙන පාරිසරික සංවේදී ස්ථානවල පරිසර හිතකාමී ලෙස පහත ව්‍යාපෘතීන් සිදුකරන ලදී.

- උඩවලව
- හද්දුවවත්ත
- බගවන්තලාව



හද්දුවවත්ත විශේෂ මැණික් ගැරීම් ව්‍යාපෘතිය



පෞද්ගලික පතල් සඳහා උපදේශන සේවා සැපයීම

පරිසර හානියට පත්වූ පහත සඳහන් භූමි ප්‍රදේශ පුනරුත්ථාපනය.

- බගවන්තලාව වැපල්ටන් වෙන්දේසි පතල් බිම වැසීම
- කුරුවිට හුණුගල්දෙණිය පතල් වල වැසීම
- බගවන්තලාව ශාන්ත ජෝකීම්වත්ත පතල්වල වැසීම
- මාතර කැකණඳුර විජයාබා විද්‍යාලයේදී පාරිසරික වැඩසටහන් පැවැත්වීම

මැණික් පතල් කම්කරුවන්ගේ ජීවන තත්වය නගා සිටුවීම සඳහා ඔවුන්ගේ පාසල් යන වයසේ ළමුන් සඳහා ශිෂ්‍යත්ව ලබා දිම. 2018 වසරේදී ළමුන් 272 දෙනෙකුට ශිෂ්‍යත්ව මුදල් ලබාදෙන ලදී.

වන්දි මුදල් යොජනා ක්‍රමය යටතේ මැණික් පතල්වල වැඩකිරීමේ දී මියගිය පුද්ගලයන් තිදෙනෙකුට වන්දි මුදල් ලබාදීම.

**මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තයේ ඉදිරි සංවර්ධනය උදෙසා ගන්නා ලද ක්‍රියාමාර්ග**

1. රත්නපුර, නාඋල ප්‍රදේශ සහ ඌව පළාත් මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තකරුවන්ගේ හා ව්‍යාපාරිකයන්ගේ ගැටළු සාකච්ඡා කිරීමේ හමුවක් පවත්වන ලදී. එම සාකච්ඡාවලදී මතුවූ කරුණු මත කඩිනමින් බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා ලදී.
   ★ මෙම වැඩසටහනට අනුව ඇළහැර, බකමූණ සහ ලග්ගල ප්‍රදේශයේ මැණික් පතල් කැණීම සඳහා බලපත්‍ර ලබා ගැනීමට ජංගම සේවයක් පැවැත්වූ අතර එම ජංගම සේවය මඟින් ගැරීම් බලපත්‍ර සඳහා අයදුම් පත් 610ක් නිකුත් කරන ලදී.




2. විගණනය සම්බන්ධ වැඩමුළුවක් ගරු විගණකාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ සේවක මහත්ම/මහත්මීන් උදෙසා පැවැත්වීම.




3. ශ්‍රී ලංකාවේ දීප ව්‍යාප්තව පවතින මැණික් නිධි සහිත ඉඩම් හඳුනාගැනීම සහ සිතියම් ගත කිරීම සම්බන්ධයෙන් පේරාදෙණිය විශ්ව විද්‍යාලය සමඟ සාකච්ඡාවක් පැවැත්වීම.
4. දිවයිනේ සෑම දිස්ත්‍රික්කයකම දිස්ත්‍රික් කාර්යාල ආරම්භ කිරීම සඳහා යෝජනාවලියක් සකස්කර ඇත.
5. සියළු පහසුකම් වලින් සපිරි නව ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සම්බන්ධව අවශ්‍ය මූලික අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කරමින් පවතී.

**මූල්‍ය සාරාංශය**






# මැණික් සහ ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය පිහිට වූ 1995-07-28 දිනැති අංක 882 දරණ ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයට අනුව මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයෙහි සංවර්ධනය සඳහා සහාය වීම වෙනුවෙන් පර්යේෂණ අංශය මගින් පහත සඳහන් බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා 2018 ව්‍යාපෘති හා වැඩසටහන ක්‍රියාවට නැංවිණි.

- ශ්‍රී ලංකාවේ මැණික් ඛනිජ පිළිබඳ සමීක්ෂණයන් කිරීම
- මැණික් ගල් අනර්ඝීකරණය කිරීමේ ක්‍රම හා අදාල රත්න විද්‍යාත්මක පර්යේෂණ කිරීම
- මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සංවර්ධනය කිරීමෙහි ලා නවෝත්පාදන සිදු කිරීම
- වැඩමුළු සම්මන්ත්‍රණ පැවැත්වීම සහ පොත්පත් පල කිරීම

## ශ්‍රී ලංකාවේ මැණික් නිධි ගවේෂණය හා තක්සේරුව ව්‍යාපෘතිය

මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සඳහා අතීතයේ සිටම ශ්‍රී ලංකාව අද්විතීය නාමයක් හිමිකරගෙන සිටින අතර අදටත් මෙරටට ඉහළම ආදායම් ගෙන එන කර්මාන්ත 5 අතර මෙම කර්මාන්තය පවතී.එම නිසා රටේ ආර්ථිකයේ උන්නතිය උදෙසා දීප ව්‍යාප්තව ඇති මැණික් නිධි හඳුනාගැනීම හා උකහා ගැනීම අතිශයින් වැදගත්ය.

එම අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා පරිසර හිතකාමී මැණික් පතල් කැණීමේ නිවැරදි ක්‍රමවේදයන් හඳුන්වා දීම සහ ශ්‍රී ලංකාවේ තිරසර මැණික් පතල් කැණීම් කර්මාන්තයක් සඳහා මාර්ගෝපදේශ සැකසීම වෙනුවෙන්, මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය, “ශ්‍රී ලංකාව තුළ මැණික් නිධි ගවේෂණය හා තක්සේරුව” නව ව්‍යාපෘතිය කැබිනට් අනුමැතිය යටතේ ක්‍රියාත්මක කරයි. මෙම වසර තුල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05ක් සඳහා මැණික් විභව සිතියම් නිර්මාණය කරන ලදී.

### හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

හපුතලේ කොට්ඨාසයේ මැණික් නිධි උමා ඔයෙහි හා වෙලි ඔයෙහි අතු ගංගාවන් ආශ්‍රිතව ද්විතීයික නිධි ලෙස ඇල්ලගම, අලුත්වෙල, දියතලාව, තොටලාගල, හොරදොරොව්ව ප්‍රදේශ වල හමුවේ. රංජල්ලාව, *මැණික් කන්ද* නම් ස්ථානය ප්‍රාථමික නිධියක් බවට නිගමනය කල හැකි අතර එහි නාය තැන්පතුවක් වියහැකි මැණික් තැන්පතු “වැව” ප්‍රදේශයෙන් හමුවේ. හපුතලේ මැණික් විභවතාව ඉහළ ප්‍රදේශ 04ක් හඳුනාගෙන ඇත. මූලිකව සැකසූ මැණික් විභවතා සිතියම ඉහත පරිදි වේ.



### හල්දුම්මුල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය

ක්ෂේත්‍ර ගවේෂණය, අධ්‍යයනය හා පරීක්ෂණාගාර අධ්‍යයනයන් මගින් හඳුනාගත් මැණික් විභවතා සිතියම් සකස් කරන ලද අතර එහිදී පහත සඳහන් මැණික් විභවතාව ඉහල ක්ෂේත්‍ර හඳුනාගන්නා ලදී.

1. කොටබක්ම මැණික් ක්ෂේත්‍රය
2. වෙලිඔය මැණික් ක්ෂේත්‍රය
3. ගම්පහ මැණික් ක්ෂේත්‍රය
4. නිකපොත මැණික් ක්ෂේත්‍රය
5. අක්කර සීය මැණික් ක්ෂේත්‍රය
6. දිවුල්ගස්මුල්ල මැණික් ක්ෂේත්‍රය
7. කොස්ගම මැණික් ක්ෂේත්‍රය
8. හරන්කහව මැණික් ක්ෂේත්‍රය
9. කොස්ලන්ද මැණික් ක්ෂේත්‍රය
10. රණසිංහගම මැණික් ක්ෂේත්‍රය



මෙම දිනවල හඳුනාගන්නා ලද මැණික් ක්ෂේත්‍ර තවදුරටත් තහවුරු කිරීම හා මැණික් විභවතා සිතියම සැදීම අවසන් කරමින් පවතී.




**සෙවණගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**

සෙවනගල - ගිනිගල් පැලැස්ස ප්‍රදේශයේ ආර්ථික වටිනාකමක් ඇති පළිඟු පාෂාණ (Sepentinite) නම් පාෂාණ නිධියක් හමුවිය. එම නිධිය 10m ක් වැනි ප්‍රදේශයක් තුළ කුඩා ගල් කුට්ටි ලෙස විසිරී පවතින අතර යම් ප්‍රදේශ වල අඩි 10ක් තරම් ගැඹුරකට දිවේ. මෙම පාෂාණ නිධියේ මතු පිටට විවෘත වී ඇති කොටස් ජීර්ණය වීමට ලක්වී ඇති නමුත් අභ්‍යන්තරයට දිවෙන පාෂාණ බාහිර බලපෑම් වලට ලක් නොවන බැවින් නොදිරූ තත්ත්වයේ පවතින බව සිතිය හැක. තවද, මෙම පළිඟු පාෂාණ ආශ්‍රිතව බොහෝවිට කහඳ (Chert) දක්නට ලැබුණු අතර කොළ පැහැ ඛනිජයක් ද යම් ස්ථාන වල සෑදී ඇති බව නිරීක්ෂණය කෙරිණි. ක්ෂේත්‍ර ගවේෂණයෙන් හා රසායනාගාර පරීක්ෂණ වලින් රැස් කර ගත් තොරතුරු පදනම් කර ගනිමින් මැණික් විභවතා සිතියම සකස් කරන ලදී. එහිදී මැණික් විභවතාව ඉහල ක්ෂේත්‍ර 07ක් හඳුනා ගන්නා ලදී.

01 වැලි ආර මැණික් ක්ෂේත්‍රය
02 මහගම මැණික් ක්ෂේත්‍රය
03 හබරුගල ආර මැණික් ක්ෂේත්‍රය
04 ගල්වල ආර මැණික් ක්ෂේත්‍රය
05 හබරලු වැව මැණික් ක්ෂේත්‍රය
06 නුගගලයාය මැණික් ක්ෂේත්‍රය
07 හබරලු ආර මැණික් ක්ෂේත්‍රය



**කතරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**

මේ වනතෙක් කල අධ්‍යයනයන්ට අනුව, කතරගම කොට්ඨාශයේ ප්‍රාථමික නිධිවලට වඩා බහුලව පවතින්නේ ද්විතියික මැණික් නිධිය. මෙම නිධි වල ප්‍රභවය ලෙස මැණික් ගඟ හැඳින්විය හැක. මැණික් ගඟ දෙපස ඇති කුඹුක් ගස් වල මුල් පද්ධතිය මඟින් ගඟේ ඉවුරු සම්පූර්ණයෙන්ම ආවරණය වී ඇති අතර ගං පතුල සෑදී ඇත්තේ යටි පාෂාණ වලිනි. එබැවින් මැණික් ගඟ ආශ්‍රිත අවසාදිත පවතින්නේ ඉතා සීමිත ප්‍රමාණයක් පමණි. කෙසේ වුවද, ගඟෙහි ගැඹුර වැඩි ස්ථාන වල සැලකිය යුතු අවසාදිත ප්‍රමාණයකින් සැදුණු නිධි දක්නට ලැබේ. තවද, වැඩිහිටි කන්ද පාමුල බොහෝ පතල් කැණීම් සිදුවන අතර ඒ ආශ්‍රිතව ඉපැරණි ඇළ මාර්ග තිබී ඇති බවට සලකුණු ද දක්නට ලැබේ.

**තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**

තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල මූලික හා ද්විතීයික ක්ෂේත්‍ර ගවේෂණ කටයුතු අවසන් කර ඇති අතර විද්‍යාගාර අධ්‍යයන කටයුතුද සිදු කර ඇත. මැණික් විභව සිතියම පිළියෙල කිරීමට අවශ්‍යව තිබූ භූ විද්‍යාත්මක සිතියම් ලබා ගැනීමේ ප්‍රමාදයක් සිදු වුවද මේ වන විට එම සිතියම් ද ලබා ගෙන ඇත. (Digital Copies) ඒ අනුව මෙම වසර අවසන් වන විට තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මැණික් විභව සිතියම හා වාර්තාව අවසන් කිරීමට නියමිතය.

ප්‍රතිලාභ

මෙතෙක් හඳුනාගෙන නොමැති මැණික් නිධි අනාවරණය මගින් ජාතික ආර්ථිකය නැංවීම මෙම ව්‍යාපෘතියෙන් අත්කර ගත හැකි ප්‍රතිලාභය වේ.

## තිරසර ලෙස මැණික් සම්පත් ලබා ගැනීම

### ශ්‍රී ලංකාවේ මැණික් නිධි රසායන විද්‍යාත්මක හා ඛනිජ විද්‍යාත්මක ලක්ෂණ විශ්ලේෂණය

මහවැලි ගඟ ආශ්‍රිතව හා කළු ගඟ ආශ්‍රිතව ඇති මැණික් තැන්පතු වල ඛනිජ විද්‍යාත්මක, භූ රසායනික විද්‍යාත්මක, අධ්‍යයනයන් සිදු කිරීම හා එමගින් මැණික් විභවතාවයන් හඳුනාගැනීම සඳහා භාවිතා කල හැකි නව ක්‍රමවේදයක් හඳුන්වා දීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි.

මූල ද්‍රව්‍ය අතර සම්බන්ධතා අධ්‍යයනයේදී පැහැදිලි වූයේ Ba:Zr, Ba:Co, Nb:Cr, Nb:Sr, Th:Ba, Ba:Cu, Cu:Th, Rb:Zr, Rb:Th, Rb:Cu සහ Rb:N යන මූල ද්‍රව්‍ය අතර >0.75 වැඩි සහ සම්බන්ධතාවයක් පවතින බවයි. මෙම සහ සම්බන්ධතා මැණික් විභවතාවන් අධ්‍යයනය සඳහා යොදා ගත හැකි අතර විශාල සාම්පල ප්‍රමාණයක් අධ්‍යයනය මගින් තහවුරු කිරීමක් කල යුතුය.

ප්‍රතිලාභ

ඉහත අධ්‍යයනය මගින් තහවුරු වූයේ රසායනික ක්‍රමවේදය මගින් මැණික් විභවතාව ඉතා හොඳින් හඳුනාගැනීමේ හැකියාවක් පවතින බවයි. ඒ අනුව මෙම අධ්‍යයනය සාම්පල ප්‍රමාණය වැඩි ප්‍රමාණයක් මගින් තහවුරු කිරීම මගින් නිවැරදිව මැණික් සහිත ස්ථාන හා මැණික් විභවතාවය අඩු ස්ථාන වෙන් කර හඳුනාගැනීම සඳහා මෙවලමක් ලෙස යොදා ගැනීමේ හැකියාවක් පවතී.

### ශාක වලට අවශ්‍ය වන පෝෂක ද්‍රව්‍ය ක්‍රමානුකූලව ලබා දිය හැකි ඛනිජ ද්‍රව්‍ය බහුල කොහු බත් මිශ්‍රිත පෝෂක මාධ්‍යයක් හඳුන්වා දීම

සීනි නිෂ්පාදනයේ අතුරු ඵලයක් වන මොලැසස් බැක්ටීරියා වියෝජනයකට, ලක්කර ඇසිටික් අම්ලය නිපදවීම මගින් මාධ්‍යයේ pH අගය වැඩි කර මෙම ඛනිජ ද්‍රව්‍ය වලින් මූල ද්‍රව්‍ය මුදාහැරීමේ වේගය වැඩි කිරීම පිළිබඳ අධ්‍යයනය සිදු කරනු ලැබීය.එහි දත්ත විශ්ලේෂණයට අනුව ප්‍රතිඵල පහතින් දක්වා ඇත.

මෙහි පර්යේෂණ කටයුතු තව දුරටත් සිදුවෙමින් පවතින අතර දැනට මෙම පෝෂක ද්‍රව්‍ය අඩංගු කොහු බත් මිශ්‍රණය ගඩොලක ආකාරයෙන් නිර්මාණය කරනු ලැබූ අතර එම මාධ්‍යයේ ශාක වර්ධනය පිළිබඳ නිරීක්ෂණ කටයුතු සිදු වෙමින් පවතී.




ඛනිජ ද්‍රව්‍ය හා කොහුබත් මිශ්‍රණය

## මැණික් ගල් අනර්ඝීකරණය කිරීමේ ක්‍රම හා අදාල රත්න විද්‍යාත්මක පර්යේෂණ කිරීම

### ක්ෂුද්‍ර ජීවීන්ගේ වර්ධනය සඳහා තෝරමල්ලි (Tourmaline) කුඩු වලින් සිදුවන බලපෑම අධ්‍යයනය කිරීම

මෙම පර්යේෂණ ව්‍යාපෘතියේ අරමුණ වූයේ ශ්‍රී ලංකා වේ පවතින දැනට ප්‍රයෝජනයට ගෙන නොමැති තොරමල්ලි ජෛව විද්‍යාත්මක යෙදවුම් සහ උපරිම ප්‍රයෝජනයක් ගැනීම සඳහා *Bifidacterium bifillum* බැක්ටීරියාවේ වර්ධන වේගය උත්තේජනය සඳහා යොදා ගැනීම මගින් උපරිමව ප්‍රයෝජනයට ගැනීමයි.



කාලය සමඟ *Bifidacterium bifillum* බැක්ටීරියාවේ වර්ධනය පහත රූපසටහන 3 මගින් පෙන්වාදිය හැක. එහිදී පෙනී යන්නේ බැක්ටීරියාවන්ගේ වර්ධනය තෝරමල්ලි මගින් කැපීපෙනෙන ලෙස වර්ධනය වන බවයි. එය ලෝකයේ ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා නව සොයාගැනීමක් වනු ඇත. ඒ සඳහා ජාත්‍යන්තර පේටන් බලපත්‍රයද ලබාගත හැක.

තෝරමල්ලි කුඩු දමන හා නොදමන ද්‍රාවණ අඛණ්ඩව දින කීපයක් සෙලවීමට සලස්වා ඇති අයුරු




Bifidacterium bifillum බැක්ටීරියාවේ වර්ධනය සඳහා
තෝරමල්ලි කුඩු වලින් සිදුවන ආකාරය.

### අවර්ණ පඩියන් සඳහා Co විසරණය කිරීම

ශ්‍රී ලංකාවේ දෙවනුව වැඩිපුරම හමුවන මැණික් ඛනිජ අතර පදියං ප්‍රමුඛවේ. සාමාන්‍යයෙන් සිදු වනුයේ මෙම අවර්ණ පදියං වර්ණ වැඩි දියුණු කිරීමකින් තොරව අපනයනය කිරීමයි. එම නිසා ශ්‍රී ලංකාවේ මැණික් සම්පතින් උපරිම ප්‍රයොජනය ගැනීම සඳහා මෙම අවර්ණ පදියං වල වර්ණ වැඩි දියුණු කිරීම වැදගත් වේ. එනයින් මෙම පර්යේෂණයේ අරමුණ ඒ සඳහා සරල, අඩු වියදම් හා හානිදායක නොවන වර්ණ වැඩි දියුණු කිරීමේ කමයක් සොයා ගැනීමයි.




රත්නපුර ප්‍රදේශයේ තත්ත්වයෙන් අඩු මැණික් වල ව්‍යාප්තිය




**තාප පිරියම්** ක්‍රියාවලිය සැකවින්




විසරණය කරන ලද නිල්පඩියං

ප්‍රතිඵල වලින් පැහැදිලිව පෙනීයන්නේ $Co^{2+}$ විසරණය කිරීම මඟින් අවර්ණ පදියං නිල් පැහැ කිරීම සඳහා ඉහල විභවතාවයක් පවතින බවයි. මෙහිදී පදියං වල නිල් පැහැය ලබා ගන්නේ 950°C යටතේ පැය 11ක් පුරා $Co^{2+}$ විසරණය කිරීම මඟිනි. ලැබෙන නිල් පැහැයෙහි තීව්‍රතාවය තීරන්ය වන්නේ විසරණය කෙරෙන $Co^{2+}$ සාන්ද්‍රණය මඟිනි. මෙම පර්යේෂණ ප්‍රතිඵල පදනම් කර ගනිමින් මැණික් ක්ෂේත්‍රයේ නියැලෙන්නන් දැනුවත් කිරීම මඟින් මෙතෙක් භාවිතයට නොගන්නා අවර්ණ පඩියං සඳහා හොඳ වටිනාකමක් ඉදිරියේදී ලබා දිය හැක.

### ගැමා විකිරණ පිරියම් කිරීම මගින් ලබා ගන්නා පුෂ්පරාග පිළිබඳව විද්‍යාත්මකව අධ්‍යයනය කිරීම

කහ පැහැයෙන් අඩු පුෂ්පරාග නියැදි රත්නපුර අවට ප්‍රදේශයෙන් මිලදී ගන්නා ලදි. එම නියැදි සියල්ලම විකිරණය කරන විකිරණ ප්‍රමාණය ගයිගර් මුලර් විශ්ලේෂකය මගින් අධ්‍යනය කරන ලදි. එයින් නියදි 10ක් වෙළඳපොලේ සාමාන්‍ය ලෙස පිරියම් කිරීම සිදු කර නියෝජිතයකු මඟින් පිරියම් කිරීම සිදුකරන ලදි. විකිරණ පිලියම් කිරීමෙන් පසුව එම නියදි පිටකරන විකිරණ අධ්‍යනය කරන ලදි.
මෙම සියළු නියදි විකිරණ පිළියම් කිරීමට පෙර හා පසු අවශේෂ වර්ණාවලියක් (Raman, UV-VIS-NIR හා FTIR) විශ්ලේෂණය කරන ලදි. පිරියම් කරන ලද හිරු එළියේ හා UV කිරණ වලදී වර්ණයේ ස්ථායීතාවයද අධ්‍යනය කරන ලදි.

ඒ අනුව විකිරණ පිළියම් කිරීම මගින් තද කහදුඹුරු පැහැයක් දක්වා වර්ණය වැඩි දියුණු විය.




**විකිරණ පිළයම් කිරීම මඟින් වර්ණය වැඩිදියුණු වී ඇති අයුරු**

මෙම පිරියම් කිරීම සිදුකරන ලද මැණික් ගල් වෙළඳපොලෙහි සැරිසරනු ලබයි. ඒවායින්ද අහිතකර කිරණ පිටකරනු ඇතැයි අනිසි බියක් තිබුණි. එහෙත් මෙම පර්යේෂණයෙන් එය පහව යයි. මෙම වර්ණය ස්ථායි කිරීම පිළිබඳව අධ්‍යයනය තවදුරටත් සිදු වේ.

### ශ්‍රී ලංකාවේ අඩු තත්ත්වයෙන් යුත් මැණික් වල අගය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය

රතු දුඹුරු පැහැ විනිවිද නොපෙනෙන සුළු ජාගුං සෙල්සියස් අංශක 1100 පමණ උෂ්ණත්වයෙන් පැය තුනක පමණ කාලයක් ඔක්සිහාරක වායුගෝලීය තත්වයක් යටතේ තාප පිරියම් කරණයේ දී සැලකිය යුතු නිල් පැහැයක් ලැබුනු නමුදු මැණික් පාෂණයෙහි පැහැදිලි බව වැඩි දියුණු වීමක් දක්නට නොලැබිණි. තද කොළ පැහැ විනිවිද නොපෙනෙන ජාගුං සෙල්සියස් අංශක 1000 ක පමණ උෂ්ණත්වයක් යටතේ පැය තුනක පමණ කාලයක් ඔක්සිකාරක පරිසර තත්වයන් යටතේ තාප පිරියම් කරණයේ දී සැලකිය යුතුම විනිවිද පෙනෙන සුළු කොළ පැහැයෙන් අඩු ජාගුං බවට පත් විය. රතු දුඹුරු පැහැ විනිවිද නොපෙනෙන සුළු ජාගුං සෙල්සියස් අංශක 900 පමණ උෂ්ණත්වයක පැය තුනක පමණ කාලයක් ඔක්සිකාරක පරිසර තත්වයක් යටතේ තාප පිරියම් කරණයේ දී සැලකිය යුතුව කහ දුඹුරු පැහැ ජාගුං බවට පත් විය. නමුත් එහි විනිවිද පෙනෙන සුළු බව වැඩි දියුණු නොවීය.

### කොරුන්ඩම් (Corundum) භූ විද්‍යාත්මකව හා රසායන විද්‍යාත්මකව වෙනස්වන ආකාරය හා ඊට අනුරූපව ඒවාට අගය එකතු කිරීම සඳහා විභවයන් හඳුනාගැනීම

ශ්‍රී ලංකාවේ ගෙවුඩ බහුලව හමුවන ප්‍රදේශ 04ක් වන ඇලහැර, ඇහැළියගොඩ, රත්නපුර හා මොණරාගල යන ප්‍රදේශ වලින් තෝරා ගත් පතල් පොළවල් වලින් ගෙවුඩ මිලදී ගැනීම සිදු කරනු ලැබීය. මෙහිදී එම ගෙවුඩ ලබා ගත් ස්ථානයෙන්ම පස් සාම්පලද එක් රැස් කර ගනු ලැබීය. මෙම පර්යේෂණ ප්‍රතිඵල අනුව විවිධ වර්ගයේ ගෙවුඩ වලට තාප පිරියම් කිරීම මඟින් උපරිම ප්‍රතිපල ලබා ගැනීමට අවශ්‍ය ප්‍රශස්ථ තත්ව පිළිබඳව අවබෝධයක් ලබා ගත හැකිය. එමඟින් ඒවාට අගය එකතු කිරීම සඳහා විභවයන් හඳුනාගත හැකිය.

### නැනෝ තාක්ෂණික භාවිතයෙන් අවර්ණ පඩියන් වල අගය වැඩි කිරීම

මෙම සොයා ගැනීමට පේටන්ට් පත්‍රය සඳහා Epitaxial layer on gemstones capable of adding value to low quality gem material නම යටතේ පේටන් බල පත්‍රය ලබා ගැනීමට යොමු කර ඇත. මෙම සොයා ගැනිමට (Patent-LK/P/20172) පේටන්ට් බල පත්‍රය ලබා ගැනීමට කටයුතු කර ඇත.



SEM මගින් ලබා ගන්නා ලද වර්ණ ආවරණයේ විශාල කරන ලද රූප රාමු

### ආභරණ සෑදිම සඳහා තිරුවාණා ඛනිජයන්හි ගුණාත්මය ඉහල නැංවීම

මෙම ව්‍යාපෘතිය තුලින් භාවිතයට නොගෙන අපතේ යන අඩු වටිනාකමෙන් යුතු තිරුවානා ඛනිජයන්හි විවිධ අගය ඉහල නැංවීමේ ක්‍රම වලට ලක් කර වටිනාකම ඉහල නැංවීම අපේක්ෂා කෙරේ. විවිධ වර්ගයේ තිරුවානා ඛනිජ විවිධ උෂ්ණත්ව යටතේ තාප පිරියම් කිරීම සිදු කරන ලදී රසායනික විපර්යාස හා සංයුතිය නිර්ණය සඳහා වර්ණාවලිය ( FI- IR) නිරීක්ෂණය කරන ලදී. ඇමතිස්ට් ස්පටික පිරිසිදු කිරිම හා සැකසීමෙන් පසු විදුලි උඳුන් තුල බහා අධියර 3ක් යටතේ තාප පිරියම් කරන ලදි.
දුම් පළිඟුවෙහි දුඹුරු පැහැය 230$^{O}$C රත් කිරීමේදී ඉවත් වේ. තවද ස්පටික රූපී ලෙස නොපිහිටන කැල්සිඩොනි වර්ගයේ තිරුවානා 450 $^{O}$C ට තාප පිරියම් කිරීමේදී රතු පැහැති කානීලියන් බවට පත් වූ අතර මීට හේතුව ව්‍යුහය තුල යකඩ පැවතීම බව හඳුනා ගන්නා ලදි. එමෙන්ම 250 $^{O}$C ට තාප පිරියම් කල පළිඟු ක්ෂණිකව සිසිල් කිරීම මගින් පැලුම් සහිත Cracked Quartz සාදා ගන්නා ලදි.
මෙමගින් අඩු ගුණාත්මක භාවයෙන් යුතු තිරුවාණා ඛනිජයන් හි ගුණාත්මය ඉහල දැමීම තුලින් ඛනිජ අපතේ යාම අවම වන අතර ස්වර්ණාභරණ නිශ්පාදනය වැඩි දියුණු කිරීම සිදු වේ.

## මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සංවර්ධනය කිරීමෙහිලා නවෝත්පාදන සිදු කිරීම

### ජලීය ද්‍රාවණ වලින් බැර ලෝහ ඉවත් කිරිම සඳහා ස්වාභාවික ඛනිජ ද්‍රව්‍ය අධිශෝෂක ලෙස භාවිතා කිරීම

මෙහිදී තොරමල්ලි, පඩියන්, හා තලාතු මිනිරන් යන වටිනාකමින් අඩු ඛනිජ ද්‍රව්‍ය මගින් ඊයම් (Pb) හා කැඩ්මියම් (Cd) අධිශෝෂණය අධ්‍යයනය කරන ලදී.




ඒ අනුව ඉතා අඩු මාත්‍රාවක් මගින් ද්‍රාවණයක Pb සාන්ද්‍රණය ඉතා කාර්යක්ෂමව අඩු කිරීමේ හැකියාවක් තොරමල්ලි වලට පවතී. අධ්‍යයනය කරන ලද ඛනිජ ද්‍රව්‍යයන් අප ජලය , ජලය පිරියම් කිරීම සඳහා ඵලදායි ලෙස යොදා ගත හැකි බවයි. මෙම ප්‍රතිපල යොදා ගෙන විද්‍යාත්මක ප්‍රකාශනයක් පිළියෙල කරමින් පවතින අතර එය අන්තර්ජාතික විද්‍යාත්මක ජර්නලයක් (Journal) සඳහා යොමු කිරීමට අපේක්ෂා කෙරේ.

### මැණික් පතල් කැනීමේදී යොදා ගන්නා දැව වර්ග වෙනුවට භාවිතා කල හැකි ආදේශක ද්‍රව්‍යයන් පිළිබඳ අධ්‍යයනය



Nano සිලිකා වල SEM විශ්ලේෂණය

ආදේශකයක් නිර්මාණය කිරීම සඳහා ඉවතලන ප්ලාස්ටික් බෝතල් ප්‍රතිචක්‍රීකරණය කර ඒ සමග ගල් කුඩු මිශ්‍ර කර තනා ගනු ලබන ගඩොලක් පිළිබඳ අධ්‍යයනය කරනු ලැබූ අතර මෙහිදී පර්යේෂණ කටයුතු මගින් සොයාගනු ලැබූ ආදේශක ද්‍රව්‍ය සඳහා ඉවතලන ප්ලාස්ටික් අමුද්‍රව්‍යක් ලෙස යොදා ගැනීම නිසා විශාල පරිසර හානියක් අවම කර ගත හැකි අතර නිපදවනු ලැබූ ආදේශක ද්‍රව්‍ය දිරාපත් කරවීමේ ක්‍රමවේදයක් ද අධ්‍යයනය කරමින් පවතී.

### මැටි නිෂ්පාදන වල භෞතික ගුණය වැඩි දියුණු කිරීම සඳහා ඉවතලන මැණික් ඛනිජ කුඩු භාවිතය පිළිබඳ අධ්‍යයනය

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූ තාපයට ඔරොත්තු දීමේ හැකියාව වැඩි කිරීම යන ගුණාංගය සාර්ථක වී ඇත. මේ අනුව පෙනීයන්නේ පළිඟු කුඩු මිශ්‍ර කර සාදා ගන්නා ලද නිෂ්පාදන වල ගුණාත්මකභාවය ඉහල බවය. පළිඟු කුඩු අමිශ්‍ර නිෂ්පාදන සමඟ සසඳන කල ඉතා ඉහළ ප්‍රගතියක් දක්වයි.




Fig 1. Raw materials

Fig 1a. Quartz powder mixed sample

Fig 1b. Sample without Quartz powder

Fig 2. Temperature Vs burning time

### පුහුණු හා සංවර්ධන වැඩසටහන්

ගෙවී ගිය වර්ෂයේදී ආයතනය මගින් කර්මාන්තයේ ඉල්ලුමක් සහිත පාඨමාලා රැසක් මෙයෙවීමට පියවර ගනු ලැබිණ. මේ මගින් සත්‍ය වශයෙන්ම කර්මාන්තයේ නියැලෙන පුහුණු ශිල්පීන් බොහොමයකට උසස් තාක්ෂණික හා ශිල්පීය දැනුම ලබා දීමේ අවකාශය උදා විය. සහජ කුසලතා වලින් පිරිපුන් මෙම කණ්ඩායම් මගින් ලබා ගත් අධ්‍යාපනික පසුබිම මත දේශීය මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය ඉතා තරගකාරී තත්වයක පවත්වාගෙන යාමට සමත් වනු ඇත.

### පුහුණු පාඨමාලා ව්‍යාප්තිය

පසුගිය වර්ෂවල දී රත්නපුර, කඩුවෙල, මහනුවර, ගාල්ල, පොළොන්නරුව, යාපනය, අවිස්සාවේල්ල අත්තනගල්ල හා නිවිතිගල යන මධ්‍යස්ථාන 09කදී මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ පුහුණු පාඨමාලාවන් රැසක් ක්‍රියාත්මක කරන ලදි. එසේම නාවුල, මඩකලපුව හා රත්මලාන යන ස්ථානවල නව මධ්‍යස්ථාන 03 ආරම්භ කරන ලදී. ඒ තුලින් 1220 ක පිරිසක් අප වෙතින් පුහුණුව ලබා ඇත.

ආයතනය විසින් විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ගේ උන්නතිය උදෙසා රත්මලාන බිහිරි විද්‍යාලයේ නව මැණික් කැපුම් පාඨමාලාවක් නොමිලයේ ආරම්භ කරන ලදී.

ආයතනය අවිස්සාවේල්ල, මඩකලපුව නව මධ්‍යස්ථාන ආරම්භ කිරීම හරහා මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය අදාල දිස්ත්‍රික්ක තුල ප්‍රචලිතකිරීමේ හැකියාව ඇතිවිය.

### ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය නිපුණතාවයන් හඳුන්වා දීම

ක්ෂේත්‍රය මුහුණ දී ඇති පුහුණු ශ්‍රමික හිඟය පිටු දැකීම සඳහා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය හා මැණික් හා ස්වර්ණාභරණ සංගමය සමග ඒකාබද්ධව විශේෂ පුහුණු ව්‍යාපෘතියක් පවත්වාගෙන යන ලදි. එමගින් අඩු ආදායම්ලාභීන්ගේ දැනුම කුසලතාවය වැඩි කර ක්ෂේත්‍රයේ රැකියා සඳහා යොමු කිරීමේ අරමුණින් පාඨමාලා නොමිළයේ හැදෑරීමට මෙමඟින් කටයුතු සිදු කරන ලදී.

මැණික් කර්මාන්තයේ විධිමත් අධ්‍යාපනය පුළුල් කිරීමක් ලෙස ආයතනය SLQF03 ප්‍රමිතියේ විෂයමාලාවක් සහිත රත්නවිද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවක් මෙම වසරේ සිට හඳුන්වාදීමක් සිදු කරන ලදී. මීට අමතරව ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණ හා නිෂ්පාදන තාක්ෂණය NVQ 5-තත්වයේ පාඨමාලාවක් 2019 පලමු කාර්තුව වන විට ආරම්භ කිරීමටද සැලසුම් කර ඇත, තවද, මැණික් කැපීම හා ඔපදැමීමේ පාඨමාලාව NVQ- 4වන මට්ටමට ප්‍රතිතනය කිරීමටද, අනෙකුත් පාඨමාලා අවසානයේ පිලිගත් NVQ ප්‍රමිතියේ සහතිකපතක් ලබාදීමටද හැකියාව ලැබී ඇත.

කර්මාන්තයේ නව තාක්ෂණික දැනුම පුහුණුලාභීන් වෙත ලබා දීමේ අරමුණ ඇතිව විෂය නිර්දේශ යාවත්කාලීන කිරීමක් සිදුකරන ලදී.

| මැණික් කර්මාන්තය ආශ්‍රිත පාඨමාලා | ස්වර්ණාභරණ කර්මාන්තය ආශ්‍රිත පාඨමාලා |
|---|---|
| මූලික රත්නවිද්‍යාව | ස්වර්ණාභරණ නිෂ්පාදන NVQ 03 |
| රත්නවිද්‍යාව | ස්වර්ණාභරණ නිෂ්පාදන NVQ 04 |
| ගෙවුඩ තාප පිරියම් කිරීම | ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණ මාස 04 |
| මූලික මැණික් කැපුම් තාක්ෂණය | ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණ මාස 06 |
| මැණික් කැපීම හා ඔපදැමීම NVQ 03 | පරිගණක ආශ්‍රිත ස්වර්ණාභරණ නිෂ්පාදන |
| මැණික් කැපීම හා ඔපදැමීම NVQ 04 | වාත්තු හා විද්‍යුත් ලෝහාලේපනය |
| මැණික් වර්ණ ශ්‍රේණිගත කිරීම හා අලෙවිකරණය | ස්වර්ණාභරණ සඳහා ගල් බැදීම |
| මැණික් කැටයම් කැපීම | විලාසිතා ආභරණ නිෂ්පාදනය - දෙමළ |
| | විලාසිතා ආභරණ නිෂ්පාදනය |

**තාක්ෂණික පුහුණු පහසුකම් හඳුන්වා දීමේ කලාව**

උසස් තාක්ෂණය සහිත පුහුණු ඒකක ස්ථාපනය කර විද්‍යානුකුලව සැකසූ ඉහල ප්‍රමිතියෙන් යුත් වාත්තු කිරීම හා විද්යුත් ලෝහාලේපන කිරීමේ පුහුණු ඒකකය ස්ථාපනය, ගල් බැදීම සඳහා වර්තමානයේ යොදාගන්නා මයික්‍රෝ සෙටින් තාක්ෂණය සහිත පුහුණු ඒකකය ස්ථාපනය කිරීම, පරිගණක ආශ්‍රිත ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණ හා ත්‍රිමාන මුද්‍රණ පුහුණු ඒකකය හා විචිත්‍රවත් කැටයම් හා පබලු නිර්මාණ ඒකකය ස්ථාපිත කිරීමට කටයුතු කර ඇත.

**පර්යේෂණ සංවර්ධන කටයුතු**

ආයතනය අලෙවි වෙළඳපොල සමීක්ෂණය ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය හා ඒකාබද්ධව ආරම්භකර ඇත. මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ ශ්‍රමිකයින් පිළිබඳ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට අවශ්‍ය විධිමත් විද්‍යාත්මක දත්ත පද්ධතියක් නොපවතින බැවින් කර්මාන්තයේ ව්‍යාප්තිය හඳුනා ගැනීම, පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම, ශ්‍රමිකයින්ගේ ඌනතාවය හඳුනාගැනීම හා අනගි ලෝහ භාවිතය හඳුනාගැනීම ඉලක්ක කර ගනිමින් මෙම වෙළඳපල සමීක්ෂණය පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

**සිසුන්ගේ වෘත්තීය සවිබල ගැන්වීමේ ක්‍රියා**

සිසුන් විසින් නිපදවනු ලබන නව නිෂ්පාදන ජාතික හා අන්තර්ජාතික මට්ටමින් අලෙවි කිරීමේ කාර්යයද අප ආයතනය හරහා සිදු කරනු ලැබේ .මේ සඳහා ප්‍රාදේශීය වශයෙන් අලෙවි මධ්‍යස්ථාන පිහිටුවා ඇති අතර ලෝක වෙළඳ මධ්‍යස්ථානයේද නව අලෙවි මධ්‍යස්ථානයක් ආරම්භ කර ඇත. තවද ආයතනය විසින් සහභාගි වන ප්‍රදර්ශණ (FACETS, JEWELS) වලදීද මෙම ශිෂ්‍ය නිෂ්පාදන අලෙවි කිරීමට කටයුතු කරනු ලැබේ.

**පුහුණු පාඨමාලා ප්‍රගතිය**

| පුහුණු වැඩසටහන | | පුහුණු ලාභින් සංඛ්‍යාව | පාඨමාලා අවසන් කල | අවසන් නොවූ |
|---|---|---|---|---|
| 01 | රත්න විද්‍යාව ඩිප්ලෝමාව | 25 | | 25 |
| 02 | මූලික රත්න විද්‍යාව | 146 | 45 | 80 |
| 04 | රත්න විද්‍යාව | 78 | 26 | 35 |
| 05 | ගෙවුඩ තාප පිරියම්කරණය | 138 | 68 | 34 |
| 06 | මැණික් කැපීම හා ඔප දැමීම | 294 | 140 | 85 |
| 07 | මැණික් වර්ණශ්‍රේණිගත කිරීම හා අලෙවිකරණය | 62 | 46 | 09 |
| 08 | මැණික් කැටයම් කැපීම | 06 | 00 | 06 |

| | | | | |
|---|---|---|---|---|
| 09 | ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණය | 101 | 55 | 27 |
| 10 | ස්වර්ණාභරණ නිෂ්පාදනය | 70 | 09 | 50 |
| 11 | විලාසිතා ආභරණ නිෂ්පාදනය | 115 | 86 | 00 |
| 12 | ආභරණ සඳහා ගල් බැඳීම | 85 | 42 | 26 |
| 13 | පරිගණක ආශ්‍රිත ස්වර්ණාභරණ මොස්තර නිර්මාණය | 61 | 28 | 15 |
| 14 | රළු මැණික් හඳුනාගැනීම | 00 | 00 | 00 |
| 15 | වාත්තු හා විද්‍යුත් ලෝහාලේපනය | 06 | 04 | 02 |
| 16 | මූලික මැණික් කැපුම් තාක්ෂණවේදය )කෙටි කාලීන( | 19 | 09 | 08 |
| 17 | විදේශීය සිසුන් | 04 | 00 | 04 |
| 18 | තනිපුද්ගල පාඨමාලා සිසුන් | 10 | 07 | 03 |
| | **එකතුව** | **1220** | **569** | **390** |

2018.01.01 සිට 2018.12.31 දක්වා කාලය තුළ පුහුණු ලාභින් ලියාපදිංචිය

වාර්ෂික ශිෂ්‍ය ලියාපදිංචිය






# සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ ශ්‍රී ලංකා ජල තීරයේ සිදුවන සමුද්‍ර දූෂණය වැළැක්වීම, අවම කිරීම සහ පාලනය කිරීම සඳහා පිහිටුවා ඇති ආයතනයයි. උක්ත පනත මගින් අධිකාරියට ලබාදී ඇති බලතල වෙරළබඩ කලාපයද ඇතුළුව සමුද්‍රයේ අනන්‍ය ආර්ථික කලාපය දක්වා විහිදේ.

## සමුද්‍ර දූෂණය පාලනය සඳහා වන යාන්ත්‍රණ වැඩි දියුණු කිරීම

### සමුද්‍ර නාන තොටුපල හා වෙරළ තීරයන් වැඩිදියුණු කිරීම

සමුද්‍ර දූෂණය වැළැක්වීම සඳහා නිසි ක්‍රියාමාර්ග ගැනීම උදෙසා සමුද්‍ර නාන තොටුපලවල් හා දිගුදුර නලමගින් මුහුදට අපජලය මුදාහරින ස්ථාන ආශ්‍රිතව ජල තත්ත්වයන් අඛන්ඩව පරීක්ෂා කර දත්ත පද්ධතියක් පවත්වාගැනීම වැදගත් වේ. මෙම දත්ත අනුව ශ්‍රී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශයන්හි සමුද්‍ර දූෂණය අවම කිරීමේ යාන්ත්‍රණ ක්‍රියාත්මක කර ඇත.

2018 වර්ෂයේ සමුද්‍ර නාන තොටුපලවල්හි ජලයේ ගුණාත්මකභාවය ශ්‍රේණිගත කිරීම

| අංකය | නාන තොටුපල | දිස්ත්‍රික්කය | දර්ශක අගය | ශ්‍රේණිය | පංතිය |
|---|---|---|---|---|---|
| 1 | මොරගල්ල | කළුතර | 100 | විශිෂ්ඨයි | I |
| 2 | උණවටුන | ගාල්ල | 86.62 | ඉතා හොඳයි | II |
| 3 | මිරිස්ස | මාතර | 100 | විශිෂ්ඨයි | I |
| 4 | තංගල්ල | හම්බන්තොට | 100 | විශිෂ්ඨයි | I |
| 5 | ආරුගම්බේ | අම්පාර | 100 | විශිෂ්ඨයි | I |
| 6 | පාසිකුඩා | මඩකලපුව | 100 | විශිෂ්ඨයි | I |
| 7 | හලාවත වෙරළ තීරය | පුත්තලම | 71.24 | හොඳයි | III |
| 8 | වෙන්නප්පුව | පුත්තලම | 100 | විශිෂ්ඨයි | I |
| 9 | මීගමුව වෙරළ උද්‍යානය | ගම්පහ | 100 | විශිෂ්ඨයි | I |
| 10 | ගල්කිස්ස | කොළඹ | 100 | විශිෂ්ඨයි | I |
| 11 | වැල්ලවත්ත | කොළඹ | 65.31 | සාමාන්‍ය | IV |
| 12 | මාබල් වෙරළ | ත්‍රිකුණාමලය | 100 | විශිෂ්ඨයි | I |
| 13 | ත්‍රිකුණාමලය වෙරළ | ත්‍රිකුණාමලය | 100 | විශිෂ්ඨයි | I |
| 14 | නිලාවැලි වෙරළ | ත්‍රිකුණාමලය | 100 | විශිෂ්ඨයි | I |
| 15 | පරෙවි දූපත | ත්‍රිකුණාමලය | 100 | විශිෂ්ඨයි | I |
| 16 | චාට් වෙරළ | යාපනය | 100 | විශිෂ්ඨයි | I |
| 17 | කැෂුරිනා | යාපනය | 100 | විශිෂ්ඨයි | I |
| 18 | තොන්ඩමන්ආරු | යාපනය | 100 | විශිෂ්ඨයි | I |
| 19 | තලෛමන්නාරම | මන්නාරම | 100 | විශිෂ්ඨයි | I |

### ධීවර කර්මාන්තයෙන් සිදුවන සමුද්‍ර දූෂණ අවම කිරීම

ධීවර වරායන් ආශ්‍රිතව සිදුවන සමුද්‍ර දූෂණය අවම කිරීම සහ ධීවර වරායන්හි එකතුවන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් ශ්‍රී ලංකාවේ ධිවර වරායන් 16ක් සඳහා අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ සැලසුම් පිහිටුවා ඇත. තවද අධිකාරිය විසින් ධිවර වරායන් පවිත්‍ර කිරීමේ වැඩසටහන් 20ක්, රැස්වීම් 7ක් සහ ධිවර ප්‍රජාව හා ධීවර වරායන්හි පාර්ශව කරුවන් දැනුවත්කිරීමේ වැඩසටහන් 4ක් මෙම වර්ෂය පුරා ක්‍රියාත්මක කර ඇත.

### වෙරල සහ සමුද්‍ර දූෂණ පාලනය

#### මුහුදට පිරියම් කරනලද අපජලය බැහැර කිරීමට අදාලව බලපත්‍ර නිකුත් කිරීම

සමුද්‍රය වෙත අපජලය බැහැර කිරීම අවම කිරීම හා අපජලය පිරියම් කිරීමෙන් පමණක් බැහැර කිරීම දිරිගැන්වීමේ අරමුණින් අධිකාරියේ සියලුම දිස්ත්‍රික් කාර්යාලයන් මගින් තම ප්‍රදේශයේ වෙරළාශ්‍රිත හෝටල්/ කර්මාන්තශාලා අධීක්ෂණය සිදුකරන ලදී.

මුහුදට අපජලය බැහැර කිරීමට අදාලව බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රගතිය

| | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| **ආදායම රු.මිලියන** | 0.71 | 2.9 | 3.79 | 4.2 |
| **බලපත්‍ර ගණන** | 39 | 95 | 177 | 266 |

**පිවිතුරු සයුර ව්‍යාපෘතිය**

- ***වෙරළ රැකබලාගන්නන් හඳුන්වා දීමේ වැඩසටහන***

  ලක්දිව වෙරළ තිරයේ තිරසාර භාවිතය තහවුරු කිරීම සඳහා වෙරළ රැකබලාගන්නන් ස්ථාපිතකිරීම, සමුද්‍රීය පරිසර අධිකාරිය විසින් තැබූ තවත් එක් දැවැන්ත පියවරකි. මෙමගින් සමුද්‍ර දූෂණය අවම කිරීම සඳහා ප්‍රජා දායකත්වය ලබාගැනෙන අතරම අඩු ආදායම් ලාභීන්ගේ අදායම් වර්ධනය කිරීමද සිදු කෙරේ. මෙම වැඩසටහන 2018 සැප්තැම්බර් මස 16 දින අතිගරු ජනාධිපතිතුමාගේ සහභාගිත්වයෙන් ගාල්ල දඩල්ල වෙරළ තීරයේදී නිළ වශයෙන් ආරම්භ කෙරිණි. එමෙන්ම 2018 දෙසැම්බර් හිදී වැඩසටහනේ නිසි ක්‍රියාකාරීත්වය සඳහා සමෘධි සංවර්ධන දෙපාර්තමේන්තුව හා සමුද්‍රීය පරිසර අධිකාරිය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. ඒ අනුව වෙරළ රැකබලාගන්නන් 39 දෙනෙකු දිනපතා කි.මී. 40ක පමණ වෙරළ තිරයක් පිරිසිඳු කරනු ලැබේ. තවද 2019 වර්ෂය තුල වෙරළ රැකබලාගන්නන් ගණන 112 දක්වා වැඩිකිරීමට සැලසුම් කර ඇත.

- තව දුරටත් අධිකාරිය විසින් කැළණි ගඟ සඳහා කසල කළමනාකරණ සැලසුමක් සකස් කිරීම සඳහා කැළණි ගංගා මෝයේ සිට කි.මී. 2ක් පමණ ගොඩබිම දෙසට වන්නට ගං ඉවුරු ආශ්‍රිතව ඇති දූෂක ප්‍රභවයන් හඳුනාගැනීමේ මූලික සමීක්ෂණයක් සිදුකරන ලදී. මා ඔය සිට කල්පිටිය දක්වා, වෙඩිතලතිවු, කඩුවෙල සිට කුඹුක්කන් ඔය දක්වා, අහංගම සිට හික්කඩුව දක්වා සහ මාතර වෙරළ තිරය සඳහා වෙරළාශ්‍රිත පරිසර පැතිකඩ නිර්මාණය කර ඇත.

**සමුද්‍රීය පරිසර පද්ධති පිලිබඳ අධ්‍යයනය**

කොළඹ හා ගාල්ල වාණිජ වරායන් ආශ්‍රිතව හඳුනාගත් සමුද්‍රීය ආගන්තුක සත්ත්ව විශේෂයන්හි ආක්‍රමිකතාවය (invasiveness) නිර්ණය කිරීම සඳහා සමීක්ෂණ කිහිපයක් 2018 වසරේදී සිදුකරන ලදී. මිරිස්ස හා ත්‍රිකුණාමලය වෙරළෙහි කෘතිම ලෙස ප්‍රතිසංස්ථානය කරතිබූ කොරල් පර නැවත පරීක්ෂා කිරීමේ වැඩසටහන් හා ත්‍රිකුණාමලය වෙරළෙහි කොරල්පර ප්‍රතිසංස්ථානය කිරීම සඳහා සමීක්‍ෂණ 2 ක් සිදුකර කොරල් ප්‍රතිසංස්ථානය සඳහා කෘතිම ගල්කුට්ටි (Coral boulders) තැන්පත්කිරීම සිදුකරන ලදී. ගිං ගඟේ ඉවුරු දෙපස කඩොලාන පැල 50 ක් සිටුවීමට ක්‍රියා කරන ලදී. ඒකාබද්ධ ආයතනික සම්බන්ධීකරණයක් ඇති කිරීම තුලින් කායන්කර්නි ප්‍රදේශයේ කොරල් පර ආශ්‍රිත සමුද්‍ර ප්‍රදේශය රක්ෂිත කලාපයක් බවට පිහිටුවීම සඳහා වැඩමුළුවක් පවත්වන ලදී. එමෙන්ම කායන්කර්නි සමුද්‍ර ප්‍රදේශය කලාප වලට වෙන්කිරීම සිදුකරන ලද අතර සමීක්ෂණ 2ක් පවත්වන ලදී.

## සමුද්‍ර දූෂණය වැළක්වීමේ ක්‍රමවේදයන් වැඩි දියුණු කිරීම

### අන්තර්ජාතික සම්මුතීන් හා රෙගුලාසි ක්‍රියාත්මක කිරීම

සමුද්‍රීය පරිසර දූෂණය පාලනය සඳහා වන යාන්ත්‍රණ වැඩි දියුණු කිරීම සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් 2018 වසර තුලදී බංකර් රෙගුලාසිය සංශෝධනය සඳහා වැඩමුළුවක්, ස්භාවික සම්පත් ගවේෂණය අන්තර්ගත කිරීම සඳහා වැඩමුළුවක්, තෙල් විසුරුම්කාරක රෙගුලාසිය සඳහා වන වැඩමුළුවක්, තෙල් වාර්ථා රෙගුලාසිය සඳහා වන වැඩමුළුවක්, ලන්ඩන් කෙටුම්පත සඳහා වන ජාතික වැඩමුළුවක් හා සංවේදී පරිසර පද්ධති සඳහා කලාපීය වැඩමුළුවක් පවත්වනු ලැබිණි.

**නෞකා මගින් සිදුවන සමුද්‍ර දූෂණය අවම කිරීම**

- නෞකා මගින් ජනනය වන අපද්‍රව්‍ය සඳහා ප්‍රතිග්‍රහණ සේවාව සැපයීම

නෞකා මගින් ජනනය වන අපද්‍රව්‍ය හේතුවෙන් සිදුවන සමුද්‍ර දූෂණය වැලැක්වීම සඳහා අධිකාරිය විසින් සෑම දිනකම පැය 24 පුරාවට අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ සේවාවක් පපයනු ලැබේ. දැවි තෙල්, ඝන අපද්‍රව්‍ය හා මල අපද්‍රව්‍ය නිසි අයුරින් බැහැර කිරීම සඳහා සේවා සපයන ආයතන 24 ක් 2018 වසර සඳහා ලියාපදිංචි වී ඇති අතර අවසර පත්‍ර 1618 ක් නිකුත් කර රු. මිලියන 22.53 ක මුදලක් අධිකාරිය මගින් උපයා ගන්නා ලදී.

- බංකර් සේවා සපයන්නන් හට බංකර් බලපත්‍ර නිකුත් කිරීම

ප්‍රධාන වශයෙන් කොළඹ වරාය සහ හම්බන්තොට වරායන් වලට පැමිණෙන නෞකා වෙත බංකර් තෙල් සැපයීම වෙනුවෙන් බලපත්‍ර නිකුත් කිරීම සිදුකරනු ලැබීය. 2018 වසර සඳහා බංකර් සේවා සපයන්නන් 9 දෙනෙකු ලියාපදිංචි වී ඇති අතර එමගින් රු.මිලියන 1.72 ක ආදායමක් උපයා ගන්නා ලදී.

**සමුද්‍ර පරිසරය ආශ්‍රිත ගැටළු සඳහා ආයතනික රාමුවක් සකස් කිරීම.**

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් ශ්‍රී ලංකාවේ සමුද්‍ර පරිසරය ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිපත්ති උපායමාර්ග හා ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස්කරන ලදී.

## අන්තර්ජාතික උත්සව සංවිධානය කිරීම හා පැවැත්වීම

**ජාතික සමුද්‍ර සම්පත් සුරැකීමේ සතිය සහ වෙරළ පවිත්‍රතා දින ජාතික සැමරුම් උත්සවය-2018 සැප්තැම්බර් 15 සිට 21 දක්වා**

ශ්‍රී ලංකා රජය විසින් "ජාතික වෙරළ හා සාගර සම්පත් සංරක්ෂණ සතිය" ලෙස සැප්තැම්බර් මස 15 වැනි දින ආරම්භ වන සතියක් ප්‍රකාශයට පත් කරන ලදී .ඊට සමගාමීව සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් ජාතික වෙරළ පිරිසිදු කිරීමේ ප්‍රධාන වැඩසටහන 10 වන වරටත් සැප්තැම්බර් මස 16 වන දින ගාල්ල දඩල්ල වෙරළ තීරයේදී 1500 ක පමණ පිරිසකගේ සහභාගීත්වයෙන් පවත්වනු ලැබිණි. තවද වෙරළ කලාපිය දිස්ත්‍රික්කය 14 තුල තෝරාගත් ස්ථාන 80ක පිරිසිදු කිරීමේ වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් 16,800 පමණ පිරිසකගේ සහභාගිත්වයෙන් සතිය පුරා පවත්වන ලදී.

**ජගත් සාගර දිනය - 2018**



2018 ජුනි 7,8,9 යන තෙදින පුරාවට මුද්‍රිත හා ඉලෙක්ට්‍රොනික ජනමාධ්‍යවේදීන් 60 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් සඳහා ත්‍රිකුණාමලය සෝබර් දූපත හා පරෙවි දූපත තුල දැනුවත් කිරීමේ වැඩමුළුවක් හා පරවි දූපතෙහි දිය යට කොරල් පර පවිත්‍ර කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කෙරිණි.

මීට අමතරව 620 දෙනෙකුගේ සහභාගිත්වයෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ පෝරුතොට වෙරළ පවිත්‍ර කිරීමේ වැඩසටහනක් හා 402 දෙනෙකුගේ සහභාගිත්වයෙන් අම්පාර දිස්ත්‍රික්කයේ තිරුක්කෝවිල් වෙරළ පවිත්‍රතා වැඩසටහනක් ක්‍රියාත්මක කෙරිණි.

එමෙන්ම අම්පාර දිස්ත්‍රික්කය තුල පාසැල් සිසුන් කේන්ද්‍ර කරගනිමින් සිසුන් 648 දෙනෙකගේ සහභාගිත්වයෙන් දැනුවත් කිරීමේ වැඩසටන් සහ දැනුවත්කිරීමේ පා ගමනක් පවත්වන ලදී.

**සමුද්‍ර පරිසරය පිලිබඳ සිව්වන ජාතික විද්‍යා සමුළුව**

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය මගින් සංවිධානය කල සිව්වන සමුද්‍ර විද්‍යා සමුළුව 2018 ඔක්තෝබර් 20 දින කොළඹ බණ්ඩාරනායක අන්තර්ජාතික සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදී. එහිදී සමුද්‍ර පරිසරය

සංවේදී සමුද්‍ර පරිසර පද්ධති හා සමුද්‍ර රක්ෂිත කලාප, පාරිසරික සංචාරක කර්මාන්තය හා වෙරළ කළමනාකරණය, ධීවර කටයුතු ජලජීවී වගාව හා සමුද්‍ර පරිසරය සහ නාවික කටයුතු සමුද්‍ර දූෂණය හා සම්බන්ධ නීති පද්ධති යන අංශ 4 යටතේ පර්යේෂණ සොයාගැනීම් 27 ක් ප්‍රකාශයට පත් කෙරිණි.



**ජාතික පරිසර සතිය - 2018**

"ප්ලාස්ටික් මගින් සිදුවන පරිසර දූෂණය පිටු දකිමු" යන තේමාව යටතේ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් ජූනි 5 වන දිනට යෙදෙන ජගත් පරිසර දිනය සැමරීමේ ප්‍රධාන වැඩසටහන ගම්පහ දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරන ලදී. එමෙන්ම පරිසර සතිය වැඩසටහන් තුලදී පරිසර සංරක්ෂණය හා සමුද්‍ර පරිසරය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා 2053 දෙනෙකු සහභාගී වූ අතර ධීවර වරායන් හා වෙරළ පවිත්‍රතා වැඩසටහන් සඳහා 3184 දෙනෙකු සහභාගී විය.




**වනරෝපා ජාතික වැඩසටහන**

2018 වර්ෂයේදී සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් පැළ රෝපනය කිරීමේ වැඩසටහන් 2ක් පුත්තලම දිස්ත්‍රික්කයේදී සංවිධානය කරන ලදී.



- සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය නොරොච්චෝලේ විදුලි බලාගාර සේවක පිරිසකගේ හා මීගමුව සිංහ සමාජයේ සහභාගිත්වයෙන් කුඹුක්, මහුල් කරඳ, වැටකෙයියා, මී ආදී දේශීය පැළ වර්ග 10,000 ක් නොරොච්චෝලේ විදුලි බලාගාර භූමිය තුළ රෝපනය කිරීම සිදු කරන ලදී.
- එමෙන්ම අධිකාරිය කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ එක්ව කල්පිටියේ නරිකුඩාව ප්‍රදේශයේ කඩොලාන පැළ 2000ක් රෝපනය කිරීම සිදු කරන ලදී.

මන්නාරම දිස්ත්‍රික්ක ප්‍රාදේශීය කාර්යාලය මගින් කඩොලාන පැළ 500 ක් රෝපනය කිරීමද සිදු කරන ලදී.

**හදිසි තෙල් විසිරීමකදී ක්‍රියාත්මක ජාතික සැලැස්ම (NOSCOP) ක්‍රියාවට නැංවීම**

2018 වර්ෂයේදී සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් හදිසි තෙල් විසිරීමකදී ක්‍රියාත්මක ජාතික සැලැස්මට අනුව පෙරහුරු 3ක් ත්‍රිකුණාමලය, පුත්තලම හා අම්පාර දිස්ත්‍රික්කවල පවත්වන ලදී. හදිසි තෙල් විසිරීමකදී හෝ රසායනික විසිරීමකදී ඒ සඳහා කඩිනම් ප්‍රතිචාර දැක්වීමෙන් සමුද්‍ර හා වෙරළ පරිසරයට සිදුවන හානිය අවම කරගැනීම තහවුරු කිරීම සඳහා තෙල් විසිරීමකදී ප්‍රතිචාර දක්වන්නන් සඳහා පුහුණු වැඩසටහනක් සහ වැඩමුළු 7ක් පවත්වනලදී. එමෙන්ම 2018 වර්ෂය තුල හදිසි තෙල් විසිරුම් අවස්ථා 2ක් සිදුවූ අතර එමගින් සිදුවියහැකි පරිසර හානිය අවම කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලදී.

2018 වසර තුල සිදු වූ හදිසි තෙල් විසිරුම් අවස්ථාවේදී ඉවත් කරන ලද තෙල් ප්‍රමාණයන්

| තෙල් විසිරුම සිදු වූ ස්ථානය | තෙල් වර්ගය හා ප්‍රමාණය |
|---|---|
| **තල්දියවත්ත** | දැවි තෙල් ටොන් 39ක ප්‍රමාණයක් (අපවිත්‍ර වූ ජලයද ඇතුළුව) |
| **කොලොන්නාව තෙල් ගබඩා පර්යන්තය** | දැවි තෙල් ටොන් 15ක ප්‍රමාණයක් (අපවිත්‍ර වූ ජලයද ඇතුළුව) |

**සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ ධාරිතා වර්ධනය- දකුණු පළාත් කාර්යාලය විවෘත කිරීම**

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ පළමු ස්ථිර ගොඩනැගිල්ල ගාල්ල, දඩල්ල ප්‍රදේශයේ ඉදි කරන ලද අතර එම අභිනව ගොඩනැගිලි සංකීර්ණය අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ සුරතින් 2018 සැප්තම්බර් 16 වන දින විවෘත කරන ලදී. එම ගොඩනැගිලි සංකීර්ණය නවීන විද්‍යාගාරයක්, ගාල්ල දිස්ත්‍රික් කාර්යාලය, දකුණු පළාත් කාර්යාලය හා නවාතැන් පහසුකම් සහිත ගොඩනැගිල්ලකින් සමන්විත වේ.





**ආදායම් ප්‍රගතිය -2018**

| විස්තරය | ඉලක්ක ආදායම | සත්‍ය ආදායම | ප්‍රතිශතය |
|---|---|---|---|
| ආදායම | 33.7 | 33.4 | 99% |


STATE TIMBER
The Leader of Timber Power
STATE TIMBER CORPORATION

# රාජ්‍ය දැව සංස්ථාව

රාජ්‍ය දැව සංස්ථාව රජය සතු ව්‍යාපාරයකි. එය 1968 වර්ෂයේ දී ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ගරු අමාත්‍යතුමන් විසින් 1957 අංක 49 දරන රජයේ කාර්මික සංස්ථා පනතේ බලතල ප්‍රකාර පිහිටුවන ලද අතර, 1982 පෙබරවාරි 05 දිනැති අංක:178/10 ඇති විශේෂ ගැසට් නිවේදනය සහ 2009 වර්ෂයේ ජුනි 26 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව තවදුරටත් සංශෝධනය කොට යාවත්කාලීන කරන ලදී.

- ❖ වනාන්තරවලින් දැව කපා ඉවත් කිරීම, එම දැව ඉරුදැව හා නිමි භාණ්ඩ බවට පරිවර්තනය කිරීම, දැව කඳන්, ඉරුදැව හා නිමි භාණ්ඩ නිෂ්පාදන අලෙවිය සහ යථෝක්ත කාර්යයන් සඳහා කැලෑ මාර්ග ඉදිකිරීම.
- ❖ දැව කඳන් කිරීමේ මධ්‍යස්ථාන, ඉරුම් මෝල්, තෙල් කැවීමේ හා පරිරක්ෂණ යන්ත්‍රාගාර, දැව වියළීම හා වියළීමේ උඳුන් හා අවශ්‍ය උපකරණ මිලදීගැනීම, ඉදිකිරීම හා ක්‍රියාකරවීම.
- ❖ දැව අලෙවි මධ්‍යස්ථාන පවත්වාගෙන යාම.
- ❖ දැව අතුරු භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය.
- ❖ දැව ආනයනය කිරීම.
- ❖ නව වනවගා ව්‍යාපෘති ආරම්භ කිරීම, නැවත වනවගා කිරීම, කැලෑ සහ වනවගාවන් විද්‍යාත්මකව කළමනාකරණය කිරීම.
- ❖ කෘෂිකාර්මික නිෂ්පාදන.
- ❖ දැව ආශ්‍රිත නිමි හා අර්ධ නිමි භාණ්ඩ නිෂ්පාදන අපනයනය කිරීම.
- ❖ පෞද්ගලික ඉඩම් වලින් දැව මිලදීගැනීම.
- ❖ වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන පිරිසැකසුම.
- ❖ වේවැල් ආනයනය කිරීම.
- ❖ නියැදි පරීක්ෂා කිරීම් මගින් දේශීය හා ආනයනය කරන ලද දැව හඳුනාගැනීම සහ දැව සම්බන්ධ සහතික නිකුත් කිරීම.
- ❖ දැව කර්මාන්තය ආශ්‍රිත විෂයයන් පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම, සහතික ප්‍රදානය කිරීම සහ පරිසරය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.
- ❖ සංස්ථාවට අයත් ඉඩම් හා ගොඩනැගිලිවල සම්පූර්ණ ප්‍රයෝජනය ලබාගැනීම සඳහා සැලසුම් කිරීම සහ ඒ වෙනුවෙන් ආයෝජනය කිරීම.

**රාජ්‍ය දැව සංස්ථාව හමුවේ ඇති ප්‍රධාන අභියෝග**

- ⌘ වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් නිදහස් කරන දැව ප්‍රමාණය මත සීමාවීමට සිදුවීම නිසා අවශ්‍ය ආකාරයට ඉදිකිරීම් කර්මාන්තය සඳහා දැව ලබාගැනීමේ පවතින අවදානම් තත්වය.
- ⌘ අඩික පිරිවැයක් සහිත හිඟ දැව වර්ගවලට ආදේශකයන් ලෙස ප්ලාස්ටික්, සිමෙන්ති, යකඩ, ඇලුමිනියම්, සෙරමික් සහ ලෝහ මිශ්‍රිත අමුද්‍රව්‍ය භාවිතයට යොමුවීම.
- ⌘ ආනයනික දැව වෙළෙන්දන්ගෙන් සහ සුළු පරිමාන දැව නිෂ්පාදනකරුවන්ගෙන් ඇති වන තරඟකාරිත්වය.
- ⌘ උසස් තත්වයේ භාණ්ඩ සඳහා අධික පිරිවැයක් යෙදවීමට සිදුවන නිසා අඩු මිළට පාරිභෝගිකයන්ට භාණ්ඩ ලබාදීමට නොහැකිවීම.

**ලෝක පරිසර දිනය වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්**

- "තුරු ජන සිසු බැංකු" වැඩසටහන යටතේ කුරුණෑගල හා කෑගල්ල දිස්ත්‍රික්ක වල පාසල් 10ක් සඳහා රු 79,281.97 .ක් වටිනා කෘෂි උපකරණ කට්ටල 14ක් සහ පොත් පරිත්‍යාග කිරීම.
- "තුරු ජන සිසු බැංකු" වැඩසටහන යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ පාසල් 10ක රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ලෙක පරිසර දිනය වෙනුවෙන් රාජ්‍ය දව සංස්ථාව මගින් මැල්ලකන්ද රක්ෂිතයේ සංවිධානය කරන ලද ප්‍රධාන වැඩසටහන සඳහා රු 65,349.50 ක මුදලක් සහ ප්‍රාදේශික වල සංවිධානය කරන ලද වැඩසටහන් සඳහා රු 37,200.00 ක මුදලක් වැය කර ඇත.
- රු. 91,000 ක වටිනා කමින් යුතු පැල කොටු 70ක් අම්පාර හරිත ජන පදනම වෙත ලබා දීම.





| ක්‍රියාකාරකම | ඉලක්ක | | ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | භෞතික | මූල්‍ය රු.'000 | භෞතික | මූල්‍ය රු.'000 |
| කඳන් ස.මී. | 126,861 | 2,896,106 | 130,040 | 3,249,155 |
| ඉරුදැව ස.මී. | 5,064 | 238,467 | 4,389 | 249,791 |
| ආනයනික ඉරු දැව ස.මී. | 1,000 | 120,750 | | 18,752 |
| විදුලිකණු ඒකක | 27,800 | 277,444 | 9,850 | 120,116 |
| සිල්පර ඒකක | 41,500 | 373,085 | 43,651 | 499,163 |
| වටකණු ඒකක | 72,700 | 5,608 | 112,837 | 20,408 |
| වැටකණු ඒකක | 65,700 | 3,942 | 125,967 | 11,707 |
| දර ස.මී. | 79,000 | 39,450 | 101,172 | 57,739 |
| ගෘහභාණ්ඩ රු.මී. | 428 | 590,876 | 232.2 | 356,280 |
| අලිවැටකණු ඒකක | 28,800 | 72,864 | 17,155 | 131,485 |

**වනරෝපා ජාතික රුක් රෝපන වැඩසටහන වෙනුවෙන් ක්‍රියාකාරී දායකත්වය දැක්වීම**

- රාජ්‍ය දැව සංස්ථාවේ පැල තවාන් වල නිෂ්පාදනය කරන ලද පැල 130,000ක් පමණ රාජ්‍ය ,අර්ධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන හා සංවිධාන සඳහා නොමිලේ බෙදාදීම.
- මන්නාරම දිස්ත්‍රික්කයේ සංවිධානය කරන ලද "වනරෝපා" ජාතික වැඩසටහන වෙනුවෙන් දායකත්වය ලබාදීම.
- කුරුණෑගල දිස්ත්‍රික්කයේ නක්කාවත්ත ජාතික පාසලේ පැවත්වූ පැළ රෝපණය කිරීමේ ප්‍රධාන වැඩසටහන සංවිධානය සිදු කිරීම.
- ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලයේ පැවත්වූ "X –ban" ප්‍රදර්ශණය වෙනුවෙන් කුටියක් ඉදිකිරීම හා එම විද්‍යාලයේ ප්‍රේක්ෂකාගාරය හා වේදිකාව අලුත්වැඩියා කිරීමට දායක වීම.
- ප්‍රාදේශීය වශයෙන් පැවත්වූ පැළ රෝපණය කිරීමේ වැඩසටහන් රාශියක් සංවිධානය කිරීම




**2018 වසරේදී දායකත්වය ලබාදෙන ලද දැනුවත්කිරීමේ වැඩසටහන්**

- තිරසාර දැව භාවිතය හා දැව සංරක්ෂණය පිළිබඳ පාසල් ගුරුභවතුන් හා ජනතාව දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම.
- දැව තාක්ෂණය හා දැව විද්‍යාව පිළිබඳව පාසල් ගුරුභවතුන් දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම.
- ඒ අනුව දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන තිරසාර ලෙස භාවිතා කිරීම හා ඒවා සංරක්ෂණය පිළිබඳ පුහුණු වැඩමුළු 12 ක් පවත්වන ලද අතර, එහිදී දැනුවත් කිරීමේ පත්‍රිකාද බෙදා හරින ලදී.

**2018 වසරේදී දායකත්වය ලබාදෙන ලද පර්යේෂණ වාර්තා**


*Muthumala, C.K., De Silva Sudhira, Alwis P. L. A. G., and Arunakumara K. K. I. U., 2018,*; Identify the Strength Grade for Finger Jointed Timber Species According to BS 5268-2:2002 ; 23rd *International Forestry Symposium 2018, Department of Forestry and Environmental Science, University of Sri Jayewardenepura, Sri Lanka; State Timber Corporation, Sri Lanka.*

*Siriwardana V.R.A. and Muthumala, C.K., 2018,* Evaluation the Authenticity of Wood Species in Sri Lankan Timber Market; 23rd *International Forestry Symposium 2018, Department of Forestry and Environmental Science, University of Sri Jayewardenepura, Sri Lanka; State Timber Corporation, Sri Lanka.*

*Motagedara arachchi C.I.. and Muthumala, C.K., 2018,*; A Survey and Usage and Imaged issues of Kaya Senegalese Timber Species in Kurunegala District in Sri Lanka; 23rd *International Forestry Symposium 2018, Department of Forestry and Environmental Science, University of Sri Jayewardenepura, Sri Lanka; State Timber Corporation, Sri Lanka.*

*Siriwardana V.R.A[1], Wickramasingha W N[2] 2018; Strength Classification for Sri Lankan Wood Species.; Annual research Symposium, University of Colombo, Sri Lanka.*

*Muthumala, C.K[1],De Silva Sudhira[2], Arunakumara K. K. I. U[3], Alwis P. L. A. G[4], 2018,; Identification of joint efficiencies in 13mm Finger Jointed Timber Species Used in Sri Lanka.; 9th International Conference on Sustainable Build Environment, University of Peradeniya, Sri Lanka.*

*Muthumala, C.K[1], De Silva Sudhira[2], Arunakumara K. K. I. U[3], Alwis P. L. A. G[4], 2018,; Investigation of the most suitable glue type for finger-joints production in Sri Lanka.; Research Journal of Agriculture and Forestry Science; International science Community Association, India.*

**2018 වසරේදී විශ්ව විද්‍යාල සිසුන් සමග කරනලද පර්යේෂණ**

- Identification of Timber species using physical and anatomical features - *B M J S Basnayeka*

*Supervised by C K Muthumala – Manager (Reasarch & Training) - STC*

- Determination of some wood properties and its uses in 50 lesser known timber in Sri Lanka – *J T S S Jayawardhana*

*Supervised by Dr Nimal Ruwanpathirana- Genaral Manager- STC*

- Estimation Harvesting Cost of Pine Plantation by private sector and State Timber Corporation – *J M P C B Jayasundara*

*Supervised by Dr Nimal Ruwanpathirana- Genaral Manager- STC*

- Effect of Volumetric Shrinkage for finger Joint Timber Production Technique in Different Exposure Conditions – *S M J P Dayawansha*

*Supervised by C K Muthumala – Manager (Reasarch & Training)-STC*

- Development of Timber Classification System for Finger Joint Timber Production Using Strength Properties – *M A M Pamoda*

*Supervised by C K Muthumala – Manager (Reasarch & Training) – STC+*




භූ විද්‍යා සමීක්ෂණ හා
පතල් කාර්යාංශය

“සමාජීය, සංස්කෘතිකමය සහ පාරිසරික වටිනාකම් සුරකිමින් ජනතාවගේ ජීවන ප්‍රමිතීන් හා ජීවනෝපායයන් වැඩි දියුණු කිරීම සඳහා මහපොලොව සහ එහි ශක්තිය තේරුම් ගැනීම සහ කළමනාකරණය කිරීම මගින් ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා දායක වීම”.

තාක්ෂණික ආර්ථික හා විද්‍යාත්මක තිරසර සංවර්ධනය හා අනුකූලව ජාතික භූ විද්‍යා සම්පත් සමුදායක් සකස්කරමින්, ඛනිජ කැනීම හා සැකසීම සහ ගවේෂණය විධිමත් කරමින්, තිරසර ක්‍රමෝපායික සේවාවන් ලබාදීම ගවේෂණය කරමින්, විශේෂ භෞතීව් විද්‍යා තොරතුරු ලබාදෙමින් හා ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා ක්‍රමෝපායික ලෙස දායක වෙමින් භෞතීවිය සහ එහි ශක්තිය අවබෝධ කරගැනීම සඳහා සිදුකරන පර්යේෂණයන් සඳහා ආයෝජනය කිරීම මගින් ස්වභාවික සම්පත් හා පරිසරය කළමනාකරණය කිරීම

## භූ විද්‍යා අංශය

- **භූ විද්‍යා සිතියම් මුද්‍රණය කිරීම**



සමස්ත ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි භූ විද්‍යා සිතියම් ප්‍රකාශයට පත් කිරීම මෙම කාර්යාංශයෙහි ප්‍රධාන කාර්යයන්ගෙන් එකක් වේ. ඛනිජ සහ භූගත ජලය ගවේෂණය කිරීම, ප්‍රධාන ඉදිකිරීම් හා සිවිල් ඉංජිනේරු කටයුතු සහ නායයාම් උවදුරු සිතියම් සැකසීම ඇතුළු කටයුතු ගණනාවක් සඳහා භූමිය පිලිබඳ භූ තොරතුරු අඩංගු භූ විද්‍යා සිතියම් භාවිතා කරනු ලැබේ. සමස්ත මෙම ආවරණය වන පරිදි (1:100,000 පරිමාණයේ) භූ විද්‍යා සිතියම් 21ම 2014 වර්ෂය තුළදී භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් සම්පූර්ණ කරන ලද අතර, 1 250,000 පරිමාණයේ භූ විද්‍යා සිතියම් අංක 04 2017 වර්ෂයේදී පල කරන ලදී. සමස්ත දිවයිනෙහිම 1,500,000 පරිමාණයේ සිතියම් සැකසීම සිදු කරනු ලබමින් පවතී.

- **චාතුර්ථික සිතියම් සැකසීමේ (වෙරළ කලාපීය) වැඩසටහන**

චාතුර්ථික සිතියම් මුද්‍රණය කිරීමේ වැඩසටහන
මාතර, කළුතර, සහ අම්බලන්ගොඩ බලපිටිය කලාපවල සිතියම් ඇතුළුව 1:50,000 පරිමාණයේ සිතියම් සැකසීමේ කටයුතු සහ ක්ෂේත්‍ර කටයුතු පසුගිය වර්ෂවල සම්පූර්ණ කර ඇති අතර සිතියම් 03 - 2017 ඔක්තෝබර් මාසයේදී ප්‍රසිද්ධ කරන ලදී.





පුත්තලම, සිලාවතුරෙයි සහ කල්පිටිය හම්බන්තොට, තංගල්ල සහ තිස්සමහාරාමය කලාපවල සිතියම් සැකසීමේ කටයුතු සිදු කරන ලදී. පුත්තලම, සිලාවතුරෙයි සහ කල්පිටිය කලාපවල සවිස්තරාත්මක විදුම් කටයුතු සිදු කරන ලදී. ඉතිරි විදුම් සිදුරු හතර සම්බන්ධ කටයුතු 2019 වර්ෂයේදී සිදු කරනු ඇත.

- **පාංශු භූ රසායනික සිතියම් වැඩසටහන**

පසෙහි භූ රසායනික ලක්ෂණ අධ්‍යයනය කිරීම සඳහා 2008 වර්ෂයේදී පාංශු භූ රසායනික වැඩසටහන ආරම්භ කරන ලදී. ඛනිජ ගවේෂණය, පාරිසරික අධීක්ෂණ කටයුතු, කෘෂිකාර්මික පර්යේෂණ සහ භූ සෞඛ්‍ය උපදුරු අධ්‍යයන කටයුතු සඳහා මෙම සිතියම් ප්‍රයෝජනවත් වේ. 1:50,000 පරිමාණයේ පාදක සිතියම් යොදාගෙන භූ රසායනික සිතියම් කටයුතු සිදු කරනු ලබමින් පවතී. සෑම $4km^2$ ප්‍රදේශයකම $1km^2$ පාලන ප්‍රදේශයක් සඳහා මතුපිට සහ 2 m ගැඹුරින් පස් නිදර්ශක 2 ක් ලබා ගනු ලැබේ. පරමාණුක අවශෝෂන වර්ණාවලිමානය සහ ප්‍රේරිත යුග්ම ප්ලාස්මා ප්‍රකාශ විමෝචක වර්ණාවලිමානය භාවිතා කරමින් රසායනික ලක්ෂණ විශ්ලේෂණය කරනු ලැබේ.

**භූ රසායනික සිතියම් සැකසීමේ සහ මුද්‍රණය කිරීමේ වැඩසටහන**

තිඹොල්කැටිය, මාතර, රක්වාන, තංගල්ල, මොරවක සහ හම්බන්තොට යන 1:50,000 පරිමාණයේ සිතියම් කලාප හයක විශ්ලේෂන දත්ත යොදා ගනිමින් (රක්වාන - තංගල්ල) සිතියම් කලාප අංක 20 මුද්‍රණය කිරීමේ කටයුතු පසුගිය වර්ෂ තුලදී සම්පූර්ණ කරන ලද අතර සිතියම් අංක 20 - 2017 ඔක්තෝබර් මාසයේදී ප්‍රසිද්ධ කරන ලදී. සිතියම් කලාප අංක 08 සකස් කිරීමේ කටයුතු සිදු වෙමින් පවතී.

**පාංශු භූ රසායනික සිතියම් වැඩසටහනෙහි විද්‍යාගාර කටයුතු**

සිතියම් කලාප අංක 08 (අනුරාධපුරය - පොළොන්නරුව) සහ සිතියම් කලාප අංක 06 හි විශ්ලේෂණ කටයුතු ඉහත කී කාල පරිච්ඡේදය තුළ සිදු කරනු ලබමින් පැවතුනි.

**පාංශු භූ රසායනික වැඩසටහනෙහි ක්ෂේත්‍ර කටයුතු**

සිතියම් කලාප අංක 23 : නිලාවැලි, සිතියම්කලාප අංක 06, පාන්කුලම් සහ සිතියම් කලාප අංක 28, ත්‍රිකුණාමලය ආශ්‍රිත ක්ෂේත්‍ර කටයුතු සිදු කරනු ලබමින් පැවතුනි.

- **ගඩොල් හා උළු කර්මාන්තය සඳහා සුදුසු පරිමාණ හඳුනා ගැනීම සඳහා මා ඔය ඔස්සේ ගඩොල් හා උළු මැටි පරීක්ෂණය**

ගඩොල් හා උළු මැටි ලබා ගත හැකි ස්ථාන හඳුනාගැනීම සඳහා මා ඔය ඔස්සේ ගඩොල් හා උළු මැටි පරීක්ෂණය 2017 වර්ෂයේ අවසාන කාර්තුව තුලදී අරඹන ලද අතර ක්ෂේත්‍ර කටයුතු වලින් 90% පමණ නිම කර ඇත.

මෙම ක්ෂේත්‍ර කටයුතු සිදු කිරීමේ කාර්යය පවරන ලද නිලධාරියා හට දීප ව්‍යාප්ත ඉඩි කිරීම් අමුද්‍රව්‍ය සමීක්ෂණයකට සහභාගි වීමට සිදු වූ හෙයින් මෙම ක්ෂේත්‍ර කටයුතු තාවකාලික ලෙස නතර කරන ලදී.




- **පළාත් ඛනිජ පරීක්ෂණ සහ පළාත් ඛනිජ සිතියම්**

සබරගමුව සහ ඌව සහ උතුරුමැද පළාත් වල ක්ෂේත්‍ර කටයුතු නිම කරන ලදි.

ඌව පළාත් ඛනිජ සිතියම සඳහා දත්ත සැකසීමේ කටයුතු නිම කරන ලද අතර, සබරගමුව ඛනිජ සිතියම සඳහා දත්ත සැකසීමේ කටයුතු සිදු කරනු ලබමින් පවතී. එම සිතියම් දෙක 2019 වර්ෂයේදී පළ කරනු ඇත.

- **ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ ආධාර ඇතිව ක්‍රියාත්මක වන න්‍යෂ්ඨික අමුද්‍රව්‍ය පරීක්ෂණය සහ ඒ ආශ්‍රිත කටයුතු**

*කාර් රථයක සිට ක්‍රියාත්මක කරනු ලබන ගැමා කිරණ වර්ණාවලිමාන පරීක්ෂණය*

නාඋල ප්‍රදේශය තුළ හඳුනා ගන්නා ලද විකිරණශීලී විෂමතාවය පිලිබඳ පූර්ණ භූ විද්‍යාත්මක පරීක්ෂණයක් සිදු කරන ලද අතර දත්ත විශ්ලේෂණය සිදු කරනු ලබමින් පවතී.

**ශ්‍රී ලංකාවේ වෙරළ තීරුව තුල ඇති ප්‍රධාන ඛනිජ වැලි නිධි පෙන්නුම් කරන සිතියම**

**තලෙයිමන්නාරම සිට ගාල්ල දක්වා වෙරළ තීරය ඔස්සේ න්‍යෂ්ඨික අමුද්‍රව්‍ය පරීක්ෂණය**

තලෙයිමන්නාරම සිට ගාල්ල දක්වා වෙරළ තීරය ඔස්සේ න්‍යෂ්ඨික ආරම්භ කරන ලද අතර ක්ෂේත්‍ර කටයුතු නිම කර ඇත. අලුත්ගම සිට ගාල්ල දක්වා ද ක්ෂේත්‍ර කටයුතු නිම කර ඇත. මෙම පරීක්ෂණය තුළ විකිරණශීලී විෂමතා කලාප ඇති ප්‍රදේශ 4 (හතර) ක් හඳුනා ගන්නා ලද අතර මෙලෙස හඳුනාගනු ලැබූ කලාප තුළ පූර්ණ පරීක්ෂණයක් යථා කාලයේදී සිදු කරනු ඇත.











කතිරවේලි ඛනිජ වැලි නිධියෙහි විකිරණශීලී මිනුම්

- **භූ කම්පන දත්ත හා සුනාමි අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම සහ භූ කම්පන නිරීක්ෂණ මධ්‍යස්ථාන තුන පවත්වාගෙන යාම**

අනිකුත් ආධාර ලබා දෙන ආයතනවල සහයෝගය ඇතිව ස්ථාපිත කරන ලද භූ කම්පන නිරීක්ෂන මධ්‍යස්ථාන තුන බාධාවකින් තොරව ක්‍රියාත්මක වෙමින් පවතින අතර මෙම මධ්‍යස්ථාන වලින් ලබා ගනු ලබන දත්ත භූ.ස.ප.කා. හි ප්‍රධාන මධ්‍යස්ථානයෙහි පිහිටි දත්ත මධ්‍යස්ථානය වෙත කිසිඳු ගැටලුවකින් තොරව සම්ප්‍රේෂණය කරනු ලැබේ. මෙම භූ කම්පන මධ්‍යස්ථාන වලින් දත්ත ලබා දීම 2018 වර්ෂය තුළදී සතුටුදායක මට්ටමක පැවතුනි. භූ චලන, භූ ස්පන්දන සහ ඉන්දියන් සාගරයේ භූ කම්පන සිදුවීම් පිලිබඳ මහජනතාව විසින් සිදු කරනු ලබන විමසීම් සම්බන්ධයෙන් දත්ත මධ්‍යස්ථානය විසින් 2018 වර්ෂයේදීත් සාර්ථක ලෙස ප්‍රතිචාර දක්වා ඇත.



භූ.ස.ප.කා. හි සුනාමි අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය



පළාත් භූ කම්පන නිරීක්ෂණ මධ්‍යස්ථානයෙහි භූ කම්පන වාර්තාව (2018 සැප්තැම්බර් 14 වැනි දින ත්‍රිකුණාමලයේ සිදු වූ භූමිකම්පාව)

භූ කම්පන නිරීක්ෂණයට අමතරව භූ කම්පන දත්ත හා සුනාමි අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට අදාළ කැණීම් කටයුතු පිළිබඳව මහජනතාව වෙතින් ලැබෙන පැමිණිලි 0112862862 සහ1921 දුරකථන අංක ඔස්සේ ලබා ගැනීමද සිදුකරනු ලැබේ. මධ්‍යස්ථානයෙහි සේවයේ නියුතු නිලධාරීන් විසින් එකී පැමිණිලි වාර්තා කර ගැනීමෙන් අනතුරුව කැණීම් අංශය වෙත යොමු කරනු ලැබේ .

- **භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය- පුස්තකාලය වැඩි දියුණු කිරීම**

**පුස්තකාල පෙළ පොත් මිලදී ගැනීම**

2018 වර්ෂය තුල මිලදී ගැනීම සඳහා පොත් ලැයිස්තුවක් පුස්තකාල කමිටුව විසින් නිර්දේශ කරන ලද අතර රු. මිලියනයක මුදලක් එම පොත් මිලදී ගැනීම සඳහා වෙන් කරන ලදී. කෙසේ වුවද කිසිදු පොතක් මිලදී ගනු නොලැබූ අතර විද්‍යුත් පොත් සංකල්පය පිලිබඳව කළමනාකාරිත්වය විසින් සලකා බලන ලදී

**කෞතුකාගාර සංවර්ධනය 2018**

කෞතුකාගාර සංවර්ධනය පිලිබඳ යෝජනාව නියෝජ්‍ය අධ්‍යක්ෂ (භූ විද්‍යා) හරහා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරන ලදී. පුස්තකාල හා කෞතුකාගාර කමිටුව විසින් එක්සත් ජනපදයේ වාර්ඩ් ස්වාභාවික විද්‍යා ආයතනයේ නාමාවලිය තුළ සඳහන් ස්ඵටික, ඛනිජ හා පාෂාණ නිදර්ශක තෝරා ගන්නා ලද අතර (නිදර්ශක 85ක්) එසේ තෝරා ගන්නා ලද නිදර්ශක මිලදී ගන්නා ලදී. ප්‍රදර්ශක කුටි නිර්මාණය කිරීම, අකුණු ආරක්ෂණ පද්ධතියක් සැකසීම සහ වෙනත් කටයුතු සිදු කරනු ලබන ආකාරය පිලිබඳව උපදෙස් ලබා ගැනීම සඳහා කෞතුකාගාර සංවර්ධන කමිටුවේ සාමාජිකයන් කිහිප දෙනෙකු විසින් ජාතික පුස්තකාලයෙහි නිරීක්ෂණ චාරිකාවක් සිදු කරන ලදී. මෙම උපදෙස් පිලිබඳව කෞතුකාගාර සංවර්ධන කමිටුව සමග සාකච්ඡා කර ඒ පිලිබඳ යෝජනාවක් අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

**පුස්තකාල අංකිතකරණ ව්‍යාපෘතිය *2016-2019***

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් ජාතික විද්‍යා පදනම හා එක්ව 2016 වර්ෂයේ මැද භාගයේදී අංකිත පුස්තකාල ව්‍යාපෘතිය ආරම්භ කරන ලද අතර මෙම ව්‍යාපෘතියෙහි III අදියර 2017 වර්ෂයේදී ආරම්භ කරන ලදී.

1. පිරික්සීම සඳහා ලේඛන තෝරා ගැනීම
(ලේඛන වර්ග - තාක්ෂණික වාර්තා සහ අනිකුත් වාර්තා, පුවත්පත්වලින් කපා ගන්නා ලද කොටස්) පිටු 50200 ක් පිරික්සීම කරන ලදී.
2. ඉහත පිටු 50, 200 සඳහා හඳුනාගැනීමේ සංකේත නිර්මාණය කරන ලදී.
3. ලේඛණ පිරික්සීම ඉදිරියටත් සිදු කරනු ලබමින් පවතී.

- **දීප ව්‍යාප්ත ඉදි කිරීම් අමුද්‍රව්‍ය පරික්ෂණය**




ශ්‍රී ලංකාව තුළ දැනට සිදු කරගෙන යනු ලබන කඩිනම් සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් ඉදි කිරීම් අමුද්‍රව්‍ය සඳහා ඇති වී ඇති අධික ඉල්ලුම සහ අනාගත අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා 2017 පෙබරවාරි මස අවසානයේ සිට ඉදිකිරීම් සමුදාය පිලිබඳ ගුණාත්මක හා ප්‍රමානාත්මක පරික්ෂණයක් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි භූ විද්‍යා අංශය විසින් සිදු කරන ලදී. ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ ඉල්ලුම මත ඔවුන් විසින් යොදවන ලද රු. මිලියන හැටක මූල්‍ය දායකත්වය සහිතව මෙම පරික්ෂණය සිදු කරන ලදී. දිවයින පුරා ඇති ලෝහ / පාෂාණ, බොරලු, පස් සහ වැලි, සඳහා ගුණාත්මක සහ ප්‍රමාණාත්මක මට්ටමේ කැනීම් සිදු කිරීම සඳහා සුදුසු ස්ථාන හඳුනාගැනීම මෙම පරීක්ෂණයෙහි අරමුණ වේ. ජනාවාස ප්‍රදේශ, ජල මූලාශ්‍ර, නායයෑම් ඇති වීමේ අවදානමක් සහිත ප්‍රදේශ සහ පාරිසරික ලෙස වැදගත් වන ප්‍රදේශ පිළිබඳව දැඩි අවධානය යොමු කරමින් සුදුසු ප්‍රදේශ සඳහා නිර්දේශ ලබා දෙනු ලැබේ. කුරුණෑගල හරහා ගමන් කරන යෝජිත නුවර අධිවේගී මාර්ගය, මාතර සිට දීර්ඝ කරනු ලබන දකුණු අධිවේගී මාර්ගය, මීගමුව දක්වා දීර්ඝ කරනු ලබන අධිවේගී මාර්ගය සහ මහනගර අමාත්‍යාංශය යටතේ කොළඹ සිදු කරනු ලබන ඉදිකිරීම් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන ලදී. දිස්ත්‍රික්ක දහනවයකට අදාළ කටයුතු නිම කරන ලද අතර සියලුම අවසන් වාර්තා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු පිලිබඳ අමාත්‍යාංශයට භාරදෙන ලදී.

වලවේ ගඟෙහි අවසාදිත පරීක්ෂණය සිදුකොට ක්ෂේත්‍ර කටයුතු සම්පූර්ණ කර ඇත. වාර්තාව පිළියෙල කරනු ලබමින් පවතී.

- **පාෂාණ විද්‍යා විද්‍යාගාරය**

1. පුද්ගලික සේවාදායකයන් සඳහා සිදු කරන ලද පරීක්ෂණ වලින් ලැබුණු සෘජු ආදායම

| නිදර්ශක සංඛ්‍යාව | ආදායම (රු) |
|---|---|
| 579 | 3,764,183.00 |

2. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි නිලධාරීන්ගේ ඉල්ලීම මත ව්‍යාපෘති හා ක්ෂේත්‍ර කටයුතු සඳහා සිදු කරන ලද අනිකුත් විශ්ලේෂණ (ගාස්තු අය කිරීමකින් තොරව)

| නිදර්ශකයේ ස්වභාවය | නිදර්ශක සංඛ්‍යාව | විශ්ලේෂණයේ වටිනාකම රු. |
|---|---|---|
| පාෂාණ | 25 | 81,000.00 |
| වැලි | 59 | 294,500.00 |
| මුළු එකතුව | | 375,500.00 |

3 . ප්‍රදර්ශන සහ පාසල් විද්‍යා වැඩසටහන් සඳහා සහභාගී වීම සහ නිදර්ශන කට්ටල පිළියෙල කිරීම (ගාස්තු අයකිරීමකින් තොරව ) නිදර්ශක කට්ටල 75ක් පමණ පාසල් ගුරුවරුන්ට සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ලබා දීම සඳහා පිළියෙල කරන ලදී .

- 2018 නොවැම්බර් මස 17 සහ 18 යන දින වලිදී ටාජ් සමුද්‍රා හෝටලයේදී පවත්වන ලද ස්වර්ණාභරණ ප්‍රදර්ශනය
- ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලයේදී පවත්වන ලද එක්ස් බෑන් අධ්‍යාපනික විද්‍යා හා තාක්ෂණ ප්‍රදර්ශනය 2018
- 2018 නොවැම්බර් 2 සහ 3 දිනවලදී කෑගල්ල බාලිකා විද්‍යාලයේදී පවත්වන ලද අධ්‍යාපනික ප්‍රදර්ශනය
- 2018 ඔක්තෝම්බර් මස 25 සිට 26 දක්වා ලීඩ්ස් ජාත්‍යන්තර පාසලේ 20 වන සංවත්සරය සඳහා පවත්වන ලද අධ්‍යාපනික ප්‍රදර්ශනය
- 2018 ඔක්තෝම්බර් මස 10 දින සිට 14 වන දින දක්වා අක්කරපත්තු මුස්ලිම් මහා විද්‍යාලයේදී පවත්වන ලද කලාපීය මට්ටමේ විද්‍යා ප්‍රදර්ශනය
- 2018 ඔක්තෝබර් මස පස් වන දින පානදුර ශාන්ත ජෝන් විද්‍යාලයේ දී පවත්වන ලද අධ්‍යාපනික ප්‍රදර්ශනය
- 2018 මාර්තු මස 1 සහ දෙවන දින සහ පෙබරවාරි මස 28 වන දින මීරිගම ඩී.එස්. සේනානායක මහා විද්‍යාලයේ දී පවත්වන ලද අධ්‍යාපනික ප්‍රදර්ශනය
- 2018 ජුනි මස 29 සහ 30 දිනදී කුරුණෑගල මලියදේව බාලිකා විද්‍යාලයේදී පවත්වන ලද අධ්‍යාපනය ප්‍රදර්ශනය
- 2018 ජුනි මස 10 වන දින කොළඹ 10 ගෝතමී බාලිකා විද්‍යාලයේදී පවත්වන ලද විද්‍යා දින දර්ශනය
- 2018 ජූලි මස 6 සිට 9 වන දින දක්වා ක්‍රිස්තුදේව බාලිකා විද්‍යාලය පවත්වන ලද ක්‍රිස්තුදේව ශිල්ප ප්‍රභා 2018 අධ්‍යාපනික ප්‍රදර්ශනය
- 2018 මාර්තු මස හත සහ අට යන දිනවලදී කොළඹ සිරිමාවෝ බාලිකා විද්‍යාලයේ දී පවත්වන ලද අධ්‍යාපනික ප්‍රදර්ශනය

**මහේස්ත්‍රාත් අධිකරණ සහ ශ්‍රී ලංකා රේගුව විසින් කරන ලද ඉල්ලීම් සඳහා වූ විශ්ලේෂණ**

| ඉල්ලීම් කරන ලද්දේ කා විසින්ද යන වග | නිදර්ශකයේ ස්වභාවය | නිදර්ශක සංඛ්‍යාව | විශ්ලේශකයේ වටිනාකම (රු) |
|---|---|---|---|
| මහේස්ත්‍රාත් අධිකරණ | වැලි/පාෂාණ | 17 | 110,500.00 |
| රේගුව | වැලි | 14 | 56,000.00 |
| | | මුළු එකතුව | 166,500.00 |

- **විශ්ලේෂණ විද්‍යාගාරය**

බාහිර සේවා දායකයන් සඳහා සිදු කරන ලද රසායනික විශ්ලේෂණ

- හුණුගල්, තිරුවානා, ඩොලමයිට්, මිනිරන්, ෆෙල්ඩ්ස්පාර්, පස් වැලි, සිමෙන්ති, මයිකා, ඛනිජවැලි, මැටි, ජලය, දිරාගිය පාෂාණ, අනිකුත් මිශ්‍ර ලෝහ සහ ගඩොල් සහ පිහන් මැටි මිශ්‍ර භාණ්ඩ ආදිය අඩංගු නිදර්ශක 300 ක් පමණ විශ්ලේෂණය කිරීම විවිධ ආයතන හා පුද්ගලයන්ගේ ඉල්ලීම මත මෙම විද්‍යාගාරය විසින් සිදු කරන ලදී. මෙයින් රු. 21,44,500.00 (බදු රහිතව) ක මුදලින් විශ්ලේෂණ විද්‍යාගාර ආදායම ලෙස ලැබුණි.

- **භූ විද්‍යා අංශයේ ව්‍යාපෘති සඳහා සිදු කරන ලද රසායනික විශ්ලේෂණ කටයුතු .**

භූ විද්‍යා අංශයෙහි අදාල ව්‍යාපෘති ආදායම තුළ මෙම ආදායම ඇතුලත් වේ.

| **ව්‍යාපෘතියෙහි නම** | **නිදර්ශන සංඛ්‍යාව** | **ආදායම (රු.)** |
|---|---|---|
| 1. සී/ස ටෝකියෝ සිමෙන්ති හුණුගල් ව්‍යාපෘතිය | 83 | 581,000.00 |
| 2. එම්. පී. එම්. මයින්ස් ඇන්ඩ් මිනරල්ස් පුද්ගලික සමාගම / වැලි | 50 | 300,000.00 |
| 3. සී/ස ටොකියෝ ලංකා සිමෙන්ති සමාගම සඳහා සිමෙන්ති අමුද්‍රව්‍ය පරීක්ෂණය | 110 | 1,320,000.00 |
| 4. නිරිත දිග වෙරළ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා දෙද්දුව ප්‍රදේශයේ ජලයෙහි ගුණාත්මක තත්ත්වය පරීක්ෂා කිරීම | 31 | 704,000.00 |
| මුළු එකතුව | | **2,905,000.00** |

- **භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ නිලධාරීන්ගේ ඉල්ලීම මත ඔවුන්ගේ ව්‍යාපෘති / පර්යේෂණ සඳහා සිදු කරන ලද රසායනික විශ්ලේෂණ කටයුතු**

| **ව්‍යාපෘතිය මඟින් ඉල්ලා සිටින ලද විශ්ලේෂණය** | **නිදර්ශකයේ ස්වභාවය / නිදර්ශක සංඛ්‍යාව** | **සිදු කරන ලද විශ්ලේෂණයෙහි ප්‍රභේදය** | **විශ්ලේෂණයෙහි වටිනාකම** |
|---|---|---|---|
| 1. රතු පස් නිදර්ශක විශ්ලේෂණය | මැටි /සංඛ්‍යාව 01<br>රතු පස් /සංඛ්‍යාව 03 | සම්පූර්ණ විශ්ලේෂණය | 48,000.00 |
| 2. බොල්ගොඩ වැලි පරික්ෂණය | වැලි /04 | ඊයම්, කැඩ්මියම්, ආසනික්, මර්කරි | 9,000.00 |
| 3.ඇලමාර්ග වල අවසාදිත පරික්ෂණය | අවසාදිත /සංඛ්‍යාව 12 | රත්‍රන් සහ රිදී ඇතුළු බැර ලෝහ | 144,000.00 |
| 4. ප්‍රතිකාරක ක්‍රියාවලට භාජනය කිරීමෙන් පසුව පානීය ජලයේ ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම | ජලය / සංඛ්‍යාව 05 | පූර්ණ විශ්ලේෂණය | 45,000.00 |
| 5. ඉදි කිරීම් කටයුතු සඳහා ඇති යෝග්‍යතාවය පරීක්ෂා කිරීම | වැලි / සංඛ්‍යාව 4 | ලවණතාවය, ක්ලෝරයිඩ් කාබනික ද්‍රව්‍ය සහ කාබනේට් | 20,000.00 |
| 6. අගය එකතු කිරීම් කටයුතු | පාෂාණ / සංඛ්‍යා 2<br>ඉල්මනයිට් සංඛ්‍යා 5 | පූර්ණ විශ්ලේෂණය | 99,000.00 |
| 7. අපනයන නිදර්ශක විශ්ලේෂණය | තිරුවානා / සංඛ්‍යාව 02 | පූර්ණ විශ්ලේෂණය | 12,000.00 |
| 8. ගල්පර කැඩීම මඟින් භූගත ජලය කෙරෙහි ඇති කරනු ලබන ජල විද්‍යාත්මක බලපෑම් | ජලය / සංඛ්‍යා 14 | පූර්ණ විශ්ලේෂණය | 63,000.00 |
| 9. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශ කණ්ඩායම ශ්‍රී ලංකා රේගුව වෙතින් එකතු කර ගන්නා ලද නිදර්ශක | පස් හා කාබනික ද්‍රව්‍ය වල මිශ්‍රණය / නිදර්ශක 14 | රත්‍රන් පමණි | 28,000.00 |
| **විශ්ලේෂණ වල සම්පූර්ණ වටිනාකම** | | | **450,000.00** |

**නිතිපතා සිදු කරනු ලබන කාර්යයන් සඳහා අයකිරිමකින් තොරව නිදර්ශක පරික්ෂා කිරීම**

| **ව්‍යාපෘතිය මඟින් ඉල්ලා සිටින ලද විශ්ලේෂණය** | **නිදර්ශකයේ ස්වභාවය / නිදර්ශක සංඛ්‍යාව** | **සිදු කරන ලද විශ්ලේෂණයේ ප්‍රභේදය** | **විශ්ලේෂණයේ වටිනාකම** |
|---|---|---|---|
| 1. පාෂාණ විද්‍යා විද්‍යාගාරය / උසාවි නිදර්ශක | පස් / සංඛ්‍යා 10 | ලවණතාවය | Rs 10,000.00 |

| | | | |
|---|---|---|---|
| 2. ශ්‍රී ලංකා රේගුව | පස් / සංඛ්‍යා 5 | රත්‍රන් සඳහා | Rs 10,000.00 |
| 3 ශ්‍රී ලංකා විගණන දෙපාර්තමේන්තුව | පස් / සංඛ්‍යා 4 | රත්‍රන් සඳහා | Rs 8000.00 |
| **විශ්ලේෂණය මුළු වටිනාකම** | | | **Rs 28,000.00** |

- **භූ රසායනික සිතියම් පිළියෙල කිරීම**

(අ) කලාප අංක 20 - රක්වාන - තංගල්ල
1: 50,000 පරිමාණයේ තිබොල්කැටිය, මාතර, රක්වාන, තංගල්ල, මොරවක සහ හම්බන්තොට කලාපවල විශ්ලේෂණාත්මක දත්ත භාවිතා කරමින් සකසන ලද භූ රසායනික සිතියම් කලාප අංක 20 (රක්වාන - තංගල්ල) මුද්‍රණය කිරීමේ කටයුතු නිම කර ඇති අතර එම සිතියම දැන් අලෙවිය සඳහා නිකුත් කර ඇත.
(ආ) කලාප අංක 08 - අනුරාධපුරය - පොලොන්නරුව
අනුරාධපුරය - පොළොන්නරුව භූ රසායනික සිතියම් කලාප අංක 08 පිළියෙල කිරීම සඳහා කැකිරාව කලාපයෙන් එකතු කර ගන්නා ලද නිදර්ශක 250 ක විශ්ලේෂණ කටයුතු නිම කරන ලදී.
(ඇ) කලාප අංක 06 : වවුනියාව - ත්‍රිකුනාමලය
භූ රසායනික සිතියම් කලාප අංක 6 සැකසීම සඳහා මැදවච්චිය සහ හොරොව්පතාන 1:50,000 කලාප වලින් එකතු කර ගන්නා ලද නිදර්ශක 500 ක් එකතු කොට විශ්ලේෂණය කරන ලද අතර වවුනියාව සහ පාන්කුලම් හි රසායනික විශ්ලේෂණ කටයුතු ආරම්භ කරන ලදී.

- **විද්‍යාගාර ප්‍රතීතනය – ISO 17025.**

අවශ්‍ය ලේඛන සකස් කරන ලද අතර (තත්ත්වකරණ අත්පොත, ක්‍රියා පටිපාටි අත්පොත, ක්‍රම වේද අත්පොත සහ විගණන වාර්තා) විශ්ලේෂණ විද්‍යාගාරය සඳහා ISO – 17025 සහතිකය ලබා ගැනීම සඳහා අවශ්‍ය ලේඛන සමග ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය වෙත අයදුම් පත්‍රයක් යොමු කරන ලදි.

- **දෙවන ජාත්‍යන්තර ඛනිජ සම්මන්ත්‍රණය -2018**




ඛනිජ අංශයේ ආර්ථිකමය වශයෙන් හා පාරිසරිකමය වශයෙන් දක්නට ලැබෙන අභියෝගකාරී ගැටලු වලට ප්‍රතිකර්ම සෙවීම සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශයෙහි සහයෝගය ඇතිව ශ්‍රී ලංකා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් දෙවන ජාත්‍යන්තර ඛනිජ සම්මන්ත්‍රණය පවත්වන ලදී. ඛනිජ අංශය වෙත සාධනීය ප්‍රතිඵල ලබා දෙමින් 2018 නොවැම්බර් මාසයේදී එම සම්මන්ත්‍රණය සාර්ථක ලෙස නිමකරන ලදී.

ආර්ථික ප්‍රතිලාභ හා පාරිසරික බලපෑම් තුලනාත්මක ආකාරයකින් පවත්වාගෙන යෑම සඳහා ජාතියට අයත් පෘථිවි සම්පත් වෙත සාකල්‍ය ප්‍රවේශයක් ලබා ගැනීම සඳහා කැපවීමක් සහිත නීල හරිත යුගයක් නිර්මාණය කිරීම සඳහා වන අනාගත ශ්‍රී ලංකාවේ දැක්ම හා සමගාමී වන ලෙස දෙවන ඛනිජ සම්මන්ත්‍රණය පවත්වන ලදී .ඛනිජ අංශයෙහි සංවර්ධනය සඳහා වැදගත් වන කුඩා පරිමාණයේ පර්යේෂණ ගණනාවක් රට පුරා සිදු කර ඇති බව මෙහිදී අනාවරණය විය. අවුරුදු දෙකකට පසු නැවත විමසා බැලීමේදී පෙනී යන යන කරුණක් වූයේ සමහර පර්යේෂණ රටෙහි ආර්ථික සුභ සිද්ධිය සඳහා යොදා ගනු ලබන අතර තවත් සමහර පර්යේෂණ තවදුරටත් දීර්ඝ ලෙස සිදු කරනු ලබමින් පවතින බවයි. එහෙයින් රට සහ පාර්ශවකරුවන් වෙත මෙම සම්මන්ත්‍රණයෙහි ඇති වැදගත්කම අවබෝධ කර ගනිමින් ආරම්භක පියවරෙන් ඉගෙන ගන්නා ලද පාඩම් මත පදනම්ව මීටත් වඩා උසස් ආකාරයකින් වාර්ෂිකව මෙම කටයුත්ත ඉටු කිරීමට අමාත්‍යාංශය තුළ අභිලාෂයක් ඇත.



- **ඛණිජ ප්‍රතිපත්තිය සැකසීම**

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය දායක වන ප්‍රධාන හා වැදගත් කාර්යයන්ගෙන් එකක් වනුයේ 2017/18 වර්ෂය තුල ඛනිජ ප්‍රතිපත්තිය සැකසීමයි. විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය විසින් පත් කරන ලද කමිටුවක් විසින් පිලියෙල කරන ලද මෙම ප්‍රතිපත්තියෙහි මූලික කෙටුම්පත තවදුරටත් වැඩි දියුණු කර අවශ්‍ය සංරචක එකතු කරන ලදි. ඛනිජ ප්‍රතිපත්තියෙහි අවසාන කෙටුම්පත මහවැලි හා පරිසර අමාත්‍යාංශය සහ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති අතර තම අමාත්‍යාංශවල ඉහළ මට්ටමින් මෙම ප්‍රතිපත්තිය පොදුවේ පිලිගනු ලැබ ඇත. ඉතාකෙටි කලකින් මෙම ප්‍රතිපත්තිය අනුමත කිරිම සඳහා ජනතාව වෙත ඉදිරිපත් කරනු ඇත. ඛනිජ ප්‍රතිපත්ති කෙටුම්පත පිළිබඳ පාර්ශවකරුවන්ගේ රැස්වීමක් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ශ්‍රවණාගාරයේදී 2018 ඔක්තෝබර් මස 18 වන දින භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය පවත්වන ලදී.





## භූ භෞතික කාර්යයන්:

**මෙම ගවේෂණ කාලය තුලදී භූ භෞතික ඒකකය පහත සඳහන් ව්‍යාපෘතිවල නිරත විය.**

| විෂයය | ව්‍යාපෘතිය | අරමුන | ප්‍රගතිය |
|---|---|---|---|
| **01** | වැලි කැනීම් සිදු කරනු ලබන ප්‍රදේශ තුල මහවැලි ගඟෙහි යම් ස්ථානවල ලක්ෂණ<br>**AP/2018/ EGPY/Mahaweli** | යම් පාෂාණවල ගැඹුර ගැන අවධානය යොමු කරමින් වැලි කැනිම හේතු කොටගෙන ජල ගැලීම් සිදුවන තැනිතලා ප්‍රදේශ වෙත ඇති විය හැකි බලපෑම හඳුනා ගැනීම | මෙම කාර්යය සඳහා දින 08 ක් යොදා ගන්නා ලද අතර සිරස් විද්‍යුත් ශබ්ද පිරික්සීම් 16 ක් මේ සඳහා යොදා ගන්නා ලදී.<br>ක්ෂේත්‍ර කටයුතු වලින් 30% පමණ නිම කර ඇත. |
| **02** | ශ්‍රී ලංකාවේ ඩොලරයිට් නිධි සිතියම්ගත කිරීම<br>**AP/2018/EGPY/Dykes** | අධ්‍යයන සහ භූ තාපමය ශක්‍යතා පැතිකඩ ඔස්සේ මෙහි නිධි පිලිබඳ සිතියම් සැකසීම | මාදුරු ඔය, ගෝමරන්කඩුව යන ප්‍රදේශ සිතියම්ගත කර චුම්බකමය සිතියම් ගත කිරිම සඳහා ස්ථාන තෝරා ගන්නා ලදි. ක්ෂේත්‍ර කටයුතු වලින් 20% නිම කර ඇත. (දින 08) |
| **03** | භූ භෞතික උපකරණ පරික්ෂා කිරීමේ ස්ථාන හඳුනා ගැනීම<br>**AP/2018/GEPY/Test site** | භූ භෞතික උපකරණ පරික්ෂා කිරිම සඳහා කේන්ද්‍රීය පහසුකම් ලබාදිම සහ මේ පිලිබඳ දැනුම ලබා දීම සඳහා වැඩසටහන් පැවැත්වීම | ෆොක්ස් හිල් හි මේ සඳහා සුදුසු ස්ථානය පිලිබඳව යුධ හමුදාව සමග සාකච්ඡා පවත්වන ලදි |
| **04** | තිරුවානා නිධි පිලිබඳ ලේඛනය<br>**AP/2018/GEPY/VQ** | දැනට පවතින සංචිත සහ ගුණාත්මකභාවය පිලිබඳ තොරතුරු ඇතුලත්ව තිරුවානා නිධි පිලිබඳව සවිස්තරාත්මක දත්ත පදනමක් සැකසීම | එම ප්‍රදේශවල සංචාරය කර තිරුවාන කර්මාන්ත ස්ථානවලින් තොරතුරු ලබා ගැනීම සඳහා ප්‍රශ්නාවලියක් පිලියෙල කර ඇත. දින 04 |
| **05** | එප්පාවල පරික්ෂණය<br>**AP/2018/GEPY/Eppawal a** | සිතියමක් සැකසීම | එප්පාවල සිතියම් සකසා ඇත. වයස ගණනය කිරිම සඳහා ඩොලරයිට් නිදර්ශක යවා ඇත. |

## කැනීම් අංශය

- **පතල් අංශයෙහි ප්‍රධාන කටයුතු**

1992 අංක 33 දරන පතල් හා ඛනිජ පනත යටතේ, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් පහත සඳහන් බලපත්‍ර වර්ග නිකුත් කරනු ලැබේ.

- ගවේෂණ බලපත්‍ර
- කැනීම් බලපත්‍ර (ශිල්පීය, කාර්මික, විශේෂිත ඛණිජ)
- වෙළඳ පත්‍ර
- අපනයන බලපත්‍ර
- ප්‍රවාහන බලපත්‍ර

- **බලපත්‍ර පිලිබඳ තොරතුරු**

පුරස්කාර – (ආදායම්)

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් ලබා ගන්නා ලද පුරස්කාර ආදායම් පහත වගුව මගින් පෙන්නුම් කරනු ලැබේ. ලැබෙන පුරස්කාර ආදායමෙහි සාමාන්‍ය වර්ධනයක් එමගින් පෙන්නුම් කරනු ලැබේ.




| වර්ෂය | පුරස්කාර ආදායම(රු.මිලියන) | වර්ෂය | පුරස්කාර ආදායම(රු.මිලියන) |
|---|---|---|---|
| 2005 | 143.06 | 2012 | 732.71 |
| 2006 | 150.26 | 2013 | 681.27 |
| 2007 | 199.66 | 2014 | 1,128.46 |
| 2008 | 284.05 | 2015 | 1,293.43 |
| 2009 | 378.29 | 2016 | 1,578.58 |
| 2010 | 453.85 | 2017 | 2,569.32 |
| 2011 | 586.89 | 2018 | 4202.44 |

**පතල් පරීක්ෂා කිරීම මගින් උපයා ගන්නා ලද ආදායම**

පහත සඳහන් ප්‍රස්තාරය තුළ පෙන්නුම් කර ඇති පරිදි පතල් පරීක්ෂා කිරීම මගින් උපයා ගන්නා ලද ආදායම ඉහළ යෑම තුලින් රටෙහි ඛනිජ කර්මාන්තයෙහි ශීඝ්‍ර ඉහළයාම පෙන්නුම් කරනු ලැබේ.




| වර්ෂය | පතල් පරීක්ෂා ගාස්තු (රු.මිලියන) | වර්ෂය | පතල් පරීක්ෂා ගාස්තු (රු.මිලියන) |
|---|---|---|---|
| 2005 | 5.25 | 2012 | 142.52 |
| 2006 | 4.43 | 2013 | 153.23 |
| 2007 | 5.61 | 2014 | 140.15 |
| 2008 | 30.07 | 2015 | 182.94 |
| 2009 | 52.76 | 2016 | 247.95 |
| 2010 | 95.45 | 2017 | 260.66 |
| 2011 | 128.42 | 2018 | 243.54 |

2018 වර්ෂය තුළදී විවිධ බලපත්‍ර නිකුත් කිරීම මගින් උපයා ගන්නා ලද ආදායම පහත වගුව තුළ පෙන්නුම් කරනු ලැබේ.

වර්ෂය තුළදි නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව

| බලපත්‍ර වර්ගය | බලපත්‍ර කාණ්ඩය | ඒකක බලපත්‍ර ගාස්තුව | නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව | සම්පූර්ණ ගාස්තුව |
|---|---|---|---|---|
| ගවේෂණ | EL | | 34 | 6,247,000.00 |
| කැනීම් | IML/A | 20000 | 378 | 7,560,000.00 |
| | IML/B | 8000 | 1900 | 15,200,000.00 |
| | IML/C | 4000 | 493 | 1,972,000.00 |
| | AL/A | 3000 | 1747 | 5,241,000.00 |
| | AL/B | 1250 | 2395 | 2,993,750.00 |
| වෙළඳ | TDL/A | 7500 | 10 | 75,000.00 |
| | TDL/B | 5000 | 3729 | 18,645,000.00 |
| | TDL/C | 1000 | 6 | 6,000.00 |
| ප්‍රවාහන | TPL | 90 | 936511 | 84,285,990.00 |
| අපනයන | | 5000 | 649 | 3,245,000.00 |
| මුළු එකතුව | | | **947,852** | **145,470,740.00** |

- **ඛනිජ ගවේෂන, කැනීම්, වෙළඳ, ප්‍රවාහන සහ අපනයන බලපත්‍ර නිකුත් කිරීම තුළින් ලැබුන ආදායම පහත සටහනේ දැක්වේ.**




| වර්ෂය | බලපත්‍ර ගාස්තුව (රු.මිලි) | වර්ෂය | බලපත්‍ර ගාස්තුව (රු.මිලි) |
|---|---|---|---|
| 2005 | 36.05 | 2012 | 69.82 |
| 2006 | 47.04 | 2013 | 91.15 |
| 2007 | 48.04 | 2014 | 75.60 |
| 2008 | 41.90 | 2015 | 80.00 |
| 2009 | 45.07 | 2016 | 224.80 |
| 2010 | 57.64 | 2017 | 176.40 |
| 2011 | 79.46 | 2018 | 145.47 |

- **කැනීම් අංශය විසින් සිදු කරන ලද විශේෂ කටයුතු සහ ජාතික ආර්ථිකයට දක්වන ලද දායකත්වය**

පරිසරය ආරක්ෂා කිරීම සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් විශේෂ පියවර ගන්නා ලද අතර වනරෝප සහ ජන නිම්න හරිත අරණ වැනි තිරසාර කැනීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මගින් පරිසරය ආරක්ෂා කිරීම සඳහා රජයේ සහ පෞද්ගලික ආයතනවල සහයෝගය ලබා ගන්නා ලදී. ''හරිත වැලි තොටුපල ව්‍යාපෘතිය'' ශ්‍රී ලංකාව තුළ තිරසර කැනීම් ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද විශේෂ වැඩසටහනකි.
මීට අමතරව දැ.ස.ප.කො විසින් ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන තත්ත්වයන් සංවර්ධනය කිරීම සඳහා පියවර ගැනීම වැනි වෙනත් ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති ද ක්‍රියාත්මක කරන ලදී.

**හරිත වැලි තොටුපළ**

''හරිත වැලි තොටුපළ'' සංකල්පය පිළිබඳව වැඩමුළුවක් අගෝස්තු මස 29 සහ 30 යන දිනවලදී තුල්හිරිය මාස් ෆැබ්රික් පාර්ක් හිදී පවත්වන ලදී. ඉන් පසුව බලපත්‍රලාභීන් සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සහ කලාපීය මට්ටමින්ද දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී. ඒ අනුව භූ.ස.ප.කා වෙත අයදුම්පත් 3000 පමණ ඉදිරිපත් කරන ලදී.



**වන රෝපා**

වනරෝපා වැඩසටහනට සමගාමීව "ජල නිම්න හරිත අරන" නම් ව්‍යාපෘතිය පරිසර නියෝජ්‍ය අමාත්‍ය අජිත් මාන්නප්පෙරුම සහ භූ.ස.ප.කා සභාපති අසේල ඉද්දවල යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් මන්නාරම දිස්ත්‍රික්කයේ මුසලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි මල්වතුඔය අරිප්පු පාලම අසලදී 2018 ඔක්තෝබර් මස 5 දින ආරම්භ කරන ලදී.





භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් සංවිධානය කරන ලද වනරෝපා වැඩසටහන ජාත්‍යන්තර පරිසර දිනයට සමගාමීව නුවර ගම් පළාතේ අධිකරණ සංඝනායක අතිපූජ්‍ය මතාව ශ්‍රී සුමංගල නායක හිමිපානන් ගේ ප්‍රධානත්වයෙන් ඉසුරුමුණිය විහාර උද්‍යානයේදී ආරම්භ කරන ලදී.

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ අනුග්‍රහය යටතේ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ සභාපති අසේල ඉද්දවල සහ අධ්‍යක්ෂ ජනරාල් වෛර් සිරිවර්ධන යන මහත්වරුන්ගේ සහභාගීත්වය ඇතිව ඓතිහාසික සෝමාවතී පූජා භූමියේදී නොවැම්බර් මස 02 දිනද මෙම වැඩසටහන පවත්වන ලදී.

**ප්‍රති ආසෘති ජල පිරිපහදු උපකරණ**



උතුරු මැද පළාත තුළ දක්නට ඇති වකුගඩු රෝගය මර්දනය කිරීමට වන අතර මෙහිදී භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් ජලය පවිත්‍ර කිරීමේ උපකරණ පරිත්‍යාග කරනු ලැබේ.

අනුරාධපුර මිහිඳු ආරණ්‍ය සේනාසනයේදී ප්‍රති ආසෘති තාක්ෂණය යොදා ක්‍රියාත්මක කරනු ලබන මෙම යන්ත්‍රෝපකරණ ගම්මාන වෙත ලබා දෙනු ලැබේ.

500 වැනි රෝ උපකරණය පරිත්‍යාග කිරීමේ කාර්යය අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් 2018/09/21 දින පවත්වන ලද අතර මෙම උපකරණ 500 මගින් පිරිසිදු කරන ලද ජලය ජය ශ්‍රී මහා බෝධිය වෙත පූජා කරනු ලැබුනි.

**කඩවල වැව ප්‍රතිසංස්කරණය කිරීම**

ගම්වාසීන්ගේ වාරි සම්පාදක කටයුතු සඳහා පහසුකම් සැළසීම පිණිස පොලොන්නරුව තමන්කඩුව කඩවර වැව ප්‍රතිසංස්කරණය කිරීම භූ.ස.ප.කා තාක්ෂණ සේවා සමාගම, ශ්‍රී ලංකා නාවික හමුදාව, භූ.ස.ප.කා සහ තමන්කඩුව ප්‍රදේශයෙහි වැලි කැනීමේ නිරත ප්‍රජාවෙහි සහභාගීත්වය ඇතිව 2018/08/09 දින සිදුකරන ලදී.

ආදායම් හා වියදම් ප්‍රකාශය

| | 2017<br>ජනවාරි - දෙසැම්බර්<br>රු. | 2018<br>ජනවාරි - දෙසැම්බර්<br>රු. |
|---|---|---|
| බලපත්‍ර ගාස්තු | 275,649,686.79 | 182,010,668.01 |
| පරීක්ෂා කිරීමේ ගාස්තු | 260,394,886.53 | 243,540,031.79 |
| රාජ්‍ය භාගය | 4,626,027,568.08 | 4,336,254,835.78 |
| කැනීම් ආදායම | 5,162,072,141.40 | 4,761,805,535.58 |
| විද්‍යාගාර | 2,566,300.00 | 4,106,800.00 |
| ව්‍යාපෘති | 23,897,133.76 | 46,863,846.00 |
| භූ විද්‍යා ආදායම | 26,463,433.76 | 50,970,646.00 |
| වෙනත් | 100,148,439.17 | 105,835,411.02 |
| පොළී ආදායම | 281,010,362.65 | 323,407,258.13 |
| අනෙකුත් ආදායම් මුළු එකතුව | 381,158,801.82 | 429,242,669.15 |
| **මුළු ආදායම** | **5,569,694,376.98** | **5,242,018,850.73** |
| භූ විද්‍යා | 49,629,316.81 | 77,790,198.13 |
| සිතියම් | 15,856,719.49 | 15,534,556.93 |
| ව්‍යාපෘති | 13,202,794.86 | 22,144,716.99 |
| කලාපීය | 209,433,945.19 | 304,643,830.10 |
| කැනීම් | 37,658,014.16 | 3,780,211,518.53 |
| පරිපාලන | 415,920,677.96 | 470,050,746.43 |
| ආදායම් බදු | 75,714,400.00 | 180,623,742.00 |
| **මුළු වියදම** | **817,415,868.47** | **4,850,999,309.11** |
| **වියදමට පසු ආදායම** | **4,752,278,508.51** | **391,019,541.62** |



# ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ
# මධ්‍යම උපදේශන කාර්යාංශය

A. 2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා කාර්යාංශය විසින් භාරගත් නව ව්‍යාපෘති සංඛ්‍යාව

1. උපදේශන සේවා ව්‍යාපෘති:
   ව්‍යාපෘති සංඛ්‍යාව: **69**
   මුළු උපදේශන සේවා ගාස්තු: රු.බිලියන **2.6**

2. ඉදිකිරීම් සේවා ව්‍යාපෘති:
   ව්‍යාපෘති සංඛ්‍යාව: **42**
   ව්‍යාපෘතියේ මුළු පිරිවැය: රු.බිලියන **12.5**

B. **201**8 අවසානය දක්වා අත්පත් කරගත් ජයග්‍රහණ - ප්‍රධාන ව්‍යාපෘති කිහිපයක ප්‍රගතිය

## උපදේශන අංශය

| අංකය | ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘතියේ මුළු පිරිවැය ශ්‍රී.ල රු.මිලියන | **2018.12.31** දිනට අපගේ සේවා සැපයීමේ ප්‍රගතිය % |
|---|---|---|---|
| 01 | මාතර – කතරගම දුම්රිය මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය. | 40,000 | 92 |
| 02 | මුල්ලේරියාව මූලික රෝහලෙහි ජාතික ආඝාත මධ්‍යස්ථානයක් ඉදිකිරීම. | 1, 220 | 65 |
| 03 | කළුගඟ ජලාශයේ මූලස්ථායි සංවර්ධන ව්‍යාපෘතිය. | 14,250 | 70 |
| 04 | බ්‍රෝඩ්ලැන්ඩ්ස් ජලවිදුලි ව්‍යාපෘතිය. | 11,480 | 59 |
| 05 | උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය. | 71,400 | 95 |
| 06 | මැනිං වෙළඳ සංකීර්ණය පැළියගොඩ ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය. | 4,000 | 79 |
| 07 | අකුරේගොඩ, පැලවත්ත, ප්‍රධාන ආරක්ෂක මූලස්ථාන ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම. | 55,000 | 47 |
| 08 | කොළඹ **05**, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය ඉදිකිරීම. | 2,515 | 85 |
| 09 | ත්‍රිකුණාමල නැව් තටාකය ඉදිකිරීම් ව්‍යාපෘතිය. | 3,000 | 100 |
| 10 | දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝකිරීම - මාතරසිට බෙලිඅත්ත සහ මත්තල සිට හම්බන්තොට දක්වා. | 255,000 | 84.5 |
| 11 | මධ්‍යම අධිවේගී මාර්ගය ඉදිකිරීම - මීරිගම සිට කුරුණෑගල දක්වා. | 137,000 | 45 |
| 12 | කොළඹඅග නගර සනඅපදුව්‍යකළමනාකරණව්‍යාපෘතිය- අරුවක්කාලු,පුත්තලම | 16,000 | 40 |
| 13 | සීතාවකගඟජලවිදුලිබලාගාරය - දෙහිඕවිට. | 15,000 | 65 |
| 14 | සෙත්සිරි පාය (අදියර 3)ඉදිකිරීම. | 10,000 | 32 |
| 15 | පොලොන්නරුවේ යෝජිත ජාතික පාසල( පළමු අදියර). | 513 | 100 |



මැනිං වෙළඳ සංකීර්ණය පැළියගොඩ




මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය



උමා ඔය බහුකාර්ය  සංවර්ධන ව්‍යාපෘතිය



බ්‍රෝඩ්ලන්ඩ් ජලවිදුලි ව්‍යාපෘතිය



දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝකිරීම




අරුවාක්කාල්හි සණ අපද්‍රව්‍ය කළමණාකරණ ව්‍යාපෘතිය

## ඉදිකිරීම් අංශය

| අංකය | ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘතියේ මුළු පිරිවැය ශ්‍රීල රු.මිලියන | 2018.12.31 දිනට ඉදිකිරීම්වල ප්‍රගතිය % |
|---|---|---|---|
| 01 | මොරාගහ ජලාශය ඉදිකිරීම. | 1,209 | 96 |
| 02 | කැළණිය විද්‍යාලංකාර පිරිවෙනෙහි බෞද්ධ සම්මේලන ශාලාව ඉදිකිරීමේ ව්‍යාපෘතිය. | 685 | 99.6 |
| 03 | රත්නපුර ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය. | 406 | 83 |
| 04 | කරාපිටිය ශික්ෂණ රෝහලෙහි නව ඒකකයක් පිහිටුවීමේ ඉදිකිරීම. | 790 | 61 |
| 05 | යාපනය ශික්ෂණ රෝහලෙහි හදිසි අනතුරු ඒකකය ඉදිකිරීමේ ව්‍යාපෘතිය. | 531 | 100 |
| 07 | කුරුණෑගල මූලික රෝහලෙහි මාතෘ ඒකකයට අදාළ වාට්ටු සංකීර්ණය ඉදිකිරීම. | 915 | 90 |
| 08 | සෞඛ්‍ය අමාත්‍යාංශ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම් ව්‍යාපෘතිය , කාසල් වීදිය. | 5,199 | 26 |
| 10 | විශේෂිත ළමා වාට්ටු සංකීර්ණයක් ඉදිකිරීම - අම්පාර මහ රෝහල. | 876 | 17 |
| 11 | නවගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම - මූලික රෝහල, නින්තවූර්. | 2,887 | 11 |
| 13 | අනුරාධපුර මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය ඉදිකිරීම. | 3,724 | 11 |
| 14 | රේඩීය ත්වරණ විකිරණචිකිත්සාගාරයඉදිකිරීම - ශික්ෂණරෝහල, අනුරාධපුර. | 270 | 30 |
| 15 | යෝජිතපරිපාලන ගොඩනැගිලි සංකීර්ණයක් සැලසුම් තර ඉදිකිරීම,නවනගරය,පොළොන්නරුව . | 1,303 | 33 |
| 16 | යෝජිතරජයේනිලධාරි නිවාසසංකීර්ණය නවනගරය, පොළොන්නරුව. | 1,737 | 31 |
| 17 | කෞතුකාගාර හා සම්පත් මධ්‍යස්ථානය ඉදිකිරීම, පොලොන්නරුව( පළමු අදියර). | 165 | 100 |
| 18 | ලන්ඩනයේ ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ මාණ්ඩලිකනිල නිවාස අලුත්වැඩියාකිරීම /ප්‍රතිසංස්කරණයකිරීම. (අන්තර්ජාතික අංශය) . | 86 | 86 |



කැළණිය විද්‍යාලංකාර පිරිවෙනෙහි බෞද්ධ සම්මේලන ශාලාව



කෞතුකාගාර හා සම්පත් මධ්‍යස්ථානය ඉදිකිරීම,

පොලොන්නරුව



මහ නගර සභාව ඉදිකිරීම, පොළොන්නරුව



යෝජිත පරිපාලන ගොඩනැගිලි සංකීර්ණය පොළොන්නරුව



සෞඛ්‍ය අමාත්‍යාංශ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල

## C. 2019 වර්ෂය සඳහා සැලසුම් කර ඇති ක්‍රියාකාරකම්

**කාර්යාංශය විසින් දැනට භාරගෙන ඇති ප්‍රධාන උපදේශන හා ඉදිකිරීම් ව්‍යාපෘති කිහිපයක විස්තර. මෙම ව්‍යාපෘති 2019 වර්ෂය තුළදීද සිදුකරගෙන යනු ඇත.**

| ව්‍යාපෘතියේ නම | කෙටිවිස්තරය | විෂය පථය | ව්‍යාපෘතියේ මුළු පිරිවැය ශ්‍රීල රු.මිලියන |
|---|---|---|---|
| රත්නපුරඋසාවිසංකීර්ණයඉදිකිරීම. | මෙමගොඩනැගිල්ල ඉදිකිරීමේ සියළු උපදේශන සේවාවන් කාර්යාංශය විසින් ලබාදෙනු ලැබේ. | උපදේශන සේවා සැපයීම | 1,800 |
| නාගරිකපුනර්වර්ධන ව්‍යාපෘතිය - කොළඹනගරයේඉදිකිරීමනිවාසඒකක 400ක් ඉදිකිරීම. | මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමේ සියළුඋපදේශන සේවාවන් කාර්යාංශය විසින් ලබාදෙනු ලැබේ. | උපදේශන සේවා සැපයීම | 15,000 |

| | | | |
|---|---|---|---|
| සුබිතපුරවරනගරසංවර්ධනවැඩසටහන - මහනුවර. | කොන්ත්‍රාත් පරිපාලනය සහ අධීක්ෂණය,තත්ව පාලනය ආදී කාර්යයන් කාර්යාංශය විසින් සිදුකරනු ලැබේ. | උපදේශන සේවා සැපයීම | 1,000 |
| කොළඹසැහැල්ලු දුම්රිය ගමනාගමනමාර්ග(ලයිට් රේල් ටාන්සිට් LRT) මාළබේ සිට පිටකොටුව දක්වා සැහැල්ලු දුම්රිය මාර්ගයක් ඉදිකිරීම. | මූලික ශක්‍යතා අධ්‍යයනය. | උපදේශන සේවා සැපයීම | 300,000 |
| නිවාසව්‍යාපෘතිය -ජයවර්ධනපුර රෝහල පාර,තලවතුගොඩ. | මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමේ සියළු උපදේශන සේවාවන් කාර්යාංශය විසින් ලබාදෙනු ලැබේ. | උපදේශන සේවා සැපයීම | 7,000 |
| ශ්‍රී ලංකාව රායඅධිකාරිය සඳහා මහල්17කින් යුත් ගොඩනැගිල්ල හාවැඩමුළුශාලා 04ක්ඉදිකිරීම. | මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමේ සියළු උපදේශන සේවාවන් කාර්යාංශය විසින් ලබාදෙනු ලැබේ. | උපදේශන සේවා සැපයීම | 10,739 |
| මුඛ සෞඛ්‍ය ඒකකයක් ඉදිකිරීම - ශික්ෂණ රෝහලක රාපිටිය. | මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමේ සියළු උපදේශන සේවාවන් කාර්යාංශය විසින් ලබාදෙනු ලැබේ. | නිර්මාණය කිරීම හා ඉදිකිරීම | 997 |
| ළමා වාට්ටු සංකීර්ණයක් ඉදිකිරීම - ශික්ෂණ රෝහල- අම්පාර. | මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමේ සියළු උපදේශන සේවාවන් කාර්යාංශය විසින් ලබාදෙනු ලැබේ.. | නිර්මාණය කිරීම හා ඉදිකිරීම | 1,427 |
| පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම - හෙද පුහුණු පාසල අනුරාධපුර. | මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමේ සියළු උපදේශන සේවාවන් කාර්යාංශය විසින් ලබාදෙනු ලැබේ. | නිර්මාණය කිරීම හා ඉදිකිරීම | 790 |
| ළමා වාට්ටු සංකීර්ණයක් ඉදිකිරීම- කරාපිටියශික් ෂණ රෝහල. | මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමේ සියළු උපදේශන සේවාවන් කාර්යාංශය විසින් ලබාදෙනු ලැබේ. | නිර්මාණය කිරීම හා ඉදිකිරීම | 1,359 |
| යෝජිත අධ්‍යාපන හා පරිපාලන ගොඩනැගිල්ල, හෙද පුහුණු පාසල - ගාල්ල. | මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමේ සියළු උපදේශන සේවාවන් කාර්යාංශය විසින් ලබාදෙනු ලැබේ. | නිර්මාණය කිරීම හා ඉදිකිරීම | 513 |

මහවැලි උපදේශන කාර්යාංශය

## ඉංජිනේරු අංශය

**සිදු කරන ලද ප්‍රධාන ව්‍යාපෘතීන් ව්‍යාපෘති කාලපරිච්ඡේදය - 2018.01.01 සිට 2018.12.31 දක්වා**

| අං | ව්‍යාපෘතිය | ඇස්තමේන්තු වටිනාකම (මිලියන) | ප්‍රගතිය | මූල්‍ය වියදම රු. (මිලියන) | මූල්‍ය ලැබීම් (මිලියන) | සටහන |
|---|---|---|---|---|---|---|
| 1 | යෝජිත සංචාරක නිවාසය ඉදිකිරීම මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය | 82,935,966.63 | 40% | 56 | 34.5 | මෙම ව්‍යාපෘතියෙහි ගිවිසුම2018.06.27 දින සීනෝ හයිඩ්‍රෝ ආයතනය මගින් අවසන් කරන ලදී |
| 2 | යෝජිත නිරීක්ෂණ මධ්‍යස්ථානය ඉදිකිරීම මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘති | 137,053,875.00 | 10% | 26.6 | 23.1 | මෙම ව්‍යාපෘතියෙහි ගිවිසුම 2018.06.27 දින සීනෝ හයිඩ්‍රෝ ආයතනය මගින් අවසන් කරන ලදී |
| 3 | ප්‍රජාමූල බැංකුව ඉදිකිරීම හිඟුරක්ගොඩ - | 10,812,971.47 | 90% | 6.8 | 7.0 | ඉදිකරමින් පවතින |
| 4 | කණේවෙල අමුණ නැවත ඉදි කිරීම - හොරණ | 34,601,101.72 | 20% | 4.9 | 10.3 | ඉදිකරමින් පවතින |

## ව්‍යාපෘති කලමනාකරණ / උපදේශක සේවා අංශය

| අං | ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘති වටිනාකම රු.(මිලියන) | සම්පූර්ණ කර ඇත/ ක්‍රියාත්මක වෙමින් පවතී | ප්‍රගතිය (%) | වෙනත් |
|---|---|---|---|---|---|
| 01 | උතුරු පලාත් ජල සම්පත් සංවර්ධනය සඳහා ශක්‍යතා අධ්‍යනය | 34,452,520.00 | සම්පූර්ණ කර ඇත. | 100% | |
| 02 | උමා ඔය බහුකාර්ය ව්‍යාපෘතිය (ප්‍රධාන නිර්මිතයන්) සඳහා සකසා ඇති පරිසර කලමණාකරන සැලැස්මෙහි පසු විපරුම් විගනණය හා වාර්තාකරණය | 10,879,000.00 | සම්පූර්ණ කර ඇත. | 100% | කොන්ත්‍රාත්තුව 2018 වර්ෂය දක්වා දීර්ඝ කර ඇත |
| 03 | ශ්‍රී ලංකාව තුල ජල සම්පත් සහ වාර්මාර්ග සංවර්ධනය සඳහා සිදුකරන ක්‍රමෝපායික පරිසර ඇගයීම් අධ්‍යනය | 37,750,625.00 | ක්‍රියාත්මක වෙමින් පවතී | 90% | |
| 04 | පරිසරික බලපෑම් ඇගයීම් අධ්‍යනය - මාදුරු ඔය දකුණු ඉවුරු ඇල සංවර්ධන ව්‍යාපෘතිය | 20,331,500.00 | ක්‍රියාත්මක වෙමින් පවතී | 95% | |
| 05 | පරිසරික බලපෑම් ඇගයීම් අධ්යනය - යෝජිත ගිං -නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය | 22,138,000.00 | ක්‍රියාත්මක වෙමින් පවතී | 20% | Client (MIWRM) is in the process of finalizing the revised project layout |
| 06 | පරිසරික බලපෑම් ඇගයීම් අධ්‍යනය - යෝජිත පහල මල්වතු ඔය ජලාශ ව්‍යාපෘතිය | 8,940,250.00 | ක්‍රියාත්මක වෙමින් පවතී | 95% | |
| 07 | යෝජිත යටිමහන ජලාශ ව්‍යාපෘතිය - ශක්‍යතා අධ්‍යනය | 31,627,000.00 | ක්‍රියාත්මක වෙමින් පවතී | 30% | අනුග්‍රාහකයා – ජා.ජ.ස.හා.ජ.ම |
| 08 | යෝජිත මුන්දෙනි ආරු සංවර්ධන ව්‍යාපෘතිය - සමාජ බලපෑම් අධ්‍යයනය හානැවත පදිංචි කිරීම | 4,540,000.00 | ක්‍රියාත්මක වෙමින් පවතී | 80% | අනුග්‍රාහකයා **වා.ජ.ස.හා.ආ. ක.අ** |

| අං | ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘති වටිනාකම රු.(මිලියන) | සම්පූර්ණ කර ඇත/ ක්‍රියාත්මක වෙමින් පවතී | ප්‍රගතිය (%) | වෙනත් |
|---|---|---|---|---|---|
| 09 | පරිපූරක පාරිසරික බලපෑම් ඇගයීම් අධ්‍යයනය - නැවත පදිංචි කරවීමහා වාරි ජලය සැපයීම සඳහා වන යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය | 4,773,000.00 | ක්‍රියාත්මක වෙමින් පවතී | 70% | අනුග්‍රාහකයා **වා.ජ.ස.හා.ආ.ක.අ** |
| 10 | යෝජිත තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය - සමාජ බලපෑම් අධ්‍යයනය | 2,990,250.00 | ක්‍රියාත්මක වෙමින් පවතී | 20% | අනුග්‍රාහකයා **වා.ජ.ස.හා.ආ.ක.අ** |

ජා.ජ.ස.හා.ජ.ම - ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය

**වා.ජ.ස.හා.ආ.ක.අ** - වාරිමාර්ග,ජලසම්පත් හා ආපදා කලමණාකරන අමාත්‍යාංශය

**උපදේශකවරුන් අනුයුක්ත කිරීමේ සේවා සැපයීම 2018.**

1. මහවැලි උපදේශක සේවා කාර්යාංශය (පුද්ගලික) සමාගම සීනෝහයිඩ්‍රෝ සමාගම- චීනය අතර සේවා සැපයීම සඳහා ගිවිසුම
    - කොන්ත්‍රාත් අගය- රු. මිලියන 670
    - ලද මුදල - රු. මිලියන 211.2 (වැට් සහ ජාතිය ගොඩනැගීමේ බදු රහිතව)
    - අත්තිකාරම් අඩු කල පසු ලැබුනු මුලු මුදල - රු. මිලියන 210.7 (වැට් සහ ජාතිය ගොඩනැගීමේ බදු රහිතව)
2. මොරගහකන්ද ව්‍යාපෘතිය සඳහා උපදේශන සේවා සැපයීම
    - කොන්ත්‍රාත් අගය- රු. මිලියන 167.1
    - ලද මුදල - රු. මිලියන 166.7(වැට් සහ ජාතිය ගොඩනැගීමේ බදු රහිතව)
    - අත්තිකාරම් අඩු කල පසු ලැබුනු මුලු මුදල - රු. මිලියන 165.3 (වැට් සහ ජාතිය ගොඩනැගීමේ බදු රහිතව)

# IV කොටස

# මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ එක් එක් අංශ මගින් ක්‍රියාත්මක කරන වැඩසටහන්වල ප්‍රගතිය

- වායු සම්පත් කළමනාකරණ හා ජාතික ඕසෝන් ඒකකය
- ජෛව විවිධත්ව අංශය
- දේශගුණ විපර්යාස අංශය
- භූමි සම්පත් අංශය
- පරිසර දූෂණ පාලන හා රසායන ද්‍රව්‍ය කළමනාකරණ අංශය
- වන සම්පත් අංශය
- පරිසර සැලසුම් හා ආර්ථික අංශය
- අධ්‍යාපන, පර්යේෂණ හා පුහුණු අංශය
- ප්‍රතිපත්ති සැලසුම් හා නියාමන අංශය
- අන්තර්ජාතික සබඳතා අංශය
- නීති අංශය
- ආයතන අංශය
- විමර්ශන අංශය
- මානව සම්පත් සංවර්ධන අංශය
- අභ්‍යන්තර විගණන අංශය
- ඉඩම් අංශය
- ඉංජිනේරු තාක්ෂණ සේවා හා ප්‍රසම්පාදන අංශය
- ජල සම්පත් කළමණාකරණ අංශය




# වායු සම්පත් කළමනාකරණ හා ජාතික ඕසෝන් ඒකකය

වායු තත්ත්ව කළමනාකරණයට අදාළ ප්‍රතිපත්ති සැලසුම් සකස් කිරීම හා අදාළ පාර්ශවකරුවන් සම්බන්ධීකරණය තුලින් එම ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීම වායු සම්පත් කළමනාකරණ අංශය මගින් සිදු කරන අතර මීට අදාළව වාහන වායු විමෝචන පාලනය කිරීම, ස්ථානීය වායු විමෝචන පාලනය කිරීම, ගෘහස්ථ වායු තත්ත්ව කළමනාකරණය, ඉන්ධන වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම, වායු තත්ත්ව අධීක්ෂණය සහ වායු දූෂණය පිළිබඳ මහජනයා දැණුවත් කිරීමේ කටයුතු මෙම අංශය මගින් සම්බන්ධීකරණය කරනු ලබයි.

වායු දූෂණය, වර්තමාන ලෝකය මුහුණ දෙන ඉතාමත්ම බරපතල ගැටළුවක් වන අතර, එය සෞඛ්‍ය, පාරිසරික මෙන්ම ආර්ථික ක්ෂේත්‍රයන් කෙරෙහිද බලපෑම් ඇති කිරීමට ඉවහල් වී ඇත. කාර්මික හා වාණිජ අංශවල වේගවත් ව්‍යාප්තිය මෙන්ම රටේ ආර්ථික වර්ධනයට අනුකූලව ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ ප්‍රයත්නයේදී ශ්‍රී ලංකාවේද වායු දූෂණ තත්ත්වයන් වැඩිවීමේ ගැටලුවක් උද්ගතවී ඇත. ශ්‍රී ලංකාවේ වායු දූෂණය කෙරෙහි ප්‍රධාන වශයෙන් දායකත්වයක් දක්වනු ලබන්නේ ජංගම ප්‍රභවයන්ගෙන් සිදු වන වායු විමෝචනයන් සහ ස්ථානීය ප්‍රභවයන්ගෙන් සිදුවන වායු විමෝචනයන් වන අතර, ආර්ථික කටයුතු වල සීඝ්‍ර ව්‍යාප්තිය අති විශාල ලෙස පොසිල ඉන්ධන භාවිතයෙන් බලශක්තිය උත්පාදනය කිරීමද මෙයට හේතු වී ඇත. ශ්‍රී ලංකාවේ වර්තමාන තත්ත්වය සැලකීමේදී විශේෂයෙන් කොළඹ නගරයේ වායු දූෂණය සඳහා ප්‍රවාහන අංශය 60% ක පමණ දායකත්වයක් දරන අතර, කොළඹ නගර සීමාවේ ස්ථාපනය කර ඇති තාප බලාගාර හේතුවෙන් මෙම තත්ත්වය තවත් උග්‍ර වී ඇත. එසේම අනෙකුත් නගරයන්ද වායු දූෂණයේ තර්ජනයට ලක්ව ඇති අතර, භූගෝලීය පිහිටීම අනුව (නිම්නයක) මහනුවර නගරය මේ සම්බන්ධයෙන් පෙරමුණ ගෙන ඇත. ශ්‍රී ලංකාවේ වායු දූෂණය පිළිබඳව සැලකීමේදී ගෘහස්ථ වායු දූෂණය ද ප්‍රමුඛස්ථානයක් ගන්නා අතර නිවෙස්වල ආහාර පිසීමේදී ජෛව ස්කන්ධ භාවිතය ඉහළ මට්ටමක පැවතීම මීට ප්‍රධාන හේතුව වේ.

සැමට පිරිසිදු වාතය මෙහෙය යටතේ 2018 වර්ෂයේදී වායු සම්පත් කළමනාකරණ අංශය විසින් ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් රුසකි.

## වායු තත්ත්ව කළමනාකරණය සඳහා උපාය මාර්ගික කළමනාකරණය හා සම්බන්ධීකරණය සඳහා ආයතනික ව්‍යුහය ස්ථාපනය කිරීම

- **වායු සම්පත් කළමනාකරණය සඳහා පාර්ශවකරුවන් සම්බන්ධීකරණය**

වායු සම්පත් කළමනාකරණ අංශය 2018/04/19 වන දින වායු සම්පත් කළමනාකරණයට අදාළ වන පාර්ශවකරුවන් කැඳවා දැනට වායු තත්ත්ව කළමනාකරණය සඳහා පවත්නා වූ වැඩසටහන සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී. තවද වායු සම්පත් කළමනාකරණය උදෙසා පාර්ශවකරුවන්ගේ සම්බන්ධීකරණය ශක්තිමත් කිරීමට මෙහෙයුම් / නියාමන කමිටුවක් ස්ථාපනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලද අතර 2018/07/11 දින ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඒ අනුව "පිරිසිදු වායු 2025 ක්‍රියාකාරී සැළැස්ම" ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය සහ නියාමනය සඳහා වායු තත්ත්ව කළමනාකරණ ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන්ගෙන් හා විශේෂඥයන්ගෙන් සමන්විත මෙහෙයුම් කමිටුවක් හා තාක්ෂණික කමිටුවක් ස්ථාපනය කිරීමට වායු සම්පත් කළමනාකරණ අංශය පියවර ගන්නා ලද අතරම 2018/11/30 දින මෙම මෙහෙයුම් / නියාමන කමිටුව හා තාක්ෂණ කමිටුව ඒකාබද්ධ කර රුස්වීමක් පවත්වා වායු සම්පත් කළමනාකරණය පිළිබඳ බොහෝ කරුණු සාකච්ඡා කර තීරණ රුසකට එළැඹීමක් සිදු කෙරිණි.

- **වායු තත්ත්ව කළමනාකරණය සම්බන්ධ ජාතික සමුළුව පැවැත්වීම**

වායු සම්පත දූෂණය වළක්වා ගැනීමට අදාළව වායු ගුණාත්මක භාවය හා නවීන තාක්ෂණය සහ විද්‍යාත්මක පරීක්ෂණ සම්බන්ධයෙන් විවෘතව සාකච්ඡා කිරීමේ අරමුණින් වායු තත්ත්ව කළමනාකරණය සම්බන්ධ 7 වන ජාතික සමුළුව 2018/08/16-17 යන දිනයන්හීදී මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.

## ප්‍රවාහන ක්ෂේත්‍රයේදී සිදුවන වායු විමෝචන ඵලදායී ලෙස කළමනාකරණය

- **වාහන වායු විමෝචන ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම**

වාහන ආනයනයේදී EURO 4 හෝ ඊට සමාන ප්‍රමිති ක්‍රියාත්මක කිරීම සඳහා 2018 වර්ෂයේ අයවැයේදී යෝජනා විය. ඒ අනුව රාජ්‍ය ආයතන හා වාහන ආනයනය කරන්නන් නියෝජනය වන පරිදි පාර්ශවකරුවන් කැඳවා 2018/06/21 දින රුස්වීමක් පවත්වා වාහන ආනයන ප්‍රමිති EURO 4 ප්‍රමිතිය කරා

වර්ධනය කිරීම සම්බන්ධව එකී පාර්ශවකරුවන්ගේ අදහස් විමසන ලදී. පසුව වාහන ආනයනය, නිෂ්පාදනය හෝ එකලස් කිරීම සඳහා වන වාහන විමෝචන ප්‍රමිති අංක: 2079/42 හා 2018/07/12 දිනැති ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද අතර අංක 2083/3 හා 2018/08/06 දිනැති ගැසට් පත්‍රය මගින් එකී ප්‍රමිති තවදුරටත් සංශෝධනය කරන ලදී.

- **වාහන වායු විමෝචන පරීක්ෂණ වැඩසටහන (VET Programme ) අධීක්ෂණය**



ප්‍රවාහන ක්ෂේත්‍රයේදී සිදුවන වායු විමෝචන අවම කිරීමේ අරමුණ ඇතිව රත්නපුර, කෑගල්ල, මහනුවර, කළුතර හා කුරුණෑගල දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි වාහන වායු පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථාන අධීක්ෂණය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. එහිදී ගැටලු සහගත මධ්‍යස්ථාන හඳුනාගෙන එම ගැටලු නිරාකරණය කිරීමට පියවර ගන්නා ලදී.

## සුපිරිසිදු තාක්ෂණය, පිරිසිදු ඉන්ධන ආශ්‍රිත ක්‍රියාකාරකම

- **ශ්‍රී ලංකාව තුල පරිසර හිතකාමී රිය ධාවනය ප්‍රවර්ධනය සඳහා වන නියමු ව්‍යාපෘතිය**

පරිසර හිතකාමී රිය ධාවනය මගින් ඉන්ධන කාර්යක්ෂමතාව හා වායු ගුණාත්මක භාවය ඉහළ යාම, මාර්ග සුරක්ෂිතතාවය ඇතිවීම, වාහන නඩත්තු පිරිවැය අඩුවීම ආදි පරිසර හිතකාමී ප්‍රයෝජනයන් බොහෝ ප්‍රමාණයක් ළඟා කර ගත හැකි සේම රියදුරන් හා මගීන් උදෙසා සෘජු ඵලප්‍රයෝජන හිමි වෙයි. මෙහිදී පරිසර හිතකාමී රිය ධාවනය යනුවෙන් අදහස් වන්නේ සැලකිය යුතු මට්ටමින් ඉන්ධන පිරිමැස්ම ඉහළ නංවා ගැනීම හා වාහන වායු විමෝචනය අඩුකිරීම කෙරෙහි බලපෑමක් ඇතිකර ගත හැකි වන පරිදි රිය ධාවනය කරන ආකාරය සුළු වෙනසකට භාජනය කිරීමයි. එම අරමුණ ඉටුකර ගැනීම සඳහා ව්‍යාපෘතියට අදාළ පාර්ශවකරුවන් කැඳවා රැස්වීම් 04ක් සංවිධානය කරන ලද අතර එහිදී පරිසර හිතකාමී රිය ධාවනය සඳහා ජපාන සහයෝගීතා නියමු ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම හා සංවිධානය කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

- **ශ්‍රී ලංකාවේ වායු තත්ත්ව කළමනාකරණය උදෙසා පොසිල ඉන්ධනයන්ගේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම**

පොසිල ඉන්ධන දහනයේදී පිටවන විමෝචනයන්ගේ ප්‍රතිඵලයක් ලෙස සංසරණ වායු ගුණාත්මක භාවය විනාශ වී යාම ඉතාමත් සංකීර්ණ ගැටළුවකි. ඒ සඳහා සියළුම පාර්ශ්වයන්ගේ සහභාගීත්වයෙන් සියළුම පැතිකඩ ආවරණය වන පරිදි පුළුල් උපාය මාර්ගයන් සහ කාලීන ඉලක්කයන් සහිතව ශ්‍රී ලංකාව සඳහා සුපිරිසිදු ඉන්ධන හඳුන්වා දීමේ අරමුණෙන් මාර්ග සිතියමක් සකස් කර ඇත. එමගින් ප්‍රවාහන, කර්මාන්ත හා බලශක්ති උත්පාදන ක්‍රියාවලීන් තුල පොසිල ඉන්ධන දහනය මගින් සිදුවන වායු දූෂණය අවම කිරීමට මෙන්ම ගෘහස්ථ වායු දූෂණය අවම කිරීමටද උපකාර වනු ඇත. මෙම ඉන්ධන තත්ත්ව මාර්ග සිතියම යාවත්කාලීන කර අවසන් කිරීම සඳහා තාක්ෂණික කමිටු රැස්වීමක් 2018/01/23 දින පවත්වන ලදී.

### අවට වායු ගුණාත්මකභාවය පිළිබඳව අධ්‍යයනය කිරීම

ශ්‍රී ලංකාව තුළ සිදු කරන ලද වායු ගුණාත්මක තත්ත්ව අධීක්ෂණ කටයුතු පිළිබඳව ප්‍රගතිය සමාලෝචන කිරීම සහ ශ්‍රී ලංකාව සඳහා අංග සම්පූර්ණ වායු තත්ත්ව අධීක්ෂණ යාන්ත්‍රණයක් සකස් කිරීම සඳහා අදාළ පාර්ශවයන් සමඟ මූලික කටයුතු අවසන් කර ඇත. අන්තර් වාර අධීක්ෂණ ක්‍රමවේදයක් ලෙස ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය දැනටමත් සිදු කරනු ලබන වායු තත්ත්ව අධීක්ෂණ කටයුතු වල දත්තයන් ලබා ගැනීම, නුවර නගරයේ අධීක්ෂණ කටයුතු පුළුල් කිරීම සහ පුත්තලම නගරයේ අධීක්ෂණ කටයුතු ආරම්භ කිරීම වෙනුවෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය වෙත ප්‍රතිපාදන ලබාදෙන ලද අතර එහිදී ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් ඉදිරිපත් කරන ලද අධ්‍යයන වාර්තාවේ දත්තයන් ඉදිරි සැළසුම් කටයුතු සඳහා ප්‍රයෝජනයට ගැනීමට නියමිතය.

**ගෘහස්ථ වායු තත්ත්ව කළමනාකරණය**

ගෘහස්ථ පරිසර එනම් නිවාස, කාර්යාල, කර්මාන්ත ශාලා, පන්තිකාමර, රථ වාහන වැනි මිනිසා විසින් දෛනික කටයුතු ඉටු කර ගැනීම සඳහා පරිහරණය කරන බාහිර පරිසරයට සෘජුවම නිරාවරණය නොවූ ස්ථාන වල අහිතකර වායූන්ගේ සාන්ද්‍රණය ඉහළ යාම වඩා භයානක හා අහිතකර සෞඛ්‍යමය බලපෑම් ඇති කරයි. එබැවින් පිරිසිදු වායු 2025 ක්‍රියාකාරී සැලැස්මෙහි ගෘහස්ථ වායු තත්ත්ව කළමනාකරණය හා ඒ සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම ප්‍රධාන උපායමාර්ගයක් ලෙස හඳුනාගෙන ඇත. ඒ සඳහා 2018 වර්ෂයේදී තාක්ෂණික කමිටුවක් පත්කර ගන්නා ලද අතර 2018/12/27 දින එහි පළමුවන සාකච්ඡා වටය පවත්වන ලදී.

**වායු දූෂණය හා වායු තත්ත්ව කළමනාකරණය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන්**

වායු දූෂණය පාලනය කර එය අවමකර ගැනීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් තුලින් ප්‍රවේශයක් ලබාගැනීමේ හැකියාවක් පවතී. එබැවින් වායු සම්පත් කළමනාකරණ අංශය මගින් පොලිස් නිලධාරීන්, පාසල් සිසුන් හා ජනමාධ්‍යවේදීන් දැනුවත් කිරීම සඳහා 2018 වර්ෂයේදී විශේෂ අවධානය යොමු කරන ලදී.
වායු දූෂණය, වායු තත්ත්ව කළමනාකරණය හා වාහන වායු විමෝචන පරීක්ෂා කිරීමේ වැඩසටහන සම්බන්ධව රථ වාහන හා පරිසර පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් 2018 වර්ෂයේදී සංවිධානය කරන ලද අතර එකී වැඩසටහන් කුරුණෑගල, පොළොන්නරුව, කෑගල්ල හා ගාල්ල යන දිස්ත්‍රික්ක ආවරණය වන අයුරින් ඉතා සාර්ථකව පවත්වන ලදී.
තවද පාසල් සිසුන් දැනුවත් කිරීම තුලින් වායු දූෂණය පාලනය කිරීමේ වැදගත්කම දරුවන් මගින් සමාජගත කිරීම හා ඒ සඳහා ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීමේ අරමුණ ඇතිව වායු දූෂණය, එමගින් සෞඛ්‍ය හා පරිසරය කෙරෙහි ඇති කරන අහිතකර බලපෑම්, වායු ගුණාත්මක තත්ත්ව කළමනාකරණය පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් කෑගල්ල, කුරුණෑගල, ගම්පහ යන දිස්ත්‍රික්ක ආවරණය කරමින් පවත්වන ලදී.





වායු දූෂණය හා ආශ්‍රිත සෞඛ්‍ය හා පාරිසරික ගැටළු පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම සහ හරිත හා තිරසාර පරිසරයක් උදෙසා වායු ගුණාත්මක තත්ත්වයෙහි ඇති වැදගත්කම කෙරෙහි මහජන අවධානය යොමු කිරීමේ අරමුණෙන් ජනමාධ්‍ය වේදීන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් 2018/12/27 දින මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේදී පවත්වන ලදී. විවිධ ජනමාධ්‍යයන් නියෝජනය කරමින් ජනමාධ්‍යවේදීන් 35 දෙනෙකු පමණ මේ සඳහා සහභාගී වූ අතර එහිදී වායු තත්ත්ව කළමනාකරණය සම්බන්ධයෙන් මේ දක්වා ගෙන ඇති ක්‍රියාකාරකම් වල සාර්ථකත්වය සහ ඒකී ක්‍රියාදාමයේ සන්ධිස්ථානයන්, වාහන වායු විමෝචන පරීක්ෂණ වැඩසටහනෙහි සාර්ථකත්වය සහ ඉදිරි ක්‍රියාමාර්ගයන්, වාහනවල ඉන්ධන කාර්යක්ෂමතාව, යෝජිත ඉන්ධන තත්ත්ව මාර්ග සිතියම, ගෘහස්ථ වායු තත්ත්ව කළමනාකරණය, වායු දූෂණයෙහි සෞඛ්‍යය බලපෑම්, වායු තත්ත්ව අධීක්ෂණ ක්‍රමවේදයන්, පාරිසරික තිරසාර ප්‍රවාහන ක්‍රමවේදයන්, ස්ථානීය වායු විමෝචන පාලන උපාය මාර්ග, අපද්‍රව්‍ය කළමනාකරණය තුලින් වායු දූෂණය පාලනය, ඕසෝන් වියන හායනය සහ ඕසෝන් ස්තරය ආරක්ෂා කිරීම සඳහා වන ගෝලීය ප්‍රවේශය සහ එහි දේශීය දායකත්වය, යෝජිත හරිත ගොඩනැගිලි සංකල්පය පිළිබඳ හැඳින්වීම වැනි විවිධ මාතෘකා ඔස්සේ වායු සම්පත් කළමනාකරණය පිළිබඳ ප්‍රවීණයින් විසින් දේශන ඉදිරිපත් කරන ලදී.


National Biodiversity Strategic
Action Plan 2016-2022
Biodiversity Secretariat
Ministry of Mahaweli Development and Environment

# ජෛවවිවිධත්ව අංශය

## ශ්‍රී ලංකාවේ ජෛවවිවිධත්ව සංරක්ෂණය

ශ්‍රී ලංකාව වර්ෂ 1992දී ජෛවවිවිධත්ව සම්මුතියට අත්සන් තැබූ පාර්ශවකාර රාජ්‍යයක් බවට පත් වූ අතර, වර්ෂ 1994දී එයට අපරානුමැතිය ලබා ගන්නා ලදී. සියලුම පාර්ශවකාර රටවල් ජෛවවිවිධත්ව සංරක්ෂණයට අදාළ ජාතික උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු බවට ජෛවවිවිධත්ව සම්මුතියේ 10 වන සැසිවාරයේදී එකඟ විය. ඒ අනුව, මෙම අංශය මඟින් ජාතික ජෛවවිවිධත්ව උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම 2016-2022 වර්ෂය සඳහා සකසන ලදී.

මෙම උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්මේ ජාතික ඉලක්ක යටතේ ඇති ක්‍රියාකාරකම් ජෛවවිවිධත්ව අංශය මෙන්ම විවිධ පාර්ශවකාර ආයතන මඟින් ක්‍රියාත්මක කරනු ලබන අතර මෙහි සම්බන්ධීකරණ කටයුතුද මෙම අංශය මඟින් සිදු කරනු ලබයි. 2018 වර්ෂය තුළදී මෙම උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් ක්‍රියාකාරකම් ප්‍රාදේශීය මට්ටමෙන් ක්‍රියාත්මක කිරිම සඳහා අදාළ රාජ්‍ය, රාජ්‍ය නොවන හා පුද්ගලික අංශයේ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළු 3ක් දිස්ත්‍රික් ලේකම්තුමන්ලාගේ ප්‍රධානත්වයෙන් ත්‍රිකුණාමලය, යාපනය හා මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලදී පවත්වනු ලැබීය.








### ජෛවවිවිධත්වය හා සම්බන්ධ විද්වත් කමිටු

ජෛවවිවිධත්ව සංරක්ෂණය හා තිරසර සංවර්ධනය උදෙසා වන ජාතික ජෛවවිවිධත්ව විද්වත් කමිටුව කාලීනමය ගැටලු පිළිබඳ තීන්දු තීරණ ගනු ලබන අතර මීට අමතරව ජීවී විශේෂ සංරක්ෂණ කමිටුව, ආක්‍රමණශීලී ආගන්තුක ජීවීන් පිළිබඳ කමිටුව, ජෛව සුරක්ෂිතාව පිළිබඳව සම්බන්ධීකරණ කමිටුව, පරාග වාහක සංරක්ෂණ උපදේශක කමිටුව, පාරම්පරික දැනුම පිළිබඳ කමිටුව, පුරාජෛවවිවිධත්වය පිළිබඳ උපදේශක කමිටුව සහ කඩොලාන සංරක්ෂණය පිළිබඳ විද්වත් කමිටුව යන කමිටු මඟින් නොයෙකුත් සංරක්ෂණ ක්‍රියාවලින් සම්බන්ධව තීන්දු තීරණ ගැනීම සහ සැලසුම් සකස් කිරීමේ දී අදාළ තාක්ෂණික නිර්දේශයන් ලබා දීම සිදු කරනු ලැබේ.

2018 වර්ෂය තුල අදාල විද්වත් කමිටු මගින් පහත නිර්දේශ ලබා දී ඇත.

- රුහුණු විශ්ව විද්‍යාලයේ දූරස්ථ අධ්‍යාපන අංශය යටතේ ජෛවවිවිධත්ව පාඨමාලාවක් හඳුන්වා දීම.
- ජෛව සම්පත් භාවිතය සහ ප්‍රතිලාභ බෙදා හදා ගැනීමේදී ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාවය හඳුනාගැනීම.





ජාතික ජෛවවිවිධත්ව විද්වත් කමිටු රැස්වීම

## අන්තර්ජාතික ජෛවවිවිධත්ව දින සැමරුම

2018 මැයි 22 දිනට යෙදුන අන්තර්ජාතික ජෛවවිවිධත්ව දිනයේ මෙවර තේමාව වූ “මිහිමත ජීවය සුරකිමු - 25 වසරක අත්දැකීම් හුවමාරු කර ගනිමු “ යන්න පෙරදැරි කරගනිමින් ජෛවවිවිධත්ව සම්මුතියේ 25 වන සැමරුම් උත්සවය මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේදී පවත්වනු ලැබීය.






25වන සැමරුම් උත්සවයේ අවස්ථා

## ජාතික රතුදත්ත ලේඛණය යාවත්කාලීන කිරීම

ශ්‍රී ලංකාව ජෛවවිවිධත්වයෙන් අනූන රටක් වන අතර ලෝක ජෛවවිවිධත්ව උණුසුම් කලාප අතරින් එකක් ලෙස නම් කර ඇත්තේ ඒකීය ක්ෂේත්‍රඵලයක් තුල පවතින අධික ජීවී විවිධත්වය ඉතා ඉහළ අගයක් වීම හා ඒවායේ පැවැත්මට එල්ලවන තර්ජනද ඉහළ මට්ටමක පැවතීමත් සැලකිල්ලට ගැනීමෙනි.

ශාක විශේෂ පිළිබඳ සංරක්ෂිත තත්වය ඇගයීම යටතේ ශාක විශේෂ 3492ක් අතරින් 2018 වසර තුලදී ශාක විශේෂ 1600ක් ඇගයීමට ලක් කරන ලද අතර මෙම ඇගයීම සඳහා ජාතික ශාකාගාරය හා ශාක පිළිබඳ විද්වතුන් සමඟ පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව 10ක් වන අතර මෙම ක්‍රියාවලිය ඉදිරි කාලය තුලදී ක්‍රියාත්මක කිරීම සිදු කිරීම මගින් ජාතික රතු දත්ත ලේඛණයේ ශාක පිළිබඳ ලේඛණය එළිදැක්වීමට බලාපොරොත්තු වේ.
සත්ත්ව විශේෂ පිළිබඳ සංරක්ෂිත තත්වය ඇගයීම යටතේ 2018 වර්ෂයේ ගොඩ බෙල්ලන් හා මුහුදු ක්ෂීරපායින් පිළිබඳ සත්ව කාණ්ඩ විද්වත් කමිටු රැස්වීම් 02ක් පවත්වන ලදි.

## ජෛවවිවිධත්වය හා පරිසර පද්ධති සේවා වටිනාකම් පිළිබඳ විශ්ව විද්‍යාල සිසුන් දැනුවත් කිරීම

ජෛවවිවිධත්වය හා පරිසර පද්ධති සේවාවන්ගේ වටිනාකම් හඳුනාගනිමින් ඒවා සංරක්ෂණය කර තිරසර ලෙස භාවිතා කිරීම පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික වැඩමුළුවක් රජරට විශ්ව විදාලයේදී පවත්වනු ලැබිණි.






**වැඩමුළුවේ අවස්ථා කිහිපයක්**

## ශ්‍රී ලංකාවේ පුරාජෛවවිවිධත්වය සංරක්ෂණය සහ තිරසර භාවිතය පිළිබඳ ක්‍රියාකාරී සැලසුම



පුරාජෛවවිවිධත්ව ක්‍රියාකාරී සැලසුම

ඉංග්‍රීසි මාධ්‍යයෙන් සකස් කරනු ලැබූ පුරාජෛවවිවිධත්ව ක්‍රියාකාරී සැලැස්ම, පුරාජෛවවිවිධත්ව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්වලදී මෙන්ම විශ්ව විද්‍යාල සිසුන්ගේ සහ අනෙකුත් පරිහරණය කරන්නන්ගේ පහසුව උදෙසා සිංහල භාෂාවට පරිවර්තනය කරන ලදී.

## පාංශු ජෛවවිවිධත්ව පැතිකඩ සහ සංරක්ෂණ ක්‍රියාකාරී සැලැසුම

ශ්‍රී ලංකාවේ කෘෂි ජෛවවිවිධත්වය සංරක්ෂණය සඳහා තිරසාර කෘෂිකාර්මික ක්‍රමෝපායන් ප්‍රවර්ධනය සහ ස්ථාපිත කිරීම ඉලක්ක කරගනිමින් සහ පාංශු ජීවීන් සංරක්ෂණය කර ගැනීමේ අරමුණින් එම ක්ෂේත්‍රයේ විද්වතුන්ගේ සහභාගීත්වයෙන් පාංශු ජෛවවිවිධත්ව පැතිකඩ සහ සංරක්ෂණය ක්‍රියාකාරී සැලැසුම සකස් කරන ලදී.

## අටවිසි බෝධි වෘක්ෂ වැඩසටහන

මෙම වැඩසටහන යටතේ 2018 වර්ෂය තුලදී අටවිසි බෝධි වෘක්ෂ කට්ටල 50 ක ප්‍රමාණයක් දිවයිනේ විවිධ ප්‍රදේශවල විහාරස්ථාන, රාජ්‍ය ආයතන හා පුණ්‍ය ආයතන සඳහා ලබාදී ඇත. මෙමගින් දුර්ලභ හා ආගමික වශයෙන් වැදගත් ශාක විශේෂ ගහනය වැඩි කිරීම සිදුකෙරේ.

## පාරම්පරික දැනුම පිළිබඳ ආසියානු කලාපීය වැඩමුළුව

පාරම්පරික දැනුම පිළිබඳ ආසියානු කලාපීය රටවල් සඳහා වූ වැඩමුළුව 2018 ජූලි 27 දින සිට 31 දක්වා මහනුවර දී පැවැත්විනි. මේ සඳහා ඉන්දියාව, භූතානය, නේපාලය, පකිස්ථානය, මැලේසියාව, පිලිපීනය, වියට්නාමය, ටජිකිස්ථානය සහ ලාඕසය යන රටවල විදේශ නියෝජිතයන් 20 දෙනෙකු පමණද ශ්‍රී ලංකාවේ මෙම ක්ෂේත්‍රයට අදාළ ආයතන නියෝජනය කරමින් පිරිසක් සහභාගී වූහ.

මෙම කලාපීය වැඩමුළුවේදී පාරම්පරික දැනුම සංරක්ෂණය කරමින් එය තිරසර ලෙස භාවිතය පිළිබඳ මෙන්ම ඉන් අත්වන ප්‍රතිලාභ බෙදා හදා ගන්නා ආකාරය පිළිබඳව ද දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලද අතර ශ්‍රී ලංකාවේ පාරම්පරික වෛද්‍ය ක්‍රම පිළිබඳව ද ප්‍රායෝගික දැනුවත් කිරීමක් සිදු කරන ලදී.







## ශාක හා සත්ත්ව ජීවී විශේෂ පිළිබඳ දත්ත එක්රැස් කිරීම අරමුණු කරගෙන ජෛව විවිධත්වය සම්බන්ධ පර්යේෂණ සඳහා මූල්‍යාධාර ලබාදීම

රතු දත්ත ලේඛනය යාවත්කාලීන කිරීමේදී දත්ත ඌනතාවයක් පවතින ශාක හා සත්ත්ව විශේෂ පිළිබඳව දත්ත රැස්කර ගැනීමේ අරමුණින් පර්යේෂණ සඳහා පර්යේෂකයන්ට මූල්‍යාධාර සැපයීම සිදු කරනු ලබයි. මේ යටතේ 2018 වර්ෂය සඳහා පර්යේෂණ ව්‍යාපෘති 3ක් සඳහා මූල්‍යාධාර සපයන ලදී.

1. **Distribution, Ecology and Phenology of Impatiens repens Moon (Balsaminaceae): a rediscovered Endemic Plant Species of Sri Lanka**
2. **Diversity, Systematics and Conservation of the Skink fauna (Scincidae) of Sri Lanka**
3. **Floristic Diversity of Ambokka Mountain Range.**

**කඩොලාන පරිසර පද්ධති සංරක්ෂණය සහ තිරසර භාවිතය**

- කඩොලාන සංරක්ෂණය හා තිරසර භාවිතය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය කෙටුම්පත් කරන ලද අතර එය දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට පරිවර්තනය කර ඇත.
- 2018.06.05 දින අම්පාර ශාස්ත්‍රවෙලි (කඩොලාන කැළෑ) රක්ෂිත වනාන්තරයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී.
- කඩොලාන පරිසර පද්ධති සංරක්ෂණය සහ තිරසර භාවිතය සඳහා අමාත්‍යාංශයේ ස්ථාපිත කර ඇති විද්වත් කමිටුව මගින් උපකමිටුවක් පත්කොට කඩොලාන නැවත වගා කිරීම සහ පුනරුත්ථාපනය සඳහා මාර්ගෝපදේශ සකස් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.
- පුත්තලම දිස්ත්‍රික්කයේ පුත්තලම හා හලාවත අඩවි වල තෝරාගත් හායනයට ලක්වූ කඩොලාන පරිසර පද්ධති හෙක්ටයාර 10 ක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා එක්ව පුනරුත්ථාපනය කරන ලදි.
- මන්නාරම සහ පුත්තලම දිස්ත්‍රික්කයේ පවතින කඩොලාන පරිසර පද්ධතිය සංරක්ෂණය සහ තිරසර ලෙස භාවිතා කරන්නේ කෙසේද යන්න පිළිබඳව එම දිස්ත්‍රික්කවල රාජ්‍ය නිලධාරීන්, ත්‍රිවිධ හමුදා, පරිසර පොලීසියට අනුයුක්ත නිලධාරීන් මෙන්ම විශ්ව විද්‍යාල සිසුන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් මෙන්ම කඩොලාන පැල සිටුවීමේ ප්‍රායෝගික වැඩසටහනක් පිළිවෙලින් 2018 ජූනි 8 සහ 2018 ජූලි 26 දිනයන්හිදී පවත්වනු ලැබිය.
- කඩොලාන පරිසර පද්ධතිය සංරක්ෂණය හා තිරසර භාවිතය පිළිබඳ පාසැල් සිසුන් දැනුවත් කිරීමේ ප්‍රායෝගික වැඩමුළුවක් ශ්‍රී ලංකා නෙක්ස්ට් නීල හරිත යුගයක් වැඩසටහනට සමගාමීව 2018 ඔක්තෝබර් 19 දින බන්ඩාරණායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදි. මෙහිදී වැඩමුළුවට සහභාගීවූ සිසුන්හට ඔවුන් විසින් ලබා ගන්නා ප්‍රායෝගික දැනුම භාවිතා කර අනෙකුත් පාසැල් සිසුන්ද සහභාගී කරවා ගනිමින් කඩොලාන පරිසර පද්ධති සංරක්ෂණ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරවීමට අවශ්‍ය දැනුම ලබාදීම සහ උනන්දුව ඇතිකිරීම සිදුකරන ලදි.



ක්ෂේත්‍රයේ කඩොලාන පැල සිටුවීම





කඩොලාන පරිසර පද්ධති සංරක්ෂණය පිළිබඳ පාසල් සිසුන් දැනුවත් කිරීම




දේශගුණ විපර්යාස අංශය

දේශගුණ විපර්යාස බලපෑම්වලට ජාතික වශයෙන් මුහුණ දීම සඳහා අවශ්‍ය සැලසුම් සංවර්ධන ක්‍රියාදාමයට ඇතුලත් කිරීම, ප්‍රතිපත්ති සහ වැඩසටහන් සංවර්ධනය කිරීම, දේශගුණික විපර්යාසයන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා කැපවුනු ආයතනික යාන්ත්‍රණයක් ලෙස ක්‍රියා කිරීම, දේශගුණික විපර්යාස පිළිබඳ ජාතික ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමුඛතා හඳුනා ගැනීම හා දේශගුණ විපර්යාස පිළිබඳ පර්යේෂණ සඳහා පහසුකම් සැලසීම සහ පර්යේෂණ ප්‍රතිඵල ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාකාරකම් සඳහා බෙදා හැරීමට කටයුතු කරනු ලබයි. තවද දේශගුණ විපර්යාස පිළිබඳව එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියෙහි ලේකම් කාර්යාලය සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම සහ කියතෝ සම්මුතියට අදාළව ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් තොරතුරු බෙදාහැරීමේ මධ්‍යස්ථානය ලෙස ක්‍රියාකරයි. මෙම අරමුණු සපුරා ගනු වස් දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය පහත සඳහන් ක්‍රියාකාරකම් සිදුකර ඇත.

### දේශගුණික විපර්යාස පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

දේශගුණ විපර්යාස වලට අනුහුරුවීම සහ හරිතාගාර වායු විමෝචනය අවම කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය සැලසුම දේශගුණික විපර්යාස පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මගින් ලබාදේ. ප්‍රගතිය වාර්තා කරන කාලසීමාව තුළ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවමින් දේශගුණ විපර්යාසවල බලපෑම්වලට ලක්වන ප්‍රධාන ක්ෂේත්‍ර වලට අදාළව බලපෑමට ලක්වන ප්‍රදේශ ඇගයීම සිදුකරමින් පවතී. එසේම තෙවන ජාතික සන්නිවේදන වාර්තාව සැකසීමේ ව්‍යාපෘතිය යටතේ හරිතාගාර වායු විමෝචන ඉන්වෙන්ට්‍රිය සැකසීමද මේ කාල සිමාව තුළ සිදුවේ.

### දේශගුණ විපර්යාස සඳහා ජාතික අනුහුරු සැලැස්ම

ජාතික අනුහුරු සැලැස්ම රටක දේශගුණ විපර්යාස සඳහා මුහුණ දීමට යොදන ජාතික උත්සාහයන්ගෙන් සැදුම්ලත් මාර්ගෝපදේශයකි. ජාතියක් වශයෙන් දේශගුණ විපර්යාස වලින් ඇතිවන අවදානම අඩුකර ගනිමින් අනුහුරු ධාරිතාවය වර්ධනය කර ගැනීමට ප්‍රායෝගික සැලසුමක් සකස් කිරීම මෙහි අරමුණයි. මෙම ජාතික අනුහුරු සැලැස්ම යටතේ ශ්‍රී ලංකාව තුළ දේශගුණික විපර්යාස වල අහිතකර බලපෑම් වලට වඩාත්ම ලක්විය හැකි ක්ෂේත්‍ර 10 ක් හඳුනාගෙන ඇත.

ප්‍රධාන වශයෙන් හඳුනාගත් ක්ෂේත්‍ර ලෙස ආහාර සුරක්ෂිතතාව, ජල සම්පත්, වෙරළ හා සමුද්‍ර අංශය, සෞඛ්‍යය, මානව ජනාවාස හා යටිතල පහසුකම්, පරිසර පද්ධති හා ජෛවවිවිධත්වය, සංචාරක හා විනෝද ක්‍රීඩා, අපනයන කෘෂි කාර්මික අංශය, කර්මාන්ත, බලශක්ති සහ ප්‍රවාහන ක්ෂේත්‍රය දැක්විය හැකිය.ජාතික අනුහුරු සැලැස්ම, දේශගුණික විපර්යාස ලේකම් කාර්යාලයේ වෙබ් අඩවියෙහි (www.climatechange.lk) ප්‍රකාශයට පත් කර ඇත.

ප්‍රගතිය වාර්තා කරන කාලසීමාව තුළ,




- පළාත් සඳහා දේශගුණික විපර්යාස පිළිබඳ අනුවර්තන සැලසුම් සකස් කිරීමට අදාළ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම සඳහා පවත්වන ලද වැඩමුළු සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.
- දේශගුණ විපර්යාස පිළිබඳ අනුගත වීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි සිංහල සහ දෙමළ පරිවර්තනයන් සිදු කරන ලදී. එහි සිංහල පරිවර්තනය පිටපත් 1000 ක් මුද්‍රණය කරන ලදී.

### දේශගුණික තාක්ෂණික අවශ්‍යතා ඇගයීම

දේශගුණ විපර්යාස සඳහා සාර්ථකව මුහුණදීමට අවශ්‍ය තාක්ෂණික අවශ්‍යතා ඇගයීම් වාර්තාව සකසා ඇති අතර දේශගුණ විපර්යාස සම්බන්ධ ව්‍යාපෘති සැකසීමේදී හා තෙවන ජාතික සන්නිවේදන වාර්තාව සැකසීමේදී මෙම ඇගයීම් වාර්තාව උපයෝගී කරගෙන ඇත.

### ශ්‍රී ලංකාවේ යෝජිත ජාතික වශයෙන් තීරණය කළ දායකත්වයන් (INDCs) පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම

පැරිස් ගිවිසුම පරිදි ගෝලීය උණුසුම පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකාව විසින් අනුගමනය කරනු ලබන උපාය මාර්ගයන් වන "දේශීයව තීරණය කරන ලද දායකත්වය" (Intended Nationally Determined Contributions - INDCs) ප්‍රකාශයට පත් කොට 2020-2030 වසර තුලදී දේශීයව තීරණය කරන ලද දායකත්ව (INDCs) ක්‍රියාත්මක කිරීමට එකඟ වී ඇත.

බලශක්ති, ප්‍රවාහන, කර්මාන්ත, අපද්‍රව්‍ය කළමනාකරණය, ජෛවවිවිධත්වය හා පරිසර පද්ධති, සෞඛ්‍ය, ආපදා කළමනාකරණය, ජල හා වාරිමාර්ග, කෘෂිකර්ම, පශු සම්පත්, සාගර හා නාවික, නගර, මහා නගර හා

මානව ජනාවාස, සංචාරක කර්මාන්ත හා විනෝදාංශ යන ක්ෂේත්‍ර යටතේ හරිතාගාර වායු විමෝචනය අවම කිරීම සඳහා වූ උපායමාර්ගික ප්‍රතිපත්ති සහ ක්‍රියාත්මක සැලසුම්සකස් කිරීමට නියමිතය. මෙම ක්ෂේත්‍ර 13 සඳහා දේශීයව තීරණය කරන ලද දායකත්ව (INDCs) ක්‍රියාත්මක කිරීමට විෂය භාර අමාත්‍යතුමාගේ හා පලාත් සභා අමාත්‍යවරුන්ගේ ප්‍රධානත්වයෙන් උපදේශක සභා පිහිටුවන ලදී. තවද, උපායමාර්ගික ප්‍රතිපත්ති සහ ක්‍රියාත්මක සැලසුම් සකස් කිරීම සඳහා වූ සැලසුම් සම්පාදන හා මෙහෙයුම් පිළිබඳ විශේෂඥ කමිටු අදාළ අමාත්‍යාංශවල ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පිහිටුවන ලදී.

අතිගරු ජනාධිපතිතුමා විසින් එක්සත් ජාතීන්ගේ මූලස්ථානයේ පැවති එක්සත් ජාතීන්ගේ මහා සභා රැස්වීමේදී, දේශගුණික විපර්යාස පිළිබඳ පැරිස් ගිවිසුම අපරානුමත කිරීමේ නීත්‍යානුකූල ලේඛනය භාර දෙන ලදී. "දේශීයව තීරණය කරන ලද දායකත්වය" (NDCs) එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියට ඉදිරිපත් කරන ලදී. ප්‍රවාහන ක්ෂේත්‍ර සඳහා දේශීයව තීරණය කරන ලද දායකත්වය සහ හරිතාගාර වායු ඉන්වෙන්ටරිය පිළිබඳ පුහුණු වැඩමුළුවක් පවත්වන ලදී. දේශීයව තීරණය කරන ලද දායකත්වයෙහි සිංහල හා දෙමළ පරිවර්තන කටයුතු සිදු කරන ලදී.

## "ශ්‍රී ලංකා නෙක්ස්ට්-නීලහරිත යුගයක්" ජාත්‍යන්තර සම්මන්ත්‍රණය සහ ප්‍රදර්ශනය 2017

ශ්‍රී ලංකාව දේශගුණ විපර්යාසයන්ගේ අහිතකර බලපෑම් වලට දැඩිව ලක්වේ. දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියේ (UNFCCC) පාර්ශවකර රටක් ලෙස ශ්‍රී ලංකාව දේශගුණ විපර්යාසයන්ගේ අභියෝගයන්ට මුහුණ දීමට සහ ඊට එරෙහිව ක්‍රියාත්මක වීමේ සිය ගෝලීය කාර්යභාරය අවබෝධ කරගෙන ඇති අතර එම සම්මුතියේ 21වන පාර්ශවකරුවන්ගේ රැස්වීමේදී එකඟත්වය ලබාදුන් පැරිස් ගිවිසුමට අපරානුමතිය ලබාදී ඇත. ශ්‍රී ලංකාව සිය ජාතික වශයෙන් තීරණය කරනලද දායකත්ව ඉදිරිපත්කර ඒවා ක්‍රියාත්මක කිරීමට සූදානම් වීමේ සැලසුමක් සකස්කර ඇත. ශ්‍රී ලංකාව පැරිස් ගිවිසුමේ 2030 න්‍යාය පත්‍රය සහ තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමට දක්වන කැපවීම පිළිබිඹු කිරීමට "ශ්‍රී ලංකා නෙක්ස්ට්-*නීල හරිත යුගයක්*" වැඩසටහන දියත්කර ඇත.

ඒ අනුව, තුන්වන "*ශ්‍රී ලංකා නෙක්ස්ට්-නීලහරිත යුගයක්*" පාරිසරික සම්මන්ත්‍රණය සහ ප්‍රදර්ශනය 2018 ඔක්තෝබර් මස 19-20 දිනවල දී පවත්වන ලදී. මෙම වැඩසටහනේ සම්බන්ධීකරණ කටයුතු දේශගුණික විපර්යාස ලේකම් කාර්යාලය විසින් සිදු කරන ලදී.

- **දේශගුණ විපර්යාස පර්යේෂණ සමුළුව**

දැඩි අවදානමට ලක්වී ඇති ප්‍රජාවන්, ක්ෂේත්‍ර සහ ප්‍රදේශ වල ඔරොත්තුදීමේ හැකියාව වර්ධනය සඳහා සුදුසු අනුහුරු ක්‍රියාමාර්ග ගැනීමට දේශගුණ විපර්යාසයන්ගේ බලපෑම් හේතුවෙන් ඇතිවන අවදානම් ඇගයීමට මෙන්ම හරිතගාර වායු විමෝචනය අවම කිරීමට අදාළ ක්ෂේත්‍ර සහ ක්‍රියාකාරකම් හඳුනා ගැනීමට දේශගුණ විපර්යාස පිළිබඳ සවිස්තරාත්මක සහ පරිපූර්ණ පර්යේෂණ උපායමාර්ගයක් පැවතීම ඉතා වැදගත් වේ.

මෙම දේශගුණ විපර්යාස පර්යේෂණ උපායමාර්ගය සැකසීමේ ක්‍රියාවලිය සඳහා අදාළ පාර්ශවකර ආයතනවල සක්‍රිය සහභාගිත්වය ලබාගැනීමේ අරමුණින් "ශ්‍රී ලංකා නෙක්ස්ට්-*නීල හරිත යුගයක්*" 2018 වැඩසටහනට සමගාමීව දේශගුණ විපර්යාස පර්යේෂණ සමුළුව සංවිධානය කර ඇත. මෙම සමුළුවෙහි ප්‍රධාන අරමුණු පහත පරිදි වේ.

- ○ දේශගුණ විපර්යාස පර්යේෂණ උපායමාර්ගය කෙටුම්පත සඳහා අදහස් ලබා ගැනීම
- ○ දේශගුණ විපර්යාස පර්යේෂණවල පවතින හිදැස් හඳුනා ගැනීම
- ○ දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලයේ දේශගුණ විපර්යාස පර්යේෂණ පිළිබඳ තොරතුරු ගබඩාව එළිදැක්වීම
- ○ දේශගුණ විපර්යාස හා ආශ්‍රිත ගැටළු සම්බන්ධයෙන් ශ්‍රී ලාංකික පර්යේෂකයින්ගේ දැනුවත් භාවය ඉහළ නැංවීම

මෙම සමුළුව රාජ්‍ය ආයතන, විශ්ව විද්‍යාල ප්‍රජාව සහ සිවිල් සංවිධාන වල සහභාගිත්වයෙන් පවත්වන ලද අතර සංවිධාන කටයුතු දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය, ජනතාක්ෂන්, ස්යිකන් ට්‍රස්ට් සහ අයිඩියා ආයතන මගින් සිදු කරන ලදී.

## දේශගුණ විපර්යාස පිළිබඳ දැනුවත් කිරීම හා ධාරිතා වර්ධනය

- පාසල් ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන

ලෝක පරිසර දිනයට සමගාමීව 2018 ජූනි මස 28 වන දින කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාල ශ්‍රවනාගාරයේ දී රාජ්‍ය ආයතන, ගුරු භවතුන්, පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් පවත්වන ලදී.

- **දැනුවත් කිරීමේ මෙවලම් මුද්‍රණය කිරීම**

"දේශගුණ විපර්යාස සහ අපේ අනාගතය" පිළිබඳ පොත් පිංච, "දේශගුණ විපර්යාස හඳුනා ගනිමු" අත්පත්‍රිකාව නැවත මුද්‍රණය කරන ලදී.







- **හරිත දේශගුණික අරමුදලට (GCF) ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම සම්බන්ධව දැනුවත් කිරීම**

විදේශීය නියෝජිතයින් සමග පෞද්ගලික අංශයේ පාර්ශවකරුවන්ට හරිත දේශගුණික අරමුදලට (GCF) ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩමුළුවක් 2018 මාර්තු මස 15 වන දින පවත්වන ලදී.





- **මානව ජනාවාස දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම්වලට මුහුණ දීම සඳහා වූ මාර්ගෝපදේශය මුද්‍රණය කිරීම**

මානව ජනාවාස දේශගුණ විපර්යාසවල අහිතකර බලපෑම්වලට මුහුණ දීම සඳහා වූ මාර්ගෝපදේශය සකස් කිරීම සඳහා වැඩමුළු දෙකක් පවත්වන ලද අතර එහි මුල් කෙටුම්පත හා සංකල්ප පත්‍රිකාව සකස් කරන ලදී.

**දේශගුණ විපර්යාස පිළිබඳ ජාතික කමිටු**

- **දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර් ආයතනික සම්බන්ධීකරණ කමිටුව**

දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර් ආයතනික සම්බන්ධීකරණ කමිටුව 2012 වර්ෂයේ සැප්තැම්බර් මස පිහිටුවන ලද අතර මෙය රේඛීය අමාත්‍යාංශ සහ අනෙකුත් රාජ්‍ය ආයතන නියෝජනය කෙරෙන කමිටුවකි. මෙම කමිටුව ස්ථාපිත කිරීමේ ප්‍රධාන පරමාර්ථය වූයේ, දේශගුණ විපර්යාස පිළිබඳ අනුහුරු වීමේ හා දේශගුණ විපර්යාස අවම කිරීමේ විද්වත් කමිටු දෙක මගින්, නිර්දේශ කරනු ලබන උපාය මාර්ග සහ ක්‍රියාකාරකම් මෙම කමිටුව හරහා අදාළ ආයතන වල ප්‍රතිපත්ති තුළට ඇතුලත් කර ගැනීමයි. ප්‍රගතිය වාර්තා කරන කාලසීමාව තුළ, දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර් ආයතනික සම්බන්ධීකරණ කමිටු රැස්වීම් දෙකක් පවත්වන ලදී.

- **දේශගුණ විපර්යාස සඳහා අනුහුරුවීමේ ජාතික විශේෂඥ කමිටුව**

මෙම අංශය විසින් ජාතික දේශගුණ විපර්යාස ප්‍රතිපත්ති සහ අනුහුරු උපායන් පදනම් කර ගනිමින් ජාතික දේශගුණ විපර්යාස සඳහා අනුහුරුවීමේ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම ආරම්භ කර ඇත. එම ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සහ ශ්‍රී ලංකාව තුළ දේශගුණ විපර්යාස වල අහිතකර බලපෑම්වලට අනුහුරුවීම සඳහා උපදෙස් ලබා ගැනීමට අනුහුරුවීමේ ජාතික විශේෂඥ කමිටුව පිහිටුවන ලදී.

දේශගුණ විපර්යාස සඳහා අනුහුරුවීමේ ජාතික විශේෂඥයන්ගේ 11 වන හා 12 වන කමිටු රැස්වීම් වලදී පහත විෂයන් සඳහා මාර්ගෝපදේශ ලබා දෙන ලදී.

- දේශගුණ විපර්යාස හේතුවෙන් ඇතිවන අවධානම ඇගයීම සහ ජාතික සංවර්ධන ක්‍රියාවලියට දේශගුණ විපර්යාස සඳහා අනුගත වීමේ ක්‍රියාකාරකම් අන්තර්ග්‍රහණය කිරීම සඳහා වූ තාක්ෂණික ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
- දේශගුණ විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියට ඉදිරිපත් කල යුතු ශ්‍රී ලංකාවේ තෙවන ජාතික සන්නිවේදන වාර්තාවේ අවධානම් තත්වය ඇගයීමේ හා අනුහුරුවීමේ ක්‍රමෝපාය පිළිබඳ පරිච්ඡේදය සකස් කිරීම.
- පැරිස් සම්මුතියේ දේශගුණ විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියේ 24 වන පාර්ශවකරුවන්ගේ රැස්වීම් සඳහා පැරිස් සම්මුතියේ ක්‍රියාත්මක වැඩසටහන සම්බන්ධ ශ්‍රී ලංකාවේ වර්තමාන තත්වය පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම.

- **දේශගුණික විපර්යාස අවම කිරීම පිළිබඳ ජාතික විශේෂඥ කමිටුව**

ශ්‍රී ලංකාවේ දේශගුණ විපර්යාස අවම කිරීම සඳහා ක්‍රියා කිරීමේ දී ඇතිවන ගැටලු වලදී මග පෙන්වීම සඳහා දේශගුණික විපර්යාස අංශය මගින් දේශගුණික විපර්යාස අවම කිරීම පිළිබඳ ජාතික විශේෂඥ කමිටුව පිහිටුවන ලදී. ප්‍රගතිය වාර්තා කරන කාල සීමාව තුළ, දේශගුණ විපර්යාස සඳහා අනුහුරුවීමේ ජාතික **ජාතික විශේෂඥ කමිටු** රැස්වීම් දෙකක් පවත්වන ලදී.

### දේශගුණ තාක්ෂණ හුවමාරු මධ්‍යස්ථානය හා ජාලය (CTCN) යටතේ දේශගුණ විපර්යාස වල අහිතකර බලපෑම් අවම කිරීම සඳහා යෝග්‍ය තාක්ෂණය හඳුනා ගැනීම සහ ප්‍රචලිත කිරීම

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් පිහිටුවන ලද දේශගුණ විපර්යාස වලඅහිතකර බලපෑම් අවම කිරීම සඳහා යෝග්‍ය තාක්ෂණය හඳුනා ගැනීමේ කමිටුව විසින් දේශගුණ තාක්ෂණ හුවමාරු මධ්‍යස්ථානය හා ජාලය (CTCN) වෙත ඉදිරිපත් කිරීමට පෙර ව්‍යාපෘති යෝජනා පිළිබඳ ඇගයීම් සහ නිර්දේශ ඉදිරිපත් කිරීම සිදු කරයි. ප්‍රගතිය වාර්තා කරන කාලසීමාව තුළ වැව්ලි ක්ෂේත්‍රයට දේශගුණ විපර්යාස වලින් ඇතිවන බලපෑම් සහ ව්‍යාපෘති යෝජනා සකස් කිරීම පිළිබඳ වැඩමුළු දෙකක් රාජ්‍ය හා පෞද්ගලික අංශ සඳහා පවත්වන ලදී. දැනට ආගරපතන හා කොටගල වැව්ලි සමාගම සහ ඇල්පිටිය වැව්ලි සමාගම විසින් ව්‍යාපෘති යෝජනා දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත.

### කාබන් විමෝචනය අවම කිරීමේ උපායමාර්ගික සැලැස්ම (LCDS) සකස් කිරීම

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල් ඔවුන්ගේ ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම අවම කිරීම සඳහා දේශීයව තීරණය කරන ලද දායකත්ව (NDCs) ප්‍රකාශයට පත් කර ඇති අතර, එම අපේක්ෂිත මට්ටම් ළඟා කර ගැනීම සඳහා විවිධ උපායමාර්ගික සැළසුම් සකස් කිරීම අවශ්‍ය වේ.

තිරසර සංවර්ධනය පිළිබඳ සන්දර්භය තුළ දේශීයව තීරණය කරන ලද දායකත්වයන් ක්‍රියාත්මක කිරීම හා හරිතාගාර වායු විමෝචනය අවම කිරීම සඳහා ගෝලීය ප්‍රයත්නයන්ට දායක වීම සඳහා කාලෝචිතව අවශ්‍ය වන්නේ කාබන් විමෝචනය අවම කිරීමේ උපායමාර්ගික සැලැස්ම සකස් කිරීමයි. එබැවින් දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය ශ්‍රී ලංකාව සඳහා කාබන් විමෝචනය අවම කිරීමේ උපායමාර්ගික සැලැස්මෙහි කෙටුම්පත (LCDS) වැඩි දියුණු කිරීමට කැපවී සිටී.

- කෙටුම්පත් කළ උපායමාර්ගික සැලැස්ම තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා විශේෂඥ අදහස් ලබා ගැනීමට බලශක්ති, ප්‍රවාහන, කර්මාන්ත සහ අපද්‍රව්‍ය යන අංශයන් සඳහා ආංශික රැස්වීම් පවත්වන ලදී.
- කෙටුම්පත තාක්ෂණික වශයෙන් වැඩිදියුණු කළ අතර විශේෂඥ අදහස් ලබා ගැනීම සඳහා දේශගුණික විපර්යාස අවම කිරීම පිළිබඳ විශේෂඥ කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.
- විශේෂඥ කමිටුවේ අදහස්වලට අනුව උපායමාර්ගික සැලැස්ම සංශෝධනය කරන ලදී.

### කුරුණෑගල නගරය දේශගුණික පසන් නගරයක් (Climate Smart Cities) බවට පරිවර්ථනය

දේශගුණික පසන් නගර ව්‍යාපෘති යෝජනාව, දේශගුණ තාක්ෂණ හුවමාරු මධ්‍යස්ථානය සහ ජාලය (CTCN) වෙත ඉදිරිපත් කොට ඊට අනුමැතිය ලබා ගන්නා ලදී. දේශගුණ තාක්ෂණ හුවමාරු මධ්‍යස්ථානය සහ ජාලය (CTCN) කුරුණෑගල නගරය සඳහා දේශගුණික පසන් නගර (Climate Smart Cities) පිහිටුවීම සඳහා තාක්ෂණික ආධාර ලබා දීමට එකඟ වී ඇත.


how Soil
is formed


Soil
functions
Soils deliver ecosystem services that enable life on Earth
Carbon sequestration
Water purification and soil contaminant reduction
Climate regulation
2015
Provision of food, fibre and fuel
Nutrient cycling
Cultural heritage
Habitat for organisms
Provision of construction materials
Foundation for human infrastructure
Source of pharmaceuticals and genetic resources
Flood regulation
Food and Agriculture Organization of the United Nations

# භූමි සම්පත් අංශ

ශ්‍රී ලංකාවේ සැලකිය යුතු තර්ජනයක්ව පවතින භූමි හායනය හා එහි අභියෝග සැලකිල්ලට ගනිමින් 1995 වසරේදී ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ කාන්තාරකරණය වැළැක්වීමේ සම්මුතියෙහි පාර්ශවකරුවකු ලෙස ක්‍රියා කරයි.

දිවයිනේ භූමි හායනය වැළැක්වීමේ අරමුණින් ඒ සඳහා ජාතික ක්‍රියාකාරී වැඩසටහනක් 2015 සිට 2024 දක්වා කාලපරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. මෙම ක්‍රියාකාරී වැඩසටහනෙහි දීර්ඝකාලීනව හා කෙටිකාලීනව ක්‍රියාත්මක කිරීම සඳහා ඇති විවිධ වැඩසටහන් හා ක්‍රියාකාරකම් අධීක්ෂණය, මෙහෙයවීම හා ඇගයීම භූමි සම්පත් අංශය විසින් සම්බන්ධීකරණය කරන ජාතික මෙහෙයුම් කමිටු හා තාක්ෂණික සම්බන්ධීකරණ කමිටු හරහා සිදුවේ. භූමි සම්පත් අංශයේ ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් හා විවිධ ක්‍රියාකාරකම් මෙම ජාතික ක්‍රියාකාරී වැඩසටහනට අනුකූලව සිදුවේ. ඒ අනුව, පහත සඳහන් ප්‍රධාන ක්‍රියාකාරකම් 2018 වර්ෂයේදී සිදුකරන ලදි.

**භූමි හායනය අවම කිරීමේ ආදර්ශන ස්ථාන ස්ථාපිත කිරීම**

- **මහර බන්ධනාගාර පරිශ්‍රය**

ගම්පහ දිස්ත්‍රික්කයේ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, මහර බන්ධනාගාර පරිශ්‍රයේ බන්ධනාගාර රැඳවියන් යොදාගනිමින් පාංශු සංරක්ෂණ ආදර්ශන ස්ථානයක් සකස් කළ අතර එහි දෙවන අදියරේ වැඩකටයුතු 2018 වර්ෂයේ සිදුකරන ලදි.





- **ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුර පරිශ්‍රය - මීරිගම**

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැළසුම් දෙපාර්තමේන්තුව ඒකාබද්ධව පළතුරු උද්‍යාන (Fruit orchard ) සංකල්පය සහිතව පාංශු සංරක්ෂණ ක්‍රමවේද යොදාගනිමින් මෙම ආදර්ශනය ඉදිකිරීමේ පළමු අදියරේ වැඩකටයුතු අවසන් කර ඇත.







- **පාසල් වල භූමි හායනය අවම කිරීමට පාංශු සංරක්ෂණ ආදර්ශන ස්ථාපිත කිරීම**

පාසල් වල භූමි හායනය අවම කිරීමේ අරමුණින් මළගල මහා විද්‍යාලයේ සහ මහව ගජනැග්ම මහා විද්‍යාලයේ සෝදා පාළුවට ලක්ව තිබූ භූමි ප්‍රදේශ 02ක් ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගනිමින් භූමි හායනය වැළැක්වීම සඳහා ආදර්ශන ස්ථාන 02ක් ස්ථාපිත කරන ලදි. මෙමගින් ශිෂ්‍ය ශිෂ්‍යාවන් හට ඉගෙනුම් ක්‍රියාවලියේදී ඇති ඒකාකාරී මානසිකත්වයෙන් මිදීමේ හැකියාව මෙන්ම මතක ශක්තිය වර්ධනය කරගැනීමේ හැකියාව ද ලැබේ.

**ඛනිජ සම්මන්ත්‍රණය 2018**

2018 "ශ්‍රී ලංකා නෙක්ස්ට්" නීල හරිත යුගයක්; වැඩසටහනට සමගාමීව 2018 ඔක්තෝබර් 20 දින කොළඹ, බණ්ඩාරණායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී "භූ සම්පත්, ආර්ථික ප්‍රතිලාභ, පාරිසරික බලපෑම්" වශයෙන් තේමා 03ක් යටතේ අන්තර්ජාතික ඛනිජ සම්මන්ත්‍රණයක් භූමි සම්පත් අංශය හා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය එක්ව පවත්වන ලදී. මෙම සම්මන්ත්‍රණය සඳහා දේශීය විදේශීය ඛනිජ

කර්මාන්තකරුවන්, විශ්ව විද්‍යාල, රජයේ ආයතන, මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය යන ආයතන වලින් නිලධාරීන් සහභාගී විය.





**මොරගහකන්ද කළුගඟ ජල පෝෂක ප්‍රදේශ වල සංරක්ෂණ තත්වය පිළිබඳ අධ්‍යයන වාර්තාවක් සකස් කිරිම**

භූමි හායනය නිශේධනය කිරිම සඳහා වූ ඉලක්ක සැලසීමේ වැඩසටහන යටතේ හඳුනා ගන්නා ලද ඉලක්ක සපුරා ගැනිමට මොරගහකන්ද කළුගඟ ජල පෝෂක ප්‍රදේශ වල, වන හා පාංශු සංරක්ෂණ තත්ත්වය පිළිබඳ අධ්‍යයනය කර ව්‍යාපෘති වාර්තාවක් සකස් කර ආධාර ලබාගැනීම සඳහා යොමු කිරීමට ICRAF ආයතනයේ විදේශිය විශේෂඥයින් පිරිසක් සමග භූමි සම්පත් අංශයේ නිලධාරීන් පිරිසක් 2018.03.11-14 දක්වා සහ 2018.04.07-08 දක්වා දිනයන්හි ක්ෂේත්‍ර අධ්‍යානයන්හි යෙදුණි.

**දැනුවත් කිරීමේ මෙවලම් මුද්‍රණය**




“ආර්ථිකය සරි කළ හැකි ලාංකික ඛනිජ සම්පත්” ග්‍රන්ථය ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් හා ඒවායේ වටිනාකම පිළිබඳ තොරතුරු රැසක් සරළ බසින් එළිදක්වන බැවින් පාසල් සිසුන්, ගුරු භවතුන් හා ඛනිජ ක්ෂේත්‍රය පිළිබඳ ඇල්මක් හා උනන්දුවක් දක්වන අය වෙත මෙම ග්‍රන්ථය ලබාදීම ක්ෂේත්‍රයේ දැනුවත්භාවය හා උනන්දුව වැඩිකිරීමට උපකාර වන බැවින් මෙහි සිංහල හා ඉංග්‍රීසි යන භාෂා ද්විත්වයෙන් මුද්‍රණය කරන ලදි.

මීට අමතරව පරිසර ක්ෂේත්‍රයේ මහා සැළැස්ම සහ ක්ෂුද්‍ර ප්ලාස්ටික් මගින් සිදුවන පරිසර දූෂණය පිළිබඳ අත්පත්‍රිකාවක්ද මුද්‍රණය කරන ලදි.

**දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම**

තිරසර භූමි කළමනාකරණය පිළිබඳ පාසල් සිසු දරු දැරියන් හා ගුරුභවතුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පින්නවල මධ්‍ය මහා විද්‍යාලය, නුගේගොඩ අනුලා විද්‍යාලය, තර්ස්ටන් විද්‍යාලය - කොළඹ හා හ/යෝධකණ්ඩිය මහා විද්‍යාලයේදී පවත්වන ලදි. තවද, තිරසර භූමි කළමනාකරණය සම්බන්ධයෙන් දන්කොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් සහ දන්කොටුව ප්‍රාදේශීකයන් දැනුවත් කිරීමේ වැඩසටහනක් සහ තිරසර භූමි කළමනාකරණය හා වෙරළ සම්පත් සංරක්ෂණය යන මැයෙන් වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක්ද පවත්වන ලදි.

**පුහුණු වැඩසටහන් පැවැත්වීම**

භූමි සම්පත ආරක්ෂාකර ගනිමින් භූමි හායනය වැළැක්වීම, පාංශු සංරක්ෂණය සඳහා ප්‍රායෝගිකව ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ප්‍රායෝගික දැනුම ලබාදීම හා එම දැනුම ජනතාව අතර ගලායැමට ඉඩ සැළැස්වීම අරමුණු කරගනිමින් ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැළසුම් දෙපාර්තමේන්තුව සමග එක්ව නේවාසිකව පුහුණු කිරීමේ වැඩසටහන් 04ක් මගින් ඉඩම් පරිහරණ සැළසුම් නිලධාරීන් 200ක් පුහුණු කරන ලදි.

**ජාත්‍යන්තර දින සැමරීමේ වැඩසටහන්**

- **ලෝක කාන්තාරකරණය වැළැක්වීමේ දිනය සැමරීම - 2018 ජුනි 17**

2018 ජුනි 17 වන දිනට යෙදී තිබුණු ජගත් කාන්තාරකරණය වැළැක්වීමේ දිනය සැමරීම නිමිත්තෙන් මහර බන්ධනාගාර පරිශ්‍රයේ ස්ථාපිත කරන ලද පාංශු සංරක්ෂණ ආදර්ශන ස්ථානය නිල වශයෙන් මහර

බන්ධනාගාරය වෙත භාරදීම හා ගම්පහ දිස්ත්‍රික්කයේ ගොවීන් 150 ක් පාංශු සංරක්ෂණ ක්‍රම පිළිබඳව ප්‍රායෝගික දැනුවත් කිරීමේ වැඩසටහන ගම්පහ දිස්ත්‍රික්කයේ ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලයේ ද සහයෝගය ඇතිව පැවැත්විනි. මෙහිදී පැමිණ සිටි ගොවීන් අතර වටිනා පළතුරු පැළ බෙදා දීමද සිදුකරන ලදි.





- **ලෝක ජල දිනය සැමරීම - මාර්තු 22**

ලෝක ජල දිනය සැමරීම නිමිත්තෙන් පින්නවල මධ්‍ය මහා විද්‍යාලයට විශාල අඩුපාඩුවක්ව පැවැති පානීය ජලය ප්‍රමාණවත් පරිදි රඳවා ගැනීම සඳහා අවශ්‍යව තිබූ ජල ටැංකියක් එම පාසල වෙත පරිත්‍යාග කරන ලදී.

- **ලෝක පාංශු දිනය සැමරීම -2018**

2018 පාංශු දින තේමාව වූ පාංශු දූෂණයට විසඳුමක් (“ Be the Solution to Soil Pollution”) යටතේ ගෝලීය ගැටළුවක් බවට පත්ව ඇති පාංශු දූෂණය පාදක කර ගනිමින් පර්යේෂණ අධ්‍යයනයක් භූමි සම්පත් අංශය විසින් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ පාංශු අධ්‍යයන අංශය සමග එක්ව සිදුකරන ලදි. කෘෂි රසායනික ද්‍රව්‍ය අධික ලෙස භාවිත කරනු ලබන නුවරඑළිය දිස්ත්‍රික්කයේ සීතාඑළිය ප්‍රදේශය තෝරා ගනිමින් එම ප්‍රදේශයේ ප්‍රධාන භූමි භාවිතාවන් 2ක එනම් එළවළු හා තේ වගා කරනු ලබන භූමි භාවිතාවන් 2ක අංශු මාත්‍ර මූලද්‍රව්‍යවල අවකාශීය ව්‍යාප්තිය පිළිබඳව පර්යේෂණ අධ්‍යයනයක් සිදුකෙරිනි.




- **ලෝක සාගර දිනය සැමරීමේ වැඩසටහන**

ජූනි මස 08 වන දිනට යෙදුණු ලෝක සාගර දිනය නිමිත්තෙන් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය හා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය සමග එක්ව මාධ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ත්‍රිකුණාමලයේ පරවි දූපතේදී පැවැත්වූ අතර එහිදී කොරල් පිරිසිදු කිරීමේ හා කිමිදුම් සැසියක්ද මාධ්‍යවේදීන් සඳහා පැවැත්විනි.

- **ලෝක පරිසර දිනය සැමරීමේ වැඩසටහන**

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය හා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියත්, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවත් එක්ව පරිසර සංරක්ෂණය, ප්ලාස්ටික් හා පොලිතීන් වලින් පරිසර දූෂණය වළක්වා ගන්නේ කෙසේද යන්න පිළිබඳව පාසල් සිසු දරු දැරියන් දැනුවත් කිරීමේ වැඩසටහනක් මීගමුව නගර ශාලාවේදී සහ ගම්පහ දිස්ත්‍රික්කයේදී පැවැත්වූ අතර කලපු පවිත්‍රතා වැඩසටහනක් ද පැවැත්විනි.

**භූමි හායනය වැළැක්වීම හා තිරසර භූමි කළමනාකරණය වෙනුවෙන් සිදුකරනු ලබන පර්යේෂණ වැඩසටහන් සඳහා සකස්කරන ලද සුළු මූල්‍යාධාර වැඩසටහන -2018**

තිරසර භූමි කළමනාකරණය හා භූමි හායනය වැළැක්වීම පාදක කරගනිමින් පස, ජලය, වෙරළ හා සාගර යන ප්‍රධාන තේමාවන්ට අදාළව පර්යේෂණ සිදුකරනු ලබන විශ්වවිද්‍යාල හා අනෙකුත් අදාළ ආයතනයන්ගෙන් පර්යේෂණ යෝජනා ගෙන්වා ගනිමින් ඒ සඳහා සුළු මූල්‍යාධාර ලබාදීමේ වැඩසටහනක් පැවැත්වීමට කටයුතු සම්පාදනය කරන ලදි. මේ සඳහා සුදුසු පර්යේෂණ තෝරාගැනීම තාක්ෂණික ඇගයීම් කමිටුවක් මඟින් සිදුකළ අතර එහිදී පර්යේෂණ 5ක් සඳහා සුළු මූල්‍යාධාර ලබාදෙන ලදී. වර්ෂ අවසානයේදී පර්යේෂණයන් සාර්ථකව නිම කිරීමෙන් පසු පර්යේෂණ වාර්තා ඉදිරිපත් කිරීමක් සිදුකෙරිනි.

**වැලි සහ කළු ගල් ආනයනය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ සකස් කිරීම**

ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා ඉතා විශාල පරිමාණයෙන් අවශ්‍ය වන වැලි සහ කළු ගල් උකහා ගැනීම මඟින් පරිසරයට සිදුවන හානි අවම කරමින් නියමිත කාල සීමාව තුළදී සැපයීමේ අරමුණින් කාන්තාර රට වලින් එම ද්‍රව්‍ය ආනයනය කිරීම පිළිබඳව අවධානය යොමුව ඇත. ඒ අනුව මෙම ද්‍රව්‍ය නිසි ප්‍රමිතියකින් යුතුව හා ශ්‍රී ලංකාවේ පරිසරයට හානියක් නොවන ආකාරයට ආනයනය කිරීම පිළිබඳව මාර්ගෝපදේශ සකස් කිරීම සිදුකෙරෙමින් පවතී.

**ජාතික ඛනිජ ප්‍රතිපත්තිය සකස් කිරීම**

කැබිනට් මණ්ඩලය විසින් ලබාදී ඇති තීරණයකට අනුව විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය කෙටුම්පත් කරනු ලැබූ ජාතික ඛනිජ ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය හා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය එක්ව සිදු කරන ලදි. ජාතික ඛනිජ ප්‍රතිපත්ති කෙටුම්පත ඛනිජ ක්ෂේත්‍රයේ නියුතුවන්නන්ගේ අදහස් හා යෝජනා ලබාගැනීම සිදුකරන ලද අතර මේ වන විට අවසන් කෙටුම්පත සකස් කරමින් පවතී.




# පරිසර දූෂණ පාලන හා රසායනික ද්‍රව්‍ය කළමනාකරණ අංශය

**පරිසර** දූෂණ පාලන හා රසායනික ද්‍රව්‍ය කළමනාකරණ අංශය, පරිසර දූෂණ පාලනය හා රසායනික ද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්ති, මාර්ගෝපදේශ හා ක්‍රියාකාරි සැලසුම් සකස් කරනු ලබන අතර පරිසර දූෂණ පාලනය සම්බන්ධයෙන්, වාතය, ජලය සහ පස, දූෂණය කෙරෙහි මේ වනවිට ප්‍රධාන අවධානය යොමු කර ඇත. එමෙන්ම අනෙකුත් රජයේ සහ රජයට අයත් නොවන පාර්ශවකරුවන් සමග රසායනික ද්‍රව්‍ය කළමනාකරණ සහ පරිසර දූෂණ පාලන කටයුතු ක්‍රියාත්මක කිරීම සිදු කරයි.

තිරසර සංවර්ධන 12 වන අරමුණට අනුව "තිරසර පරිභෝජනය සහ නිෂ්පාදනය" සඳහා මෙම අංශය ඉලක්ක 12.4 අනුව "ජීවන චක්‍ර කළමනාකරණයක් තුළින් පරිසර හිතකාමී ලෙස රසායනික ද්‍රව්‍ය සහ අපද්‍රව්‍ය කළමනාකරණය" පිණිස කටයුතු කරනු ලබයි.

ඉහත ඉලක්කයන්ට අදාළ පුහුණු වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් අදාළ කණ්ඩායම් හා ප්‍රජාව උදෙසා පවත්වන අතර, එමගින් පරිසර දූෂණය අවම කිරීම හා රට තුළ නිසි රසායන ද්‍රව්‍ය කළමනාකරණයක් ඇති කිරීමට බලාපොරොත්තු වේ.

පරිසර දූෂණ පාලන සහ රසායනික ද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් ජාතික සහ ජාත්‍යන්තර සමුළු, රැස්වීම් සහ කමිටු වලදී මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය නියෝජනය මෙම අංශය මගින් සිදු කරයි

බාසල්, ස්ටොක්හෝම්, මිනමාටා යන අන්තර් ජාතික සම්මුතීන්වල ජාතික කේන්ද්‍රීය ලක්ෂ්‍ය ලෙස ක්‍රියා කරන මෙම අංශය, ජාතික මෙහෙයුම් කමිටු පවත්වා උපද්‍රවකාරි අපද්‍රව්‍ය, කල්පවතින කාබනික දූෂක ද්‍රව්‍ය, රසදිය හා රෝටර්ඩම් සම්මුතිය යටතේ කාර්මික රසායන ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අනෙකුත් පාර්ශ්වකරුවන් සමග සාකච්ඡා කර තීරණ ගැනීම හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදුකරයි. රොටර්ඩම් සම්මුතිය යටතේ ක්‍රියාත්මක වන පලිබෝධ නාශක පිළිබඳ කටයුතු පලිබෝධනාශක රෙජිස්ට්‍රාර් සිදු කරයි.

**බාසල් සම්මුතිය**: මෙමගින් උපද්‍රවකාරි අපද්‍රව්‍ය, දේශසීමා හරහා ප්‍රවාහනය සහ බැහැර කිරීම පාලනය කිරීම පිළිබඳ කටයුතු කරයි. මෙම සම්මුතිය හා බැඳුනු පාර්ශව කරුවන් 186 දැනට සිටින අතර මෙම සම්මුතියට අදාළව අප රට තුළ පරිසර පනත යටතේ උපද්‍රවකාරි අපද්‍රව්‍ය කළමනාකරණ රෙගුලාසි ක්‍රියාත්මක වන අතර උපද්‍රවකාරි අපද්‍රව්‍ය දේශසීමා හරහා ප්‍රවාහනය නියාමනය කෙරේ.

**රසදිය පිළිබඳ මිනමාටා සම්මුතිය** : මේ ගිවිසුමේ අරමුණ වන්නේ රසදිය නිසා සිදු වන පරිසර දූෂණය වැළැක්වීම හා රසදිය භාවිතය පාලනය කිරීමයි. නෛතික බැඳීමක් සහිත සම්මුතියක් වන අතර එමගින් අංශ ගණනාවක් ඔස්සේ රසදිය මගින් වන දූෂණය පාලනය කිරීමෙන් පරිසරයට සහ මානව සෞඛ්‍යයට සිදුවන හානිය අවම කිරීමට අදහස් කෙරේ.

**කල් පවතින දූෂක කාරක පිළිබඳ ස්ටොක්හෝම් සම්මුතිය;** මෙම සම්මුතිය මගින් කල්පවතින රසායනික දූෂක කාරක මගින් මානව සෞඛ්‍යයට සහ පරිසරයට සිදුවිය හැකි අවදානම අවම කිරීම අරමුණු කරයි. මෙම රසායනික ද්‍රව්‍ය මිනිසුන්ගේ සහ සත්වයන්ගේ මේද පටක වල සංචිතවීමෙන් ප්‍රතිශක්තිකරණ, ස්නායු සහ ප්‍රජනක පද්ධති ආශ්‍රිත සෞඛ්‍ය ගැටළු සහ සමහර පිළිකා රෝගී තත්ත්වයන් ඇතිකරයි.

**රොටර්ඩම් සම්මුතිය**: මෙම සම්මුතියේදී සමහර උපද්‍රවකාරි රසායනික ද්‍රව්‍ය සහ පලිබෝධ නාශක අන්තර් ජාතික වෙළඳාමේදී අපනයනය කරන රටවලින් පෙර දැනුවත් කැමැත්ත ලබා ගැනීම සිදුකෙරේ. මෙමගින් රටවල් අතර වගකීමෙන් බැඳේ. මෙම සම්මුතිය යටතේ කාර්මික රසායනික ද්‍රව්‍ය මධ්‍යම පරිසර අධිකාරිය නියාමනය කරන අතර පලිබෝධනාශක, පලිබෝධනාශක රෙජිස්ට්‍රාර් මගින් නියාමනය කෙරේ.

**2018.01.01 - 2018.12.31 දක්වා පරිසර දූෂණ පාලන සහ රසායනික ද්‍රව්‍ය කළමනාකරණ අංශය සිදු කල ක්‍රියාකාරකම්**

**ස්ටොක්හෝම් සම්මුතිය යටතේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම යාවත් කාලීන කිරීම**
ස්ටොක්හෝම් සම්මුතිය යටතේ පහත සඳහන් වාර්තා සැකසීම අවසන් කර මුද්‍රණය කර ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ පාර්ශව කරුවන්ට ලබාදෙන ලදී. මෙම වාර්තා වල දැනට භාවිතා කරන, හෝ අභිමතයකින් තොරව ජනනය වන කල් පවතින කාබනික දූෂක කාරක පිළිබඳව විස්තර අඩංගු වේ. මෙම රසායනික දූෂක කාරක භාවිතය අවම කිරීම සහ එම දූෂක නිසි ලෙස කළමනාකරණය මෙන්ම විකල්ප යොදාගැනීම පිළිබඳව අදාළ අංශ දැනුවත් කිරීම මෙම වාර්තා සැකසීමේ අරමුණ වේ. මෙම දූෂක කාරක සමහරක් නම් අපද්‍රව්‍ය පිළිස්සීම නිසා ඇතිවන ඩයිඔක්සින් සහ ෆියුරාන් වායුව, ට්‍රාන්ස්ෆෝමර් තෙල් වල අඩංගු පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල් ආදියයි. මෙම වැඩසටහන් මගින් අද වනවිට අප රට තුළ භාවිතා වූ කල් පවතින කාබනික දූෂක කාරක හා පලිබෝධ නාශක සියල්ල තහනම් කිරීමට හැකි වී තිබේ .

සකස් කරන ලද වාර්තා



1. ස්ටොක්හෝම් සම්මුතියට අදාළ ජාතික ක්‍රියාකාරි සැලැස්ම
2. කල්පවතින කාබනික දූෂක පලිබෝධනාශක
3. යාවත් කාලීන කරන ලද පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල් ඉන්වෙන්ටරිය
4. අභිමතයකින් තොරව (Unintentionally Produced) ඇතිවන කල්පවතින කාබනික දූෂක (ඩයොක්සින් සහ ෆියුරාන් ඉන්වෙන්ට්රිය සහ වායු විමොචනය අවම කිරීමට යෝජනා )
5. පර්ෆ්ලුරොඔක්ටේන් සල්ෆොනික් ඇසිඩ් සහ ලවණ(PFOS) තක්සේරුව සහ කළමනාකරණය
6. පොලිබ්රෝමිනේටඩ් ඩයිෆිනයිල් ඊතර්(POPs-PBDEs) සහ හෙක්සබ්රෝමෝ බයිෆිනයිල් (HBB) ප්‍රාථමික ඉන්වෙන්ටරිය සහ ක්‍රියාකාරී සැලැස්ම

ජගත් පරිසර දිනයට සමගාමී වැඩසටහන්

කෑගල්ල දිස්ත්‍රික්කයේ පැවත්වූ ජගත් පරිසර දින ජාතික උත්සවයට සමගාමීව කසළ බඳුන් කට්ටල රජයේ ආයතන 23 ක් සඳහා බෙදා දීම සහ දැනුවත් කිරීමේ වැඩ සටහනක් පැවැත්වීම. මේ සඳහා පොලිසිය, උසාවිය, පාසල්, නගර සභාව, ආගමික සිද්ධස්ථාන, ආදී ආයතන සහභාගී විය



1. 'ප්ලාස්ටික් දූෂණය වළකමු' යන තේමාව යටතේ මාලබේ ශ්‍රී රාහුල බාලිකා විද්‍යාලය සහ මොරටුවේ ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමයේ දැනුවත් කිරීමේ වැඩ සටහන් 02ක් පැවැත්විණි.
2. වරකාපොල නගරයේ පවිත්‍ර කිරීමේ වැඩසටහනක් සම්බන්ධීකරණය කිරීම. මේ සඳහා රෙකිට් බෙන්කින්සේර් ආයතනය අනුග්‍රහය දක්වන ලදී.
3. පරිසර දින තේමාවට සමගාමීව පෝස්ටරයක් සහ අත්පත්‍රිකාවක් මුද්‍රණය කර බෙදා හැරීම.
4. කාසල් රෝහල් කාර්ය මණ්ඩලය සඳහා උපද්‍රවකාරි අපද්‍රව්‍ය සහ සාමාන්‍ය අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්වීම.
5. කල් පවතින කාබනික දූෂක කාරක පිළිබඳ ධාරා' නැමැති රූපවාහිනී වාර්තා වැඩසටහන නිෂ්පාදනය කිරීම
6. වර්ෂා ජලයේ රසදිය සංයෝග මිශ්‍ර වී තිබේද යන්න පරික්ෂා කර බැලීම සඳහා වූ උපකරණයක් **තායිවාන්** රජයෙන් ලබා **දී ඇති අතර** එය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ස්ථාපනය කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කිරීම. මෙමගින් ආසියා පැසිෆික් රසදිය නියාමන ජාලය ( Asia Pacific Mercury Monitoring Network /APMMN) සමග කටයුතු කිරීමට හැකි වනු ඇත
7. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සියලුම පළාත්වල රසායනාගාර කාර්ය මණ්ඩල " රසායනික ද්‍රව්‍ය සහ අපද්‍රව්‍ය කළමනාකරණය " පිළිබඳව පුහුණු කරන ලදී. ( නිලධාරීන් 500 )
8. විවෘත විශ්ව විද්‍යාලයේ කාර්ය මණ්ඩලය සඳහා අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්වීම
9. "ජාතික රසායනික ද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තිය" සැකසීම සඳහා අදාළ පාර්ශවකරුවන් සමග වැඩමුළු, රැස්වීම් සහ සාකච්ඡා පවත්වන ලදී . මෙම ප්‍රතිපත්තිය සෑදීම මගින් රසායනික ද්‍රව්‍ය වල ජීවන චක්‍ර කළමනාකරණයක් ඇති කිරීමට හැකිවනු ඇත.

**10.** "ජාතික අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තිය", 2007 වසරේ සාදන ලද ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තිය යාවත් කාලීන කර සාදන ලදී. මෙහිදී ද්‍රවමය සහ වායුමය අපද්‍රව්‍ය මෙම ප්‍රතිපත්තියට ඇතුළත් කරන ලද අතර, දැනට ඇතිවී තිබෙන නව අභියෝග වලට සරිලන ලෙස ක්ෂුද්‍ර ප්ලාස්ටික්, ගොඩනැගිලි අපද්‍රව්‍ය, ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය, සහ අනෙකුත් උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණය ද මෙයට ඇතුළත් කරන ලදී. මෙහිදී අදාළ පාර්ශවකරුවන්ගේ කාර්ය භාරය හඳුනාගෙන ඇති අතර ප්‍රතිපත්ති කෙටුම්පත අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීමට කටයුතු සැලසුම් කර ඇත.







**11.** 2017 සැප්තැම්බර් මස පැන වූ පොලිතින් රෙගුලාසිය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට අදාළව කමිටු වාර ගණනාවක්ම පවතන ලද අතර මෙහිදී පොලිතීන් වර්ග සම්බන්ධ HS code ( Harmonized System) පිළිබඳව අවධානය යොමු කරන ලදී.



# වන සම්පත් අංශය

### "වන රෝපා" ජාතික රුක් රෝපණ වැඩසටහන

ශ්‍රී ලංකාවේ වන ආවරණය මුළු භූමි ප්‍රමාණයෙන් 32% ක් දක්වා වැඩි කර ගැනීමේ ඉලක්කය සපුරා ගැනීම පිණිස, රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික පාර්ශවකරුවන්ගේ සක්‍රීය දායකත්වයෙන් ක්‍රියාත්මක කරනු ලබන වාර්ෂික වැඩසටහනක් ලෙස "වන රෝපා" ජාතික රුක් රෝපණ වැඩසටහන හඳුන්වා දිය හැකිය. මේ යටතේ රුක් රෝපණය පිළිබඳව ප්‍රමුඛ අවධානය ලබා දීම පිණිස සෑම වර්ෂයකම ඔක්තෝබර් මාසය "වන රෝපා" ජාතික රුක් රෝපණ මාසය ලෙස නම් කර තිබේ. ඒ අනුව 2018 වසරේ "වන රෝපා" ජාතික රුක් රෝපණ වැඩසටහනේ ප්‍රධාන උත්සවය අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2018 ඔක්තෝබර් 05 වැනි දින මන්නාරම් දිස්ත්‍රික්කයේ තම්පනේකුලම් හිදී පවත්වන ලදි. මෙහිදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් හෙක්ටයාර 02ක භූමියක විවිධ වන පැළ 2000ක් සිටුවන ලද අතර වන රෝපා වැඩ සටහන යටතේ 2018 වසර තුළ රාජ්‍ය ආයතන මෙන්ම රාජ්‍ය නොවන හා පෞද්ගලික පාර්ශවකරුවන්ගේ සක්‍රීය දායකත්වයෙන් දිවයින පුරා සංරක්ෂිත කැලෑවලින් පරිභාහිරව පැළ 2,69,085 ක් රෝපණය කෙරිණි.





2018 වසරේ "වන රෝපා" ජාතික රුක් රෝපණ වැඩසටහන - මන්නාරම දිස්ත්‍රික්කයේ තම්පනේකුලම්

### රුක් රෝපණ වැඩසටහන්වලට අවශ්‍ය පලතුරු පැළ නිකුත් කිරීම

දිවයිනේ විවිධ ප්‍රදේශවල පවත්වන ලද රුක් රෝපණ වැඩසටහන්වලට අවශ්‍ය පලතුරු පැළ නිකුත් කිරීම සඳහා මෙම අමාත්‍යාංශයේ ඉල්ලීම මත ජනාධිපති කාර්යාලයේ පුනරුදය පරිසර සංරක්ෂණ වැඩසටහන යටතේ රුපියල් මිලියන 4 ක ප්‍රතිපාදන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ලබා දුනි. මේ වන විට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිපදවන ලද පලතුරු පැළ 28,993 ක් එම දෙපාර්තමේන්තුව හරහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ත්‍රිවිධ හමුදාව, පාසැල් හා අනෙකුත් රාජ්‍ය ආයතන විසින් සංවිධානය කරන ලද රුක් රෝපණ වැඩසටහන් සඳහා නිකුත් කරන ලද අතර එම කටයුතු සම්බන්ධීකරණය කිරීම මෙම අමාත්‍යාංශයේ වන සම්පත් අංශය මඟින් සිදු කරන ලදී.

### නාගරික තුරු වියන් ස්ථාපන වැඩසටහන

නාගරික ප්‍රදේශ වල ජීවත් වන ප්‍රජාව වෙත සුව පහසු පාරිසරික තත්වයන් ඇති කිරීමේ අරමුණු ඇතිව 2018 වසර පුරා නාගරික තුරු වියන් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කරන ලදි. ඒ අතර මීගමුව නගරයේ රාජපක්ෂ උද්‍යානය, මූලික රෝහල, පාසල්, පල්ලි, රජයේ ගොඩනැගිලි හා මාර්ග දෙපස ආශ්‍රිතව රුක් රෝපණය කරණ ලදී. (මුහුදු බඩ ප්‍රදේශයක් වූ බැවින් පැළ සඳහා දැල් සහිත ආවරණ ස්ථාපිත කරන ලදී). එමෙන්ම ගම්පහ නගරය, රාගම වෛද්‍ය පීඨය, කැළණිය විශ්වවිද්‍යාලය, හෝමාගම නැනෝ තාක්ෂණ ආයතනය ආදි ස්ථාන වල රත්හඳුන්, සුදු හඳුන්, උෟණ භාවිත පලතුරු වර්ග ඇතුලත් වටිනා ශාක වර්ග රෝපණය කරන ලදි. තවදුරටත් හෝමාගම තාක්ෂණ නගරය, හක්මන ප්‍රාදේශීය සභාව අයත් ප්‍රදේශ හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සමඟ එක්ව වැලිකන්ද මහවැලි නගරය ආදී ස්ථාන හරිතකරණය සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදෙන ලදී.

**ශ්‍රී ලංකා නෙක්ස්ට් "NEXT" ( Sri Lanka NEXT) ජාතික වැඩසටහන**

ශ්‍රී ලංකා නෙක්ස්ට් පාරිසරික වැඩසටහන සඳහා වායු සම්පත් අංශය සමග එක්ව "මහපොළවේ රිද්මය" නමින් ප්‍රවීණ සංගීතඥයකු ගේ සහභාගිත්වයෙන් පාසල් සිසු දරු දැරියන් 400ක් සඳහා පරිසරය හා සංගීතය පිළිබඳ සහභාගිත්ව සංගීත වැඩසටහනක් පවත්වන ලදී.

**වෙනත් රාජ්‍ය ආයතන සමඟ එක්ව රුක් රෝපණ වැඩසටහන් මෙහෙයවීම**

ඌන භාවිත පලතුරු උයන් ඇති කිරීම සඳහා පාසල් තෝරා ගැනීමේ අරමුණින් අධ්‍යාපන අමාත්‍යාංශයේ, කෘෂිකර්ම හා පරිසර අධ්‍යාපන අංශය මඟින් අභ්‍යන්තර චක්‍ර ලේඛයක් නිකුත් කර ඇත. ඒ අනුව තෝරාගන්නා ලද පාසැල් 152ක පලතුරු උයන් ඇති කිරීම සඳහා පලතුරු පැළ ලබා දීමට කටයුතු කරන ලදී. මේ සඳහා පුනරුදය වැඩසටහන යටතේ ප්‍රතිපාදන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත නිකුත් කරන ලදී. මෙම වැඩසටහන ජනාධිපති කාර්යාලයේ තිරසර පාසල් වැඩසටහන සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීමට තෝරා ගෙන ඇත.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සමඟ එක්ව අභිනවයෙන් ඉදිකරනු ලබන නිවාස යෝජනා ක්‍රමයන් තුළ වන පැළ හා පලතුරු පැළ රෝපණය කිරීම සිදුකල අතර මේ වන විට එවැනි නිවාස යෝජනා ක්‍රම 12 ක රුක් රෝපණ වැඩසටහන් සඳහා දායකත්වය ලබා දී ඇත.

වෙනත් ආයතන වෙතින් රුක් රෝපණය සඳහා ඉල්ලීම් ඉදිරිපත් කරන අවස්ථාවන්හිදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණ කරමින් පැළ ලබාදීමේ කටයුතු වන සම්පත් අංශයේ මැදිහත් වීමෙන් ඉටු කරන ලදී.

දිස්ත්‍රික් පරිසර සමුළුව හා 2018 ජගත් පරිසර දිනය සැමරීම සඳහා 2018.05.04 දින අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් කෑගල්ලේදී පවත්වන ලද උත්සවය සඳහා සහභාගී වූ පාසල් දරු දැරියන් හා මහජනතාව අතර බද්ධ අඹ පැළ 1000, බද්ධ බෙලි පැළ 1000, බද්ධ රඹුටන් පැළ 1000, බීජ දෙළුම් පැළ 500, බීජ අනෝදා පැළ 500 ක් වශයෙන් පලතුරු පැළ 4000 ක් බෙදාදීමට කටයුතු කරන ලදී.

මන්නාරම මහජන ක්‍රීඩාංගණයේ අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2018.10.05 දින පවත්වන ලද "වන රෝපා" ජාතික රුක් රෝපණ වැඩසටහනට සහභාගීවූ පැසල් දරු දැරියන් හා මහජනතාව අතර බද්ධ අඹ පැළ 1000ක්, බීජ දෙළුම් පැළ 1000ක්, බීජ දෙහි පැළ 500ක් හා බීජ පේර පැළ 500ක් වශයෙන් පලතුරු පැළ 3000ක් බෙදාදීමට කටයුතු කරන ලදී.

**පාසැල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන**

මෙරට වන ආවරණය ඉහළ නැංවීමේ ජාතික වැඩසටහන බහුවිධ ප්‍රවේශයකින් ක්‍රියාත්මක වන අවස්ථාවක රුක්රෝපණ වැඩසටහන් පැවැත්වීම මගින් පාසැල් ප්‍රජාව ඒ සඳහා යොමුකිරීමටත් ප්‍රායෝගික ක්‍රියාකාරකම් තුළින් වනාන්තර සංරක්ෂණයට පෙළඹවීම හා ජෛවවිවිධත්ව සංරක්ෂණය පිළිබඳව නව දැනුම ලබාදිමට ත් මෙම වැඩසටහනෙන් අපේක්ෂා කෙරේ. පාසැල හා නිවස තුළ ක්‍රමවත් කසළ කළමනාකරණයක් සඳහා ආකල්ප වර්ධනය කිරිමත් මෙහි තවත් අරමුණකි.





I. 2018 අප්‍රේල් 02 වැනි දින අනුරාධපුර දිස්ත්‍රික්කයේ ධම්මදින්න මහා විද්‍යාලය
මේ සඳහා එම විදුහලේ 6-11 ශ්‍රේණිවල සිසුන් 150 පමණ හා ගුරුභවතුන් සහභාගී වූහ. වන සම්පත් අංශයේ ප්‍රතිපාදන මගින් කිලෝපේර පැළ 200 ක් ද පාසල් සිසුන් හට රෝපණය කිරීමට ලබා දෙන ලදී.

II. 2018 සැප්තැම්බර් මස 26 දින කෑගල්ල කිවුල්දෙණිය මහානාග මහා විද්‍යාලය
මේ සඳහා එම විදුහලේ 6-13 ශ්‍රේණිවල සිසුන් 300 පමණ හා ගුරුභවතුන් සහභාගී වූහ. වන සම්පත් අංශයේ ප්‍රතිපාදන මගින් පලතුරු පැළ 30 ක් ද පාසල් සිසුන් හට රෝපණය කිරීමට ලබා දෙන ලද අතර කසළ වර්ග කර එකතු කිරීමට හැකිවන පරිදි කසළ වර්ග කිරීමේ බඳුන් කට්ටලයක් හා කොම්පොස්ට් සකස් කිරීමට බඳුන් දෙකක් ද දැනුවත් කිරීමේ නාමපුවරු දෙකක්ද විදුහලේ ස්ථාපිත කරන ලදී.

**වන සංරක්ෂණය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම**

වන සංරක්ෂණය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම කලාප 03ක් යටතේ සිදුකෙරේ.

I. නකල්ස් කඳුවැටිය සංරක්ෂණය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම
II. සිංහරාජ වනාන්තරය ආරක්ෂා කර ගැනීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම
III. වෙනත් - වන වගා සඳහා ඉඩම් අත්පත් කර ගැනීම

ඉහත අරමුණු වෙනුවෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉඩම් අත්කර ගැනීමේ කටයුතු විවිධ ගැටළු හේතුවෙන් මන්දගාමී ස්වභාවයකින් ක්‍රියාත්මක වූ බැවින්, අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරින්, ඉඩම් අමාත්‍යාංශ නිලධාරින්, තක්සේරු නිලධාරීන්, මැනුම් නිලධාරීන්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා නිලධාරීන් හා මේ සඳහා අදාළ සියළු පාර්ශවයන් එකට එක්ව සාකච්ඡා කිරීමට අවශ්‍ය කටයුතු සංවිධානය කරන ලදි. ඒ අනුව මේ වනවිට ගැටළු සහගත තත්ත්වයන් මග හරවා ගනිමින් ඉඩම් අත්පත් කිරීමේ කටයුතු කඩිනමින් සිදු කෙරෙමින් පවතී.

නකල්ස් වනාන්තර සංරක්ෂණයට අදාළව 2018 අප්‍රේල් මාසයේ පැවැත්වූ වැඩමුළුව මගින් උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් ගොනු 124 ක් ද, 2018 ජූනි මාසයේ පැවැත්වූ වැඩමුළුව මඟින් මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් ගොනු 75ක්ද, ලග්ගල පල්ලේගම ඉඩම් ගොනු 46ක්ද, එමෙන්ම නුවරඑළිය දිස්ත්‍රිකයට අදාළව වෙනත් වන වගා ගොනු 43ක් සම්බන්ධ ගැටළු සාකච්ඡා කිරීමටද හැකියාව ලැබිණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස මෙම ගොනුවලින් 75%ක පමණ, එවකට පැවති වගන්ති මට්ටමෙන් ඉදිරි වගන්ති මට්ටම් දක්වා ගෙන යාමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. තවද උඩුදුම්බර හා කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අයත් ඉඩම් අත්පත් කර ගැනීමට අදාළව විරෝධතා පරීක්ෂණ 02ක් ද පැවැත්වීමට කටයුතු කරන ලද අතර ගොනු 20කට අදාළ ඉඩම් අත්පත් කටයුතු අවසන් කිරීමට හා ගොනු 21 කට අදාළ ඉඩම් අත්පත් කිරීමේ කටයුතු අවසන් අධියර දක්වා ගෙන එමට හැකිවී ඇත.

**මහජන පැමිණිලි සම්බන්ධීකරණය**

කැලෑ ඉඩම් හා කුඩා ජල විදුලි බලාගාර සම්බන්ධයෙන් වන මහජන පැමිණිලි වලට කළුතර, මුලතිව් හා රත්නපුර දිස්ත්‍රික්කවල ක්ෂේත්‍ර පරීක්ෂණ පවත්වා අදාළ නිරීක්ෂණ ලබාදීමට කටයුතු කරන ලද අතර මධ්‍යම පරිසර අධිකාරිය හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අදාළ පාරිසරික ඇගයීම් කමිටුවල සාමාජිකයෙකු ලෙසද මෙම අංශය කටයුතු කරනු ලැබේ. මහජන පැමිණිලි 70 ක් පමණ සම්බන්ධීකරණ කටයුතු සිදු කර ඇත. (උදා - ලෝලුගස් වැව ඉඩම් ගැටලුව, අමාවිල් ආරණ්‍ය සේනාසනය ඉඩම් ගැටලුව, වට්ටමඩු ඉඩම් ගැටලුව) මෙයට අමතරව කුඩා ජල විදුලි බලාගාර සම්බන්ධව පැවති ආයතනික ගැටලු නිරාකරණය කිරීම සඳහා මැදිහත්කරුවෙකු ලෙස මෙම අංශය ක්‍රියා කරන ලදී.





උසාවි නියෝග, නඩුකර, පරිසර සංවේදී සංකීර්ණ ගැටලු පිළිබඳව මැදිහත් වීම.



# පරිසර සැලසුම් හා ආර්ථික අංශය

2018 වර්ෂයේ දී මෙම අංශය යටතේ ප්‍රධාන වැඩසටහන් 08ක් ක්‍රියාවට නංවන ලදී.

01. නීල හරිත ගම්මාන වැඩසටහන
02. හරිත ගිණුම්කරණය
03. පිවිතුරු නිෂ්පාදනය
04. හරිත වාර්තාකරණය
05. හරිත ප්‍රසම්පාදනය
06. නීල හරිත ඔසු උයන් ස්ථාපනය කිරීම
07. පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන
08. ශ්‍රී ලංකා මානව හිමිකම් හා ප්‍රවර්ධනය සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම.

**නීල හරිත ලස්සන ලංකා හරිත සුහුරු ගම්මාන සංවර්ධනය කිරීමේ වැඩසටහන**

දේශගුණ විපර්යාසයන්ගේ අහිතකර බලපෑම් වලට පාත්‍ර ප්‍රජාවන් වෙසෙන ගම්මාන කේන්ද්‍ර කර ගනිමින් එම ප්‍රජාවන්ගේ දේශගුණ විපර්යාසයන්ගේ අහිතකර බලපෑම්වලට ඔරොත්තු දීමේ ධාරිතාවය ඉහළ නැංවීමේ අරමුණින් සමස්ත දිවයිනම ආවරණය වන සේ ඉහත වැඩසටහන ක්‍රියාත්මක වේ. එහිදී ගම්මාන සංවර්ධනය සඳහා වෙන් කොට ඇති සම්පත් රාශිකරණය කිරීම මඟින් සහ ක්‍රියාකාරී ප්‍රතිදානයන් එම ග්‍රාමීය ප්‍රජාවන්ට උරුම කරදීම සඳහා රාජ්‍ය, පෞද්ගලික හා රාජ්‍ය නොවන පාර්ශවකරුවන් ඒකාබද්ධ වැඩසටහනකට ගොනු කෙරේ.

මෙම වැඩසටහන යටතේ 2018 වසරේදී පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

- නීලහරිත ලස්සන ලංකා සුහුරු ගම්මාන වැඩසටහන සඳහා අන්තර් ආයතනික සම්බන්ධීකරණය
- නීලහරිත ගම්මාන වැඩසටහන සඳහා අත්තනගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සමෘද්ධි නිලධාරීන්ගේ සහයෝගය ලබාගැනීම සඳහා සාකච්ඡාවක් එම සමෘද්ධි කාර්යාලයේදී පැවැත්විණි.
- එහිදී දැනට අත්තනගල්ල බෝපාගම- කැන්දලන්ද නීලහරිත ගම්මානය සඳහා සහභාගිත්ව ග්‍රාම සංවර්ධන සැලසුම්, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව මඟින් සකස් කොට ඇති බැවින් එහි සඳහන් ජීවනෝපාය සංවර්ධන වැඩ සටහන් යෝජිත ඒකාබද්ධ ප්‍රවේශය තුළ ක්‍රියාත්මක කිරීම පිළිබඳ සාකච්ඡා කරන ලදී.
- ජගත් ජෛවවිවිධත්ව සම්මුතියේ පාර්ශ්වකාර රාජ්‍යයක් බවට පත්වීමේ 25 වෙනි සංවත්සරය වෙනුවෙන් ඌන උපයෝගී පලතුරු යොදා සකසනු ලැබූ ආහාර මණ්ඩලයක් ඉදිරිපත් කරන ලදී. නීලහරිත ගම්මාන වල කාලීනව සුලබ වන එළවළු, පලතුරු ආදිය බෙදාහදා ගැනීම සඳහා ප්‍රජා සහභාගීත්ව මෙවලමක් ලෙස ආහාර මණ්ඩල සැකසීම හඳුන්වා දී ඇත.
- නීලහරිත ගම්මාන වැඩසටහනේ පාර්ශවකාර සංවිධානයක් වන මහනුවර, කුණ්ඩසාලේ ඒකාබද්ධ සංවර්ධන සංගමය මඟින් නීලහරිත ගම්මාන වැඩසටහන ජාතික ආර්ථිකයට අනුප්‍රවාහගත කිරීම **(mainstreaming)** හා අධි පරිමාණනය **(up-scaling)** කිරීම සඳහා උපායමාර්ගික ප්‍රවේශයක් සකස් කිරීම සඳහා වැඩමුළුවක් පවත්වන ලදී .
- මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍ය අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන්ගේ උපදෙස් මත උතුරේ ඩෙල්ෆ්ට් දූපත සඳහා තිරසර සංවර්ධන සැලැස්මක් සකස් කිරීම අමාත්‍යාංශයේ වන සම්පත් අංශය මඟින් අරඹන ලදී. එයට සමගාමීව සමස්ථ ඩෙල්ෆ්ට් දූපතම ආවරණය වනසේ නීලහරිත කලාපයක් ප්‍රකාශයට පත්කොට දූපතේ නීලහරිත ගම්මාන වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට ක්ෂේත්‍ර අධ්‍යයනයක නිරත වීම.




ඩෙල්ෆ්ට් දූපතෙහි ක්ෂේත්‍ර අධ්‍යයනයක නිරත වීම

- වැලිකන්ද මහවැලි සී කලාපයේ හරිත පාසැල් හා හරිත ගොවි සංවිධාන පිහිටුවීම සඳහා ඒකක හා කොට්ඨාශ කළමනාකරුවන් පුහුණු කිරීම සඳහා වැඩමුළුවක් වැලිකන්ද ඒකක කළමනාකාර කාර්යාලයීය ශ්‍රවනාගාරයේදී පැවැත් වුනි. එහිදී මහවැලි ප්‍රදේශ තුල පරිසර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා නිලධාරීන් පුහුණු කරන ලදී. තව ද ක්‍රීඩා හා පරිසර බලකාය පිහිටුවීම - මහවැලි බී කලාපය
- ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ මහවැලි කේන්ද්‍රයේ මගින් දෙහි අත්තකණ්ඩිය මහවැලි සී කලාපයේ ක්‍රීඩා හා පරිසර බලකාය පිහිටුවීම සඳහා දායකත්වය ලබා දීම. එහිදී පාසැල් ළමුන් 150 දෙනෙක් සහභාගී වූ අතර අඹ, ජේර හා කොස් පැළ බෙදා දෙන ලදී.



පේර, අඹ හා කොස් පැළ බෙදා දීම (දෙහිඅත්ත කණ්ඩිය)

- ශ්‍රී ලංකා නෙක්ස්ට් - නීලහරිත යුගයක් කරා ජාතික ප්‍රදර්ශනය හා කතිකාවත සඳහා "නීලහරිත ගම්මාන කතිකාවත" යනුවෙන් වැඩසටහනක් ඉදිරිපත් කරන ලදී. එහිදී ආදර්ශ ගම්මාන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අනිකුත් රාජ්‍ය, රාජ්‍ය නොවන හා ප්‍රජා මූලික ආයතන හා සම්බන්ධීකරණය වෙමින් ඒකාබද්ධ ප්‍රවේශයකට අනුව නීලහරිත ගම්මාන වැඩසටහන ක්‍රියාත්මක කලහැකි ආකාරය අරඹයා ඉදිරිපත් කිරීම සිදුකරන ලදී.
- නීලහරිත ගම්මාන වැඩසටහන සඳහා ආයතනික සම්බන්ධීකරණ සාකච්ඡාවක් ඒකාබද්ධ ගම්මාන සංවර්ධන වැඩසටහන සකස් කිරීම හා නීල හරිත ගම්මාන මාර්ගෝපදේශ සංග්‍රහයේ කෙටුම්පත් සකස් කිරීමට වැඩමුළු 02ක් පවත්වා කෙටුම්පත් සැකසීම අවසන් කොට ඇත.( බත්තරමුල්ල/ කුණ්ඩසාලේ)

**හරිත ගිණුම්කරණය ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කිරීම**

දැනට පවතින ක්‍රමවේදය අනුව ජාතික ආර්ථිකයට ස්වභාවික පරිසරයෙන් ලැබෙන දායකත්වය සහ ආර්ථික ක්‍රියාවලි නිසා පරිසරයට සිදු වන හානිය නිසා ඇතිවන පාඩුව දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේදී නොසලකා හැරේ. මෙම කරුණ නිසා ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී පරිසරය ආශ්‍රිත කරුණු නොසලකා හැරීමට ලක්ව ඇති අතර ඒ නිසා ස්වභාවික සම්පත් හායනයකට ලක්ව ඇත. ස්වභාවික සම්පත් තුළින් ජාතික ආර්ථිකයට ලැබෙන දායකත්වය ගණනය කිරීම සහ එය දළ දේශීය නිෂ්පාදනයට ඇතුළත් කිරීමේ අරමුණින් හරිත ගිණුම්කරණ ක්‍රමවේදය ආරම්භ කරන ලදී. ඒ අනුව එක්සත් ජාතීන්ගේ සංවිධානය අනුග්‍රහය යටතේ ක්‍රියාත්මක කරන ආර්ථික ගිණුම්කරණය තුළට පූර්ණ ආර්ථික අගය යන සංකල්පය යටතේ පාරිසරික දායකත්වය ඇතුළත් කිරීමට යෝජනා කරන ලදී.

හරිත ගිණුම්කරණය යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් තුල සිදු කරන ලදී.

- හරිත ගිණුම්කරණය පිළිබඳ පාර්ශවකරුවන් සමඟ වත්මන් තත්වය හා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාවක් පැවැත්වීම.
- හරිත ගිණුම්කරණය පිළිබඳ අමාත්‍යාංශ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් පැවැත්වීම.
- බලශක්ති අංශයේ හරිත ගිණුම්කරණ අගයන් ගණනය කිරීම පිළිබඳ මූලික සාකච්ඡාවක් පැවැත්වීම.



බල ශක්ති අංශයේ හරිත ගිණුම් ගණනය පිළිබඳ මූලික සාකච්ඡාව

- හරිත ගිණුම්කරණය පිළිබඳ ජල අංශයේ ජාත්‍යන්තර වර්ගීකරණ (ISIC) ජාතික මට්ටමින් ගැලපෙන පරිදි සකස් කිරීම සඳහා පාර්ශවකාර ආයතන දැනුවත් කිරීම හා එම ආයතන සමඟ එක්ව වර්ගීකරණයන් සකස් කිරීම.





ජල අංශයේ හරිත ගිණුම් ගණනය පිළිබඳ ආයතන දැනුවත් කිරීමේ සාකච්ඡාව

- හරිත ගිණුම් කරණය පිළිබඳ ජල අංශයේ දෙවන වැඩමුළුව පැවැත්වීම (ජල අංශය ගණනය කිරීම සඳහා සකස් කරන ලද වගු ආයතන සමඟ සාකච්ඡා කිරීම, ආයතන කිහිපයක කේන්ද්‍රීය මධ්‍යයන් හඳුනා ගැනීම) දත්ත ඉල්ලුම් කිරීම සඳහා එක් එක් ආයතන වෙත ලිපි යොමු කිරීම හා එක් එක් ආයතනයන් සඳහා වෙන වෙනම දත්ත ලබා ගැනීම සඳහා සකස් කරන ලද වගු යොමු කිරීම.




ජල අංශයේ හරිත ගිණුම් ගණනය පිළිබඳ දෙවන වැඩමුළුව

**සම්පත් කාර්යක්ෂමතා සහ සුපිරිසුදු නිෂ්පාදන ප්‍රතිපත්තිය ප්‍රවර්ධනය කිරීම**

තිරසර නොවන පරිභෝජන රටා හේතුවෙන් ස්වාභාවික සම්පත් කෙරෙහි ඇති ඉල්ලුම දිනෙන් දින වැඩි වෙමින් පවතී. එනමුදු සුපිරිසිදු නිෂ්පාදනය ක්‍රියාත්මක කිරීම මගින් සම්පත් භාවිතා කිරීමේ කාර්යක්ෂමතාවය වැඩිකර ස්වභාවික සම්පත් ක්ෂයවීම අඩු කර දූෂණය සහ නිෂ්පාදන පිරිවැය අවම කරගත හැකි බව ගෝලීයව පිළිගෙන ඇත.

මෙම වැඩසටහන යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

I. කර්මාන්තකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.( Switch-Asia ව්‍යාපෘතිය මගින් සිදු කරන ලදී.)

**ජාතික හරිත වාර්තාකරණ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම**

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් නිෂ්පාදන හා සේවා ක්ෂේත්‍රයන්හි තිරසර කාර්ය සාධනය වාර්තා කිරීම පිණිස වර්ෂ 2011 දී ජාතික හරිත වාර්තාකරණ ක්‍රමවේදය ස්ථාපිත කරන ලදී. නිෂ්පාදන හා සේවා ක්ෂේත්‍රයන්හි තිරසර කාර්යසාධනය සන්නිවේදනය කිරීම සඳහා ජාතික හරිත වාර්තාකරණ ක්‍රමවේදය උපයෝගී කොට ගනී.

මෙම වැඩසටහනේ මූලික අරමුණ වනුයේ කර්මාන්ත හා සේවා සපයන්නන්ගේ තිරසර කාර්යසාධනය ඇගයීමට ලක් කිරීමත් හා තිරසර කාර්යසාධනය වාර්තා කිරීමේ ධාරිතා වර්ධනයත්ය.
ජාතික හරිත වාර්තාකරණ ක්‍රමවේදය යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

- මෙම වසර තුළ තවදුරටත් කර්මාන්තකරුවන් 30ක් පමණ හරිත වාර්තාකරණය සඳහා ලියාපදිංචි වන ලදී.

- 2018 වර්ෂය සඳහා හරිත වාර්තා 05ක් කර්මාන්තකරුවන් විසින් ඉදිරිපත් කරන ලද අතර ශ්‍රී ලංකා NEXT වැඩසටහන යටතේ පැවැති ජනපති සම්මාන වැඩසටහනේ දී හොඳම හරිත වාර්තාව සඳහා ජනාධිපති සම්මානයක් ප්‍රදානය කරන ලදී.



- 2018 වසර තුළදී ලියාපදිංචි වන ලද කර්මාන්තකරුවන් (දෙවන මට්ටමේ) සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 02ක් පවත්වන ලදී.

**හරිත ප්‍රසම්පාදනය**

- ජාතික හරිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ දෙවන කෙටුම්පත සඳහා යෝජනා හා අදහස් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙත යොමු කරන ලදී.
- තිරසර පරිභෝජනය හා නිෂ්පාදන ව්‍යාපෘතියට සමගාමීව දැනුවත් කිරීමේ වැඩමුළු 5ක් පවත්වන ලදී.

**නීල හරිත ඔසු උයන් ස්ථාපිත කිරීම**

මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණු වන්නේ,

- දුර්ලභ ශාක විශේෂ සංරක්ෂණය හා තිරසාර භාවිතයට අවස්ථාව සැලසීම
- නීල හරිත ගම්මාන වැඩසටහන සඳහා හරිත රැකියා උත්පාදනයට අවස්ථාව සැලසීම
- හරිත රැකියා ප්‍රවර්ධනය කිරීම
- ජෛවවිවිධත්වය සංරක්ෂණය
- අධ්‍යාපනික වටිනාකමකින් යුත් ඔසු උයන් ස්ථාපිත කිරීම

2018 වසරේ නීල හරිත ඔසු උයන් ස්ථාපිත කිරීමේ වැඩසටහන යටතේ ඔසු උයන් 03 ක් වැලිකන්ද ග්‍රාමීය රෝහල, මීගොඩ ආයුර්වේද රෝහල හා යගිරල යන ස්ථාන වල ස්ථාපිත කරන ලදී. ඔසු පැළ රෝපණය කිරීම වනරෝපා ජාතික රුක්රෝපණ වැඩසටහනට සමගාමීව 2018 වසරේ ඔක්තෝබර් මාසයේ සිට ආරම්භ කරන ලදී.

මෙහිදී වැලිකන්ද නගරය හරිත නගරයක් කිරීමේ වැඩසටහන යටතේ වැලිකන්ද ග්‍රාමීය රෝහල් භූමියේ දැනට පවතින ඔසු උයන වැඩි දියුණු කිරීමටත්, මීගොඩ ආයුර්වේද රෝහල සතුව පවතින ඔසු උයන වැඩිදියුණු කිරීමත් සහ බස්නාහිර පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් යගිරල ප්‍රදේශයේ ස්ථාපිත කරන ඔසු උයන සඳහා අවශ්‍ය අදාළ ස්ථානයන්හි දේශගුණික තත්ත්වයන්ට ගැලපෙන හා ප්‍රතිකාර කටයුතු සඳහා අත්‍යාවශ්‍යව පවතින ගුණාත්මයෙන් ඉහළ ඔසු පැළ ලබාදීම සිදුකරන ලදී.







වැලිකන්ද ඔසු උයන සඳහා පැල සිටුවීම

**පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන**



පරිසර සැලසුම්කරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සහ විද්‍යාපති උපාධි පාඨමාලාව ප්‍රවර්ධනය සඳහා මොරටුව විශ්ව විද්‍යාලයේ නගර හා ග්‍රාම නිර්මාණ අංශය සමඟ අවශ්‍ය කටයුතු සිදු කරන ලද අතර මෙම පශ්චාත් උපාධි පාඨමාලාව සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය 2017 දෙසැම්බර් මස ලැබුනු අතර ඒ සඳහා සිසුන් තෝරා ගෙන 2018/08/04 දින සිට පාඨමාලාව ආරම්භ කරන ලදී.

**ශ්‍රී ලංකා මානව හිමිකම් හා ප්‍රවර්ධනය සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම**

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය ලබා ගැනීම දක්වා ශ්‍රී ලංකාව සිය ප්‍රජාතන්ත්‍රවාදී හා ජනතා කේන්ද්‍රීය ප්‍රතිපත්තිවලට අනුකූලව කටයුතු කර ඇති අතර, එක්සත් ජාතීන්ගේ ප්‍රධාන මානව හිමිකම් සම්මුතීන්ට මෙන්ම වෙනත් ගිවිසුම් කිහිපයක් සඳහා ස්වේච්ඡා පදනම මත පාර්ශවකරුවෙකු බවට පත් වී තිබීම මෙන්ම සියළු ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම අරමුණු කරගත් විකල්ප සන්ධානයන්ද (Protocol) වේ.



ගෝලීය පාරිසරික සහයෝගීතා ක්‍රියාවලිය තුළ ශ්‍රී ලංකාව ක්‍රියාකාරීව සහභාගී වී ඇති අතර බහුපාර්ශවීය පාරිසරික ගිවිසුම් හා ප්‍රකාශයන් ආසන්න වශයෙන් 40 ක් පමණ අනුමත කර ඇත. ව්‍යවස්ථාපිතව රැකගතයුතු මූලික අයිතිවාසිකමක් ලෙස පරිසරයට ඇති අයිතිය හඳුනා ගැනීම අනිවාර්ය විය යතු අතර, පරිසරයට අදාළ නීති හා ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්ම තුළ එයට ප්‍රමුඛත්වය දිය යුතු වේ.
ජාතික මානව හිමිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සඳහා ප්‍රගතිය සමාලෝචනය/ නිර්දේශ / යෝජනා ක්‍රියාත්මක කිරීම කෙටි කාලීන(2018.06.30 දක්වා), මධ්‍ය කාලීන (2019.12.31), දිගු කාලීන (2021.12.31) ලෙස ක්‍රියාවට නැංවීම හෝ සම්බන්ධීකරණය කිරීම සඳහා අදාළ අමාත්‍යාංශ / ආයතන නිශ්චිතව හඳුනාගෙන ඇත.

ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් යුත් අන්තර් අමාත්‍යාංශ කමිටුව විසින් ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කරනු ලබන අතර, සිවිල් සමාජ පාර්ශ්වකරුවන්ගේද සහභාගීත්වය ඇතිව පරිසර විෂයට අනුබද්ධ සියළු ආයතන සහභාගිත්වයෙන් පැවැත්වෙන ආංශික කමිටුවට සැම මාසයකම නිලධාරීන්ගේ කමිටුව වෙත ප්‍රගතිය වාර්තා කිරීමට සිදු වේ.

මෙම වැඩසටහන යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

- පරිසර අයිතීන් සඳහා හඳුනා ගෙන තිබූ කෙටි කාලීන ක්‍රියාකාරකම් වලින් එකක් හැර අනෙකුත් ක්‍රියාකාරකම් 2018.06.30 දිනට සම්පූර්ණ කිරීම. (ජාතික පරිසර පනත සංශෝධනය කිරීමේ ක්‍රියාකාරකම කෙටි කාලීන ක්‍රියාකාරකමක් වශයෙන් හඳුනා ගෙන ඇති නමුත් එය පියවර ගණනාවක් ඔස්සේ සිදු කළ යුතුව ඇති නිසා 2018.06.30 දින වන විට අවසන් කිරීමට හැකි වී නැත. එහෙත් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යැවීම දක්වා කටයුතු අවසන් කර ඇත.)
- සැම මාසයක් අවසානයේදීම පරිසර අයිතීන් සඳහා වන ආංශික කමිටු රැස්වීමක් පවත්වා ප්‍රගතිය සමාලෝචනය කර සංහිදියා යාන්ත්‍රණ පිළිබඳ සම්බන්ධීකරණ ලේකම් කාර්යාංශයට වාර්තා කිරීම
- අනිකුත් අමාත්‍යාංශ වල ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් බහු පාර්ශවීය ක්‍රියාකාරකම් සඳහා මෙම අමාත්‍යාංශය යටතේ ඇති ආයතන දායක වන අවස්ථාවන්හිදී ඒ සඳහා පැවැත්වෙන ආංශික කමිටු රැස්වීම් සඳහා සහභාගි වීම සහ වාර්තා සැපයීම




පරිසර අධ්‍යාපන හා
ප්‍රවර්ධන අංශය

## ජගත් පරිසර දිනය 2018 සැමරීම

2018 ජගත් පරිසර දින සැමරුම් උත්සවය හා පරිසර සංරක්ෂණ සමුළුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා පාර්ලිමේන්තු මැති ඇමතිවරුන්ගේ සහභාගීත්වයෙන් ද, සම්භාවනීය අමුත්තන්ගේ සහ පාසල් සිසු සිසුවියන්ගේ සහභාගීත්වයෙන් ද 2018 ජූනි මස 04 වන දින කෑගල්ල නිදහස් මාවතේ දී පවත්වන ලදී. "ප්ලාස්ටික් අවභාවිතාව මඟින් සිදුවන පරිසර දූෂණය පිටුදකිමු" (Beat Plastic Pollution) යන්න මෙවර ජගත් පරිසර දින තේමාව විය.



අතිගරු ජනාධිපතිතුමන් උත්සවය සඳහා පිළිගන්නා ලද අවස්ථාව



පරිසර ප්‍රතිඥාව ලබා දීම



2018 ජගත් පරිසර දිනය සනිටුහන් කරමින් බෙලි පැළයක් රෝපණය කළ අවස්ථාව

## සොබා වලන කෙටි චිත්‍රපට තරගාවලිය පැවැත්වීම

තරුණ සිනමා කරුවන් තුළ පරිසර සංරක්ෂණය පිළිබඳ ආකල්ප වර්ධනය කරමින් සාධනීය සමාජ කතිකාවතක් ගොඩනැගීම අරමුණු කරගෙන ජගත් පරිසර දිනයට සමගාමී වැඩසටහනක් ලෙසින් "සොබා වලන" කෙටි චිත්‍රපට තරගාවලිය සංවිධානය කරන ලදී. නිර්මාණකරුවන් විසින් ඉදිරිපත් කරන ලද නිර්මාණ ප්‍රවීණ විනිසුරු මඩුල්ලක් මගින් ඇගයීමට ලක් කළ අතර සම්මාන ප්‍රදානෝත්සවය Sri Lanka Next "නීල හරිත යුගයක්" වැඩසටහනට සමගාමීව අමාත්‍යාංශ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රවීණ විනිසුරු මඩුල්ලේ සහ නිර්මාණකරුවන්ගේ සහභාගීත්වයෙන් 2018.10.19 දින කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වනු ලැබිණි. වඩා උසස් නිර්මාණයක් බිහිකිරීමේ අරමුණින් නිර්මාණකරුවන් හා විනිශ්චය මණ්ඩලය අතර විද්වත් කතිකාවතක් ඇති කිරීමට ද අවස්ථාව සලසා දෙන ලදී.






කුසලතා සම්මාන පළමු ස්ථානය - නාලක විජේරත්න





කුසලතා සම්මාන දෙවන ස්ථානය - සුදීෂ රත්නායක





කුසලතා සම්මාන තෙවන ස්ථානය - මනෝදා අමරජීව






කුසලතා සම්මාන සිව්වන ස්ථානය - එස්. මනෝජ්

## පරිසර ගැටළු පිළිබඳ මාධ්‍ය වාර්තා සම්බන්ධීකරණය

රූපවාහිනී නාලිකාවල ප්‍රචාරය වන පරිසර ගැටලු හා පුවත්පත්වල පළවන පරිසරයට අදාළ ගැටලු සම්බන්ධයෙන් ආයතනික සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම මෙම අංශය මගින් සිදු වේ. විශේෂයෙන්ම මේ තුළින් වර්තමානයේ පැන නැගී ඇති පාරිසරික ගැටලු සඳහා අමාත්‍යාංශ මට්ටමින් මැදිහත් වී විසඳුම් සෙවීමට කටයුතු කරමින් පාරිසරික ගැටලු අවම කිරීම මෙහි ප්‍රධාන පරමාර්ථය වෙයි.

ඒ අනුව වාර්තා කරන කාල සීමාවට අදාළව රූපවාහිනී නාලිකා 07ක විකාශනය වූ පාරිසරික ගැටළු/අවධානයන් 236ක් හඳුනාගෙන ඒ සඳහා ක්‍රියාත්මක වන ලදි. පුවත්පත්වල පලවූ පරිසර සංවේදී මාතෘකා පිළිබඳව අවධානය යොමු කරමින් ගැටළු 128ක් සම්බන්ධයෙන් අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.

## පරිසර අධ්‍යාපන දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම



මෙම අංශය මගින් සිසු දරුවන්, රාජ්‍ය ආයතනවල නිලධාරීන් සහ මහජනතාවගේ පරිසර සංවේදීතාව, පරිසරය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් දිපව්‍යාප්තව පවත්වනු ලබයි. 2018 වර්ෂය තුළ පාසල් සිසුන්, රාජ්‍ය නිලධාරීන් ඇතුළුව 2,150 දෙනෙකු වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් 06ක් පවත්වා ඇත.

## හරිත රැකියා ප්‍රවර්ධනය

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්, හරිත රැකියා සඳහා යොමු කිරීම මෙහි ප්‍රධාන අරමුණ වෙයි. ඒ සඳහා කැමැත්තක් දක්වන තරුණ තරුණියින් දැනුවත් කිරීම හා හරිත රැකියා සම්බන්ධ ප්‍රායෝගික පුහුණුව ලබා දීම මෙමගින් සිදු කරනු ලබයි. 2018 වසරේ පාදුක්ක හා යාපනය වැඩසටහන් 02ක් පවත්වා ව්‍යවසායකයින් 172 දෙනෙකු පුහුණු කර ඇත.





### සොබා පරිසර ප්‍රකාශනය සහ සොබා පුවත් හසුන ප්‍රකාශයට පත් කිරීම

වර්තමානයේ ඇති වී තිබෙන ගෝලීය පාරිසරික අර්බුද හමුවේ පරිසර සංරක්ෂණය කෙරෙහි දැනුම ලබා දීම හා ආකල්පමය වෙනසක් ඇති කිරීම තුළින් පාරිසරික වශයෙන් සංවේදී ප්‍රජාවක් බිහි කිරීමේ අරමුණ ඇතිව සෑම වසරකම පරිසර අමාත්‍යාංශය මගින් සොබා සඟරාව ප්‍රකාශනය සිදු කරයි. ඒ අනුව පසුගිය වසරේදීද සොබා සඟරාව කලාප දෙකක් එළි දක්වන ලදී. තවද අමාත්‍යාංශයේ කාලීන තොරතුරු හා වරින්වර සංවිධානය කෙරෙන වැඩසටහන් පිළිබඳ තොරතුරු අන්තර්ගත "සොබා පුවත් හසුන" 2018 වර්ෂය සඳහා එක් කලාපයක් ප්‍රකාශයට පත් කරන ලදි. ඉහත ප්‍රකාශන දීප ව්‍යාප්ත මට්ටමින් පාසල් සිසුන්, ගුරුවරුන්, රාජ්‍ය නිලධාරීන්, පුස්තකාල සඳහා සහ සාමාන්‍ය මහජනතාව වෙත බෙදා දීම සිදු කරන ලදි. තවද, මෙම ප්‍රකාශන විශ්වවිද්‍යාල පුස්තකාල, පාසල් සහ ප්‍රාදේශීය සභා කාර්යාල වෙත ද ලබා දීම සිදු කරන ලදී.









# ප්‍රතිපත්ති සැලසුම් හා නියාමන අංශය

2003 වසරේ සකස් කරන ලද පරිසර ප්‍රතිපත්තිය කාලීන අවශ්‍යතාවයන්ට අනුව යාවත්කාලීන කිරීම 2017 වසරේ ආරම්භ කරන ලදී. ඒ අනුව පරිසර ප්‍රතිපත්තියට ඇතුළත්විය යුතු නව ක්ෂේත්‍ර හඳුනාගැනීමත් මුල් ප්‍රතිපත්තයේ හඳුනාගත් හිදැස් ආවරණය වන පරිදි ප්‍රතිපත්තිය යාවත්කාලීන කර කෙටුම්පත් කිරීම සිදුකර ඇත. මේ සඳහා අනෙකුත් පාර්ශවකාරී රේඛීය අමාත්‍යාංශ, රාජ්‍ය ආයතන, සිවිල් සංවිධාන හා මහජනතාව දැනුවත් කරමින් ප්‍රතිපත්තිය සැකසීමේ ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය.

නව පරිසර ප්‍රතිපත්තියට ගැලපෙන පරිදි ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලැස්ම යාවත්කාලින කිරීමේ කටයුතුද මේ වන විට ආරම්භකර ඇති අතර ඒ සඳහා දේශගුණ විපර්යාස මඟින් ඇතිවන අභියෝගයන්ට මුහුණදීම, ශාක සත්ත්ව හා පරිසර පද්ධති සුරැකීම, වෙරළ තීරය හා අවට මුහුද ඥානාන්විත ලෙද පරිහරණය, වගකීමෙන් යුතු ඉඩම් පරිහරණය, නිවැරදි තෝරාගැනීම සඳහා දැනුම යන මෙහෙවර යාවත්කාලීන කිරීමේ වැඩමුළු පවත්වා ඇත.

ප්‍රගති සමාලෝචන කාල සීමාව තුළ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවෙහි අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කල අතර ඒ අතරින් ඒකාබද්ධ අරමුදල් යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති යෝජනා 2ක් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට හැකිව ඇත.

නව ව්‍යාපෘති 3ක් සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කල අතර ඉන් 1ක් සඳහා අනුමැතිය ලබා ගැනීමට හැකිව ඇත.

එමෙන්ම ජාතික අයවැය මගින් අනුමත ඒකාබද්ධ අරමුදල යටතේ ප්‍රතිපාදන ලබා ගනිමින් ක්‍රියාත්මක වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා අමාත්‍යාංශ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමත් ඒ යටතේ ක්රියාත්මක ආයතන හා අංශවෙත ප්‍රතිපාදන ලබා ගැනීමට කටයුතු සිදු කෙරිනි. ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ලබා දුන් ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති හා වැඩසටහන්වල ප්‍රගතිය විමසීම හා අදාළ පාර්ශව වෙත ප්‍රගතිය වාර්තා කිරීම සිදුකර ඇත. තවද ජනාධිපති ලේකම් කාර්යාලය මගින් මුදල් ලබාදෙන පුනරුදය වැඩසටහනට අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආයතන හා අංශ සම්බන්ධීකරණය කරමින් ඊට අදාළ ප්‍රගති සමාලෝචන පැවැත්වීම සිදු කර ඇත.

තවද අමාත්‍යාංශයේ සියලුම අංශ සමග සම්බන්ධ වී රැස්වීමක් පවත්වා හා වරින් වර එකතුවී මෙම අමාත්‍යාංශයේ දත්ත අවශ්‍යතාවයන් හඳුනා ගත් අතර පසුව එයට අමතරව හරිත ගිණුම්කරණයට අදාළ දත්ත හා තිරසර සංවර්ධන ඉලක්ක වලට අදාළ දත්ත අවශ්‍යතා ද එකතු කොට එම දත්ත ලබාගත හැකි මූලාශ්‍ර ආදිය ඇතුළත් ලේඛනයක් පිළියෙල කරමින් පැවතිණි. මීට අමතරව තිරසර සංවර්ධන ඉලක්ක වල පරිසර විෂයට අදාළ දර්ශක වල පදනම් දත්ත අදාළ ආයතන සම්බන්ධීකරණය කරගනිමින් පිළියෙල කල අතර, අදාළ දර්ශක සඳහා දත්ත ශ්‍රී ලංකාව තුළ පිළියෙල නොකරන අවස්ථාවල එම දර්ශක සඳහා proxy දර්ශක පිළියෙල කිරීමට කටයුතු කර ඇත. එසේම තිරසර සංවර්ධන ඉලක්ක වලට අදාළ රැස්වීම් වලට සහභාගී වෙමින් පරිසර විෂයට අදාළ ඉලක්ක සපුරා ගැනීමට අදාළ වන අනෙකුත් වැඩකටයුතුද ඉටුකොට ඇත.











# අන්තර්ජාතික සබඳතා අංශය

**දකුණු ආසියානු පාරිසරික සහයෝගීතා වැඩසටහනේ (සකෙප්) 14 වන විධායක සභා රැස්වීම -2018 මාර්තු 26 සිට 28, කොළඹදී පවත්වන ලදී.**

14 වන විධායක සභා රැස්වීමේ සමාරම්භක සැසිය 2018 මාර්තු මස 28 වන දින සාමාජික රටවල්වල ඉහළ මට්ටමේ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් කොළඹදී පවත්වනු ලැබීය. එහි මූලික රැස්වීම, ජාතික කේන්ද්‍රීය ආයතන වල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් 2018 වර්ෂයේ මාර්තු මස 26 හා 27 දිනයන්හි කොළඹදී පවත්වනු ලැබිය. 14 වන විධායක සභා රැස්වීම ඇෆ්ගනිස්ථානු රජයේ සත්කාරකත්වය සහිතව මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ දායකත්වයෙන් හා සකෙප් ලේකම් කාර්යාලයේ සම්බන්ධීකරණය ඇතිව පවත්වන ලදී. ඒ අනුව දකුණු ආසියානු පාරිසරික සහයෝගීතා වැඩසටහනේ (සකෙප්) ලේකම් කාර්යාලය හා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිල නිවාසය ඉදිකිරීම සඳහා ඉඩමක් ලබා දීමට ශ්‍රී ලංකා රජය සත්කාරක රට වශයෙන් එකඟතාවය පල කර ඇති අතර එම ඉඩම වෙන්කරවා ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණ අතර ඉදිරි කටයුතු සිදු කෙරෙමින් පවතී.





**හරිත දේශගුණ අරමුදලෙහි විධායක අධ්‍යක්ෂතුමාගේ ශ්‍රී ලංකා සංචාරය**

හරිත දේශගුණික අරමුදල[Green Climate Fund (GCF)] ප්‍රධාන ජාත්‍යන්තර මූල්‍ය ආයතනයක් වන අතර සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ හැකියාවන් වර්ධනය කිරීමේ වැඩසටහන් සඳහා සහනදායී මූල්‍යාධාර සපයනු ලැබේ. එබැවින්, රට තුළ දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ හැකියාවන් වර්ධනය කිරීමේ ව්‍යාපෘති සඳහා ප්‍රශස්ත අරමුදල් ලබා ගැනීමට මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය හරිත දේශගුණික අරමුදල සමඟ ඉතා සමීපව කටයුතු කරමින් සිටී.
හරිත දේශගුණ අරමුදලෙහි [Green Climate Fund (GCF)] විධායක අධ්‍යක්ෂ, තානාපති හොවාර්ඩ් බම්සෙයි මහතා දූත පිරිසක් සමඟ පසුගිය අප්‍රේල් මාසයේ දී ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. එහිදී එම ආයතනයේ නිලධාරීන් සහ කෘෂි වන වගා පර්යේෂණ පිළිබඳ ජාත්‍යන්තර කවුන්සිලයෙහි [International Council for Research in Agro Forestry (ICRAF)] විශේෂඥයින් සමග ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයේ සහ නකල්ස් රක්ෂිතයේ මෙන්ම ජලාධාර ප්‍රදේශවලට බලපාන දේශගුණික බලපෑම් පිළිබඳ නිරීක්ෂණයක් ගුවනින් සිදු කරන ලදී. දේශගුණික විපර්යාසයන් හේතුවෙන් ඇතිවන අභියෝගයන්ට මුහුණදීම සඳහා වඩාත් අවදානමට ලක් වූ ප්‍රජාවන්, ප්‍රදේශ සහ ක්ෂේත්‍රයන් අතර ප්‍රශස්ත ලෙස හැකියාවන් වර්ධනය කිරීමට ඇති අවස්ථාවන් පිළිබඳව විධායක අධ්‍යක්ෂ සහ ඔහුගේ කණ්ඩායම අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡාවක් ද පවත්වන ලදී.

**පොදුරාජ්‍ය මණ්ඩලීය නීල ප්‍රඥප්තියට අනුව කඩොලාන ප්‍රතිස්ථාපනය පිළිබඳ ශූරයන් වීමට ශ්‍රී ලංකාව පොරොන්දු වෙයි**




පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායකයන් විසින් නීල ප්‍රඥප්තිය සම්මත කර ගැනීමත් සමඟ සාගර වල ආරක්ෂාව පිළිබඳව සම්බන්ධීකරණය පිළිබඳ එකඟතාවයකට පැමිණියහ. මෙම සන්ධර්භය තුළ ශ්‍රී ලංකාව කඩොලාන ප්‍රතිස්ථාපනය පිළිබඳ ශූරයන් වීමට බලාපොරොත්තු වන බව නිවේදනය කරන ලදී. සයිප්‍රසය, කෙන්යාව, ඕස්ට්‍රේලියාව, බෙලිස්, මොරිසියස්, එක්සත් රාජධානිය, වනවාටු, නවසීලන්තය, ෆීජි සහ කැනඩාව යන රටවල් තිරසාර සාගර සංවර්ධනය හා සංරක්ෂණයට සඳහා පෙළගැසීමට පොරොන්දු විය.

**ප්ලාස්ටික් දූෂණය අවම කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාව පොදු රාජ්‍ය මණ්ඩලීය පවිත්‍ර සාගර සන්ධානයට එක්වීම**

ප්ලාස්ටික් භාවිතය අවම කිරීම තුලින් ලෝක සාගරයන් පිරිසිදු කිරීමේ අභිමතාර්ථය සහිතව නවසීලන්තය සානාව හා ශ්‍රී ලංකාව ප්ලාස්ටික් දූෂණයට එරෙහි සටන්වලට බල කිරීම සඳහා සාමාජික රටවල් ඒකාබද්ධ කිරීමේ අරමුණ ඇතිව එක්සත් රාජධානිය සහ වනවාටු යන රාජ්‍යයන්ගේ නායකත්වයෙන් යුත් පොදු රාජ්‍ය මණ්ඩලීය සාගර සන්ධානයට එක් විය.

**ශ්‍රී ලංකාව කොරල්පර පිළිබඳ ජාත්‍යන්තර වැඩසටහනෙහි සාමාජිකත්වය ලබා ගැනීම**

නිවර්තන කොරල්පර ඇති රටවල් අතර ශ්‍රී ලංකාවට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. ලොව පුරා විහිදී ඇති මෙම කොරල් සම්පත ආරක්ෂා කර ගැනීමේ අරමුණින්, අවිධිමත් හවුල්කාරීත්වයකින් යුතු කොරල් පර පිළිබඳ ජාත්‍යන්තර වැඩසටහන International Coral Reef Initiative (ICRI) පිහිටුවාගෙන ඇත. ශ්‍රී ලංකාවේ කොරල් පර සංරක්ෂණය සඳහා අවශ්‍ය ධාරිතාව වැඩිකර ගැනීමේ අරමුණින් කොරල් පර පිළිබඳ ජාත්යන්තර වැඩසටහන (ICRI) සමඟ සම්බන්ධ වීමට ශ්‍රී ලංකාව මෑත දී තීරණය කරන ලදී. ඒඅනුව මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණ අතර ඒ සඳහා අවශ්‍ය ඉදිරිකටයුතු සිදු කෙරෙමින් පවතී.

**පරිසර ක්ෂේත්‍රය හා සම්බන්ධ ද්වි/බහු පාර්ශවික ගිවිසුම්**

පහත සඳහන් ගිවිසුම් සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ කෙටුම්පත් කොට ඇත.

- ශ්‍රී ලංකාවේ පයිනස් වන වගා දේශීය ශාක විශේෂ වලින් අනුන වන වගා බවට පරිවර්තන කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වනාන්තර තිරසර කළමනාකරණය හා පුනරුත්ථාපනය පිළිබඳ ආසියා ශාන්තිකර ජාලය (Asia Pacific Network for Sustainable Forest Mangement and Rehabilitattion - APFNet) සමඟ අවබෝධතා ගිවිසුම
- ශ්‍රී ලංකාවේ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සහ ඔස්ට්‍රේලියානු රජයේ භූ විද්‍යා ආයතනය අතර විද්‍යාත්මක හා තාක්ෂණික සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම.

  එසේම අනෙකුත් ගිවිසුම් වන:
  - දේශගුණ විපර්යාස පිළිබඳව ශ්‍රී ලංකා රජය හා කොරියානු සමුහාණ්ඩුව අතර සහයෝගීතා ගිවිසුම.
  - ශ්‍රී ලංකාවේ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සහ බ්‍රිතාන්‍යය භූ විද්‍යා සමීක්ෂණ කාර්යාංශය අතර අවබෝධතා ගිවිසුම.
  - ශ්‍රී ලංකාවේ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සහ ජර්මන් හොල්ම්හෝල්ට් මධ්‍යස්ථානයට අනුබද්ධ භූ විද්‍යාවන් පිළිබඳව ජර්මානු පර්යේෂණ මධ්‍යස්ථානය සමඟ අවබෝධතා ගිවිසුම.
  - තායිලන්ත මැණික් හා ස්වර්ණාභරණ ආයතනය සහ ශ්‍රී ලංකාවේ මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ සහ පුහුණු ආයතනය අතර අවබෝධතා ගිවිසුම.
  - වෙරළ හා සමුද්‍රීය සහයෝගීතාව පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය හා චීන සමුහාණ්ඩුව අතර සමුද්‍රීය පරිපාලන (State Oceanic Administration (SOA) අවබෝධතා ගිවිසුම.
  - ශ්‍රී ලංකාව හා වියට්නාමය අතර මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ සහයෝගීතාව පිළිබඳව අවබෝධතා ගිවිසුම්

සඳහා අදාල පාර්ශවකාර රටවල එකඟතාවයන් ලබා ගැනීම සඳහා අදාළ තානාපති කාර්යාල සඳහා යොමු කොට ඇත.

**ගෝලීය පාරිසරික පහසුකම යටතේ ව්‍යාපෘති**

ගෝලීය පාරිසරික පහසුකම් චක්‍ර 6 යටතේ "සහයෝගයෙන් කළමනාකරණයට : ඒකාග්‍රිත ස්වාභාවික සම්පත් කළමනාකරණය සඳහා වන වගාව කෘෂිකර්මය සහ සංරචනය යන අංශ, ප්‍රජා කේන්ද්‍රීය වුත් පරිසර පද්ධති මත පදනම් වුත් ප්‍රවේශයන් තුලින් ඒකාබද්ධ කිරීම" යන ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලැබුන අතර එහි සම්පූර්ණ ව්‍යාපෘති වාර්තාව සැකසීම සඳහා තාක්ෂණික උපදේශක කමිටු, සමාරම්භක වැඩමුළුව හා ප්‍රාදේශීය සමාරම්භක වැඩමුළු පවත්වන ලදී. එසේම "පාරිසරික හා සාමාජීය වශයෙන් සංවේදී කෘෂි පාරිසරික පද්ධති ස්ථාපිත කිරීම තුලින් භූමි හායනය අවම කිරීම හා ආහාර සුරක්ෂිතතාව ඇතිකරමින් සෞඛ්‍ය සම්පන්න ගොවි ජනතාවක් හා සමෘද්ධිමත් දිවි පැවැත්මක් තහවුරු කිරීම" යන ව්‍යාපෘති සඳහාද

අනුමැතිය ලැබුණ අතර එහි සම්පූර්ණ ව්‍යාපෘති වාර්තාව සැදීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කෙරෙමින් පවතී.

**අන්තර්ජාතික පාරිසරික සන්ධාන, සම්මුති, සහයෝගීතා වැඩසටහන් හා අන්තර්ජාතික ආයතන සඳහා වාර්ෂික දායකත්ව මුදල් හා සත්කාරක මුදල් ගෙවීම**

2018 වර්ෂය සඳහා පහත සඳහන් අන්තර්ජාතික පාරිසරික සන්ධාන, සම්මුති, සහයෝගීතා වැඩසටහන් හා ජාත්‍යන්තර ආයතන සඳහා වාර්ෂික දායකත්ව මුදල් හා සත්කාරක මුදල් ගෙවා අවසන් කොට ඇත.

- එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන (UNEP)
- කාන්තාරීකරණය වැළැක්වීම සඳහා වූ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (UNCCD)
- දේශගුණ විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතිය (UNFCCC)
- ව්‍යසනකාරී අපද්‍රව්‍ය දේශාන්තර සංසරණය හා අපහරණය සඳහා වූ බාසල් (Basel) සම්මුතිය
- මිනමාටා සම්මුතිය
- දිගුකල් පවතින කාබනික දූෂ්‍යකාරක සඳහා වූ ස්ටොක්හෝම් (Stockholm) සම්මුතිය
- ලෝක සංරක්ෂණ සංගමය (IUCN)
- ජෛවවිවිධත්ව සම්මුතිය (Biological Diversity)
- ජෛව සුරක්ෂිතතාවය සඳහා වූ කටිජිනා (Biosafety) සන්ධානය
- දකුණු ආසියානු පාරිසරික සහයෝගීතා වැඩසටහන (SACEP) සඳහා දායකත්ව මුදල්
- දකුණු ආසියානු පාරිසරික සහයෝගීතා වැඩසටහන (SACEP) සඳහා සත්කාරක මුදල්
- පරිසරය පිළිබඳ දකුණු ආසියානු සහයෝගී වැඩසටහනට යටතේ පවතින දකුණු ආසියානු සමුද්‍ර වැඩසටහන (SASP)



# නීති අංශය

පාරිසරික කළමනාකරණය තුළින් තිරසර සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම සඳහා නීතිමය විධිවිධාන විමර්ශණය කර වැඩි දියුණු කිරීම අරමුණු කර ගනිමින් පහත කාර්යයන් ක්‍රියාවට නංවනු ඇත.

- අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනය වල නඩු කටයුතු සඳහා සහාය දැක්වීම
- පනත් / ගැසට් සම්බන්ධ කටයුතු
- අභියාචනා විභාග කිරීම
- ගිවිසුම් සකස් කිරීම/පරීක්ෂා කිරීම
- මහජන පැමිණිලි සම්බන්ධ කටයුතු සිදු කිරීම
- අමාත්‍යාංශයේ එක් එක් අංශය මගින් ඉදිරිපත් කරන නීතිමය ගැටළු සම්බන්ධ උපදෙස් දීම
- පරිසර නීතිය පිළිබඳ වැඩමුළු සංවිධානය/ පැවැත්වීම

| නීති අංශය මගින් සිදු කරන ලද ප්‍රධාන කාර්යයන්හි ප්‍රගතිය - 2018/01/01 - 2018/12/31 | | | | |
|---|---|---|---|---|
| අංකය | ප්‍රධාන ක්‍රියාකාරකම | අනු ක්‍රියාකාරකම | භෞතික ප්‍රගතිය | මූල්‍ය (රු. මි.) |
| 1 | පොලිස් නිලධාරින් පරිසර නීතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව - මාතර හා අනුරාධපුර දිස්ත්‍රික්කය | | 2 | 0.2433 |
| 2 | අභියාචනා විභාග කිරීම | 1.1.ජාතික පාරිසරික පනත යටතේ අභියාචනා විභාග කිරීම | 116 | |
| | | 1.2. පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත යටතේ අභියාචනා විභාග කිරීම | 52 | |
| | | 1.3. ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත යටතේ අභියාචනා විභාග කිරීම | 28 | |
| | | 1.4. වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ පනත යටතේ අභියාචනා විභාග කිරීම | 145 | |
| 3 | අමාත්‍යාංශයට අදාල නඩු / මානව හිමිකම් නඩු සඳහා සහය දැක්වීම | | 27 | |
| 4 | පනත්/ගැසට් සකස් කිරීම සම්බන්ධ නිති කෙටුම්පත්/නීතිපති දෙපාර්තමේන්තුවට සහය වීම | | 17 | |
| 5 | අමාත්‍යාංශයට සම්බන්ධ ආයතන වලට අදාළ ගිවිසුම් සැකසීම/පරීක්ෂා කිරීම | | 59 | |
| 6 | මහජන පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම | | 99 | |





පොලිස් නිලධාරීන් සඳහා සංවිධානය කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්

# පාලන අංශය

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ පාලන අංශය, අමාත්‍යාංශයේ සාමාන්‍ය පරිපාලන කටයුතු සහ අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු, ආයතනවල පරිපාලන කටයුතු හා සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ලබයි. ඒ අනුව පහත සඳහන් කාර්යයන් මෙම අංශය විසින් ඉටු කරනු ලැබේ.

- අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ සහ නියෝජ්‍ය අමාත්‍ය කාර්ය මණ්ඩලයේ සියලුම පෞද්ගලික ලිපිගොනු සම්බන්ධ කටයුතු
- අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ නිවාඩු, දුම්රිය බලපත්‍ර හා වාර ප්‍රවේශපත්‍ර සම්බන්ධ කටයුතු
- අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ, නියෝජ්‍ය අමාත්‍ය කාර්ය මණ්ඩලයේ අතිකාල, නිවාඩු දින වැටුප් හා ගමන් වියදම් සම්බන්ධ කටයුතු
- අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩල තොරතුරු හා මු.රෙ 71 යටතේ තනතුරු අනුමත කර ගැනීම සම්බන්ධ කටයුතු
- සියලුම තනතුරුවලට අදාළ පුරප්පාඩු පිරවීම, බඳවා ගැනීම, පත්කිරීම, උසස්කිරීම, ස්ථාන මාරු ලබා දීම, විශ්‍රාම ගැන්වීම සම්බන්ධ කටයුතු
- කාර්ය මණ්ඩලයට අදාළ ආපදා ණය, දේපළ ණය ලබා දීම සම්බන්ධ කටයුතු
- අග්‍රහාර රක්ෂණ ක්‍රමයේ ප්‍රතිලාභ ලබා දීම සම්බන්ධ කටයුතු
- ප්‍රවාහන විෂයට අදාළ සියළුම රාජකාරී
- පාර්ලිමේන්තු ප්‍රශ්න, පාර්ලිමේන්තු කල් තැබීමේ යෝජනා, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග යටතේ ඉදිරිපත් වන ප්‍රශ්න සඳහා පිළිතුරු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සම්බන්ධ කටයුතු
- වාර්ෂික පාර්ලිමේන්තු අවසරපත්, පාර්ලිමේන්තුවේ පැවැත්වෙන රැස්වීම්/කමිටු සඳහා අමාත්‍යාංශයේ හා ආයතනවල නිලධාරීන්ගේ නම් පාර්ලිමේන්තුව වෙත යවා අවසර/ අවසරපත් ලබා ගැනීම
- අමාත්‍යාංශය හා යටතේ ඇති ආයතනවල අණපනත් නීති රෙගුලාසි ගැසට්, වාර්ෂික වාර්තා හා ගිණුම්, කාර්ය සාධන වාර්තා/ක්‍රියාකාරී සැලැස්ම පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ඉදිරිපත් කිරීම
- අමාත්‍යාංශයේ හා යටතේ ඇති දෙපාර්තමේන්තු, ආයතනවල නිලධාරීන් හට සහනදායි පදනම මත වාහන ආනයන බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු
- අමාත්‍යාංශයේ සියලුම නිලධාරීන්ගේ හැඳුනුම්පත් සකස් කිරීමේ කටයුතු
- අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ තැපැල් ඡන්ද සම්බන්ධ කටයුතු සහ මැතිවරණ රාජකාරී සඳහා නිලධාරීන්ගේ තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධ කටයුතු
- තොරතුරු පනත යටතේ අමාත්‍යාංශයට අදාළව තොරතුරු ඉදිරිපත් කිරීමේ කටයුතු
- අමාත්‍යාංශය හා යටතේ ඇති ආයතන සඳහා වාහන මිලදී ගැනීමට අදාළ ඉල්ලීම් සමාලෝචනය කර භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීම
- අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවල හා ආයතනවල කාර්ය මණ්ඩලය අනුමත කරවා ගැනීම, බඳවා ගැනීම් පරිපාටි අනුමැතියට ඉදිරිපත් කිරීම, පුරප්පාඩු පිරවීම සඳහා අනුමැතිය ලබා ගැනීම හා දීමනා ගෙවීම සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා යොමු කිරීම
- අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා ආයතනවල නිලධාරීන් සඳහා පෞද්ගලික විදේශ නිවාඩු සහ අතිරේක ඉන්ධන ප්‍රතිපූර්ණය සඳහා අනුමැතිය ලබා දීම
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සඳහා සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීම
- අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවල හා ආයතනවල සම්මුඛ පරීක්ෂණ සඳහා අමාත්‍යාංශ නියෝජිතයින් නම් කිරීම
- අමාත්‍යාංශයේ හා යටතේ ඇති දෙපාර්තමේන්තුවල හා ආයතනවල නිලධාරින් සම්බන්ධයෙන් මහජන පෙත්සම් කාරක සභාව වෙත වාර්තා ඉදිරිපත් කිරීම

**සේවා ස්ථිර කිරීම් 2018**

| | |
|---|---|
| දෙපාර්තමේන්තුගත විධායක | 18 |
| සංවර්ධන නිලධාරී | 04 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | 01 |
| ඒකාබද්ධ රියදුරු සේවය | 04 |

**උසස් කිරීම් 2018**

| | |
|---|---|
| සංවර්ධන නිලධාරී | - |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | 02 |
| ඒකාබද්ධ රියදුරු සේවය | 04 |
| කාර්යාල සේවක සේවය | - |

**විශ්‍රාම ගැන්වීම් 2018**

| | |
|---|---|
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | 02 |
| ඒකාබද්ධ රියදුරු සේවය | 01 |
| කාර්යාල සේවක සේවය | 01 |

**ණය ලබා දීම් 2018**

| | |
|---|---|
| ආපදා ණය | 122 |
| දේපළ ණය | 04 |

| | | |
|---|---|---|
| පෞද්ගලික විදේශ නිවාඩු | - | 192 |
| තැපැල් ඡන්ද සඳහා තොරතුරු ඉදිරිපත් කිරීම් | - | 185 |
| හැඳුනුම්පත් සකස් කිරීම් | - | 211 |
| පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීම් | - | 32 |
| අණපනත් නිති රෙගුලාසි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම් | - | 07 |
| වාර්ෂික වාර්තා හා කාර්ය සාධන වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම් | - | 04 |
| සහනදායී පදනම මත වාහන ආනයන බලපත්‍ර නිකුත් කිරීම් | - | 86 |
| අමාත්‍ය මණ්ඩල සංදේශ | - | 53 |
| තොරතුරු පනතට අදාළව පිළිතුරු යැවීම | - | 48 |

අනෙකුත් රාජකාරි සම්බන්ධයෙන් ලිපි ලැබෙන පිළිවෙල අනුව කටයුතු කරනු ලබන අතර, ප්‍රමාණාත්මක වශයෙන් ඉදිරිපත් කිරීම අපහසු වේ.

**වාහන සංචිතය කළමණාකරනය**

| අනු අංකය | වත්කම් වර්ගය | 2018.12.31 දිනට පැවති තත්ත්වය |
|---|---|---|
| 1. | කැබ් රථ | 27 |
| 2. | මෝටර් රථ | 28 |
| 3. | වෑන් | 03 |
| 4. | ජීප් | 14 |
| 5. | මෝටර් සයිකල් | 01 |
| එකතුව | | **73** |

2018 වර්ෂයේ වාහන අලුත්වැඩියා හා සේවා වාර ගණන - 282



# විමර්ශන අංශය

අමාත්‍යාංශයීය අංශ හා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක සියළුම ආයතනයන්ට අදාළව විමර්ශන සිදු කිරීම, ආයතනික මට්ටමෙන් පැමිණිලි සම්බන්ධව ක්‍රියාත්මකවීම පිළිබඳ අධීක්ෂණය හා සම්බන්ධීකරණය තුළින් අක්‍රමිකතා අවම කිරීම සඳහා විධිමත් ක්‍රියාවලියක් අඛණ්ඩව පවත්වා ගෙන යාම මෙම අංශයේ ප්‍රධාන කාර්ය භාරයයි. අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවලට අදාළ විමර්ශන සිදු කිරීම, පැමිණිලිවලට හේතු පාදක වන ගැටළු හඳුනාගැනීම, එම ගැටළු නැවත සිදුවීම වැළැක්වීමට නිර්දේශ ඉදිරිපත් කිරීම, විමර්ශනවලින් අනාවරණය වන තොරතුරු මත විනය ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ ලබාදීම, අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල පැමිණිලි සම්බන්ධව ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීම, ලැබෙන මහජන පැමිණිලිවලට සුදුසු විසඳුම් ලබාදීම සඳහා ආයතන සම්බන්ධීකරණය කිරීම විමර්ශන අංශයේ ප්‍රධාන වගකීම් වේ.

**එක් එක් ආයතනයට අදාළව 2018 වර්ෂය තුළ ලැබුණු පැමිණිලි හා ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු**

| ආයතනය | ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව | වාර්තා කැඳවීමට යොමු කළ සංඛ්‍යාව | පිළිතුරු ලැබී ඇති සංඛ්‍යාව | විමර්ශන සංඛ්‍යාව |
|---|---|---|---|---|
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | **74** | 67 | 38 | 07 |
| වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව | **08** | 08 | 03 | - |
| ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | **37** | 31 | - | 06 |
| මධ්‍යම පරිසර අධිකාරිය | **96** | 91 | 55 | 05 |
| ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය | **23** | 20 | 09 | 03 |
| සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය | **03** | - | - | 03 |
| භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය | **106** | 93 | 42 | 13 |
| රාජ්‍ය දැව සංස්ථාව | **11** | 07 | 04 | 04 |
| මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය | **01** | - | - | 01 |
| මෙම අමාත්‍යාංශයට අදාළව ලැබී ඇති පැමිණිලි | **01** | - | - | 01 |
| මොරගහකන්ද හා කළු ගඟ ව්‍යාපෘතිය | **41** | 39 | 20 | 02 |
| **එකතුව** | **401** | **356** | **171** | **45** |



# මානව සම්පත් සංවර්ධන අංශය

මානව සම්පත් සංවර්ධන අංශය දේශීය හා විදේශීය පුහුණු සඳහා අමාත්‍යාංශයේ සියළුම බාණ්ඩයන්ට අයත් නිලධාරීන් සහභාගී කරවන අතර, ඉහත කාල සීමාව තුළ පහත සඳහන් පරිදි දේශීය පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් 537ක් සහභාගී කරවා ඇත.

| | පුහුණු වැඩමුළු විස්තර | වැඩමුළු මඟින් පුහුණු කරන ලද නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | බැහැරගත පුහුණු වැඩමුළු (රියදුරු මහතුන්/ කාර්යාල කාර්ය සහායක නිලධාරීන්/ කළමනාකරණ සහකාර නිලධාරීන්/සංවර්ධන නිලධාරීන්, පර්යේෂණ සහකාර, වැඩසටහන් සහකාර/ මාණ්ඩලික නිලධාරීන්) | 107 |
| 02 | සේවාරම්භක පුහුණු වැඩමුළු (කාර්යාල කාර්ය සහායක නිලධාරීන්/කළමනාකරණ සහකාර නිලධාරීන්/සංවර්ධන නිලධාරීන්, පර්යේෂණ සහකාර, වැඩසටහන් සහකාර/ සහකාර අධ්‍යක්ෂ) | 38 |
| 03 | විෂයානුබද්ධ පුහුණු වැඩමුළු | 361 |
| 04 | දෙමළ භාෂා පුහුණු වැඩසටහන | 31 |
| | **එකතුව** | **537** |

ඒ අනුව, මෙම කාල සීමාව තුළ දේශීය පුහුණු වැඩසටහන් සඳහා මානව සම්පත් සංවර්ධන අංශය රු. 1,073,678.35 ක මුදලක් වැය දරා ඇත.









# අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විගණන අංශය

2018 වර්ෂයේ විගණන සැලසුමට අනුව සිදු කරන ලද විගණන පරීක්ෂණ පිළිබඳව විස්තර පහත පරිදි වේ.

| දිනය | විගණන පරීක්ෂණය |
|---|---|
| 2018.02.27 | වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් ව්‍යාපෘතියේ විගණන පරීක්ෂණය |
| 2018.03.02 | වවුචර් පරීක්ෂාව (මහවැලි) |
| 2018.03.02 | වවුචර් පරීක්ෂාව (පරිසර) |
| 2018.04.10 | මහවැලි ගංගා ද්‍රෝණිය ආශ්‍රිත ජනපදවල කෘෂිකාර්මික ප්‍රජාව දේශගුණික විපර්යාස වලට අනුහුරුකරවීමේ ව්‍යාපෘතිය |
| 2018.05.04 | ප්‍රවාහන අංශය පරීක්ෂාව (පරිසර) |
| 2018.05.17 | අභ්‍යන්තර විගණන පරීක්ෂාව - ජෛව විවිධත්ව අංශය |
| 2018.05.22 | වවුචර් හා තොග පොත් පරීක්ෂාව (පරිසර) |
| 2018.06.11 | පිළිසරු ව්‍යාපෘති පරීක්ෂාව I |
| 2018.06.19 | පිළිසරු ව්‍යාපෘති පරීක්ෂාව II |
| 2018.07.13 | උමා ඔය ව්‍යාපෘති කාර්යාලය පරීක්ෂා කිරීම |
| 2018.07.31 | වවුචර් පරීක්ෂාව (අප්‍රේල් - ජුනි) |
| 2018.09.12 | අත්තිකාරම් බී ගිණුම පරීක්ෂාව |
| 2018.09.27 | පරිසර දූෂණ පාලන හා රසායන ද්‍රව්‍ය කළමනාකරණ අංශය පරීක්ෂාව |
| 2018.09.27 | පාලන අංශය - පෞද්ගලික ලිපිගොනු, නිවාඩු පරීක්ෂාව |
| 2018.11.16 | දේශගුණ විපර්යාස අංශය පරීක්ෂාව |
| 2018.11.16 | අභ්‍යන්තර විගණන පරීක්ෂාව - භූමි සම්පත් අංශය |
| 2018.11.16 | අභ්‍යන්තර විගණන පරීක්ෂාව - වන සම්පත් අංශය |
| 2018.12.31 | පරිසර සැලසුම් හා ආර්ථික අංශය - ESA ව්‍යාපෘතිය |
| 2018.12.31 | වායු සම්පත් කළමනාකරණ හා ජාතික ඕසෝන් ඒකකය |

2018 අභ්‍යන්තර විගණන සැලැස්මට අමතරව සිදු කරන ලද විගණන පරීක්ෂණයන්

| දිනය | විගණන පරීක්ෂණය |
|---|---|
| 2018.07.05 | ඝණ අපද්‍රව්‍ය බැහැරලීමේ ව්‍යාපෘතිය CSDF |
| 2018.09.03 | ජෛවවිවිධත්ව අංශය විසින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හරහා සිදු කරනු ලබන ව්‍යාපෘති වලට අදාළ වවුචර් පරීක්ෂා කිරීම |
| 2018.10.11 | වැව්ගම් පුබුදුව ව්‍යාපෘතිය පරීක්ෂා කිරීම |

2018 වර්ෂය තුළ දී සිදු කරන ලද විශේෂ විමර්ශනයන්

- රජයේ මුදල් හා දේපල වංචා කිරීම සම්බන්ධව ( මහවැලි ක්‍රීඩා මුදල් වංචාව සම්බන්ධ පරීක්ෂණය)
- ගිණුම් නිලධාරී තනතුර නොලැබීම සම්බන්ධව විමර්ශනය
- තලාව මහවැලි H කලාපයේ වාරි අංශයේ සිදු වී ඇති දූෂණ ක්‍රියා පිළිබඳව විමර්ශනය
- 2018 වර්ෂයේදී මහවැලි අංශය හා පරිසර අංශය සඳහා විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 08ක් පැවැත්වීම

# ඉඩම් අංශය

- මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය, උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය, මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන යටතේ ඉහළ ඇළහැර ව්‍යාපෘතිය යන ව්‍යාපෘති සඳහා ඉඩම් අත්කර ගැනීමේ කටයුතු සහ වන්දි ගෙවීමේ කටයුතු
- බී, සී, ඩී, එච්, වික්ටෝරියා, හුරුළුවැව, මොරගහකන්ද, වලව, රඹකැන්ඔය යන මහවැලි කලාපයන්හි ජනපදිකයින් වෙත රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීමනාපත්‍ර ලබා දීම
- මහවැලි කලාප තුළ සුළු හා මහා පරිමාණ ආයෝජන ව්‍යාපෘති සඳහා ඉඩම් බැහැර කිරීම.
- ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය බල ප්‍රදේශ තුළ ගොවි ජනතාව වෙත ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍ර ලබා දීම.
- ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය බල ප්‍රදේශ තුළ පිහිටි බෞද්ධ විහාරස්ථාන සහ අනෙකුත් පූජනීය ස්ථාන සඳහා නිදහස් දීමනාපත්‍ර ලබා දීම.

**ඉඩම් හිමිකම්පත් ප්‍රදානය 2018**

| කලාපය | ඉලක්කය (2018) | ප්‍රගතිය (2018.12.31) |
|---|---|---|
| බී කලාපය | 9,174 | 8, 250 |
| සී කලාපය | 8,440 | 8,450 |
| ඩී කලාපය | 1,998 | 1990 |
| එච් කලාපය | 5,230 | 4,240 |
| වික්ටෝරියා | 920 | 255 |
| හුරුළුවැව කලාපය | 1,302 | 1,300 |
| මොරගහකන්ද කලාපය | 1,857 | 1,857 |
| වලව | 8,570 | 8,580 |
| රඹකැන්ඔය | 1,500 | 1,500 |
| එකතුව | **41,741** | **39,172** |

# ඉංජිනේරු, තාක්ෂණ සේවා හා ප්‍රසම්පාදන අංශය

මෙම අංශයේ ප්‍රධාන විෂයන්ට අදාළව සිදුකරන ලද කාර්යයන් පහතින් දක්වා ඇත.

- මෙම අමාත්‍යාංශය අදාල අමාත්‍ය මණ්ඩලය පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටු රැස්වීම් පවත්වා අදාළ තීරණ ගැනීම් 29 ක් සිදු කර ඇත.
- අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටු රැස්වීම් පවත්වා අදාළ තීරණ ගැනීම් 9 ක් සිදු කර ඇත.
- අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යාපෘති සඳහා තාක්ෂණ ඇගැයීම් කමිටු රැස්වීම් පවත්වා අදාළ නිර්දේශ ලබා දීම් 55 ක් සිදුකර ඇත.
- ව්‍යාපෘති හා තාක්ෂණික කටයුතු වලට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ 8 ක් සකස් කර අනුමැතියට ඉදිරිපත් කර ඇත.
- අමාත්‍යාංශය යටතේ ඇති රාජ්‍ය ආයතන, දෙපාර්තමේන්තු වල හා ව්‍යාපෘතිවල ප්‍රසම්පාදන කමිටු වල නියෝජිතයෙකු ලෙස සහභගි වී තීරණ 480 ක් ලබා ගැනීමට දායකත්වය දී ඇත.
- උමාඔය බහුකාර්යය සංවර්ධන ව්‍යාපෘතිය, මොරගහකන්ද කළුගග සංවර්ධන ව්‍යාපෘතිය, මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන ආදියෙහි වීසා බලපත්‍ර ලබාදීම්වලට අදාළ නිර්දේශ 130 ලබා දී ඇති අතර, ඒවායෙහි ආනයන අපනයන බලපත්‍රවලට නිර්දේශ ලබාදීම් 210 සිදුකර ඇත.
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතන හා ව්‍යාපෘතිවල නිලධාරීන් / සේවකයන් බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ සඳහා නියෝජිතයෙකු ලෙස 25 වතාවක් සහභාගි වී ඇත.
- භාණ්ඩාගාරය, අනෙකුත් රාජ්‍ය ආයතන සමග තාක්ෂණික කටයුතු සඳහා අමාත්‍යාංශ නියෝජිතයෙකු වශයෙන් 12 වතාවක් සම්බන්ධ වී ගැටළු නිරාකරණය කර ගැනීමට සහය වීම.
- අමාත්‍යාංශය හා ඊට අදාළ සියලුම ආයතන වල ක්‍රියාත්මක වන ව්‍යාපෘති වල කොන්ත්‍රාත් කළමනාකරණ කටයුතුවලදී අමාත්‍යාංශයෙන් සිදුවිය යුතු කාර්යය භාර්යයන් සාර්ථකව නිම කර ඇත.




# ජල සම්පත් සැලසුම් අංශය

**උමා ඔය බහුකාර්යය සංවර්ධන ව්‍යාපෘතිය.**
විශේෂ ප්‍රගති සමාලෝචන රැස්වීම් වලට සහභාගි වීම. (CECB ආයතනයේ පවත්වන ලද රැස්වීම් 20කට පමණ සහභාගී වීම)

**තාක්ෂණික කමිටු සඳහා සහභාගීත්වය**
වාරිමාර්ග දෙපාර්තමේන්තුව, මහවැලි අධිකාරිය, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය යන ආයතන ජල සම්පත් සංවර්ධනය කිරිම සඳහා අදාළ සාකච්ඡා සඳහා සහභාගී විම, තාක්ෂණික කමිටු සඳහා සහභාගී වීම.

**යෝජිත උතුරු මැද පළාත් ඇළට සමගාමීව සංවර්ධනය කිරිමට යෝජිත එල්ලංගා පද්ධති සැලැස්ම අධ්‍යයනය කිරිම හා JICA ආයතනය සමඟ කටයුතු කර ශක්‍යතා අධ්‍යයනය අවසන් කිරිම.**

- සම්බන්ධිත ආයතන සමඟ ව්‍යාපෘති යෝජනා පිළිබඳ සාකච්ඡා කිරිම.
- සියලුම සම්බන්ධිත ආයතනය වෙත ව්‍යාපෘති වාර්තාවන් යොමු කිරිම.

**"යාපනයට ගඟක් " යෝජනාව**

- නෙදර්ලන්ත විශේෂඥවරුන් සමඟ සාකච්ඡා කිරිම, සහ ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනයන් සිදු කිරිම
- සම්බන්ධිත ආයතන සමඟ සාකච්ඡා පැවැත්වීම
- මහවැලි උපදේශන කාර්යාංශය සමඟ සාකච්ඡා කොට, තවත් වෙනම ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරිම

**මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන**

- ජල සැපයිම් වලට අදාළව මහජන යෝජනා හා ඉල්ලීම් පිළිබඳව අධ්‍යයනය සිදු කිරිම
- නව ඉල්ලීම් වලට අනුව ජලය ලබා දිමට ඇති හැකියාව අධ්‍යයනය කිරිම සඳහා එම ඉල්ලීම් උපදේශකවරුන් හට යොමු කිරිම
- මහවැලි ගංගා ද්‍රෝණිය සඳහා ජල තුලන අධ්‍යයනයක් සිදු කිරිම

**ජල සම්පත් සැලසුම් හා සංවර්ධනයට අදාළ ක්ෂේත්‍ර චාරිකා සිදු කිරිම හා සාකච්ඡා පැවැත්විම**

ජාතික පාරිසරික ප්‍රතිපත්තිය සැකසීම සඳහා වන සාකච්ඡා වාර සඳහා සහභාගී විම, පාරිසරික ප්‍රතිපත්තියට අනුරූපව ජල ප්‍රතිපත්ති සංකල්ප ලේඛණය සකස් කර පාරිසරික ප්‍රතිපත්ති යෝජකයන් වෙත ලබා දිම.

# V වන කොටස

## පුනරුදය පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන

පුනරුදය පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන 2018 යටතේ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය වෙත ජනාධිපති ලේකම් කාර්යාලය මගින් රු. 108,789,219 ක ප්‍රතිපාදන මුදලක් ලද අතර, අමාත්‍යාංශය යටතේ ඇති ආයතන හා අංශයන්ගේ මගින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

| ක්‍රියාත්මක ආයතන හා අංශ | වෙන්කල ප්‍රතිපාදන මුදල |
|---|---:|
| අධ්‍යාපන පුහුණු හා පර්යේෂණ අංශය | 15,250,000 |
| මධ්‍යම පරිසර අධිකාරිය | 88,463,993 |
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 3,065,226 |
| ජෛව විවිධත්ව අංශය | 2,010,000 |
| එකතුව | 108,789,219 |

## අධ්‍යාපන පුහුණු හා පර්යේෂණ අංශය

**පරිසර අධ්‍යාපනය පිළිබඳ නව විෂය නිර්දේශයට අනුකූලව රජයේ පාසල් ගුරුභවතුන් දැනුවත් කිරීමේ ව්‍යාපෘතිය**



රජයේ පාසල් වලට අනුයුක්තව 6 – 11 ශ්‍රේණි වල විද්‍යා විෂය ධාරාව ඉගැන්වීම් සිදු කරනු ලබන ගුරුභවතුන් 13,000ක් පමණ මේ වන විට දිවයින පුරා විසිරී සිටිති. මෙයින් ගුරුවරුන් 10,000 ක් පුහුණු කිරීම ඉලක්ක කර ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි. 2016 වර්ෂයේදී හඳුන්වාදෙනු ලැබූ විද්‍යා විෂයය නිර්දේශය තුළට පරිසර විෂයය ඇතුළත් කරනු ලැබූ අතර, මෙම විද්‍යා ගුරුභවතුන් පරිසර විෂයය සම්බන්ධයෙන් දැනුවත් කිරීම තුලින් සිසු දරුවන්ගේ පරිසර සංවේදීතාව ඉහළ නැංවීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. මේ සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයෙහි "පුනරුදය" ජාතික පරිසර සංරක්ෂණ වැඩසටහන යටතේ ප්‍රතිපාදන ලබා දෙන අතර 2018 වර්ෂය තුළදී වැඩමුළු 15 ක් පවත්වා ගුරුවරුන් 1,752 දෙනෙකු සාර්ථකව පුහුණු කිරීමට හැකි විය. මෙම ගුරුභවතුන් වෙත ලබා දීම සඳහා ගුරු උපදේශන අත්පොතෙහි දෙවන මුද්‍රණයද සිදු කරන ලදී.



## මධ්‍යම පරිසර අධිකාරිය

2018 වර්ෂයේදී පහත ව්‍යාපෘතීන් 07 පුනරුදය වැඩසටහන යටතේ සාර්ථකව නිම කරන ලදී.

**පරිසර නියමු හා ළමා සමාජ වැඩසටහන ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය නිෂ්පාදනය (හිස්වැසුම්, පරිසර නියමු පදක්කම්, සටහන් පොත්)**

මෙම වැඩසටහන සමස්ථ දිවයිනෙහිම පාසල් පද්ධතිය ආවරණය වන පරිදි ක්‍රියාත්මක කරන ලද අතර පරිසර හිතකාමී අනාගත පරපුරක් බිහි කිරීම මෙහි අභිමතාර්ථය වේ. ඒ යටතේ පරිසර නියමු හිස්වැසුම් 76,200 ක්, පරිසර නියමු සටහන් පොත් 37,000ක්, පරිසර නියමු සහතික ධජ 1000 ක්, පරිසර ළමා සමාජ මාර්ගෝපදේශ සංග්‍රහ 2000 ක්, පරිසර නියමු සහතික පත්‍ර 161,000 ක් හා පරිසර නියමු පදක්කම් 81,650 ක් නිෂ්පාදනය කරන ලදී.



**ජාතික පරිසර නියමු කඳවුර පැවැත්වීම**

පරිසර නියමු වැඩසටහනේ ස්වර්ණ පදක්කම්ලාභීන් ජාතික කඳවුර සඳහා තෝරාගන්නා ලදී. මෙවර ජාතික පරිසර නියමු කඳවුර ත්‍රිකුණාමලයේ "සාගරිකා" නාවික හමුදා කඳවුරේදී

2018.09.19 සිට 22 යන දිනයන් හිදී මුළු දිවයිනම ආවරණය වන පරිදි පාසල් 57ක සහභාගිත්වයෙන් පවත්වන ලදී. මෙම කඳවුර සඳහා සහභාගි වූ මුළු ප්‍රමාණය 606ක් වූ අතර පරිසර නියමුන් 340ක් හා පරිසර නියමු වැඩසටහන ක්‍රියාත්මක වන පාසල් වල ගුරුවරුන් 70ක් මේ සඳහා සහභාගි විය.

**පරිසර නියමු ජනාධිපති පදක්කම් ක්‍රියාවලිය පිළිබඳ සකස් කරනු ලබන මාර්ගෝපදේශ සංග්‍රහය**

මෙම මාර්ගෝපදේශ සංග්‍රහය යාවත්කාලීන කර සිංහල පිටපත් 400කින් හා දමිළ පිටපත් 200කින් මුද්‍රණය කරන ලදී.

**පරිසර නියමු ජනාධිපති පදක්කම් අපේක්ෂකයන් වෙනුවෙන් පවත්වන පරිසර අධ්‍යාපන වැඩසටහන**



මෙම වැඩසටහන පරිසර නියමු පදක්කම් ක්‍රියාවලියේ සිව්වන පදක්කම වන ස්වර්ණ පදක්කම්ලාභි පරිසර නියමුවන් ජනාධිපති පරිසර පදක්කම සඳහා සූදානම් කරවන ප්‍රායෝගික හා න්‍යායාත්මක වැඩසටහනකි. මෙම වැඩසටහන ඌව පළාත, සබරගමුව පළාත, වයඹ පළාත, කොළඹ දිස්ත්‍රික්කය හා පුත්තලම දිස්ත්‍රික්කය ආවරණය වන පරිදි ස්වර්ණ පදක්කම්ලාභීන් 650කගේ සහ ප්‍රාදේශිය නිලධාරින්, ගුරුභවතුන් 100කගේ සහභාගීත්වයෙන් සාර්ථකව පවත්වන ලදී.

**මධ්‍යම පරිසර අධිකාරියේ හා පළාත් කාර්යාල වල පරිසර ප්‍රදර්ශන ඒකකය ශක්තිමත් කිරීම**

පරිසර සංවේදීතාව හා පරිසර සංරක්ෂණ සම්බන්ධ දැනුවත් භාවය ඉහල නැංවීම අරමුණු කොට ගනිමින් පහත සඳහන් ප්‍රදර්ශන භාණ්ඩ සබරගමුව, උතුර හා දකුණු පළාත් කාර්යාලවල පරිසර ප්‍රදර්ශන ඒකකය ශක්තිමත් කිරීම සඳහා ලබාදෙන ලදී.

- 4 Flex Backdrop
- 4 CEA Name board
- 4 Eco board Tree Structures
- 27 Pull up stand flex banners
- 4 Television (Size 43")

**මහජන පුස්තකාල හරහා පාරිසරික දැනුම ව්‍යාප්ත කිරීම**

මෙම වැඩමුළුව 2018.10.26වන දින මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලදී ඒ අනුව බස්නාහිර පළාත නියෝජනය කරමින් කොළඹ කළුතර හා ගම්පහ යන දිස්ත්‍රික්කයන්හි මහජන පුස්තකාලහාර නිලධාරීන් 190 දෙනෙකු සහභාගී විය. එහිදී පාරිසරික තොරතුරු ඇතුළත් පොස්ටර් භාෂා 03න්ම සකස් කර බෙදා දෙන ලදී.

**ගම්පහ දිස්ත්‍රික් ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය - කොම්පෝස්ට් අංගනය ඉදි කිරීම**

දිනකට15MT ධාරිතාවයකින් යුත් කොම්පෝස්ට් අංගනයේ ඉදිකිරීම් අවසන් කර ඇති අතර 2019 02.05. දින වන විට මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට නියමිතය.



## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

පුනරුදය පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන යටතේ 2018 වර්ෂයේදී කන්දේතැන්න හෙක්.01ක නව වන වගාවක් ස්ථාපිත කිරීමත් වන සංරක්ෂණ දෙපාර්තමේන්තු විසින් 2017 ස්ථාපිත වන වගාව නඩත්තු කිරීමත් සිදු කරන ලදී. තවද ජාතික වන රෝපා වැඩසටහන යටතේ මන්නාරම දිස්ත්‍රික්කයේ මඩුපාර අඩවිය, තම්පනිකුලම් යන ප්‍රදේශයේ නව වන වගාවන් ස්ථාපනය කිරීමට සිදු කෙරිනි.

## ජෛවවිවිධත්ව අංශය

කෑගල්ල කලාප අධ්‍යාපන කාර්යාලය මගින් කරන ලද ඉල්ලීමකට අනුව තෝරාගත් පාසල් 5ක අධ්‍යාපන කටයුතු සඳහා සමනල උයන් 5ක් ස්ථාපිත කිරීම.

- කෑගල්ල බාලිකා මහා විද්‍යාලය
- කෑගල්ල/ වර/ ඩඩ්ලි සේනානායක මහා විද්‍යාලය
- කෑගල්ල/දැදි/ පැරකුම්බා මහා විද්‍යාලය
- කෑගල්ල බොස්සැල්ල මහා විද්‍යාලය
- කෑගල්ල/ කහබිලියාව මහා විද්‍යාලය



**ප්‍රජා සහභාගිත්වයෙන් පරාගවාහක ජීවී විශේෂ සංරක්ෂණය කිරීමේ වැඩසටහන**

පොල් වගාව තුල මී මැසි පාලනය ප්‍රචලිත කිරීම තුලින් ශ්‍රී ලංකාවට ආවේණික පරාගවාහකයින් සංරක්ෂණය කිරීම සහ එතුලින් තිරසාර පොල් අස්වැන්නක් කරා ළගාවීම අරමුණු කරගනිමින් මෙම වැඩසටහන මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය සහ පොල් වගා කිරීමේ මණ්ඩලය ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබයි.



වැඩසටහන සඳහා තෝරා ගනු ලැබූ ක්ෂේත්‍ර සහ ඉලක්කගත කණ්ඩායම - කුරුණෑගල දිස්ත්‍රික්කය - යක්විල සහ වෙල්පල්ල පොල් සංවර්ධන නිළධාරී කොට්ඨාශ

ගම්පහ දිස්ත්‍රික්කය- ඌරාපොළ හා වැකේ පොල් සංවර්ධන නිළධාරී කොට්ඨාශ- ක්ෂේත්‍ර අධ්‍යනය හා ප්‍රායෝගිකව දැනුවත් කිරීම දෙසැම්බර් 06 වන දින පවත්වන ලදි.

නඩත්තුව පිළිබඳ පුහුණු වැඩසටහන්වලින් අනතුරුව මී මැසි ජනපද සහිත පෙට්ටි ඔවුන් වෙත ලබාදීම සිදු කරන ලද අතර මේ පිළිබඳව පසුවිපරම් ඉදිරියේදී සිදු කෙරෙනු ඇත.

පරාගකාරක සංරක්ෂණය පිළිබඳ එක් දින වැඩමුළුවක් ප්‍රායෝගික පුහුණුව සහිතව 2018.12.14 දින මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ශ්‍රවණාගාරයේදී සිදු කරන ලදි.

අතරමැදි කලාපීය සමනල විශේෂයන් වර්ගීකරණය සහ ක්ෂේත්‍රයේදී හදුනාගැනීම තුලින් එම කලාපය තුළ සමනල සංරක්ෂණයට ප්‍රමුඛතාවය ලබාදී ජෛවවිවිධත්ව සංරක්ෂණය කිරීම අරමුණු කරගනිමින් ඌව පලාතේ වන සංරක්ෂණ, වනජීවී සංරක්ෂණ, මධ්‍යම පරිසර අධිකාරිය මෙන්ම පලාත් පරිසර නිළධාරීන් සහ විශ්ව විද්‍යාල සිසුන් සඳහා දෙදින නේවාසික පුහුණු වැඩමුළුවක් 2018 නොවැම්බර් 1,2 දිනවල හල්දුම්මුල්ල ආයුර්වේද පර්යේෂණ ඔසු උයන පරිශ්‍රයේදී පවත්වනු ලැබීය.



# VI වන කොටස

## මූල්‍ය විශ්ලේෂණය සහ ගිණුම් සාරාංශය

## මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය – 160

| වැඩ සටහන හා ව්‍යාපෘතිය | පුනරාවර්තන වියදම් | | | ප්‍රාග්ධන වියදම් | | |
|---|---|---|---|---|---|---|
| | වෙන් කිරීම් (රු.) | වියදම (රු.) | % | වෙන් කිරීම් (රු.) | වියදම (රු.) | % |
| වැඩ සටහන 01 | | | | | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් | | | | | | |
| ව්‍යාපෘතිය 01 | | | | | | |
| අමාත්‍ය කාර්යාලය | 40,550,000.00 | 33,625,841.58 | 82.9 | 3,585,000.00 | 2,698,288.70 | 75.3 |
| ව්‍යාපෘතිය 11 | | | | | | |
| රාජ්‍ය අමාත්‍ය කාර්යාලය | 21,179,000.00 | 14,705,679.02 | 69.4 | 3,671,000.00 | 3,394,885.17 | 92.5 |
| ව්‍යාපෘතිය 02 | | | | | | |
| අමාත්‍යාංශ පරිපාලනය | 310,350,000.00 | 291,443,419.35 | 93.9 | 18,715,000.00 | 17,065,259.52 | 91.2 |
| වැඩ සටහන 02 | | | | | | |
| ව්‍යාපෘතිය 03 | | | | | | |
| පරිසර සංරක්ෂණය | | | | 1,708,937,250.00 | 1,491,343,430.13 | 87.3 |
| ව්‍යාපෘතිය 04 | | | | | | |
| රාජ්‍ය ආයතන | 3,523,000,000.00 | 3,489,050,840.00 | 99.0 | 1,782,500,000.00 | 1,293,933,537.00 | 72.6 |
| ව්‍යාපෘතිය 05 | | | | | | |
| මහවැලි සංවර්ධනය | | | | 36,157,476,750.00 | 31,308,806,030.56 | 86.6 |
| උප එකතුව | | | | | | |
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව - 283 | 1,400,554,000.00 | 1,323,970,895.92 | 94.5 | 913,600,000.00 | 911,947,526.02 | 99.8 |
| වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව - 291 | 127,350,000.00 | 124,903,101.89 | 98.1 | 1,367,620,000.00 | 448,835,549.46 | 32.8 |
| එකතුව | 5,422,983,000.00 | 5,277,699,777.76 | 97.3 | 41,956,105,000.00 | 35,478,024,506.56 | 84.6 |

**පුනරාවර්තන වියදම් -2018**

වියදම් ශීර්ෂය -160- මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

වැඩ සටහන් අංක : 1 - මෙහෙයුම් වැඩසටහන

ව්‍යාපෘති 01- අමාත්‍ය කාර්යාලය

| වැය ශීර්ෂ අංකය | මූල්‍ය කරනය | කාණ්ඩය/වැය ශීර්ෂය/ අයිතමය/ විස්තරය | වෙන් කිරීම් (රු.) | ශුද්ධ වියදම (රු.) | % |
|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන වියදම් | **40,550,000.00** | **33,625,841.58** | 82.9 |
| | | පුද්ගල පඩිනඩි | 207,000,000.00 | 18,017,170.75 | 8.7 |
| 1001 | 11 | වැටුප් හා වේතන | 12,750,000.00 | 10,810,305.57 | 84.8 |

| වැය ශීර්ෂ අංකය | මූල්‍ය කරනය | කාණ්ඩය/වැය ශීර්ෂය/ අයිතමය/ විස්තරය | වෙන් කිරීම් (රු.) | ශුද්ධ වියදම (රු.) | % |
|---|---|---|---|---|---|
| 1002 | 11 | අතිකාල | 1,700,000.00 | 1,567,824.23 | 92.2 |
| 1003 | 11 | වෙනත් දීමනා | 6,250,000.00 | 5,639,040.95 | 90.2 |
| | | **ගමන් වියදම්** | 2,750,000.00 | 728,735.75 | 26.5 |
| 1101 | 11 | දේශීය | 750,000.00 | 606,856.75 | 80.9 |
| 1102 | 11 | විදේශීය | 2,000,000.00 | 121,879.00 | 6.1 |
| | | **සැපයීම්** | 6,500,000.00 | 5,784,525.17 | 89.0 |
| 1201 | 11 | කාර්යාලීය උපකරණ | 1,500,000.00 | 1,439,566.75 | 96.0 |
| 1202 | 11 | ඉන්ධන | 5,000,000.00 | 4,344,956.42 | 86.9 |
| 1203 | 11 | අහාර සහ නිල ඇඳුම් | | | |
| | | **නඩත්තු වියදම්** | 6,100,000.00 | 5,999,299.21 | 98.3 |
| 1301 | 11 | වාහන | 6,000,000.00 | 5,908,771.21 | 98.5 |
| 1302 | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 100,000.00 | 90,528.00 | 90.5 |
| 1303 | 11 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | | | |
| | | **සේවා** | 4,500,000.00 | 3,096,110.70 | 68.8 |
| | | ප්‍රවාහන | 900,000.00 | 718,387.10 | 79.8 |
| 1402 | 11 | තැපැල් හා සන්නිවේදන | 1,000,000.00 | 611,460.81 | 61.1 |
| 1403 | 11 | විදුලිය හා ජලය | 1,400,000.00 | 776,599.53 | 55.5 |
| 1404 | 11 | බදු කුලී සහ පළාත් පාලනආයතන බදු | 200,000.00 | - | 0.0 |
| 1409 | 11 | වෙනත් | 1,000,000.00 | 989,663.26 | 99.0 |

**මූලධන වියදම් - 2018**

වියදම් ශීර්ෂය -160- **මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය**

වැඩ සටහන් අංක : 1 - මෙහෙයුම් වැඩසටහන

ව්‍යාපෘති 01- අමාත්‍ය කාර්යාලය

| වැය ශීර්ෂ අංකය | මූල්‍ය කරනය | කාණ්ඩය/වැය ශීර්ෂය/ අයිතමය/ විස්තරය | වෙන් කිරීම් (රු.) | ශුද්ධ වියදම (රු.) | % |
|---|---|---|---|---|---|
| | | මූලධන වියදම් | **3,585,000.00** | **2,698,286.70** | 75.3 |
| | | මූලධන වත්කම්වල පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 2,900,000.00 | 2,050,726.70 | 70.7 |
| 2001 | 11 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 250,000.00 | | 0.0 |
| 2002 | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 300,000.00 | - | 0.0 |
| 2003 | 11 | වාහන | 2,350,000.00 | 2,050,726.70 | 87.3 |
| | | මූලධන වත්කම් අත්පත්කර ගැනීම | 685,000.00 | 647,560.00 | 94.5 |
| 2101 | 11 | වාහන | | - | |
| 2102 | 11 | ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 25,000.00 | 14,800.00 | 59.2 |
| 2103 | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 660,000.00 | 632,760.00 | 95.9 |

**පුනරාවර්තන වියදම් -2018**

**වියදම් ශීර්ෂය -160- මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය**

වැඩ සටහන් අංක : 1 - මෙහෙයුම් වැඩසටහන

ව්‍යාපෘති 01- රාජ්‍ය අමාත්‍ය කාර්යාලය

| වැය ශීර්ෂ අංකය | මූල්‍ය කරනය | කාණ්ඩය/වැය ශීර්ෂය/ අයිතමය/ විස්තරය | වෙන් කිරීම් (රු.) | ශුද්ධ වියදම (රු.) | % |
|---|---|---|---|---|---|
| | | **පුනරාවර්තන වියදම්** | **21,179,000.00** | **14,705,679.02** | 69.4 |
| | | **පුද්ගල පඩිනඩි** | 10,250,000.00 | 7,190,063.37 | 70.1 |
| 1001 | 11 | වැටුප් හා වේතන | 6,450,000.00 | 4,697,030.73 | 72.8 |
| 1002 | 11 | අතිකාල | 1,200,000.00 | 834,165.00 | 69.5 |
| 1003 | 11 | වෙනත් දීමනා | 2,600,000.00 | 1,658,867.64 | 63.8 |
| | | **ගමන් වියදම්** | 1,660,000.00 | 618,634.50 | 37.3 |
| 1101 | 11 | දේශීය | 660,000.00 | 618,634.50 | 93.7 |
| 1102 | 11 | විදේශීය | 1,000,000.00 | - | 0.0 |
| | | **සැපයීම්** | 3,990,000.00 | 2,845,997.23 | 71.3 |
| 1201 | 11 | කාර්යාලීය උපකරණ | 1,350,000.00 | 785,671.05 | 58.2 |
| 1202 | 11 | ඉන්ධන | 2,590,000.00 | 2,060,326.18 | 79.5 |
| 1203 | 11 | අහාර සහ නිල ඇඳුම් | 50,000.00 | | 0.0 |
| | | **නඩත්තු වියදම්** | 2,370,000.00 | 1,804,400.91 | 76.1 |
| 1301 | 11 | වාහන | 2,000,000.00 | 1,684,225.91 | 84.2 |
| 1302 | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 270,000.00 | 89,850.00 | 33.3 |
| 1303 | 11 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 100,000.00 | 30,325.00 | 30.3 |
| | | **සේවා** | 2,909,000.00 | 2,246,583.01 | 77.2 |
| | | ප්‍රවාහන | 200,000.00 | - | 0.0 |
| 1402 | 11 | තැපැල් හා සන්නිවේදන | 879,000.00 | 416,583.01 | 47.4 |
| 1403 | 11 | විදුලිය හා ජලය | 1,080,000.00 | 1,080,000.00 | 100.0 |
| 1409 | 11 | වෙනත් | 750,000.00 | 750,000.00 | 100.0 |

**මූලධන වියදම් - 2018**

**වියදම් ශීර්ෂය -160- මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය**

වැඩ සටහන් අංක : 1 - මෙහෙයුම් වැඩසටහන

ව්‍යාපෘති 01- රාජ්‍ය අමාත්‍ය කාර්යාලය

| වැය ශීර්ෂ අංකය | මූල්‍ය කරනය | කාණ්ඩය/වැය ශීර්ෂය/ අයිතමය/ විස්තරය | වෙන් කිරීම් (රු.) | ශුද්ධ වියදම (රු.) | % |
|---|---|---|---|---|---|
| | | **මූලධන වියදම්** | **3,671,000.00** | **2,698,286.70** | 73.5 |
| | | මූලධන වත්කම්වල පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 2,671,000.00 | 2,050,726.70 | 76.8 |
| 2001 | 11 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 1,071,000.00 | | 0.0 |
| 2002 | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 100,000.00 | - | 0.0 |
| 2003 | 11 | වාහන | 1,500,000.00 | 2,050,726.70 | 136.7 |
| | | මූලධන වත්කම් අත්පත්කර ගැනීම | 1,000,000.00 | 647,560.00 | 64.8 |
| 2101 | 11 | වාහන | | - | |
| 2102 | 11 | ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 325,000.00 | 14,800.00 | 4.6 |
| 2103 | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 675,000.00 | 632,760.00 | 93.7 |

**පුනරාවර්තන වියදම් -2018**

**වියදම් ශීර්ෂය -160- මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය**

වැඩ සටහන් අංක : 1 - මෙහෙයුම් වැඩසටහන

ව්‍යාපෘති 02: පරිපාලන හා ආයතනික සේවා

| වැය ශීර්ෂ අංකය | මූල්‍ය කරනය | කාණ්ඩය/වැය ශීර්ෂය/ අයිතමය/ විස්තරය | වෙන් කිරීම් (රු.) | ශුද්ධ වියදම (රු.) | % |
|---|---|---|---|---|---|
| | | **පුනරාවර්තන වියදම්** | **310,350,000.00** | **291,443,419.35** | 93.9 |
| | | **පුද්ගල පඩිනඩි** | 188,320,000.00 | 171,675,632.64 | 91.2 |
| 1001 | 11 | වැටුප් හා වේතන | 118,600,000.00 | 116,286,916.24 | 98.0 |
| 1002 | 11 | අතිකාල | 7,700,000.00 | 7,264,684.03 | 94.3 |
| 1003 | 11 | වෙනත් දීමනා | 62,020,000.00 | 48,124,032.37 | 77.6 |
| | | **ගමන් වියදම්** | 3,600,000.00 | 3,400,566.53 | 94.5 |
| 1101 | 11 | දේශීය | 1,600,000.00 | 1,450,458.75 | 90.7 |
| 1102 | 11 | විදේශීය | 2,000,000.00 | 1,950,107.78 | 97.5 |
| | | **සැපයීම්** | 18,850,000.00 | 18,578,638.63 | 98.6 |
| 1201 | 11 | කාර්යාලීය උපකරණ | 6,400,000.00 | 6,274,735.41 | 98.0 |
| 1202 | 11 | ඉන්ධන | 12,200,000.00 | 12,065,173.32 | 98.9 |
| 1203 | 11 | ආහාරපාන හා නිල ඇඳුම් | 250,000.00 | 236,729.90 | 94.7 |
| | | **නඩත්තු වියදම්** | 14,800,000.00 | 14,427,830.33 | 97.5 |
| 1301 | 11 | වාහන | 12,300,000.00 | 12,245,347.20 | 99.6 |
| 1302 | 11 | යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ | 2,200,000.00 | 2,106,981.13 | 95.8 |
| 1303 | 11 | ගොඩනැගිලි හා ඉදි කිරීම් | 300,000.00 | 75,502.00 | 25.2 |
| | | **සේවා** | 48,100,000.00 | 47,728,134.21 | 99.2 |
| 1401 | 11 | ප්‍රවාහන | 5,100,000.00 | 4,689,134.73 | 91.9 |
| 1402 | 11 | තැපැල් හා සන්නිවේදන | 11,500,000.00 | 10,932,838.80 | 95.1 |
| 1403 | 11 | විදුලිය හා ජලය | 16,000,000.00 | 15,819,106.96 | 98.9 |
| 1404 | 11 | බදු කුලී හා පළාත් පාලන ආයතන බදු | | | |
| 1405 | 11 | වෙනත් | 16,500,000.00 | 16,287,053.72 | 98.7 |
| | | **මාරු කිරීම්** | 35,580,000.00 | 35,534,199.01 | 99.9 |
| 1505 | 11 | සම්මාදම් සහ දායක මුදල් | 32,680,000.00 | 32,673,956.83 | 100.0 |
| 1506 | 11 | රජයේ සේවකයින් සඳහා දේපල ණය පොලී | 2,900,000.00 | 2,860,242.18 | 98.6 |
| | | **වෙනත් පුනරාවර්තන වියදම්** | 100,000.00 | 98,418.00 | 98.4 |
| 1701 | 11 | | | | |
| 1703 | 11 | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම | 100,000.00 | 98,418.00 | 98.4 |

**මූලධන වියදම් - 2018**

**වියදම් ශීර්ෂය -160- මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය**

වැඩ සටහන් අංක : 1 - මෙහෙයුම් වැඩසටහන

ව්‍යාපෘති 02- පරිපාලන හා ආයතනික සේවා

| වැය ශීර්ෂ අංකය | මූල්‍ය කරනය | කාණ්ඩය/වැය ශීර්ෂය/ අයිතමය/ විස්තරය | වෙන් කිරීම් (රු.) | ශුද්ධ වියදම (රු.) | % |
|---|---|---|---|---|---|
| | | **මූලධන වියදම්** | **18,715,000.00** | **17,065,259.52** | 91.2 |
| | | මූලධන වත්කම්වල පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 10,050,000.00 | 8,633,926.53 | 85.9 |
| 2001 | 11 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 1,550,000.00 | 1,545,730.40 | 99.7 |

| වැය ශීර්ෂ අංකය | මූලා කරනය | කාණ්ඩය/වැය ශීර්ෂය/ අයිතමය/ විස්තරය | වෙන් කිරීම් (රු.) | ශුද්ධ වියදම (රු.) | % |
|---|---|---|---|---|---|
| 2002 | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 500,000.00 | 390822.64 | 78.2 |
| 2003 | 11 | වාහන | 8,000,000.00 | 6,697,373.49 | 83.7 |
| | | මූලධන වත්කම් අත්පත්කර ගැනීම | 2,665,000.00 | 2,621,715.00 | 98.4 |
| 2101 | 11 | වාහන | | - | |
| 2102 | 11 | ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 30,000.00 | 20,800.00 | 69.3 |
| 2103 | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 2,635,000.00 | 2,600,915.00 | 98.7 |

**මූලධන වියදම් - 2018**
වියදම් ශීර්ෂය -160- මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
**වැඩ සටහන් අංක : 2**
**ව්‍යාපෘතිය 03 - පරිසර සංරක්ෂණය**

| වැය ශීර්ෂ අංකය | මූලා කරනය | ව්‍යාපෘතිය | වෙන් කිරීම් (රු.) | ශුද්ධ වියදම (රු.) | % |
|---|---|---|---|---|---|
| | | **1පරිසර ප්‍රතිපත්ති සකස් කිරීම, සමාලෝචනයසහ හිඩැස් විශ්ලේෂණය** | | | |
| 2507 | 11 | ආයෝජන | 500,000.00 | 448,552.75 | 89.7 |
| | | **2.දේශගුණික විපර්යාසවල බලපෑම් අවම කිරීම සහ අනුහුරුවීම** | | | |
| 2507 | 11 | ආයෝජන | 1,500,000.00 | 1,467,103.29 | 97.8 |
| | | **3. ප්‍රධාන පරිසර වැඩ සටහන් සැමරීම** | | | |
| 2509 | 11 | ආයෝජන | 5,000,000.00 | 3,308,608.71 | 66.2 |
| | | **4. පරිසර අධ්‍යාපනය හා දැනුවත් කිරීම** | | | |
| 2509 | 11 | ආයෝජන | 1,570,000.00 | 1,558,250.50 | 99.3 |
| | | **5.පරිසර ආරක්ෂණය හා සංරක්ෂණය** | | | |
| 2507 | 11 | ආයෝජන | 9,100,000.00 | 8,547,644.05 | 93.9 |
| | | **6 .පාසැල් පරිසර පුහුණු වැඩ සටහන (හරිත නියමු)** | | | |
| 2509 | 11 | ආයෝජන | 19,000,000.00 | 18,491,916.85 | 97.3 |
| | | **7. මොන්ට්‍රියල් සන්ධානය ක්‍රියාත්මක කිරීම** | | | |
| 2509 | 13 | ආයෝජන | 29,670,000.00 | 29,470,266.58 | 99.3 |
| 2509 | 17 | ආයෝජන | 490,000.00 | 489,421.00 | 99.9 |
| | | **13. වනභායනය හා වනහරණය හේතුවෙන් සිදුවන හරිතාගාර වායු විමෝචනය වැළැක්වීමේ වැඩසටහන** | | | |
| 2202 | 13 | ආයෝජන | 4,029,650.00 | 4,029,618.00 | 100.0 |
| | | **18. පිළිසරු වැඩ සටහන** | | | |
| 2506 | 11 | ආයෝජන | 215,000,000.00 | 165,000,000.00 | 76.7 |
| | | **58. ශ්‍රී ලංකා කෘෂි පාරිසරික කලාප සංරක්ෂණය සහ දේශගුණික විපර්යාස වලට ජනයා අනුගතවීම** | | | |
| 2509 | 13 | ආයෝජන | 16,473,500.00 | 8,789,450.45 | 53.4 |
| 2509 | 13 | ආයෝජන | 13,840,000.00 | 12,744,518.61 | 92.1 |
| | | **69. ඝණ අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ගොඩනැංවීම - අනුරාධපුර, හික්කඩුව, උඩුනුවර, පානදුර (GOSL/Korea)** | | | |

| වැය ශීර්ෂ අංකය | මූලා කරනය | ව්‍යාපෘතිය | වෙන් කිරීම් (රු.) | ශුද්ධ වියදම (රු.) | % |
|---|---|---|---|---|---|
| 2506 | 12 | ආයෝජන | | | |
| 2506 | 17 | ආයෝජන | 39,000,000.00 | 36,950,000.00 | 94.7 |
| | | **74.** වනහරණය සහ වන හායනය වැළැක්වීම සඳහා වූ වැඩ සටහන **(GOSL/UNDP)** | | | |
| 2202 | 13 | ආයෝජන | | | |
| | | **97.** ශ්‍රී ලංකාවේ මහවැලි ගංගා ද්‍රෝණි ආශ්‍රිත ගොවි ජනපදවල කෘෂිකාර්මික ප්‍රජාව දේශගුණික විපර්යාස වල අහිතකර බලපෑම්වලට අනුහුරු කරවීමේ ව්‍යාපෘතිය **(GOSL/WFP)** | | | |
| 2202 | 13 | ආයෝජන | 250,000,000.00 | 127,896,987.70 | 51.2 |
| | | **101.**ප්‍රධාන ජල මූලාශ්‍ර වල ජල තත්ව ඇගයීම **(GOSL/JAPAN)** | | | |
| 2507 | 13 | ආයෝජන | | | |
| 2507 | 17 | ආයෝජන | 1,000,000.00 | 1,000,000.00 | 100.0 |
| | | **104.** ජෛව විවිධත්වය සහ තිරසාර කළමනාකරණය සඳහා වූ තිරසාර කළමනාකරණය | | | |
| 2507 | 11 | ආයෝජන | 9,200,000.00 | 9,200,000.00 | 100.0 |
| | | **105**පරිසර මාවත ජනප්‍රිය කරවීම | | | |
| 2202 | 11 | ආයෝජන | 911,100.00 | 911,065.05 | 100.0 |
| | | **106** පාරිසරික සංවේදී භූමි ප්‍රදේශවල ජෛව විවිධත්ව සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම හා පරිසර සේවා නඩත්තුව පිළිබඳ ව්‍යාපෘතිය | | | |
| 2509 | 13 | ආයෝජන | 61,000,000.00 | 45,435,688.72 | 74.5 |
| | | **108** ශ්‍රී ලංකාව තුල පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල් අපද්‍රව්‍ය හා පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල් අඩංගු උපකරණ පරිසර හිතකාමී ලෙස කළමනාකරණය හා බැහැර කරලීමේ ව්‍යාපෘතිය **(GEF/UNIDO)** | | | |
| 2509 | 13 | ආයෝජන | 27,340,000.00 | 17,803,176.88 | 65.1 |
| | | **109** මිනමාටා සම්මුතියට අදාළව ශ්‍රී ලංකාව තුළ රසදිය භාවිතය පිළිබඳව මූලික ඇගයීමේ ව්‍යාපෘතිය **)UNIDO)** | | | |
| 2507 | 13 | ආයෝජන | 5,000,000.00 | 4,071,010.59 | 81.4 |
| | | **110** මධ්‍යම පරිසර අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබන අධ්‍යාපන වැඩසටහන්, දැනුවත් කිරීම හා හරිත සම්මාන වැඩසටහන | | | |
| 2507 | 11 | ආයෝජන | 17,000,000.00 | 16,756,572.08 | 98.6 |
| | | **112** ජෛව පද්ධති සංරක්ෂණය හා කළමණාකරණය | | | |
| 2506 | 12 | ආයෝජන | 940,000,000.00 | 939,850,714.81 | 100.0 |
| 2506 | 17 | ආයෝජන | 10,000,000.00 | 8,989,792.40 | 89.9 |
| | | **114** ශ්‍රී ලංකාවේ තෙවන ජාතික දේශගුණ විපර්යාස සන්නිවේදන වාර්තාව සකස් කිරීමේ **)UNDP)** | | | |
| 2507 | 13 | ආයෝජන | 20,520,000.00 | 20,113,774.11 | 98.0 |
| | | 115 ගම්පහ දිස්ත්‍රික්කයේ භූ ජලය දූෂණය | | | |

| වැය ශීර්ෂ අංකය | මූලා කරනය | ව්‍යාපෘතිය | වෙන් කිරීම් (රු.) | ශුද්ධ වියදම (රු.) | % |
|---|---|---|---|---|---|
| | | වැලැක්වීමේ අරමුණින් කර්මාන්ත අපද්‍රව්‍ය හා අපජලය කළමනාකරණ ව්‍යාපෘතිය | | | |
| 2507 | 13 | ආයෝජන | 6,300,000.00 | 6,300,000.00 | 100.0 |
| | | 116 මධ්‍යම කඳුකරයේ හායනයට පත් වූ කෘෂිකාර්මික ඉඩම් පුනුරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය | | | |
| 2505 | 13 | ආයෝජන | 1,200,000.00 | 1,139,259.00 | 100.0 |
| | | 117 පරිසරය හා සෞඛ්‍ය ප්‍රතිපත්ති සඳහා වායු තත්ව තක්සේරු කිරීමේ ව්‍යාපෘතිය | | | |
| 2507 | 13 | ආයෝජන | 4,293,000.00 | 580,038.00 | 13.5 |
| | | එකතුව | 1,708,937,250.00 | 1,491,343,430.13 | 87.3 |

**මූලධන වියදම් - 2018**
**වියදම් ශීර්ෂය -160- මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය**
**වැඩසටහන් අංක : 2**
**ව්‍යාපෘතිය 05 - මහවැලි සංවර්ධනය**

| වැය ශීර්ෂ අංකය | මූලා කරනය | ව්‍යාපෘතිය | වෙන් කිරීම් (රු.) | ශුද්ධ වියදම (රු.) | % |
|---|---|---|---|---|---|
| | | **1. මොරගහකන්ද කළුගඟ ජලාධාර ව්‍යාපෘතිය (GOSL/China,Kuwait& Saudi)** | **18,877,700,000.00** | **16,030,630,927.56** | 84.9 |
| 2506 | 11 | ආයෝජන | 9,320,700,000.00 | 9,220,204,000.00 | 98.9 |
| | 12 | ආයෝජන | 4,500,000,000.00 | 3,039,334,380.80 | 67.5 |
| | 14 | ආයෝජන | 3,457,000,000.00 | 2,779,898,153.32 | 80.4 |
| | 17 | ආයෝජන | 1,600,000,000.00 | 991,194,393.44 | 61.9 |
| | | **3.මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය ( බී කලාපය පුනරුත්තාපනය)** | | | |
| 2506 | 11 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 290,000,000.00 | 290,000,000.00 | 100.0 |
| | | **4.උමා ඔය හැරවීමේ ව්‍යාපෘතිය (GOSL-Iran)** | | | |
| 2506 | 11 | ඉඩම් හා වැඩි දියුණු කිරීම් | 7,510,000,000.00 | 6,523,304,111.27 | 86.9 |
| | | **5.ප්‍රධාන හා මධ්‍යම ප්‍රමාණයේ වාරි මාර්ග නඟා සිටුවීම** | | | |
| 2506 | 11 | ඉඩම් හා වැඩි දියුණු කිරීම් | 150,000,000.00 | 137,000,000.00 | 91.3 |
| | | **6.රිදීමාලියද්ද ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය** | | | |
| 2506 | 11 | ඉඩම් හා වැඩි දියුණු කිරීම් | 76,000,000.00 | 64,000,000.00 | 84.2 |
| | | **7.වැලිඔය ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය** | | | |
| 2506 | 11 | ඉඩම් හා වැඩි දියුණු කිරීම් | 260,000,000.00 | 260,000,000.00 | 100.0 |
| | | **8. බී කලාපයේ මාදුරුඔය දකුණ ඉවුර සංවර්ධනය** | | | |
| 2506 | 11 | ඉඩම් හා වැඩි දියුණු කිරීම් | 60,000,000.00 | 60,000,000.00 | 100.0 |
| | | **9.ශක්‍යතා අධ්‍යයනය** | | | |
| 2505 | 11 | ආයෝජන | 28,028,900.00 | 21,540,144.91 | 76.8 |

| වැය ශීර්ෂ අංකය | මූල්‍ය කරනය | ව්‍යාපෘතිය | වෙන් කිරීම් (රු.) | ශුද්ධ වියදම (රු.) | % |
|---|---|---|---|---|---|
| | | **11.ජල සම්පත් සංවර්ධනය සඳහා වන ආයෝජන ව්‍යාපෘතිය (GOSL/ADB)-Upper EleheraCanel, Moragahakanda, Kalugaga Transfer canel, Minipeancicut raising & LB Rehabilitation, North Wes. Province Canal** | 5,199,000,000.00 | 5,108,393,259.91 | 98.3 |
| 2506 | 12 | ආයෝජන | 3,440,000,000.00 | 3,400,186,914.48 | 98.8 |
| 2506 | 14 | ආයෝජන | 609,000,000.00 | 600,716,772.82 | 98.6 |
| 2506 | 17 | ආයෝජන | 1,150,000,000.00 | 1,107,489,572.61 | 96.3 |
| | | **13.වෙලි ආරක්ෂණ හා ජල සම්පත් සැළසුම්කරණ ව්‍යාපෘතිය (GOSL/W.B)** | 2,540,000,000.00 | 2,283,050,648.04 | 89.9 |
| 2506 | 12 | ආයෝජන | 2,500,000,000.00 | 2,243,050,648.04 | 89.7 |
| 2506 | 17 | ආයෝජන | 40,000,000.00 | 40,000,000.00 | 100.0 |
| | | **14. රඹකැන් ඔය ඒකාබද්ධ සංවර්ධන වැඩසටහන** | | | |
| 2506 | 11 | ආයෝජන | 108,000,000.00 | 94,000,000.00 | 87.0 |
| | | **16. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන කෘෂිකර්ම හා පශු සම්පත් වැඩසටහන** | | | |
| 2506 | 11 | ආයෝජන | 214,000,000.00 | 175,000,000.00 | 81.8 |
| | | **17. මාදුරුඔය දකුණු ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය** | 5,145,000.00 | 143,735.63 | 2.8 |
| 2506 | 12 | | 5,000,000.00 | | 0.0 |
| 2506 | 17 | | 145,000.00 | 143,735.63 | 99.1 |
| | | **18. ඒකාබද්ධ ජල කළමනාකරණ ප්‍රවේශයක් තුලින් ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ දේශගුණික විපර්යාසවලට කුඩා ඉඩම් හිමි ගොවින්ගේ මුහුණදීමේ ශක්තිය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය )GCF/UNDP)** | 839,602,850.00 | 261,743,203.24 | 31.2 |
| 2202 | 13 | ආයෝජන | 784,647,850.00 | 206,788,203.24 | 26.4 |
| 2202 | 17 | ආයෝජන | 54,955,000.00 | 54,955,000.00 | 100.0 |
| එකතුව | | | 36,157,476,750.00 | 31,308,806,030.56 | 86.6 |

මුලධන වියදම් - 2018

**වියදම් ශීර්ෂය -160- මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය**

**වැඩ සටහන් අංක : 2 සංවර්ධන වැඩසටහන්**

**ව්‍යාපෘතිය 04 : රාජ්‍ය ආයතන**

| වැය ශීර්ෂ අංකය | මූල්‍ය කරනය | ආයතනය | වෙන් කිරීම් (රු.) | ශුද්ධ වියදම (රු.) | % |
|---|---|---|---|---|---|
| | | **මධ්‍යම පරිසර අධිකාරිය** | | | |
| 2201 | 11 | රාජ්‍ය ආයතන | 57,000,000 | 57,000,000 | 100 |
| | | **සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය** | | | |

| වැය ශීර්ෂ අංකය | මූල්‍ය කරනය | ආයතනය | වෙන් කිරීම් (රු.) | ශුද්ධ වියදම (රු.) | % |
|---|---|---|---|---|---|
| 2201 | 11 | රාජ්‍ය ආයතන | 90,000,000 | 77,253,537 | 85.8 |
| | | **මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය** | | | |
| 2201 | 11 | රාජ්‍ය ආයතන | 60,000,000 | 51,680,000 | 86.1 |
| | | **ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය** | | | |
| 2201 | 11 | රාජ්‍ය ආයතන | 1,575,500,000 | 1,108,000,000 | 70.3 |
| | | එකතුව | 1,782,500,000.00 | 1,293,933,537.00 | 72.6 |

**පුනරාවර්තන වියදම් - 2018**

වියදම් ශීර්ෂය -160- මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

වැඩ සටහන් අංක : 2 සංවර්ධන වැඩසටහන්

ව්‍යාපෘතිය 04 : රාජ්‍ය ආයතන

| වැය ශීර්ෂ අංකය | මූල්‍ය කරනය | ආයතනය | වෙන් කිරීම් (රු.) | ශුද්ධ වියදම (රු.) | % |
|---|---|---|---|---|---|
| | | **මධ්‍යම පරිසර අධිකාරිය** | | | |
| 1503 | 11 | රාජ්‍ය ආයතන | 615,000,000 | 615,000,000 | 100.0 |
| | | **සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය** | | | |
| 1503 | 11 | රාජ්‍ය ආයතන | 128,000,000 | 127,986,840 | 100.0 |
| | | **මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය** | | | |
| 1503 | 11 | රාජ්‍ය ආයතන | 80,000,000 | 51,680,000 | 64.6 |
| | | **ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය** | | | |
| 1503 | 11 | රාජ්‍ය ආයතන | 2,700,000,000 | 2,694,384,000 | 99.8 |
| | | එකතුව | 3,523,000,000 | 3,489,050,840 | 99.0 |

# VII වන කොටස

## අමාත්‍ය මණ්ඩල පත්‍රිකා
## මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

| # | අමාත්‍ය මණ්ඩල සංදේශ අංකය | ශීර්ෂය |
|---|---|---|
| 1 | 18/0091/704/001 | කොළඹ අගනගර කලාපයෙහි තෙත්බිම් ගොඩකිරීම හා විනාශ කිරීම වහාම නවතාලීම සඳහා තාවකාලික තහනම් නියෝගයක් පැනවීම හා තෙත්බිම් ආරක්ෂිත කලාප ලෙස ප්‍රකාශයට පත් කිරීම හා සංවර්ධනය කිරීම. |
| 2 | 18/0194/704/003 | දේශගුණ විපර්යාස අභියෝග හමුවේ ජල සම්පත එලදායී අයුරින් කළමනාකරණය කිරීම. |
| 3 | 18/0193/704/002 | උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ බලපෑමට ලක්වූ ප්‍රදේශ ආශ්‍රිත විශේෂ ආපදා කළමනාකරණ සැලැස්ම |
| 4 | 18/0251/704/004 | දකුණු කොළඹ වැලි පෝෂණ ව්‍යාපෘතිය - යාන්ත්‍රික වැලි පෝෂණ විධික්‍රමය (Sand Engine Methodology) යොදා ගනිමින් ක්‍රියාත්මක කිරීම සඳහා වන අමාත්‍ය මණ්ඩල සංදේශය |
| 5 | 18/0373/704/005/TBR | මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන යටතේ ක්‍රියාත්මක ඉහල ඇළහැර ඇළ ඉදි කිරීම යටතේ කළු ගහ - මොරගහකන්ද හුවමාරු ඇල මුළු දිග කි.මී 8ක් වන උමං මාර්ග දෙකක්, විවෘත ඇළ මාර්ගයක්, දියමං පාලම් සහ ඒ ආශ්‍රිත නිර්මිත ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම. |
| 6 | 18/0374/704/006/TBR | මොරගහකන්ද සහ කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතියේ සංශෝධිත වියදම් ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා ගැනීම. |
| 7 | 18/0382/704/007/ TBR | මොරගහකන්ද ජලාශයේ සැදැල බැම්ම අංක 01 හි අත්තිකාරම් සඳහා කැනීම් කිරීමේදී හඳුනාගත් භූ විද්‍යාත්මක වෙනස්කම් නිසා ඇතිවූ විචලනය සඳහා ගෙවීම් කිරීම. |
| 8 | 18/0478/704/008/ TBR | මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන වයඹ පළාත් ඇළ ව්‍යාපෘතියේ නැබඩගහවත්ත සිට මහකිතුල ජලාශ පිවිසුම් උමග දක්වා ප්‍රධාන ඇළ ඉදිකිරීම් (කි.මී.5+ මී.250 සිට කි.මී.22+මී.300 දක්වා) කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම. |
| 9 | 18/0589/704/009 | දකුණු ආසියානු පාරිසරික සහයෝගිතා වැඩසටහනේ (SACEP) ලේකම් කාර්යාලය හා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිල නිවාසය ඉදි කිරීමට ඉඩමක් ලබා ගැනීම සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කරවා ගැනීම. |
| 10 | 18/0588/704/001-I | කොළඹ අග නගර කලාපයෙහි තෙත්බිම් ගොඩ කිරීම හා විනාශ කිරීම වහාම නවතාලීම සඳහා තාවකාලික තහනම් නියෝගයක් පැනවීම හා තෙත් බිම් ආරක්ෂණ කලාප ලෙස ප්‍රකාශයට පත් කිරීම හා සංවර්ධනය කිරීම. |
| 11 | 18/0684/704/011 | මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - වැඩසටහන් කළමනාකරණ ඒකකය සඳහා ප්‍රසම්පාදන විශේෂඥවරයෙක් පත් කිරීම. |
| 12 | 18/0673/704/010 | 1981 අංක 57 දරණ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත යටතේ සකස් කරන ලද 2018 ශ්‍රී ලංකා වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම සඳහා අනුමැතිය ලබා ගැනීම. |
| 13 | 18/0851/704/012 | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ උපදේශක තනතුර සඳහා පත් කිරීම |
| 14 | 18/0901/803/002 | මොරගහකන්ද ජලාශයේ මූලස්ථායී වැඩ ඉදි කිරීම් කොන්ත්‍රාත්තුවට අදාල සැලසුම් ඇගයීම් කර අනුමත කිරීම සහ ඉදි කිරීම් අධීක්ෂණය සඳහා වූ උපදේශක කොන්ත්‍රාත්තුව සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, මහවැලි උපදේශක සේවා කාර්යාංශය සහ සිනෝහයිඩ්‍රෝ කෝප්පරේෂන් ආයතනය අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුමේ කාලය දීර්ඝ කිරීම. |
| 15 | 18/0900/803/001 | විවෘත රාජ්‍ය හවුල්කාරීත්වය - ජාතික ක්‍රියාකාරී සැලැස්මේ පරිසර තේමාව (බෙදීම 1: විනිවිද පෙනෙන පාරිසරික තීරණ : මූලික පාරිසරික පරීක්ෂණය කෙරේහි අදහස් ප්‍රකාශ කිරීමට මහජනතාවට ඇති අයිතිය නැවත ලබා දීම සහ මහජන අදහස් පිළිබඳ රජයේ වග වීම. |
| 16 | 18/0942/803/003 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වැල්ලවායේ කොටිකම්බොක්ක වනාන්තරය තුල ඇති තිරුවානා නිධිය කැණීම් කර,අගය එකතු කොට අපනයනය සඳහා අලෙවි කිරීම. |
| 17 | 18/0949/803/005 | පුලතිසි වෙළඳ සංකීර්ණය සහ කෘෂි ආර්ථික මධ්‍යස්ථානය ඉදිකිරීම. |

| # | අමාත්‍ය මණ්ඩල සංදේශ අංකය | ශීර්ෂය |
|---|---|---|
| 18 | 18/0964/803/006 | ශ්‍රී ලංකාවේ පරිසර හිතකාමී ඇස්බැස්ටොස් ආනයනය හා භාවිතය පාලනය කිරීම |
| 19 | 18/0988/803/007 | ශ්‍රී ලංකාවේ කොරල් පර පිළිබඳ ජාත්‍යන්තර වැඩසටහනෙහි සාමාජිකත්වය ලබා ගැනීම. |
| 20 | 18/1013/803/008 | සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ දකුණු පළාත් කාර්යාලය හා ගාල්ල දිස්ත්‍රික් කාර්යාලය රසායනාගාරයක් සහිතව ස්ථාපනය කිරීම. |
| 21 | 18/1014/803/009 | මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ඉඩම් හා නිවාස අහිමිවන්නන් සඳහා ලබා දෙන විශේෂ අතිරේක දීමනා සහ පහසුකම් |
| 22 | 18/1109/803/010 | ගුණාත්මක භාවය හා කල්පැවැත්ම සලකා රාජ්‍ය දැව සංස්ථාවේ නිෂ්පාදිත ගෘහ භාණ්ඩ මිලදී ගැනීමට අපේක්ෂා කරන රාජ්‍ය ආයතන වෙත අනුමැතිය ලබා දීම. |
| 23 | 18/1154/803/011 | ජාතික පාරිසරික පනත සංශෝධනය කිරීම. |
| 24 | 18/1172/803/012 | දකුණු කොළඹ වැලි පෝෂණ ව්‍යාපෘතිය - යාන්ත්‍රික වැලි පෝෂණ විධික්‍රමය (Sand Engine Methodology) යොදා ගනිමින් ක්‍රියාත්මක කිරීම සහ කළු ගං මුවදොරෙහි බාදනයට ලක්වූ ස්වාභාවික වැලි වැටිය නැවත ස්ථායී කිරීම සඳහා වන අමාත්‍ය මණ්ඩල සංදේශය. |
| 25 | 18/1216/803/013 | සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සාමාන්‍යාධිකාරී තනතුරේ සේවය කරනු ලබන ආචාර්ය පී.බී.ටර්නි ප්‍රදීප් කුමාර මහතාගේ සේවා කාලය දීර්ඝ කිරීම. |
| 26 | 18/1240/803/014 | උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ සේවා යෝජකගේ නියෝජිත වෙත තාක්ෂණික සහාය ලබා ගැනීම සඳහා CECB වෙත ප්‍රදානය කරන ලද උපදේශක සේවා කොන්ත්‍රාත්තුවේ කාලය දීර්ඝ කිරීම. |
| 27 | 18/1272/803/015 | මොරගහකන්ද - කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකු පත් කිරීම. |
| 28 | 18/1334/803/017 | රත්නපුර දෙමුවාවත මැණික් වීදිය ජාත්‍යන්තර මැණික් වීදියක් ලෙස සංවර්ධනය කිරීම සහ මැණික් කුළුණ ඉදි කිරීම. |
| 29 | 18/1321/803/016 | රට අභ්‍යන්තර ජල මූලාශ්‍රයන්හි ජලයෙහි ගුණාත්මක තත්ත්වය පසුවිපරම් කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම. |
| 30 | 18/1350/803/019 | වසර 2025 දී පවිත්‍ර වාතාශ්‍ර තත්ත්වයන් ළඟාකර ගැනීම සඳහා වූ "පිරිසිදු වායු 2025 ක්‍රියාකාරී සැලැස්ම" ක්‍රියාත්මකකිරීම සඳහා නියාමන/මෙහෙයුම් කමිටුව ස්ථාපනය කිරීම. |
| 31 | 18/1349/803/018/TBR | උමා ඔය බහු කාර්ය සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය සහ ෆරාබි සමාගම අතර ඇති කරගත් ගිවිසුම් කාලය දීර්ඝ කිරීම. |
| 32 | 18/1401/803/020 | මාතර මහ නගර සභාව සහ අවට පළාත් පාලන ආයතනවල අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු විධිමත් කිරීම සඳහා මාතර, කොටවිල ප්‍රදේශයේ ඉදි කරන ලද "අපද්‍රව්‍ය වලින් බලශක්ති" ජීව වායු ව්‍යාපෘතිය මඟින් නිපදවන විදුලිය මිලදී ගැනීම සම්බන්ධයෙන් ලංකා විදුලි බල මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹීම. |
| 33 | 18/1532/803/009 - I | මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ඉඩම් හා නිවාස අහිමිවන්නන් සඳහා ලබා දෙන විශේෂ අතිරේක දීමනා සහ පහසුකම්. |
| 34 | 18/1514/803/021 | මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන සැලැස්ම ආශ්‍රිතව වාරි කර්මාන්ත ක්ෂේත්‍රයේ සිදු කෙරෙමින් පවතින දැවැන්ත ආයෝජන පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම. |
| 35 | 18/1679/803/023 | උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රධාන උමඟේ ඇතිවූ ජල කාන්දුව නිසා බලපෑමට ලක්වූ නිවාස හිමියන්ට හදිසි ආපදා තත්ත්වය යටතේ සහන සැලසීම. |
| 36 | 18/1672/803/022 | යෝජිත ශ්‍රී ලංකා චීන සැපයුම් සහ කර්මාන්ත කලාපයන් හෙවත් විශේෂ ආර්ථික කලාපය හම්බන්තොට සඳහා ඉඩම් අත්පත් කර ගැනීම. |
| 37 | 18/1769/803/024 | නීල හරිත ආර්ථික සංවර්ධන ප්‍රවේශයට අනුකූලව,මහවැලි විශේෂ බල ප්‍රදේශය ආශ්‍රිතව පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය , ආනයන වෙළඳපල ඉලක්ක කරගත් පරිසර හිතකාමී කෘෂිකර්මාන්ත හා සංචාරක ක්ෂේත්‍රය රාජ්‍ය පෞද්ගලික ඒකාබද්ධ ආයෝජන වැඩසටහන. |

| # | අමාත්‍ය මණ්ඩල සංදේශ අංකය | ශීර්ෂය |
|---|---|---|
| 38 | 18/1797/803/027 | දේශගුණ විපර්යාස අවම කිරීමේ හවුල්කාරීත්ව ව්‍යාපෘතිය |
| 39 | 18/1795/803/025 | වන සංරක්ෂණ ආඥා පනත සංශෝධනය කිරීම. |
| 40 | 18/1796/803/026 | පද්ධති කාර්යක්ෂමතාවය හා ජල ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා වූ ව්‍යාපෘතියේ උපදේශක සේවාව ප්‍රංශයේ Egis Eau උපදේශක ආයතනය (ප්‍රධාන උපදේශක ආයතනය, ප්‍රංශයේ Egis International උපදේශක ආයතනය (බද්ධ උපදේශක ආයතනය) සහ මෙරට Resources Development Consultants Pvt Ltd උපදේශක සමාගම (දේශීය උප උපදේශක ආයතන) වෙත ප්‍රදානය කිරීම සඳහා වූ අනුමැතිය ලබා ගැනීම. |
| 41 | 18/1817/803/028 | කොළඹ අගනගර කලාපයෙහි තෙත්බිම් ගොඩ කිරීම හා විනාශ කිරීම වහාම නවතාලීම සඳහා තාවකාලික තහනම් නියෝගයක් පැනවීම හා තෙත්බිම් ආරක්ෂිත කලාප ලෙස ප්‍රකාශයට පත් කිරීම හා සංවර්ධනය කිරීම. |
| 42 | 18/1917/803/012- I | දකුණු කොළඹ වැලි පෝෂණ ව්‍යාපෘතිය - යාන්ත්‍රික වැලි පෝෂණ විධි ක්‍රමය (Sand Engine Methodology) යොදා ගනිමින් ගල්කිස්ස සිට අගුලාන දක්වා වූ වෙරළ තීරය ස්ථායී කිරීම සහ කළු ගං මුව දොරෙහි බාදනයට ලක්වූ ස්වාභාවික වැලි වැටිය නැවත ස්ථායී කිරීම. |
| 43 | 18/1955/803/029 | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වාර්ෂික වාර්තාව 2015 |
| 44 | 18/2083/803/031 | ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත්, මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්) සමාගම, රාජ්‍ය - පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ව්‍යාපෘති කමිටුව විසින් තෝරාගත් බාහිර ආයෝජකයා සම්බන්ධ කර ගැනීම. |
| 45 | 18/2171/803/034 | ගෝලීය දේශගුණ හා කාලගුණ විපර්යාසයන්ට සාර්ථක ලෙස මුහුණ දීම පිණිස ඒකාබද්ධ ජලාධාර සහ ජල සම්පත් කළමනාකරණය කිරීම. |
| 46 | 18/2162/803/032 | දේශගුණ විපර්යාසයන්හි අහිතකර බලපෑම් හමුවේ ශ්‍රී ලංකාව සවිබල ගැන්වීමට අවශ්‍ය අන්තර්ජාතික විද්‍යාත්මක, තාක්ෂණික සහ මූල්‍ය සහයෝගය ලබා ගැනීම සඳහා හරිත දේශගුණ අරමුදල [Green Climate Fund (GCF)], කෘෂි වන වගා පර්යේෂණ පිළිබඳ ජාත්‍යන්තර කවුන්සිලය [Intrnational Council for Research in Agro Forestry (ICRAF)] සමඟ ගිවිසුම් වලට එළැඹීම සහ ගෝලීය හරිත වර්ධන ආයතනයේ [Global Green Growth Initiative (GGGI)] සාමාජිකත්වය ලබා ගැනීම. |
| 47 | 18/2365/803/039 | නිවාස ඉදිකිරීම හෝ වෙනත් කාර්යයන් සඳහා ඉඩම් කට්ටි කිරීමේදී පරිසර පද්ධතීන්ට සිදුවන හානි අවම කිරීමට අවශ්‍ය පියවර ගැනීම. |
| 48 | 18/2373/803/012 - II | දකුණු කොළඹ වැලි පෝෂණ ව්‍යාපෘතිය - යාන්ත්‍රික වැලි පෝෂණ විධික්‍රමය (Sand Engine Methodology) යොදා ගනිමින් ක්‍රියාත්මක කිරීම සහ කළු ගං මුව දොරෙහි බාදනයට ලක්වූ ස්වාභාවික වැලැ වැටිය නැවත ස්ථායී කිරීම. |
| 49 | 18/2605/803/020-I | මාතර මහ නගර සභාව සහ අවට පළාත් පාලන ආයතනවල අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු විධිමත් කිරීම සඳහා මාතර, කොටවිල ප්‍රදේශයේ ඉදි කරන ලද “අපද්‍රව්‍ය වලින් බලශක්තිය”ජීව වායු ව්‍යාපෘතිය මඟින් නිපදවන විදුලිය මිලදී ගැනීම සම්බන්ධව ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹීම. |
| 50 | 18/2659/803/027- I | දේශගුණ විපර්යාස අවම කිරීමේ හවුල්කාරීත්ව ව්‍යාපෘතිය. |

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
மகாவலி அபிவிருத்தி மற்றாடல் அமைசக
Ministry of Mahaweli Development and Environment